PERCY JACKSON & OLYMPIANS

THE LIGHTNING THIEF

පර්සි ජැක්සන් සහ

අකුණු හොරා

පරිවර්තනය

සවින්දි ආරියතිලක



Scanned with CamScanner

පර්සි ජැක්සන් සහ අකුණු හොරා

පරිවර්තනය : සවින්දි ආරියතිලක

ISBN : 978-955-679-071-5

ප්‍රථම මුද්‍රණය - 2015 පෙබරවාරි

ආශිර්වාද ප්‍රකාශන
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
දුරකථන : 033 2275419

මෙම සිංහල පරිවර්තනයේ අයිතිය © සවින්දි ආරිතිලක

සියලුම හිමිකම් ඇවිරිණි.

කර්තෘ ගේ අවසරයකින් තොරව මෙම පරිවර්තනය
සම්පූර්ණයෙන්ම හෝ එහි කොටස් හෝ
උපුටාගැනීම, මුද්‍රිත හෝ ලිඛිත, ඉලෙක්ට්‍රොනික හෝ
වෙනත් මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම,
අනුවර්තනය කිරීම හා එවැනි ලෙස සැකසූ පිටපත්
බෙදා හැරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ

පරිගණක පිටු සැකසුම හා කවර නිර්මාණය
චාමින් විජේරත්න - 0777 577299

මුද්‍රණය
ආශිර්වාද ප්‍රින්ටර්ස්, 70, ගිරිඋල්ල පාර, මීරිගම.

මම අහම්බෙන් වගේ මගේ ගණිත ගුරුතුමියව වාෂ්ප කළා

මෙහෙමයි, මට උප දෙවියෙක් වෙන්න කොහෙත්ම උවමනා වුණේ නෑ.

ඔයා මේක කියවන්නේ ඔයත් එහෙම කෙනෙක් කියලා හිතන නිසා නම්, මගේ උපදේශය තමයි: දැන්මම මේ පොත පැත්තකින් තියන්න. ඔයාගේ අම්මා හරි තාත්තා හරි ඔයාගේ උපත ගැන කියන ඕනෑම බොරුවක් විශ්වාස කරගෙන සාමාන්‍ය මනුස්සයෙක් වගේ ජීවත් වෙන්න උත්සාහ කරන්න.

උප දෙවියෙක් වීම හරිම අන්තරාදායක, භය උපදවන දෙයක්. හුඟක් වෙලාවට ඒක ඔයාව වේදනාකාරී සහ නිර්දය විදිහට මරණයට පත් කරවාවි.

ඔයා සාමාන්‍ය ළමයෙක් නම්, මේ පොත ප්‍රබන්ධයක් කියලා හිතන නිසා කියවනවා නම්, හොඳයි, දිගටම කියවන්න. මේ දේවල් කවදාවත් සිද්ධ නොවූවා කියලා විශ්වාස කරන්න ඔයාලට පුළුවන් වීම ගැන මට ඉරිසියයි.

ඒත් ඔයා මේ පිටු අතර ඔයාවම දකිනවා නම්, එහෙමත් නැත්නම් ඔයා තුළ යමක් කැලතෙනවා වගේ හැඟීමක් දැනෙනවා

නම්; වහාම, මේ දැන්ම කියවන එක නතර කරන්න. සමහර විට ඔයාත් අපෙන් කෙනෙක් වෙන්න පුළුවන්. ඔයා ඒක තේරුම් ගත්තා කියන්නේ, එයාලාටත් ඒක දැනෙන්න වැඩි කාලයක් යන්නෙ නෑ කියන එකයි. එදාට එයාලා ඔයාව සොයාගෙන ඒවි.

ඔන්න එදාට කියන්න එපා මං කලින් කිව්වෙ නෑ කියලා....

***

මගේ නම පර්සි ජැක්සන්.

මගේ වයස අවුරුදු දොළහයි. මම යැන්සි විද්‍යාලයේ -නිව්යෝක්වල තියෙන විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වෙන්වූ පෞද්ගලික පාසලක් - නේවාසික ශිෂ්‍යයෙක් විදිහට කලින් මාස දෙක තුන වෙනකල්ම සිටියා.

මම විශේෂ අවශ්‍යතා සහිත ළමයෙක්ද?

ඔව් එහෙම කියන්නත් පුළුවන්.

ඒක ඔප්පු කරන්න සාධක මගේ මේ කෙටි, කාලකණ්ණි ජීවිතයෙන් ඕනෑ තරම් හොයාගන්න පුළුවන්, ඒ වුණත් මේ දේවල් හුගක්ම නරක අතට හැරෙන්න පටන් ගත්තේ පහුගිය මැයි මාසේ අපේ ශ්‍රේණියේ කට්ටිය - ඒ කියන්නේ මැන්ටල් කේස් විසි අට දෙනෙකුයි ගුරුවරු දෙන්නෙකුයි - මැන්හැටන්වල මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයේ පෞරාණික ග්‍රීක හා රෝමානු අංශය බලන්න පිටත් වූ දවසේ ඉඳලයි.

ඔයාලට හිතේවි ඒක මහා නීරස ගමනක් කියලා... ඇත්තටම එහෙම තමයි. සාමාන්‍යයෙන් යැන්සි එකෙන් යන ක්ෂේත්‍ර චාරිකා ඔක්කොම එහෙමයි.

ඒත් මිස්ටර් බෲනර්, අපේ ලතින් ගුරුතුමා මේ චාරිකාව මෙහෙයවූ නිසා මට මේ ගමන යන්න හිත හදාගන්න පුළුවන් වුණා.

මිස්ටර් බෲනර් තුනී වෙගෙන යන කොණ්ඩෙකුයි, අශෝභන රැවුලකුයි තිබුණු මැදි වයසේ කෙනෙක්. එයා නිතරම ඇන්දෙ ට්වීඩ් රෙද්දෙන් මහපු ගෙවිලා ගිය ජැකට් එකක්. ඒකෙන් නිතරම කෝපි සුවඳ හැමුවා. විශේෂම දේ තමයි මිස්ටර් බෲනර්ට රෝද පුටුවක් පාවිච්චි කරන්න සිද්ධ වීම. ඒ රෝද පුටුව ස්වයංක්‍රීයව හසුරුවන්න පුළුවන් එකක්.

ඔයා හිතනවා ඇති මිස්ටර් බෲනර් ඇල්මැරුණු ගති තියෙන කෙනෙක් කියලා. ඒත්, එයා අපේ පන්තියේදි විහිළු කරන්න දක්ෂයි. ඒ වගේම, එයා අපිට පන්තියේදි සෙල්ලම් කරන්නත් ඉඩ දෙනවා. මිස්ටර් බෲනර් ළඟ අපූරු රෝමානු සන්නාහ සහ ආයුධ එකතුවකුත් තිබුණා. ඉතින් මේ ගුරුතුමාගේ පන්තියේදි විතරයි මට නිදි කිරන්නෙ නැතුව ඉගෙන ගන්න පුළුවන් වුණේ.

මම බලාපොරොත්තු වුණේ මේ චාරිකාව හොඳ එකක් වෙයි කියලා; අඩු තරමේ, මට කරදරයක පැටලෙන්නෙ නැතුවවත් ඉන්න පුළුවන් වෙයි කියලයි හිතුවේ. මොන පිස්සුද...

කලින් අවුරුදුවලදි වගේම මේ අවුරුද්දෙත් මට ගොඩක් කරදරවලට මැදි වෙන්න සිද්ධ වුණා.

ගිය අවුරුද්දෙ අපි ගියේ සරටෝගා රණබිමට. එහෙදි මම කාලතුවක්කුවක් අතගාන්න ගිහින් කරදරයක් කරගත්තා. ඇත්තටම මම හිතලා පාසල් බසය ඉලක්ක කළා නෙවෙයි. ඒ වුණත් අන්තිමේදි මාව ඒ පාසලෙන් එළෙව්වා. ඊටත් කලින් අවුරුද්දෙ, ඒ කියන්නෙ මම හතර වසරෙ ඉන්නකොට අපි මුහුදු මෝරු බලන්න මින් මැදුරක අභ්‍යන්තරයට ගියා. එහෙදි මම මොකක්දෝ වැරදි ලීවරයක් ඇදපු නිසා අපේ පන්තියේ ඔක්කෝටම බලාපොරොත්තු නොවූ විදිහට පීනන්න අවස්ථාවක් හම්බ වුණා. එතකොට ඊටත් කලින් අවුරුද්දෙ... හොඳයි, ඔයාට ඉතින් හිතාගන්න පුළුවන්නෙ.

ඉතින් මේ චාරිකාවෙදිවත් හොඳ ළමයෙක් වගේ ඉන්න මම තදින්ම හිතාගත්තා.

ඒ නිසාමද කොහෙදෝ අපි යන මග දිගටම වලගේ නැන්සි බොබ්ෆිට් (රතු කොණ්ඩයක් තියෙන, මූණ පුරා ලප පිරුණු, නිතරම හොරකමට පෙලඹුණු රණ්ඩු කෙක්කක්) සැරින් සැරේට මගෙ හොඳම යාළුවා ග්‍රෝවර්ගෙ ඔළුව පිටිපස්සට සැන්ඩ්විච්වලින් දමලා ගැහුවෙ මාව රණ්ඩුවකට පටලවා ගන්න උවමනාවෙන්මයි.

ග්‍රෝවර් කියන්නෙ ඔය වගේ දේවලට හරිම ලේසියෙන් ඉලක්ක වෙන කෙනෙක්. ඒ වගේ අඩන්තේට්ටමකට මුහුණ දෙන්න වුණෝතින් එයා කරන්නෙ පොඩි එකෙක් වගේ අඬන එකයි. කලින් ශ්‍රේණිවල එයාට එකම පන්තියේ අවුරුදු දෙක තුනක්වත් ඉන්න සිද්ධ වෙන්න ඇති. මොකද එයා හය වසරෙ හිටියට නිකටෙ පොඩි රැවුලකුත් වැවෙන්න පටන් ගෙන තිබුණා. අනිත් ලොකුම දේ තමයි එයා

ඇඟ චිකල් කෙනෙක් විම. එයාගෙ කකුල් දෙකේ පේශිවල මොකක්ද ලෙඩක් තිබුණා. ඒ නිසා එයා කවදාවත් ශාරීරික අභ්‍යාසවලට සහභාගි වුණේ නැහැ. නියත හැම අඩියක්ම ලොකු වේදනාවක් වගේ තමයි ග්‍රෝවර් ඇවිද්දේ. එයා ඇවිදින විදිහ දකින ඕනෑම කෙනෙක්ට හිතා යනවා. හැබැයි අපිව මෝඩයාට අන්දන්න එහෙම ඇවිදිනවා ද කියලත් වෙලාවකට හිතුණේ කැන්ටීමේ එයා ආසම කෑම - එන්චිලඩා විකුණන දවසට ග්‍රෝවර් දුවනවා දැක්කමයි.

කොහොම හරි, ග්‍රෝවර්ගෙ දුඹුරු පාට කැරලි කොණ්ඩෙ පුරාම නැන්සි බොබිෆිට්ගෙ සැන්ඩ්විච් කෑලි රැඳිලා තියෙනවා දැක්කම ගෙයේ මාළු මගේ ඇගේ හටන්න ගත්තා. මම දැනටමත් පරිවාසෙකට යටත් වෙලා ඉන්න නිසා එයා කරන ඒවට විරුද්ධව මට මුකුත් කරන්න බැරි බව නැන්සි දැනගෙන සිටියා. මේ චාරිකාව අතරතුරේදී මොනවා හරි නරක දෙයක්, කට්ටියව අපහසුතාවයට පත් වෙන දෙයක්, අඩුම තරමේ ලාවටවත් ජොලි දෙයක්වත් සිද්ධ වුණෝතින් මාව එල්ලනවා කියලා අපේ විදුහල්පති මට කලින්ම තර්ජනය කරලයි තිබුණේ.

"මම අරසිව මරණවා," මම කෙඳිරුවා.

"අයියෝ ඒක ගණන් ගන්න එපා. මම කොහොමත් පීනට් බටර්වලට ආසයිනෙ." මාව සන්සුන් කරන්න උත්සාහ කරමින් ග්‍රෝවර් කිවුවා.

එතකොටම පාවෙලා ආව තවත් සැන්ඩ්විච් කෑල්ලක් මග හරින්න ග්‍රෝවර් පැත්තකට නැමුණා.

"හොඳටම ඇති." කියාගෙන මම නැගිට්ටේ නැන්සි ඉන්න දිහාවට යන්නයි. ඒත් ග්‍රෝවර් මාව ආපසු ආසනයට ඇදලා ගත්තා.

"ඔයා දැනටමත් ඉන්නෙ පරිවාසෙකට අහුවෙලා කියලා අමතකද?" ග්‍රෝවර් මට මතක් කළා. "දන්නවනෙ පොඩි දෙයක් හරි සිද්ධ වුණොත් තාටද කන් දෙක පුරවලා අහගන්න වෙන්නෙ කියලා."

එදා සිදුවුණු දේවල් ආපසු මතක් කරනකොට මට හිතෙන්නෙ අපරාදෙ ඒ වෙලාවෙම නැන්සිගෙ හොම්බට දෙකක් දුන්නෙ නැත්තෙ කියලමයි. මොකද, ඊට පස්සෙ මුහුණ දෙන්න සිද්ධ වුණ දේවල් එක්ක බලනකොට විදුහල්පතිගෙන් හම්බ වෙන දඬුවම් දාහෙන් සම්පතක් වගෙයි.

කෞතුකාගාරයේදී නවේ ගුරා වුණේ මිස්ටර් බෲනර්.

හඩ දෝංකාර දෙන විශාල ප්‍රදර්ශන ශාලා හරහා එයා අපිව කැඳවාගෙන ගියා. මේ ශාලා පුරවා තිබුණේ කිරිගරුඬ ප්‍රතිමා සහ ආරක්ෂිත වීදුරු පෙට්ටිවල දමා තිබුණු ගොඩාක් පරණ පෙනුමක් ඇති කළු-තැඹිලි පාට මැටි භාණ්ඩවලිනුයි. ඒවා දකිනකොට මට පුදුම හිතුණෙ අවුරුදු දෙතුන් දාහක් තිස්සෙ මේවා විනාශ නොවී ඉතිරි වුණේ කොහොමද කියලයි.

මුදුනේ ස්ෆින්ක්ස් (සිංහ කයක් සහ කාන්තා මුහුණක් ඇති) ප්‍රතිමාවක් තිබුණු, අඩි දහතුනක් උස ගල් කුලුන අසල නතර වූ මිස්ටර් බෲනර් එයාගෙ වටේට අපි හැමෝවම එකතු කරගත්තා. මේ ගල් කුලුන අපේ වයසෙ හිටපු ගැහැනු ළමයෙක් වෙනුවෙන් හදපු ස්මාරකයක්ලු. මේ කුලුන වටේට තිබුණු කැටයම් ගැන ගුරුතුමා විස්තර කරන්න පටන් ගත්තා. මිස්ටර් බෲනර් කියන දේවල්වලට උවමනාවෙන් ඇහුම්කන් දෙන්න මම උත්සාහ කළත් වටේ හිටි අනෙක් ළමයින්ගෙ කෑ කෝ ගැහිල්ල නිසා එයාගේ හඩ යටපත් වුණා. එහෙම වෙලාවට එයාලට කෑගහන්න එපා කියන්න ගිහින් මිසිස් ඩොඩ්ස්ගෙ, ඒ කියන්නෙ අපිත් එක්ක ගිය අනිත් ගුරුවරියගෙ රැව්ලි, ගෙරවිලිවලට ලක්වෙන්න මට සිද්ධ වුණා.

මිසිස් ඩොඩ්ස් කියන්නෙ අපේ ගණිත ගුරුවරිය. එයාගෙ වයස අවුරුදු පනහක් විතර වුණත් දැන් කාලේ තරුණ කෙල්ලො අඳින ආකාරයේ කළු පාට ලෙදර් ජැකට් එකක් නිතරම අඳින්න එයා හුරුවෙලා සිටියා. එයාගෙ මුහුණෙ හැම වෙලාවකම දකින්න තිබුණෙ හරිම අධම පෙනුමක්. ජෝර්ජියාවල ඉඳලා එයා අපේ පාසලට ආවේ මේ අවුරුද්දෙ භාගයක් විතර ගෙවුණාටත් පසුවයි. ඒ අපේ කලින් ගණිත ගුරුවරිය ස්නායු බිඳ වැටීමකට ලක්වුණු නිසයි.

අපේ පාසලට ආව පළවෙනි දවසෙ ඉඳලම නැන්සි බොබිෆිට් එයාගෙ ප්‍රියතම ශිෂ්‍යාව බවට පත් කරගත් මිසිස් ඩොඩ්ස් මාව 'යක්ෂ පැටවුන්ගේ ' කුලකයට දාන්න අමතක කළේ නෑ. පන්ති කාමරයෙදි බැරි වෙලාවත් මගේ දිහාවට එයාගෙ වක ගැසුණු ඇඟිල්ලක් දිගු කරලා 'දැන් පැටියෝ, ඔයා' කියලා එයා කිව්වොත් එහෙම මට මාසෙකට විතර අනිවාර්යයෙන්ම පාසලෙන් පසු අතිරේක පාඩම්වලට නවතින්න වෙන බව මම දැනගෙන සිටියා.

එක වතාවක් එයා මට දඬුවමක් විදිහට පරණ ගණිත අභ්‍යාස පොත්වල ලියලා තිබුණු උත්තර මකන්න කිවුවා. මහ රෑ වෙනකල් ඒ වැඩේ කරන ගමන් 'මිසිස් ඩොඩ්ස් නම් මනුස්ස දුවෙක් වෙන්න

බැහැ' කියලා මං ග්‍රෝවර් එක්ක කිව්වම, මගේ දිහා හරිම බරපතළ විදිහට බලපු ග්‍රෝවර්, 'ඒක නම් සහතික ඇත්ත, බං' කියලා මගේ කතාව අනුමත කළා.

ග්‍රීක අවමංගල චාරිත්‍ර ගැන මිස්ටර් බෲනර් දිගටම කියවාගෙන ගියා.

ඒත් මගේ පිටුපසට වෙලා, ගල් කුලුනේ තිබුණු නග්න පිරිමියෙකුගෙ කැටයම ගැන තොරතෝංචියක් නැතුව කියවන නැන්සිව මට කංකරච්චලයක් වෙලයි සිටියේ. ඉවසගෙන ඉඳලා බැරිම තැන එයා දිහාට හැරුණු මම "ඔය දෙඩවිල්ල නවත්ත ගන්නවකො." කියලා කිවුවා. ඒත් මම හිතුවට වඩා සද්දෙට ඒක කියවුණේ පන්තියම හිනස්සවමින්.

කියමින් සිටි කතාව නවත්තලා මගේ පැත්තට හැරුණු මිස්ටර් බෲනර් "මට පේන්නෙ පර්සිට මේ ගැන මොනවා හරි කියන්න තියෙනවා වගේ." කිවුවා.

"නෑ සර්." මම කිව්වෙ මුහුණ රතු කරගෙන.

"බාගදා ඔයාට පුළුවන් වෙයි මේ කැටයමෙන් නිරූපණය කරන්නෙ මොකක්ද කියලා අපිට කියන්න?" ගල් කුලුනේ තිබුණු එක් කැටයමක් පෙන්වමින් මිස්ටර් බෲනර් කිවුවා.

කැටයම දිහා බලපු මට අස්වැසිල්ලක් දැනුණේ ඇත්තෙන්ම එය මට හඳුනාගන්න පුළුවන් වුණ නිසායි. "මේකෙන් පෙන්වන්නෙ ක්‍රෝනොස් එයාගෙ ළමයින්ව ගිලිනවා, නේද?"

"හරි. ඒත් එයා එහෙම කළේ?" මම දුන්න උත්තරය මිස්ටර් බෲනර්ට මදි වගෙයි.

"ම්ම්ම්.." කතාව මතක් කරගන්න මම මගේ මොළේ පහුරු ගෑවා. "ක්‍රෝනොස් කියන්නේ දෙවිවරුන්ගේ රජා, ඉතින් -"

"දෙවිවරුන්ගේ?" මිස්ටර් බෲනර් ඇහුවා.

"නෑ. නෑ. ටයිටන්වරුන්ගේ." මම නිවැරදි කළා. "ඉතින්, දෙවිවරු වුණු එයාගේ දරුවන්ව විශ්වාස කරන්න බැරිවුණ නිසා එයා ළමයි ටික ගිල දැම්මා, නේද? ඒත් එයාගේ බිරිඳ, සියුස් බබාව හංගලා, ඒ වෙනුවට ගල් ගෙඩියක් දුන්නා ක්‍රෝනොස්ට ගිලින්න. පස්සේ කාලෙක සියුස් ලොකු උනාම තාත්තගෙ බඩෙන් සහෝදර සහෝදරියෝ ටික වමාරවලා එළියට ගන්න උපක්‍රමයක් යෙදුවා."

"ඊයා..!" මගේ පිටුපස සිටි කෙල්ලෙක් බෙරිහන් දුන්නා.

"ඊට පස්සේ දෙවිවරු සහ ටයිටන්වරු අතරේ ලොකු යුද්ධයක් ඇති වුණා," මම කියාගෙන ගියා, "ඒකෙන් දෙවිවරු ජයග්‍රහණය කළා."

"හරියට මේවා අපිට ඇත්ත ජීවිතේදි ඕනෑ වෙයි වගේ," මට පිටුපසින් සිටි නැන්සි, එයාගේ යාළුවෙකුට කෙඳිරුවා. "හරියට අපි රස්සාවකට ඉල්ලනකොට, 'කරුණාකර,ක්‍රෝනොස් එයාගේ ළමයි ගිල්ල හේතුව පැහැදිලි කරන්න' කියලා අහයි වගේ."

"නැන්සිගෙ විශිෂ්ට ප්‍රශ්නය ගැන මොකද හිතන්නේ, පර්සි? මේ දේවල් අපිට සැබෑ ජීවිතේදි වැදගත් වෙන්නේ කොහොමද කියලා එයාට පැහැදිලි කරලා දෙන්නකෝ." මිස්ටර් බෲනර් මාව බෙල්ලටම හිර කළා.

"ඇදගෙන නෑවා," ග්‍රෝවර්, නැන්සි සිටි පැත්තට හැරිලා කුටු කුටු ගෑවා.

"කට වහගන්නවා." මූණ එයාගේ කොණ්ඩෙටත් වඩා රතු කරගෙන නැන්සි පිප්පුවා.

හැබැයි, ඒකෙන් අඩු තරමේ නැන්සිගේ කට ටිකකට වැහුණා. එයා කියන කට කැඩිච්ච කතා අල්ලගන්න පුළුවන් වුණේ මිස්ටර් බෲනර්ගෙ රේඩාර්වලට විතරයි.

මිස්ටර් බෲනර්ගේ ප්‍රශ්නය ගැන ටිකක් වෙලා කල්පනා කරලා මම උරහිස් ඇකිළුවා. "මම දන්නෑ, සර්."

"අයියෝ.." මිස්ටර් බෲනර්ගේ මූණට බලාපොරොත්තු කඩවුණ පෙනුමක් ආවා.

"හොඳයි, ලකුණු බාගයයි, මිසිටර් ජැක්සන්. ක්‍රෝනොස් ගිලපු ළමයි අමරණීය දෙවිවරු නිසා එයාලා පස්දෙනාම බඩ ඇතුළේ ජීර්ණයට ලක් නොවී, උස් මහත් වෙලා ජීවත් වුණා. ඉතින්, මෙයාලව එළියට ගන්න සියුස් අබ සහ වයින් මිශ්‍ර කරලා හදපු කෑමක් ක්‍රෝනොස්ට කන්න සැලැස්සුවා. ඒ කෑම නිසා ක්‍රෝනොස් එයාගෙ බඩේ හිටපු ළමයි ටික වැමෑරුවා. ඊට පස්සේ මේ දෙවිවරු එකතුවෙලා එයාලගේ තාත්තව පරාජය කළා. ක්‍රෝනොස්ගෙම දෑකැත්තෙන් ඔහුව කෑලිවලට කපලා, ඒ කෑලි ටාටරස්වල, ඒ කියන්නේ පාතාල ලෝකයේ අඳුරුම කොටසේ විසිරුවා.''

Scanned with CamScanner

ඔන්න ඒ ලස්සන කතාව ඉවර වෙනකොටම වගේ අපේ දවල් කෑම වෙලාවත් ඇවිල්ලා. "මිසිස් ඩොඩ්ස්ට පුළුවන් නේද අපිව එළියට එක්ක යන්න?"

පන්තියේ කෙල්ලෝ ටික බඩගින්නත් ඉවසගෙන පෝලිමට එළියට යද්දි, කොල්ලෝ ටික ඉක්මනට එළියට යන්න පොරකෑවා. මමත් ග්‍රෝවර්ව ඇදගෙන ඒ ගොඩට එකතු වෙන්න හදනකොටම මිස්ටර් බෲනර්ගෙ හඬ මට ඇහුණා. "පර්සි."

එයා කොයි වෙලේ හරි මාව අල්ලගනීවි කියලා මට කලින්ම හිතිලයි තිබුණෙ.

ග්‍රෝවර්ට යන්න කියලා මම මිස්ටර් බෲනර්ගෙ දිහාවට හැරුණා.

"සර්?"

අවුරුදු දහස් ගාණක් පුරාවට ලෝකෙ සිද්ධ වුණු හැම දෙයක්ම දකලා අත්දැකීම් ලබා ඇති බවක් පෙනුණ මිස්ටර් බෲනර්ගෙ දුඹුරු පාට තිබුණු ඇස් දෙකේ ඒ වෙලාවෙ නම් තිබුණේ මට ලේසියෙන් ගැලවිලා යන්න දෙන්නෙ නෑ කියනවා වගේ බැල්මක්.

"මම අහපු ප්‍රශ්නයට ඔයා උත්තරේ ඉගෙන ගන්න ඕනෑ," එයා මට කිවුවා.

"ටයිටන්ලා ගැනද?"

"සැබෑ ජීවිතය ගැන. දන් ඔයා ඉගෙන ගන්න දේවල් ජීවිතයට අදාළ කරගන්නේ කොහොමද කියන එක."

"ආහ්.."

"ඔයා මගෙන් ඉගෙන ගන්න දේවල් ජීවිතයට ඉතාමත් වැදගත්." මිස්ටර් බෲනර් කියාගෙන ගියා. "ඉතින්, මම බලාපොරොත්තු වෙන්නෙ ඔයා ඒ දේවල් ගැන විශේෂ සැලකිල්ලකින් කටයුතු කරයි කියලා. මම හැම වෙලාවෙම දකින්න කැමති ඔයාගෙ හොඳම දේ විතරයි, පර්සි ජැක්සන්."

මට ටිකක් කේන්ති ගියා. ඇයි දෙයියනේ, මේ මනුස්සයා මොකද මට මෙච්චර බල කරන්නෙ.

මම කියන්නෙ, ඇත්තටම, පන්තියේ තරඟ තියෙන දවස්වලට මිස්ටර් බෲනර් රෝමන්කාරයෙක් වගේ ඇඳගෙන ඇවිත්, කළු ලෑල්ල

ළඟට දුවලා ඉස්සර කාලෙ හිටපු හැම රෝමන්කාරයෙකුගේම නමයි, එයාගේ අම්මාගෙ නමයි, එයාලා මොන දෙවියන්ටද වැන්දෙ කියලයි කියන්න අපිට අභියෝග කරන කොට නම් එයා ජොලි තමයි. ඒ වුණත් මිස්ටර් බෲනර් මගෙන් බලාපොරොත්තු වෙන්නෙ මමත් අනිත් ළමයි තරම්ම දක්ෂ විදිහට වැඩ කරනවා දකින්න. මම වචන අන්ධතාවය සහ දෙයකට අවධානය දක්වන්න බැරි ආබාධය (ඒ.ඩී.එච්.ඩී.) තියෙන ළමයෙක් කියන එක එයා නොසලකා හැරලා. මට මෙච්චර කාලෙකට විභාගෙකින් සී පාස් එකකට වඩා හොඳ ප්‍රතිඵලයක් ගන්න හැකිවෙලා නැහැ. ඒත් මිස්ටර් බෲනර්ට ඕනෑ අනිත් ළමයින්ටත් වඩා හොඳට මම වැඩ කරනවා දකින්න. ඒ වුණාට ඔය ඉතිහාසෙ එන ඔක්කොම මිනිස්සුන්ගෙ නමුයි, අලගිය-මුලගිය තැනුයි මතක තියා ගන්නවා කෙසේ වෙතත් මට ඒවා හරියට කියවගන්නත් බැහැ.

"මීට වඩා තදින් උත්සාහ කරන්නම්," වගේ මොකක්ද එකක් මම මුමුණන අතරේ මිස්ටර් බෲනර් අර ගල් ස්මාරකය දිහාවට දුක්බර බැල්මක් හෙළුවේ හරියට එයාටත් ඒ ගෑනු ළමයාගේ අවමඟුලට සහභාගී වෙන්න සිද්ධ වුණා වගෙයි.

ඔන්න ඊටත් පස්සෙ තමයි කෑම කන්න යන්න මට අවසර ලැබුණේ.

කෞතුකාගාරයට ඇතුළුවන තැන පඩි පෙළ දිගට අපේ පන්තිය වාඩිවී සිටියා. එතන වාඩි වුණාම පස්වෙනි මාවතේ එහෙ-මෙහෙ යන ජනකාය හොඳට පෙනුණා.

අපිට ඉහළ අහසේ කළු පාට වලාකුළු පිරිලා, කැකෑරෙමින් තිබුණේ මේ පළාතේ මීට කලින් කවදාවත් නොදැකපු විදිහේ මහා කුණාටුවක් අතළඟ එන බව පෙන්වමින්. පසුගිය නත්තලෙන් පස්සේ නිව්යෝක්වල කාලගුණය හරිම අමුතු වෙලා තිබුණේ. විශාල හිම කුණාටු, ජල ගැලීම් වගේම අකුණු කෙටීම් නිසා ඇතිවුණු හදිසි ගිනිග ැනීම්වලටත් මුහුණ දෙන්න අපිට සිදුවුණා. ඉතින් ඒ වෙලාවේ සුළි සුළඟක් ආවත් මට ඒක ලොකු පුදුමයක් වෙන්නේ නැති වෙයි. මේ ඔක්කොම විපර්යාස වෙනවා ඇත්තේ ගෝලීය උෂ්ණත්වෙ ඉහළ යාම නිසා හරි, ඔය වගේ වෙන මොකක් හරි නිසා වෙන්න ඇති හිතලා මම හිත හදාගත්තා.

අහසේ පහළ වූ කුණාටුවේ පෙරනිමිති ගැන වෙන කවුරුත් අවධානය යොමු කළේ නැහැ. සමහර පිරිමි ළමයි, එයාලා ළඟ

Scanned with CamScanner

ඉතුරු වුණ කෑම කෑලි පරෙවියන්ට විසි කරමින් සිටියා. ඒ අතරේ, නැන්සි බොබිෆිට් කවුදෝ ගෑනු කෙනෙක්ගේ පසුම්බියට විදින්න උත්සාහ කරනවා මම දැක්කා. අනේ ඇත්තට, මිසිස් ඩොඩ්ස්ට කොයි වෙලාවකවත් ඒවා නම් පෙනුණේ නෑනේ.

මම ග්‍රෝවර් එක්ක ගිහින් අනිත් අය සිටි තැනින් ටිකක් ඈතට වෙන්න තිබූ වතුර මලක් අයිනේ ඉඳ ගත්තා. එහෙම කළොත් වටේ පිටේ මිනිස්සු අපිත් ඒ ඉස්කෝලේ - ඒ කියන්නේ අනිත් ඉස්කෝලවලින් එළවන ළමයින්ට යන්න තියෙන ඉස්කෝලේ ළමයි බව හිතන්නෙ නැතිවෙයි කියලා අපි හිතුවා.

"පන්තියේ වැඩිපුර වෙලා නතර කරගන්නවා කිව්වද?" ග්‍රෝවර් ඇහුවා.

"නැත්," මම කිවුවා. මිස්ටර් බෲනර් එහෙම නම් කරන්නෙ නැහැ. ඒත් එයා මට මගෙ පාඩුවේ ඉන්න දෙන්නෙ නෑනේ. මං කියන්නෙ, මට කවදාවත් එයා කියන විදිහේ ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක් වෙන්න බෑනේ."

ටික වෙලාවක් යනකල් ග්‍රෝවර් සද්ද නැතුව හිටියා. මම හිතුවේ මගේ හිත හැදෙන විදිහේ මොකක් හරි හරබර දාර්ශනික කතාවක් කියන්න මනුස්සයා තටමනවා කියලයි. අන්තිමේදි ග්‍රෝවර් ඇහුවේ, "මම ඔයාගෙ ඇපල් ගෙඩිය ගන්නද?"

මට කොහෙත්ම ලොකු බඩගින්නක් තිබුණෙත් නැති නිසා මම ඒක එයාටම දුන්නා.

පස්වෙනි මාවතේ ගිය වාහන පෝලිම දිහා බලාගෙන මම කල්පනා කළේ අපේ ගෙදර ගැනයි. ඒ නිවාස සංකීර්ණයට තිබුණේ අපි වාඩිවෙලා සිටි තැන ඉඳන් පොඩි දුරයි. නත්තලෙන් පසුව මට අම්මාව දකින්න අවස්ථාවක් ලැබුණේම නැති බව මතක් වෙනකොට පාරේ යන කුලී වාහනයක් අල්ලගෙන ගෙදරට ඉගිලෙන්න මට තදින්ම උවමනා වුණා. එහෙම ගියොත් මාව දකින්න ලැබුණට අම්මා ගොඩාක් සතුටු වෙයි, මාව බදාගනියි. ඒත් ඒ වගේම මං ගැන එයාගෙ තියෙන බලාපොරොත්තු කඩ වෙයි. මම මීට වඩා හොඳට වැඩ කරන්න උත්සාහ කරන්න ඕනෑ කියලා මට තදින්ම මතක් කර දීලා, අම්මා මාව අනිත් පැත්තට හරවලා යැන්සි එකට යවයි. ඇත්තම කියනවා නම්, මේ අවුරුදු හයට මම පාසල් හයකට මාරුවෙලා තිබුණා. පෙනුණ හැටියට නම්, මේ පාසලෙනුත් ළඟදිම මාව දොට්ට දාන තත්ත්වයක්

තිබුණේ. ඉතින් ඔය වගේ තත්ත්වයක් උඩ මම අම්මා බලන්න ගියොත්, අම්මිගේ මූණේ ඇතිවෙන දුක්බර පෙනුම දරාගන්න මට බැරිවෙයි කියලා හිතුණ නිසා මම ගෙදර යන අදහස එහෙමම අත හැරියා.

මිස්ටර් බෲනර්, එයාගේ රෝද පුටුව ආබාධිත අයට ගමන් කරන්න හදලා තිබුණු බෑවුම් මග පාමුල නවත්තගෙන, නවකතා පොතක් කියවන ගමන් සැල්දිරි කොළ කන්න ගත්තා. එයාගෙ රෝද පුටුව පිටුපසින් රතු පාට කුඩයක් ඉහළා තියෙනවා දැකලා මට මතක් වුණේ ජංගම ආපනශාලා මේසයක්.

මම, මගේ සැන්ඩ්විච් පාර්සලය දිග හරිද්දි නැන්සි, එයාගෙ කැත යාළුවෝ ටිකත් එක්ක මගේ ඉස්සරහට පාත්වුණා. එයාට සංචාරකයින්ගෙන් හොරකම් කරන වැඩෙන් ඇති හිතිලා වෙන්න ඇති කියලා මම හිතුවා. එයා බාගෙට කාලා ඉතුරු කළ කෑම එකක් ග්‍රෝවර්ගෙ ඔඩොක්කුවට අත හැරියා.

"ඔහ්," නැන්සි, එයාගෙ බොල්ලෑ දත් ඇන්ද පෙන්නා විරිත්තුවා. එයාගෙ මූණ පුරා තැඹිලි පාට ලප ගොඩාක් විසිරිලා තිබුණේ හරියට කවුරු හරි තීන්ත ඉසිනයක් මූණට අල්ලලා වගෙයි.

සන්සුන්ව ඉන්න මම උත්සාහ කළා. 'ඔයාගෙ තරහා පාලනය කර ගන්න, හෙමීට දහයට ගණන් කරන්න.' කියලා පාසලේ උපදේශක මට අනන්තවත් කියලා ඇති. ඒත් ඒ වෙලාවෙ මගෙ කේන්තිය ඉහළ නගිද්දි ඒ උපදෙස් ඔක්කොම මට අමතක වෙලා ගියා. මගේ කන් ඇතුළේ මුහුදු රැල්ලක් ගිගුම් දෙනවා මට දැනුණා.

එයාට අතක්වත් තැබුවා මට මතක නැහැ, ඒත්, ඊළඟට මට මතක, වතුර මල ළඟ ජලාශය ඇතුළේ පස්ස බිම ඇනගෙන වැටිලා, "පර්සි මාව තල්ලු කළෝ!" කියලා නැන්සි බෙරිහන් දුන් හැටියි.

මිසිස් ඩොඩ්ස් එතැනට ප්‍රාදුර්භූත වුණා.

එතැන සිටි ළමයි අතරේ කසුකුසුවක් පැතිරුණා; "ඔයා දැක්කද ඒක-"

"-වතුර-"

"-හරියට එයාව ඇදලා ගත්තා වගේ-"

එයාලා මොනවා කියවනවාද කියලා තේරුණේ නැතත්, මම ආයෙමත් අමාරුවක වැටුණා කියලා නම් මට හොඳට තේරුණා.

දුප්පත් නැන්සි පැටියට කරදරයක් නෑ කියලා දැනගත්තට පස්සේ, එයාට කෞතුකාගාරයේ තෑගි කඩෙන් අලුත් ඇඳුමකුයි, තව එක එක ඒවයි අරන් දෙන්න පොරොන්දු වුණ මිසිස් ඩොඩ්ස්, ඊට පස්සේ මාව අල්ලා ගත්තා. එයාගේ ඇස් දෙකේ ජයග්‍රාහී බැල්මක් තිබුණේ හරියට, මේ වාරය පුරාම එයා දකින්න බලාපොරොත්තුවෙන් සිටි දෙයක් මම කළා වගෙයි. "දැන්, පැටියෝ -"

"මං දන්නවා," මම ගෙරෙව්වා. "මාසයක්ම වැඩ පොත් මකන්න වෙනවා"

එහෙම කියපු එක හොඳ නම් නැහැ.

"යමු මාත් එක්ක," මිසිස් ඩොඩ්ස් කිවුවා.

"ඉන්න!" ග්‍රෝවර් කෑගැසුවා. "මමයි ඒක කළේ, මම තමයි එයාව තල්ලු කළේ."

මම ග්‍රෝවර් දිහා බලන් හිටියේ පුදුම වෙලා. ග්‍රෝවර් මාව ආරක්ෂා කරන්න උත්සාහ කිරීම මට අදහාගන්න බැරි වුණා.

ඒත් මිසිස් ඩොඩ්ස් මිනිහව මැරෙන්න බය කළා. එයා රවපු රැවිල්ලේ සැරට ග්‍රෝවර්ගෙ රැවුල් ගස් තුන හතරක් තිබුණු නිකට වෙවුලනවා මම දැක්කා.

"මම එහෙම හිතන්නෙ නෑ මිස්ටර් ග්‍රෝවර් අන්ඩර්වුඩ්," එයා කිවුවා.

"ඒත් -"

"ඔයා කට වහගෙන ඕතනට වෙලා ඉන්න."

බලාපොරොත්තු සුන් වූ ග්‍රෝවර් මගේ දෙස බැලුවා.

"අවුලක් නෑ, බං," මම කිවුවා. "එහෙම කියපු එකම ලොකු දෙයක්."

"වස්තුවේ," මිසිස් ඩොඩ්ස් කිවුවා. "දැන්වත් යමු."

එහා පැත්තෙ ඉඳන් නැන්සි බොබ්ෆිට් මට දත් නියෙව්වා.

'පස්සෙ අල්ල ගන්නම්' කියන බැල්ම නැන්සිට දාලා මම මිසිස් ඩොඩ්ස්ගේ පැත්තට හැරුණත් එයා එතන සිටියේ නැහැ. කෞතුකාගාරයට ඇතුළුවන පඩි පෙළ මුදුනේ සිටගෙන එයා මට ඉක්මනට එන්න කියනවා වගේ නොයිවසිල්ලෙන් අත වනමින් සිටියා.

එච්චර ඉක්මනට ඉගිළුණාද මන්දා!

සමහර වෙලාවට මට ඔය වගේ වැඩ වෙනවා. මගේ මොළේට නින්ද යනවද මන්දා, ඊළඟට මම දන්නෙ මට මොකක් හරි දෙයක් මග ඇරුණා කියලයි. හරියට අහසෙන් කෑල්ලක් කඩන් වැටිලා, ඒ හිඩැස ඇතුළෙන් හිස් අවකාශය දිහා මම බලන් ඉන්නවා වගෙයි. පාසල් උපදේශක නම් කියන්නේ, එහෙම වෙන්නේ ඒ.ඩී.එච්.ඩී නිසා මගේ මොළයට වටපිට දේවල් හරියට තේරුම්ගන්න බැරි වුණාමලු.

මට නම් එහෙම හිතෙන්නෙ නෑ.

මම මිසිස් ඩොඩ්ස්ගේ පස්සෙන් ගියා.

පඩි පෙළ නගින අතරේ මම ග්‍රෝවර් දෙස හැරිලා බැලුවා. සුදුමැලි වී සිටි එයා මගේ දෙසත් මිස්ටර් බෲනර් දෙසත් මාරුවෙන් මාරුවට බලමින් සිටියේ සිදුවන දේවල් මිස්ටර් බෲනර්ගේ අවධානයට ලක් කරන්න වගෙයි. ඒත්, මිස්ටර් බෲනර් සිටියේ නවකතා පොතේ ඇතුළටම ගිලිලා.

මම ඉස්සරහා බලනකොට මිසිස් ඩොඩ්ස් ආයෙමත් අතුරුදන් වෙලා. දැන් එයා හිටියේ පිවිසුම් ශාලාවේ එහා කොණේ.

නියමයි, මම හිතුවා. මෙයා ලෑස්ති වෙන්නෙ මං ලව්වා නැන්සිට අලුත් ඇඳුමක් අරන් දෙන්නද කොහෙද.

ඒත් යන විදිහට එහෙමත් නෙවෙයි වගේ.

කෞතුකාගාරේ ඇතුළටම මම මිසිස් ඩොඩ්ස්ව ලුහුබැන්දා. අන්තිමේදි මට එයාව අල්ලගන්න පුළුවන් වෙනකොට අපි ආපසු පෞරාණික ග්‍රීක හා රෝම අංශයටම ඇවිත් තිබුණා.

ඒ වෙලාවේ ශාලාවටම සිටියේ අපි දෙන්නා විතරයි. ග්‍රීක දෙවිවරුන්ගේ කැටයම් සහිත විශාල කිරිගරුඬ බිත්තිය ඉදිරියේ සිටගත් මිසිස් ඩොඩ්ස් අත් දෙකත් බැඳගෙන, උගුරෙන් අමුතු විදිහේ ගෙරවිල්ලක් වගේ හඬක් පිට කරන්න ගත්තා. ඒ සද්දෙ නැතත් මට භය වෙන්න තව හේතු තිබුණා. ගුරුවරයෙක් එක්ක තනිවෙන එක භයානක දෙයක්, විශේෂයෙන්ම මිසිස් ඩොඩ්ස් එක්ක. එයා ග්‍රීක දෙවිවරුන්ගේ කැටයම් දිහා බලාගෙන සිටියේ හරියට ඒක කුඩු පට්ටම කරලා දාන්න වගෙයි.

"ඔයා අපිට හරියට කරදර දුන්නා, වස්තුවේ," එයා කිවුවා.

Scanned with CamScanner

"ඔව්, මැඩම්," ආරක්ෂිතම විදිහට මම උත්තර දුන්නා.

"ඔයා හිතන්නෙ එහෙම කියලා පැනලා යන්න හම්බ වෙයි කියලාද?" ලෙදර් ජැකට්ටුවේ අත් දෙක මැණික් කටුව ළඟින් අදින ගමන් එයා ඇහුවා. එයාගේ ඇස්වල තිබුණේ තරහකටත් වඩා වැඩි දෙයක්. ඒක මහ යක්ෂ බැල්මක්.

එයා ගුරුවරියක් නේ, ඒ නිසා මට කරදරයක් කරන්නේ නැති වෙයි, මම එහෙම හිතුවේ හිතේ තිබුණු බය ඈරගන්න.

"ම-මම මීට වඩා හොඳට හැසිරෙන්න බලන්නම්, මැඩම්," මම කිවුවා.

අකුණු හඬකින් ශාලාවම දෙදුරුම් කෑවා.

"අපි මෝඩයෝ කියලා හිතන්න එපා පර්සි ජැක්සන්," මිසිස් ඩොඩ්ස් කිවුවා. "තුඹව නිරාවරණය කර ගන්න අපිට උවමනා වුණේ ටික කාලයක් විතරයි. පාපොච්චාරණය කරනවා, එහෙම කළොත් තුඹට වැඩිය විඳවන්න වෙන්නෙ නැති වෙයි."

එයා මොනවා ගැනද කියන්නෙ කියලා මට නම් තේරුණේ නැහැ.

මම හිතුවේ නේවාසිකාගාරේ මම රසකැවිලි හංගලා තියාගෙන අනිත් ළමයින්ට හොරෙන් විකුණපු එක එයාට අහුවෙන්න ඇති කියලායි. එහෙමත් නැත්නම්, ටොම් සෝයර් පොත ගැන මම රචනාව ලිවුවේ ඒ පොත අල්ලන්නෙවත් නැතුව අන්තර්ජාලෙන් කොපි කරලා බව එයාලා හොයා ගන්න ඇති. අයියෝ... එහෙම වුණොත් මට දුන්නු ලකුණු ටික කපලා දායිද දන්නේ නැහැ. ඊටත් වඩා විනාශයක් වෙන්නෙ එයාලා මට ඒ පොත කියවන්න කිව්වොතින්.

"ඉතින්?" එයා සැර කළා.

"මැඩම්, මම මුකුත්...."

"තුඹගේ කාලය ඉවරයි," එයා සර්පයෙක් වගේ පිම්බා.

අද්භූතම, භයානකම දේ සිද්ධ වුණේ ඊට පසුවයි.

මිසිස් ඩොඩ්ස්ගේ ඇස් දෙක ලිපේ අඟුරු වගේ දිලිසෙන්න පටන් ගත්තා. එයාගේ ඇඟිලි ඉදිරියට දිගුවෙලා, ඒවා කුරුල්ලන්ගේ නියපොතුවලට හැරුණා. එයාගේ ජැකට්ටුව දියවෙලා ගිහින් තටු දෙකක් හැදුණා. තව දුරටත් එතැන හිටියේ මිසිස් ඩොඩ්ස් නෙවෙයි,

කට පුරා කහ පාට දළ පිරුණු, වවුල් තටු සහ තියුණු පහුරු තිබුණු මැහැල්ලක්. එයා මාව කීතු කරන්න හදන බව මට තේරුණා.

ඒත්, ඊට පස්සේ සිදු වුණේ ඊටත් වඩා අමුතු දෙයක්.

මීට විනාඩියකට කලින් එළියේ සිටි මිස්ටර් බෲනර්, දත් පැනකුත් අතේ තියාගෙන වේගයෙන් අපේ දිහාවට රෝද පුටුව අරන් එනවා මම දැක්කා.

"අල්ල ගන්න, පර්සි!" කියලා කෑගසමින්, එයා අතේ තිබුණු පෑන මගේ දිහාවට විසි කළා.

මිසිස් ඩොඩ්ස් -එහෙමත් නැත්නම් එතන හිටපු අමුතු සතා-මට පහර දෙන්න පැන්නා.

මම කෑගසාගෙන පැත්තකට පනින කොට එයාගේ තියුණු පහුරු මගේ කන ළඟින් යනවා මට දැනුණා. පාවෙලා ආව බෝල්පොයින්ට් පෑන බිමට වැටෙන්න කලින් අල්ලගන්න මට පුළුවන් වුණා. ඒත්, ඒක මගේ අතේ දවටුනාට පස්සේ එතන තවදුරටත් තිබුණේ පෑනක් නෙවෙයි, කඩුවක්! ඒක තමයි මිස්ටර් බෲනර් ඉස්කෝලේ තරග තියෙන දවස්වලට නිතරම අරන් එන ලෝකඩ කඩුව.

මිසිස් ඩොඩ්ස් මිනීමරු බැල්මක් එක්ක මගේ දිහාවට හැරුණා.

මගේ දණහිස් දෙක ජෙලි වලින් හැදිලා වගේ ගැහෙන්න ගත්තා. මගේ අත් කොච්චර හයියෙන් වෙවුලුවාද කියනවා නම්, තව පොඩ්ඩෙන් මම කඩුවත් අත හරිනවා.

"මකබෑවියන්!" එයා ගෙරෙව්වා.

ඊත් එක්කම එයා කෙලින්ම මගේ දෙසට පියාඹා ආවා.

දැනුණු මර බයට මගේ ඇඟම හිරිවැටිලා. මට ඒ වෙලාවේ කරන්න පුළුවන් වුණේ එකම එක දෙයයි - මම කඩුව වැනුවා.

එයාගේ උරහිසේ වැදුණු කඩු තලය හරිම පහසුවෙන් ඇඟ හරහා පහළටම ගියේ හරියට එයා වතුරෙන් හැදිලා හිටියා වගෙයි. ස්...ස්....!

සුළි සුළඟකට හසු වූ වැලි මාළිගාවක් වගේ කුඩු පට්ටම වෙලා ගිය මිසිස් ඩොඩ්ස්ගේ ඉතුරු වුණ කහ පාට කුඩත් වාෂ්ප වෙලා ගියේ ගෙන්දගම් ගඳ විතරක් වාතයේ ඉතුරු කරමින්. ඒ සතාගේ මර ලතෝනිය ශාලාව ඇතුළේ තාමත් දෝංකාර දෙනකොට මට දැනුණේ

ඒ රතු පාටට දිලිසුණු ඇස් දෙක තවමත් මගේ දිහා බලාගෙන ඉන්නවා වගෙයි.

පෞරාණික ග්‍රීක හා රෝම අංශය ඇතුළේ මම තනියම හිටගෙන හිටියේ බෝල්පොයින්ට් පෑනකුත් අතේ තියාගෙනයි.

මිස්ටර් බෲනර්වත් වෙන කිසිම කෙනෙක්වත් අහලක හිටියේ නැහැ.

මගේ අත් දෙක තවමත් වෙවුලමින් තිබුණා. මට පෙනුණේ මම දවල්ට කාපු කෑමවල මොකක් හරි අවුලක් තිබිලා වගෙයි.

ඇත්තටම මේ ඔක්කොම දේවල් මම හිතෙන් මවා ගත් ඒවාද? මම ආපසු එළියට යද්දි වැස්සක් පටන්ගෙන තිබුණා.

කෞතුකාගාරයේ සිතියම ඔළුවට උඩින් අල්ලගෙන ග්‍රෝවර් වතුර මල ළඟ ඉඳගෙන සිටියා. එතැන එහා පැත්තේ නැන්සි තෙමිච්ච කිකිළියක් වගේ යාළුවෝ එක්ක කෙකර ගගා හිටියේ ජලාශයේ පීනලා ගොඩ ආව ගමන්. මාව දැක්කම එයා, "තමුසෙට අද නම් මිසිස් කෙර්ගෙ න් පස්ස රතු වෙනකල් කන්ඩ හම්බ වෙයි." කියලා කෑගැසුවා.

"කාගෙන්?" මම ඇසුවා.

"අපේ ටීචර්ගෙන්, මැට්ටෝ!"

මම තදින් ඇහි පිල්ලම් ගැසුවේ මතකය පැහැදිලි කර ගන්නයි. මිසිස් කෙර් කියලා ගුරුවරියක් අපිට හිටියේ නැතේ. මොනවා ගැනද කියවන්නේ කියලා මම නැන්සිගෙන් ඇහුවාම එයා සමච්චලේට වගේ බලලා යන්න ගියා.

මිසිස් ඩොඩ්ස් කොහෙද කියලා මම ග්‍රෝවර්ගෙන් ඇසුවා.

"කවුරු?" එයා ඇසුවා.

ඒත්, එයා එහෙම කිවුවේ පුට්ටක් වෙලා අරගෙනයි. ඒ වගේම තමයි එයා මගේ දිහා බැලුවෙත් නැහැ. ඉතින් ඒ නිසා මම හිතුවේ ග්‍රෝවර් මාව විහිළුවකට අරගෙන කියලායි.

"විහිළු නෙවෙයි බං," මම කිවුවා. "ඇත්තටම අහන්නේ."

අහසේ තවත් අකුණක් පිපිරුවා.

මිස්ටර් බෲනර් රතු පාට කුඩෙත් ඉහළගෙන පොත කියවමින් සිටියේ හරියට එක තත්පරයකටවත් එයා එතැනින් හෙලවුණේ නෑ වගෙයි.

මම එයා ළඟට ගියා.

එයා මගේ දිහා බැලුවේ ටිකක් අන්දබූත වෙලා වගෙයි. "ආහ්, මගේ පෑන නේද? මීට පස්සෙවත් මෙහෙම ගමනක් එනකොට තම තමන්ගේ පෑන් පැන්සල් අරන් එන්න පුරුදු වෙන්න, හරිද."

පෑන තවමත් මගේ අතේ බව මට මතක් වුණේ එයා කිව්වමයි. මම ඒක ආපසු මිස්ටර් බෲනර්ට දුන්නා.

"සර්," මම ඇසුවා. "මිසිස් ඩොඩ්ස් කොහෙද?"

"කවුද?" එයා මගේ දිහා බලන් හිටියේ හිස් බැල්මකින්.

"අද අපිත් එක්ක ආව අනිත් ටීචර්. අර අපිට ගණන් උගන්වන කෙනා?"

එයා ඇහි බැමි දෙකත් අකුළගෙන කල්පනා කරන ගමන් රෝද පුටුවේ හරි බරි ගැහුණා. "පර්සි, මිසිස් ඩොඩ්ස් කියලා කෙනෙක් අපිත් එක්ක මේ ගමන ආවේ නැහැ. මම දන්න තරමින් නම්, යැන්සි එකේ එහෙම නමක් තියෙන ගුරුවරියකුත් නැහැ. ඔයා හොඳින් නේද, දරුවෝ?"

Scanned with CamScanner

02

නාකි ආච්චිලා තුන් දෙනා ගොතපු මරණයේ මේස්

විටින් විට අත් විඳින්න වෙන අද්භූත අත්දැකීම්වලට කලින් මම හුරුවෙලයි සිටියේ. සාමාන්‍යයෙන් ඒවා ඉක්මනට ඉවර වෙනවා. ඒත් සති ගාණක් තිස්සේ අත් විඳින්න වුණ මේ මායාකාරී සිද්ධිය මට දරාගන්න අමාරු වුණා. ඉතිරි පාසල් වාරය පුරාම මට දැනුණේ මුළු ඉස්කෝලෙම අය මාව රවට්ටන්න විහිළුවක් කරනවා වගෙයි. මිසිස් කේර්ව - රන් පාට කොණ්ඩයක් තිබුණු අහංකාර චරිතයක් - එදා ක්ෂේත්‍ර චාරිකාව ඉවරවෙලා අපි ආපසු යන්න බසයට නගින වෙලාවේ මුලින්ම දකින්න කලින් මම ජීවිතේට දැකලා තිබුණේ නෑ. ඒ වුණත් නත්තලෙන් පසු අපිට දිගටම ගණිතය ඉගැන්වූවේ එයා කියලා මුළු ඉස්කෝලෙම ළමයි එක හෙළාම කිවුවා.

මම නිතරම වගේ කාත් එක්ක හරි කතා කරන කොට මිසිස් ඩොඩ්ස් ගැන සඳහනක් කළේ එයාලට බැරි වෙලාවත් මොනවා හරි කියවෙයිද බලන්නයි. ඒත්, එහෙම වෙලාවට එයාලා මගේ දිහා බලන් හිටියේ හරියට පිස්සෙක් දිහා බලනවා වගෙයි.

ඔහොම යනකොට මමත් මුළුමනින්ම වගේ එයාලව විශ්වාස කළා - මිසිස් ඩොඩ්ස් කියලා කෙනෙක් කවදාවත් සිටියේ නැහැ.

කොහෙත්ම නැහැ.

ඒත් මාව ගොනාට අන්දන්න ග්‍රෝවර්ට නම් බැරි වුණා. මම මිසිස් ඩොඩ්ස්ගේ නම මතක් කළාම එයා ටිකක් අදිමදි කරලා, පස්සේ මට කියනවා එහෙම කෙනෙක් හිටියේ නැහැ කියලා. ඒත්, එයා කියන්නේ බොරු කියලා මම දැනගෙන සිටියා.

මොකක් හරි දෙයක් සිද්ධ වෙමින් තිබුණා. කෞතුකාගාරෙදි මොකක් හරි දෙයක් වෙලා තිබුණා.

දවල් කාලයට නම් මට මේ දේවල් කල්පනා කරන්න වෙලාවක් තිබුණේ නැහැ. ඒත් රෑට, වවුල් තටුයි නිය පහුරුයි එක්ක එන මිසිස් ඩොඩ්ස්ගේ දර්ශන මාව හීනෙන් බය කළා.

කාලගුණය දිගටම පිස්සු නැටුවේ මගේ හිත තවත් අවුල් කරමින්. එක රෑක අකුණු කුණාටුවක් අපේ නේවාසිකාගාරය ළඟින්ම හමාගෙන ගියා. ඊට ටික දවසකට පස්සේ මෙච්චර කාලයකට හඩ්සන් නිම්නයේ දකින්න ලැබුණු ලොකුම ටොනේඩෝව හමාගෙන ගියේ යැන්සි විද්‍යාලයේ ඉඳලා හැතැප්ම පනහක් විතර දුරින්. මේ දවස්වල අපි සමාජ අධ්‍යයනය විෂයේ කාලීන සිදුවීම්වලට ඉගෙන ගත්තෙත් මේ අවුරුද්දේ අත්ලාන්තික් සාගරය හරහා හමාගිය අසාමාන්‍ය හදිසි කුණාටු ප්‍රමාණය ගැනයි.

මට නිතරම වගේ අනිත් අයව තුරුස්සන ගතියකුත්, මගේ ඔළුව අවුල් ගතියකුත් දැනෙන්න ගත්තා. විභාගවලින් මම ගන්න ශ්‍රේණි ඩීවල ඉඳන් එෆ්වලටම බැස්සා. නැන්සි එක්කත් මම නිතරම රණ්ඩු කරගත්තා. පන්තියට එන හැම ගුරුවරයාම වගේ මාව පන්තියෙන් එළියේ හිට ගස්සවලා තියන්න හේතු හොයාගත්තා.

අන්තිමේදී, දවසක් අපේ ඉංග්‍රීසි ගුරුතුමා - මිස්ටර් නිකොල්, මම අක්ෂර වින්‍යාස විභාගවලට පාඩම් කරන්න මෙච්චර කම්මැලි වෙන්නෙ ඇයි කියලා සියවෙනි සැරේටත් මගෙන් ඇහුවාම මම එයාගේ ඇඟට කඩාගෙන පැන්නා. මම එයාට නාකි බේබද්දා කිවුවා. ඒ වචනේ තේරුම නම් මම හරියට දන්නේ නෑ, ඒත්, එහෙම කියන එක හොඳයි කියලා මට හිතුණා.

ඊළඟ සතියේ විදුහල්පති, යැන්සි විද්‍යාලයේ ඊළඟ අවුරුද්ද සඳහා මාව බඳවා ගන්නේ නැති බව නිල වශයෙන්ම දන්වලා මගේ අම්මට ලියුමක් යැව්වා.

මරු, මම, මටම කියා ගත්තා. මරේ මරු.

මට තිබුණේ ගෙදර යන ආසාව.

මට ඕනෑ වුණේ අපේ පුංචි ගෙදරට වෙලා අම්මාත් එක්ක ඉන්නයි. එතකොට මට සාමාන්‍ය ළමයි යන ඉස්කෝලෙට යන්න වෙනවා කියලත්, ඒ වගේම මට මගේ ජරා බාප්පා එක්ක ජීවත් වෙන්න වෙනවා කියලත් මම දැනගෙන හිටියා. ඒ මොන දේ වුණත් මට උවමනා වුණේ ආයෙත් අම්මා ළඟට යන්නයි.

ඒ වුණාට, මම දාලා යන්න අකමැති සමහර දේවලුත් යැන්සි එකේ තිබුණා. මගෙ කාමරයේ ජනේලයෙන් පේන කැලේ, ඈතින් පේන හඩ්සන් ගඟ, පයින් ගස්වලින් හමන සුවඳ. ඒ වගේම ග්‍රෝවර් නැතුවත් මට හුඟක් පාළු හිතෙයි. ටිකක් අමුතු කෙනෙක් වුණාට එයා මට හොඳ යාළුවෙක් වුණා. මම දුක් වුණේ, මං නැතිව මේ මනුස්සයා ලබන අවුරුද්ද කොහොම ගෙවයිද කියලායි.

මට ලතින් පන්තියත් නැති වෙනවා නේ. මිස්ටර් බෲනර්ගේ පිස්සු තරඟාවලිවලට මට ආයේ එකතු වෙන්න ලැබෙන්නේ නැතුව යනවා. මම ඊට වඩා හොඳට වැඩ කරයි කියලා එයා කොච්චර නම් විශ්වාස කළාද.

වාර අවසාන විභාගය ළං වෙනකොට මම පාඩම් කළේ ලතින් විතරයි. මේ විෂයෙන් මම ඉගෙන ගන්න ඒවා මගේ ජීවිතය සහ මරණය තීරණය කරාවි කියලා මිස්ටර් බෲනර් කියපු කතාව මට අමතක වුණේ නැහැ. මම මිස්ටර් බෲනර්ව විශ්වාස කරන්න පටන් ගත්තේ ඇයි කියලා මටම හිතා ගන්න බැරි වුණා.

අන්තිම විභාගයට කලින් දවසේ මට කොච්චර පීඩනයක් දැනුණාද කිව්වොත් මම 'ග්‍රීක පුරාණ ප්‍රවාදයට කේම්බ්‍රිජ් මග පෙන්වීම' පැත්තකට විසිකරලා දැමුවා. ඒකේ වචන පොත පුරා පීනගෙන ඇවිත් මගෙ ඔළුව වටේ කැරකෙන්න ගත්තා. පොතේ අකුරු නටන්න ගත්තේ හරියට හිම උඩ ලිස්සලා යනවා වගෙයි. එක ලතින් වචනයකින් තවත් වචනයක් වෙන්කර හඳුනා ගන්නේ කොහොමද කියලවත් තේරුම් ගන්න මට බැරි වුණා. එතකොට ලතින් ක්‍රියා පද වර නැඟීම? අයියෝ..!

මම කාමරේ එහෙට මෙහෙට ඇවිද්දා. මට දැනුණේ මගේ කමිසේ ඇතුළේ කූඹි දඟලනවා වගෙයි.

මට මිස්ටර් බෲනර්ගේ බරපතළ බැල්ම මතක් වුණා. "මම හැම වෙලාවෙම දකින්න කැමති ඔයාගෙ හොඳම දේ විතරයි, පර්සි ජැක්සන්."

මම ලොකු හුස්මක් අරගෙන ග්‍රීක පොත ආයෙත් අහුලා ගත්තා.

මම ඊට කලින් කවදාවත් ගුරුවරයෙකුගෙන් උදව් ඉල්ලා නැහැ. මම මිස්ටර් බෲනර් එක්ක කතා කළොත් සමහර විට එයා පාඩම් කරන්න ඕනෑ කරුණු ටිකක්වත් මට පෙන්වා දේවි. අඩු තරමේ එයාගේ විෂයට මම ගන්න යන තඩි එෆ් එක ගැන සමාව ඉල්ලන්නවත් මට පුළුවන් වේවි. මගේ උපරිමයට යන්න මම උත්සාහයක්වත් ගත්තේ නැහැ කියලා මම යැන්සි එකෙන් යද්දි එයා හිතනවට මම කැමති වුණේ නැහැ.

මම පඩි පෙළ බැහැලා ගුරුවරුන්ගේ කාර්යාල පැත්තට ඇවිදන් ගියා. හුඟක් ඒවා ඒ වෙද්දි හිස්වෙලා කළුවරේ තිබුණා. ඒත්, මිස්ටර් බෲනර්ගේ කාමරේ දොර අඩවල් කරලායි තිබුණේ. ඒ හිඩැස හරහා කාමරයේ එළිය කොරිඩෝවේ බිමට වැටිලා තිබුණා.

කාර්යාලය ඇතුළෙන් මට කටහඬවල් ඇහෙද්දි මම සිටියේ දොරේ අල්ලුවට අඩි තුනක් විතර මෙහායිනුයි. මිස්ටර් බෲනර් ප්‍රශ්නයක් අහනවා ඇහුණා. ඒකට උත්තර දුන් කටහඬ වෙන කාගෙවත් නෙවෙයි, ග්‍රෝවර්ගේ. "... දුක් වෙන්නේ පර්සි ගැන, සර්."

මම හිටි තැනම ගල්වුණා.

මම සාමාන්‍යයෙන් එහෙම අනුන්ගේ කතාවලට හොරෙන් ඇහුම්කන් දෙන කෙනෙක් නෙවෙයි. ඒ වුණාට, ඔයාට වුණත් පුළුවන්ද ඔයාගෙ හොඳම යාළුවා වැඩිහිටියෙක් එක්ක ඔයා ගැන කතා කරද්දි ඇහුම්කන් නොදී ඉන්න?

මම තවත් අඟලක් විතර කිට්ටු වුණා.

"... මේ ගිම්හාන කාලෙදි තනියම." ග්‍රෝවර් කිය කියා සිටියා. "මම කියන්නේ, කාරුණික ඇත්තෙක් ඉස්කෝලෙටම ආවා! දැන් අපි ටක්කෙටම දන්නවා කියන්නේ, උනුත් දන්නවා කියන එකනේ-"

"එයාව ඉක්මන් කරන එකෙන් වෙන්නේ මේ ප්‍රශ්න තවත් නරක අතට හැරෙන එකයි," මිස්ටර් බෲනර් කිව්වා. "කොල්ලා තව ටිකක් මෝරනකල් අපිට ඉන්න වෙනවා."

"ඒත්, එයාට එච්චර කාලයක් නැතිවෙයිනේ. උත්තරායන කාලය වෙනකොට-"

"එයා නැතුව අපිට ඒක විසඳගන්න වෙනවා, ග්‍රෝවර්. මේ කරදරවලට පැටලෙන්නෙ නැතුව විනෝදෙන් ඉන්න පුළුවන් කාලෙ එයා එහෙම හිටපුදෙන්."

"ඉතින් සර්, එයා අර ගැහිච දක්කනේ.."

"එයා හිතින් මවා ගන්න ඒවා," මිස්ටර් බෲනර් මැදට පැන්නා. "ඒක එයාට ඒත්තු ගන්වන්න ළමයි අතරෙයි ගුරුවරු අතරෙයි පැතිරිලා තියෙන අවුල ඇති වෙයි."

"සර්, ම... මට බැහැ සර් ආයෙමත් මගේ රාජකාරිය වරද්ද ගන්න." ග්‍රෝවර්ගේ කටහඬ හැඟීම්බර වෙලා තිබුණේ. "ඔයා දන්නවනේ එහෙම වුණොත් මට වෙන දේ?"

"ඔයා වරද්දගෙන නැහැ, ග්‍රෝවර්," මිස්ටර් බෲනර් කාරුණික ලෙස කිවුවා. "ඒ ගැනි මොකටද ආවේ කියලා මට කලින්ම තේරුම ගන්න තිබ්බා. දැන් මේ දේවල් ඔක්කොම පැත්තකින් තියලා, අපි කල්පනා කරමු පර්සිව ජීවතුන් අතර තියාගන්නේ කොහොමද කියලා ඊළඟ-"

"දඩාස්" ගාලා ලොකු සද්දයක් ආවේ මගේ අතින් බිමට වැටුණු ග්‍රීක පොතෙන්.

මිස්ටර් බෲනර් නිශ්ශබ්ද වුණා.

මගෙ පපුව හයියෙන් ගැහෙන ගත්තා. මම ඉක්මනට පොතත් අහුලාගෙන ආපස්සට ගියා.

මිස්ටර් බෲනර්ගේ කාර්යාල දොරේ වීදුරුව හරහා උස හෙවණැල්ලක් වැටුණා. එච්චර උස හෙවණැල්ලක් අපේ රෝද පුටුවේ ඉන්න ගුරුතුමාට නම් තියෙන්න විදිහක් නැහැ. එතකොට, එයා අතේ තියන් ඉන්නවා වගේ හෙවණැල්ලෙන් පෙනුණේ මොකක්ද, දුන්නක්ද?

ළඟින්ම තිබුණු කාමරයේ දොර ඇරගෙන මම ඇතුළට රිංගුවා.

තත්පර ගාණකට පසු මම සිටි කාමරේ දොර ළඟින් ක්ලොප්-ක්ලොප්-ක්ලොප් සද්දයක් ඇහුණේ හරියට රෙදි කෑලි වටේට ඔතපු ලී කුට්ටි බිම වදිනවා වගෙයි, ඊට පස්සේ සතෙක් නහයෙන් පිඹිනවා වගේ හඬකුත් ඇහුණා. ලොකු, අඳුරු රූපයක් දොරේ වීදුරුව ඉදිරියේ නතරවෙලා, ටිකකින් ඉදිරියට ගියා.

මගෙ බෙල්ල දිගේ දාඩිය බිංදු ගලන්න පටන් ගත්තා.

කොරිඩෝවේ කොහේ හෝ තැනක ඉඳන් මිස්ටර් බෲනර් කතා කරනවා ඇහුණා. "මුකුත් නැහැ," එයා මිමිණුවා. "දක්ෂිණායනයෙන් පස්සේ ඉඳලම් මගේ ස්නායු හරියට වැඩ කරන්නේ නැහැ වගේ."

"මගෙත් එහෙමද කොහෙද," ග්‍රෝවර් කියනවා ඇහුණා. "හැබැයි මට දිවුරන්න වුණත් පුළුවන්..."

"ඔයා දැන් ඔයාගේ කාමරේට ගියොත් හොඳයි," මිස්ටර් බෲනර් එයාට කිවුවා. "හෙට තියෙන විභාගවලට ලෑස්ති වෙන්නත් තියෙනවා නේද?"

"ඒක ගැන නම් මතක් කරන්නවත් එපා."

මිස්ටර් බෲනර්ගේ කාර්යාල කාමරෙන් ආව එළිය නිවිලා ගියා.

කළුවරේම ඒ කාමරේට වෙලා මම හිටිය ටික වෙලාව මට දැනුණේ හරියට කල්පයක් වගෙයි.

අන්තිමේදී, මම ඒ කාමරයෙන් එළියට ඇවිත් හෙමින් සීරුවේ මගේ කාමරේට ගියා.

මම යනකොට ග්‍රෝවර් ඇඳේ පෙරළිලා ලතින් සටහන් වගයක් පාඩම් කරමින් සිටියේ හරියට එයා මුළු රෑම එතැනට වෙලා හිටියා වගෙයි.

"හේයි," නිදිමතෙන් වගේ එයා කිවුවා. "ඔයා මේ විභාගෙට පාඩම් කරන්නේ නැද්ද?"

මම උත්තර දුන්නේ නැහැ.

"අවුලෙන් වගේ මොකද?" එයා නළල රැළි කරගෙන ඇසුවා. "මොකක් හරි ප්‍රශ්නයක්ද?"

"නෑ... ටිකක් මහන්සියි වගේ."

මම අනිත් පැත්තට හැරුණේ එයාට මගේ මුහුණේ තිබුණු හැඟීම් කියවන්න බැරි වෙන්නයි. නිදාගන්න හිතාගෙන මම ඇඳුම් මාරු කරගත්තා.

පහළ තට්ටුවේදී ඇසුණු දේවල් තේරුම් ගන්න මට බැරි වුණා. ඒවා ඔක්කොම මම හිතින් මවාගත් ඒවා කියලා විශ්වාස කරන්නයි මට ඕනෑ වුණේ.

Scanned with CamScanner

ඒත්, එක දෙයක් නම් පැහැදිලියි. ග්‍රෝවර් මිස්ටර් බෲනර් එක්ක මට හොරෙන් මං ගැනයි කතා වෙමින් සිටියේ. එයාලා හිතුවේ මම ඉන්නෙ මොකක් හරි අනතුරක කියලයි.

***

ඊළඟ දවසේ හවස මම පැය තුනක ලතින් විභාගයක් ඉවර කරලා යන ගමන් සිටියේ. මම වැරදියට ලියපු ඔක්කොම ග්‍රීක හා රෝම නම් මගේ ඇස් දෙක ඉස්සරහා පාවෙවී තිබුණා. ඒ වෙලාවේ මිස්ටර් බෲනර් ආපසු මට ඇතුළට කතා කළා.

එක මොහොතකට මට හිතුණේ, මම ඊයේ රෑ එයාලගේ කතාව හොරෙන් අහගෙන සිටි බව සර්ට මාට්ටු වෙලා කියලයි. ඒත්, ප්‍රශ්නෙ ඒක නෙවෙයි වගෙයි.

"පර්සි," එයා කිවුවා. "යැන්සි එක දාලා යනවා කියලා පහු බහින්න එපා. ඒක... ඒක වුණේ හොඳටයි කියලා හිතන්න."

එයා ඒක කාරුණික විදිහට කිවුවා වුණත්, ඒ වචන මාව අපහසුවට පත් කළා. එයා ඒවා හෙමීට කිව්වට, ඒ වෙලාවේ විභාගය කරමින් සිටි ළමයින්ට ඒවා හොඳට ඇහුණා. නැන්සි බොබෆිට් කට ඇද කරලා විරිත්තුවා.

"හරි, සර්," මම මිමිණුවා.

"මම අදහස් කළේ..." මිස්ටර් බෲනර්, එයාගේ රෝද පුටුව ඉස්සරහට පස්සට කළේ හරියට මොනවා කියන්නද කියලා අදහසක් නැතුව වගෙයි. "ඔයාව හරියන්නේ මෙහෙට නෙවෙයි. ඒක තීරණය වෙන්න කාලයක් ගියා විතරයි."

මගේ ඇස් දෙකෙන් තරු විසි වුණා.

මම ගොඩක්ම කැමැත්තෙන් හිටිය ගුරුවරයා, මුළු පන්තියම ඉදිරියේ මට කියනවා, මාව මේ ඉස්කෝලෙන් එළවන එක සාධාරණයිලු.

"ඇත්ත," මම කිවුවේ වෙවුලමින්.

"නෑ, නෑ," මිස්ටර් බෲනර් කිවුවා. "ඔහ්, මම කියපු දේ ඔයා පටලගත්තා. මම කියන්න හැදුවේ... ඔයා සාමාන්‍ය කෙනෙක් නෙවෙයි, පර්සි. ඒක නොහොත්ම-"

"බොහොම ස්තුතියි, සර්, ඒක මතක් කරලා දුන්නාට," මම ගුරුතුමාගේ මුණටම කිවුවා.

"පර්සි-"

ඒත්, මම නවතින්නේ නැතුව දිගටම ගියා.

වාරය ඉවර වෙන දවසේ මම, මගේ ඇඳුම් ටික සූට්කේස් එකට එබුවා.

අනිත් කොල්ලෝ විහිළු කර කර, එයාලා නිවාඩුවට කරන්න හිතන් ඉන්න දේවල් ගැන කතාවෙමින් සිටියා. එක්කෙනෙක් ස්විස්ටර්ලන්තේ කඳු නගින්න යනවලු. තවත් කෙනෙක් බටහිර ඉන්දිය කොදෙව් දූපත්වලට නැවෙන් සංචාරයක් යනවලු. එයාලා හැම දෙනාමත් මං වගේම, අනිත් ඉස්කෝලවලින් පිටුවහල් කරපු අය තමයි. ඒ වුණාට එයාලා සල්ලිකාර පිටුවහල්ලුනේ. එයාලගේ තාත්තලා විධායක නිලධාරියෝ, එහෙමත් නැත්නම් තානාපතිලා, සමහරු ප්‍රසිද්ධ අයගේ ළමයි. ඒත්, මම වැදගැම්මකට නැති පවුලකින් ආව වැදගැම්මකට නැති කොල්ලෙක් විතරයි.

මම මේ ගිම්හාන නිවාඩුවේ කොහේද යන්නේ කියලා එයාලා මගෙන් ඇහුවම මම ආපසු නගරෙට යනවා කියලා මං කිවුවා.

හැබැයි, මේ නිවාඩු කාලෙදි පත්තර විකුණන රස්සාවක්, නැත්නම් බල්ලෝ ඇවිද්දවන්න යන රස්සාවක් වගේ පොඩි රස්සාවක් කරන්න මට සිද්ධ වෙනවා කියලා මම එයාලට කියන්න ගියේ නැහැ.

"ඔහ්," එක්කෙනෙක් කිවුවා. "ඒක නම් නියමයි."

ඊට පස්සේ එයාලා නැවතත් එයාලාගේ කතාව දිගටම කරගෙන ගියේ හරියට මම එතන හිටියෙවත් නැති ගාණටයි.

මම සමුදෙන්න බයේ සිටි එකම කෙනා ග්‍රෝවර් විතරයි. ඒත්, එහෙම කරන්න ඕනෑ නැති බව මම දැනගත්තේ පස්සේයි. මොකද, මම යන්න හිටපු බසයේම එයාත් මැන්හැටන්වලට යන්න ටිකට් අරන් තිබුණා. ඉතින් අපි දෙන්නට එකටම නගරෙට යන්න පුළුවන්කම තිබුණා.

බසයේ ගිය ගමන පුරාවට ග්‍රෝවර් කළේ සැකෙන් වගේ අනිත් මගියෝ දිහා බල බලා ගිය එකයි. අපි යැන්සි එකෙන් පිටට ගිය හැම වෙලාවකදිම ග්‍රෝවර් හැසිරුණේ මේ විදිහට කියලා ඒ වෙලාවේ මගේ මතකයට ආවා. හරියට, මොකක් හරි නරක දෙයක් සිද්ධ වෙයි කියන බයෙන් එයා හිටියා වගෙයි. කලින් නම් මම හිතුවේ අනිත් කට්ටිය

එයාව විහිළුවට ගනී කියලා බයෙන් ඉන්නවා ඇති කියලයි. ඒත්, මේ බසයේ එයාව විහිළුවට ගන්න ඉන්නේ කවුද...

අන්තිමේදී, එයාගේ මේ හැසිරීම මට බලාගෙන ඉන්න බැරිවුණා.

"කාරුණික ඇත්තෝ ඉන්නවද කියලද බලන්නේ?"

ග්‍රෝවර් උඩ ගියා. "ඇ-ඇයි එහෙම ඇහුවේ?"

මිස්ටර් බෲනර් සහ එයා අතරේ ඇති වූ කතාව මම හොරෙන් අහගෙන සිටියා කියලා මම එයාට ඇත්තම කිවුවා.

"ඔයාට කොච්චරක් ඇහුණද?" ඇස් දෙකත් මොකදෝ කරගෙන ග්‍රෝවර් ඇහුවා.

"අහ්.. වැඩිය මුකුත් නැහැ. මේ... මොකක්ද උත්තරායන කාලය කියන්නේ?"

එයා පුදුමැලි වුණා. "බලන්න, පර්සි... මම දුක් වෙමින් හිටියේ ඔයා ගැන. ඔයා බහුබූත ගණන් ටීචර් කෙනෙක් ගැන මනස්ගාත මවාගෙන.."

"ග්‍රෝවර්-"

"ඉතින්, මම මිස්ටර් බෲනර් එක්ක කිය කියා හිටියේ ඔයාට ආතතිය හරි ඒ වගේ මොකක් හරි හැදිලද දන්නෑ කියලා. මොකද, මිසිස් ඩොඩ්ස් කියලා කෙනෙක් හිටියෙත් නැහැ, අනික.."

"ග්‍රෝවර්, ඔයාට ඔයිට වඩා හොඳට බොරු කියන්න ඉගෙන ගන්න වෙනවා."

එයාගේ කන් දෙක රතු වුණා.

කමිස සාක්කුවෙන් කුණු ගැවුණු කාඩ් එකක් ගත් ග්‍රෝවර් ඒක මට දුන්නා. "මේක තියාගන්න. මේ නිවාඩු කාලෙදී බැරි වෙලාවත් ඔයාට මගේ උදව් ඕනෑ වුණොත් එහෙම."

ඒ කාඩ් එකේ තිබුණේ හැඩ දාලා ලියපු අකුරු වගයක්. ඒවා කියවගන්න මට ගොඩක් අමාරු වුණා. ඒත් අන්තිමේදී මට යන්තම් වචන ටික තේරුම්ගන්න පුළුවන් වුණා.

ග්‍රෝවර් අන්ඩර්වුඩ්, රැකවල්කරු
අර්ධ-ලෝහිත කන්ද

ලෝන්ග් අයිලන්ඩ්, නිව්යෝර්ක්
(800)009-0009

"මොකක්ද අර්ධ-"

"කෑ ගහන්න එපා මෝඩයෝ !" එයා බෙරිහන් දුන්නා. "ඒක තමයි, ම්..ම්... මම ගිම්හාන කාලේ ඉන්න තැන."

මට දුක හිතුණා. එහෙනම් ග්‍රෝවර්ටත් ගිම්හාන බංගලාවක් තියෙනවා. යැන්සි එකේ ඉන්න අනිත් ළමයි වගේම ග්‍රෝවර්ගේ පවුලේ අයත් සල්ලිකාරයෝ වෙන්න ඇති කියලා මීට කලින් කවදාවත් මට හිතිලා තිබුණේ නැහැ.

"හරි," මම කිවුවේ මූහුණ කළු කරගෙන. "එහෙනම්, මට ඔයාලගේ බංගලාව පැත්තේ එන්න හිතුණොත් ආවට කමක් නැද්ද?"

එයා ඔළුව වැනුවා. "ඔව්. එහෙමත් නැත්නම්... ඔයාට මාව ඕනෑ වුණොත්."

"මට මොකටද ඔයාව ඕනෑ වෙන්නේ?"

මම හිතුවට වඩා රළු විදිහට ඒක කියවුණා.

ග්‍රෝවර්ගේ බෙල්ල මුලටම යනකම් රතු පාට වුණා. "බලන්න, පර්සි. ඇත්තටම, ම-මට ඔයාව ආරක්ෂා කරන්න සිද්ධ වෙලා තියෙනවා."

මම එයා දිහා බලාගෙන හිටියා.

මුළු අවුරුද්ද පුරාම අනිත් ළමයි එක්ක මම වලි දාගත්තේ ඒ ළමයින්ගෙන් වෙන දාමරිකකම් වලින් ග්‍රෝවර්ව ඈත් කරලා තියාගන්නයි. ලබන අවුරුද්දේ මම නැතුව මෙයා ගුටි කයිද කියලා කල්පනා කරලම මට නින්ද ගියෙත් නැහැ. දැන් මෙයා කියනවා එයාලු මාව ආරක්ෂා කරන්නේ.

"ග්‍රෝවර්," මම කිවුවා. "ඇත්තටම මොනවාගෙන්ද ඔයා මාව ආරක්ෂා කරන්නේ?"

මොකක්දෝ තදින් ඇතිල්ලෙන හඬක් අපේ කකුල්වලට යටින් ආවා. බසයේ ඉදිරියෙන් කළු පාට දුමක් ගලන්න පටන් ගත්තේ මුළු බසයේම කුණු බිත්තර ගඳක් පතුරුවමින්. බසයේ රියැදුරා කට යටින් ශාප කරමින් බසය පාරෙ අයිනට කරලා නැවැත්තුවා.

එන්ජිමේ කැලිවලට විනාඩි දෙක තුනක් තිස්සේ තට්ටු දාලා බලපු රියැදුරා අපි ඔක්කෝටම බසයෙන් බහින්න කිවුවා. ඉතින්, මම ග්‍රෝවර් එක්ක අනෙක් අය පසුපසින් බසයෙන් එළියට ඇදුණා.

අපි සිටියේ ගම්බද පැත්තකයි. බසය එතැනදිම කැඩුණේ නැත්නම් ඒ වගේ තැනක් තියෙනවා කියලා කවදාවත් මතක හිටින්නෙත් නැතිවෙයි. අධිවේගී පාරේ අපි සිටි පැත්තේ තිබුණේ මේපල් ගසුයි, පාරේ යන කාර්වලින් දමා ගිය කුණුයි විතරයි. ඉර රස්නෙට නළියනවා වගේ පෙනුණ වීදි හතරකට එහා පැත්තේ දකින්න ලැබුණේ පරණ මෝස්තරේ පලතුරු තට්ටුවක්. ඒකේ විකුණන්න තියලා තිබුණු දේවල්වලට තිබුණේ ඉස්තරම් පෙනුමක්: පෙට්ටිවල පිරවූ ලේ රතු පාට චෙරි ගෙඩි, ඇපල් ගෙඩි වගේම වෝල්නට් සහ ඇප්‍රිකොට් ගෙඩිත්, අයිස් දමූ වීදුරුවල පිරවූ ඇපල් බීමත් එතැන තියෙනවා පෙනුණා. ගනුදෙනුකාරයෝ කිසිවෙක් පේන්න නොසිටි එතැන මේපල් ගස් සෙවණේ තැබූ පැද්දෙන පුටුවල වාඩි වූ වයසක ආච්චිලා තුන්දෙනෙක් ගොතමින් සිටියේ මම ජීවිතේටම දැකපු ලොකුම මේස් කුට්ටමයි!

ලොකුම මේස් කුට්ටම කියලා මම කිවුවේ, ඒ එක මේස් එකක් ස්වේටරයක් තරම් ලොකු නිසයි. හැබැයි ඒවා ඇත්තටම මේස් තමයි.

දකුණු පැත්තේ ඉඳගෙන සිටි ගෑහැනු කෙනා මේස් එකක් ගොතද්දී, වම් පැත්තේ සිටි කෙනා අනෙක ගෙතුවා. මැද සිටි ගෑහැනු කෙනා ලොකුම ලොකු බාස්කට් එකක් පුරවලා නිල් පාට කැටි නූල් තියාගෙන සිටියා.

සුදුමැලි වෙලා රැලි ගැසුණු මුහුණු සහ පට ලේන්සුවලින් ගැට ගැසූ රිදී පාට කොණ්ඩා තිබුණු මේ ආච්චිලා තුන්දෙනාටම තිබුණේ ඉතා වයස්ගත පෙනුමක්. එයාලාගේ ඇට පෑදුනු අත්, සුදු පාට කපු ඇඳුම් වලින් එළියට දිගුවෙලා තිබුණා.

අමුතුම දේ වුණේ, එයාලා තුන්දෙනා එක එල්ලේම මගේ දිහා බලන් ඉන්නවා වගේ මට පෙනුණ එකයි.

මේ ගැන මොනවා හරි කියන්න හිතාගෙන ග්‍රෝවර් දිහාට හැරෙද්දී එයාගේ මූණේ ලේ හිඳිලා ගිහින් තියෙන විදිහ මට දකින්න ලැබුණා. එයාගේ නහයත් නළියමින් තිබුණේ.

"ග්‍රෝවර්?" මම කිවුවා. "ඇයි මොකද?-"

"මට කියන්න එයාලා ඔයා දිහා නෙවෙයි නේද බලන්නේ? කියන්නකෝ... ඔයා දිහාද?"

"ඔව්. හරි අමුතුයිනේ? ඒ මේස් කුට්ටම මට හරියයිද දන්නෑ නේද?"

"විහිළුවට ගන්න එපා, බං. මේක කොහොමටවත්ම විහිළුවක් නෙවෙයි."

මැද ඉඳගෙන සිටි ආච්චි රත්තරන් පාට සහ රිදී පාට ලොකු කතුරු දෙකක් එළියට ගත්තා. ඒ කතුරුවල තල දළිපිහි වගේ දිගට තිබුණා. ග්‍රෝවර් ලොකු හුස්මක් ඇදලා ගත්තා.

"අපි බස් එක ඇතුළට යමු" එයා මට කිවුවා. "ඉක්මන් කරන්න."

"මොකක්?" මම කිවුවා. "ඒක ඇතුළේ පෝරණුවක් වගේ ඇති."

"ඉක්මනට එන්න!" එයා අමාරුවෙන් දොර ඇරගෙන ඇතුළට රිංගුවා, ඒත් මම සිටි තැනින් හෙලවුණේ නැහැ.

පාර එහා පැත්තේ ආච්චිලා තවමත් මගේ දෙස බලා සිටියා. මැද සිටි කෙනා කැටි නූල කැපූ හඬ, වාහන පිරුණු වීදි හතරකට මෙහායින් ඉඳලත් මට හොඳට ඇහුණා.

දෙපැත්තේ සිටි ආච්චිලා දෙන්නා නිල් පාට මේස් ගුළි කරගත්තා. මම පුදුම වුණේ, එයාලා මේ මේස් දෙන්න යන්නේ මොන යෝධයාටද කියලයි.

බසයේ පිටුපසින් රියැදුරා දුම් දමන ලොකු ලෝහ කෑල්ලක් ඇදලා ගත්තා. ගැහෙමින් තිබුණ බසය ආපසු පණ ගැන්වුණේ ඉන්පසුවයි.

මගියෝ ප්‍රීති ඝෝෂා නැඟුවා.

"ඔන්න, ලෙඩේ හරි!" රියදුරා කෑගැසුවේ අතේ තිබුණු තොප්පියෙන් බසයේ බඳට ගසමිනුයි. "හැමෝම ආපහු බස් එකට නගින්න."

අපි ආපසු ගමන පටන් ගත්තාම මගේ ඇඟට උණ ගතියක් දැනෙන්න ගත්තේ හරියට මට වෛරස් ලෙඩක් හැදිගෙන එනවා වගෙයි.

ග්‍රෝවර්ගේ පෙනුම ඊටත් අන්ත වුණා. එයාගේ දත් ඇදි දෙක කට කට ගාලා ගැහෙන තරමටම එයා ගැහෙමින් හිටියා.

"ග්‍රෝවර්?"

"ඇයි?"

"ඔයා මොනවද මට නොකියා හංගන් ඉන්නේ?"

ග්‍රෝවර් එයාගේ කමිස අතෙන් නළලේ දහඩිය පිස දැමුවා. "පර්සි, අර පලතුරු කට්ටුව ළඟදි ඔයා මොනවද දැක්කේ?"

"අර ආච්චිලාද? එයාලා ගැන ඔච්චර කලබල වෙන්නේ මොකටද? එයාලා මිසිස් ඩොඩ්ස් වගේ නෙවෙයිනේ, නේද?"

ඔයාගේ මුහුණේ තිබුණු හැඟීම් කියවන්න අමාරු වුණා, ඒත් මට දැනුණේ ඒ පලතුරු කඩේ ආච්චිලා තුන්දෙනා මිසිස් ඩොඩ්ස්ටත් වඩා ගොඩක් නරක අය වගෙයි. "ඔයා දැක්කේ මොනවද කියලා විතරක් මට කියන්නකෝ." ග්‍රෝවර් කිවුවා.

"එතැන මැද හිටපු කෙනා කතුරු දෙකක් එළියට ගත්තා, ඊට පස්සේ එයා කැට් නූල කැපුවා."

එයා ඇස් දෙකත් වහගෙන, ඇඟිලි වලින් එයාගේ පපුව සූරා ගන්නවා වගේ අභිනයක් කළා.

"එයා නූල කපනවා ඔයා දැක්කා." එයා කිවුවා.

"ඔව්, ඉතින්?" මම එහෙම කිවුවා වුණත්, ඒක හිතනවට වඩා ලොකු දෙයක් කියලා මටම තේරුණා.

"එහෙම වෙන්නේ නැහැ," ග්‍රෝවර් කෙඳිරුවේ එයාගේ මහපටැඟිල්ල විකමින්. "ගිය සැරේ වුණා වගේ මේ සැරෙත් වෙන්න දෙන්න බැහැ."

"මොන සැරේද?"

"හැම පාරම හය වසරේදි, එතනින් එහාට යන්න ලැබෙන්නෙම නැහැ."

"ග්‍රෝවර්," මම කතා කළේ, එයා දැන් ඇත්තටම මාව බය කරන්න පටන් ගත් නිසායි. "මොනවද මේ කියවන්නේ?"

"බස් එකෙන් බැස්සට පස්සේ ඔයාව ගෙදරට ඇරලවන්න මට ඉඩ දෙන්න ඕනෑ. කෝ... මට පොරොන්දු වෙන්න එහෙම කරනවා කියලා."

ඒ ඉල්ලීම හරිම අමුතු එකක් වුණත් එයාට ඕනෑ වුණ ලෙසට මම පොරොන්දු වුණා.

"ඒක මිථ්‍යා ඇදහිල්ලක් වගේ දෙයක්ද?" මම ඇසුවා.

උත්තර නැහැ.

"ග්‍රෝවර්- ඒ නූල කපපු එක, ඒකෙන් අදහස් වුණේ කවුරුහරි මැරෙන්න යනවා කියලද?"

එයා මගේ දිහා දුක්මුසුව බැලුවේ, මගේ මල් වඩමට ගැළපෙන මල් ජාතියත් එයා තීරණය කරලා ඉවරයි වගෙයි.

03

ග්‍රෝවර් බලාපොරොත්තු නොවූ විදිහට කලිසම නැතුව ආවා

පාපොච්චාරණය කරන වෙලාවඃ අපි බස් නැවතුම්පොළට ආව ගමන්ම මං ග්‍රෝවර්ව මග හැරියා.

මම දන්නවා, මම දන්නවා. ඒක නපුරු වැඩක් තමයි. ඒත් ග්‍රෝවර් මාව හොඳටම බය කරමින් සිටියේ. එයා මා දිහා බැලුවේ හරියට මළමිනියක් දිහා බලනවා වගෙයි. "ඇයි හැම සැරේම මෙහෙම වෙන්නේ?" "ඇයි හය වසරෙදිම මෙහෙම වෙන්නේ?" ඔය වගේ විකාර දේවල් කොඳුරද්දී මම කොහොමද එයත් එක්ක ඉන්නේ...

කොයි වෙලාවකදී හරි ග්‍රෝවර් කලබල වුණොත් එයාගේ මුත්‍රාශය වැඩ කරන්න පටන් ගන්නවා. ඉතින්, බස් එකෙන් බැහැපු ගමන්ම, එයා එනකම් ඉන්නවා කියල මාව පොරොන්දු කර ගත්තු ග්‍රෝවර් වැසිකිළියට දුවනවා දැක්කම මට පුදුම හිතුණේ නැහැ. එයා එනකම් ඉන්නවා වෙනුවට මම කළේ, මගේ සූට් කේස් එකත් අරගෙන එළියට ඇවිත් හමුවුණ පළවෙනි කුලී රියට නැගපු එකයි.

"නැගෙනහිර - එකසිය හතරවෙනි ගෙදරට," මම රියැදුරාට කිවුවා.

ඔයාලට මගේ අම්මා මුණ ගැසෙන්න කලින් මම එයා ගැනත් වචනයක් කියන්නම්.

මගේ අම්මාගේ නම සැලී ජැක්සන්. එයා තමයි මේ ලෝකේ ඉන්න හොඳම කෙනා. 'නරකම ඉරණමකට මුහුණ දෙන්නේ හොඳම

පුද්ගලයෝ' කියන මගේ සිද්ධාන්තය ඒකෙන් ඔප්පු වෙනවා! අම්මට අවුරුදු පහේදී, එයාගේ දෙමව්පියෝ ගුවන් අනතුරකින් නැතිවෙලා. ඊට පස්සේ, එයාව හදාගෙන තියෙන්නේ එයා ගැන කිසිම සැලකිල්ලක් දක්වලා නැති එයාගේ මාමා කෙනෙක්. අම්මාට උවමනා වෙලා තියෙන්නේ නවකතා රචකයෙක් වෙන්නයි, ඒ නිසා එයා ඉගෙන ගන්න කාලෙම පොඩි රස්සාවක් කරලා හම්බ වුණ සල්ලි ඉතුරු කරගෙන තියෙන්නේ නිර්මාණාත්මක රචනය ගැන ඉගෙන ගන්න පුළුවන් විශ්වවිද්‍යාලයකට යන්නයි. ඒත්, ඒ කාලය වෙද්දී එයාගේ මාමාට පිළිකාවක් හැදුණ නිසා උසස් පෙළ පන්තිය අත ඇරලා ගිහින් මාමාව බලාගන්න එයාට සිද්ධ වෙලා. අන්තිමේදී, මාමා මැරුණට පස්සේ අම්මා සල්ලිත් නැතුව, පවුලකුත් නැතුව, ඩිප්ලෝමාවකුත් නැතුව තනිවෙලා.

අම්මාගේ ජීවිතයේ සිද්ධ වෙලා තියෙන එකම හොඳ දේ එයාට මගේ තාත්තාව මුණ ගැසුණු එකයි.

මට තාත්තා ගැන කිසිම මතකයක් නැහැ. යන්තමින් හරි මතක තියෙන්නේ එක විදිහක උණුසුම් දීප්තියක්, සමහරවිට ඒ එයාගේ හිනාවෙන් අංශුමාත්‍රයක් වෙන්න ඇති. එයාව මතක් වෙනකොට දුක හිතෙන නිසා තාත්තා ගැන කතා කරන්න මගේ අම්මා වැඩිය කැමති නැහැ. එයා ළඟ තාත්තගේ පින්තූරයක් තිබුණෙත් නැහැ.

ජේනවනේ, ඒ දෙන්නා විවාහවෙලා ඉඳලා නැහැ. අම්මා කියපු විදිහට මගේ තාත්තා පෝසත්, වැදගත් කෙනෙක්. දවසක් තාත්තා මොකක්දෝ වැදගත් ගමනක් යන්න අත්ලාන්තික් සාගරය හරහා යාත්‍රා කරාලු. ඒත්, එයා කවදාවත් ආපසු ඇවිල්ලා නැහැ.

එයා මුහුදේ අතරමං වෙලා, අම්මා කියන්නේ එහෙමයි. මැරිලා නැහැ. අතරමං වෙලා විතරයි.

අම්මා එක එක විදිහෙ රස්සාවල් කරලා, ඩිප්ලෝමාව ගන්න රාත්‍රී පන්තිවලට ගිහින් ඉගෙන ගන්න ගමන් මාවත් ඇති දැඩි කළා. ඒ වුණාට එයා කිසිම දවසක ඒ ගැන අවලාද නැගුවේවත්, කේන්ති ගත්තේවත් නැහැ. එකම සැරයක්වත් නැහැ. ඒත් මම දන්නවා මම එයාට ලේසි පහසු දරුවෙක් වුණේ නැහැ.

අන්තිමේදි අම්මා ගේබ් අග්ලියානෝ එක්ක විවාහ වුණා. අපි මුලින්ම මුණගැහිලා තත්පර තිහක් විතර යනකම් හොඳට හැසිරුණ ගේබ්, ඊට පස්සේ එයාගේ නියම ස්වරූපය පෙන්වන්න පටන් ගත්තා.

මම පොඩි කාලේ එයාට 'ගඳ ගහන ගේබ්' කියලා නමක් දාලයි තිබුණේ. මට සමාවෙන්න මෙහෙම කියනවට, ඒත්, ඒක තමයි ඇත්ත. ඒ මිනුස්සයා කුණු වෙච්ච සුදු ළූණු ගෙඩියක් වගේ ගඳ ගැහුවා.

අපි දෙන්නා නිසා එයාගේ ජීවිතේ තවත් දුෂ්කර වුණා. ගඳ ගහන ගේබ් අම්මට සලකපු විදිහ, එතකොට එයයි මමයි එක තැන ඉන්නකොට හැසිරෙන විදිහ... හොඳයි, මම ගෙදර ගියාට පස්සේ සිදුවුණ දේ ඒකට හොඳ උදාහරණයක් වෙවි.

මම අපේ පුංචි ගෙදර ඇතුළට ගියේ අම්මා වැඩ ඉවරවෙලා ගෙදර ඇවිත් ඇති කියලා හිතාගෙනයි. ඒ වෙනුවට මම දැක්කේ ගඳ ගහන ගේබ් එයාගේ යාළුවෝ එක්ක සාලෙට වෙලා කාඩ් සෙල්ලම් කරන ආකාරයයි. රූපවාහිනිය මහ සද්දෙට දමා තිබුණා. බැදපු අල පෙති සහ බිස් බීර ටින් බුමුතුරුණ පුරාම විසිරිලා.

"එහෙනම් ඔයා ගෙදර ආවා," මගේ දිහාවට යන්තමින් බැල්මක් හෙලා එයා ඇහුවේ සිගරට්ටුවකුත් කටේ රඳවාගෙනමයි.

"අම්මා කොහෙද?"

"වැඩ," එයා කිවුවා. "ඔයා ළඟ සල්ලි එහෙම නැද්ද?"

ඕන්න ඔහොම තමයි එයාගේ හැටි. ආපහු ගෙදර ආවට සතුටින් පිළිගැනීමක් නැහැ. "ඔයාව දකින්න ලැබුණට සතුටුයි. පහුගිය මාස හය හොඳින් හිටියද?" ඔය මුකුත්ම නැහැ.

ගේබ් හිටියටත් වඩා මහත් වෙලා. දැන් එයාගෙ පෙනුම තල්මහෙක් වගෙයි. එයාගේ ඔළුවටම තිබුණේ කෙස් ගස් තුනක් විතර. ඒ ටිකත් හිස්කබලටම වෙන්න පීරා තිබුණේ හරියට ඒකෙන්වත් එයාට කඩවසම් පෙනුමක් එයි හිතලා වගෙයි.

එයා ක්වීන්ස්වල ඉලෙක්ට්‍රොනික් උපකරණ වෙළඳ සැලක කළමණාකරුවෙක් විදිහට වැඩකළත් එයා වැඩි කාලයක් ගත කළේ ගෙදරට වෙලායි. එයාව තාමත් ඒ රස්සාවෙන් එළවලා නැත්තේ ඇයි කියලා මට හිතාගන්න බැහැ. එයා කළේ චෙක්පත් එකතු කරන එකයි, ඒ සල්ලි මට හිතේ කරකැවිල්ල හදවන සිගරට් සහ බීරවලට වියදම් කරන එකයි විතරයි. කොයිම වෙලාවකදි වුණත් මම ගෙදරට ආවොත් එයා බලාපොරොත්තු වෙන්නේ එයාගේ සූදු සෙල්ලම්වලට වියදම් කරන්න මගෙන් සල්ලි ගන්නයි. එයා ඒකට කිවුවේ 'කොල්ලන්ගේ රහස්' කියලායි. බැරිවෙලාවත් මම ඒ ගැන අම්මාට කිව්වොත් එයා මට සිහිය නැතිවෙනකල්ම ගහයි.

"මගේ ළඟ ඇති සල්ලියක් නැහැ," මම එයාට කිවුවා.

එයා ඇහි බැමි එසෙව්වා.

ගේබ්ට බල්ලෙක්ට වගේ සල්ලිවල ඉව දැනෙනවා. එයාගෙ ගඳෙන් හැමදේම වැහිලා තියෙනකොට ඒක විතරක් දැනෙන්නේ කොහොමද කියන එකත් පුදුමයක්.

"ඔයා බස් එකෙන් බැහැලා ගෙදර ආවෙ කුලී වාහනේක නේද?" එයා ඇසුවා. "ඒකට සල්ලි ගෙව්වම ඉතුරු කීයක් හරි හම්බවෙන්නත් ඇතිනේ. කවුරුහරි මේ වහල යට ජීවත් වෙන්න හිතාගෙන ඉන්නවා නම් එයාගේ බර එයාම දරාගන්න එක එයාගේ යුතුකමක්, එහෙම නේද එඩී?"

එඩී - මේ තට්ටු නිවාස සංකීර්ණයේ පරිපාලකයා මගේ දෙස බැලුවේ අනුකම්පාවෙන් වගෙයි. "අයියෝ ගේබ්," එයා කිවුවා. "මේ දරුවා ආවා විතරයිනේ."

"මම කියපු දේ හරි නේද?" ගේබ් ආපසු ඇසුවා.

එඩී, එයාගේ විස්කෝතු පිගානට රැව්වා.

"හොඳයි," මම කිවුවා. සාක්කුවේ තිබුණු මුදල් නෝට්ටු කීපයක් එළියට ඇදලා ගත් මම ඒ ටික මේසය උඩට දැම්මා. "දිනන්න නම් හම්බවෙන්න එපා !"

"අන්න, ඔයාගේ ප්‍රගති වාර්තාව ආවා, මොළකාරයෝ!" එයා බෙරිහන් දුන්නා. "මම ඔයා වුණා නම් ඔච්චර උද්දච්ච වෙන්නේ නැහැ!"

මම, මගේ කාමරේට ගියේ දොරත් සද්දෙට වහගෙනයි. මගේ කිව්වට මේ කාමරේ මගේමත් නෙවෙයි. මම ඉස්කෝලේ ඉන්න කාලෙට මේක ගේබ් අයිති කරගන්නවා.

කාමරේට වෙලා 'පාඩම් කරනවා' කියලා කිව්වට, එයාට පාඩම් කරන්න තිබුණේ පරණ කාර් සඟරා ටිකක් විතරයි. ඒ වුණාට, මගේ බඩු ටික ඔක්කෝම අල්මාරිය ඇතුළට තල්ලු කරලා, එයාගේ මඩ ගැවුණු බූට් අඩි පාරවල් කාමරේ පුරාම තියලා, මුළු කාමරේම එයාගේ ගඳින් පුරවලා තියන්න එයා හරි ආසයි.

මම, මගේ සූට් කේස් එක ඇඳ උඩට අත හැරියා. ආහ්... මගේ පුංචි මාළිගාව...

මිසිස් ඩොඩ්ස් ගැන දකපු භයානක හීනවලටත් වඩා නරක විදිහට, එහෙමත් නැත්නම් අර පලතුරු තට්ටුවේ ආච්චි නූල කැපූ සද්දෙටත් වඩා අන්ත විදිහට මට ගේබ් ගේ ගඳ දැනුණා.

අර ආච්චිලා ගැන කල්පනා කරද්දී නම් මගේ කකුල් පණ නැති වෙනවා වගේ දැනුණා. මට මතක් වුණේම ග්‍රෝවර්ගේ බය වෙච්ච මුහුණයි - එයා නැතුව මම ගෙදර යන්නේ නැහැ කියලා මාව පොරොන්දු කරගත් හැටියි. හදිසි වෙව්ලුමක් මගේ ඇඟ පුරා පැතිරුණා. මේ දැනුත් කවුරු හරි මගේ දිහා බලන් ඉන්නවා වගේ හැඟීමක් මට දැනෙන්න ගත්තා. සමහර විට, ඒකා දැනටමත් භයානක නිය පහුරු දිගු කරගෙන පඩි පෙළ නැගගෙන එනවද දන්නෑ...

එතකොටම මට මගේ අම්මාගෙ කටහඬ ඇහුණා. "පර්සි?"

අම්මා ඇවිත් මගේ නිදන කාමරේ දොර ඇරියා. ඒත් එක්කම මගේ බයත් දියවෙලා ගියා.

මගේ හිතේ බය සැක නැතිවෙලා යන්න අම්මාගේ මුහුණ දක්කත් ඇති. එළිය වැටෙන විදිහට පාට වෙනස් වෙන අම්මාගේ ඇස් දෙක දිලිසෙමින් තිබුණා. එයාගේ හිනාව හිතට උණුසුමක් දනවනවා. අම්මාගේ දුඹුරු පාට දිග කොණ්ඩයේ කීප පොළක අළු පාට කෙස් මතු වී තිබුණත්, එයා වයසට ගිහින් කියලා නම් මම කවදාවත් හිතුවේ නැහැ. එයා මගේ දිහා බලන්නේ හරියට මගේ කිසිම නරකක් නොදක හොඳ දේම විතරක් දකිනවා වගෙයි. අම්මා කිසිම කෙනෙක්ට සැරෙන් කතා කරනවාවත්, නපුරු වචනයක් කියනවාවත් මට කවදාවත් අහන්න ලැබිලා නැහැ. අඩු තරමේ මටවත්, ගේබ්ටවත් එහෙම කතා කරලා නැහැ.

"ඔහ්, පර්සි," අම්මා මාව තදින්ම වැලඳ ගත්තා. "මට විශ්වාස කරන්නත් බැහැ. ගිය නත්තලෙන් පස්සේ ඔයා ගොඩාක් ලොකු වෙලා නේ!"

එයාගේ රතු, නිල් සහ සුදු මිශ්‍ර නිල ඇඳුමෙන් හැමුවේ ලෝකයේ තියෙන හොඳම සුවඳවල්; චොකලට්, සීනිකුරු වගේම අම්මා රසකැවිලි කඩේදී විකුණන අනිත් සියලුම රසකැවිලිවල සුවඳ ඒකෙන් ආවා. අනෙක් වතාවල මම ගෙදර ආවම ගෙනත් දෙන විදිහටම

මෙවරත් නොමිලේ ලැබෙන රසකැවිලි සාම්පල පිරවූ ලොකු මල්ලක් අම්මා මට ගෙනැවිත් තිබුණා.

අපි දෙන්නම ඇඳ අයිනේ වාඩිවුණා. අම්මා මගේ ඔළුව අතගාන ගමන් මට නියෝග කළේ ඉස්කෝලෙන් ආව ලියුමේ සඳහන් කර නැති අනිත් හැමදේම කියන්න කියලායි. ඒ අතරේ මම බ්ලූබෙරි රසැති සීනිකුරු මල්ල ආක්‍රමණය කළා.

මාව ඉස්කෝලෙන් අයින් කිරීම ගැන අම්මා කිසිම දෙයක් මතක් කළේ නැහැ. එයා ඒක ගැන වැඩිය හිතුවෙ නැහැ වගෙයි. ඒත්, මම හොඳින්ද? මගේ වැඩ ටික මම හොඳට කරගෙන ගියාද?, වගේ කාරණා ගැන අම්මා ගොඩාක් හිතලා තිබුණා. අම්මා මාව බදාගෙන ඉන්න විදිහට මගේ හුස්මත් හිරවෙනවා කියලා මම කිව්වත්, එයාව ආපසු දකින්න ලැබීම ගැන මම යටිහිතෙන් ගොඩාරියක් සතුටු වුණා.

එහා කාමරේ සිටි ගේබ් කෑගැසුවා, "සැලී, බීන් ඩිප් එකක් හැදුවොත් නරකද?"

මම දත්මිටි කෑවා.

මේ ලෝකේ ඉන්න හොඳම ගෑනු කෙනා තමයි මගෙ අම්මා. හරි නම් මේ වගේ නරක, නපුරු මනුස්සයෙක් වෙනුවට අම්මාට කෝටිපතියෙක්ව වුණත් විවාහ කරගන්න තිබුණා.

මම යැන්සි එකේ සිටි අන්තිම දවස් කීපය ගැන කියනකොට ප්‍රීතිමත් ගතියක් පෙන්වන්න උත්සාහ කළේ අම්මාව සනසවන්නයි. මාව ඉස්කෝලෙන් අස් කිරීම ගැන වැඩි දුකක් නැහැ කියලා මම අම්මාට කිවුවා. මොකද, මේ සැරේ මට සම්පූර්ණ අවුරුද්දක් විතරම එකම ඉස්කෝලෙක ඉන්න පුළුවන් වුණානේ. ඒ වගේම මට අලුත් යාළුවෝ කීප දෙනෙකුත් ලැබුණා. මම සෑහෙන තරම් හොඳට ලතින් ඉගෙන ගත්තා. ඒ වගේම, අවංකවම කිව්වොත්, විදුහල්පති කිව්ව තරම් නරක විදිහට මම ළමයි එක්ක රණ්ඩු වෙන්න ගියෙත් නැහැ. මම ඇත්තටම් යැන්සි එකට කැමැත්තෙන් සිටියේ. ගොඩාක් කැමැත්තෙන්. මේ අවුරුද්දේ ගොඩාක් ඉදිරියට එන්න මට පුළුවන් වුණා. මට මාවම තේරුම් ගන්න පුළුවන් වුණා. මෙහෙම කියාගෙන යනකොට ග්‍රෝවර් සහ මිස්ටර් බෲනර් ගැන මතක්වෙලා මට වචන පැටලෙන්න ගත්තා. වෙන දෙයක් තියා, නැන්සි බොබ්ෆිට් වුණත් ඒ තරම් නරක නැහැ කියලා මට හිතෙන්න ගත්තා.

Scanned with CamScanner

ඒත්, අර කෞතුකාගාරෙට ගිය චාරිකාව ළඟට කතාව ඇදිලා ආවම...

"ඇයි?" මගේ අම්මා ඇහුවා. එයාගේ ඇස් දෙක මගෙ හිතේ පතුල හාරන්න ගත්තේ, හැංගිලා තියෙන රහස් එළියට ඇදලා ගන්නයි. "ඔයා මොකක්හරි දේකට බය වුණාද, පුතේ?"

"නැහැ, අම්මේ.."

අම්මාට බොරුවක් කියන්න සිදුවීම මහා නරක දෙයක් විදිහටයි මට දැනුණේ. මිසිස් ඩොඩ්ස් ගැනත්, කැටි තුල් තියාගෙන සිටි ආච්චිලා ගැනත් අම්මාට කියන්න මට උවමනා වුණත්, ඒක මහ මෝඩ කතාවක් වගේ පෙනේවි කියලා මට බය හිතුණා.

අම්මා තොල් දෙක තද කරගත්තා. මම මොනවාහරි හංගන බව එයා දැනගෙන සිටියත් එයා මට බල කළේ නැහැ.

"ඔයාව පුදුම කරවන්න දෙයක් මගේ ළඟ තියෙනවා," අම්මා කිවුවා. "අපි මුහුදු වෙරළට යනවා!"

මගේ ඇස් දෙක ලොකු වුණා. "මොන්ටවුක්වලටද?"

"රැයවල් තුනකට - පුරුදු කැබින් කාමරේටම."

"කවදද යන්නෙ?"

අම්මා හිනාවුණා. "මම ඇඳුම් මාරු කරගත්තු ගමන්ම."

මට ඒක විශ්වාස කරන්නත් අපහසු වුණා. එච්චර ලොකු වියදමක් කරන්න තරම් සල්ලි නැහැ කියලා ගේබ් විරුද්ධ වුණ නිසා පසුගිය ගිම්හාන සතු දෙකේදිම අපි දෙන්නාට මොන්ටවුක්වලට යන්න බැරි වුණා.

"කන් ඇහෙන්නේ නැද්ද? මං ඉල්ලපු බීන් ඩිප් එක කෝ, සැලී?" දොර ළඟට කඩා පාත් වූ ගේබ් ගෙරෙව්වා.

එයාට ගහන්න තරම් කේන්තියක් මට දැනුණා, ඒත් අම්මා ගේ ඇස් දිහා බලද්දි එයාගේ සිතේ තිබුණු අදහස මොකක්ද කියලා මට තේරුණා: ''ටික වෙලාවකට වත් ගේබ්ට හොඳින් සලකන්න. අඩු තරමේ අපි මොන්ටවුක්වලට පිටත් වෙනකල්වත්.''

"මම මේ ඒක හදන්න යන්න ලෑස්ති වුණේ," එයා ගේබ්ට කිවුවා. "අපි කතා කර කර හිටියේ අපේ ගමන ගැන."

ගේබ් ගේ ඇස් දෙක පුංචි වුණා. "ගමන? ඔය කියන්නේ ඔයා ඇත්තටම එහෙ යනවා කියලද?"

"මම ඕක කලින්ම දැනගෙන හිටියා," මම කෙඳිරුවා. "එයා අපිට යන්න දෙන්නේ නැහැ."

"එයා අනිවාර්යයෙන්ම යන්න දේවි." ඒත් එක්කම අම්මා කිවුවා. "ඔයාගේ බාප්පා වියදම් ගැන හිතලා ටිකක් කලබල වෙලා, එච්චරයි. ඒ ඇරත්," අම්මා කියාගෙන ගියා, "බීන් ඩිප් විතරක් නෙවෙයි, මුළු සති අන්තෙටම සෑහෙන තරමේ හට්ටු හතක් ලොකු ඩිප් එකක් එයාට හදලා දීලා නේ මම යන්නේ."

ඒකෙන් ගේබ් ටිකක් මෙල්ල වුණා. "එතකොට, මේ ගමන යන්න සල්ලි... ඔයාගේ ඇඳුම්වලට යන සල්ලිවලින් පිරිමහගන්න ඒවා නේ?"

"ඔව්, අනේ." අම්මා කිවුවා.

"ඔයා මගේ කාර් එකෙන් එහෙට ගිහින් එනවා ඇරෙන්න වෙන කොහේවත් ගෙනියන්නෙත් නැහැ නේ?"

"අපි ඒක ගොඩාක් පරිස්සම් කරන්නම්."

ගේබ්, එයාගේ දෙබිඩි නිකට කැසුවා. "එහෙනම්, ඔයා හට්ටු හතේ ඩිප් එක හදන එක ඉක්මන් කරන්න වෙයි... ඒ වගේම, මගේ කාඩ් සෙල්ලමට බාධා කළාට මේ කොල්ලා මගෙන් සමාව ගන්නත් වෙයි."

සතියක් විතර කෙඳිරි ගාන්න දෙකක් දෙන්නත් වෙයි, මම එහෙම හිතුවත් එයාව කේන්ති ගස්වන්න එපා කියලා අම්මාගේ ඇස් දෙක මට අනතුරු ඇඟෙව්වා.

අම්මා මොකටද මේ මනුස්සයාට ඕනෑ විදිහට වැඩ කරන්නේ? මට කෑගහන්න උවමනා වුණා. මේ මනුස්සයා හිතන දේවල් ගැන අම්මා ඇයි ඔච්චර සලකන්නේ?

"මට සමා වෙන්න," මම මිමිණුවා. "මට සමා වෙන්න ඔයාගේ අතිශයින්ම වැදගත් කාඩ් සෙල්ලමට බාධා කෙරුවට. දැන්, කරුණාකරලා, ආපහු ඒකට යන්න."

ගේබ්ගේ ඇස් දෙක හීනි වුණා. එයාගේ චූටි මොළේ උත්සාහ කරන්න ඇත්තේ මම කියපු දේ ඇතුළේ ඇනුම්පදයක් තිබුණද හොයා ගන්නයි.

Scanned with CamScanner

"හොඳයි, ඕනෑ එකක්." එයා තීරණය කළා.

එයා ආපසු එයාගේ සෙල්ලම පටන් ගන්න ගියා.

"ස්තූතියි, පර්සි." මගේ අම්මා කිව්වා. "අපි මොන්ටවුක්වලට ගියාට පස්සේ ඔයාට කියන්න අමතක වුණ දේවල් ගැන වැඩිදුර කතා කරමු, හොඳද?"

ඒක මොහොතකට සාංකාවක් - එහෙමත් නැත්නම්, අවුල් සහගත බවක් අම්මාගේ ඇස්වල දිස්වුණා. හරියට, බස් ගමන පුරාවට මට ග්‍රෝවර්ගේ ඇස් දෙකේ දකින්න ලැබුණු බය වගේ දෙයක්, කාමරේ තිබුණු අසාමාන්‍ය සීතල අම්මාටත් දැනිල ද කියලා මට හිතුණා.

ඒත්, ඊට පස්සේ අම්මාගේ පුරුදු හිනාව ආයෙමත් මතුවුණා. ඉතින්, මට වැරදීමක් වෙන්න ඇති කියලා මම තේරුම් ගත්තා. මගේ කොණ්ඩය අවුල් කළ අම්මා ගියේ ගේබ්ගේ තට්ටු හතේ ඩිප් එක හදන්නයි.

ඊට පැයකට පසු අපි පිටත් වෙන්න සූදානම් වුණා.

මම අම්මාගේ ගමන් මලු කාරයට පටවනවා බලන්න විතරක් ගේබ්, එයාගේ කාඩ් සෙල්ලමෙන් නිවාඩුවක් ගත්තා. එයා දිගින් දිගටම කෙඳිරි ගාමින් කිව්වේ එයාට අම්මා උයලා දෙන කෑමයි - ඊටත් වඩා වැදගත් දේ, එයාගේ කාර් එකයි මේ සති අන්තයට නැති වීම ගැනයි.

"මන්න, මගේ කාර් එකට සීරීමක්වත් වෙන්න බැහැ, මොළකාරයෝ." මම අන්තිම මල්ලත් පටවන විට එයා අනතුරු ඇඟෙව්වා.

"පොඩිම පොඩි සීරීමක්වත් වෙන්න බැහැ."

හරියට මට කාරය එළවන්න දෙනවා වගෙයි. මට තාම දොළහයි. ඒත්, ඒක ගේබ්ට ප්‍රශ්නයක් වුණේ නැහැ. අඩු තරමේ, මුහුදු ළිහිණියෙක් කාරය උඩට වසුරක් දාලා ගියත්, එයා ඒකත් මට බනින්න පොරක් කර ගනීවි.

එයා ආපසු ගොඩනැගිල්ල පැත්තට හෙමින් හෙමින් යනවා බලාගෙන ඉන්නකොට මට දැනුණු තද කේන්තියත් නිසාම මම තේරුම් ගන්න අමාරු දෙයක් කළා. ගේබ් දොර ළඟට කිට්ටු වෙද්දිම වගේ, බසයේදී ග්‍රෝවර් කළ ආකාරයේ අභිනයක් මම අතෙන් කළා. ඇඟිලි විහිදා තිය එල් කරගෙන පපුව පහුරු ගෑව මම ඊට පස්සේ ගේබ් දෙසට අත දිගු කරලා තල්ලු කිරීමක් වගේ දෙයක් කළා. ඒත් එක්කම දොර

කොයි තරම් තදින් වැසුණා ද කියනවා නම්, ඒ දොර ගේබ්ගේ පිටුපස වැදුණු වේගයට එයා වීසි වී ගිහින් පඩි පෙළ උඩ වැටුණේ එයාව කාල තුවක්කුවකින් විද්දා වගෙයි. සමහරවිට, එය සුළඟ නිසා සිද්ධ වුණු දෙයක් වෙන්න ඇති, එහෙමත් නැතිනම්, දොරේ සරණේරුවලට මොනවාහරි වෙලා තියෙන්න ඇති. කොහොම වුණත් ඒ ගැන සොයා බලන්නට මම එතැන රැඳුණේ නැහැ.

කාරයට ගොඩ වුණු මම අම්මාටත් ඇතුළට නගින්න කිව්වා.

අපි කුලියට ගත් කැබින් කාමරය තිබුණේ දකුණු වෙරළේ, ලෝන්ග් අයිලන්ඩ්වලට සමීපයෙන්. එය පාට මැකී ගිය තිර රෙදි දැමූ, වැලි අතරේ බාගෙට ගිලුණු පාටකුරු පෙට්ටියක් වගේ පොඩි කාමරයක්. ඒ කාමරයේ කැබිනට් ඇතුළේ මකුළුවෝත්, අනිත් තැන්වල වැලිත් පිරී තිබුණා. බොහෝ වේලාවලට ඒ අවට මුහුද පීනන්නට බැරි තරම් සීතල වුණා.

ඒ තැනට මම ගොඩාක් ආදරය කළා.

මම චූටි බබෙක් කාලේ ඉඳලම අපි එහෙට යන්න පුරුදු වෙලා සිටියා. මගේ අම්මා ඊටත් කලින් ඉඳලා එතැනට ගියාලු. අම්මා කවදාවත්ම නොකීවත්, ඒ වෙරළ අම්මාට විශේෂ තැනක් වූ හේතුව මම දැන සිටියා. අම්මාට මගේ තාත්තාව මුණ ගැසී තිබුණේ ඒ වෙරළේදීයි.

අපි මොන්ටවුක්වලට කිට්ටු වෙද්දී අම්මා වයසෙන් තරුණ වෙනවා වගෙයි මට පෙනුණේ. අවුරුදු ගණනාවක දුක් වේදනා සහ වැඩවලින් හෙම්බත් වූ ලකුණු එයාගේ මුහුණෙන් මැකී ගියා. අම්මාගේ ඇස් දෙක මුහුද වගේ නිල් පාටින් දිලිසෙන්න ගත්තා.

ඉර බසින වෙලාව වෙද්දී කැබින් කාමරයට ගිය අපි ජනෙල් හැර දමා, සුපුරුදු පිරිසිදු කිරීම් කළා. ඊට පස්සේ, වැල්ලේ ඇවිදින්න ගිය අපි නිල් පාට කෝන් චිප්ස් මුහුදු ළිහිණියන්ට දැමුවේ නිල් පාට ලොසින්ජර සහ නිල් පාට ටොෆි සූප්පු කරමිනුයි.

මං හිතන්නේ, කෑම සියල්ල නිල් පාට ඇයි කියලා ඔයාලාට තේරුම් කරලා දෙන්න වේවි.

ඒක සිද්ධ වුණේ ගේබ් සහ මගේ අම්මා අතරේ ඇති වුණු බහින්බස්වීමක් නිසයි. එහෙම දේවල් ඇත්තටම නැහැ කියලා ගේබ් අම්මාට කියා තිබුණා. ඒක හරි පොඩි සිදුවීමක් තමයි. ඒත්, එදා ඉඳන් අම්මා නිල් පාට කෑම ජාති හදන්න ගත්තා. එයා උපන්දින කේක් ගෙඩි

Scanned with CamScanner

නිල් පාටට හැදුවා. බ්ලූබෙරි සීම හැදුවා. ඒ වගේම, ගෙදරට ගේන රසකැවිලි සියල්ලම නිල් පාටින් තෝරලා ගේන්නත් වගබලා ගත්තා. අම්මා මෙහෙම තිරීමෙනුත්, එයා විවාහ වුණාට පසු මිසිස් අග්ලියානෝ කියලා නම වෙනස් නොකර විවාහයට පෙර නම වූ ජැක්සන් යන්නම පාවිච්චි කිරීමෙනුත් එයා ගේබ්ට යටත් වී ඉන්න අකමැති, විප්ලවකාරී අදහස් ඇති කෙනෙක් බව ඔප්පු වෙනවා. හරියට මම වගේ...

කළුවර වැටෙද්දී ගිනිමැලයක් දල්වූ අපි එයින් හොට් ඩෝග්ස් සහ මාෂ්මෙලෝස් බැදගත්තා. අම්මාගේ දෙමව්පියෝ ගුවන් අනතුරකින් මිය යාමට කලින් කාලය ගැන කතා අම්මා මට කිවුවා. ඒ වගේම, රස කැවිලි කඩෙන් ඉවත් වෙලා නිදහසේ පොත් ලියන්න තරම් සල්ලි ඇති කාලෙක ලියන්න හිතාගෙන ඉන්න කතා ගැනත් අම්මා මට කිවුවා.

අන්තිමේදී, අපි මොන්ටවුක්වලට එන සෑම වතාවකදීම මගේ හිතේ මතුවන ප්‍රශ්නය - මගේ තාත්තා ගැන අම්මාගෙන් අහන්න ධෛර්යයක් මගේ හිතට ආවා. අම්මාගේ ඇස් දෙක බොඳ වෙන්න ගත්තා. අම්මා මට හැම වෙලාවේදීම කියන කතාව ඒ වෙලාවේදිත් කියාවී කියලා මම හිතුවා. ඒ වුණත්, ඒ කතාව කොච්චර ඇසුවත් මට එපා වෙන්නේ නැහැ.

"එයා ගොඩාක් කරුණාවන්තයි, පර්සි," එයා කිවුවා. "උස, කඩවසම්, බලවත් කෙනෙක්. ඒ වගේම ආචාර සම්පන්නයි. ඔයාටත් තියෙන්නේ එයාගේ කළු කොණ්ඩෙයි කොළ පාට ඇස් දෙකයි."

අම්මා, එයාගේ රසකැවිලි මල්ලෙන් නිල් පාට ලොසින්ජරයක් ගත්තා. "අනේ... එයාට ඔයාව දකින්න ලැබුණා නම්, එයා ගොඩාක් ආඩම්බර වේවි, පර්සි."

අම්මා එහෙම කියද්දී මම පුදුම වුණා. ආඩම්බර වෙන්න තරම් මම දක්ෂ කෙනෙක් ද? වචන අන්ධතාවයෙන් පෙළෙන, ඩී ගොඩක් පිරුණු ප්‍රගති වාර්තාවක් තියෙන, අවුරුදු හයක් තුළ හය වතාවක් පාසල්වලින් එළවපු කොල්ලෙක් ගැන කිසිම කෙනෙකුට ආඩම්බර වෙන්න පුළුවන් ඇති කියලා මට නම් හිතුනේ නැහැ.

"එතකොට මගේ වයස කීයද?" මම ඇසුවා. "මම ඇහුවේ... එයා මෙහෙත් යද්දි?"

අම්මා ගිනිදැල් දෙස බලා සිටියා. "එයාට මා එක්ක ඉන්න ලැබුණේ එක ගිම්හාන සෘතුවක් විතරයි, පර්සි. එතකොට අපි හිටියෙත් මේ කැබින් කාමරේමයි."

"ඒත්... මම බබෙක් කාලේ එයා මාව දැනගෙන හිටියා නේද?"

"නැහැ පැටියෝ. මම දරුවෙක් බලාපොරොත්තුවෙන් ඉන්න බව එයා දැනගෙන හිටියා. ඒත්, එයාට ඔයාව දකින්න ලැබුණේ නැහැ. ඔයා ඉපදෙන්න කලින් එයාට යන්න සිද්ධ වුණා."

අම්මා කියපු දේත් සමග මගේ මතකයේ තිබූ කාරණයක් එකට ගළපන්න මම උත්සාහ කළා. මගේ තාත්තාගේ හිනාව... මට දැනුණා වගේ මතක ඒ උණුසුම් දිප්තිය...

මම හැම වෙලාවෙම සිතුවේ මම අත දරුවෙක් කාලයේ තාත්තා මාව දැකලා ඇති කියලයි. අම්මා කවදාවත් ඒ ගැන හරියට නොකිව්වත් මට එහෙම විශ්වාසයක් තිබුණා. ඒත්, දැන් අම්මා මෙහෙම කියද්දී...

මට, මගේ තාත්තා ගැන තරහවක් දැනුණා. සමහරවිට ඒ මගේ මෝඩකම නිසා වෙන්න ඇති. ඒ වුණත්, මගේ අම්මාව විවාහ කර ගන්නේ නැතිව එයා අර මුහුදු ගමන යෑම ගැන මට කේන්තියක් දැනුණා. එයා අපිව දාලා ගිය නිසා, දැන් අපිට ගඳ ගහන ගේබ් එක්ක ජීවත් වෙන්න සිද්ධ වෙලා.

"අම්මා ආයෙමත් මාව පිට තැනකට යවනවද?" මම එයාගෙන් ඇසුවා. "මාව ආයෙමත් බෝඩිම් ඉස්කෝලෙකට යවනවද?"

අම්මා මාෂ්මෙලෝවක් ගින්නෙන් ඇදලා ගත්තා.

"මම දන්නේ නැහැ, පැටියෝ," එයාගේ කටහඬ බර වුණා. "මං හිතන්නේ... මං හිතන්නේ අපිට එහෙම මොකක්හරි කරන්න සිද්ධ වෙයි."

"ඇයි ඔයා කැමති නැද්ද මම ඔයාගේ ළඟ ඉන්නවට?" ඒ වචන පිටවෙනවත් එක්කම, එහෙම ඇසීම ගැන මට පසුතැවිල්ලක් දැනුණා.

මගේ අම්මාගේ ඇස් දෙකේ කඳුළු පිරුණා. එයා මගේ අත අරගෙන තදින් මිරිකුවා. "අනේ, පර්සි, නැහැ. ම-මට එහෙම කරන්න වෙනවා. මම ඔයාව පිටට යවන්නේ ඔයාගෙම හොඳටයි."

අම්මා එහෙම කියද්දී මට මතක් වුණේ මිස්ටර් බෲනර්ව. එයා කිව්වෙත් යැන්සි එකෙන් යෑමෙන් මට වෙන්නේ හොඳක් කියලා නේ.

"ඒ මම සාමාන්‍ය ළමයෙක් නෙවෙයි නිසා." මම කිවුවා.

"ඔයා එහෙම කියන්නේ ඒක භාරක දෙයක් වගෙයි නේ, පර්සි. ඔයා කොච්චර වැදගත් කෙනෙක්ද කියලා ඔයාට තාම තේරුම් ගිහින් නැහැ. මම හිතුවේ යැන්සි විද්‍යාලයට තියෙන දුර ප්‍රමාණවත් වෙයි කියලා. අන්තිමේදී, එතැනවත් ඔයාට පරිස්සමින් ඉන්න පුළුවන් වේවි කියලයි මම හිතුවේ."

"පරිස්සම් වෙන්නේ මොකෙන්ද?"

අම්මා මගේ ඇස් දෙක දෙස බැලුවා. ඒ බැල්ම දිගේ මතකයන් ධාරාවක් මගේ සිතට ආවා. මේ තරම් කාලයකට මට මුහුණ දෙන්න සිදුවුණු සියලුම ආකාරයේ අද්භූත සිදුවීම් වගේම මම අමතක කරන්න උත්සාහ කළ බිහිසුණු සිදුවීම් සියල්ලම මට මතක් වුණා.

මම තුන වසරේ ඉන්න කාලේ දවසක් කළු කබායක් හැඳගත් මනුස්සයෙක් මාව ක්‍රීඩා පිටියේදී අල්ලා ගත්තා. පොලිසියට කතා කරනවා කියලා ගුරුවරු තර්ජනය කළාම ඒ මනුස්සයා ගොරවමින් යන්න ගියා. ඒත්, එයා දමාගෙන සිටි පුළුල් වාටියක් සහිත තොප්පියට යටින්, ඒ මනුස්සයාගේ නළල මැදට වෙන්න එක ඇසක් විතරක් තිබුණු බව මම කියද්දී කවුරුවත් මාව විශ්වාස කළේ නැහැ.

ඊටත් කලින් සිදුවුණු ගොඩාක් පරණ සිදුවීමකුත් මගේ මතකයට ආවා. මම පෙර පාසලේ ඉන්න කාලේ, කෙටි නින්දක් ගන්න කියලා ගුරුතුමිය මාව තියපු තොට්ටිල්ල ඇතුළට සර්පයෙක් ඇවිත් තිබුණා. මාව ගන්න අම්මා එද්දි, කොරපොතු තියෙන පුල්ලි පටියක් සමග මම සෙල්ලම් කරනවා දැකලා එයා යටිගිරියෙන් කෑගැසුවා. කොහොම හරි, මගේ සිඟිති අත් දෙකෙන් ඒ සර්පයාගේ හුස්ම හිර කරලා මරලා දාන්න මට පුළුවන් වෙලා තිබුණා.

හැම පාසලකදීම ඇඟ හිරිවට්ටන ආකාරයේ අනාරක්ෂිත සිදුවීමක් වූ නිසා මට තැනින් තැනට මාරු වෙන්න සිද්ධ වුණා.

පළතුරු තට්ටුවේ සිටි වයසක ආච්චිලා තුන්දෙනා ගැනත්, මිසිස් ඩොඩ්ස්ට කෞතුකාගාරයේදී වුණු දේ ගැනත් අම්මාට අනිවාර්යයෙන්ම කියන්න උවමනා බව මම දැනගෙන සිටියා. ඒත්, මට ඒකට හිත හදාගන්න බැරි වුණා. ඒ කතාව කිව්වොත් අපි මොන්ටවුක්වල ගෙවන නිවාඩුව මෙතැනින්ම ඉවර වේවි කියලා මට හිතුණා. එහෙම වෙනවා දකින්න මම කැමති වුණේ නැහැ.

"ඔයාව පුළුවන් තරම් මගේ ළඟින් තියාගන්න මම උත්සාහ කළා," අම්මා කිව්වා. "එහෙම කරන එක වැරැද්දක් කියලයි එයාලා

කිවුවේ. මේකට තව එක විකල්පයයි තියෙන්නේ, පර්සි - ඔයාගේ තාත්තාට ඕනෑ වුණේ ඔයාව එතැනට යවන්න. ඒත්... ඒත්, එහෙම කරන්න මට හිත හදා ගන්න බැහැ."

"මාව විශේෂ ඉස්කෝලෙකට යවන්න මගේ තාත්තාට උවමනා වුණා?"

"ඉස්කෝලයක් නෙවෙයි," අම්මා මෘදුව කිවුවා. "ගිම්හාන කඳවුරක්."

මගේ ඔළුව කරකැවෙන්න ගත්තා. මම ඉපදෙනවා බලන්නවත් ළඟ නොසිටි තාත්තා මොකටද මාව ගිම්හාන කඳවුරකට යවන්න කියලා අම්මාට කියන්නේ? අනිත් එක, ඒක ඔච්චරටම වැදගත් නම් අම්මා මීට කලින් කවදාවත් ඒ ගැන මට නොකිවුවේ ඇයි?

"මට සමාවෙන්න, පර්සි." මගේ ඇස්වල තිබුණු බැල්ම දැකලා අම්මා කිවුවා. "ඒත්, ඒ ගැන කියන්න මට බැහැ. ම-මට බැහැ ඔයාව එතැනට යවන්න. එහෙම කළොත්, සමහරවිට මට ආයේ කවදාවත් ඔයාව දකින්න ලැබෙන්නේ නැති වේවි."

"කවදාවත් දකින්න ලැබෙන්නේ නෑ? ඒත්, ඒක ගිම්හාන කඳවුරක් නම්..."

එයා ගිනිමැලය දෙසට හැරුණා. මම වැඩිදුර ප්‍රශ්න ඇසුවොත් අම්මා අඬන්න ගනීවි කියලා එයාගේ මුහුණේ තිබුණු පෙනුමෙන් මම තේරුම් ගත්තා.

එදා රෑ මම අමුතුම හීනයක් දැක්කා.

වෙරළේ කුණාටුවක් පැතිරෙමින් තිබුණා. මුහුදු රළ වදින සීමාවේ හරිම ලස්සන සතුන් දෙන්නෙක් - ඒ කියන්නේ සුදුම සුදු අශ්වයෙක් සහ රන් පාට රාජාලියෙක් එකිනෙකාව මරාගන්න උත්සාහ කරමින් සිටියා. රාජාලියා වේගයෙන් පහළට ඇවිත් අශ්වයාගේ හොම්බ පසාරු වෙන ආකාරයට තියුණු පහුරුවලින් පහර දුන්නා. අශ්වයා පිටුපස කකුල් දෙකෙන් සිටගෙන රාජාලියාගේ තටුවලට ඉදිරි පාදවලින් පහර දුන්නා. ඒ දෙන්නා සටන් කරද්දී පොළොව දෙදුරුම් කෑවා. පොළොව ඇතුළේ තැනකින් දුෂ්ට හිනා හඬක් නැගුණේ සතුන් දෙදෙනාව තව තවත් දරුණු ලෙස සටනට පොලඹවමින්.

මම ඒ පැත්තට දුවගෙන ගියේ, එයාලා එකිනෙකා මරා ගන්න කලින් එය නතර කළ යුතු බව දැනගෙනයි. ඒත්, මගේ දිවීම වේගවත්

Scanned with CamScanner

වුණේ නැහැ. මම ප්‍රමාද වැඩි බව මට තේරුම් ගියා. රාජාලියා අශ්වයාගේ ඇස ඉලක්ක කරගෙන වේගයෙන් පහළට එනවා දකලා මම කෑගැහුවා - එපා!

මම ගැස්සිලා ඇහැරුණා.

එළියේ, ඇත්තටම කුණාටුවක් හමමින් තිබුණා. එය ගස් උඳුල්ලා දමන, ගෙවල් පවා ඉදිරී යන ආකාරයේ කුණාටුවක්. වෙරළේ අශ්වයෙක්වත් රාජාලියෙක්වත් සිටියේ නැහැ. තත්පර කිහිපයකට ඉර පායනවා වගේ වටපිටාවම එළිය කරමින් විදුලි කෙටුවා. අඩි විස්සක් පමණ උස රළ ගෙඩි පෙරළි ඇවිත් වැලි කඳුවල හැපුණේ කාලතුවක්කු පහරවල් තරම් වේගයෙන්.

ඊළඟ අකුණු පහරේ හඬට අම්මා ඇහැරුණා. ඇස් දෙක ලොකු කරගෙන ඉඳගත් අම්මා "සුළි කුණාටුවක්" කියලා කිව්වා.

ඒක තේරුමක් නැති කතාවක් බව මම දන සිටියා. ගිම්හාන කතුවේ මුල් භාගයේදී ලෝන්ග් අයිලන්ඩ්වලට සුළි කුණාටු එන්නේ නැහැ. ඒත්, මුහුදට ඒක අමතක වෙලා වගෙයි. සුළඟ ගුගුරන හඬ තුළින් මොර ගහන හඬක් - තරහින් පිරුණු, වධ හිංසා දෙන හඬක් මට ඇසුණේ මගේ කෙස් පවා කෙළින් කරමිනුයි.

ඊට පස්සේ, වැලිවලට අතකොළුවකින් තලනවා වගේ තවත් හඬක් සිට්ටුවෙන්ම ඇසෙන්න වුණා. කවුදෝ කෑගසමින් කැබින් කාමරේ දොරට තඩි බාන්න ගත්තා.

ඇඳෙන් බිමට පැන්න අම්මා දොරේ අගුල ඇරියා.

ඇද හැලෙමින් තිබුණු මහ වැස්සට පිටුපා, දොර ඉදිරියේ සිටගෙන සිටියේ ග්‍රෝවර්. ඒ වුණත් එයා... එයා මම දනගෙන සිටි ග්‍රෝවර් නෙවෙයි.

"මුළු රෑ තිස්සෙම හෙව්වා," එයා අමාරුවෙන් හුස්ම අදිමින් කිව්වා. "ඔයා මොනවා හිතාගෙනද මෙහෙම ආවේ?"

අම්මා මගේ දිහා බැලුවේ භීතියට පත් වෙලා - ග්‍රෝවර් ව දකලා නෙවෙයි, එයා ආව හේතුව ගැන හිතලා.

"පර්සි," එයා වැස්සේ හඬ පරයමින් කෑගැසුවා. "ඉස්කෝලෙදී මොනවද වුණේ? ඔයා මොනවද මට නොකියා හිටියේ?"

මම ග්‍රෝවර්ව දකිමෙන් ගල් ගැහිලයි සිටියේ. මම දකින්නේ මොනවද කියලා මටම තේරුම් ගන්න බැරි වුණා.

"ඕ සියෝ කායි අල්ලෝයි තියෝයි!" ග්‍රෝවර් කෑගැසුවා. "ඒකා දැන් මගේ පස්සෙන් එනවා. ඔයා අම්මාට කිව්වේ නැද්ද?"

එයා මේ දැන් පෞරාණික ග්‍රීක භාෂාවෙන් ශාපයක් කළ බවත්, ඒක මට හරියටම තේරුම් ගිය බවත් මට ඒ වෙලාවේ තේරුම් ගන්න බැරි වුණේ මම ගොඩාක් කම්පනයට පත් වී සිටි නිසයි. මහ රෑ මැද ග්‍රෝවර් තනියම මෙතැනට ආවේ කොහොමද කියලා පුදුම වෙන්නත් බැරි තරමට මම කම්පනය වෙලයි සිටියේ. මොකද, ග්‍රෝවර් සිටියේ කලිසමක් නැතිව! ඒ වගේම, එයාගේ කකුල්...

අම්මා මගේ දිහාවට තද බැල්මක් හෙළලා, මීට කලින් කවදාවත් කතා නොකළ හඬකින් මට අණ කළා: "පර්සි, දැන්වත් ඔක්කොම කියන්න!"

පලතුරු තට්ටුවේ ආච්චිලා ගැනත්, මිසිස් ඩොඩ්ස් ගැනත් මම මොන මොනවදෝ ගොත ගසමින් කිව්වා. මගේ දෙස රවාගෙන බලා සිටි අම්මාගේ මුහුණ අකුණු එළියට පෙනුණේ මළමිනියක් වගේ සුදුමැලි වෙලයි.

වැහි කබාය මගේ දෙසට විසි කළ අම්මා, එයාගේ පසුම්බිය ඩැහැගත්තා. "ගිහිල්ලා කාර් එකට නගින්න. දෙන්නම. ඉක්මනට!"

ග්‍රෝවර් කාරයට දිව්වා - ඒත්, ඒකට දිවීමක් කියලම කියන්නත් බැහැ. එයා, එයාගේ ලොම් පිරුණු පස්සා ගාත් සොලවමින් හැල්මේ ගියා. හදිසියේම, එයාගේ කකුල් දෙකේ පේශිවල තියෙනවා කියූ අසනීපය මොකක්ද කියලා තේරුම් ගන්න මට පුළුවන් වුණා. එයා ඇවිදිනකොට බකල ගැසුවත්, වේගයෙන් දුවන්නේ කොහොමද කියලා මම තේරුම් ගත්තා.

මොකද කියනවා නම්, එයාගේ කකුල් තිබිය යුතු තැන තිබුණේ මැදින් දෙකට බෙදුණු කුර දෙකක්!

Scanned with CamScanner

04

මගේ අම්මා මට ගොන් පොර අල්ලන්න ඉගැන්නුවා

රෑයේ කළුවර ඉරාගෙන අපි ගම්බද පාරවල් දිගේ ඉදිරියට ඇදුණා. සුලං පාරවල් තදින් ඇවිත් කාරයේ හැපුණා. ඉදිරිපස වීදුරුවට වැහි බිඳු වැටුණේ කස පහරවල් වගෙයි. අම්මාට කොහොම පාර පෙනුණද කියලා මට හිතාගන්න බැරි වුණත් එයා දිගටම වාහනය පදවාගෙන ගියා.

විදුලි කෙටීමකින් කාරය ඇතුළේ ආලෝකමත් වෙන හැම වතාවකදීම, පිටුපස අසුනේ මට එහා පැත්තෙන් ඉඳගෙන සිටි ග්‍රෝවර් දිහා මම බැලුවේ මට පිස්සු හැදීගෙන එනවද, එහෙමත් නැත්නම් එයා මොකක් හරි විදිහක ලොම් රෙද්දකින් මැසූ කලිසමක් හැඳගෙන ඉන්නවද කියලා හොයා ගන්නයි. ඒත්, නැහැ. ඒ ගඳ මොකක්ද කියලා මට හරියටම මතක තිබුණේ හෝඩියේ පන්තිවල ඉන්නකොට අපිව සත්තු වත්තට එක්කගෙන ගිය චාරිකාව නිසයි. ඒක හරියට බැටළු ලොම්වලින් හැදූ චූල්වල ගඳ - නැත්නම්, ගොවිපළක ඇති කරන සතෙක් තෙමුණාම එන ගඳ වගෙයි.

"එතකොට, ඔයයි මගේ අම්මායි කලින් ඉඳලා අඳුරනවද?" ඒ වෙලාවේ මට අහන්න මතක් වුණේ එච්චරයි.

"හරියටම නෙවෙයි," ග්‍රෝවර් උත්තර දුන්නේ පිටුපස බලන කණ්ණාඩියෙන් බලමින්. ඒත්, අපිට පිටුපසින් එන වාහනයක ලකුණක්වත් තිබුණේ නැහැ.

"මං කිවුවේ, අපි මීට කලින් කවදාවත් මුණ ගැහිලා නැහැ. ඒ වුණාට මම ඔයාව මුර කරනවා කියලා ඔයාගේ අම්මා දැනගෙන හිටියා ."

"මාව මුර කළා?"

"ඔයා කරන දේවල් ගැන හෙවිල්ලෙන් හිටියා. ඔයා හොඳින්ද කියලා හොයලා බැලුවා. ඒත්, ඔයාගේ යාළුවෙක් කියලා මම කියපු එක නම් බොරුවක් කියලා හිතන්න එපා." එයා ඉක්මනින්ම තවත් එකතු කිරීමක් කළා. "මම ඇත්තටම ඔයාගේ යාළුවා."

"ම්..ම්... එතකොට, ඇත්තටම ඔයා මොකෙක්ද?"

"මේ වෙලාවේ ඒක ඒ හැටි දෙයක් නෙවෙයි නේ."

"ඒ හැටි දෙයක් නොවෙන්නේ කොහොමද? මගේ හොඳම යාළුවාගේ ඉණෙන් පහළ බූරුවෙක් වුණාම-"

"බ්ලා-හා-හා!" ග්‍රෝවර් උගුරෙන් තියුණු හඬක් පිට කළා.

ග්‍රෝවර් මීට කලිනුත් ඒ හඬ පිට කරනවා මට ඇහිලා තිබුණා. ඒත්, මම හිතාගෙන හිටියේ ඒ එයා හිනාවෙන විදිහ කියලයි. ඒත්, දැන් තමයි මට තේරුණේ ඒක එයා කේන්තියෙන් උම්බෑ කියන විදිහ කියලා.

"එළුවෙක්!" එයා මොර ගැහුවා.

"මොකක්?"

"මගේ ඉණෙන් පහළ එළුවෙක්."

"දැන් ඔයාමනේ කිවුවේ ඒක ඒ හැටි දෙයක් නෙවෙයි කියලා."

"බ්ලා-හා-හා! වෙන සැටර් (ශරීරයේ ඉහළ අර්ධය මනුෂ්‍යයෙක්ගේ හා පහළ අර්ධය එළුවෙක්ගේ හෝ අශ්වයෙක්ගේ ස්වරූපය ගන්නා සත්වයෙක්) කෙනෙක් එහෙම නම් මේ කරපු අපහාසෙට ඔයාව කුරෙන් පාගලා පොඩි කරන්නේ!"

"හෝ... පොඩ්ඩක් ඉන්න. සැටර්? ඔයා කියන්නේ හරියට මිස්ටර් බෲනර්ගේ මිථ්‍යා කතාවල ඉන්න අය වගේද?"

"අර පළතුරු තට්ටුවේ හිටිය වයසක ගෑනු තුන්දෙනා ඔයාට මිථ්‍යාවක්ද, පර්සි? එතකොට, මිසිස් ඩොඩ්ස් මිථ්‍යාවක්ද?"

"ආ... ඒ කියන්නේ ඔයා පිළිගන්නවා මිසිස් ඩොඩ්ස් කියලා කෙනෙක් ඇත්තටම හිටියා කියලා?"

"අනිවාර්යයෙන්ම."

"එහෙනම් ඇයි-"

"ඔයා ඒ ගැන අඩුවෙන් දන ගන්න තරමට ඔයා ආකර්ෂණය කර ගන්න රාක්ෂයෝ ගණනත් අඩු වෙනවා," ග්‍රෝවර් කිවුවේ හරියට ඒකෙන් මේ හැමදේම පැහැදිලි වෙනවා වගෙයි. "අපි මිනිස් ඇස්වලට මීදුමක් දම්මා. අපි බලාපොරොත්තු වුණේ කාරුණික ඇත්ති මනස්ගාතයක් කියලා ඔයා හිතයි කියලයි. ඒත්, ඒක හරි ගියේ නැහැ. ඔයා කවුද කියලා ඔයාට තේරුම් යන්න පටන් ගත්තා."

"මම කවුද - පොඩ්ඩක් ඉන්න, මොකක්ද ඒ කිවුවේ?"

අමුතු මොර දෙන හඬ අපිට පිටුපස තැනකින් ආයෙමත් ඇහෙන්න ගත්තා. හැබැයි, දන් ඒක ඇහුණේ කලින් වතාවට වඩා කිට්ටුවෙන්. අපිව ලුහුබඳින දේ මොකක් වුණත්, ඒක තවමත් අපේ ඉව පාරේ.

"පර්සි," අම්මා කිවුවා, "ඔයාට තේරුම් කරලා දෙන්න ඕනෑ දේවල් ගොඩක් තිබුණත් දන් ඒකට වෙලාවක් නැහැ. අපි කොහොම හරි ඔයාව ආරක්ෂිත තැනකට ගෙනියන්න ඕනෑ."

"ආරක්ෂා වෙන්නේ මොකෙන්ද? කවුද මේ මගේ පස්සෙන් එළවන්නේ?"

"ඔන්, වැදගැම්මකට ඇති කෙනෙක් නෙවෙයි," ග්‍රෝවර් කිවුවා. එයාට බූරුවා කිව්වට තවමත් කේන්තියෙන් ඉන්න බව ඒ කියපු විදිහෙන් මට තේරුණා.

"යම රජ්ජුරුවොයි, එයාගේ ලේ පිපාසිත දාසයෝ ටිකයි විතරයි."

"ග්‍රෝවර්!"

"සමාවෙන්න මිසිස් ජැක්සන්. මීට වඩා වේගයෙන් එළවන්න බැරිද?"

සිදු වෙමින් පැවතුන දේට හිත යොමු කරන්න මම උත්සාහ කළත් ඒක අසාර්ථක වුණා. මේක හීනයක් නොවෙන බව මම දන

හිටියා. මේ මම හිතේ මවාගත් දෙයක් නෙවෙයි. මේ තරම් අද්භූත දෙයක් හිතින් මවා ගන්න මට බැහැ.

අම්මා කාරය වම් පැත්තට හැරෙව්වේ තියුණු නැම්මක් ගනිමිනුයි. අඳුරු ගොවිපළවල්, කැලෑවෙන් වැසුණු කඳුවැටි සහ සුදු පාට උල් ලී වැටවල් පසු කරමින් අපි පටු පාරක ඇතුළට ගමන් කළා.

"අපි කොහෙද යන්නේ?" මම ඇහුවා.

"අර මං ඔයාට කිව්ව ගිම්හාන කඳවුරට." අම්මාගේ කටහඬ දැඩි වෙලා; එයා බය නොපෙන්නා ඉන්න උත්සාහ කළේ මං ගැන හිතලා වෙන්න ඇති. "ඔයාගේ තාත්තාට ඔයාව යවන්න උවමනා වුණ තැනට."

"මාව යවන්න ඔයාට උවමනා නොවුණ තැනට."

"අනේ, රත්තරන්," මගේ අම්මා අයැදුවා, "මේ කරදරේ හොඳටම ඇති. වුට්ටක් තේරුම් ගන්න බලන්නකෝ. ඔයා ඉන්නේ ලොකු අනතුරක."

"කොහෙදෝ හිටිය නාකි ආච්චි කෙනෙක් කැට් නූල් කැපුව නිසාද?"

"එයාලා නාකි ආච්චිලා නෙවෙයි." ග්‍රෝවර් කිවුවා. "එයාලා තමයි ඉරණම. ඒකේ තේරුම මොකක්ද කියලා ඔයා දන්නවද? එයාලා ඔයා ඉස්සරහ පෙනී හිටියේ ඇයි කියලා? එයාලා එහෙම කරන්නේ ඔයා... එයාලා එහෙම කරන්නේ කවුරු හරි මැරෙන්න යනවා නම් විතරයි."

"හෝ... ඔයා කිවුවේ! ඔයා කියලා."

"නෑ, නෑ. මම කිවුවේ කවුරුහරි කියලා."

"ඔයා! ඔයා, කියලා අදහස් කළේ මාව නේ."

"මම, ඔයා කියලා කිවුවේ කවුරුහරි කියන එකට මිසක් ඔයා ගැන නෙවෙයි.''

"ළමයිනේ!" අම්මා කිවුවා.

අම්මා කාරය දකුණට කපලා ගන්නකොට එයා මග හරින්න උත්සාහ කළ කෙනාගේ ඡායාවක් මම දැක්කා. ඒ අඳුරු, සැලෙන රූපය දැන් අපිට පිටුපස කුණාටුව තුළ බොඳවෙමින් තිබුණා.

"ඒ මොකෙක්ද ඒ?" මම ඇහුවා.

Scanned with CamScanner

"අපි දැන් ඒ සිටවුවටම ඇවිල්ලා ඉන්නේ," මගේ අම්මා කිවුවේ මගේ ප්‍රශ්නය නොසලකා හරිමින්. "අනේ... අනේ... තව හැකැප්මයි."

ඒ මොකද කියලා දන නොසිටියත්, මම අසුනේ ඉදිරියට නැමී බලාගෙන සිටියේ එතැනට ඉක්මනින් යන අපේක්ෂාවෙනුයි.

අපි පසු කරමින් සිටි පාළු ගම්බද පළාතේ කළුවරයි, වැස්සයි හැර වෙන කිසිම දෙයක් පේන්න තිබුණේ නැහැ.

මම මිසිස් ඩොඩ්ස් ගැන කල්පනා කරන්න ගත්තා. එයා තට්ටු දෙකතුයි දළ් දතුයි තියෙන අමුතු සතා බවට හැරුණු මොහොත මතක් වෙද්දී මගේ අත-පය හිරිවැටිලා යනවා වගේ මට දැනුණා. එයා මිනුස්සයෙක් නෙවෙයි. එයා ඇවිත් තිබුණේ මාව මරන්න.

ඊට පස්සේ මට මතක් වුණේ මිස්ටර් බෲනර්ව... එයා මගේ දිහාවට විසි කළ කඩුව ගැන. මම ඒ ගැන ග්‍රෝවර්ගෙන් අහන්න හිතනකොටම මගේ බෙල්ල පිටුපස රෝම කෙළින් වෙනවා මට දැනුණා. ඇස් අන්ධ කරවන එළියක් සමග හඬ ඇට පුපුරු වෙන තරමේ හඬක් පැතිරුණා. ඒත් එක්කම අපේ කාරය පිපිරුණා.

මගේ ඇගේ බර නැතිව ගියා වගේ හැඟීමක් මට දැනුණා මතකයි. ඒක හරියට එකම මොහොතකදී මාව අඹරලා, පොඩි පට්ටම් කළා වගෙයි.

"උහ්," මම කෑගැහුවේ රියැදුරු අසුනේ පිටුපසින් මගේ නළල මිදී කරමින්.

"පර්සි!" මගේ අම්මා කෑගැහුවා.

"මට අවුලක් නැහැ..."

මිදුළට දැනුණු හෝන්තු ගතිය පලවා හරින්න මම උත්සාහ කළා. මම නම් මැරිලා නැහැ. ඇත්තටම, අපේ කාරයත් පුපුරලා නැහැ. එවිට අගලකට වැටිලා විතරයි. කාරයේ රියැදුරු අසුන පැත්තේ දොරවල් දෙකම මඩේ හිරවෙලා. ඒ වගේම, කාරයේ වහලය බිත්තර කට්ටක් වගේ පැළිලා. එතැනින් කාරය තුළට වැසි වතුර වැගිරෙමින් තිබුණා.

අකුණක්. සිදුව වුණු දේට දිය හැකි එකම පැහැදිලි කිරීම එයයි. ඒ නිසා අපිව පාරෙන් පිටතට විසි වෙලා. පිටුපස අසුනේ මට එහා පැත්තේ කිසිම සෙලවීමක් නැති ලොකු පොදියක් තිබුණා. "ග්‍රෝවර්!"

කට කොණකින් ලේ පෙරාගෙන එයා වැටිලා සිටියා. මම එයාගේ ලොම් පිරුණු ඉණෙන් අල්ලා සෙලෙව්වේ හිතෙන් අයැදිමින්. එපා! බාගෙට පට්ටි සතෙක් වුණත් ඔයා තමයි මගේ හොඳම යාළුවා. ඔයාට මැරෙන්න දෙන්න බැහැ.

"කෑම," එයා කෙඳිරි ගානකොට එයා ගැන බය වෙන්න දෙයක් නැහැ කියලා මම දැනගත්තා.

"පර්සි," අම්මා කිවුවා. "අපිට..." එයාගේ කටහඬ ගොත ගැහෙන්න ගත්තා.

මම පිටුපස බැලුවා. මඩ ඉසුණු පිටුපස වීදුරුව තුළින් බලද්දී, විදුලි කොටන එළියෙන් පාරේ ගැට්ටෙන් පැනලා අපේ දිහාවට ඇදෙන රූපයක් මම දැක්කා. ඒක දකිනකොට මගේ ඇඟ නළියනවා වගේ මට දැනෙන්න ගත්තා. ඒ අඳුරු ඡායාවෙන් පෙනුණේ රග්බි ක්‍රීඩකයෙක් වගේ සද්දන්ත කෙනෙක්වයි. එයා ඔළුවට උඩින් බ්ලැන්කට්ටුවක් අල්ලාගෙන ඉන්නවා වගෙයි පෙනුණේ. එයාගේ ඇගේ උඩු කොටස විශාලයි. ඒ වගේම මවිල් පිරිලා. එයා උඩට ඔසවාගෙන සිටි අත් දෙක පෙනුණේ හරියට අං දෙකක් වගෙයි.

මම තදින් කෙළ ගිල්ලා. "කවුද ඒ-"

"පර්සි," අම්මා කිවුවේ මාරාන්තික බරපතළකමකින්.

"කාර් එකෙන් එළියට යන්න."

අම්මා, එයාගේ මුළු බරම යොදලා එයා ළඟ තිබුණු දොර තල්ලු කරන්න උත්සාහ කළා. ඒක මඩේ හිරවෙලා. මම, මගේ ළඟ තිබුණු දොර තල්ලු කරලා බැලුවා. ඒකත් හිර වෙලා. කරකියා ගන්න දෙයක් නැතිව මම බැලුවේ වහලේ හැදිලා තිබුණු හිල දෙසයි. සමහර විට, එතැනින් පිට වෙන්න පුළුවන් වේවි. ඒත්, ඒ හිලේ දාරවලින් දුම් දමමින් තිබුණේ.

"අතින් දොරෙන් එළියට යන්න!" මගේ අම්මා කිවුවා. "පර්සි- ඔයාට දුවන්න වෙනවා. අතන තියෙන ලොකු ගහ පේනවද?"

"මොන?"

තවත් අකුණකින් වටපිටාව ආලෝකමත් වෙද්දී වහලයේ හිල හරහා අම්මා කියූ ගහ දැකගන්න මට පුළුවන් වුණා. ධවල මන්දිරේ හදන තාත්තල් ගහ තරම් විශාල පයින් ගසක් ළඟම කන්ද මුදුනේ තිබුණා.

"ඒක තමයි ඉඩමේ මායිම," අම්මා කිවුවා.

"ඒ කන්ද උඩට ගියාම ඔයාට පෙනේවි පහළ දෙණියේ ලොකු ගොවිපළක් තියෙනවා. පස්ස බලන්නේ නැතිව එහෙට දුවන්න. උදවු ඉල්ලලා කෑගහන්න. නැබැයි, ඒ ගෙදර දොර ළඟට යනකල් නතර වෙන්න එපා."

"අම්මාත් එනවා නේ."

අම්මාගේ මුහුණ සුදුමැලි වෙලා, මුහුද දිහා බලන් ඉන්න වෙලාවට වෙනවා වගේ ඇස් දෙක දුකින් පිරුණා.

"නෑ!" මම කෑගැසුවා. "ඔයත් මං එක්ක එන්නම ඕනේ. ග්‍රෝවර්ව උස්සගන්න මට උදව් කරන්න."

"කෑම්" ග්‍රෝවර් කලින් සැරේටත් වඩා ටිකක් සද්දෙට කෙඳිරි ගෑවා.

ඔළුවේ බ්ලැන්කෙට්ටුවක් දාගෙන සිටි යෝධ මිනිසා ගොරවමින්, නහයෙන් හුස්ම පිඹිමින් දිගටම අපේ දෙසට ආවා. එයා කිට්ටුවට එනකොට මට තේරුම් ගියේ එයා ඔළුවට උඩින් බ්ලැන්කෙට්ටුවක් අල්ලගෙන ඉන්නවා වෙන්න බැහැ කියලයි. මොකද, එයාගේ මස් පිරුණු ලොකු අත් දෙක කඳ දෙපැත්තෙන් ඉස්සරහට පස්සට වැනෙමින් තිබුණා. එයා ළඟ බ්ලැන්කෙට්ටුවක් තිබුණේ නැහැ. ඔළුවක් කියලා හිතන්න බැරි තරම් විශාල ලොම් පිරුණු පොදිය... ඒක තමයි එයාගේ ඔළුව. එතකොට, අං වගේ පෙනුණු උල් දෙක...

"එයාට ඕනෑ අපිව නෙවෙයි," අම්මා මට කිවුවා. "එයාට උවමනා ඔයාව. ඒ නැතත්, මට ඉඩමේ මායිමෙන් එහාට යන්න බැහැ."

"ඒත්..."

"අපිට දන් වෙලාවක් නැහැ, පර්සි. කරුණාකරලා යන්නකෝ."

මම තරහින් පිපිරුණා. මගේ අම්මා එක්ක, ග්‍රෝවර් කියන එළුවා එක්ක වගේම, අපේ දිහාවට හෙමින් හෙමින් ඇදෙන අං තියෙන මී හරකෙක් වගේ සතා එක්කත් මට කේන්ති ගියා.

ග්‍රෝවර්ව පසු කරගෙන බඩ ගෑව මම ඒ පැත්තේ දොර ඇර ගත්තා. "අපි ඔක්කෝම එකට යමු. එන්න අම්මේ."

"මම කිව්වනේ ඔයාට-"

"අම්මා! මම ඔයාව මෙතැන දාලා යන්නේ නැහැ. ග්‍රෝවර්ව ගන්න මට උදවු කරන්න."

එයා උත්තර දෙනතුරු බලා නොඉඳ මම ග්‍රෝවර් ඇදගෙන එළියට බඩ ගෑවා. එයා පුදුම හිතෙන තරම් සැහැල්ලු වුණා. ඒත්, අම්මා මගේ උදව්වට ආවේ නැත්නම් එයාව උස්සාගෙන වැඩි දුරක් යන්න මට පුළුවන් වෙන්නේ නැහැ.

අපි දෙන්නා ග්‍රෝවර්ගේ අත් දෙක අපේ කරට උඩින් දමාගෙන කන්ද උඩට ඇදෙන්න පටන් ගත්තා. අපිට යන්න සිද්ධ වුණේ ඉණ උසට වැවුණු තණ ගොල්ලක් මැදිනුයි.

ආපහු හැරිලා බලද්දී, පළවෙනි වතාවට මට ඒ රාක්ෂයාව හරියට බලාගන්න පුළුවන් වුණා. එයා අඩුම තරමේ අඩි හතක්වත් උස ඇති. අයෝමය පුරුෂයෙක් වගේ මස් ගොබ පිරුණු අත පය ඒ සතාට තිබුණා. දීප්තිමත් සුදු පාට යට ඇඳුමක් ඇරෙන්න එයා වෙන කිසිවක් හැඳගෙන සිටියේ නැහැ. එයාගේ උඩු කොටස ඒ තරම් භයානක පෙනුමක් නොගත්තා නම් ඒක හරිම විහිළු පෙනුමක් ගන්න ඉඩ තිබුණා. දුඹුරු පාට දළ ලොම් එයාගේ බඩේ ඉඳලා උඩට පැතිරී ගොස්, උරහිස් ළඟදී ගොඩාක් ඝනකමට වැවී තිබුණා.

මස්පිඩු ගොඩකින් හැදිලා තිබුණු එයාගේ බෙල්ලේ සිට, අති විශාල ඔළුව දක්වාම ලොම් පැතිරී තිබුණා. මගේ අතක් තරම් දිගු හොම්බේ තිබුණු තෙත් නාස්පුඩුවලට දිලිසෙන පිත්තල මුදු දමලා. කළු සහ සුදු පාට යෝධ අං දෙකෙළවර ගොඩාක් උල් වී තිබුණේ ඒ සතාට අති භයානක පෙනුමක් දෙමිනුයි.

ඒ රාක්ෂයා මොකාද කියලා මම හඳුනා ගත්තා. මෙහෙමයි, මිස්ටර් බෲනර් අපිට කියලා දුන් මුල්ම කතාවලින් එකක මේ සතා සිටියා. ඒත්, එහෙම සත්තු ඇත්තටම ඉන්න විදිහක් නැනේ.

ඇසට වැටුණු වතුර බිඳුවක් මග හරින්න මම ඇසිපිය සැළුවා. "ඒකා -"

"පර්සිෆයිගේ පුතා," මගේ අම්මා කිවුවා. "එයාලාට ඔයාව ගන්න මෙච්චර ලොකු උවමනාවක් තියෙනවා කියලා මම කලින් දැනගෙන හිටියා නම්..."

"ඒත්, ඒ තමයි මින-"

"උගේ නම කියන්න එපා," අම්මා අනතුරු ඇඟෙව්වා. "නම්වලට බලයක් තියෙනවා."

අපි තවමත් පයින් ගහට ගොඩාක් ඈතින් - අඩුම තරමේ තවත් යාර සීයක්වත් කන්ද උඩට යන්න උවමනායි.

මම ආයෙමත් පිටුපස හැරී බැලුවා.

ගොන්-මිනිහා අපේ කාරය උඩට නැගලා ජනේලවලින් එබී බලමින් සිටියා. බලමින් සිටියා කිව්වට ඒකා බලනවාට වඩා කළේ නහය අතුල්ලන එකයි. හරියට ඉව කරනවා වගෙයි. ඌ ඔය තරම් කරදර වෙන හේතුව මට හිතාගන්න බැරි වුණා. මොකද, ඒ වෙනකොටත් අපි මිනින් තිබුණේ අඩි පනහක් විතරනේ.

"කැම්?" ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"ශ්ශ්..." මම කිවුවා. "අම්මේ, ඌ මොනවද ඒ කරන්නේ? ඒකාට අපිව පේන්නේ නැද්ද?"

"උගේ ඇස් පෙනීමයි කන් ඇහීමයි අන්තිම සවුත්තුයි," අම්මා කිවුවා. "ඌ යන්නේ ඉව පාරේ. ඒ වුණාට, අපි ඉන්නේ කොහෙද කියලා ඒකා ඉක්මනටම හොයා ගනී."

ගොන්-මිනිහා කේන්තියෙන් තප්පු ලෑවේ ඒ බව අඟවන්න වගෙයි.

ඒ සතා ගේබ් ගේ කාරයේ ඉරුණු වහලයෙන් අල්ලා ඔසවා ගනිද්දි වාහනයේ වැසිය කිරි කිරි ගෑවා. ඒකා කාරය ඔළුවට උඩින් උස්සා පාරේ පහළට වීසි කළා. වැස්සට තෙමී තිබුණු තාර උඩට වැටුණු කාරය, ගිනි පුලිඟු විසුරුවමින් සැතපුම් බාගයක් විතර ගොස් නතර වුණා. ඊට පස්සේ ඉන්ධන ටැංකිය පුපුරා ගියා.

'සීරීමක්වත් වෙන්න බැහැ,' ගේබ් කියපු විදිහ මට මතක් වුණා.

"අයියෝ!"

"පර්සි," අම්මා කිවුවා. "ඒකා අපිව දැක්කම අනින්න දුවගෙන එයි. එනකොට අන්තිම තත්පරය වෙනකල් බලාගෙන ඉන්න. ඊට පස්සේ ඉන්න තැනින් පැත්තකට පනින්න - කෙලින්ම අනෙක් පැත්තට. අනින්න දුවගෙන එන වෙලාවට ඉක්මනට පැති මාරු කරන්න ඌට අමාරුයි. ඔයාට තේරෙනවා නේද?"

"මේ ඔක්කොම දේවල් ඔයා දන්නේ කොහොමද?"

"මෙහෙම පහර දීමක් වෙයි කියලා මම ගොඩක් කාලයක් තිස්සේ බයෙන් හිටියේ. මෙහෙම වෙයි කියලා මට කලින්ම තේරුම් ගන්නයි තිබුණේ. ඔයාව මගේ ළඟ තියාගෙන මම කළේ ගොඩාක් ආත්මාර්ථකාමී වැඩක්."

"මාව ඔයා ළඟ තියාගෙන? ඒත් -"

තරහින් කළ තවත් තප්පු ලෑමක් එක්ක ගොන්-මිනිහා කන්ද නගින්න පටන් ගත්තා.

උාට අපේ ඉව දැනිලා.

පයින් ගසට තිබුණේ තවත් යාර කීපයක දුරක් විතරයි. ඒත්, කන්දේ බෑවුමත්, ලිස්සන ගතියත් එන්න එන්නම වැඩි වුණා. මට ග්‍රෝවර්ව තව දුරටත් සැහැල්ලුවෙන් දැනුණේ නැහැ.

ගොන්-මිනිහා අපේ කිට්ටුවටම ආවා. තවත් තත්පර කීපයකින් ඌ අපේ උඩට පනීවි.

ඒ වෙනකොට අම්මා ඉන්න ඇත්තේ හොඳටම හෙම්බත් වෙලයි. ඒ වුණත් එයා ග්‍රෝවර්ට උර දුන්නා. "යන්න, පර්සි! අපි බෙදිලා යමු! මම කිව්ව දේ මතක තියා ගන්න."

බෙදිලා යන්න මට උවමනා වුණේ නැතත්, එයා කියන දේ නිවැරදි බව මට දැනුණා. ඒක තමයි අපිට තිබුණු අන්තිම අවස්ථාව. මම වම් පැත්තට හැරිලා ටික දුරක් දුවගෙන ගිහින් බලද්දි ඒ සතා මගේ පැත්තට එනවා පෙනුණා. ඒකාගේ කළු ඇස් දෙක වෛරයෙන් දිලිසුනා. කුණු වූ මස්වල ගඳක් ඒ සතාගෙන් හැමුවා.

ගොන්-මිනිහා ඔළුව පාත් කරගෙන දුවගෙන ආවේ මට අනින්නයි. දැලිපිහි වගේ තියුණු අං දෙක කෙලින්ම ඉලක්ක වෙලා තිබුණේ මගේ පපුවටයි.

මගේ බඩ පෙරළෙමින් දැනුණු බය නිසා මට දුවන්න උවමනා වුණා. ඒත්, ඒකෙන් වැඩක් නැති වෙයි. මේ සතාට වඩා වේගයෙන් දුවන්න මට කොහෙත්ම පුළුවන් කමක් නැහැ. ඒ නිසා මම සිටි තැනම නතරවෙලා, අන්තිම තත්පරේදී පැත්තකට පැන්නා.

බඩු කෝච්චියක් වගේ වේගයෙන් එතැන පසු කරගෙන ගිය ගොන්-මිනිහා කේන්තියෙන් තප්පුලමින් ආපසු හැරුණා. ඒත්, මේ සැරේ මගේ පැත්තට නෙවෙයි, ග්‍රෝවර්ව තණ ගොල්ලේ වාඩි කරවමින් සිටි මගේ අම්මාගේ දිහාවටයි ඒකා හැරුණේ.

Scanned with CamScanner

අපි කන්ද මුදුනට ළං වෙලයි සිටියේ. අම්මා කියූ විදිහටම කන්දෙන් එහා පැත්තේ දෙණියක් තියෙනවා මට පෙනුණා. ගොවිපළකින් නික්මුණු එළි, වැස්ස අතරින් කහ පාටට දිලිසුනා. ඒත්, ඒ සැතපුම් බාගයක් විතර දුරින්. ඒ තරම් දුරක් යාගන්න අපිට කොහෙත්ම ඉඩක් නැහැ.

කකුලෙන් පොළොව පහුරු ගාමින් ගොන්-මිනිහා ගෙරෙව්වා. උගේ ඇස් යොමු වී තිබුණේ මගේ අම්මා දිහාවටමයි. අම්මා කන්ද පහළ පාර දෙසට හෙමින් හෙමින් පසු බහින්න ගත්තේ රාක්ෂයාව ග්‍රෝවර්ගෙන ඈතට ගෙනයන්නයි.

"දුවන්න, පර්සි!" අම්මා කිව්වා. "මෙතැනින් එහාට මට යන්න බැහැ. දුවන්න!"

ඒත්, බය නිසා මම සිටි තැනම ගල්වෙලා. රාක්ෂයා අම්මාට අනින්න දුවගෙන යද්දී අම්මා මට කියා දුන් විදිහටම පැත්තකට පනින්න උත්සාහ කළා. ඒත්, කලින් වතාවේ සිදු වූ දෙයින් පාඩමක් ඉගෙන ගෙන සිටි ගොන්-මිනිහා අම්මා පනිද්දිම අත දිගු කර අම්මාගේ බෙල්ලෙන් අල්ලා ගත්තා. අතින් පයින් පහර දෙමින් දඟලන අම්මාව ඌ ඉහළට එසෙව්වා.

"අම්මේ!"

මගේ ඇස් දිහා බැලූ අම්මා අමාරුවෙන් අන්තිම වචනය පිට කළා. "යන්න!"

ඒත් එක්කම, තරහින් ගර්ජනය කළ රාක්ෂයා මගේ අම්මාගේ බෙල්ල වටා තිබුණු ග්‍රහණය දැඩි කළා. මගේ ඇස් ඉදිරිපිටදීම මගේ අම්මා දීප්තිමත් රත්වන් ආලෝකයක් වී දිය වෙලා ගියේ හරියට ප්‍රක්ෂේපණ යන්ත්‍රයකින් නිකුත් වූ රූපයක් වගෙයි. ඇස් තිලංකාර කරවන ආලෝකයක් පැතිරුණා. ඊට පස්සේ බලනකොට අම්මා... අතුරුදහන් වෙලා.

"එපා!"

මගේ හිතේ තිබුණු බය පරදා කෝපය මතු වුණා. මෙතෙක් වෙලා නොදැනුණු ශක්තියක් මගේ බාහුවලට දැනෙන්න ගත්තේ හරියට මිනිස් වෙඩිස්සේ නිය පහුරු මතු වූ වෙලාවේ දැනුණා වගෙයි.

තණ ගොල්ලේ අසරණව වැතිරිලා සිටි ග්‍රෝවර් දිහාවට ගොන්-මිනිහා හැරුණා. මගේ හොඳම යාළුවා උඩින් නැමුණු රාක්ෂයා ඉව කරන්න ගත්තේ එයාවත් උස්සලා අරන් දිය කරලා දාන්න වගෙයි.

ඒකට ඉඩ දීලා බලාගෙන ඉන්න මට පුළුවන් කමක් තිබුණේ නැහැ.

මම, මගේ රතු පාට වැහි කබාය ගලවලා අතට ගත්තා.

"හේයි!" කබාය වනමින් ගොන්-මිනිහාගේ පැත්තට දුවන ගමන් මම කෑගැහුවා. "ඒයි, මෝඩයා! බිං හරකා!"

"රා...ර්!" මස් ගොබ පිරුණු දත් සොලවමින් රාක්ෂයා මගේ පැත්තට හැරුණා.

මට අදහසක් පහළ වුණා - ඒක හරිම මෝඩ අදහසක් වුණත්, කිසිම අදහසක් නැතිව ඉන්නවට වඩා ඒක හොඳයි හිතුණා. මම පයින් ගසට හේත්තු වෙලා ගොන්-මිනිහා දෙසට රතු කබාය වැනුවේ අන්තිම මොහොතේ පැත්තකට පැනගන්න හිතාගෙනයි.

ඒත්, මම සිතූ විදිහට ඒක සිද්ධ වුණේ නැහැ.

මම මොන පැත්තට පැන්නත් මාව අල්ලා ගැනීමට සූදානමින් අත් දෙක දෙපසට විහිදුවාගත් ගොන්-මිනිහා දුවගෙන ආවේ හිතාගන්නත් බැරි වේගයකින්.

කාලය ගතවීම මන්දගාමී වුණා.

මගේ කකුල්වල පේශි තද වුණා. දෙපැත්තට පනින්න බැරි නිසා කෙලින්ම උඩට පැන්න මම රාක්ෂයාගේ ඔළුවට පයින් ඇන, එයින් ගැම්මක් ගනිමින් උඩු ගුවනේදීම වටයක් හැරී ඌගේ කර උඩට පාත් වුණා.

කොහොමද මම එහෙම දෙයක් කළේ? ඒ ගැන හොයා බලන්න තරම් කාලයක් මට තිබුණේ නැහැ. ඊට මිලි තත්පරයකට විතර පසු, රාක්ෂයාගේ ඔළුව ගසේ හැප්පුණා. ඒ ගැටුමෙන් මගේ දත් ටික නොකැඩී බේරුණේ නූලෙන් වගෙයි.

මාව බිම වට්ටන්න උත්සාහ කරමින් ගොන්-මිනිහා වටේට කැරකුණා. මාව විසිවී නොයන විදිහට මම අත් දෙක අං දෙක වටා පටලවා ගත්තා. තවමත් අකුණු හා විදුලි කෙටීම් තදින්ම පැවතුණා.

මගේ පෙනීමට බාධා කරමින් වැහි බිඳු මගේ ඇස්වලට වැටුණා. කුණු මස්වල ගඳින් මගේ නාස් පුඩු ඇවිළෙනවා වගෙයි මට දැනුණේ.

රාක්ෂයා ඇඟ සොලවමින් එහෙ මෙහෙ පනින්න ගත්තේ කුළු හරකෙක් වගෙයි. ඌට තිබුණේ කෙලින්ම පිටුපසට ගිහින් මාව පොඩි වී යන විදිහට ගසේ පිට හප්පන්නයි. ඒත්, මේ සතාට යන්න පුළුවන් එක පැත්තකට විතරයි කියලා මට තේරුණා ඒ ඉදිරියට විතරයි.

ඒ අතරේ, තණ ගොල්ලේ වැතිරී සිටි ග්‍රෝවර් කෙඳිරි ගාන්න ගත්තා. කට වහගන්න කියලා එයාට කෑ ගහන්න මට ඕනෑ වුණත්, මාව උඩට පහළට වීසි වෙමින් සිටි වේගයට කට ඇරියොත් මම, මගේ දිව හපා ගන්න බව මට තේරුණා.

"කෑම්" ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

එයා දෙසට හැරුණු ගොන්-මිනිහා පොළොව පහුරුගාමින් සූදානම් වුණේ එයාට පහර දෙන්නයි. ඌ මගේ අම්මාගේ ජීවය මිරිකා අරන්, එයාව අතුරුදහන් කළ විදිහ මට මතක් වුණා. ඒ මතකයත් එක්කම වියරු තරහකින් මගේ හිත පිරුණා. මම අත් දෙකින්ම එක් අඟක් අල්ලාගෙන, මගේ උපරිම ශක්තිය යොදමින් පිටුපසට ඇද්දා. කම්පනය වුණු රාක්ෂයා පුදුමයෙන් වගේ ගෙරෙව්වා. ඊත් එක්කම- 'කරාස්'

යටි ගිරියෙන් කෑගැසූ ගොන්-මිනිහා මාව ඈතට වීසිකළා. මම තණ ගොල්ල මත උඩුබැලි අතට වැටෙද්දී මගේ ඔළුව ගලක වැදුණා. මම අමාරුවෙන් නැගිටලා ඉඳ ගනිද්දී මගේ ඇස් දෙක බොඳවෙන්න ගත්තා. ඒත්, ගොන්-මිනිහාගේ අඟක් මගේ අතේ. ඒක කඩතොළු වුණ ඇටකටුවකින් හැදූ පිහියක් වගෙයි.

ගොන්-මිනිහා ආයෙමත් අනින්න ආවා.

හිත හිතා ඉන්න කාලයක් නොගෙන මම පැත්තකට පෙරළිලා දණගසා ගත්තා. රාක්ෂයා මාව පසුකර යනවත් එක්කම මම, මගේ අතේ තිබුණු කැඩුණු අඟ ඌගේ ලොම් පිරුණු ඉළ ඇට කුඩුවට යටින් ඇන්නා.

ගොන්-මිනිහා ගොරවන්න ගත්තේ මර වේදනාවෙන්. නලියමින් පසුව පහුරු ගෑව ඒ සතා ටිකින් ටික දිය වෙන්න ගත්තා. මගේ අම්මා රන්වන් එළියකට දිය වුණා වගේ නෙවෙයි - මිසිස් ඩොඩ්ස්ට වුණා වගේ ඒ සතාත් වැලිවලට කුඩුවෙලා සුළඟට ගසාගෙන ගියා.

ඒ වෙද්දී වැස්ස නතර වෙලා. කුණාටුව තවමත් ගිගුම් දුන්නත් ඒ ඈතින්. මම කුණු ගොඩක් වගේ ගඳ ගැහුවා. මගේ දණහිස් දෙක ගැහෙනවා වගේ මට දැනුණා. මගේ ඔළුවත් පැළිලා වගේ රිදෙන්න ගත්තා. මාව දුර්වල වෙලා වෙවුලන්න ගත්තේ බයට වගේම දරා ගන්න බැරි දුකටයි. මගේ ඇස් ඉදිරිපිටම මගේ අම්මා අතුරුදහන් වුණා. බිම පෙරළෙමින් අඬන්න මට ඕනෑ වුණත්, ග්‍රෝවර්ට මගේ උදවු උවමනායි. ඉතින්, මම ග්‍රෝවර්වත් වාරු කරගෙන දෙණිය පහළ තිබුණු ගොවිපළ දිහාවට හෙමින් හෙමින් යන්න ගත්තා. මම අඬ අඬා මගේ අම්මාට කතා කළා. ඒ මොනවා කළත් මම ග්‍රෝවර්ව වාරු කරගෙනම සිටියා. එයාවත් නැති කරගන්න මම සූදානම් වුණේ නැහැ.

මට අන්තිමට මතක මම ලී දොර පියස්සක් යට ඇද වැටුණු හැටියි. මට උඩින් තිබුණු සිවිලිමේ විදුලි පංකාවක් කැරකෙමින් තිබුණා. කහ පාට විදුලි බුබුළක් වටේට සලබයෝ පියාඹුවා. රැවුල වැවූ හුරු පුරුදු මුහුණක් සහ කුමාරිකාවකගේ වගේ කැරලි ගැසුණු තඹ පාට කොණ්ඩයක් ඇති ලස්සන ගැහැනු ළමයෙකුගේ මුහුණක් මගේ දිහා බරපතළ බැල්මෙන් බලා සිටියා. "එයා තමයි කෙනා, එයා වෙන්නම ඕනෑ." ගැහැනු ළමයා කිවුවා.

"නිශ්ශබ්ද වෙන්න, ඇනබෙත්," පිරිමි කෙනා කිවුවා. "එයාට තවම සිහිය තියෙනවා. එයාව ඇතුළට ගන්න."

Scanned with CamScanner

05

මම අශ්වයෙක් සමග කාඩ් සෙල්ලම් කළා

ගොවිපළ සත්තු පිරුණු විකාර හීන ගොඩක් මට පෙනුණා. එයාත් වැඩි දෙනෙකුට උවමනා වුණේ මාව මරන්න. ඉතිරි ටිකට උවමනා වුණේ කෑම.

මම සිහිප සැරයක්ම ඇහැරෙන්න ඇති, ඒත්, මට ඇසුණු හා පෙනුණු දේවල අගක්-මුලක් තේරුම් ගන්න මට පුළුවන් වුණේ නැහැ. ඒ නිසා මම ආපසු නින්දට වැටුණා. මම මෑදු ඇඳක වැතිරී ඉන්නකොට, තඹ පාට කැරලි කොණ්ඩකාරී බටර් දැමූ පොප් කෝන්වල රසැති පුඩිමක් වගේ කෑමක් මට හැන්දකින් කැව්වා. එයා මගේ දිහාවට නැමිලා, මගේ නිකට දිගේ බේරුණු බිඳිති හැන්දට ගත්තේ බොරුවට හිනා වෙමින්.

"උත්තරායනයේදී මොකක් සිද්ධ වෙයි ද?" එයා මගෙන් ඇහුවේ මම ඇස් අරිනවා දැකලයි.

"මොකක්ද?" මම අමාරුවෙන් කෙඳිරුවා.

එයා වටපිට බැලුවේ වෙන කාටවත් ඇහේවි කියලා බයෙන් වගෙයි. "මොනවද මේ සිද්ධ වෙන්නේ? මොකක්ද හොරකම් කරලා තියෙන්නේ? අපිට ඉතිරි වෙලා තියෙන්නේ තව සති කීපයක් විතරයි."

"මට කණගාටුයි," මම මිමිණුවා. "මට තේරෙන්නේ..."

කවුදෝ දොරට තට්ටු කළා. ගැහැනු ළමයා ඉක්මනින් තවත් පුඩිං හැන්දක් මගේ කටට එබුවා.

ඊළඟ වතාවේ මම ඇහැ අරිනකොට ගැහැනු ළමයා ගිහිල්ලා.

රළු තඹ කොණ්ඩයක් තිබුණු ජේන්තුකාරයෙක් කාමරයේ කොණක සිටගෙන මාව මුර කරමින් සිටියා. එයාගේ නිල් පාට ඇස් - අඩුම තරමින් දුසිමක් විතර - එයාගේ කම්මුල්වල, නළලේ සහ අත් දෙක පිටුපස විසරී තිබුණා.

අන්තිමේදි, මට හරියටම සිහිය ලැබෙනකොට මගේ වටපිටාවේ තිබුණු කිසිම දෙයක් මට අද්භූත විදිහට දැනුණේ නැහැ. ඇත්තටම, මට පුරුදු අයටත් වඩා මෙයාලා හොඳ අය බව මට තේරුණා. අති විශාල දොර පියස්ස යට තිබුණු පුටුවක වාඩිවෙලා මම බලාගෙන සිටියේ දෙණියට එහා, ඈතින් පෙනුණු කොළ පාට කඳු දිහායි. හමා ආ මඳ සුළඟේ තිබුණේ ස්ට්‍රෝබෙරි සුවඳක්. මගේ කකුල්වලට බ්ලැන්කට්ටුවක් පොරවා, බෙල්ල පිටුපසින් කොට්ටයක් තබා තිබුණේ මගේ පහසුවටයි. ඒ හැමදේම හොඳ වුණත්, මගේ කට ඇතුළේ නම් ගෝනුස්සෙක් පදිංචි වෙලා ඉඳලා වගෙයි මට දැනුණේ. මගේ වේලුණු දිවට අප්‍රසන්න ගතියක් දැනුණා. ඒ වගේම, මගේ කටේ තිබුණු හැම දතක්ම රිදුම් දුන්නා.

මට එහා පැත්තේ මේසය උඩ උස බීම වීදුරුවක් තිබුණා. කොළ පාට බීම බටයක් දමා තිබුණු ඒක පෙනුණේ අයිස් දැමූ ඇපල් බීම වීදුරුවක් වගෙයි.

මගේ අත් දෙක කොයි තරම් දුර්වල වෙලා තිබුණාද කියනවා නම්, මම වීදුරුව ගන්න ගිහින් තව පොඩ්ඩෙන් ඒක අත ඇරෙනවා.

"පරිස්සමෙන්," මට හුරු පුරුදු කටහඬක් ඇහුණා.

පියස්ස වටා තිබුණු අත්වැටට හේත්තු වෙලා සිටියේ ග්‍රෝවර්. එයාට තිබුණේ සතියකින් විතර නිදා නොගත් පෙනුමක්. උස බූට් දෙකක් දාලා, නිල් පාට කලිසමක් සමග 'අර්ධ-ලෝහිත කඳවුර' කියලා මුද්‍රණය කළ දීප්තිමත් තැඹිලි පාට ටී ෂර්ට් එකක් හැඳ සිටි ග්‍රෝවර්, එක කිහිල්ලක් යට සපත්තු පෙට්ටියක් රඳවාගෙන සිටියා. අර එළු කොල්ලා නෙවෙයි, පරණ පුරුදු ග්‍රෝවර්මයි.

ඉතින්, සමහරවිට මට නරක හීනයක් පේන්න ඇති. සමහරවිට මගේ අම්මා කරදරයක් නැතිව හොඳින් ඇති. අපි, අපේ නිවාඩුව ගත

කරන අතරේ මොකක් හරි හේතුවකට මේ ලොකු ගෙදරට ආවද දන්නේ නැහැනේ. එතකොට...

"ඔයා මගේ ජීවිතය බේරුවා," ග්‍රෝවර් කිව්වා. "මම... මෙහෙමයි. අඩුම තරමේ මට කරන්න පුළුවන් එකම දේ... මම ආපහු කන්ද පහළට ගියා. සමහරවිට ඔයාට මේක උවමනා වෙයි කියලා මට හිතුණා."

එයා බොහෝම ගෞරවයෙන් සපත්තු පෙට්ටිය මගේ ඔඩොක්කුවෙන් තැබුවා.

ඒක ඇතුළේ තිබුණේ කළු සහ සුදු පාට ගොන් අඟ. එය කැඩී වෙන් වූ තැනින් කඩතොළු වෙලා, මුදුන් කෙළවරේ වේලුණු ලේ තැවරිලා තිබුණා. ඒ කියන්නේ, ඒ දේවල් මට පෙනුණු නරක හීනයක් නෙවෙයි.

"මිනටෝර්," මම කිව්වා.

"ම්ම්... පර්සි, ඒක එච්චර හොඳ අදහසක් නෙවෙයි-"

"ඒක නේද ග්‍රීක මිථ්‍යා කතාවල එයාට කියන නම?" මම එයාගෙන් ඇහුවා. "මිනටෝර්. බාගෙට මිනිස්, බාගෙට ගොනෙක්."

ග්‍රෝවර් අපහසුවෙන් වගේ ඉරියව්ව මාරු කළා. "ඔයා දවස් දෙකක් තිස්සේ සිහිය නැතිව හිටියා. ඔයාට කොච්චරක් මතකද?"

"මගේ අම්මා. එයා ඇත්තටම..."

එයා බිම බලාගත්තා.

මම දෙණිය දිහා බලාගෙන සිටියා. එහි ගස් ගොන්නකුත්, දඟර ගැසෙමින් ගලා ගිය දිය පාරකුත්, ඒ වගේම නිල් අහස යටින් අක්කර ගාණක් පුරාවට පැතිරී ගිය ස්ට්‍රෝබෙරි වගාවකුත් තිබුණා. කඳු වළල්ලකින් මුළු දෙණියම වටවෙලා. ඒ කඳු අතරින් උසම කන්ද තිබුණේ හරියටම අපිට ඉදිරියෙන්. ඒ කන්ද මුදුනේ ලොකු පයින් ගස තිබුණා. ඉර එළියත් එක්ක ඒ දේවල් හරි ලස්සන දර්ශනයක් මැව්වා.

මගේ අම්මා නැතිවෙලා. හරි නම් මුළු ලෝකයම සීතල සහ අඳුරු තැනක් විය යුතුයි. කිසිම දෙයක් ලස්සන වෙන්න බැහැ.

"මට සමාවෙන්න," ග්‍රෝවර් නහය ඉහළට ඇද්දා. "මම පරාජිතයෙක්. මම-මම තමයි මේ ලෝකේ ඉන්න නරකම සැටර්."

එයා අඩමින් කකුල බිම ගැසූ වේගයට ඒක ගැලවිලා ආවා. මම අදහස් කළේ, එයා දාගෙන සිටි බූට් සපත්තුව ගැලවිලා ආවා. ඒක ඇතුළේ කුරයක හැඩයේ හිලක් ඉතිරි වෙන්න අනිත් සියල්ලම පුලුන්වලින් පුරවලා තිබුණා.

"ඔහ්, ස්ටයික්ස්!" එයා කෙඳිරුවා.

පැහැදිලි අහස හරහා අකුණක් ඇදී ගියා.

හොඳයි, ඒකෙන් ඔක්කොම පැහැදිලි වෙනවා, බොරු කකුල ඇතුළට එයාගේ කුරය රිංගවා ගන්න ග්‍රෝවර් දඟලන අතරේ මම හිතුවා.

ග්‍රෝවර් කියන්නේ සැටර් කෙනෙක්. එයාගේ කැරළි කොණ්ඩය බූගාලා බැලුවොතින් චූටි අං දෙකකුත් බලා ගන්න පුළුවන් වෙයි කියලා මට ඔට්ටුවක් වුණත් අල්ලන්න පුළුවන්. ඒත්, සැටර්ලා තියා, මිනටෝර්ලාවත් මේ ලෝකේ ඇත්තටම ඉන්නවා කියන එකේ කිසිම පුදුමයක් නොදනෙන තරමටම මගේ තත්වය දුක්ඛිත හා මූසල වුණා. මේ සියල්ලෙන්ම මම තේරුම්ගත් එකම කාරණය වුණේ, මගේ අම්මාව ඇත්තටම ශූන්‍යයක් වෙනතුරු මිරිකා, එයාව රන් පාට ආලෝකයකට දිය කර දාලා කියන එකයි.

මම තනිවෙලා. මාව අනාථයෙක් වෙලා. මට ජීවත් වෙන්න සිද්ධ වෙන්නේ ගඳ ගහන ගේබ් එක්කද? නෑ. ඒක නම් කවදාවත් සිද්ධ වෙන්නේ නෑ. ඊට වඩා හොඳයි මහ පාරේ ජීවත් වෙන එක. මට අවුරුදු දහ හත සම්පූර්ණයි කියලා බොරුවට අඟවලා මම හමුදාවට බැඳෙනවා. මම ඔය මොනවා හරිම කරනවා.

ග්‍රෝවර් සිටියේ තවමත් හූල්ලමින්. පව්, අසරණ කොල්ලා - අසරණ එළුවා, සැටර්, ඕනෑ එකක් - බලාගෙන හිටියේ හරියට ගුටි කන්න සූදානමින් වගෙයි.

"ඒක සිද්ධ වුණේ ඔයාගේ වැරැද්දක් නෙවෙයි." මම කිව්වා.

"නැහැ. ඒක මගේ වැරැද්ද. මට කියලා තිබුණේ ඔයාව ආරක්ෂා කරන්න කියලා නේ."

"මගේ අම්මා ද ඔයාට කිවුවේ මාව ආරක්ෂා කරන්න කියලා?"

"නෑ. ඒක මගේ රස්සාව. මම වැඩ කරන්නේ රැකවලෙක් විදිහට. අඩු තරමේ... මම වැඩ කළේ රැකවලෙක් විදිහට."

"ඒත් ඇයි..." හදිස්සියේම වගේ මට කරකැවිල්ලක් දැනුණා. මගේ ඇස් දෙකත් බොඳවුණා.

"ඔයා වැඩිය මහන්සි වෙන්න එපා," ග්‍රෝවර් කිවුවා. ''මෙන්න." එයා මගේ අතේ තිබුණු වීදුරුව අල්ලගෙන බීම බටය මගේ කටට කිට්ටු කළා.

ඒකේ රස දැනෙද්දී මගේ දිව පැකිළුණා. මොකද, මම බලාපොරොත්තු වුණේ ඇපල් බීම. ඒත්, ඒක කොහෙත්ම ඇපල් බීම රසයක් ගත්තේ නැහැ. ඒකෙන් ආවේ චොකලට් චිප් විස්කෝතු රසයක්. දියර විස්කෝතු. අනෙක් අතට, ඒවා නිකන්ම විස්කෝතුත් නෙවෙයි - ඒවා මගේ අම්මා ගෙදර හදන නිල් පාට චොකලට් විස්කෝතු, බටර් රස දිවට දැනෙන, චොකලට් කැබලි දිය වෙමින් තියෙන, උණු උණු විස්කෝතු. ඒක බොනකොට මගේ මුළු ඇඟම උණුසුම් වෙමින් ශක්තිය පිරෙනවා වගේ මට දැනුණා. මගේ දුක නම් හිතෙන් ඉවත් වුණේ නැහැ, ඒත්, මට දැනුණේ මගේ අම්මා මං පුංචි කාලේදී කළා වගේ, මගේ කම්මුල අතගාලා මගේ අතට විස්කෝතුවක් දීලා, හැමදේම හොඳින් සිද්ධ වෙයි කියලා මාව සනසනවා වගෙයි.

කිසි දෙයක් තේරුම් ගන්නත් කලින් මම බීම වීදුරුවම හිස් කරලා තිබුණා. මම ඒ වීදුරුව දිහා බලාගෙන සිටියේ පුදුමයෙන්. මේ දන් මට බොන්න ලැබුණේ උණුසුම් බීමක් කියලා මට හොඳටම විශ්වාසයි. ඒ වුණත් වීදුරුවේ අයිස් කැට දිය වෙන්න පටන් ගෙනවත් තිබුණේ නැහැ.

"ඒක හොඳයිද?" ග්‍රෝවර් ඇසුවා.

මම ඔළුව වැනුවා.

"ඒකේ රස මොන වගේද?" එයා ඇසුවේ ආසාවෙන් වගෙයි. මට වරදකාරී හැඟීමක් දැනුණා.

"අයියෝ," මම කිවුවා. "ඔයාටත් ටිකක් රස බලන්න දෙන්න තිබුණේ."

එයාගේ ඇස් දෙක ලොකු වුණා. "නෑ! මම අදහස් කළේ ඒක නෙවෙයි. මම ටිකක්... පුදුම වුණා."

"චොකලට් විස්කෝතු," මම කිවුවා. "මගේ අම්මා ගෙදර හදන ඒවා."

එයා හිල්ලුවා. "ඉතින්, දන් ඔයාට කොහොමද දැනෙන්නේ?"

"මට දන් නැන්සි බොබ්ෆිට්ව යාර සීයක් විතර ඈතට වීසි කරන්න පුළුවන් වගේ."

"ඒක හොඳයි," එයා කිවුවා. "ඒක නියමයි. මම හිතන්නේ ඒවා තව ටිකක් බොන්න අවදානමක් ගන්න ඔයාට බැරිවෙයි."

"ඒ කිවුවේ?"

එයා මගේ අතේ තිබුණු හිස් වීදුරුව අරන් මේසය උඩින් තැබුවේ ඩයිනමයිට් එකක් අල්ලනවා වගේ පරිස්සමින්. "එන්න යමු. කයිරොන්, මිස්ටර් ඩී එක්ක බලාගෙන ඉන්නවා."

පියස්ස සම්පූර්ණ ගෙදර වටේටම තිබුණා.

ඒ තරම් දුරක් ඇවිදීමෙන් මගේ කකුල් වෙවුලන්න ගත්තා. මිනටෝර් අඟ අරගෙන යන්න ග්‍රෝවර් ඉදිරිපත් වුණත් මම ඒක මගේ ළඟම තියාගත්තා. මේ සිහිවටනය වෙනුවෙන් මට බොහොම දරුණු මිලක් ගෙවන්න සිද්ධ වුණා. ඉතින්, ඒක නැති කරගන්න මම සූදානම් වුණේ නැහැ.

ගෙදර අනෙක් පැත්තට ළඟා වුණාම මට හුස්ම ගන්නත් අමතක වුණා.

අපි ඉන්න ඇත්තේ ලෝන්ග් අයිලන්ඩ්වල උතුරු වෙරළේයි. මොකද, ගෙදර මේ පැත්තේදී දෙණිය සැතපුමක් විතර ඈතින් දිලිසෙන මුහුද දක්වාම පැතිරී තිබුණා. ඒ-මේ අතර තිබුණු දේවල් සියල්ල ග්‍රහණය කරගන්න මට අපහසු වුණා. මුළු භූමිය පුරාම පුල්ලි වැටී තිබුණේ පෞරාණික ග්‍රීක ගෘහ නිර්මාණවල ආභාෂය ගත් ගොඩනැගිලිවලින්. විවෘත වහලයක් ඇති ක්‍රීඩා මණ්ඩපයක්, රංගාවාටයක්, වෘත්තාකාර මල්ලව භූමියක් - හැබැයි, මේ සියල්ලටම තිබුණේ අති නවීන පෙනුමක්. ඒවාගේ කිරි ගරුඬ කුලුනු අව්වට දිලිසුනා. අසලක තිබුණු වැලි පොළවේ පාසල් යන වයසේ ළමයි සහ සැටර්ලා දුසිමක් විතර අත්පන්දු ක්‍රීඩා කරමින් සිටියා. කුඩා විලක් හරහා ඔරු ඇදී ගියා. ග්‍රෝවර් හැඳ සිටි ආකාරයේම ටී ෂර්ට් හැඳගත් ළමයි ගොඩාක් ගස් අතර තිබුණු කාමර පොකුරක් වටා දුවමින් ඔට්ටු සෙල්ලම් කළා. තවත් සමහරු දුනු ශිල්පයට වෙන්කළ අඩවියේ ඉලක්කවලට විදිමින් සිටියා. අනෙක් අය කැලෑබද පාරවල් දිගේ අශ්වයන් පැද්දා. මම දැක්කේ මායාවක් නොවෙයි නම්, ඒ සමහර අශ්වයන්ට තටු තිබුණා.

පියස්ස කෙළවර තිබූ මේසයක් දෙපස පිරිමි දෙන්නෙක් මුහුණට මුහුණලා වාඩි වී සිටියා. ඔවුන්ට එහා පැත්තේ අත් වැටට හේත්තු වී සිටියේ මට පොප් කෝන් රස පුඩිං කැවූ තඹ කොණ්ඩකාරී.

මගේ පැත්තට මුහුණලා සිටි පිරිමියාට කුඩා නමුත්, මසින් පිරුණු ඇගක් තිබුණා. එයාට රතු නහයකුත්, ලොකු දියාරු ඇස් දෙකකුත්, ඒ වගේම තද දම් පාටට හුරු ගත කැරලි කොණ්ඩයකුත් තිබුණා. එයාගේ පෙනුම හරියට චිත්‍රවල ඉන්න තටු තියෙන බබාලගේ වගෙයි - මොකක්ද එයාලාට කියන නම, භූතයෝද? නෑ, නෑ, දූතයෝ - දේව දූතයෝ. අන්න හරි. එයාට තිබුණේ මැදිවියට කිට්ටු වුණ දේව දූතයෙකුගේ පෙනුමක්. එයා හැඳගෙන සිටියේ කොටි පුල්ලි මෝස්තරයක් වැටුණු හවායි කමිසයක්. ගේබ්ගේ කාඩ් සෙල්ලම් කරන නඩේට නම් එයාව හරියටම ගැළපේවි කියලා මට හිතුණා. ඒත්, මෙයාට නම් මගේ බාප්පාව වුණත් සුදුවෙන් පරාද කරන්න පුළුවන් වේවි!

"ඒ මිස්ටර් ඩී," ග්‍රෝවර් මගේ කනට කෙඳිරුවා. "එයා තමයි මේ කඳවුරේ අධ්‍යක්ෂක. එයා ළඟදි ආචාරශීලීව ඉන්න. අර ගෑනු ළමයාගෙ නම ඇනබෙත් චේස්. එයා මෙහෙ කඳවුරුකාරියක් විතරයි. ඒත් මේ කඳවුරේ ඉන්න අනිත් හැමෝටම වඩා වැඩි කාලයක් එයා මෙහේ ඉඳලා තියෙනවා. එතකොට, කයිරොන්ව නම් ඔයා කොහොමත් දන්නවානේ..."

අපිට පිටුපස හරවාගෙන හිටිය කෙනා දෙසට ඇඟිල්ල දිගු කරමින් ග්‍රෝවර් කිවුවා.

මුලින්ම මට තේරුම් ගියේ, එයා ඉන්නේ රෝද පුටුවක කියන එකයි. ඊට පස්සේ, එයාගේ ට්වීඩ් කබායත්, තුනී වෙමින් තිබුණු දුඹුරු පාට කොණ්ඩයත්, ඒ වගේම එයාගේ රළු රැවුලත් හඳුනා ගන්න මට පුළුවන් වුණා.

"මිස්ටර් බෲනර්!" මම බෙරිහන් දුන්නා.

ලතින් ගුරුතුමා මගේ දිහාවට හැරිලා හිනාවුණා. එයාගේ ඇස් දෙක දඟකාර බැල්මකින් දිලිසුනා.

"ආහ්, හොඳයි, පර්සි," එයා කිවුවා. "දැන් අපිට කාඩ් සෙල්ලම් කරන්න හතර දෙනෙක් ඉන්නවා."

එයා මිස්ටර් ඩී ට දකුණු පසින් තිබුණු පුටුවේ මට වාඩි වෙන්න සැලැස්වුවා. මිස්ටර් ඩී ලේ පිරුණු ඇස් දෙකෙන් මගේ දිහා බලලා ලොකු සුසුමක් හෙළුවා.

"ඔහ්, මං හිතන්නේ, මං මේක කියන්න ඕනෑ. අර්ධ-ලෝහිත කඳවුරට සාදරෙන් පිළිගන්නවා. ඔන්න හරි. දැන්, ඔයාව දැකීම සතුටක් කියලත් මම කියයි කියලා නම් බලාපොරොත්තු වෙන්න එපා."

"අහ්, ස්තුතියි." මම එයාගෙන් ටිකක් ඈත් වුණා. මොකද, මම මෙච්චර කාලයක් ගේබ් එක්ක ජීවත් වෙලා ඉගෙන ගත් දෙයක් තියෙනවා නම්, ඒ වැඩිහිටියන් හොඳටම මත්වෙලා ඉන්නේ කොයි වෙලාවේද කියා තේරුම් ගන්නා විදිහයි. මිස්ටර් ඩී මත්පැන්වලට ආගන්තුකයෙක් කියලා කවුරුහරි කියනවා නම් මට කියන්න තියෙන්නේ එහෙනම් මම සැටර් කෙනෙක් කියලයි.

"ඇනබෙත්?" මිස්ටර් බෲනර් තඹ කොණ්ඩකාරියට කතා කළා.

එයා ඉදිරියට ආවාම මිස්ටර් බෲනර් අපිව එකිනෙකාට හඳුන්වා දුන්නා. "මේ දැරිවි තමයි ඔයාට සනීප වෙනකල් සාත්තු සප්පායම් කළේ, පර්සි. ඇනබෙත්, ඔයා ගිහින් බලනවද පර්සිගේ ඇඳ ලෑස්ති ද කියලා? දැනට අපි එයාව කැබින් අංක එකොළහට දාමු."

"හොඳයි, කයිරොන්." ඇනබෙත් කිවුවා.

පෙනුණු හැටියට නම් එයත් මගේ වයසේම වගෙයි, මට වඩා අඟල් දෙකක් විතර උස ඇති. එයාට තිබුණේ මලල ක්‍රීඩා කරන කෙනෙකුගේ පෙනුමක්. අව්වට පිළිස්සීමෙන් දුඹුරු පාටට හැරුණු සමත්, තඹ පාට කැරලි කොණ්ඩයත් නිසා එයාට තිබුණේ කැලිෆෝනියාවේ ගැහැනු ළමයින්ට ඇති කියලා මම හිතේ මවාගෙන සිටි පෙනුමමයි. ඒත්, එයාගේ ඇස් දෙක ඒ චිත්ත රූපයට ගැළපුණේ නැහැ. එයාගේ ඇස් දෙකේ තිබුණේ පුදුමාකාර අළු පාටක්, හරියට, කුණාටු වෙලාවට අහසේ වලාකුළුවල පාට වගෙයි. ඒ ඇස් දෙක ලස්සන වුණත් එහි තැති ගන්වන පෙනුමකුත් තිබුණා፡ හරියට සටනකින් මාව පරදවන්න හොඳම ක්‍රමය ගැන එයා කල්පනා කරනවා වගෙයි.

මගේ අතේ තිබුණු මිනටෝර් අඟ දිහාවට බැල්මක් හෙළූ එයා, ආපසු මගේ දිහා බැලුවා. 'ඔයා මිනටෝර්ව මරලා' කියලා හරි, එහෙමත් නැත්නම්, 'වාව්! ඔයා නම් මාරයි' වගේ දෙයක් එයා කියන්න ලෑස්ති වෙනවා කියලා මම හිතුවා.

ඊත්, ඒ වෙනුවට, "ඔයා නිදා ගන්නකොට කෙළ පෙරනවා," කියලා එයා කිවුවා.

එයා තණ පිට්ටනියේ පහළට දුවගෙන යද්දී එයාගේ තබ කොණ්ඩය එයාට පිටුපසින් පියැඹුවා.

"ඉතින්?" මම ඇහුවේ මාතෘකාව වෙනස් කරන්න උවමනාවෙන්. "ඔයා, අහ්, මෙහෙද වැඩ කරන්නේ මිස්ටර් බෲනර්?"

"මිස්ටර් බෲනර් නෙවෙයි," හිටපු - මිස්ටර් බෲනර් කිවුවා. " ඒක මම දාගත්ත නමක්. මට කයිරොන් කියලා කතා කරන්න."

"හොඳයි." මම අන්දමන්ද වෙලා අධ්‍යක්ෂක දිහා බැලුවා. "එතකොට... මිස්ටර් ඩී කියන එකටත් මොකක් හරි තේරුමක් තියෙනවද?"

මිස්ටර් ඩී කාඩ් කුට්ටම ඇහිම නතර කරලා මගේ දිහා බැලුවේ හරියට මම මහ හඬින් රාම්තෙල් පිටකළා වගෙයි. "කොල්ලෝ, නම් කියන්නේ බලවත් දේවල්. හේතුවක් නැතුව ඒවා කියව කියවා වටේ ඇවිදින්න ඔයාට බැහැ."

"ඔන්, හරි. සමා වෙන්න."

"මම කියන්නම ඕනියේ, පර්සි," බෲනර්-කයිරොන් බාධා කළා, "ඔයාව පණපිටින් දකින්න ලැබීම ගැන මට හරිම සතුටුයි. කඳවුරුකාරයෙක් වෙන්න ඉඩ තියෙන කෙනෙක් වෙනුවෙන්ම මම පිටට ගියේ ගොඩාක් කාලෙකට පස්සේ. මගේ කාලය නාස්ති වුණා කියලා හිතන්න නම් මම පොඩ්ඩක්වත් කැමති නැහැ."

"පිටට ගියා?"

"මම යැන්සි විද්‍යාලයේ අවුරුද්දක් වැඩ කළේ ඔයාට උගන්වන්න. අපි හැම ඉස්කෝලෙකටම වගේ සැටර්ලව යවලා තියෙන්නේ සෝදිසියෙන් ඉන්න. ඊත් ග්‍රෝවර්ට ඔයාව මුණ ගැහුණු ගමන්ම වගේ එයා මට ඔයා ගැන දැන්වූවා. ඔයාගේ විශේෂත්වයක් තියෙනවා කියලා එයාට දැනුණා. ඒ නිසා මම තීරණය කළා ඉස්කෝලෙට යන්න. හිටපු ලතින් ගුරුතුමාට මම තේරුම් කරලා දුන්නා... අහ්, එයා නිවාඩුවක් ගන්න එක හොඳයි කියලා."

ඉස්කෝලේ මේ අවුරුද්ද පටන් ගත් කාලේ මතක් කරන්න මම උත්සාහ කළා. ඒක ගොඩාක් කාලයකට කලින් වුණ දෙයක් වගේ

දැනුණත්, යැන්සි එකේ මුල් සතියේ අපිට ලතින් උගන්වන්න ආවේ වෙනත් ගුරුවරයෙක් බව මට යන්තමින් වගේ මතක තිබුණා.

කිසිම හේතු දැක්වීමක් නැතිව එයා අතුරුදහන් වුණාට පස්සේ මිස්ටර් බෲනර් ඇවිත් එයාගේ තැන ගත්තා.

"ඔයා යැන්සි එකට ආවේ මට උගන්වන්නමද?" මම ඇහුවා.

කයිරොන් ඔළුව වැනුවා. "ඇත්තම කියනවා නම්, මුලදී මටත් ඔයා ගැන විශ්වාසයක් තිබුණේ නැහැ. අපි ඔයාගේ අම්මාට කතා කරලා දැන්වූවා ඔයා අර්ධ-ලෝහිත කඳවුරට එන්න සූදානම් වෙනකල් අපි ඔයා ගැන සෝදිසියෙන් ඉන්නවා කියලා. ඒත් ඒ වෙනකොටත් ඔයාට ඉගෙන ගන්න තව ගොඩාක් දේවල් තිබුණා. ඒ කොහොම වුණත්, මෙහෙට පණපිටින් එන්න ඔයාට පුළුවන් වුණා නේ. සාමාන්‍යයෙන් පළවෙනි පරීක්ෂණය විදිහට සැලකෙන්නේ ඒක."

"ග්‍රෝවර්," මිස්ටර් ඩී නොඉවසිල්ලෙන් කිවුවා, "ඔයා සෙල්ලම් කරනවද, නැද්ද?"

"ඔව්, සර්!" ග්‍රෝවර් වෙවුලමින් හතරවෙනි පුටුවේ වාඩිවුණා. කොටි පුල්ලි වැටුණු කමිසයක් හැඳගත් මේ කොට, තඩි මනුස්සයාට එයා ඔය තරම් බයවෙන හේතුව නම් මට හිතාගන්න බැරි වුණා.

"කාඩ් කුට්ටමෙන් සෙල්ලම් කරන්නේ කොහොමද කියලා ඔයා දන්නවා නේ?" මිස්ටර් ඩී මගේ දෙසට බැල්මක් හෙළුවේ අවිශ්වාසයෙන් වගෙයි.

"මම දන්නේ නැනේ," මම කිවුවා.

"මම දන්නේ නැනේ, සර්." එයා මාව නිවැරදි කළා.

"සර්," මම ආපසු කිවුවා. මේ කඳවුරු අධ්‍යක්ෂක ගැන මගේ හිතේ තිබූ කැමැත්ත ටිකෙන් ටික අඩු වෙමිනුයි තිබුණේ.

"හොඳයි," එයා මට කිවුවා, "මේක තමයි පරණ රෝම මල්ලව පොර ක්‍රීඩාව සහ පැක්මැන් ක්‍රීඩාවට පස්සේ මිනිස්සු විසින් සොයාගත්ත ශ්‍රේෂ්ඨම ක්‍රීඩාව. මම බලාපොරොත්තු වෙනවා ශිෂ්ට සම්පන්න තරුණයෝ සියලු දෙනාම මේකේ නීති-රීති ටික ඉගෙන ගනීවි කියලා."

"එයා ඒවා හොඳට ඉගෙන ගනීවි කියලා මට විශ්වාසයි," කයිරොන් කිවුවා.

Scanned with CamScanner

"අනේ," මට කියැවුණා, "මොකක්ද මේ තැන? මම මොනවද මෙහෙ කරන්නේ? මිස්ටර් බෲ-කයිරොන් - ඔයා ඇයි මට උගන්වන්නම යැන්සි එකට ගියේ?"

මිස්ටර් ඩී නහයෙන් පිම්බා. "මමත් ඇහුවේ ඔය ටිකමයි."

කඳවුරු අධ්‍යක්ෂක කාඩ් ටික බෙදුවා. ග්‍රෝවර්ගේ ගොඩට කාඩ්පතක් වැටෙන සෑම වතාවකදීම එයා බයෙන් ඇකිළුණා.

කයිරොන් මගේ දෙස බලා අනුකම්පාවෙන් වගේ සිනාසුණේ හරියට ලතින් පන්තියේදී මම කොයි තරම් අඩු ලකුණු ප්‍රමාණයක් ගත්තත්, එයාගේ හොඳම ශිෂ්‍යයා මම කියලා අඟවන්න එයා සිනාසුණා වගෙයි. මම හරි උත්තරේ දේවි කියලා එයා බලාපොරොත්තු වුණා.

"පර්සි," එයා කතා කළා. "ඔයාගේ අම්මා ඔයාට මුකුත්ම කියලා නැද්ද?"

"එයා කිවුවා..." මුහුද දෙස බලා ඉන්න අම්මාගේ දුක්බර ඇස් දෙක මට මතක් වුණා. "එයා කිවුවා මගේ තාත්තාට මාව මෙහෙට එවන්න උවමනා වුණත්, එයා ඒකට බය වුණා කියලා. එයා කිවුවා, එක පාරක් මම මෙහෙට ආවොත් ආයේ මට මෙහෙන් යන්න බැරි වෙයි කියලා. අම්මාට ඕනෑ වුණේ මාව එයා ළඟින්ම තියා ගන්න."

"නියමයි," මිස්ටර් ඩී කිවුවා. "අන්න එහෙම තමයි සාමාන්‍යයෙන් එයාලා මැරුම් කන්නේ. කොල්ලෝ, ඔයා ලංසු තියනවද, නැද්ද?"

"මොනවද?" මම පෙරළා ඇහුවා.

කාඩ් සෙල්ලමට ලංසු තබන ආකාරය එයා මට නොයිවසිල්ලෙන් කියලා දුන්නා. ඉතින්, එයා කියූ විදිහට මමත් කළා.

"මට පේන විදිහට, ඔයාට කියන්න උවමනාවටත් වඩා දේවල් තියෙනවා," කයිරොන් කිවුවා. "මට හිතෙන්නේ අපේ සාමාන්‍ය මග පෙන්වීමේ චිත්‍රපටිය ඒකට ප්‍රමාණවත් වෙන්නේ නැති වෙයි."

"මග පෙන්වීමේ චිත්‍රපටිය?" මම ඇහුවා.

"නෑ," කයිරොන් තීරණය කළා. "හොඳයි, පර්සි. ඔයා දන්නවා නේ ඔයාගේ යාළුවා-ග්‍රෝවර් සැටර් කෙනෙක් කියලා. ඔයා දන්නවා නේ -" එයා සපත්තු පෙට්ටියේ වූ අඟ පෙන්වූවා - "ඔයා මිනටෝර්ව මැරුවා කියලා. ඒකත් එසේ මෙසේ හපන්කමක් නෙවෙයි කොල්ලෝ. ඔයා නොදන්නවා ඇත්තේ, මහා බලගතු දේවල් ඔයාගේ ජීවිතය

ඇතුළේ වැඩ කරනවා කියන එක. දෙවිවරු - ග්‍රීක දෙවිවරු කියලා ඔයාලා හඳුන්වන කට්ටිය - තවමත් ඉන්නවා."

මම ඇස් දෙක ලොකු කරගෙන මේසය වටේ සිටි අනෙක් අය දෙස බලා සිටියා.

නෑ! මම බලා සිටියේ කවුරුහරි යටිගිරියෙන් කෑගසනතුරුයි. ඒත්, මට ඇසුණේ මිස්ටර් ඩී කෑගසන හඬ විතරයි, "ඔහ්, රාජකීය විවාහයක්. ට්‍රික්! ට්‍රික්!" එයා දිනාගත් කාසි ගණිමින් මිස්ටර් ඩී කෙකර ගෑවා.

"මිස්ටර් ඩී," ග්‍රෝවර් බයාදු ලෙස කතා කළා, "ඔයා කන්නේ නැත්නම්, මම ඔයාගේ කෝක් කෑන් එක ගන්නද?"

"එහ්? ඔහ්, හරි ගන්න."

හිස් ඇලුමිනියම් කෑන් එකෙන් ලොකු කෑල්ලක් කඩාගත් ග්‍රෝවර් දුක හිතෙන විදිහට ඒක හපන්න ගත්තා.

"පොඩ්ඩක් ඉන්න," මම කයිරොන්ට කිවුවා. "එතකොට, ඔයා මට කියන්නේ දෙවියෙක් කියලා කෙනෙක් ඉන්නවා කියලද?"

"මෙහෙමයි," කයිරොන් කිවුවා. "දෙවියෙක්. දෙවියෙක් කියලා කිවුවාම ඒක වෙනමම විෂයක්. අපි මේක පාරභෞතිකවාදයත් එක්ක පටලවා ගන්න හොඳ නැහැ."

"පාරභෞතික? ඒත් මේ දැන් ඔයා කිවුවේ-"

"ඒ දෙවිවරු. බහු වචනයෙන්, එයාලා ස්වභාවධර්මයේ බලවේග සහ මිනිස් ක්‍රියාවන් පාලනය කරන බලවත් පිරිසක්: ඔලිම්පස්වල අමරණීය දෙවිවරු. ඒක නම් පොඩි විෂයක්."

"පොඩි?"

"ඔව්, සෑහෙන්න. අපි ලතින් පන්තියේදී දෙවිවරු ගැන සාකච්ඡා කරලා තියෙනවා නේ."

"සියුස්," මම කිවුවා. "හේරා. ඇපලෝ. ඔයා කියන්නේ අන්න එයාලා ගැනද?"

ඒත් එක්කම නැවත වතාවක් වලාකුළක්වත් නැති අහසේ අකුණක් කෙටුවා.

"කොල්ලෝ," මිස්ටර් ඩී කිවුවා. "මම ඔයා වුණා නම්, ඔහොම හිතු මනාපෙට ඒ නම් කියවන්නේ නැහැ."

Scanned with CamScanner

"ඒ වුණාට ඒවා කතන්දර නේ," මම කිවුවා. "ඒවා අකුණු කෙටීම් ගැනයි, කාතු භේදය ගැනයි විස්තර කරන්න හදපු මිථ්‍යා විශ්වාස. විද්‍යාව හොයාගන්න කලින් මිනිස්සු ඇදහුවේ ඒ වගේ දේවල්."

"විද්‍යාව!" මිස්ටර් ඩී සමච්චලේට කිවුවා. "එහෙනම් මට කියන්න, පර්සියස් ජැක්සන්-" මීට කලින් මම කාටවත්ම කියලා නැති මගේ ඇත්ත නමෙන් එයා කතා කරද්දි මම තිගැස්සුනා- "තව අවුරුදු දෙදාහකට විතර පස්සේ ඉන්න මිනිස්සු ඔයාලගේ විද්‍යාව ගැන මොනවා හිතාවිද?" මිස්ටර් ඩී කියාගෙන ගියා. "හ්ම්ම්? එයාලා ඒකට කියාවි 'ආදි කල්පිත දේවතා වන්දනාවක්' කියලා. අන්න එහෙමයි. ඔන්, මේ මනුෂ්‍ය වර්ගයාට නම් මම හරිම ආදරෙයි - පර්යාලෝකය ගැන එයාලාට කිසිම දැනීමක් නැහැ. හැබැයි එයාලා හිතාගෙන ඉන්නේ, එයාලා ගොඩාක් දුර ඇවිත් තියෙනවා කියලා. එහෙම නේද, කයිරොන්? මේ කොල්ලා දිහා බලලා මට කියන්නකෝ."

මිස්ටර් ඩී ට නම් මම කැමති වුණේම නැහැ. එයා අපිට මනුෂ්‍ය වර්ගයා කියලා කතා කරන්නේ හරියට එයා එහෙම කෙනෙක්... නොවෙයි වගෙයි. අන්, ග්‍රෝවර් සෝඩා කෑන් එකත් කන ගමන්, යටහත් පහත්ව ඉදගෙන එයාගේ කාඩ් ටික දිහා බලාගෙන සිටි හේතුව ගැන අදහසක් එයින් මගේ හිතට ආවා. මට දැනුණේ මගේ උගුරේ ගුළියක් හිර වෙනවා වගෙයි.

"පර්සි," කයිරොන් කතාකළා, "මේ කතාව විශ්වාස කරන, නොකරන එක ඔයාගේ වැඩක්. ඒත්, අමරණීයයි කියන්නේ අමරණීයයි. ඔයාට එක තත්පරයකට හිතාගන්න පුළුවන් ද කවදාවත් මැරෙන්නේ නැතිව, කවදාවත් විනාශ වෙලා යන්නේ නැතිව, ඔයා දැන් ඔය ඉන්න විදිහට හැමදාම ජීවත් වෙනවා?"

ඒක නම් සැහෙන්න හොඳ දෙයක් වගෙයි, කියලා මම කටට ආව උත්තරය දෙන්න ලෑස්ති වුණා. ඒත් කයිරොන් ඒ කතාව කියූ ස්වරය නිසා මම ටිකක් පසුබට වුණා.

"ඔයා කියන්නේ, මිනිස්සු ඒ දේවල් විශ්වාස කළත්, නොකළත්," මම කිවුවා.

"අන්න හරි," කයිරොන් මගේ කතාවට එකඟ වුණා. "බැරි වෙලාවත් ඔයාත් දෙවියෙක් වුණා නම් එහෙම, මිථ්‍යාවක් කියලා මිනිස්සු ඔයා ගැන කියද්දි ඔයාට මොනවා හිතේවිද? අකුණු කෙටීම් පැහැදිලි

කරන්න ගොතපු පරණ කතාවක් කියලා ඔයාට කිව්වම? මම ඔයාට කිව්වොත්, පර්සියස් ජැක්සන්, කවදාහරි දවසක මිනිස්සු ඔයාවත්, 'ඒක පුංචි කොල්ලෝ අම්මලා අහිමිවීම දරා ගත්තේ කොහොමද කියන එක ගැන හදපු මිථ්‍යා කතාවක් ' විදිහට හඳුන්වාවි කියලා?"

මගේ පපුව වේගයෙන් ගැහෙන්න ගත්තා. මොකක්දෝ හේතුවක් නිසා මාව තරහා ගස්වන්න එයා උත්සාහ කළත්, ඒකට ඉඩ දෙන්න මම සූදානම් වුණේ නැහැ. "මම ඒකට කැමති වෙන එකක් නැහැ. ඒත් මම දෙවියෝ ගැන නම් විශ්වාස කරන්නේ නැහැ." මම කිවුවා.

"ඔහ්, ඔයා එහෙම කරනවා නම් තමයි හොඳ," මිස්ටර් ඩී මිමිණුවා. "එයාලාගෙන් කෙනෙක් ඔයාව අළු කරලා දාන්න කලින්."

"අ-අනේ සර්. එයාට, එයාගේ අම්මා නැතිවුණා විතරයි නේ. එයා ඉන්නේ කම්පනය වෙලා." ග්‍රෝවර් කිවුවා.

"ඒකත් බොහොම හොඳ දෙයක් නේ," මිස්ටර් ඩී කාඩ්පතක් දමන ගමන් ගෙරෙව්වා. "අඩු තරමේ මේ ගැන විශ්වාසයක්වත් නැති කොල්ලෝ එක්ක වැඩ කරන්න මේ කාලකණ්ණි රස්සාවට මාව හිරවෙලා මදිවට."

එයා අත වැනුවා, ඒත් එක්කම මේසය මත කුසලානයක් ප්‍රාදූර්භූත වුණේ හරියට එක ක්ෂණයකට ඉර එළිය නැමිලා, වාතයෙන් වීදුරුවක් වියුවා වගෙයි. ඒ කුසලානය ඉබේටම රතු වයින්වලින් පිරුණා.

මගේ කට ඉබේටම ඇරුණා, ඒත් කයිරොන් නම් ඒ දෙස බලන්නවත් කරදර වුණේ නැහැ.

"මිස්ටර් ඩී," එයා අනතුරු ඇඟෙව්වා. "ඔයාගේ තහනම."

වයින් දෙස බැලූ මිස්ටර් ඩී පුදුම වුණා වගේ බොරුවට ඇඟෙව්වා.

"අයියෝ!" එයා අහස දෙස බලාගෙන කෑගැසුවා, "පරණ පුරුදු! සමා වෙන්න!"

තවත් අකුණක්.

මිස්ටර් ඩී නැවතත් අත වැනුවා, ඒත් එක්කම වයින් වීදුරුව නැවුම් කෝක් කෑන් එකකට පරිවර්තනය වුණා. අසතුටෙන් සුසුමක්

Scanned with CamScanner

ගෙනෑ මිස්ටර් ඩී සෝඩා කෑන් එකේ පියන විවර කර, ආපසු එයාගේ සෙල්ලමට ගියා.

කයිරොන් මට ඇසක් ගැසුවා. "මිස්ටර් ඩී ටික කාලෙකට කලින් සීමාවෙන් එපිට තිබිය වන දෙව්ගනකට ඇඟෑලුම්කම් පාන්න ගිය නිසා එයාගේ තාත්තා එයත් එක්ක තරහෙන් ඉන්නේ."

"වන දෙව්ගනක්." අභ්‍යවකාශයෙන් කඩාගෙන වැටුණා වගේ මතු වූ කෝක් එක දෙස ඇසි පිය නොගසා බලා ඉන්න ගමන් මමත් ඒකම කිවුවා.

"ඔව්," මිස්ටර් ඩී පාපොච්චාරණය කළා. "මට දඬුවම් කරන්න මගේ තාත්තා හරිම ආසයි. මුල් වතාවේ තහංචියක් දැම්මා. අම්මෝ! ඒක නම් හරිම භයානක අවුරුදු දහයක්! දෙවෙනි වතාවේ - හොඳයි, එයා නම් ඇත්තටම ගොඩාක් ලස්සනයි, ඒ නිසාම මට එයාගෙන් ඈත්වෙලා ඉන්න බැරි වුණා. ඉතින්, දෙවෙනි වතාවේ තාත්තා මාව මෙහාට එව්වා. අර්ධ-ලෝහිත කන්දට, ඔයා වගේ නාහෙට නාහන එවුන් ගොඩක් පිරුණු ගිම්හාන කඳවුරකට. 'එයාලාට හොඳ ආභාෂයක් වෙන්න' එහෙමයි එයා මට උපදෙස් දුන්නේ. දැන්, තරුණයන්ව ඉරලා දානවා වෙනුවට මට එයාලාත් එක්ක වැඩ කරන්න වෙලා. හා... සම්පූර්ණයෙන්ම අසාධාරණයි."

මිස්ටර් ඩී කතා කළේ හරියට අමනාපයෙන් හොට බලියන් ඉන්න අවුරුදු හයක විතර ළමයෙක් වගෙයි.

"එතකොට..." මම ගොත ගැසුවා. "ඔයාගේ තාත්තා..."

"දෙවියනේ, කයිරොන්," මිස්ටර් ඩී කිවුවා. "මම හිතුවේ ඔයා මේ කොල්ලාට මූලික දේවල් ටිකවත් උගන්නලා ඇති කියලා. මගේ තාත්තා තමයි සියුස්, ඇත්තටම."

ග්‍රීක දේව කතාවල ඩී අකුරෙන් පටන් ගන්න නම් දිගේ මගේ හිත දිව්වා. වයින්. කොටි හම. මෙහෙ වැඩ කරනවා වගේ පෙනුණු සැටිර්ලා. එතකොට, තමන්ගේ ස්වාමියා ළඟ නැමෙනවා වගේ මිස්ටර් ඩී ඉදිරියේ ග්‍රෝවර් යටහත්-පහත්ව හැසිරුණු විදිහ.

"ඔයා ඩයනයිසියස්," මම කිවුවා. "වයින්වලට අධිපති දෙවියා."

මිස්ටර් ඩී ඇස් දෙක කැරකුවා. "එයාලා මේ දවස්වල මොකක්ද කියන්නේ, ග්‍රෝවර්? කොල්ලෝ කියන්නේ 'සිරාවටම!' කියලද?"

"ඔ-ඔව්, මිස්ටර් ඩී."

"හොඳයි එහෙනම්, සිරාවටම! පර්සි ජැක්සන්. බාගදා ඔයා හිතාගෙන හිටියේ මම ඇෆ්‍රොඩයිට් (ආදරයට අධිපති දෙවඟන) කියලද?"

"ඔයා දෙවියෙක්."

"ඔව්, දරුවෝ."

"දෙවියෙක්. ඔයා?"

එයා හැරිලා කෙලින්ම මගේ දිහා බැලුවා. එයාගේ ඇස් ඇතුළේ දම් පාටට හුරු ගින්නක දීප්තියක් මම දැක්කා. ඒක හරියට, මේ කොට, මහත පුද්ගලයා, එයාගේ ඇත්ත ස්වරූපයෙන් ඇබිත්තක් විතරක් මට පෙන්වූවා කියන්න දුන් ඉඟියක් වගෙයි. මිථ්‍යා දෘෂ්ටිකයන් වටේ මිදි වැල් එතිලා, එයාලා මැරෙනතුරු හුස්ම හිර කරන දර්ශන, බේබදු රණ ශූරයෝ සටන් කරන්න ඇති ආශාවෙන් සිහි විකල් කරගත් දර්ශන, නාවිකයන්ගේ අත් වරල්වලට හැරෙද්දී ඔවුන් මරහඬ දෙන දර්ශන මට පෙනුණා. මම එයාව තවත් අවුස්සන්න ගියොත් එයා මට මීටත් වඩා දරුණු දේවල් පෙන්වාවි කියලා මට තේරුම් ගියා. මගේ ඉතුරු ජීවිත කාලයම ඉලක්කමක් ගැසූ කමිසයකුත් හැඳගෙන පිස්සන් කොටුවකට වෙලා ඉන්න සිද්ධ වෙන විදිහට එයා මගේ මොළයට මොකක් හරි කරන්න වුණත් ඉඩ තිබුණා.

"මාව පරීක්ෂා කරලා බලන්න කැමතිද, ළමයෝ?" එයා සන්සුන්ව ඇසුවා.

"නෑ, නෑ. සර්."

ගින්න ටිකක් විතර අඩු වුණා. එයා ආපසු කාඩ් සෙල්ලම දෙසට හැරුණා. "මං හිතන්නේ මම දිනුවා."

"නාම නෑ, මිස්ටර් ඩී." කයිරොන් කිවුවා. "සෙල්ලම කැරකෙන්නේ මගේ පැත්තට." කාසි ගොඩ කෙලින් කර, ගණින අතරේ එයා කිවුවා.

මිස්ටර් ඩී කයිරොන්ව රෝද පුටුවෙන් වාෂ්ප කරලා දාවි කියලා මම හිතුවා. ඒත් එයා ලොකු සුසුමක් හෙළමින් පුටුවෙන් නැගිට්ටේ ලතින් ගුරුතුමා අතින් පැරදීම එයාට නුපුරුදු දෙයක් නොවෙයි වගෙයි. ඒත් එක්කම ග්‍රෝවර්ත් පුටුවෙන් නැගිට්ටා.

"මට මහන්සියි," මිස්ටර් ඩී කිවුවා. "මට හිතෙන්නේ අද රෑ සාජ්ජෙට කලින් මම ටිකක් නිදාගත්තා නම් හොඳයි. ඒත් ඊට කලින්,

ග්‍රෝවර්, මේ පැවරුමේදී ඔයා පෙන්වපු අසම්පූර්ණ ක්‍රියාකාරීත්වය ගැන අපි ටිකක් කතා කරලා ඉමු."

ග්‍රෝවර්ගේ මුහුණෙන් දාඩිය බිංදු වැගිරෙන්න ගත්තා. "හො-හොඳයි, සර්."

මිස්ටර් ඩී මගේ දෙසට හැරුණා. "කැබින් අංක එකොළහට යන්න, පර්සි ජැක්සන්. ඒ වගේම, හොඳින් හැසිරෙන්න මතක තියාගන්න."

එයා ගෙදර ඇතුළට ඇදෙද්දී, අන්ත අසරණයෙක් වගේ ග්‍රෝවර්ත් එයා පසුපසින් ගියා.

"ග්‍රෝවර්ට ප්‍රශ්නයක් නැතිවෙයි නේද?" මම කයිරොන්ගෙන් ඇහුවා.

කයිරොන් ඔළුව වැනුවත් එයා සිටියේ කරදරෙන් වගෙයි. "නාකි ඩයනයිසියස් ඉන්නේ කේන්තියෙන් නෙවෙයි. ඒත්, එයා, එයාගේ රස්සාවට වෛර කරනවා. එයාව... ම්..ම්, බිම ගත්වලා තියෙන්නේ. ඉතින්, ආපහු ඔලිම්පස්වලට යන්න තවත් අවුරුදු සීයක් ඉවසන්න වෙන එක එයාට දරාගන්න බැරුව ඉන්නේ."

"ඔලිම්පස් කන්ද," මම ඇහුවා. "ඔයා මට කියන්නේ එහේ ඇත්තටම මාලිගාවක් තියෙනවා කියලද?"

"මෙහෙමයි, ග්‍රීසියේ ඔලිම්පස් කන්දක් තියෙනවා. තව, දෙවිවරුන්ගේ මාළිගාව - ඒ කියන්නේ එයාලාගේ බලයන් එක්රැස් වෙන තැනකුත් තියෙනවා. ඒ තැන කලින් නම් තිබුණේ ඔලිම්පස් කන්ද මුදුනේ තමයි. පරණ සිරිතට ගරු කරන්න නාමත් ඒකට ඔලිම්පස් කන්ද කියලා කිව්වට, දෙවිවරු වගේම මේ මාළිගාවත් තැනින් තැනට යනවා, පර්සි."

"ඔයා කියන්නේ ග්‍රීක දෙවිවරු දැන් ඉන්නේ ඇමරිකාවේ කියලද?"

"ඇත්තටම ඔව්. බටහිරකරණයේ හදවත එක්ක දෙවිවරුත් ගමන් කරනවා."

"මොකක් එක්ක?"

"අයියෝ... පර්සි. 'බටහිර ශිෂ්ටාචාරය' කියලා ඔයාලා හඳුන්වන එක පොත්වල තියෙන සංකල්පයක් විතරයි කියලද ඔයා හිතන්නේ?

නෑ. ඇත්තටම ඒක ජීවමාන බලවේගයක්. අවුරුදු දහස් ගණනක් පුරාවට දීප්තිමත්ව දැල්වුණු සාමූහික දැනීමක්. දෙවිවරු කියන්නෙත් ඒකෙම එක කොටසක්. එයාලා ඒකේ මූලික ප්‍රභවය කිව්වත් වැරැද්දක් නැහැ. අඩු තරමේ, එයාලා ඒකට කොයි තරම් තදින් බැඳිලා ඉන්නවද කියනවා නම්, බටහිර ශිෂ්ටාචාරය කටුගාලා දැම්මෙ නැත්නම් එයාලාටත් වියැකිලා යන්න හැකියාවක් නැහැ."

"මේ ගින්න මුලින්ම පටන් ගත්තේ ග්‍රීසියෙන්. ඊට පස්සේ, ඔයා හොඳින්ම දන්න විදිහට - අඩු තරමේ, මගේ පන්තිය සමත් වුණ නිසා ඔයා දන්නවා කියලා මම හිතාගෙන ඉන්න විදිහට - මේ දැල්ලේ මධ්‍යස්ථානය රෝමයට ගමන් කළා, ඒකත් එක්ක දෙවිවරුත් ගියා. ඔහ්, සමහරවිට වෙනස් නම් වලින් - සියුස් ජුපිටර් කියලා, ඇෆ්‍රොඩයිට් වීනස් කියලා වගේ. නම් වෙනස් වුණාට එකම බලවේගයක්, එකම දේව කණ්ඩායමක්."

"ඊට පස්සේ එයාලා මැරිලා ගියා?"

"මැරුණා? නැහැ. බටහිරකරණය මැරුණාද? දෙවිවරු තැනකින් තැනකට මාරු වුණා විතරයි. ජර්මනියට, ප්‍රංශයට, ස්පාඤ්ඤයට. ගින්න තදින්ම ඇවිලුනේ කොතැනද, එතැන දෙවිවරු හිටියා. එයාලා ශතවර්ෂ කීපයක්ම එංගලන්තයේ ගතකළා. මේ ගැන හොයාගන්න ඔයාට කරන්න තියෙන එකම දේ ගෘහ නිර්මාණ ශිල්පයන් අධ්‍යයනය කරන එකයි. මිනිස්සු කවදාවත් දෙවිවරු අමතක කළේ නැහැ. පහුගිය අවුරුදු තුන්දාහ පුරාවටම එයාලා පාලනය කළ තැන්වල තියෙන වැදගත් ගොඩනැගිලිවල එයාලාගේ චිත්‍ර, ප්‍රතිමා වගේ දේවල් ඔයාට දකින්න ලැබේවි. ඒ වගේම, පර්සි. ඔව්, ඇත්තෙන්ම එයාලා දැන් ඉන්නේ එක්සත් ජනපදයේ තමයි. ඔයාලාගේ ලාංඡනය දිහා බලන්න, ඒකේ ඉන්නේ සියුස්ගේ රාජාලියා. එතකොට, රොක්ෆෙලර් මධ්‍යස්ථානයේ තියෙන ප්‍රොමිතියස් ප්‍රතිමාව බලන්න, වොෂින්ටන්වල තියෙන ඔයාලාගේ ආණ්ඩුවේ ගොඩනැගිලිවල ඉදිරිපස තියෙන්නෙත් ග්‍රීක හැඩතලමයි. ඔයාට පුළුවන් නම් ඔලිම්පියානුවන්ව ප්‍රසිද්ධියේ පේන්න තියපු තැන් කීපයක්වත් නැති එක ඇමරිකානු නගරයක් මට හොයලා පෙන්වන්න. ඔයා ඒකට කැමති වුණත්, නැතත් මම කියන එක විශ්වාස කරන්න. ගොඩාක් මිනිස්සු රෝමයට කැමති වුණෙත් නැහැ. ඒ වගේම තමයි දැන් ගින්නේ හදවත වෙලා තියෙන ඇමරිකාවත්. මේ තමයි බටහිරකරණයේ මහා බලය. ඉතින් ඔලිම්පස් මෙහෙට ආවා. ඒ නිසා අපිත් ආවා."

ඒක නම් මට දරාගන්න බැරි තරම් දෙයක් වුණා. විශේෂයෙන්ම, කයිරොන් 'අපි' කියලා හැඳින්වූ විදිහෙන් මට දැනුණේ මොකක් හරි විශේෂ සමාජයක මමත් සාමාජිකයෙක් වෙලා වගෙයි.

"ඔයා කවුද, කයිරොන්? මම... මම කවුද?"

කයිරොන් හිනාවුණා. එයා ටිකක් හරිබරි ගැසුනේ රෝද පුටුවෙන් නැගිටින්න සූදානම් වෙනවා වගෙයි. ඒත් ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි කියලා මම දැනගෙන සිටියා. මොකද, එයාගේ ඉණෙන් පහළ කොටස පණ නැති වෙලානේ තිබුණේ.

"ඔයා කවුද?" එයා තාලෙට කිවුවා. "හොඳයි, ඒක තමයි අපි හැමෝටම වගේ උත්තර අවශ්‍ය ප්‍රශ්නය, එහෙම නේද? ඒත් දැනට, අපි කැබින් අංක එකොළහෙන් ඔයාට ඇඳක් හොයාගන්න ඕනෑ. එතැනදී ඔයාට අලුත් යාළුවෝ ටිකක් මුණ ගැහෙයි. ඒ වගේම, පාඩම් වැඩවලට ඇති තරම් වෙලාව හෙට ලැබෙයි. ඒ හැරත්, අද රෑ කඳවුරු ගිනිගොඩ ළඟ පුච්චපු මාෂ්මෙලෝත් තියේවි. ඇත්තම කියනවා නම්, මම ඒවාට හරිම ආසයි."

එහෙම කියපු කයිරොන්, එයාගේ රෝද පුටුවෙන් නැගිට්ටා. ඒත්, එයා නැගිටපු විදිහේ මොකක්දෝ අමුත්තක් තිබුණා. එයාගේ ඔඩොක්කුවේ තිබූ බ්ලැන්කෙට්ටුව බිමට වැටුණා, එත් එයාගේ කකුල් සෙලවුණේ නැහැ. එයාගේ ඉණ කොටස දිගු වෙමින් බඳ පටියෙන් ඉහළට ඇදුණා. මුලින්ම මම හිතුවේ එයා දිගම දිග සුදු වෙල්වට් යට ඇඳුමක් හැඳගෙන ඉන්නවා කියලයි. නමුත් එයා තව දුරටත් කෙලින් වෙමින් සාමාන්‍ය මනුස්සයෙකුට වඩා ගොඩාක් උස් වෙද්දී, වෙල්වට් යට ඇඳුමක් කියලා මම සිතූ දේ ඇත්තටම යට ඇඳුමක් නොවෙන බව මට තේරුම් ගියා. ඒක සුදු පාට දළ ලොම් තට්ටුවකට යට වූ, පේශි සහ බල නහරවලින් සැදුණු, සතෙකුගේ ඉදිරි කයක්.

ඒ වගේම, එයාගේ රෝද පුටුව: පුටුවක් නෙවෙයි-රෝද සවි කළ විශාල පෙට්ටියක්. ඒකේ මොකක් හෝ මායාවක් තියෙන්න ඇති. නැත්නම් එයාගේ සම්පූර්ණ ඇඟම ඒ තුළ රඳවන්න කොහෙත්ම පුළුවන්කමක් තිබුණේ නැහැ.

දිගු, ඇට සහිත දණක් ඇති කකුලක් මුලින්ම එළියට ආවා. එහි කෙළවර තිබුණේ හොඳින් ඔප දැමූ කුරයක්. ඉන්පසු, අනෙක් ඉදිරි කකුලත්, පසු ගාත් දෙකත් එළියට ආවා. පසුව බලද්දී, ඉදිරියෙන්

ඇමුණූ බොරු මිනිස් කකුල් දෙකක් හැර වෙනත් කිසිවක් ඒ පෙට්ටියේ තිබුණේ නැහැ.

මේ දැන් රෝද පුටුවෙන් පිටතට පැන්න අශ්වයා දෙස මම ඇසිපිය නොගසා බලා සිටියා. එයා කප්පාදු නොකළ, සද්දන්ත සුදු අශ්වයෙක්. ඒ වුණත් එයාගේ බෙල්ල තිබිය යුතු තැනින් ඉහළට, මගේ ලතින් ගුරුතුමාගේ කඳේ උඩු කොටස මටසිලුටු ලෙස අශ්ව කඳට බද්ධ වී තිබුණා.

"කොච්චර සහනයක්ද," නරාශ්වයා කිවුවා. "සෑහෙන කාලයක් මේක ඇතුළේ හිර වෙලා ඉඳලාම මගේ කුර සන්ධි ඔක්කෝම හිරිවැටිලා. දැන්, එන්න, පර්සි ජැක්සන්. අපි අනිත් කඳවුරුකාරයෝ ටික මුණගැහෙන්න යමු."

06

මම නාන කාමරයේ මහෝත්තමයා බවට පත් වුණා

මගේ ලතින් ගුරුතුමා අශ්වයෙක් කියන කාරණය මට දරාගන්න හැකි වුණාට පස්සේ අපි අපූරු සංචාරයක යෙදුණා. ඒ වුණත්, කිසිම වෙලාවක එයාට පිටුපසින් නොයා ඉන්න මම වගබලා ගත්තා. මොකද, මෙසිගේ තුති පුදන දින පෙළපාළිවල අශ්ව වසුරු එකතු කරන්නා ලෙසට මම කිහිප වතාවක්ම සංචාරය කර තිබූ නිසා, කයිරොන්ගේ ඉදිරි භාගය ගැන විශ්වාස කළ තරමටම එයාගේ පසු භාගය ගැනත් විශ්වාස කරන්න මට පුළුවන් වුණේ නැහැ.

අපි අත්පන්දු පිටියක් පසුකරගෙන යද්දී එහි සිටි කඳවුරුකරුවෝ කීප දෙනෙක්ම එකිනෙකාට වැලමිටෙන් ඇනගත්තා. එක් අයෙක් මම ගෙන ගිය මිනටෝර් අඟ දෙසට ඇඟිල්ලක් දිගු කළා. "එයා තමයි ඒ." තවත් කෙනෙක් කිවුවා.

කඳවුරුකරුවන්ගෙන් බොහෝමයක් දෙනා මට වඩා වැඩිමහලු වුණා. 'අර්ධ-ලෝහිත කඳවුර' කියලා මුද්‍රණය කළ තැඹිලි පාට ටී-ෂර්ට් හැඳගත් එයාලාගේ සැටර් යාළුවෝත් ග්‍රෝවර්ට වඩා ලොකුවට සිටියා. එයාලාගෙන් කිසිම කෙනෙක් ලොම් පිරුණු පස්සා ගාත් වැසෙන්න කිසිවක් හැඳ සිටියේ නැහැ. සාමාන්‍යයෙන් මම ලැජ්ජාශීලී ළමයෙක් නොවුණත්, එයාලා මගේ දෙස බලා සිටි ආකාරයෙන් මට අපහසුවක් දැනෙන්න ගත්තා. එයාලා බලාගෙන සිටියේ මම කකුල් පැටලී ඇදගෙන වැටෙනකල්වත් ද කියලා මට හිතුණා.

ආපසු හැරුණු මම මහ ගෙදර දෙස බැලුවා. ඒක මම හිතුවටත් වඩා ගොඩාක් ලොකුයි. තට්ටු හතරක් උස, අහස් නිල් පාට සහ සුදු පාට ආලේප කළ ඒ ගෙදරට තිබුණේ මුහුද අද්දර ග්‍රාමීය නිවාඩු නිකේතනයක පෙනුමක්. වහලය මුදුනේ වූ රාජාලියෙකුගේ හැඩය ගත් පිත්තල සුළං පෙන්න දෙස බලා ඉන්න අතරේ තවත් දෙයක් මගේ ඇස ගැටුණා. ඒ අට්ටාලයේ උඩම ජනේලය අසල වූ හෙවණැල්ලක්. එක තත්පරයකට වගේ, මොකක් හෝ දෙයක් එතැන ජනෙල් තිරය එහා-මෙහා කළා. කවුරු හරි මං ගැන සෝදිසියෙන් සිටින බවට අමුතු හැඟීමක් මට දැනෙන්න ගත්තා.

"අරක උඩ මොනවද තියෙන්නේ?" මම කයිරොන්ගෙන් ඇසුවා.

මම ඇඟිල්ල දිගු කළ දෙස බැලූ කයිරොන්ගේ මුහුණේ වූ සිනාව මැකිලා ගියා. "අට්ටාලය විතරයි."

"කවුරු හරි එතැන ජීවත් වෙනවාද?"

"නැහැ," එයා කිවුවේ ඒ කතාව එතැනින් නතර කරන්න වගෙයි. "පණ තියෙන කිසිම කෙනෙක් නැහැ."

එයා කියන්නේ ඇත්ත බව මට තේරුණා. ඒත්, කවුරු හෝ එතැන තිරය සෙලවූ බවත් මට හොඳටම විශ්වාස වුණා.

"ඉක්මන් කරන්න, පර්සි," කයිරොන්ගේ ප්‍රීතිමත් කටහඬට දැන් කලබලයක් එකතු වෙලා. "බලන්න තව ගොඩාක් දේවල් තියෙනවා."

අපි ස්ට්‍රෝබෙරි යායවල් හරහා ගියා. කඳවුරුකරුවෝ එහි ස්ට්‍රෝබෙරි බුසල් ගණන් කඩන අතරේ, සැටර්ලා බටනළාවලින් තාල වැයුවා.

නිව්යෝක්වල අවන්හල්වලටත්, ඔලිම්පස් කන්දටත් අපනයනය කරන්න සෑහෙන තරම් අස්වැන්නක් කඳවුරුකරුවෝ ගන්නා බව කයිරොන් මට කිවුවා. "ඒකෙන් අපේ වියදම් පිරිමහ ගන්නවා," එයා මට විස්තර කළා. "ඒ වගේම තමයි, ස්ට්‍රෝබෙරි වගාවට වැඩිය මහන්සි වෙන්න ඕනැත් නැහැනේ."

මිස්ටර් ඩී ට පලතුරු ගස්වලට බලපෑම් කරන්න හැකි බව එයා මට කිවුවා. එයා ළඟ පාතක ඉන්නකොට ගස්වලට පිස්සු හැදිලා වගේ වැවෙන්න ගන්නවාලු. ඒක හොඳින්ම වැඩ කරන්නේ මිදි වැල්වලට

වුණත්, මිස්ටර් ඩී ට මිදි වැවීම තහනම් කරලා තියෙන නිසා ඒ වෙනුවට ස්ට්‍රෝබෙරි වවනවාලු.

සැටර් කෙනෙක් බටනලා වාදනය කරන දෙස මම බලා සිටියා. එයාගේ සංගීතය ඇසෙද්දී කෘමියෝ රංචු පිටින් ස්ට්‍රෝබෙරි බිස්ස අතහැර පියඹා ගියේ ගින්නකින් බේරෙන්න දුවන සරණාගතයෝ ටිකක් වගෙයි. සංගීතයෙන් මේ වගේ මායාවල් කරන්න ග්‍රෝවර්ටත් පුළුවන් ඇති ද හිතලා මම පුදුම වුණා. එයා තවමත් මහ ගෙදරට වෙලා මිස්ටර් ඩී ගෙන් බැණුම් අහනවා ද කියලා මම කල්පනා කළා.

"ග්‍රෝවර්ව ලොකු කරදරේක වැටිලා නැතුව ඇති නේද?" මම කයිරොන්ගෙන් ඇහුවා. "මම කියන්නේ... එයා හොඳ ආරක්ෂකයෙක් නේ. ඇත්තමයි."

කයිරොන් සුසුමක් හෙළුවා. එයා ට්විඩ් කබාය ගලවා සැදලයක් දානවා වගේ එයාගේ අශ්ව පිට මතට දමා ගත්තා. "ග්‍රෝවර්ට ලොකු ලොකු හීන තියෙනවා, පර්සි. සමහරවිට, හිතන්නත් බැරි තරම් ලොකු ඒවා. එයාගේ ඉලක්කයට ළඟා වෙන්න නම්, මුලින්ම එයා අලුත් කඳවුරුකාරයෙක්ව හොයාගෙන, එයාව ආරක්ෂිතව අර්ධ-ලෝහිත කඳවුරට එක්කගෙන ඇවිත්, රැකවලෙක් විදිහට සාර්ථක වෙලා එයාගේ නිර්භීතකම ඔප්පු කරන්න ඕනෑ."

"ඉතින්, එයා ඒක කළා නේ!"

"මටත් ඔයා එක්ක එකඟ වෙන්න තිබුණා," කයිරොන් කිවුවා. "ඒත් ඒක විනිශ්චය කරන එක මට අයිති වැඩක් නෙවෙයි නේ. ඔලිම්පියස් සහ විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලය තමයි ඒක තීරණය කරන්නේ. මට බය, මේ පැවරුම සාර්ථක එකක් විදිහට එයාලා දකින්නේ නැති වෙයි කියලයි. කොහොම වුණත්, නිව්යෝක්වලදී ග්‍රෝවර්ට ඔයාව මග හැරුණා. ඊට පස්සේ, ඔයාගේ අම්මාට අත්වුණ අවාසනාවන්ත... අත්... ඉරණම. ඒ වගේම තමයි, ඔයා ඉඩමේ මායිමෙන් මෙහාට එයාව ඇදගෙන එනකොට එයා හිටියේ සිහිය නැතිව නේ. මේ කාරණාවලින් ග්‍රෝවර්ගේ නිර්භීතකම ඔප්පු වෙනවද කියලා මණ්ඩලය ප්‍රශ්න කරන්න ඉඩ තියෙනවා."

ඒකට විරුද්ධ වෙන්න මට උවමනා වුණා. සිද්ධ වූ එක දෙයක්වත් ග්‍රෝවර්ගේ වැරැද්ද නිසා සිද්ධ වුණ දේවල් නෙවෙයි. ඒත් එක්කම, මට මහා වරදකාරී හැඟීමක් දැනෙන්න ගත්තා. එදා බස්

නැවතුම්පොළේදී මම ග්‍රෝවර්ව මග ඇර නොගියා නම් එයා මේ විදිහේ කරදරේක පැටලෙන්නේ නැති වෙන්න තිබුණා.

"එයාට දෙවෙනි අවස්ථාවක් ලැබේවි, නේද?"

කයිරොන්ගේ මුහුණ ඇකිළුණා. "ඒක තමයි එයාගේ දෙවෙනි අවස්ථාව, පර්සි. අවුරුදු පහකට කලින්, එයාගේ පළවෙනි වතාවේදී සිද්ධ වුණ දේ නිසා එයාට තවත් අවස්ථාවක් දෙන්නවත් මණ්ඩලය වැඩිය උනන්දු වුණේ නැහැ. ඔලිම්පස් දන්නවා, මම එයාට අවවාද කළා තව වතාවක් උත්සාහ කරන්න කලින් ටික කාලයක් ඉවසන්න කියලා. එයාගේ වයසට එයා තවමත් පොඩි වැඩියි..."

"එයාගේ වයස කීයද?"

"ඔහ්, විසි අටයි."

"මොනවා! ඒත් තාම එයා හය වසරේ?"

"සැටර්ලා මුහුකුරා යන්නේ මිනිස්සු මුහුකුරා යන වයසෙන් බාගයක් අඩුවෙන්, පර්සි. පහුගිය අවුරුදු හය පුරාවටම ග්‍රෝවර් මධ්‍යම පාසල් ශිෂ්‍යයෙක්ට සමානවයි හිටියේ."

"ඒක නම් හරිම දරුණු දෙයක්."

"ඇත්තටම." කයිරොන් මම කියූ දේට එකඟ වුණා. "මොනවා වුණත්, එයා තවම මෝරලා මදි. සැටර්ලාගේ මිම්මෙන් බැලුවත් එහෙමයි. අනික, එයාට තවම වන ලැහැබේ මායාවල ප්‍රවීණයෙක් වෙන්න පුළුවන් වෙලාත් නැහැ. අප්පොච්චියේ, එයා හදිස්සි වුණේ එයාගේ හීන පස්සේ යන්න නේ. බාගදා, දැන් එයාට පුළුවන් වෙයි වෙන මොකක් හරි රස්සාවක් හොයා ගන්න..."

"ඒක හරි අසාධාරණයි," මම කිවුවා. "පළවෙනි වතාවේ මොනවද සිද්ධ වුණේ? එදා එච්චරටම නරක දෙයක් වුණාද?"

කයිරොන් ඉක්මනට අහක බලාගත්තා. "අපි ඉක්මන් කරලා යමුද?"

ඒත් ඒ කතාව එච්චර ඉක්මනින් නතර කරන්න මම සූදානම් වුණේ නැහැ. කයිරොන් මගේ අම්මාගේ ඉරණම ගැන කියූ ආකාරයේ මට අමුත්තක් දැනුණා, එයා 'මරණය' කියන වචනය හිතලම මග හැරියා වගෙයි මට දැනුණේ. ඒත් එක්කම එක පුංචි බලාපොරොත්තුවක දැල්ලක් මගේ හිත ඇතුළේ ඇවිළෙන්න ගත්තා.

"කයිරොන්," මම කිවුවා. "දෙවිවරුයි, ඔලිම්පස් කන්දයි මේ මිත්‍යාකතා ඇත්ත නම්..."

"ඔව්, දරුවෝ?"

"ඒ කියන්නේ පාතාල ලෝකයත් ඇත්තක්ද?"

කයිරොන්ගේ මුහුණ අඳුරු වුණා.

"ඔව්, දරුවෝ." එයා නතර වුණේ කියන්න ඕනෑ වචන තෝරාගන්න වගෙයි. "මරණින් පස්සේ ආත්ම ගමන් කරන තැනක් තියෙනවා. ඒත් දැන්, අපි වැඩිදුර විස්තර දැනගන්නකල්... ඔයා ඔය දේවල් හිතින් අයින් කරලා දාන එක තමයි හොඳ."

"ඔයා 'අපි වැඩිදුර විස්තර දැනගන්නකල්' කියලා අදහස් කළේ මොකක්ද?"

"එන්න, පර්සි. අපි කැලේ බලන්න යමු."

***

ඒ වනාන්තරය කොයි තරම් ලොකු ද කියලා මට තේරුම් ගියේ ඒක කිට්ටුවට යනකොටයි. අඩුම තරමින්, මුළු දෙණියෙන් හතරෙන් එකක්වත් රුක්ෂ ගස් පිරුණු ඒ වනාන්තරයෙන් වැසී තියෙන්න ඇති. රතු ඉන්දියානුවන්ගෙන් පසු ඒ වනයේ වෙනත් කිසිවෙක් ඉන්න නැතුව ඇති කියලා මට හිතුණා.

"කැලය පිරිලා තියෙන්නේ, ඔයා කැමති නම් ඔයාගේ වාසනාව උරගා බලන්න පුළුවන්. හැබැයි, යනවා නම් සන්නද්ධ වෙලා යන්න." කයිරොන් කිවුවා.

"මොනවාගෙන්ද පිරිලා තියෙන්නේ?" මම ඇසුවා. "සන්නද්ධ වෙන්නේ මොනවාගෙන්ද?"

"ඔයාට බලාගන්න ලැබෙයි. කොඩිය ඇල්ලීම තියෙන්නේ සිකුරාදා රෑට. ඔයාට, ඔයාගේම කඩුවකුයි පලිහකුයි තියෙනවාද?"

"මගේම-?"

"නෑ," කයිරොන් කිවුවා. "මං හිතන්නේ නැහැ ඔයාට ඇති කියලා. මට හිතෙන්නේ පස්වෙනි ප්‍රමාණේ ඒවා ඔයාට ගැළපේවි. මම පස්සේ ආයුධ ගබඩාවට යන්නම්කෝ."

ආයුධ ගබඩාවක් තියාගෙන ඉන්නේ මොන වගේ ගිම්හාන කඳවුරකද කියලා අහන්න මට උවමනා වුණා. ඒත් ඒ හැර මට කල්පනා කරන්න තව ගොඩාක් දේවල් තිබුණා. ඉතින්, අපේ චාරිකාව නොනැවතී ගියා. අපි දුනු ශිල්ප අඩවිය, ඔරු පදින විල වගේම ඉස්තාලයත් බලා ගත්තා. (ඒකට නම් කයිරොන්ගේ වැඩි කැමැත්තක් ඇති බවක් පෙනුණේ නැහැ) ඒ වගේම හෙල්ල විසි කිරීම් පුහුණුවන අඩවිය, සාජ්ජ පවත්වන රංගාවාටය සහ කඩු හා හෙල්ල සටන් පවත්වන මල්ලව භූමිය ලෙසින් කයිරොන් හැඳින්වූ පිටියකුත් තිබුණා.

"කඩු සටන් සහ හෙල්ල සටන්?" මම ඇසුවා.

"කැබින් අතර තරග වගේ දේවල්," එයා තේරුම් කරලා දුන්නා. "සාමාන්‍යයෙන් මාරාන්තික ඒවා නෙවෙයි. ඔන්, ඒ වගේම කෑම ගන්න ශාලාවකුත් තියෙනවා."

මුහුදට ඉහළින්, කන්දක් මුදුනේ තිබුණු එළිමහන් මණ්ඩපයක් පෙන්වමින් කයිරොන් කිවුවා. සුදු පාට ග්‍රීක කුලුනුවලින් ඒ මණ්ඩපය වට වී තිබුණා. එතැන ගලින් සැදූ මේස දුසිමක් විතර තිබුණත් ඒ ගොඩනැගිල්ලට බිත්ති හෝ වහලයක් තිබුණේ නැහැ.

"වහින වෙලාවට ඔයාලා මොකද කරන්නේ?" මම ඇසුවා.

කයිරොන් මගේ දිහා බැලුවේ අමුතු සතෙක් දිහා බලනවා වගෙයි. "ඒත් ඉතින් අපි කෑම ගන්න ඕනෑනේ. නැද්ද?" ඒ මාතෘකාව අත ඇරලා දාන්න මම තීරණය කළා.

අන්තිමේදී, එයා මට කැබින් පෙන්වූවා. විල ළඟ කැලෑවේ එක පොකුරට පිහිටා තිබූ කැබින් දුසිමක් එතැන තිබුණා. පාදමට කැබින් දෙකකුත්, දෙපැත්තට කැබින් පහ බැගින් වූ පෝලිම් දෙකකුත් එක්ක ඉංග්‍රීසි හෝඩියේ යූ අකුරේ හැඩයට ඒවා සාදා තිබුණා. මෙච්චර කාලයකට මම දැකපු පුදුමාකාරම ගොඩනැගිලි එකතුව එය බව මට කිසිම සැකයක් නැතිව කියන්න පුළුවන්.

දොරට උඩින් සවිකළ දැවැන්ත පිත්තල කාමර අංක (ඔත්තේ ඉලක්කම් වම් පැත්තටත්, ඉරට්ටේ ඉලක්කම් දකුණු පැත්තටත්) හැරෙන්න වෙනත් කිසිම දේකින් ඒ කැබින් එකකට එකක් සමාන වුණේ නැහැ. පුංචි කර්මාන්ත ශාලාවක වගේ දුම් කවුළුවක් අංක නමය කැබිනයේ දකින්න ලැබුණා. අංක හතරේ බිත්තිවල තක්කාලි වැල් එතිලා, ඒ වගේම එහි වහලය ඇත්තම තණකොළවලින් සාදා තිබුණා. තනි රත්තරනින් සාදා තිබූ අංක හත දෙස කෙලින් බලන්න

කැටි තරමට ඉර එළියෙන් දිලිසුනා. මේ කැබින් සියල්ලම පාපන්දු පිට්ටනියක් තරමේ පොදු මිදුලකට මුහුණලා තිබුණා. ඒ මිදුල ග්‍රීක පුතිමා, වතුර මල්, මල් පාත්ති සහ පැසි පන්දු වළලු ජෝඩුවකින් පුල්ලි වැටී තිබුණා.

පිටිය මැද ගලින් සැදූ ලොකු ගිනි උදුනක් තිබුණා. ඒ හවස් වරුව උණුසුම් වුවත්, උදුන දල්වා තිබුණා. අවුරුදු නමයක විතර ගැහැනු ළමයෙක් කෝටුවකින් ගල් අඟුරුවලට අනිමින්, ගින්න රැකබලා ගත්තා.

පිට්ටනිය ඉහළ කෙළවරේ අංක එක සහ දෙක කැබින්, ඉදිරියෙන් ලොකු කුලුනු තබා, කිරි ගරුඬවලින් පෙට්ටි හැඩයට සැදූ ඒවා වුණා. ඒ කැබින් දෙකට තිබුණේ යුවළකගේ සොහොන් ගැබ ජෝඩුවක පෙනුමක්. කැබින් දොළහෙන් ලොකුම එක වුණේ අංක එකයි. ඒ කාමරයේ ඔප දැමූ ලෝකඩ දොරවල් දිස්න දුන්නා. ඒ දිහා එක් එක් කෝණවලින් බලද්දී පෙනුණේ ඒ හරහා අකුණු විදුලි වයිරම් සෙනවා වගෙයි. මල් වැල්වලින් හා දෙළුම්වලින් හැඩ වූ සිහින් කුලුනු තිබූ කැබින් අංක දෙක වඩාත් සුන්දරව පෙනුණා. ඒ කැබිනයේ බිත්තිවල මොනර රූප කැටයම් කර තිබුණා.

"සියුස් සහ හේරා?" මම අනුමාන කළා.

"ඇත්ත හරි." කයිරොන් කිව්වා.

"එයාලාගේ කැබින් හිස් නේ."

"කැබින් කීපයක්ම එහෙම තමයි. ඇත්තටම, කිසිම කෙනෙක් අංක එකේවත් දෙකේවත් ඉඳලා නැහැ."

හොඳයි. එතකොට කැබින් එකකට එක දෙවියා ගානේ ඉන්නවා. කැබින් දොළහක් තියෙන්නේ ඔලිම්පියානුවන් දොළොස්දෙනා වෙනුවෙනුයි. ඒත් සමහර ඒවා හිස් වෙලා තියෙන්නේ කොහොමද?

වම් පැත්තේ මුලින්ම තිබූ කැබිනය - අංක තුන ඉදිරියේ මම නතර වුණා.

එය කැබින් අංක එක වගේ උස්, දැවැන්ත එකක් නොවුණත්, දිගු, වැඩිය උස නැති, ශක්තිමත් එකක් වුණා. ඒ කාමරේ පිටත බිත්ති සිප්පි කටු සහ කොරල් ඇල්ලූ රළු, අළු පාට ගල්වලින් සාදා තිබුණේ හරියට ඒ කොන්ක්‍රීට් ලෑලි මුහුදු පතුලේදී සාදා, ගොඩට ගෙනැත්

වගෙයි. විවෘතව තිබුණු දොරෙන් ඇතුළට මම එබිලා බලද්දී කයිරොන් කෑගැසුවා. "ඒයි, මම නම් ඔය වගේ වැඩ කරන්නේ නැහැ!"

එයා මාව එළියට ඇදලා ගන්න කලින් ඒ කාමරය තුළ වූ ලුණු මිශ්‍ර සුවඳ විඳගන්න මට පුළුවන් වුණා. ඒක හරියට මොන්ටවුක් වෙරළේ ඉන්නකොට හමනා හුළඟේ සුවඳ වගෙයි. කාමරයේ ඇතුළු බිත්ති මුහුදු බෙල්ලෝ වගේ දීප්තිමත්ව දිලිසුනා. එහි තිබූ සේද රෙදි එළූ ඇඳන් හයම හිස් වුණා. කවදාවත්, කිසිම කෙනෙක් ඒවාගේ නිදාගත් ලකුණක්වත් පේන්න තිබුණේ නැහැ. ඒ කැබින් කාමරය දුක්බර, පාළු පෙනුමක් ගත්තා. "ඉක්මන් කරන්න, පර්සි." කයිරොන් මගේ උරහිසට අත තබා, කතා කිරීම ගැන මම සතුටු වුණා.

අනිත් කැබින් ඔක්කොම වගේ කඳවුරුකරුවන්ගෙන් පිරිලා තිබුණා.

අංක පහ දීප්තිමත් රතු පාටින් පින්තාරු කරලා තිබුණා. බාල්දිවලිනුයි අත්වලිනුයි තීන්ත ඉහලා වගේ ඒ බිත්තිවලට හරිම අපිළිවෙළ පෙනුමක් තිබුණේ. ඒ කැබිනයේ වහලයට කටු කම්බි ගසා තිබුණා. එහි දොරේ එල්ලා තිබූ වල් ඌරු ඔළුවේ ඇස් දෙක මම යන දිහාවටම හැරෙනවා වගෙයි මට පෙනුණේ. ඒ කැබිනය ඇතුළේ අධම පෙනුමක් ඇති කොල්ලෝ කෙල්ලෝ රැනක් අත්වලින් පොර බදමින්, වාද කරමින් සිටියේ කැබිනය දෙදරවමින් ඇසුණු රොක් සංගීතය මැදයි. ඒ අතරින් සද්දෙටම කෑගැසුවේ අවුරුදු දහතුනක හෝ දහ හතරක විතර ගැහැනු ළමයෙකුයි. 'අර්ධ-ලෝහිත කඳවුර' ටී-ෂර්ට්වලින් ලොකුම ප්‍රමාණයේ එකක් හැඳ සිටි එයා, ඊට උඩින් හමුදා මෝස්තරයේ කබායක් දමාගෙන සිටියා. එයා මගේ දිහා කන්න වගේ බලාගෙන ඉඳලා යක්ෂ විදිහට විරිත්තුවා. එයාව දකිද්දී මට නැන්සි බොබ්ෆිට්ව මතක් වුණා, ඒත් මේ කඳවුරුකාරී නැන්සිට වඩා ගොඩාක් ලොකුයි. ඒ වගේම දරදඬු පාටයි. එයාට තිබුණෙත් රතු වෙනුවට දුඹුරු පාට, දිග, කුරු කොණ්ඩයක්.

කයිරොන්ගේ කුරවලට නොපෑගී ඉන්න උත්සාහ කරමින් මම නොනැවතී ගියා. "අපි වෙන නරාශ්වයෝ එක්කෙනෙක්වත් දක්කේ නැනේ?" මම ඇසුවා.

"නෑ," කයිරොන් කිවුවේ දුකින් වගෙයි. "මගේ නෑදෑයෝ හීලෑ නැති, වනචාරී කට්ටියක්. කැලෑවලදී, නැත්නම් ප්‍රධාන ක්‍රීඩා උත්සවවලදී නම් ඔයාට එයාලාව දකින්න ලැබේවි. ඒත් මෙහෙදී නම් ඔයාට එක්කෙනෙක්වත් දකින්න ලැබෙන්නේ නැහැ."

"ඔයා කිවුවේ ඔයාගේ නම කයිරොන් කියලා නේ. ඔයා ඇත්තටම..."

එයා මගේ දෙස බලා හිනාවුණා. "කතන්දරවල ඉන්න කයිරොන්මද? හර්කියුලිස්වයි අනිත් කට්ටියවයි පුහුණු කරවපු කෙනාමද?"

"ඔව්, පර්සි. ඒ මම තමයි."

"ඒත්, එහෙනම් දැන් ඔයා මැරිලා ඉන්න එපැයි?"

ඒ ප්‍රශ්නයෙන් එයාගේ කුතුහලය ඇවිස්සුනා වගේ කයිරොන් නතර වුණා. "අවංකවම කියනවා නම්, මම දන්නේ නැහැ එහෙම වෙන්න ඕනෑද කියලා. ඇත්තම කිව්වොත්, මම මැරෙන්නේ නැහැ. යුග ගාණකට කලින් දෙවිවරු මගේ ප්‍රාර්ථනාවක් ඉෂ්ට කළා.. මම ආදරේ කරන රස්සාව මට දිගටම කරගෙන යන්න පුළුවන්. මිනිස් වර්ගයාට උවමනා තරම් කාලයක් වීරයන්ගේ ගුරුවරයා වෙන්න මට පුළුවන්. ඒ ප්‍රාර්ථනාවෙන් මම ගොඩක් දේවල් ලබා ගත්තා වගේම මට ගොඩක් දේවල් අත්හරින්නත් වුණා. ඒත් මම තාම මෙතැන ඉන්නවා, ඉතින් මම විශ්වාස කරන්නේ මාව තවමත් උවමනා ඇති."

අවුරුදු තුන් දහසක් පුරාවට ගුරුවරයෙක් විදිහට වැඩ කරන එක ගැන මම ටිකක් කල්පනා කළා. මම කරන්න කැමතිම දේවල් දහය තියෙන ලැයිස්තුවට ඒක නම් කවදාවත් එකතු වෙන්නේ නැති වෙයි.

"ඒක කවදාවත් එපා වෙන්නේ නැද්ද?"

"නෑ, නෑ," එයා කිවුවා. "සමහර වෙලාවලට නම් දරුණු විදිහේ පීඩනයක් දැනෙනවා. ඒත් කවදාවත් එපා වෙන්නේ නම් නැහැ."

"ඇයි පීඩනයක් දැනෙන්නේ?"

කයිරොන්ගේ කන් ඇසීම ආයෙමත් දුර්වල වුණා.

"ඔහ්, බලන්න," එයා කිවුවා. "ඇනබෙත් අපි එනකම් බලන් ඉන්නවා."

මහ ගෙදරදී මට මුණ ගැසුණු තඹ කොණ්ඩාකාරි වම් පේළියේ අන්තිම කැබිනය - අංක එකොළහ ඉදිරියේ ඉඳගෙන පොතක් කියවමින් සිටියා.

අපි එයා සිටි තැනට ගියාම එයා මගේ දිහා බරපතළ ලෙස බැලුවේ හරියට මම නින්දෙන් කට කෙළ පෙරීම ගැන එයා තවමත් හිතනවා වගෙයි.

එයා කියවමින් සිටියේ මොකක්ද කියලා බලාගන්න මම උත්සාහ කළත් ඒ පොතේ නම කියවා ගන්න මට බැරි වුණා. ඒ මගේ වචන අන්ධතාවය නිසා වෙන්න ඇති කියලා මම මුලින් සිතුවත්, එහි තිබුණේ ඉංග්‍රීසි නෙවෙයි කියලා මට ටිකකින් තේරුම් ගියා. ඒ අකුරු මට පෙනුණේ ග්‍රීක වගෙයි - මම අදහස් කළේ ඒවා ඇත්තටම ග්‍රීක. ඒ පොතේ දේවාලවල, ප්‍රතිමාවල වගේම එක එක මෝස්තරයේ කුලුනුවල පින්තූර තිබුණේ වාස්තු විද්‍යා පොතක වගෙයි.

"ඇනබෙත්," කයිරොන් කතා කළා. "මට හවසට දුනු විදීම පුහුණු කරන්න පන්තියක් තියෙනවා. ඔයාට පුළුවන්ද මෙතැන ඉඳන් පර්සිව එක්ක යන්න?"

"හොඳයි, සර්."

"කැබින් එකොළහ," දොර දෙසට අත දිගු කරමින් කයිරොන් මට කිවුවා. "ඔයාගෙම ගෙදර වගේ ඉන්න."

සියලුම කැබින් අතරින්, සාමාන්‍ය පරණ ගිම්හාන කඳවුරක පෙනුම තිබුණේ කැබින් එකොළහටයි. එහි එළිපත්ත ගෙවී, දුඹුරු පාට තීන්ත පොතු ගැලවෙමින් තිබුණා. එයි දොරකඩ දොස්තරලා සංකේතයක් විදිහට පාවිච්චි කරන, සර්පයෝ දෙන්නෙක් වටේට එතුනු, තටු සහිත පොල්ලක සංකේතය සවිකර තිබුණා. මොකක්ද එයාලා ඒකට කියන නම...? කැඩූසියස්.

කැබිනය ඇතුළ ළමයින්ගෙන් පිරිලා. එහි වූ ඇඳන් ගාණටත් වඩා කොල්ලෝ, කෙල්ලෝ ගොඩක් කාමරයේ සිටියා. නිදාගැනීමට පාවිච්චි කරන මලු ගොඩක් පොළොව පුරා විසිරිලා. එතැන පෙනුණේ රතු කුරුස සංගමයෙන් මිනිස්සුන්ට බෙහෙත් කරන්න පාවිච්චි කරපු ශාලාවක් වගෙයි.

කයිරොන් ඇතුළට ගියේ නැහැ. එයාට යන්න බැරි තරම් දොර උසින් අඩු වුණා. ඒ වුණත්, එයාව දකපු හැටියේම කඳවුරුකරුවෝ හැමෝම නැගිටලා විනීත ලෙසට ආචාර කළා.

"හොඳයි එහෙනම්," කයිරොන් කිවුවා, "සුබ පැතුම්, පර්සි. රෑ කෑම වෙලාවට මුණ ගැහෙමු."

එයා දුනු ශිල්ප අඩවියට පිම්මේ දිව්වා.

මම දොරකඩ සිටගෙන, ළමයි දෙස බලන් සිටියා. එයාලා මට නම් ආචාර කළේ නැහැ. හැමෝම මගේ දිහා බලාගෙන සිටියේ මගේ තරම මැන ගන්න වගෙයි. මේ පිළිවෙත මට අලුත් දෙයක් නොවුණේ මම ඉස්කෝල ගොඩකට මාරු වෙලා තිබුණු නිසයි.

"එහෙනම්," ඇනබෙත් මාව ඉක්මන් කළා. "යන්න."

ඉතින්, පුරුදු විදිහටම මම දොරකඩදී කකුල පටලවාගෙන මගේ මෝඩකම ප්‍රදර්ශනය කළා. කදවුරුකාරයෝ කිප දෙනෙක්ම හිනාවල් කද කරගන්නවා ඇසුණත්, කවුරුත්, මුකුත්ම කිවුවේ නැහැ.

"කැබින් එකොළහ, අඳුන ගන්න. මේ පර්සි ජැක්සන්." ඇනබෙත් නිවේදනය කළා.

"ස්ථිර ද, නැත්නම් තීරණය නොකළ ද?" කෙනෙක් ඇසුවා.

මොනවා කියන්නද කියලා මට හිතා ගන්න බැරි වුණත්, ඇනබෙත් ඒකට උත්තර දුන්නා. "තීරණය නොකළ."

හැමෝම එකවර කත් කෙඳිරි ගාන්න පටන් ගත්තා.

අනෙක් අයට වඩා ටිකක් වැඩිමහලු පෙනුමක් තිබූ කොල්ලෙක් ඉදිරියට ආවා. "හෝව්, හෝව්, කට්ටිය. ඒකට තේ අපි මෙහෙ ඉන්නේ. සාදරෙන් පිළිගන්නවා, පර්සි. ඔයාටත් පොළොවෙන් ඉඩක් වෙන්කර ගන්න පුළුවන්, මෙන්න මෙතැනින්."

එයා අවුරුදු දහ නමයක විතර, තිවුණු පෙනුමක් තිබුණු කොල්ලෙක්. උස, පේශිවලින් පිරුණු ඇඟක් තිබුණු එයාට කොටට කැපූ වැලි පාට කොණ්ඩයකුත්, හරිම මිත්‍රශීලී හිනාවකුත් තිබුණා. කැබිලි පාට බැනියමකින් හා කොට කලිසමකින් සැරසිලා, සෙරෙප්පු කුට්ටමක් පැළඳගෙන සිටි එයාගේ බෙල්ලේ ලෙදර්වලින් සෑදූ මාලයක් ගැට ගසා තිබුණා. එය පාට පහක මැටි පබළු පහකින් සැදූවක්. එයාගේ පෙනුමට නොගැලපුණු එකම දේ වුණේ, එයාගේ දකුණු කම්මුලේ ඇස ළඟ ඉඳන් හකු ඇටය දක්වාම තිබූ මහත, සුදුමැලි තුවාල කැළැලයි. ඒක පෙනුණේ පරණ පිහියකින් වූ කැපුමක් වගෙයි.

"මේ ඉන්නේ ලූක්," ඇනබෙත් කියද්දී එයාගේ කටහඬේ කලින් නොතිබූ මොකක්දෝ වෙනසක් මට දැනුණා. එයා දෙසට බැල්මක් හෙළද්දී, එයාගේ කම්මුල් දෙකත් රතු වෙලා කියලා මට පෙනුණා. මම

බලනවා දකපු ඇනබෙත් ඉක්මනින් එයාගේ හැඟීම් තද කරගත්තා. "එයා තමයි දැනට ඔයාගේ උපදේශකයා වෙන්නේ."

"දැනට?" මම ඇසුවා.

"ඔයා තාම තීරණය නොකළ කෙනෙක් නේ," ලූක් ඉවසිලිවන්තව තේරුම් කළා. "ඉතින් ඔයාව මොන කැබින් එකට දාන්න ඕනෑද කියලා එයාලා දන්නේ නැති නිසා ඔයාව මෙහෙට එව්වා. කඳවුරට අලුතින් එන අයයි, අමුත්තන්වයි බාර ගන්නේ කැබින් අංක එකොළහ. අපි එහෙම කරන්න ඕනෑ. මොකද, හර්මීස් - ඒ කියන්නේ අපේ අනුග්‍රාහකයා සංචාරකයන්ට අධිපති දෙවියෝ නේ."

පොළොවෙන් මට කියලා වෙන්කර දුන් පුංචි කොටස දිහා මම බැලුවා. එතැන මගේ කියලා සලකුණු කරන්නවත් කිසිම දෙයක් මගේ ළඟ තිබුණේ නැහැ. ගමන් මල්ලක් නැහැ. ඇඳුම් නැහැ. අඩු තරමේ නිදන මල්ලක්වත් නැහැ. තිබුණේ මිනටෝර් අඟ විතරයි. ඒක බිමින් තියන්න හිතුවත්, හර්මීස් කියන්නේ හොරුන්ටත් අධිපති දෙවියෝ බව මතක් වුණාම මම ඒ අදහස අත් ඇරියා.

කඳවුරුකරුවන්ගේ මුහුණු දෙස මම වටේට බැලුවා; සමහරු බුම්මාගෙන, සමහරු සැකයෙන් වගේ. තවත් සමහරෙක් මෝඩ විදිහට හිනාවෙන අතරේ කිප දෙනෙක් මගේ දිහාවට ඇස් ගසාගෙන සිටියේ මගේ සාක්කුවට විදින්න අවස්ථාවක් ලැබෙනතුරු වගෙයි.

"කොච්චර කාලයක් මට මෙහෙ ඉන්න වෙයිද?" මම ඇසුවා.

"හොඳ ප්‍රශ්නයක්," ලූක් කිවුවා. "ඔයා ගැන තීරණය කරනකල්."

"ඒකට කොච්චර කාලයක් යාවිද?"

කැබිනයේ සිටි හැමෝම හිනා වෙන්න ගත්තා.

"එන්නකෝ," ඇනබෙත් මට කතා කළා. "ඔයාට අත්පන්දු පිට්ටනිය පෙන්වන්නම්."

"මම කලිනුත් ඒක දැක්කනේ."

"මෙහෙ එනවා." එයා මගේ මැණික්කටුවෙන් අල්ලාගෙන එළියට ඇදන් ගියා. අපිට පිටුපසින් කැබින් එකොළහේ ළමයි මහ හඬින් හිනාවෙනවා ඇහුණා.

"ඔයාට ඊට වඩා හොඳට කරන්න වෙනවා, ජැක්සන්." අපි අඩි කිහිපයක් ගියාට පස්සේ ඇනබෙත් කිවුවා.

"මොනවද?"

ඇස් දෙක රෝල් කරන ගමන් එයා කට යටින් කුටු-කුටු ගෑවා. "ඔයා තමයි කෙනා කියලා මම විශ්වාස කරපු එක ගැන මටම පුදුමයි."

"මොකක්ද ඔයාට තියෙන ප්‍රශ්නේ?" මගේ තරහාව ඇවිස්සෙන්න පටන් ගත්තා. "මම දන්න එකම දේ, මම ගොත්-මිනිහෙක්ව මැරුවා -"

"ඔය විදිහට කතා කරන්න එපා!" ඇනබෙත් මට කිව්වා. ඔයාට ලැබුණු අවස්ථාව තමන්ට ලැබුණා නම් කියලා මේ කඳවුරේ ඉන්න ප්‍රයාක් ළමයි හිතනවා කියලා ඔයා දන්නවා."

"මැරුම් කන්නද?"

"මිනටෝර් එක්ක සටන් කරන්න! අපි පුහුණු වෙන්නේ වෙන මොකකට කියලද ඔයා හිතන්නේ?"

මම ඔළුව සෙලෙව්වා. "බලන්න, මම සටන් කරපු එකා ඇත්තටම මිනටෝර් නම්, ඒ කියන්නේ අර කතන්දරවල ඉන්න එකාම නම්..."

"ඔව්."

"එහෙනම් ඒ ජාතියේ එක්කෙනයි නේ ඉන්නේ?"

"ඔව්."

"ඉතින් අවුරුදු කෝටි ගාණකට විතර කලින් ඒකා මැරුණා නේ. නැද්ද? වංගිගිරියේදී තෙසියස් එයාව මැරුවානේ. එතකොට..."

"රාක්ෂයෝ මැරෙන්නේ නැහැ, පර්සි. එයාලාව නැති කරලා දාන්න පුළුවන්. ඒත් මරන්න බැහැ."

"ඔහ්, ස්තුතියි. ඔයා තියෙමෙට පැහැදිලි කරලා දුන්නා."

"ඔයාට, මට වගේ එයාලාට ආත්ම නැහැ. ටික කාලෙකට එයාලාව එළවලා දාන්න පුළුවන්. සමහර විට, ඔයා වාසනාවන්ත නම් ඔයාගේ මුළු ජීවිත කාලෙටම පුළුවන්. ඒත්, එයාලා මූලිකවම ආදි කල්පිත බලවේග. කයිරොන් එයාලාට කියන්නේ 'ආදි වර්ගයා' කියලා. අන්තිමේදී එයාලා ප්‍රතිසංස්කරණය වෙනවා."

මට මිසිස් ඩොඩ්ස්ව මතක් වුණා. "ඔයා කියන්නේ, මම අහම්බෙන් වගේ කඩුවකින් කොටලා එක්කෙනෙක්ව මැරුවොත් -"

"පියු... මම කිව්වේ, ඔයාගේ ගණිත ටීචර්, අන්න හරි. එයා තවමත් මේ කොහේ හරි ඉන්නවා. ඔයා කළේ එයාව ගොඩාරියක් කේන්ති ගස්වපු එක විතරයි."

"මිසිස් ඩොඩ්ස් ගැන ඔයා කොහොමද දන්නේ?"

"ඔයා හීනෙන් කියෙව්වා."

"ඔයා එයාට මොකක්ද නමක් කියන්න ගියා නේද? ඒ ෆියුරි කියලාද? එයාලා හේඩීස්ගේ වධකයෝ. එහෙම නේද?"

ඇනබෙත් කලබල වෙලා වටපිට බැලුවේ පොළොව ඇරිලා එයාව ඇතුළට ගිල ගනීවි කියලා බයෙන් වගෙයි. "ඔයා එයාලාට නම් කියලා කතා කරන්න එපා. අඩු තරමේ මෙහෙදිවත් එපා. එයාලා ගැන කතා කරන්නම උවමනා නම් අපි එයාලාට කියන්නේ කාරුණික ඇත්තෝ කියලා."

"බලන්න, මෙහෙ අකුණු කොටන්නේ නැතිව කියන්න පුළුවන් කිසිම නමක් නැද්ද?" මම කෙඳිරි ගානවා වගේ මටම ඇසුණත්, මම වැඩිය ගණන් ගත්තේ නැහැ. "කොහොම හරි, මට කැබින් අංක එකොළහේ නතර වෙන්න වුණේ ඇයි? ඇයි හැම දෙනාම ඒක ඇතුළේ හිරවෙලා ඉන්නේ? අරෙහේ ඕනෑ තරම් හිස් ඇඳවල් තියෙනවා නේ."

මම මුලින්ම දකපු කැබින් කිහිපය පෙන්වමින් කිව්වා. ඇනබෙත් සුදුමැලි වුණා. "ඔයාට හිතුණු පලියට කැබින් එකක් තෝරා ගන්න බැහැ, පර්සි. ඒක තීරණය වෙන්නේ ඔයාගේ දෙමව්පියෝ කවුද කියන එක මතයි. නැත්නම්, අම්මා හෝ තාත්තා."

එයා මගේ දිහා බලාගෙන සිටියේ එයා කියූ දේ මම තේරුම් ගන්නා තුරුයි.

"මගේ අම්මා සැලී ජැක්සන්," මම කිව්වා. "එයා වැඩ කරන්නේ මධ්‍යම සේවා ස්ථානයේ තියෙන රසකැවිලි කඩේක. අඩු තරමේ, එයා වැඩ කළේ එතැන."

"ඔයාගේ අම්මා ගැන මට කණගාටුයි, පර්සි. ඒත් ඒක නෙවෙයි මම අදහස් කළේ. මම කිව්වේ අනිත් කෙනා ගැන. ඔයාගේ තාත්තා ගැන."

"එයා මැරිලා. මම කවදාවත් එයාව දැනගෙන හිටියේ නැහැ."

Scanned with CamScanner

ඇනබෙත් සුසුමක් හෙළුවා. පැහැදිලිවම, මේ කතාව එයා අනිත් ළමයි එක්කත් කරලා ඇති. "ඔයාගේ තාත්තා මැරිලා නැහැ, පර්සි."

"ඔයා කොහොමද එහෙම කියන්නේ? ඔයා එයාව දන්නවාද?"

"නැහැ, කොහෙත්ම නැහැ."

"එහෙනම් ඔයා කොහොමද කියන්නේ-"

"මොකද, මම ඔයාව දන්නවා. ඔයාත් අපෙන් කෙනෙක් නොවුණා නම් ඔයා මෙතැන ඉන්න විදිහක් නැහැ."

"ඔයා මං ගැන මුකුත්ම දන්නේ නැහැ."

"නෑ?" එයා ඇහිබැමක් එසෙව්වා. "මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා, ඔයා ඉස්කෝලෙකින් ඉස්කෝලෙකට මාරු වෙවී වරෙට යන්න ඇති. ඒවා ගොඩකින් ඔයාව එළවලා දාන්න ඇති."

"කොහොමද?"

"වචන අන්ධතාවය ඇති. පේන විදිහට ඒ.ඩී.එච්.ඩී.ත් ඇති."

මට දැනුණු අපහසුතාවය ගිලගන්න මම උත්සාහ කළා. "ඒවත් එක්ක මේකට තියෙන සම්බන්ධෙ මොකක්ද?"

"ඒ ඔක්කොම එකට අරන් බැලුවාම, ඒක සම්පූර්ණයෙන්ම වගේ සහතික ලකුණක්. ඔයා මොකක් හරි කියවනකොට අකුරු පිටුව වටේ පාවෙනවා, හරිද? එහෙම වෙන්නේ ඔයාගේ මනස පෞරාණික ග්‍රීක කියවන්න හැඩ ගැහිලා තියෙන නිසයි. එතකොට ඒ.ඩී.එච්.ඩී. - ඔයා ගොඩාක් කලබලකාරියි, ඔයාට පන්ති කාමරේ වාඩිවෙලා ඉන්න බැහැ. ඒ ඔයාගේ රණ බිමට හැඩ ගැහුණු ප්‍රතිරූපය නිසායි. ඇත්තම සටනකදී, ඔයාගේ ජීවිතය බේරන්නේ ඒක තමයි. එතකොට, අවධානය යොමු කරද්දී තියෙන ප්‍රශ්න; ඒ ඔයා ගොඩාක් දේවල් දකින නිසයි, පර්සි, දකිනවා මදි නිසා නෙවෙයි. සාමාන්‍ය මනුෂ්‍ය වර්ගයාට වඩා ඔයාගේ හැඟීම් දැනීම් දියුණුයි. ඇත්තටම, ගුරුවරුන්ට උවමනා ඔයාට බෙහෙත් කරවන්න. එයාලාගෙන් වැඩි දෙනා රාක්ෂයෝ. එයාලාගේ නියම ස්වරූපය ඔයාට දකින්න දෙන්න එයාලාට ඕනෑ නැහැ."

"ඔයා කතා කරන්නේ හරියට... ඔයාටත් ඒ ටිකම සිද්ධ වෙලා තියෙනවා වගේ?"

"මෙහෙ ඉන්න ළමයි ගොඩකට එහෙම වෙලා තියෙනවා. ඔයත් අපි වගේ නොවුණා නම්, මිනටෝර්ගෙන් නොමැරී බේරෙන්න ලැබෙන්නේ නැහැ. ඇම්බ්‍රෝසියාවලටයි (දෙවියන්ගේ ආහාරය) නෙක්ටාර්වලටයි (අමෘතය) නම් කොහෙත්ම ඔරොත්තු දෙන්නේ නැහැ."

"ඇම්බ්‍රෝසියා? නෙක්ටාර්?"

"ඔයාව සනීප කරන්න අපි ඔයාට කන්න, බොන්න දුන්නේ ඒවා තමයි. ඒවාගෙන් සාමාන්‍ය ළමයෙක් නම් මැරෙන්න වුණත් පුළුවන්. ඒක ඔයාගේ ලේ ගින්දරවලට හරවලා, ඇටකටු වැලි වගේ කුඩු කරලා ඔයාව මරලා දාන්න ඉඩ තිබුණා. ඇත්ත පිළිගන්න. ඔයා අර්ධ-ලෝහිතයෙක්."

අර්ධ-ලෝහිතයෙක්.

මගේ හිතේ පිරුණු ප්‍රශ්න ගොඩෙන්, කොයි එක මුලින්ම අහන්නද කියලා මට හිතා ගන්න බැරිවුණා.

එතකොටම ගොරෝසු හඬක් කෑගැසුවා."ආ... අලුත් ළමයා!"

මම හඬ ආ දෙසට හැරුණා. අපේ දෙසට කම්මැලි ගමනින් ඇවිද ආවේ රතු පාට, කැත කැබිනයේ සිටි තඩි ගැහැනු ළමයායි. එයා වගේම අඩම පෙනුමක් ඇති තවත් ලොකු කෙල්ලෝ තුන් දෙනෙක් එයාට පිටුපසින් ආවා. එයාලා හැමෝම හමුදා මෝස්තරයේ කබායවල් හැදගෙන සිටියා.

"ක්ලැරිස්," ඇනබෙත් සුසුමක් හෙළුවා. "ඔයා ගිහින් හෙල්ලයක් ඔප දානවා වගේ මොකක් හරි වැඩක් කරන්නැත්තේ ඇයි?"

"එහෙමයි, කුමරියනි," තඩි ගැහැනු ළමයා ඇද කළා. "එතකොට මට පුළුවන් නේ සිකුරාදා රෑට ඒකෙන්ම ඔහේව හිල් කරලා දාන්න."

"එර්රෙට් එස් කොරකාස්!" ඇනබෙත් කියද්දී, එයා අදහස් කළේ 'කපුටාම කාපිය!' කියලා මට කොහොමදෝ තේරුම් ගියා.

ඒ වුණත් එහි වචනවලින් කියවුනාට වඩා ලොකු ශාපයක් තිබුණා කියලා මට හිතුණා. "ඔයාට කිසිම අවස්ථාවක් නැහැ."

"අපි ඔහේලාව කුඩුපට්ටම් කරලා දානවා, " ක්ලැරිස් කිව්වත්, එයාගේ ඇස් දෙක ගැහෙන්න ගත්තා. සමහරවිට, තර්ජන කරන

විදිහටම ඒවා කරන්නත් පුළුවන් වෙයිද කියලා එයාට සැකයක් මතු වෙන්න ඇති. එයා මගේ දිහාවට හැරුණා. "කවුද මේ බටු ඇටේ?"

"පර්සි ජැක්සන්." ඇනබෙත් කිවුවා. "හඳුන ගන්න. මේ ඉන්නේ ක්ලැරිස්. ඒරීස්ගේ දුවෙක්."

මම ඇසිපිය ගැහුවා. "ඒ කියන්නේ... යුද්ධයට අධිපති දෙවියන්ගේ?"

ක්ලැරිස් විරිත්තුවා. "ඇයි, ඒක ඔහේට ප්‍රශ්නයක්ද?"

"නෑ," මම කිවුවේ මගේ මුඛරිකම ආපසු මතුකර ගනිමින්. "මෙච්චර ගඳ ඇයි කියලා ඒකෙන් හිතාගන්න පුළුවන්."

ක්ලැරිස් ගෙරෙව්වා. "අලුතින් එන අයට අපි කරන චාරිත්‍රයක් තියෙනවා, ප්‍රිසී."

"පර්සි."

"මොකක් හරි. එනවා යන්න. මම පෙන්වන්නම්."

"ක්ලැරිස්-" ඇනබෙත් කතා කරන්න උත්සාහ කළා.

"පැත්තකට වෙලා ඉන්නවා, පණ්ඩිත ආච්චි."

ඇනබෙත් දුක්බර බැල්මක් හෙළුවත් ඇත්තටම එයා පැත්තකට වුණා. කොහොමත් මට එයාගේ උදවු ඕනෑ වුණෙත් නැහැ. අලුත් ළමයා මම නේ. ඉතින්, මගේ ජනප්‍රියකම මම ම හදාගන්න ඕනෑ.

මිනටෝර් අග ඇනබෙත් අතට දුන් මම සටනට ලෑස්ති වුණා. ඒත්, මම හිතන්නත් කලින් ක්ලැරිස් මාව බෙල්ලෙන් අල්ලාගෙන යබොර-ගල් ගොඩනැගිල්ලක් දෙසට ඇදගෙන ගියා. ඒක තමයි නාන කාමරය.

මම අතින් පයින් ගසමින් දඟලුවා. ඒත් මේ කෙල්ලට තිබුණේ යකඩ වගේ අත් දෙකක්. එයා මාව ගැහැනු ළමයින්ගේ නාන කාමරයට ඇදගෙන ගියා. එහි එක් පැත්තක වැසිකිළි පෝලිමකුත් අනෙක් පැත්තේ නාන කුටි පෝලිමකුත් තිබුණා. සෑම පොදු නාන කාමරයකින්ම හැමූ ගඳ එතැනිනුත් හැමුවා. ඉතින්, මම සිතමින් සිටියේ - ක්ලැරිස් මගේ කෙස් ඉගිල්ලූ වේගයට, මට හිතන්න පුළුවන් තරමට හිතුවේ - මේ තැන ඇත්තටම අයිති දෙවිවරුන්ට නම්, මීට වඩා ඉස්තරම් නාන කාමර කට්ටල සපයා දෙන්න තිබුණා කියලයි.

ක්ලැරිස්ගේ යාළුවෝ ටික හිනාවුණා. ඒ අතරේ මම උත්සාහ කළේ මිනටෝර් එක්ක සටන් කළ වෙලාවේ මට තිබුණු ශක්තිය නැවත මතුකර ගන්නයි, ඒත් ඒ ශක්තිය මගේ අහලකටවත් ආවේ නැහැ.

"එයා හරියට 'ලොකු තුන් කට්ටුවේ' එකෙක් වගේ," ක්ලැරිස් මාව වැසිකිළියක් දෙසට තල්ලු කරමින් කිවුවා. "අන්න හරි, මට හිතෙන්නේ මිනටෝර්ට හිනා ගිහිල්ලම පණ යන්න ඇත්තේ. මේකාට තියෙන්නේ මහ මෝඩ පෙනුමක් නේ."

එයාගේ යාළුවෝ කෑකිරි පළන්න ගත්තා.

ඇනබෙත් මුල්ලකට වෙලා, එයාගේ ඇඟිලි අතරින් බලාගෙන සිටියා.

මාව දණහිස්වලින් නැමූ ක්ලැරිස්, මගේ ඔළුව වැසිකිළි පෝච්චිය දෙසට තල්ලු කරන්න ගත්තා. එයින් ආවේ මළ කෑ පයිප්පවල ගඳ සහ තව... වැසිකිළි ඇතුළට යන දේවල්වල ගඳයි. මම උපරිම වෙර යොදා ඔළුව කෙලින් තියා ගන්න උත්සාහ කළා. ඒ ජරා වතුර දෙස බලාගෙන මම අධිෂ්ඨාන කළේ, මම කීයටවත් ඒවා තුළට යන්නේ නම් නැහැ කියලයි. කොහොමටවත්ම නැහැ.

එතකොටම මොකක්දෝ දෙයක් සිද්ධ වුණා. මට දැනුණේ මගේ බඩ ඇතුළේ ගැටයක් ගැහෙනවා වගෙයි. ඒ අතරේ වතුර බට දෙදරන හඬත්, පයිප්ප වෙවුලන හඬත් මට ඇහුණා. ක්ලැරිස්ගේ ග්‍රහණය ලිහිල් වුණා. මගේ ඔළුවට උඩින් අඩ කවයක හැඩයට නැවෙමින්, වැසිකිළියේ වතුර එළියට විදින්න ගත්තා. ඊළඟට මට තේරුණේ, මට පිටුපසින් ක්ලැරිස් බෙරිහන් දෙද්දී, මම නාන කාමරයේ ටයිල් පොළොව මත හතරගාතෙන් වැටී ඉන්නා බවයි.

මම හැරී බලද්දිම වැසිකිළි වතුර නැවතත් එළියට විදින්න ගත්තා. ඒවා කෙලින්ම ගොස් ක්ලැරිස්ගේ මුහුණේ හැපුණු වේගයට එයාගේ පස්ස බිම ඇනුණා. ගිනි නිවන හමුදාවේ වතුර බටයකින් විදින වතුර කඳක් වගේ එයාගේ මුහුණටම වැටුණු ඒ වතුර ධාරාවේ බලයට ක්ලැරිස්ව නාන කුටියක් තුළටම තල්ලු වුණා.

අමාරුවෙන් හුස්ම අල්ලමින් දඟලූ ක්ලැරිස් දෙසට එයාගේ යාළුවෝ යන්න ගත්තා. අනෙක් වැසිකිළිත් පුපුරා ගියේ ඒ වෙලාවේදියි. තවත් වැසිකිළි වතුර ධාරා හයකින් එයාලාව නැවෙන්න ගත්තා. ඒ වෙලාවේදී වතුර මල් පෙළත් වැඩට බැස්සා. මේ වතුර පහරවල් සියල්ල

එකතුවෙලා කුණු ගොඩක් සෝදා දමනවා වගේ අර තඩි කෙල්ලෝ ටික නාන කාමරයෙන් එළියට විසිවනතුරුම වතුර විද්දා.

එයාලා නාන කාමරයෙන් එළියට යද්දිම වගේ, මගේ බඩ තුළ වූ ගැටයත් ලිහිල් වුණා. වතුර විදින්න පටන් ගත් ලෙසටම වගේ හදිසියේම නතර වුණා.

මුළු නාන කාමරයම වතුරෙන් යටවෙලා. ඇනබෙත්ටවත් එයින් බේරෙන්න අවස්ථාවක් ලැබී තිබුණේ නැහැ. හිසේ සිට දෙපතුලට යනතුරුම තෙතබරිත වෙලා. ඇයි නාන කාමරයෙන් එළියට තල්ලු වෙලා තිබුණේ නම් නැහැ. එයා කලින් සිටි තැනටම වෙලා මා දෙස බලාගෙන සිටියේ කම්පනය වෙලායි.

බිම බැලූ මට, මුළු නාන කාමරයෙන්ම නොතෙමුණු තැනකට දකින්න ලැබුණේ මම සිටගෙන සිටි තැන විතරයි. එතැන මගේ වටේට රවුමක ඉඩක් පමණක් නොතෙමී තිබුණා. එක වතුර බිඳුවකින් හෝ මගේ ඇඳුම් තෙමී තිබුණේ නැහැ. චුට්ටක්වත් නැහැ.

මම වෙවුලන දෙපයින් සිට ගත්තා.

"කොහොමද ඒක කළේ..." ඇනබෙත් ඇසුවා.

"මං දන්නේ නැහැ."

අපි දොර ළඟට ගියා. එළියේ මඩ ගොඩක හතර ගාතෙන් වැටී සිටි ක්ලැරිස් සහ එයාගේ යාළුවෝ තුන් දෙනා වටේට කඳවුරුකරුවෝ රැස්වෙමින් සිටියා. ක්ලැරිස්ගේ කොණ්ඩය එයාගේ මුහුණ මත සමතලා වෙලා. එයාගේ හමුදා කබාය තෙතබරිත වෙලා. කුණු කාණුවක් වගේ එයාව ගඳ ගැසුවා. එයා මට දුන් බැල්මේ තිබුණේ තනිකරම වෛරය විතරයි.

"තමුසේ ඉවරයි කියලා හිතා ගන්නවා, අලුත් එකෝ. සම්පූර්ණයෙන්ම ඉවරයි."

මට තිබුණේ එයාට යන්න දීලා පාඩුවේ ඉන්නයි, ඒත්, ඒ වෙනුවට මම කිවුවේ, "ඔයාට ආපහු ටොයිලට් වතුරෙන් කට හෝදගන්න ඕනෑ ද, ක්ලැරිස්? ඔය කට වහගත්තොත් හොඳයි."

එයාගේ යාළුවෝ එයාව අල්ලා ගත්තා. එයාලා ක්ලැරිස්ව කැබින් පහ දෙසට ඇදගෙන යද්දී, අනෙක් කඳවුරුකරුවෝ එයාගේ පයින් පහරවල් නොවැදෙන්න පාරෙන් ඉවතට පැන්නා.

ඇනබෙත් මගේ දිහා බලාගෙන සිටියා. එයා සිටියේ පිළිකුලෙන්ද, නැත්නම් එයාවත් තෙමුවාට මාත් එක්ක අමනාපයෙන්ද කියලා මට හිතාගන්න බැරි වුණා.

"මොකද?" මම ඇසුවා. "මොනවද ඔයා කල්පනා කරන්නේ?"

"මම කල්පනා කරන්නේ," එයා කිවුවා, "කොඩිය අල්ලන තරගෙට ඔයාව මගේ කණ්ඩායමට ගත්තොත් හොඳයි කියලා."

07

මගේ රෑ කෑම දුමක් වෙලා උඩ ගියා

නාන කාමරයේ සිදුවීම ගැන ආරංචිය වේගයෙන් පැතිරී ගියා. මම කොහෙට ගියත්, කඳවුරුකරුවෝ මාව පෙන්වමින් වැසිකිළි වතුර ගැන මොනවාහරි කෙඳිරුවා. එහෙම නැත්නම්, එයාලා තවමත් තෙත බේරෙමින් සිටි ඇනබෙත් දෙස ඇස් ලොකු කරගෙන බලන් සිටියා.

ඇනබෙත් තවත් තැන් කිහිපයක් මට පෙන්නුවා; කම්මල (ළමයි තම තමන්ගේ කඩු සාදාගත් තැන), කලා ශිල්ප කාමරය (එතැන සැටර්ලා කිප දෙනෙක් එළු-මිනිහෙක්ගේ යෝධ කිරි ගරුඬ ප්‍රතිමාවක් තෙළමින් සිටියා) සහ නගින්න පුහුණු වෙන බිත්තිය, එය සාදා තිබුණේ දරුණු ලෙස සෙලවෙන, ලොකු ගල් කුට්ටි පහළට අත අරින, ලෝදිය විදින, මුහුණෙන් මුහුණ බලා ගත් බිත්ති දෙකකිනුයි. වේගයෙන් නගින්නේ නැති අයව චප්ප කරන්න ඒ බිත්ති දෙක සැරින් සැරේ එකට හැප්පුණා.

අන්තිමේදී, අපි ආපසු ඔරු පදින විල ළඟට ආවා. එතැන සිට කැබින් කාමර දෙසට අඩි පාර වැටී තිබුණා.

"මට පුහුණුවීම කරන්න තියෙනවා," ඇනබෙත් නීරස ලෙසින් කිවුවා. "රෑ කෑම හත හමාරට. ඔයාගේ කැබින් එකේ කට්ටිය පස්සෙන් කෑම කාලාවට එන්න."

"ඇනබෙත්, නාන කාමරේ වුණ දේට මට කණගාටුයි."

"ඕනෑ එකක්."

"ඒක මගේ වැරැද්ද නෙවෙයි."

මාව විශ්වාස නොකරන බැල්මකින් එයා මගේ දිහා බැලුවා. ඒක ඇත්තටම මගේ වැරැද්ද කියලා මම තේරුම් ගත්තේ එතකොටයි. නාන කාමරේ කොටස්වලින් වතුර විදින්න සැලැස්වූයේ මමයි. ඒ කොහොමද කියන්න මම දන සිටියේ නැහැ. ඒත් වැසිකිළි මට ප්‍රතිචාර දක්වූවා. වතුර බටත් සමඟ මම එකඟතාවක් ඇතිකරගෙන තිබුණා.

"ඔයා ඔරකල් එක්ක කතා කරන්න ඕනෑ," ඇනබෙත් කිවුවා.

"ඒ කවුද?"

"කවුද නෙවෙයි, මොකක්ද? ඔරකල්. මම කයිරොන්ගෙන් අහන්නම්."

මම විල දෙස බලාගෙන කල්පනා කළේ එක සැරේකටවත් කවුරුහරි මට කෙලින් උත්තරයක් දෙනවා නම්, කියලයි.

විල් පතුලේ ඉඳන් කවුරුහරි මගේ දිහාව බලාගෙන ඉඳීවි කියලා මම නිකමටවත් හිතුවේ නැහැ. ඉතින්, අඩි විස්සක් විතර වතුර යට කකුල් එරමිණිය ගොතාගෙන ගැහැනු ළමයි දෙන්නෙක් ඉන්නවා දකිද්දි මගේ පපුව මොහොතකට නතර වුණා. නිල් පාට කලිසම් සහ දිලිසෙන කොළ පාට ටී-ෂර්ට් හැඳ සිටි ඒ දෙන්නාගේ දුඹුරු පාට කොණ්ඩා එයාලාගේ උරහිස් වටා නිදහසේ පාවෙද්දි, කින්න පැටවු ඒ අතරින් එහෙ-මෙහෙ පිහිනා ගියා. මාත් එක්ක හිනාවුණ එයාලා මට අත වැනුවේ ගොඩාක් කාලෙකින් දකපු යාළුවෙකුට අත වනනවා වගෙයි.

වෙන මොනවා කරන්නද කියලා හිතා ගන්න බැරිවුණ නිසා මමත් එයාලාට අත වැනුවා.

"එයාලාට උල්පන්දම් දෙන්න එපා," ඇනබෙත් අනතුරු ඇඟෙව්වා. "ජල දෙවඟනෝ කියන්නේ භයානක අඟර-දඟර කාරියෝ."

"ජල දෙවඟනෝ," මමත් ඒකම කිවුවේ මගේ හොඳ සිහිය සම්පූර්ණයෙන්ම වගේ අවුල් වෙලා වගේ දැනෙද්දියි. "හොඳටම ඇති. මට මේ දැන්ම ගෙදර යන්න ඕනෑ."

ඇනබෙත් රැවුවා. "ඔයාට තාම තේරුනේ නැද්ද, පර්සි? ඔයා ඉන්නේ ගෙදර තමයි. අපි වගේ ළමයින්ට මේ ලෝකේ තියෙන එකම ආරක්ෂිත තැන මෙතැන විතරයි."

"ඔයා කියන්නේ, මොළේ අවුල් වුණ ළමයින්ට?"

Scanned with CamScanner

"මම කියන්නේ මිනිස් නොවන ළමයින්ට. සම්පූර්ණයෙන්ම මිනිස් නොවන. බාගයක් මිනිස් ළමයින්ට."

"බාගයක් මිනිස්. එතකොට ඉතුරු බාගේ?"

"මං හිතන්නේ ඔයා දන්නවා."

එය පිළිගන්න උවමනා නොවුණත්, ඇත්තටම මම එය දැනගෙන සිටියා. මගේ ඇගේ අවයව පොපියනවා වගේ හැඟීමක් මට දැනුණා. සමහර වෙලාවලට මගේ අම්මා තාත්තා ගැන කතා කරද්දිත් මට ඒ විදිහේම හැඟීමක් දැනී තිබුණා.

"දෙවියෙක්," මම කිවුවා. "බාගයක් දෙවියෙක්."

ඇනබෙත් ඔළුව වැනුවා. "ඔයාගේ තාත්තා මැරිලා නැහැ, පර්සි. එයා ඔලිම්පියානුවන්ගෙන් එක්කෙනෙක්."

"ඒක නම්... පිස්සුවක්."

"එහෙමද? පරණ කතන්දරවල තියෙන විදිහට දෙවිවරු වැඩියෙන්ම කළ දේ මොකක්ද? මිනිස්සු එක්ක ආදර සම්බන්ධතා හදා ගනිමින්, ළමයි හද හදා වෙට යන එක තමයි එයාලා වැඩිපුරම කළේ. ගෙවිච අවුරුදු දෙතුන් දාහේදී එයාලා ඒ පුරුදු වෙනස් කර ගන්න ඇති කියලා ඔයා හිතනවාද?"

"ඒත් ඒවා මිථ්‍යාවම -" මම කියන්න ගියේ මිථ්‍යා කතා කියලයි. ඒත්, තව අවුරුදු දෙදාහකින් මාවත් මිථ්‍යාවක් විදිහට මිනිස්සු හඳුන්වාවි කියලා කයිරොන් කළ අනතුරු ඇඟවීම මට මතක් වුණා. "ඉතින්, මෙහෙ ඉන්න ළමයි ඔක්කෝම බාගෙට දෙවිවරු නම් -"

"අර්ධ දෙවිවරු," ඇනබෙත් කිවුවා. "ඒක තමයි නිල නම. එහෙම නැත්නම් අර්ධ-ලෝහිතයෝ."

"එතකොට ඔයාගේ තාත්තා කවුද?"

පැටිමේ වැට අල්ලාගෙන සිටි එයාගේ අත තද වුණා. එයාගේ ජීවිතයේ සංවේදී මාතෘකාවකට මම අනවසරයෙන් ඇතුළු වුණා වගේ හැඟීමක් මට දැනුණා.

"මගේ තාත්තා වෙස්ට්පොයින්ට්වල මහාචාර්ය කෙනෙක්," එයා කිවුවා. "මම ගොඩක් පොඩි කාලේ එයාව දැක්කාට පස්සේ ආයේ දැක්කේම නැහැ. එයා උගන්වන්නේ ඇමරිකානු ඉතිහාසය."

"එයා මනුස්සයෙක්?"

"මොකක්? ඔයා හිතුවේ මිනිස් වර්ගයාට ආකර්ෂණය වෙන්න පුළුවන් පිරිමි දෙවි කෙනෙක්ට විතරයි කියලද? කොච්චර පුරුෂවාදී ද?"

"එහෙනම් කියන්නකෝ ඔයාගේ අම්මා කවුද?"

"කැබින් අංක හය."

"ඒ කියන්නේ?"

ඇනබෙත් කෙලින් වුණා. "ඇතීනා. නුවණට සහ යුධෝපායන්ට අධිපති දෙවඟන."

හොඳයි, මම හිතුවා. මොකද නැත්තේ?

"එතකොට මගේ තාත්තා?"

"තාම තීරණය කරලා නැහැ," ඇනබෙත් කිවුවා, "මම කලිනුත් කිවුවා වගේ, කවුරුවත් දන්නේ නැහැ."

"මගේ අම්මා ඇරෙන්න. එයා දැනගෙන හිටියා."

"සමහරවිට නැතුව ඇති, පර්සි. දෙවිගොල්ලෝ හැම වෙලාවෙම එයාලාගේ ඇත්ත ස්වරූපය හෙළි කරන්නේ නැහැ."

"මගේ තාත්තා හෙළි කරන්න ඇති. එයා අම්මාට ආදරේ කළා."

ඇනබෙත් විපරම්කාරීව මගේ දිහා බැලුවා. මගේ හිත කඩන්න එයාට උවමනා වුණේ නැහැ. "සමහරවිට ඔයා හරි ඇති. සමහරවිට එයා සංඥවක් එවාවි. ඒක තමයි හරියටම දැනගන්න තියෙන එකම ක්‍රමය; ඔයාගේ තාත්තා ඔයාව පුතා විදිහට පිළිගන්නවා කියලා ඔයාට සලකුණක් එවන්න ඕනෑ. සමහර වෙලාවට එහෙම වෙනවා."

"ඔයා අදහස් කළේ සමහර වෙලාවට එහෙම වෙන්නේ නැහැ කියලද?"

ඇනබෙත් වැට දිගේ එයාගේ අත්ල එහෙ-මෙහෙ දිවෙව්වා. "දෙවිවරුන්ට වැඩ වැඩියි නේ. එයාලාට ළමයි ගොඩාක් ඉන්නවා. ඉතින් එයාලා හැම වෙලාවෙම... හොඳයි, සමහර වෙලාවට එයාලා අපිව ගණන් ගන්නේ නැහැ, පර්සි. එයාලා අපිව නොසලකා හරිනවා."

හර්මීස් කැබින් එකේ සිටි සමහර ළමයි ගැන මට සිහිවුණා. ගැටවර වයසේ සිටි එයාලා මූහුණු බුම්මාගෙන, දුකින් සිටියේ කවදාවත් නොඑන ඇමතුමක් වෙනුවෙන් බලාගෙන ඉන්නවා වගෙයි. යැන්සි එකේදිත් ඒ වගේ ළමයි කීප දෙනෙක්ව මම දැන සිටියා. එයාලාගේ

පෝසත් දෙමව්පියන්ට එයාලා ගැන බලන්න වෙලාවක් නැති නිසා එයාලාව නේවාසික ඉස්කෝලෙක රඳවා තිබුණා. ඒත් දෙවිවරු ඊට වඩා හොඳට වැඩ කරන්න ඕනෑ නේ.

"එතකොට, මාව මෙහෙ හිරවෙලා," මම කිවුවා. "එහෙම නේද? මගේ ඉතුරු ජීවිත කාලෙටම?"

"ඒක වෙනස් වෙන්න පුළුවන්," ඇනබෙත් කිවුවා. "සමහර කඳවුරුකාරයෝ මෙහෙ ඉන්නේ ගිම්හාන කාලෙට විතරයි. ඔයා ඇෆ්‍රොඩයිට්ගේ හරි ඩිමීටර්ගේ හරි ළමයෙක් නම්, ඔයා එච්චරම බලවත් කෙනෙක් නොවෙන්න පුළුවන්. එහෙම වුණොත් රාක්ෂයෝ ඔයාව නොසලකා හරින්න ඉඩ තියෙනවා. එහෙම වෙලාවට ඔයාට පුළුවන් ගිම්හාන පුහුණුව මාස කීපයක් අරගෙන අවුරුද්දේ ඉතුරු මාස ටික සාමාන්‍ය ලෝකේ ජීවත් වෙන්න. ඒත්, අපෙන් සමහර අයට මෙහෙන් පිටවෙන එක ගොඩක් අනතුරුදායක වැඩක්. අපි මුළු අවුරුද්දම ඉන්න අය. සාමාන්‍ය ලෝකෙදි, අපි රාක්ෂයින්ව අපේ දිහාවට ආකර්ෂණය කර ගන්නවා. එයාලාට අපිව දැනිලා, අපිට අභියෝග කරන්න එනවා. හුඟක් වෙලාවට, අපි කරදරයක් ඇති කරන්න පුළුවන් වයසකට එනකම් - ඒ කියන්නේ අවුරුදු දහයක්, එකොළහක් විතර වගේ වෙනකම් රාක්ෂයෝ අපිට කරදර කරන්නේ නැහැ. ඒත් ඊට පස්සේ, ගොඩක් උප දේවතාවෝ කොහොම හරි මෙහෙට එනවා. එහෙම නැත්නම් මැරුම් කනවා. තමන්ගේ ජීවිතේ කොහොම හරි බේරාගෙන, පස්සේ කාලෙකදි ගොඩාක් ප්‍රසිද්ධ වුණ කීප දෙනෙකුත් සාමාන්‍ය ලෝකේ ඉන්නවා. මම එයාලාගේ නම් කිව්වොත් ඔයාට එයාලාව හඳුන ගන්න පුළුවන් වෙයි. එයාලාගෙන් සමහරු දන්නෙවත් නැහැ එයාලා උප දෙවිවරු කියලා. හැබැයි, එහෙම ඉන්නේ හරිම ටික දෙනයි."

"එතකොට රාක්ෂයින්ට මේක ඇතුළට එන්න බැරිද?"

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "මොකක් හරි උවමනාවකට එයාලාව කැලේට ගෙනැත් දාලා හරි, ඇතුළේ ඉන්න කෙනෙක්ගෙන් විශේෂ කැඳවීමක් ලැබිලා හරි නෙවෙයි නම් එයාලාට එන්න බැහැ."

"රාක්ෂයෙක්ට කැඳවීමක් කරන්න කාටවත් ඕනෑ වෙන්නේ ඇයි?"

"සටන් පුහුණුවීම් කරන්න. අතීත් අයට විහිළුවක් කරන්න."

"විහිළුවක් කරන්න?"

"වැදගත්ම කාරණේ තමයි, රාක්ෂයන්ටවත්, සාමාන්‍ය මිනිස්සුන්ටවත් ඇතුළට එන්න බැරි වෙන්න ඉඩමේ සීමා අහුරලයි තියෙන්නේ. පිට ඉඳන් බලන සාමාන්‍ය මනුස්සයෙක්ට මෙතැන ස්ට්‍රෝබෙරි ගොවිපොළක් තියෙන දෙණියක් ඇරෙන්න වෙන අසාමාන්‍ය දෙයක් පේන්නේ නැහැ."

"ඉතින්... ඔයත් අවුරුද්ද පුරාම මෙහෙ ඉන්න කෙනෙක්ද?"

ඇනබෙත් ඔළුව වැනුවා. එයා ටී-ෂර්ට් කොලරය යටින් පාට පහක පබළු පහක් ඇමුණු මාලයක් එළියට ගත්තා. ඒකත් ලූක්ගේ කරේ තිබූ මාලය වගේමයි. වෙනසකට තිබුණේ එයාගේ මාලයට ලොකු රන් මුදුවක් අමුණා තිබීමයි. එය මොකක් හෝ විශ්වවිද්‍යාලයක සාමාජික මුදුවක් වගෙයි පෙනුණේ.

"මට වයස අවුරුදු හතේ ඉඳලා මම මෙහෙ ඉන්නේ," එයා කිවුවා. "හැම අගෝස්තුවකම තියෙන ගිම්හාන සැසියේදී තවත් අවුරුද්දක් නොමැරී ජීවත් වුණාට ඔයාට පබළුවක් ලැබෙනවා. මෙහෙ ඉන්න ගොඩක් උපදේශකයින්ටත් වඩා වැඩි කාලයක් මම මෙහෙ ඉඳලා තියෙනවා, ඒ අය ඔක්කෝම වගේ දැන් විශ්වවිද්‍යාලවල."

"ඔයා එච්චර පොඩි වයසෙදි මෙහාට ආවේ ඇයි?"

එයා මාලයේ වූ මුදුව ඇඹරුවා. "ඒකෙන් ඔයාට වැඩක් නැනේ."

"ඔහ්," අපි දෙන්නා අතර වූ අපහසුකාරී නිහඬබව මැද මම විනාඩියක් විතර සිටගෙන සිටියා. "එතකොට... මට ඕනෑ නම් මේ දැන් වුණත් මෙතැනින් එළියට යන්න පුළුවන්?"

"ඒක පණ නහගන්නවා වගේ වැඩක් වෙයි, ඒත් ඔයාට යන්න පුළුවන් මිස්ටර් ඩීගෙයි කයිරොන්ගෙයි අවසර ඇතුව. කොහොම වුණත් එයාලා මේ ගිම්හාන සැසිය ඉවර වෙනකම් ඒකට අවසර දෙන්නේ නැහැ. එහෙම නැත්නම්..."

"එහෙම නැත්නම්?"

"ඔයාට ගවේෂණයකට යන්න අවසර ලැබෙන්න ඕනෑ. ඒත් එහෙම දෙයක් වෙන්නේ හරිම කලාතුරකින්. එහෙම වුණ අන්තිම වතාවේ... " එයාගේ හඬ ඇනහිටියා. ඒ අන්තිම වතාව එතරම් හොඳින් අවසන් වෙලා නැති බව මට එයාගේ කටහඬින්ම තේරුම් ගන්න පුළුවන් වුණා.

Scanned with CamScanner

"අසනීප කාමරේ ඉන්නකොට," මම කිව්වා. "ඔයා මට අර ලමුනු කෑම කවද්දී -"

"ඇම්බ්‍රෝසියා."

"ඔව්. ඔයා මගෙන් උත්තරායනය ගැන මොකක්දෝ ඇහුවා."

ඇනබෙත්ගේ උරහිස් දෙක කෙලින් වුණා. "ඒ කියන්නේ ඔයා මොනවා හරි දන්නවා."

"නැහැ. මම කලින් ඉස්කෝලේ ඉන්නකොට ග්‍රෝවර් සයිරොන් එක්ක ඒ ගැන කතා වෙනවා මට ඇහුණා. ග්‍රෝවර් උත්තරායනය ගැන සිහන් කළා. අපිට වැඩි කාලයක් නැති කතාවක් එයා කිව්වා. මොකක්ද ඒකේ තේරුම?"

එයා අත් මිට මොළවාගත්තා. "මම ඒ ගැන දනගෙන හිටියා නම් හොඳයි. සයිරොන් යි සැටර්ලායි ඒක දන්නවා. ඒත් ඒගොල්ලෝ මට කියන්නේ නැහැ. ඔලිම්පස්වල මොකක් හරි අවුලක් වෙලා තියෙනවා. මොකක් හරි ලොකු දෙයක්. අන්තිම වතාවේ මම එහෙට යනකොට නම් එහෙ හැම දෙයක්ම සාමාන්‍ය විදිහටයි තිබුණේ."

"ඔයා ඔලිම්පස්වලට ගිහින් තියෙනවා?"

"අපෙන් සමහර අවුරුද්ද පුරාම ඉන්න අය - ලූක්, ක්ලැරිස්, මම, තව දෙතුන් දෙනෙකුයි - අපි ටික දක්ෂිණායනයේදී ක්ෂේත්‍ර චාරිකාවක් ගියා. ඒ කාලේ තමයි දෙවිවරුන්ගේ වාර්ෂික මහා මන්ත්‍රණ සභාව තිබුණේ."

"ඒත්... කොහොමද ඔයාලා එහෙට ගියේ?"

"ලෝන්ග් අයිලන්ඩ් කෝච්චියෙන්. වෙන කොහොමද? පෙන් නැවතුම්පොළෙන් බැහැලා, එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට යනවා. එතැනින් විශේෂ සෝපානෙක නැගලා හයසිය වෙනි තට්ටුවට යනවා." එයා මගේ දිහා බලා හිටියේ මම කලින් ඉඳලම මේ දේවල් දන්නවා කියන විශ්වාසයෙන් වගෙයි. "ඔයා නිව්යෝර්ක්වල කෙනෙක් නේ, නේද?"

"ඔව්, ඇත්තටම." මම දන්නා තරමින් නම් එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට තිබුණේ තට්ටු එකසිය දෙකක් විතරයි, ඒත් ඒ ගැන නොකියා ඉන්න එක හොඳයි කියලා මම හිතුවා.

"අපි එහෙ ගිහින් ආව ගමන්ම වගේ," ඇනබෙත් කියාගෙන ගියා. "කාලගුණය අමුතු වෙන්න ගත්තේ හරියට දෙවිවරු රණ්ඩු වෙනවා වගෙයි. ඊට පස්සේ සැටර්ලා ඔය ගැන කතා වෙනවා මට දෙතුන් සැරයක් ඇහුණා. මට ඒවාගෙන් තේරුම් ගන්න පුළුවන් වුණේ මොකක් හරි වැදගත් දෙයක් හොරකම් කරලා කියන එකයි. ඒක උත්තරායනයට කලින් ආපහු ලැබුණේ නැත්නම් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඔයා මෙහෙට ආවාම, මම බලාපොරොත්තු වුණේ... මං කියන්නේ - ඒරිස් එක්ක ඇර වෙන ඕනෑම කෙනෙක් එක්ක ඇතීනාට එකතු වෙන්න පුළුවන්. ඒ ඇරෙන්න, පොසෙයිඩන් එක්කත් එයාගේ තරගයක් තියෙනවා තමයි. ඒත්, ඒවා ඔක්කොම පැත්තකින් තියලා අපිට එකට වැඩ කරන්න පුළුවන් වෙයි කියලා මම හිතුවා. ඔයා මොනවා හරි දන්නවා ඇති කියලයි මම හිතාගෙන හිටියේ."

මම ඔළුව හෙල්ලුවා. එයාට උදවු කරන්න තිබුණා නම්, කියලා මට හිතුණා. ඒත් මම සිටියේ සැහෙන මහන්සියකින් වගේම බඩගින්නකින්. තවත් ප්‍රශ්න අහන්න බැරි තරමට මගේ ඔළුව පිරිලා වගේ මට දැනුණා.

"මම ගවේෂණයකට අවසර ගන්නම ඕනෑ," ඇනබෙත්, තනිවම මිමිණුවා. "මම දැන් පොඩි නැහැනේ. එයාලා ප්‍රශ්නේ මොකක්ද කියලා මටත් කියනවා නම්..."

ළඟ පාතකින් බා'බකියු සුවඳක් හමන්න ගත්තා. මගේ බඩේ ගෙරවිල්ල ඇනබෙත්ටත් ඇහෙන්න ඇති. මාව පසුව මුණ ගැහෙන්නම් කියූ එයා මට යන්න කිව්වා. එයා ජැටියේ වැට දිගේ යුද සැලැස්මක් අඳිනවා වගේ ඇඟිල්ලෙන් අඳින අතරේ මම එතැනින් පිට වුණා.

***

කැබින් එකොළහේ සැම දෙනාම කතා කරමින්, වටේ ඇවිදිමින්, රෑ කෑම වෙලාව එනතුරු බලා සිටියා. කඳවුරුකරුවෝ බොහෝමයකගේ මුහුණුවර එක වගේ බව මට පළවෙනි වතාවට තේරුණා: තියුණු නහයවල්, ඉස්සුණු ඇහිබැම්, දඟකාර සිනාව. කරදරකාරයෝ ලෙසට පාසල් ගුරුවරු නම් කරන්නේ ඒ වගේ ළමයින්වයි. මම කැබිනය තුළට යද්දී කිසිවෙකුගේ අවධානය මට යොමු නොවුණේ හොඳ වෙලාවට. ඇතුළට ගිය මම, මට වෙන්කළ බිම් කොටස මතට මිනටෝර් අඟ අත හැරියා.

උපදේශක - ලූක් එතැනට ආවා. එයාටත් හර්මීස් පවුලේ පෙනුම හොඳින්ම පිහිටා තිබුණා. එයාගේ දකුණු කම්මුලේ වූ කැළැල එකට බාධාවක් වුණත්, ඒ හිනාවේ නම් අඩුවක් වෙලා තිබුණේ නැහැ.

"ඔයාට නිදන මල්ලක් හොයා ගත්තා," එයා කිව්වා. "ආ... මෙන්න. තව, ඔයාට ඕනෑ කරන අඩුම-කුඩුම ටිකකුත් මම කඳවුරු ගබඩාවෙන් ඉස්සුවා."

හොරකම් කළ කතාව එයා විහිළුවට කිව්වද කියලා මට හිතා ගන්න බැරිවුණා.

"ස්තූතියි," මම කිව්වා.

"අවුලක් නෑ," ලූක් මට එහා පැත්තේ බිත්තියට හේත්තු වී ඉඳ ගත්තා. "පළවෙනි දවස අමාරු වුණාද?"

"මාව මෙහාට අයිති නෑ," මම කිව්වා. "අඩු තරමේ, මම දෙවියෝ ගැන විශ්වාස කරන්නේවත් නැහැ."

"ඔව්," එයා කිව්වා. "එහෙම තමයි අපි හැමෝම පටන් ගත්තේ. එක පාරක් හරි ඔයා විශ්වාස කරන්න පටන් ගත්තාම? ඊට පස්සේ වුණත් එච්චර ලේසි වෙන්නේ නැහැ."

එයාගේ හඬේ වූ කටුක ගතිය මාව පුදුමයට පත්කළා. මොකද, ලූක්ව තිබුණේ හරිම සැහැල්ලුවෙන් ඉන්න, කලබල නැති පෙනුමක්නේ. එයාට ඕනෑම දෙයක් හසුරුවාගන්න හැකියාව තියෙන බවයි පෙනුණේ.

"එතකොට, ඔයාගේ තාත්තා හර්මීස්?" මම ඇහුවා.

එයා පිටුපස සාක්කුවෙන් දුනු පිහියක් ඇදලා ගත්තා. එයා කපන්නේ ඒකෙන් මව අනින්නද කියලා එක තත්පරයකට වගේ මට හිතුණා. ඒත් එයා කළේ එයින් එයාගේ සෙරෙප්පු අඩියේ වූ මඩ සීරීමයි. "ඔව්. හර්මීස්."

"අර කකුල් දෙකේ තටු තියෙන පණිවුඩකාරයා."

"එයා තමයි. පණිවුඩකාරයෝ, වෙද්දු, වෙළෙන්දෝ, සංචාරකයෝ, හොරු. පාරවල් පාවිච්චි කරන ඕනෑම කෙනෙක්. අන්න ඒ නිසයි ඔයා මෙහෙ ඉඳගෙන, කැබින් එකොළහේ ආගන්තුක සත්කාර විඳින්නේ. තමන් අනුග්‍රහය දක්වන්නේ කාටද කියලා හර්මීස් වැඩිය හිතන්නේ නැහැ."

ලූක් එහෙම කිව්වේ මම වැදගැම්මකට නැති කෙනෙක් ලෙසට හිතාගෙන නෙවෙයි කියලා මම තේරුම් ගත්තා. ඊට වඩා හිතන්න දේවල් ගොඩාක් එයාට තිබුණා.

"ඔයාට කවදාහරි ඔයාගේ තාත්තාව මුණ ගැහිලා තියෙනවද?" මම ඇහුවා.

"එක සැරයක්."

මම බලාගෙන සිටියේ එයා ඒ ගැන කියන්න කැමති නම් කියාවි හිතලයි. පෙනුණු හැටියට නම්, එයා ඒකට කැමති වුණේ නෑ වගේ. ඒ කතාවයි, එයාගේ කම්මුලේ තුවාල කැළැලයි අතරේ මොකක් හෝ සම්බන්ධයක් ඇතිද හිතලා මම කල්පනා කළා.

මගේ දෙස බැලූ ලූක් යන්තමින් හිනාවුණා. "ඒ ගැන හිතන්න එපා, පර්සි. මෙහෙ කඳවුරුකාරයෝ ඉන්නවා. එයාලා හැමෝම වගේ හොඳ අය. කොහොම වුණත්, අපි ඔක්කොම එක පවුලක්, හරිද? අපි එකිනෙකාව බලා ගන්නවා."

අතරමං වෙලා වගේ මට දැනුණු හැඟීම ගැන ලූක්ට තේරුම් ගන්න පුළුවන් වුණා වගෙයි. ඉතින් මම ඒ ගැන ගොඩාක් සතුටු වුණා. මොකද, සාමාන්‍යයෙන් එයා වගේ වැඩිමහලු කොල්ලෙක් -එයා උපදේශකයෙක් වුණත් - මං වගේ මධ්‍යම ඉස්කෝලයකින් ආව නිකමෙක්ගෙන් ඈත් වෙලා ඉන්නයි බලන්නේ. ඒත්, ලූක් මාව එයාගේ කැබින් එකට පිළිගත්තා. එයා මට උවමනා කරන බඩු ටිකකුත් හොරකම් කරගෙන ඇවිල්ලා. අද දවසේදී මං වෙනුවෙන් කෙනෙක් කළ හොඳම දේ එයයි.

මුළු හවස් වරුව පුරාවටම මගේ හිතට වධ දුන්, මගේ අන්තිම, ලොකුම ප්‍රශ්නයත් එයාගෙන් අහන්න මම තීරණය කළා. "ඒරිස් කට්ටියගේ ක්ලැරිස් මට විහිළු කළා මම ලොකු තුන් කට්ටුවේ එකෙක් කියලා. ඊට පස්සේ ඇනබෙත්... 'ඒ කෙනා' මම වෙන්න පුළුවන් කියලා දෙසැරයක්ම කිව්වා. එයා කිව්වා මම ඔරැකල්ට කතා කරන්න ඕනෑ කියලා. මේ ඔක්කොම මොනවා ගැනද?"

ලූක්, එයාගේ පිහිය නැමුවා. "මට අනාවැකි පෙනෙන්න බැහැ."

"ඇයි ඒ?"

Scanned with CamScanner

එයාගේ මුහුණේ තුවාල කැළැල අවට ගැහෙන්න ගත්තා. "අපි හියමු.. මම අතින් අයටත් එක්කම ඇති වෙන්න බාල්දියක් පෙරලා ගත්තා කියලා. පහුගිය අවුරුදු දෙකටම - ඒ කියන්නේ මම හෙස්පෙරිඩීස්ගේ උයනට ගිය ගමන අවුල් වුණාට පස්සෙම, තවත් ගවේෂණවලට යන්න කයිරොන් අවසර දීලා නැහැ. එළියේ ලෝකය දකින්න ආසාවෙන් ඇනබෙත් මැරෙන්න හදනවා. එයා කයිරොන්ට කොච්චර කරදර කළාද කියනවා නම්, අන්තිමේදී කයිරොන් කිවුවා එයා දනටමත් ඇනබෙත්ගේ ඉරණම ගැන දන්නවා කියලා. එයාට ඔරකල් අනාවැකියක් කියලා තිබුණා. ඒක සම්පූර්ණයෙන්ම ඇනබෙත්ට හෙළි කළේ නැති වුණාට, එයා කිවුවා ඇනබෙත්ට තවම ගවේෂණයකට යන්න නියම් වෙලා නැහැ කියලා. විශේෂ කෙනෙක් මේ කඳවුරට එනකම් ඇනබෙත්ට ඉවසන්න වෙනවා කියලා එයා කිවුවා."

" විශේෂ කෙනෙක් ?"

"ඒ ගැන වද වෙන්න එපා, ළමයෝ," ලූක් කිවුවා. "මෙහෙට අලුතින් කවුරු හරි කෙනෙක් එන හැම වෙලාවකම ඇනබෙත් හිතන්නේ, එයා තමයි පෙර නිමිත්ත, කියලා. දැන්, එන්න යමු. රෑ කෑම වෙලාව හරි."

එයා ඒක කියද්දිම, ඈතින් නලාවක් පිඹින හඬක් ඇහුණා. මීට කලින් කවදාවත් අසා නැති වුණත්, එය හක් ගෙඩියක හඬ බව මම කොහොමදෝ හඳුනා ගත්තා.

"එකොළහ... පෙළ ගැසෙන්!" ලූක් කෑගැසුවා.

කැබිනයේ සිටි අපි ඔක්කෝම - ඒ කියන්නේ විසි දෙනෙක් විතර පොදු මිදුලට එකතු වුණා. ජ්‍යෙෂ්ඨත්වයේ අනු පිළිවෙළට අපි පෝලිමක් සැදුණා. එතකොට පෝලිමේ අන්තිමයා මම බව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැනේ. හිස්ව තිබූ මුල් කැබින් තුනෙන් හැර, අනෙක් කැබින්වලිනුත් කඳවුරුකරුවෝ එළියට ආවා. කැබින් අංක අටටත් කඳවුරුකරුවෝ කවුරුවත් සිටියේ නැහැ. කැබින් අංක අට දහවලේදී සාමාන්‍ය ලෙසට පෙනුනත්, ඉර බැස ගියාට පසු රිදී පාටින් දිලිසෙන්න පටන් ගෙන තිබුණා.

කන්ද මුදුනේ වූ කෑම ශාලා මණ්ඩපයට අපි පේළියට ගියා. සැටර්ලා දෙණිය ළඟදී අපිව එකතු වුණා. ඔරු පදින විලෙන් උඩට ජල දෙවඟනෝ මතු වුණා. තවත් ගැහැනු ළමයි කීප දෙනෙක් ගස් ඇතුළෙන් එළියට ආවා - ගස් ඇතුළෙන් එළියට ආවා කියලා මම

කිවුවේ එයාලා ඇත්තටම ගස් කඳන් ඇතුළෙන් එළියට ආ නිසයි. අවුරුදු නමයක හෝ දහයක විතර ගැහැනු ළමයෙක් මේපල් ගසකින් එළියට දිය වී ඇවිත් කන්ද උඩට පැන පැන එනවා මං බලාගෙන හිටියා.

මුළු පිරිසම ගත්තොත්, කඳවුරුකරුවෝ සිය දෙනෙක් විතරත්, සැටර්ලා දුසිම් කිහිපයකුත් වගේම ජල දෙවඟනෝ සහ වන දෙවඟනෝ දුසිමක් විතරත් එතැන ඉන්න ඇති.

මණ්ඩපයේ කුලුනු වටේටම පන්දම් ඇවිලෙමින් තිබුණා. ප්‍රධාන ගිනිමැලය දල්වා තිබුණේ නාන බේසමක් තරම් ලොකු, ලෝකඩ ගිනි අඟුරු භාජනයකයි. සෑම කැබිනයකටම වෙන වෙනම මේසය බැගින් වෙන්කර තිබුණා. ඒ මේස වැසී තිබුණේ දම් පාට වාටි සහිත සුදු පාට මේස රෙදිවලිනුයි. මේස හතරක් හිස්ව තිබුණත්, කැබින් එකොළහේ මේසය නම් ළමයින්ගෙන් පිරිලා, තදබද වෙලායි තිබුණේ. බංකුවක කෙළවරේ හිර වී වාඩි වෙන්න මටත් ඉඩක් ලැබුණත්, මගේ පස්සෙන් බාගයක්ම තිබුණේ එයින් එළියේයි.

දොළොස් වෙනි මේසයේ මිස්ටර් ඩී සමග ග්‍රෝවර් වාඩි වී ඉන්නවා මම දැක්කා. ඒ මේසයේ තවත් සැටර්ලා කිහිප දෙනෙකුත්, මිස්ටර් ඩීගෙම පෙනුම තිබුණු මහත කොල්ලෝ දෙන්නෙකුත් සිටියා. කයිරොන් හිටියේ පැත්තකින් හිටගෙනයි. පෙනුණු විදිහට නම් මේ වගේ මේසයක් තරාශ්වයෙකුට පොඩි වැඩියි වගෙයි.

අංක හය මේසයේ ඇනබෙත්ගේ වගේම පැණි පාට කොණ්ඩා සහ අළු පාට ඇසුත්, බරපතල පෙනුමකුත් ඇති, මලල ක්‍රීඩකයින් වගේ ළමයි රංචුවක් මැද ඇනබෙත් වාඩි වී සිටියා.

මට පිටුපසින් තිබූ ඒරීස්ගේ මේසයේ ක්ලැරිස් සිටියා. පෙනුණ විදිහට නම්, වතුර විදලා බිම දැමූ එක ගැන එයා අමතක කරලා වගෙයි. මට එහෙම හිතුණේ එයා යාළුවෝ එක්ක මහ සද්දෙට හිනා වෙමින්, යාළුවෝ දෙසටම රාමතෙල් පිට කරනවා දැක්කාමයි.

අන්තිමේදී, කයිරොන් මණ්ඩපයේ කිරි ගරුඬ පොළොවට කුරයෙන් තට්ටු කළාම, සෑම දෙනාම නිශ්ශබ්ද වුණා. එයා වීදුරුවක් උඩට එසෙව්වා. "දෙවිවරු වෙනුවෙන්!"

සෑම දෙනාම, තම-තමන්ගේ වීදුරු එසෙව්වා. "දෙවිවරු වෙනුවෙන්!"

Scanned with CamScanner

කෑම බන්දේසි අරන් එන දෙවගනෝ ඉදිරියට ආවා; මිදි, ඇපල්, ස්ට්‍රෝබෙරි, චීස්, උණු උණු පාන් ඒ වගේම ඔව්, බාබකියු! මගේ වීදුරුව හිස්ව තිබුණා, ඒත්. "ඔයාට ඕනෑ මොනවද කියලා ඒකට කියන්න. හැබැයි මත් නොවෙන දේවල් විතරයි." ලූක් කිවුවා.

"චෙරි කෝක්." මම කිවුවා.

දිලිසෙන කැරමල් පාට දියරයකින් මගේ වීදුරුව පිරුණා.

එතකොටම මට තවත් අදහසක් ආවා. "නිල් පාට චෙරි කෝක්."

වීදුරුවේ තිබුණු සෝඩා එක කෝබෝල්ට් නිල් පාටට හැරුණා.

මම පරිස්සමින් උගුරක් බීලා බැලුවා. නියමයි!

මම අම්මා වෙනුවෙන් සවිදිය පුරන්න සිතුවා.

එයා මිහිල්ලා නැහැ. මං මටම කියා ගත්තා. කොහොමහරි, එයා යන්නම මිහිල්ලා නැහැ. එයා පාතාල ලෝකයේ ඇති. එහෙම තැනක් ඇත්තටම තියෙනවා නම්, කවදා හරි දවසක....

"මෙන්න ඔයාට, පර්සි." දුම් ගැසූ මස් බන්දේසියක් මගේ අතට දෙමින් ලූක් කිවුවා.

මම මගේ පිගාන පුරවාගෙන, ලොකු කටක් කන්න ලෑස්ති වුණා. ඒත්, ඒ වෙලාවේ අනිත් කට්ටිය ඔක්කොම හිටපු තැන් වලින් නැගිටලා, තමන්ගේ පිගානුත් අරගෙන, ප්‍රධාන ගිනිමැලය පැත්තට යනවා මම දැක්කා. මම හිතුවේ එයාලා අතුරුපස මොනවා හරි බෙදාගන්න යනවා වෙන්න ඇති කියලයි.

"එන්න," ලූක් මට කතා කළා.

හැම දෙනාම, තමන්ගේ කෑමෙන් කොටසක් ගින්නට දාන විදිහ ටිකක් ළං වෙද්දී මට බලාගන්න පුළුවන් වුණා; හොඳින්ම ඉදුණු ස්ට්‍රෝබෙරි, හොඳම මස් කෑල්ල, උණුවෙන් තිබුණු බටර් වැඩිම රෝල් එක.

"දෙවිවරුන්ට දෙන ගිනි පූජා. එයාලා ඒ සුවඳට කැමතියි."

"ඔයා විහිළු කරනවා."

මේක සැහැල්ලුවෙන් ගන්න එපා, කියලා අනතුරු අගවන බැල්මෙන් ලූක් මගේ දෙස බැලුවා. ඒත්, හැම බලයක්ම තියෙන අමරණීය පිරිසක් කෑම පිච්චෙන සුවඳට කැමති වෙන්නේ කොහොමද, කියලා පුදුම නොවී ඉන්න මට බැරි වුණා.

ගින්න ළඟට ගිය ලූක් ඔළුව නමා ආචාර කරලා, රතු පාට ලොකු මිදි පොකුරක් ගින්නට විසි කළා. "හර්මීස්,"

ඊළඟට මගේ වාරේ.

මොන දෙවියන්ගේ නම කියන්නද කියලා මම දන්නවා නම්, මට හිතුණා.

අන්තිමේදී, මම නිහඬවම කන්නලව්වක් කළා; ඔයා කවුරු වුණත් මට කියන්න, කරුණාකරලා.

මම ලොකු මස් කෑල්ලක් ගින්නට දැමුවා.

එය පිලිස්සී දුම් රොටු පිට වෙද්දී මට නහය වසා ගන්න වුණේ නැහැ.

එයින් ආවේ කෑම පිලිස්සෙද්දී එන ගඳ නෙවෙයි, උණු චොකලට්, අලුත බේක් කළ විස්කෝතු, හැම්බර්ගර් සහ කැලෑ මල්වල සුවඳ සමග තවත් සුවඳවත් දේවල් සිය ගාණක සුවඳයි. දෙවියෝ මේ සුවඳට කැමති ඇති කියලා මටත් මුළුමනින්ම වගේ විශ්වාස කරන්න පුළුවන් වුණා.

හැමෝම ආපසු වාඩිවෙලා, තමන්ගේ කෑම වේල අහවර කළාට පසු, අපේ අවධානය ගන්න කයිරොන් ආයෙමත් කුරයෙන් පොළොවට තට්ටු කළා.

මිස්ටර් ඩී ලොකු සුසුමක් හෙළමින් නැගිට්ටා. "ඔව්, මං හිතන්නේ මම මේ කොල්ලෝ කෙල්ලෝ ටිකට හලෝ කිව්වොත් හොඳයි. ඔන්න එහෙනම්, හලෝ! අපේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක, කයිරොන් කියනවා ඊළඟ 'කොඩිය ඇල්ලීම' සිකුරාදාට තියෙනවා කියලා. මේ වෙනකොට ලෝරල් එක - එහෙමත් නැත්නම් ජයපත්‍රය අල්ලගෙන ඉන්නේ කැබින් අංක පහ."

අසෝබන ඔල්වරසන් හඬක් ඒරිස්ගේ මේසය දෙසින් ඇහුණා.

"පුද්ගලිකව," මිස්ටර් ඩී කියාගෙන ගියා, "මට කලින් කියන්න බැරි වුණා, ඒත්, මගේ සුබ පැතුම්. ඒ වගේම මම ඔයාලාට කියන්න ඕනෑ, අපිට අද අලුත් කඳවුරුකාරයෙක් එකතු වුණා; පීටර් ජොන්සන්."

කයිරොන් මොනවදෝ කෙඳිරුවා.

"එර්... පර්සි ජැක්සන්." මිස්ටර් ඩී නිවැරදි කළා. "අන්න හරි. හුරේ, දැන් ඉතින් ඔයාලාගේ තකතීරු සාජ්ජේ පටන් ගන්න."

හැම දෙනාම සිල්වරසත් දුන්නා. අපි හැමෝම රංගාවාටය පැත්තට පල්ලම් බැස්සා. ඇපලෝගේ කැබින් එකේ අය සාතිරගේ මුල් තැන ගත්තා. අපි කඳවුරු ගීත කියමින්, මාෂ්මෙලෝස් කමින්, විහිළු තහළු මැද සතුටු වුණා. හොඳම දේ වුණේ, කට්ටිය මගේ දිහා පුදුමයෙන් බලා ඉන්න බව තවදුරටත් මට නොදැනීමයි. මට දැනුණේ මම ගෙදර ඉන්නවා වගෙයි.

තවත් රෑ වුණාට පස්සේ, කඳවුරු ගිනිමැලයේ පුපුරු තරු පිරුණු අහස දෙසට ඇදෙන අතරේ, නැවත වතාවක් හක් ගෙඩිය නද නැගුවා. ඉතින්, අපි, අපේ කැබින්වලට යන්න පෙළ සැදුණා. මම කොච්චර මහන්සියකින් ඉඳලාද කියලා මට තේරුම් ගියේ, මම ණයට ගත් නිදන ඇඳ උඩට කඩාගෙන වැටුණු පසුයි.

මගේ ඇඹිලි මිනටෝර් අඟ වටා එතුණා. මම අම්මා ගැන කල්පනා කළා. ඒත් මගේ මනසට ආවේ සතුටුදායක දේවල්: එයාගේ හිනාව, පොඩි කාලේ මට නින්ද යනතුරු එයා කියපු කතන්දර, ඇඳ මකුණන්ට මාව කන්න ඉඩ දෙන්න එපා කියලා එයා කියන විදිහ.

ඇස් පියාගත් සැණින්ම වගේ මම නින්දට වැටුණා.

ඒක තමයි මම අර්ධ-ලෝහිත කඳවුරේ ගෙවූ මුල්ම දවස.

මම, මගේ අලුත් ගෙදර ගැන සතුටු වෙන්නේ කොයි තරම් පොඩි කාලයකටද කියලා මම කලින්ම දැනගෙන සිටියා නම්, කියලා මට හිතෙනවා.

08

අපි කොඩියක් අල්ලගත්තා

ඊළඟ දවස් කිපයේදී මම දින චර්යාවකට හුරුවුණා. සැටර්ලාගෙන්, දෙවගනන්ගෙන් වගේම නරාශ්වයන්ගෙනුත් මම පාඩම් ඉගෙනගත් බව නොසලකා හැරියොත් නම්, ඒක සම්පූර්ණයෙන්ම වගේ සාමාන්‍ය දින චර්යාවක් කියලා කියන්න පුළුවන්.

සෑම උදේ වරුවකම මම ඇනබෙත්ගෙන් පෞරාණික ග්‍රීක භාෂාව ඉගෙන ගත්තා. ඒ වෙලාවට අපි දෙවිවරු සහ දිව්‍යාංගනාවෝ ගැන වර්තමාන කාලයෙන් කතා කිරීම නම් මට ටිකක් නුහුරු වුණා. මගේ වචන අන්ධතාවය ගැන ඇනබෙත් කියූ දේ නිවැරදි බව මට තේරුණා. පෞරාණික ග්‍රීක භාෂාව කියවන්න මට ඒ තරම් අමාරු වුණේ නැහැ. අඩු තරමේ, ඉංග්‍රීසිවලට වඩා අමාරු වුණේ නැහැ. උදය වරු දෙකකට පසු, ඔළුවේ කැක්කුමක් හදා නොගෙන හෝමර්ගේ පොතක පේළි දෙක තුනක් ගැට ගහගන්න මට පුළුවන් වුණා.

දවසේ ඉතිරි කොටස මම එළිමහන් ක්‍රියාකාරකම් අතර කැරකෙමින් ගත කළේ මම දක්ෂ මොනවාටද කියලා සොයාගන්නයි. මට දුනු ශිල්පය උගන්වන්න කයිරොන් උත්සාහ කළා. ඒත් දුන්නයි, ඊතලයයි මට ගැළපෙන දෙයක් නොවෙන බව අපි ඉක්මනින්ම සොයා ගත්තා. එයා ඒ ගැන මුකුත් කිවුවේ නැහැ. වෙන දෙයක් තියා, මගේ ඉලක්කයක් වැරදිලා එක ඊතලයක් එයාගේ වලිගයේ වැදුණාටවත් එයා අවලාද නැගුවේ නැහැ.

තරඟෙට දිවීම? ඒකත් හරි ගියේ නැහැ. උපදේශක වන දෙවඟනන් හැම වෙලාවේම මාව දූවිල්ලෙන් නැහැවූවා. ඒ ගැන දුක් වෙන්න එපා කියලයි එයාලා නම් මට කිවුවේ. මොකද, ආදරෙන් පිස්සු

වැටුණු දෙවිවරුන්ගෙන් බේරෙන්න දුවලාම එයාලාට ශතවර්ෂ ගාණක පළපුරුද්ද තිබුණා. ඒ වුණත්, ගහක් තරම්වත් වේගයෙන් දුවන්න බැහැ කියන එක ටිකක් ලැජ්ජා වෙන්න ඕනෑ කාරණයක් වගෙයි මට නම් දැනුණේ.

එතකොට මල්ලව පොර? අයියෝ..! මම පිටියට යන කොයිම වෙලාවක වුණත් මාව කුඩු කරලා දාන්න සූදානමින් ක්ලැරිස් එතැන සිටියා.

"ඒක පටන් ගත්ත අයට තමයි වැඩිපුර හැකියාව තියෙන්නේ, නැට්වෝ," එයා මගේ කනට කෙඳිරුවා.

මම දක්ෂකමින් පෙන්වූ එකම දේ වුණේ ඔරු පැදීම විතරයි. ඒත් ඒක මිනටෝර්ව පැරදවූ කොල්ලෙක්ගෙන් මිනිස්සු දකින්න බලාපොරොත්තු වෙන වික්‍රමාන්විත හැකියාවක් නෙවෙයිනේ.

උපදේශකයෝ හා ජ්‍යෙෂ්ඨ කඳවුරුකරුවෝ මං ගැන සෝදිසියෙන් ඉන්නා බව මම දන සිටියා. මගේ තාත්තා කවුද කියලා තීරණය කරන්න එයාලා උත්සාහ කරමින් සිටියත්, ඒක එයාලාට ලේසි පහසු වැඩක් වුණේ නැහැ. මම ඒරීස් ළමයි වගේ ශක්තිමත් වුණේවත්, ඇපලෝ ළමයි වගේ දුනු ශිල්පයට දක්ෂ වුණේවත් නැහැ. හෙෆාස්ටස් ළමයින්ට වගේ ලෝහ කර්මාන්තයට විශේෂ හැකියාවක්වත්, දෙවියන් සතනම් කළ - ඩයනයිසියස්ගේ හැකියාවවත් මට තිබුණෙත් නැහැ. හැමදේම ටික ටික පුළුවන් වුණත්, කිසිම දෙයක අති දක්ෂයෙක් නොවෙන්න මම හර්මීස්ගේ ළමයෙක් වෙන්න ඇති කියලයි ලූක් නම් කිවුවේ. ඒත් මගේ හිත හදන්න එයා උත්සාහ කරනවා කියලයි මට නම් දැනුණේ. මං ගැන මොන විදිහේ තීරණයක් ගන්නද කියලා එයාත් දන සිටියේ නැහැ.

මේ දේවල් ඔක්කොම තිබුණත් මම කඳවුරට ගොඩාක් කැමති වුණා. උදේ පාන්දරට වැල්ලේ තිබූ මීදුමටත්, දහවල වෙද්දී ස්ට්‍රෝබෙරි යායෙන් හැමූ උණුසුම් සුවඳටත් විතරක් නෙවෙයි, මහ රෑට වනාන්තරයේ සිටි රාක්ෂයෝ නැගූ විකාර සද්දවලටත් මම ටිකෙන් ටික හුරු වුණා. කැබින් එකොළහේ අයත් එක්ක රෑ කෑම ගන්න ගියාම මගේ කෑම වේලෙන් කොටසක් ගින්නට දාලා, මගේ ඇත්තම තාත්තා එක්ක මොකක් හරි සම්බන්ධයක් දනවාගන්න මම උත්සාහ කළා. ඒත් ඒක හරි ගියේ නැහැ. හැම වේලාවකම වගේ මට දැනුණු, එයාගේ හිනාවක මතකයක් වගේ උණුසුම් හැඟීම ඇරෙන්න වෙන කිසිවක් මට දැනුණේ නැහැ. මගේ අම්මා ගැන වැඩිය නොහිතා ඉන්න මම උත්සාහ

කළත් මට දිගින් දිගටම කල්පනා වූ එකම දේ වුණේ, දෙවිවරුයි රාක්ෂයෝයි ඇත්තටම ඉන්නවා නම්, මායාවත් ඇත්තටම කරන්න පුළුවන් නම්, අනිවාර්යයෙන්ම මගේ අම්මාව ආපසු අරගෙන එන්නත් මොකක් හරි ක්‍රමයක් ඇති කියලයි.

ලූක්ගේ දොම්නස් ගතියත්, එයා, එයාගේ තාත්තා, හර්මීස්ව නුරුස්සනවා කියන කාරණයත් මම ටිකෙන් ටික තේරුම් ගත්තා. කමක් නැහැ, සමහරවිට දෙවිවරුන්ටත් කරන්න වැදගත් රාජකාරි ඇති. ඒත්, එයාලට බැරිද ඉඳහිට සැරයක්වත් එක ඇමතුමක් දෙන්න? නැත්නම් අකුණක්, ඒ වගේ මොකක් හරි දෙයක්? වාතයෙන් කෝක් එකක් මතු කරගන්න ඩයනයිසියස්ට පුළුවන් නම්, මගේ තාත්තාට - එයා කවුරු වුණත් - බැරිද ෆෝන් එකක් මතු කරගන්න?

බ්‍රහස්පතින්දා හවස් වරුවේ - ඒ කියන්නේ මම අර්ධ-ලෝහිත කඳවුරට ඇවිත් දවස් තුනකට පස්සේ, මට පළවෙනි කඩු සටන් පාඩම ඉගෙන ගන්න ලැබුණා. කැබින් එකොළහේ අපි හැමෝම මල්ලව පිටිය වටේට එකතු වුණා. එතැනදී අපේ උපදේශක වුණේ ලූක්. ග්‍රීක සන්නාහ ඇන්දවූ, පිදුරු පිරවූ පඹයින්ට පහර දෙමින් අපි මූලික ඇනීම් සහ කැපීම් පුරුදු වුණා. මට හිතුණු හැටියට මම ඒ ටික හොඳින් කළා. අඩු තරමේ, මට කරන්න තිබුණේ මොනවාද කියන එක මම තේරුම් ගත්තා, වගේම ප්‍රතික්‍රියා දක්වීමත් මම හොඳින් කළා.

මට තිබුණු ප්‍රශ්නය වුණේ මගේ අතට හරියටම ගැලපුණු කඩුවක් සොයාගන්න නැතිවීමයි. සෑම කඩුවක්ම ගොඩාක් බර වුණා, නැත්නම් ඕනෑවටත් වඩා සැහැල්ලු වුණා. සමහර තල දිගින් වැඩියි වගේ දැනුණා. මට උදවු කරන්න ලූක් උත්සාහ කළත් පුහුණුවට ගත් එක තලයක්වත් මට ගැළපෙන බවක් පේන්නේ නැහැ කියලා එයාත් පිළිගත්තා.

ඉන්පසු අපි යුගල ලෙසට සටන් කරන්න පටන් ගත්තා. එය මගේ පළවෙනි සටන නිසා මගේ හවුල්කරුවා වෙන්න ලූක් ඉදිරිපත් වුණා.

"සුබ පැතුම්," කඳවුරුකරුවන්ගෙන් කෙනෙක් මට කිවුවා. "ලූක් තමයි පහුගිය අවුරුදු තුන්සීයටම ඉපදුණු හොඳම කඩු සටන් ගුරයා."

"සමහරවිට එයා මට පොඩි බුරුලක් දෙයි." මම කිවුවා.

එයා නහයෙන් පිම්බා.

වැලෙන් ඇනීම, පහරවල් වැළැක්වීම සහ පලිහෙන් පහරවල් මග හැරීම ලූක් මට පෙන්වා දුන්නා. ඒ හැම පාඩමක්ම වගේ මට අදී කෙසියන්න කැපීම් සිදුවීම් වුණා. "ඔයාගේ පලිහ උඩට කරගන්න, පර්සි." කියන එයා, ටික පාරක් එයාගේ කඩු තලයේ පැතලි පැත්තෙන් මගේ ඉළ ඇටවලට පහර දුන්නා. "නෑ, එච්චර උඩට නෙවෙයි!" ටොක්..! "ප්‍රහාරයට පනින්න!" ටොක්..! "දැන්, පිටිපස්සට!" ටොක්..!

එයා විවේකයක් ගමු කියද්දී මම දහඩියෙන් පෙඟිලයි සිටියේ. මම සෙබඩා කළ සිසිකරණය වගේ හැමෝම රංචු ගැසුණා. අයිස් වතුර බෝතලයක් ගත් ලූක් එය ඔළුවේ හලාගන්නවා දකිද්දී, ඒක හොඳ අදහසක් කියලා හිතුණු නිසා මමත් එහෙමම කළා.

ඊට පස්සේ වගේ මට වඩාත් හොඳ සෙයියක් දැනෙන්න ගත්තා. මගේ අත්වලට නැවතත් ශක්තිය ගලාගෙන ආවා. මගේ අතට දැනුණු කඩුවේ තුලනය ගතියත් මග ඇරුණා.

"හරි හරි. කට්ටියම දැන් රවුමක් හදාගන්න!" ලූක් අණ කළා.

"පර්සි කැමති නම්, මට මිනෑ ඔයාට පොඩි පෙරහුරුවක් දෙන්න."

නියමයි, මම හිතුවා. පර්සි ඇටි කන විදිහ අපි හැමෝටම පෙන්නමු.

හර්මීස් ළමයි වටේට රොක් වුණා. එයාලා හිනාවල් තද කරගෙන ඉන්න බව මට පෙනුණා. මට වෙච්ච විකම මීට කලින් එයාලාටත් වෙලා ඇති කියලා මට සහතික වුණා. ලූක් මාවත් පඹයෙක් කරගන්නවා දකින්න නොඉවසිල්ලෙන් එයාලා බලන් සිටියේ ඒ නිසාම වෙන්න ඇති. කෙනෙක්ව නිරායුධ කරන ක්‍රමය පෙන්වන්න යනවා කියලා ලූක් හැම දෙනාටම කිව්වා. එයින් කරන්නේ තමන්ගේ කඩුවේ පැතලි පැත්ත පාවිච්චි කරමින් සතුරාගේ කඩු තලය අඹරන එකයි. එතකොට කඩුව බිම දමනවා හැර එයාට කරන්න වෙන දෙයක් නැති වෙනවා.

"මේ අමාරු එකක්," එයා බර කරලා කිව්වා. "මේක මට විරුද්ධව කරනවා මමත් අත්විඳලා තියෙනවා. ඒ නිසා කිසිම කෙනෙක් පර්සිට හිනා වෙන්න එපා. ගොඩක් කඩු හරඹ ශිල්පීන්ට මේ ක්‍රමය ඉගෙන ගන්න අවුරුදු ගාණක් පුහුණුවීම් කරන්න වෙනවා."

මුලින්ම එයා ඒක හෙමින් කර පෙන්නුවා. කියූ විදිහටම, මගේ අතින් කඩුව බිමට අත හැරුණා.

"දැන්, ඇත්තටම," මම, මගේ ආයුධය අහුලා ගත්තාට පසු එයා කිව්වා. "එක්කෙනෙක්ගේ අතින් කඩුව බිමට වට්ටනකල්ම අපි පහරවල් වළක්වන එක කරමු. ලෑස්තිද, පර්සි?"

මම ඔළුව වැනුවා, ලූක් මගේ පස්සෙන් ආවා. කොහොම හරි, මගේ කඩු මිටට පහරක් දීමෙන් එයාව වළක්වා තියාගන්න මට පුළුවන් වුණා. මගේ සංවේදන ඉන්ද්‍රියන් හොඳින් වැඩ කරන්න ගත්තා. එයාගෙන් එල්ල වෙන පහරවල් මට පෙනුණා. ඒවාට ප්‍රතිපහරවල් එල්ල කරන්නත් මට පුළුවන් වුණා. අඩියක් ඉදිරියට ගොස් එයාට පහරක් දෙන්න මම උත්සාහ කළා. ලූක් ඒ පහර ලේසියෙන්ම වෙනතකට හැරවූවත්, එයින් එයාගේ මුහුණේ වෙනසක් වෙනවා මට පෙනුණා. ඇස් දෙක සිහින් කරගත් එයා වැඩි බලයක් යොදවා මාව තල්ලු කරන්න පටන් ගත්තා.

මගේ අතේ වූ කඩුව මට තවත් බරට දැනෙන්න ගත්තා. එහි සමබරතාවය වැරදියි වගෙයි මට දැනුණේ. මාව පරදවන්න ලූක්ට යන්නේ තවත් තත්පර කිහිපයක් විතරයි කියලා මට තේරුණා. ඉතින්, කොහොම වුණත් මොකද, කියලා මම හිතුවා.

මම සතුරා නිරායුධ කරන ක්‍රමය උත්සාහ කළා.

මගේ කඩුව ලූක්ගේ කඩු තලය මුල වැද්දූ මම, මගේ මුළු බරම යොදා පහළට තල්ලු කරන අතරේම ඒක ඇඹරුවා.

ඩරාං...!

ගල්වල වැදුණු ලූක්ගේ කඩුවෙන් මහ හඬක් නැඟුණා. මගේ කඩු තුඩ එයාගේ අනාරක්ෂිත පපුවට කෙලින්ම එල්ල වෙලා තිබුණා.

අනෙක් කඳවුරුකරුවෝ තුෂ්නිම්භූත වෙලා බලාගෙන සිටියා.

මම, මගේ කඩුව පහතට දැමුවා. "මම... සමා වෙන්න."

එක මොහොතකට ලූක් කතා කරගන්නත් බැරි තරම් පුදුම වෙලා සිටියා.

"සමා වෙන්න?" එයාගේ කැළැල ඇති මුහුණ පුරා හිනාවක් ඇඳුණා. "දෙයියන්ගේ නාමෙට, පර්සි, ඔයා මොකටද සමාව ඉල්ලන්නේ? කෝ, මට ආයෙමත් ඒක කරලා පෙන්වන්න!"

මට නම් ආයෙමත් එහෙම කරන්න උවමනා වුණේ නැහැ. ටික වෙලාවකට මගේ ඇඟ තුළ පුපුරා ගිය ඒ උමතු ශක්තිය දැන්

සම්පූර්ණයෙන්ම මාව අතහැර ගිහින්. ඒත් මට ලූක්ව නතර කරන්නම බැරි වුණා.

මේ වතාවේ නම්, එතැන සටනක් තිබුණේම නැහැ. අපේ කඩු එකිනෙකට ගැටෙද්දිම වගේ, මගේ කඩුව පොළොව දිගේ ලිස්සා යන විදිහට ලූක් මගේ කඩු මිටට පහර දුන්නා.

"ආධුනිකයාගේ වාසනාව'ද?" දිගු නිහැඬියාවකට පසු බලා සිටි අයගෙන් කෙනෙක් ඇසුවා.

ලූක් තළලේ දහඩිය පිසගත්තා. "වෙන්නත් පුළුවන්," සහමුලින්ම අලුත් උනන්දුවකින් ලූක් මාව තක්සේරු කළා. "ඒත් මම පුදුම වෙන්නේ, හොඳට සමබර කරපු කඩුවක් දුන්නොත් පර්සි මොනවා කරයිද කියලා..."

සිකුරාදා හවස් වරුවේ, බිත්ති නැගීම නිසා අත්වින්ද මරණාසන්න අත්දැකීමෙන් පස්සේ, මම ග්‍රෝවර් එක්ක විල ළඟ වාඩිවෙලා මහන්සි අරිමින් සිටියා. ග්‍රෝවර් නම් කිසිම කරදරයක් නැතිව, කඳුකර එළුවෙක් වගේ කඩිසරව මුදුනටම නැග්ගා, ඒත් මම නම් ලෝදිය වලින් පණ බේරා ගත්තේ අනු නවයෙන්. මගේ කමිසය පුරාම දුම් දමන සිල් සෑදී තිබුණා. මගේ අත්වල තිබූ රෝම සියල්ලමත් පිච්චී ගිහින්.

අපි ජැටියේ වාඩිවෙලා, ජල දෙවඟනන් වතුර යට ඉඳගෙන කූඩා වියන දෙස බලා සිටියා. අන්තිමේදී, මිස්ටර් ඩී එක්ක කළ කතාබහට මොකද වුණේ කියලා ග්‍රෝවර්ගෙන් අහන්න තරම් ධෛර්යයක් හොයාගන්න මට පුළුවන් වුණා.

එයාගේ මුහුණ ලෙඩ වූ කෙනෙකුගේ වගේ කහ පාටට හැරුණා.

"හොඳයි," එයා කිවුවා. "අවුලක් නෑ."

"ඒ කියන්නේ, ඔයාට ඕනෑ රස්සාව කරන්න තවමත් ඉඩ තියෙනවා?"

එයා මගේ දෙසට කලබලකාරී බැල්මක් හෙළුවා. "මම සොයන්නෙකුගේ බලපත්‍රයක් ගන්න උවමනාවෙන් ඉන්නේ කියලා කවිරුත් ඔයාට කිව්වද?"

"ම... නැහැ." සොයන්නෙකුගේ බලපත්‍රය කියන්නේ මොකක්ද කියලා මට කිසිම අදහසක් තිබුණේ නැතත්, ඒ ගැන මේ වෙලාවේ අහන එක හරි නැහැ කියලා මට හිතුණා. "එයා කිවුවේ ඔයාට ලොකු බලාපොරොත්තු තියෙනවා කියලා විතරයි. ඉතින්... ඒකට ඔයා ය කවලෙක් විදිහට පැවරුම සම්පූර්ණ කරලා ලකුණු ගන්න ඕනෑ කියලා කිවුවා. ඉතින්, ඔයාට ඒක ලැබුණද?"

ග්‍රෝවර් පහළ සිටි ජල දෙවඟනන් දෙස බලා සිටියා. "මිස්ටර් ඩී තීන්දුව දෙන එක කල් දැම්මා. එයා කිවුවා, ඔයාගේ වැඩේදී මම අසාර්ථක වෙලාවත් සාර්ථක වෙලාවත් නැහැලු. ඒ නිසා අපි දෙන්නගේ ඉරණම් තවමත් එකට බැඳිලාලු තියෙන්නේ. ඔයාට ගවේෂණයකට යන්න අවසර ලැබිලා, ඔයාව ආරක්ෂා කරන්න මමත් ඔයා එක්කම ගියොත්, ඒ ගියා වගේම අපි ආපහු පණපිටින් ආවොත්, අන්න එතකොට මගේ රාජකාරිය සම්පූර්ණයි කියලා එයාට සලකන්න පුළුවන්ලු."

මගේ උනන්දුව වැඩි වුණා. "හොඳයි, ඒක එච්චරම නරක දෙයක් නෙවෙයිනේ, නේද?"

"බලා-හා-හා! ඊට වඩා හොඳයි එයා මාව ඉස්තාලේ සුද්ද කරන වැඩවලට මාරු කළා නම්. ඔයාට ගවේෂණයකට යන්න අවස්ථාවක් හම්බ වෙයිද... ඇරත්, ඔයාට එහෙම හම්බ වුණත්, මාව එක්කගෙන යන්න ඔයාට ඕනෑ වෙයිද?"

"ඇයි නැත්තේ. මට ඔයාව එක්ක යන්නම ඕනෑ!"

ග්‍රෝවර් මුහුණ අඳුරු කරගෙන වතුර දෙස බලා සිටියා. "කූඩා වියන එක වගේ... ප්‍රයෝජනවත් හැකියාවක් තියෙන එක නම් හරිම හොඳ දෙයක් වෙන්න ඇති."

එයාට ගොඩක් දේවල්වලට දක්ෂකම තියෙනවා කියලා එයාගේ හිත සනසවන්න මම උත්සාහ කළා, ඒත් එයින් වුණේ එයාගේ පෙනුම තවත් දුක්බර වීම විතරයි. අපි ඔරු පැදීම ගැනත්, කඩු හරඹ ගැනත් ටික වෙලාවක් කතා කර කර සිටියා. ඉන්පසු, අපි දෙවිවරුන්ගේ වාස-දේස ගැන වාද කළා. අන්තිමේදී, කඳවුරේ තිබුණු හිස් කැබින් හතර ගැන මම එයාගෙන් ඇසුවා.

"අංක අට, අර රිදී පාට එක අයිති ආර්ටෙමිස්ට," එයා කිවුවා. "එයා සදාකාලිකවම අවිවාහකව ඉන්නවා කියලා පොරොන්දු වෙලා ඉන්නේ. ඉතින්, එයාට ළමයි ඉන්න විදිහක් නැහැනේ. ඒ කැබින් එක

තියෙන්නේ. ඔයා දන්නවනේ, ගරු කිරීමක් හැටියට. එයාටත් එකක් තිබුණේ නැත්නම් එහෙම, එයා කේන්තියෙන් පිස්සු වැටෙයි."

"ඔව්, හරි. ඒත් ඉතුරු තුන, අර කොණටම වෙන්න තියෙන්නේ, ඒවා ලොකු තුන්කට්ටුවේ ඒවාද?"

ග්‍රෝවර් ගැස්සුනා. අපි ළං වෙමින් සිටියේ බැරුම් මාකොටුවකට. "නෑ. එයින් එකක් - අංක දෙක හේරාගේ." එයා කිවුවා. "ඒක තියෙන්නෙත් ගරු කිරීමක් හැටියට විතරයි. හේරා කියන්නේ විවාහයට අධිපති දෙවඟන නේ. ඉතින් එයා කීයටවත් මිනිස්සු එක්ක ආදර සම්බන්ධකම් හදාගන්න වටේ යන්නේ නැහැ. ඒක එයාගේ සැමියාගේ රාජකාරිය. තුන් කට්ටුව කියලා කියද්දී, අපි අදහස් කරන්නේ බලගතුම සහෝදරයෝ තුන් දෙනා ගැන. ක්‍රෝනොස්ගේ පුතාලා ගැන."

"සියුස්. පොසෙයිඩන්. හේඩීස්."

"අන්න හරි. ඔයා දන්නවනේ, ටයිටන්ලා එක්ක තිබුණු මහා යුද්ධයෙන් පස්සේ එයාලා තාත්තාගෙන් ලෝකය අත්කර ගත්තා. ඊට පස්සේ, කොයි කෙනාට මොන කොටස දෙනවද කියලා තීරණය කරන්න එයාලා දිනුම් ඇදීමක් කළා."

"ඒකෙන් සියුස්ට අහස ලැබුණා," මම මතක් කළා. "පොසෙයිඩන්ට මුහුදත්, හේඩීස්ට පාතාල ලෝකයත් ලැබුණා."

"අහ්-හන්."

"ඒත් මෙහෙ හේඩීස්ට කැබින් එකක් නැනේ."

"නැහැ. එයාට ඔලිම්පස්වලත් සිංහාසනයක් නැහැ. එයා, එයාට ඕනෑ විදිහටයි පාතාල ලෝකේ වැඩ කරගෙන යන්නේ. එයාටත් මෙහෙ කැබින් එකක් තිබුණානම් එහෙම..." ග්‍රෝවර් වෙවුලුවා. "එහෙනම් ඒක එච්චර ආසා හිතෙන වැඩක් වෙන්නේ නැති වෙයි. අපි ඒක එහෙමම තියෙන්න අරිමු."

"ඒත් සියුස්, පොසෙයිඩන් දෙන්නා - පරණ කතන්දරවල තියෙන විදිහට නම් එයාලාට ළමයි කෝටියක් විතර ඉඳලා තියෙනවානේ. ඒත් මේ කැබින් හිස් ඇයි?"

ග්‍රෝවර් අපහසුවෙන් කුර එහෙ-මෙහෙ කළා. "අවුරුදු හැටකට විතර කලින්. ඒ කියන්නේ දෙවෙනි ලෝක යුද්ධයෙන් පස්සේ, ලොකු තුන්කට්ටුව එකඟතාවයකට ආවා, එයාලා තවත් වීරයන්ව බිහි කරන්නේ

නැහැ කියලා. එයාලාගේ ළමයි ඕනෑවටත් වඩා බලවත්. මිනිස් ක්‍රියාකාරකම්වලට එයාලාගෙන් ලොකු බලපෑමක් එල්ල වුණා. මනුෂ්‍ය සංහාරවලට එයාලා මූලික හේතුව වුණා. ඔයා දන්නවනේ, දෙවෙනි ලෝක යුද්ධයේදී මූලිකව සිද්ධ වුණේ සියුස්ගෙයි, පොසෙයිඩන්ගෙයි පුතාලා එක පැත්තකටත්, හේඩීස්ගේ පුතාලා තවත් පැත්තකටත් බෙදිලා යුද්ධ කළා. ඒකෙන් දිනපු පැත්ත, සියුස්, පොසෙයිඩන් දෙන්නා, එයාලාත් එක්ක දිවුරුම් දෙන්න හේඩීස්ට බල කළා: මනුෂ්‍ය කාන්තාවන් එක්ක තවදුරටත් සම්බන්ධකම් තියාගන්නේ නැහැ කියලා එයාලා තුන්දෙනා ස්ටයික්ස් ගංගාව මත දිවුරුම් දුන්නා."

අකුණක් මහ හඬින් පුපුරා ගියා.

"කෙනෙක්ට දිවුරන්න පුළුවන් බරපතළම විදිහ ඒකද?"

ග්‍රෝවර් ඔළුව වැනුවා.

"එතකොට, සහෝදරයෝ තුන් දෙනා, එයාලාගේ පොරොන්දුව ඒ විදිහටම රැක්කා - ඒ කියන්නේ එයාලාට ළමයි නැහැ?"

ග්‍රෝවර්ගේ මුහුණ අඳුරු වුණා. "අවුරුදු දහ හතකට කලින් සියුස් ඒ පාරෙන් පිට පැන්නා. ඒ කාලේ අලුතෙන් ආව නිළියක් හිටියා අසූ ගණන්වල කොණ්ඩා මෝස්තර එහෙම දාගෙන. එයා නිසා සියුස්ට, තමන්ව පාලනය කර ගන්න බැරි වුණා. එයාලාගේ දරුවා, ඒ කියන්නේ තාලියා කියලා ගෑනු දරුවෙක් ඉපදුනාට පස්සේ... හොඳයි, ස්ටයික්ස් ගංගාව පොරොන්දු ගැන ගොඩාක් බරපතළ විදිහට සලකනවා. සියුස් අමරණීය කෙනෙක් නිසා එයාට නම් ලේසියෙන්ම ගැලවෙන්න පුළුවන් වුණා, ඒත් එයාගේ දුවට නම් මුහුණ දෙන්න වුණේ හරිම භයානක ඉරණමකට."

"ඒත් ඒක හරිම අසාධාරණයි. ඒක ඒ ගෑනු දරුවාගේ වරදක් නෙවෙයිනේ."

ග්‍රෝවර් තරමක් පැකිළුණා. "පර්සි, ලොකු තුන්කට්ටුවගේ දරුවෝ කියන්නේ අනිත් අර්ධ-ලෝහිතයන්ට වඩා ගොඩාක් බලවත් අය. එයාලාගේ රැස් මාලාව අනිත් අයට වඩා ප්‍රබලයි. ඒකට රාක්ෂයෝ ආකර්ෂණය වෙනවා. මේ ගෑනු දරුවා ගැන ආරංචි වුණාම සියුස්, එයාගේ දිවුරුම කඩපු එක ගැන හේඩීස් සතුටු වුණේ නැහැ. එයා තාලියාට කරදර කරන්න ටාටරස්වල හිටිය නපුරුම රාක්ෂයින්ව නිදහස් කළා. ඒ ළමයාට අවුරුදු දොළහේදී එයාගේ රැකවලා විදිහට වැඩ කරන්න සැටර් කෙනෙක්ව පත් කළා, ඒත් ඒ සැටර්ට කරන්න

පුළුවන් දෙයක් තිබ්බේ නැහැ. ඒ ගැහැනු ළමයාවයි. එයා මැරදී යාදී කරන්න තවත් අර්ධ-ලෝහිත ළමයි දෙන්නෙකුයි පරිස්සමින් මෙහෙට එක්ක එන්න එයා ගොඩාක් උත්සාහ කළා. එයාලා කිට්ටුවටම වගේ ආවා. එයාලාට අර කන්ද මුදුනටම එන්න පුළුවන් වුණා."

එයා දෙණිය හරහා අත දිගුකර, මම මිනටෝර් එක්ක සටන් කළ පයින් ගස පෙන්නුවා. "යම බිල්ලෝ රැනකුත් අරගෙන කාරුණික ඇත්තෝ තුන්දෙනාම එයාලා පිටිපස්සෙන් ආවා. එයාලාව කොටු වෙන්න ඔන්න-මෙන්න තියෙද්දී, තාලියා අර සැටර්ට කිව්වා එයා කොහොම හරි රාක්ෂයින්ව නතර කරන්නම්, එතකල් අනිත් අර්ධ-ලෝහිත ළමයි දෙන්නාව පරිස්සමෙන් කඳවුරට අරගෙන යන්න කියලා. ඒ ගැහැනු ළමයා හිටියේ තුවාල වෙලා වගේම ගොඩක් මහන්සි වෙලා. දඩයම් සතෙක් වගේ ජීවත් වෙන්න එයාට ඕනෑ වුණේ නැහැ. එයාව දාලා යන්න සැටර් කැමති වුණේ නැහැ. ඒත් තාලියාගේ හිත වෙනස් කරන්න එයාට බැරිවුණා. ඒ වගේම අනිත් අයව ආරක්ෂා කරන වගකීම තිබුණෙත් එයාගේ කරපිට නේ. ඉතින්, අර කන්ද මුදුනේදී තාලියා, එයාගේ අන්තිම සටනට තනියම මුහුණ දුන්නා. එයා මැරෙනකොට සියුස්ට එයා ගැන අනුකම්පා හිතුණා. එයා තාලියාව අර පයින් ගහට හැරෙව්වා. එයාගේ ආත්මය තවමත් මේ මිටියාවතේ මායිම් ආරක්ෂා කරන්න උදවු වෙනවා. අන්න ඒ නිසයි ඒ කන්දට අර්ධ-ලෝහිත කන්ද කියන්නේ."

ඈතින් පෙනුණු ඒ පයින් ගහ දෙස මම ඇසිපිය නොගසා බලන් සිටියා.

ඒ කතාව නිසා මට හිස් හැඟීමක් වගේම වරදකාරී හැඟීමකුත් දැනෙන්න ගත්තා. මගේ වයසේ හිටි ගැහැනු ළමයෙක්, එයාගේ යාළුවන්ව බේරාගන්න තමන්ගේ ජීවිතය පවා කැප කරලා. එයා මුළු රාක්ෂ සේනාවකටම තනිවම මුහුණ දීලා. ඒත් එක්ක බලද්දී, මම මිනටෝර්ව පැරදවීම ඒ හැටි දෙයක් නෙවෙයි කියලා මට දැනෙන්න ගත්තා. මම වෙන විදිහකට වැඩ කළා නම්, ඒ වෙලාවේ මටත් මගේ අම්මාව බේරාගන්න පුළුවන්කම තියෙන්න ඇතිද කියලා මට කල්පනා වුණා.

"ග්‍රෝවර්," මම කතා කළා. "ඇත්තටම වීරයෝ ගවේෂණවලට පාතාල ලෝකයට ගිහින් තියෙනවද?"

"සමහර වෙලාවලට," එයා කිව්වා. "ඕර්ෆියස්, හර්කියුලිස්, හුඩිනි වගේ අය."

"එතකොට, කවදාහරි එයාලාට පුළුවන් වෙලා තියෙනවද මැරුණ අයගෙන් කෙනෙක්ව ආපහු අරන් එන්න?"

"නැහැ. කවදාවත් නෑ. ඕර්ෆියස් නම් කිට්ටුවටම වගේ ආවා... පර්සි, ඔයා ඇත්තටම හිතන්නේ නැහැ නේද-"

"නෑ," මම බොරුවක් කිව්වා. "මම ටිකක් පුදුම වුණා. එතකොට... සැටර් කෙනෙක්ට හැම වෙලාවෙම පැවරිලා තියෙන්නේ උප දෙවියෙක්ව ආරක්ෂා කරන වැඩේද?"

ග්‍රෝවර් විපරම්කාරීව මගේ දිහා බලාගෙන සිටියා. මම පාතාල ලෝකය ගැන අදහස ඇත්තටම හිතෙන් අත් හැරිය බව ග්‍රෝවර්ට ඒත්තු ගන්වන්න මට බැරිවෙලා වගෙයි. "හැම වෙලාවෙම නෙවෙයි. අපි ඉස්කෝල ගොඩකට හොර රහසේ යනවා. අපි උත්සාහ කරන්නේ ශ්‍රේෂ්ඨ වීරයෝ වෙන්න ඉඩ තියෙන අර්ධ-ලෝහිතයෝ කවුද කියලා ඉව අල්ලන්න. අපිට ගොඩක් ප්‍රබල රැස් මාලාවක් හොයා ගන්න ලැබුණොත්, හරියට ලොකු තුන්කට්ටුවේ ළමයෙක්ගේ වගේ, අපි ඉක්මනට කයිරොන්ට දන්වනවා. මොකද... එයාලා ලොකු ප්‍රශ්නයක් ඇති කරන්න මුල් වෙන්න පුළුවන් නිසා, එයාලා ගැන ඇහැ ගහගෙන ඉන්න කයිරොන් උත්සාහ කරනවා."

"එතකොට, ඔයා මාව හොයාගත්තා. මම විශේෂ කෙනෙක් වෙන්න ඇති කියලා ඔයා හිතුවා කියලා කයිරොන් මට කිව්වා."

මම මේ දන් ග්‍රෝවර්ව උගුලකට හසු කළා වගේ පෙනුමක් එයාට තිබුණේ. "මම එහෙම හිතුවේ නැහැ... ඔහ්, අහන්න, ඒ විදිහට හිතන්න එපා. බැරි වෙලාවත් ඔයා එහෙම කෙනෙක් නම් - ඔයා දන්නවනේ - ඔයාට කවදාවත් ගවේෂණයකට යන්න ඉඩ ලැබෙන්නේ නැතිවෙයි. එතකොට මටත් කවදාවත් මගේ බලපත්‍රය ගන්න ලැබෙන එකක් නැහැ. ඔයා සමහරවිට හර්මීස්ගේ ළමයෙක් වෙන්න ඇති. එහෙමත් නැත්නම්, නෙමෙසිස්, ඒ කියන්නේ පළිගැනීමට අධිපති දෙවියෝ වගේ කවුරු හරි පොඩි දෙවි කෙනෙක්ගේ ළමයෙක් වෙන්න ඇති. ඒ ගැන වද වෙන්න එපා. හොඳද?"

මාව සනසනවට වඩා එයාවම සනසවා ගන්න ග්‍රෝවර් උත්සාහ කරන බව මට ඒ වෙලාවේම තේරුණා.

එදා රෑ කෑමෙන් පස්සේ කාලය වෙනදාටත් වඩා උද්වේගකාරී වුණා.

කොඩිය අල්ලන තරගයට වෙලාව අන්තිමේදී ඇවිත් තිබුණා.

පිහන් අස් කළාට පස්සේ, නැවත වතාවක් හක් ගෙඩිය පිඹින හඬ ඇහුණා. ඒත් එක්කම අපි මේසවලින් නැගිට්ටා.

කඳවුරුකරුවන්ගේ කෑගැසීම් සහ ඔල්වරසන් හඬ මැද්දෙ ඇනබෙත්, එයාගේ සහෝදරයෝ දෙන්නෙක් එක්ක සේද කොඩියක් අරන් මණ්ඩපයට දුවගෙන ආවා. අඩි දහයක් විතර දිගට, අළු පාටින් දිලිසුනු ඒ කොඩියේ මැද ඔලිව් ගහක් උඩ ඉන්නා සුදු පාට බඩක් ඇති බකමූණෙක් පින්තාරු කර තිබුණා. මණ්ඩපයේ විරුද්ධ පැත්තෙන් ක්ලැරිස්, එයාගේ යාළුවොත් එක්ක තවත් කොඩියක් අරන් දුවගෙන ආවා. අනෙක් කොඩිය තරමටම දිගු වූ එය තද රතු පාටින් දිලිසුනා. එහි මැද පින්තාරු කර තිබුණේ ලේ තැවරුණු හෙල්ලයක් සහ ඌරෙකුගේ ඔළුවකුයි.

ලූක් දෙසට හැරුනු මම සෝෂාව මැදින් කෑගැසුවා, "ඒවාද කොඩි?"

"ඔව්."

"ඒරිස්යි, ඇතිනායි ද හැම වෙලාවෙම කණ්ඩායම්වල නායකයෝ වෙන්නේ?"

"හැම වෙලාවෙම නෙවෙයි," එයා කිවුවා. "ඒත් හුගක් වෙලාවට."

"එතකොට, වෙන කැබින් එකක් කොඩිය අල්ලගත්තොත් මොකද කරන්නේ - කොඩිය ආපහු පාට කරනවද?"

එයා දත් නියෙව්වා. "බලා ගන්නකෝ. ඔක්කෝටම කලින් අපි එකක් අල්ල ගන්න එපැයි."

"අපි ඉන්නේ කාගේ පැත්තෙද?"

එයා මගේ දෙසට කපටි බැල්මක් හෙළුවේ හරියට මම නොදන්නා දෙයක් එයා දන්නවා වගෙයි. පන්දම් එළිය මැදින් පෙනුණු එයාගේ මුහුණට කැළැල නිසා දුෂ්ට පෙනුමක් ලැබී තිබුණා.

"අපි ඇතිනා එක්ක තාවකාලික ගිවිසුමකට ඇවිල්ලා ඉන්නේ. අද රෑට, අපි ඒරිස්ගෙන් කොඩිය ගන්නවා. ඒකට ඔයත් උදවු කරන්නයි යන්නේ."

කණ්ඩායම් බෙදී ඇති ආකාරය නිවේදනය කළා. ඇතීනා, කඳවුරේ ලොකුම කැබින් දෙක වූ හර්මීස් සහ ඇපලෝ සමග ගිවිසුම් ඇති කරගෙන තිබුණා. පෙනුණු විදිහට නම්, දිනන්න උදවු කිරීමට

හිලවු වශයෙන් විශේෂ වරප්‍රසාද - ඒ කියන්නේ නෑමට ලැබෙන කාලය වැඩි කිරීම, පිරිසිදු කිරීම්වලට වෙන් කරන කාලය අඩු කිරීම, ක්‍රියාකාරකම්වලට ලැබෙන ඉඩ වැඩි කිරීම් වගේ දේවල් දෙන පොරොන්දුව එයාලා කලින්ම අරන් තිබුණා.

ඉතිරි හැමෝම: ඒ කියන්නේ ඩයනයිසියස්, ඩිමීටර්, ඇෆ්‍රොඩයිට් සහ හෙෆාස්ටස් කැබින් තමන්ගේ කණ්ඩායමට එක් කරගන්න ඒරිස්ට හැකි වී තිබුණා. මම දැක තිබූ විදිහට නම්, ඩයනයිසියස්ගේ ළමයි හොඳ මලල ක්‍රීඩකයෝ වුණා. හැබැයි එතැන සිටියේ දෙන්නෙක් විතරයි. ඩිමීටර්ගේ ළමයින්ට සොබාදහමේ හැකියාවන් සහ වෙනත් එළිමහන් වැඩවලට දක්ෂකම තිබුණත් එයාලා එතරම් චණ්ඩියෝ නෙවෙයි. ඇෆ්‍රොඩයිට්ගේ දුවලා පුතාලා ගැන නම් මම වද වුණේ නැහැ. මොකද, හැම ක්‍රියාකාරකමකදීම එයාලා කළේ පැත්තකින් වාඩිවෙලා, විලෙන් පෙනෙන එයාලාගේ රූපයේ හැඩ බල-බලා කොණ්ඩය හදන එකයි, ඕපාදූප කතා කරන එකයි විතරයි. හෙෆාස්ටස්ගේ ළමයි හතර දෙනා එච්චර ලස්සන නොවුණත්, එයාලාට මුළු දවස පුරාම කම්මලේ වැඩ කිරීම නිසා හැඩි දැඩි වූ සිරුරු තිබුණා. එයාලා නම් ප්‍රශ්නයක් වේවි කියලා මට හිතුණා. එතකොට ඉතුරු වෙන්නේ ඒරිස්ගේ කැබින් එක විතරයි. ඒ කියන්නේ ලෝන්ග් අයිලන්ඩ්වලටම, එහෙමත් නැත්නම් මුළු ලෝකෙටම ඉන්න තඩිම, කැතම, නරකම ළමයි දුසිම.

කයිරොන්, එයාගේ කුරයෙන් පොළොවට ගැසුවා.

"වීරයිනේ!" එයා නිවේදනය කළා. "ඔයාලා නීති-රීති දන්නවානේ. ඇළ පාර තමයි සීමා මායිම. මුළු වනාන්තරයම ක්‍රීඩාවට අදාළයි. මායා භාණ්ඩ පාවිච්චි කරන්න පුළුවන්. හොඳට පේන තැනක කොඩිය රඳවන්න ඕනෑ, ඒ වගේම එතැන මුරට දෙන්නෙකුට වඩා ඉන්න බැහැ. හිරකාරයන්ව නිරායුධ කරන්න පුළුවන්, ඒත් එයාලාව ගැට ගහන්නවත්, කටවල් බඳින්නවත් බැහැ. කිසිම කෙනෙක්ව මරන්නවත්, අංග විකල කරන්නවත් තහනම්. තරග විනිශ්චයකරුවා සහ සටන් බිමේ වෛද්‍යවරයා විදිහට වැඩ කරන්නේ මම. දැන්, තම-තමන්ගේ ආයුධ ගන්න!"

එයා අත් දෙක විහිදුවද්දී මේස සියල්ලම අවි ආයුධවලින් වැසුණා: ආරක්ෂක තොප්පි, ලෝකඩ කඩු, හෙල්ල, හරක් සමින් සාදා ලෝහ ආලේප කළ පලිහවල්.

"හෝව්," මම කිවුවා. "අපිට ඇත්තටම මේවා පාවිච්චි කරන්න කියලද කියන්නේ?"

ලූක් මගේ දෙස බැලුවේ හරියට මට පිස්සු හැදිලා වගෙයි. "කැබින් පහේ ඉන්න ඔයාගේ යාළුවෝ ඔයාව හම ගහනවට කැමති නැත්නම් - ඕව්. මෙන්න.. මේක ඔයාට හරියයි කියලා කයිරොන් හිතුවා. ඔයා ඉන්නේ සීමාව මුර කරන්න."

මට දුන් පලිහ කළු ලෑල්ලක් විතර ලොකුයි. මැද කැඩූසියස් ලකුණක් තිබූ එය රත්තල් මිලියනයක් විතර බරට දැනුණා. මේකත් උස්සාගෙන මම වේගයෙන් දුවයි කියලා කවුරුවත් බලාපොරොත්තු වෙන්න එපා කියලයි මම ප්‍රාර්ථනා කළේ. ඇතීනා කණ්ඩායමේ අනෙක් ආරක්ෂක තොප්පිවල වගේම මගේ තොප්පිය මුදුනෙත් නිල් පාට අශ්ව ලොම් රැල්ලක් තිබුණා. ඒරීස්ගේ කණ්ඩායමේ තොප්පිවල තිබුණේ රතු පාට රැල්ලක්.

"නිල් කණ්ඩායම, ඉදිරියට!" ඇනබෙත් කෑගැසුවා.

කඩු සොලවමින් මල්වරසන් දුන් අපි එයා පිටුපසින් කැලයේ දකුණු පැත්තට ගියා. අපිට ඇනුම්පද කියා කෑගසමින් රතු කණ්ඩායම උතුරට ගියා.

මගේම ආම්පන්නවල පැටලී ඇදගෙන වැටෙන්නේ නැතිව ඇනබෙත් ළඟට යාගන්න මට පුළුවන් වුණා. "හේයි."

එයා නොනැවතී පෙළපාළියේ ගියා.

"ඉතින්, මොකක්ද සැලැස්ම?" මම ඇසුවා. "මට ණයට ගන්න මොකක් හරි මායා බඩුවක් එහෙම ඔයා ළඟ නැද්ද?"

ඇනබෙත්ගේ අත, එයාගේ සාක්කුවට ඇදී ගියේ හරියට මම එයාගෙන් මොනවාහරි හොරකම් කරාවි කියලා බයෙන් වගෙයි.

"ක්ලැරිස්ගේ හෙල්ල ගැන සෝදිසියෙන් හිටියම ඇති," එයා කිවුවා. "ඒක ඔයාගේ වදිනවට ඔයා කැමති නැහැ, නේද? අනිත් දේවල් ගැන වද වෙන්න එපා. අපි ඒරීස්ලගෙන් කොඩිය ගන්නම්. ඔයාට කරන්න තියෙන්නේ මොකක්ද කියලා ලූක් කිව්වද?,"

"සීමාව මුර කරන්න, ඒ කියන්නේ මොකක්ද මන්දා."

"ඒක ලේසියි. ඇළ ළඟට වෙලා ඉන්න. රතු කට්ටියට කිට්ටු වෙන්න දෙන්න එපා. ඉතුරු ටික මම කරන්නම්. ඇතීනාට හැම වෙලාවෙම සැලැස්මක් තියෙනවා."

මාව දූවිල්ලෙන් නාවමින් එයා මාව පසු කරගෙන ඉදිරියට ගියා.

"හොඳයි," මම කෙඳිරුවා. "මාව ඔයාගේ කණ්ඩායමට ගන්න ඔයාට ඕනෑ වුණ එක ගැන සතුටුයි."

එය සැහෙන උණුසුම් රැයක්. තැනින්-තැන දල්වුණ කණාමැදිරියන්ගේ එළි ඇරෙන්න මුළු කැලෑවම කළුවරෙන් පිරිලා. ගල් ගොඩක් අතරින් ගොර-ගොර හඬින් ගලා යන පුංචි ඇළක් අසල මාව රැඳවූ ඇනබෙත්, කණ්ඩායමේ අනෙක් අයත් එක්ක ගස් අතරට විසිරිලා ගියා.

නිල් පෙන්දක් ඇති තොප්පියක් දාගෙන, අලි පලිහක් ඔසවාගෙන එතැන තනියම හිටගෙන ඉන්නකොට මට මහා අමන ගතියක් දැනුණා. මට දුන් ලෝකඩ කඩුවත් කලින් මම උත්සාහ කර බැලූ ඒවා වගේම හරියට සමබර නැති එකක් බව මට තේරුණා. එහි ලෙදර් මිට බෝලයක් වගේ මගේ අතේ ලිස්සා ගියා.

කවුරුවත් මට පහර දෙන්න එන්නේ නැති වෙයි, එහෙම නේද? මං කියන්නේ, ඔලිම්පස්වල අයටත් වගකීම් ප්‍රකාශනයක් එහෙම ඇතිනේ, නේද?

ඈතින් හක් ගෙඩිය පිඹිනවා ඇහුණා. මර හඬදීම් හා ලෝහ ගැටෙන හඬ - ළමයි සටන් කරනවා කැලෑව දෙසින් ඇහුණා. නිල් පෙන්දක් ඇති තොප්පියක් දමාගත් ඇපලෝ කැබිනයේ මිතුරු පාක්ෂිකයෙක් මුවෙක් වගේ වේගයෙන් දුවගෙන ඇවිත්, මාව පසු කරමින්, ඇළට උඩින් පැනලා සතුරු බිම තුළට නොපෙනී ගියා.

මරු, මම හිතුවා. හැමදාම වෙනවා වගේ අදත් මට හොඳම ටික මඟ ඇරෙන්නයි යන්නේ.

එතකොටම, මගේ කොඳුඇට පෙළ දිගේ සීතල හිරිවැටිල්ලක් පතුරුවමින්, ළඟ පාත තැනකින් බල්ලෙක් පහත් හඬින් ගොරවනවා වගේ ඇසෙන්න ගත්තා.

මම ඉබේටම වගේ පලිහ එසෙව්වා. මොකක් හරි දෙයක් හොර රහසේම මට කිට්ටු වෙනවා, කියන හැඟීම මගේ හිතේ හොල්මන් කරන්න වුණා.

ටිකකින් ගෙරවීම නතර වුණා. ආව එකා පසුබහින බව මට දැනුණා.

Scanned with CamScanner

ඇළේ අනෙක් පැත්තේ තිබූ ඔඩවැටියක් පුපුරා ගියා. මොර දෙමින්, කෑගසමින්, කළුවරෙන් එළියට මතු වුණේ ඒරීස් යුද භටයෝ පස් දෙනෙක්.

"මැට්ටව වත්ප කරපල්ලා!" ක්ලැරිස් බෙරිහන් දුන්නා.

තොප්පියේ වූ දික් සිදුරෙන් එයාගේ කැත, ඌරු ඇස් දෙක වෛරයෙන් දිලිසෙනවා පෙනුණා. එයා ලෙලවමින් සිටි අඩි පහක් විතර උස හෙල්ලයේ රළු ලෝහ තුඩ රතු එළියකින් දිලිසුනා. එයාගේ සහෝදර සහෝදරියන්ට නම් තිබුණේ සම්මත ප්‍රමාණයේ ලෝකඩ කඩු විතරයි. ඒත් ඒවා වුණත් හොඳයි කියලා මට හිතුනේ නැහැ.

එයාලා ඇළ පාර පසු කරමින් දුවගෙන ආවේ මට පහර දෙන්නයි. මට උදවුවක් නම් පේන තෙක්මානෙක තිබුණේ නැහැ. එක්කෝ මම දුවන්න ඕනෑ. නැත්නම් ඒරීස් කැබින් එකේ පිරිසෙන් බාගයක් එක්ක සටන් කරන්න ඕනෑ.

පළවෙනි ළමයාගේ පාර නොවැදී පැත්තකට පැන ගන්න මට පුළුවන් වුණා. ඒත් මේ කට්ටිය මිනටෝර් වගේ මෝඩයෝ නෙවෙයි. එයාලා මාව වටකළා. ඊට පස්සේ ක්ලැරිස්, එයාගේ හෙල්ලයෙන් මට අනින්න පටන් ගත්තා. මගේ පලිහ ඒ පහරවල් පැත්තනට හැරෙව්වත්, ඒ ඇනීම් නිසා මගේ ඇඟ පුරාම පොපියන වේදනාවක් පැතිරෙනවා මට දැනුණා. මගේ කෙස් කෙලින් වුණා. මම පලිහ රඳවාගෙන සිටි අත හිරිවැටිලා. පුළුඟ පවා ගිනි ගන්නවා වගේ දැනෙන්න ගත්තා.

විදුලිය. එයාගේ තකහීරු හෙල්ලයේ විදුලිය තිබුණා. මම පස්සට පැන්නා.

තවත් ඒරීස් ළමයෙක්, එයාගේ කඩු මිටෙන් මගේ පපුවට ගැසූ පහරට මාව දුවිලි ගොඩේ ඇද වැටුණා.

මාව ජෙලි එකක් වෙනතුරු හෝ පයින් ගසන්න එයාලාට ඉඩ තිබුණත්, එයාලා මට හිනා වෙන්න ඒ වෙලාව වෙන් කර ගත්තා.

"එයාගේ කොණ්ඩේ කපමු," ක්ලැරිස් යෝජනා කළා. "එයාගේ කොණ්ඩෙන් අල්ලාගන්න."

ඊට කලින් ආපසු නැගිටින්න මට පුළුවන් වුණා. මම, මගේ කඩුව එසෙව්වත් ක්ලැරිස්, එයාගේ හෙල්ලයෙන් එයට ගැසූ පහරට විදුලි පුපුරු විසිරුනා. දැන් මගේ අත් දෙකම හිරිවැටිලා.

"ඔත්, නියමයි," ක්ලැරිස් කිවුවා. "මේ කොල්ලා නිසා මට බයත් හිතෙනවා. ඇත්තටම බය හිතෙනවා."

"කොඩිය තියෙන්නේ අර පැත්තේ," මම එයාලාට කිවුවා. කේන්ති ගිය හඬකින් කතා කරන්න මට ඕනෑ වුණා. ඒත් මට බය, ඒක ඒ විදිහට ඇසුණේ නැතිද කියලයි.

"ඔව්," එයාගේ එක සහෝදරයෙක් කිවුවා. "ඒත් මෙකනේ වැඩේ... අපිට කොඩියෙන් වැඩක් නැහැ. අපිට වැඩේ තියෙන්නේ අපේ කැබින් එක පල් කරපු එකා එක්ක."

"ඒක ඔයාලා ඉල්ලන් කාපු එකක්නේ," මම එයාලාට කිවුවා. පෙනුණු හැටියට නම් ඒ වෙලාවේ කියන්න හොඳම දේ ඒක නෙවෙයි.

එයාලා දෙන්නෙක් මගේ දිහාවට ආවා. මගේ පලිහ ඔසවන්න උත්සාහ කරමින් මම ඇළ දෙසට පසු බැස්සා. ඒත්, ක්ලැරිස් ඊට වඩා වේගවත් වුණා. එයාගේ හෙල්ලය කෙලින්ම ඇවිත් මගේ ඉළ ඇටවල වැදුනා. පපුව ආරක්ෂා වෙන්න සන්නාහයක් හැඳ නොසිටියා නම් මාව කුරුම්බැට්ටි මැෂිමක් වගේ හිල් වෙන්න ඉඩ තිබුණා. ඒත් එයින් වැදුණු විදුලි සැරට මගේ දත-කටත් පුට්ටු වුණා. ඒ කණ්ඩායමේ තවත් ළමයෙක්, එයාගේ කඩුව මගේ අත හරහා වැනුවේ මට ලොකු කැපුමක් දෙමිනුයි.

ලේ ගලනවා දකිද්දී මගේ ඔළුව කරකැවෙන්න ගත්තා. ඒක හරියට සීතල සහ උණුසුම එක පාරට දැනෙනවා වගෙයි.

"අංග විකල කරන්න තහනම්," මට කියාගන්න පුළුවන් වුණා.

"අයියෝ," ඒ කොල්ලා කිවුවා. "මං හිතන්නේ මගේ අතුරුපස වරප්‍රසාදය මට නැතිවෙයි."

එයා මාව තල්ලු කරද්දී මම වතුර කලතමින් ඇළට ඇද වැටුණා. එයාලා හිනා වෙන්න ගත්තා. ඒත්, එයාලා විනෝද වෙලා ඉවර වුණාම වෙන්නේ මට මැරුම් කන්න කියලා මට තේරුණා.

එතකොටම අමුතු දෙයක් සිද්ධ වුණා. වතුරෙන් මගේ හැඟීම් සහ දැනීම් අවදි වෙනවා වගෙයි පෙනුණේ. හරියට මට මේ දැන් මගේ අම්මාගෙන් ලොසින්ජර් මල්ලක් ලැබුණා වගෙයි.

ක්ලැරිස් සහ අනෙක් ළමයි ටික මාව අල්ලගන්න ඇළට ආවත්, ඊට කලින් එයාලාට මුහුණ දෙන්න මම සිටගත්තා. කළ යුතු දේ මම දැන සිටියා. මුලින්ම ආව කොල්ලාගේ ඔළුවට මගේ කඩුවේ

පැතලි පැත්තෙන් ගැසූ පහරට එයාගේ ආරක්ෂක තොප්පිය ගැලවිලා වැටුණා. මගේ පහර කොච්චර තදින් එයාට වැදුණාද කියනවා නම්, වතුරට ඇද වැටෙද්දිත් එයාගේ ඇස් දෙක කම්පනයෙන් ගැහෙනවා මට පෙනුණා.

ජෝකර් අංක දෙකයි, ජෝකර් අංක තුනයි මගේ දිහාවට ආවා. එක්කෙනෙකුගේ මුහුණට පලිහෙන් ගැසූ මම, මගේ කඩුවෙන් අනෙකාගේ අශ්ව ලොම් පෙන්ද කපා දැමුවා. ජෝකර් අංක හතරට නම් මට පහර දෙන්න ඒතරම් උවමනාවක් නැහැ වගේ පෙනුණත්, විදුලි සැර නිසා සට-පට හඬින් පුපුරන හෙල්ලයත් මගේ දිහාවට දිගු කරගෙන ක්ලැරිස් ඉදිරියටම ආවා. එයා එයින් මට ඇනපු ඇසිල්ලේම වගේ, මගේ පලිහේ කෙළවරත්, කඩුවත් පාවිච්චි කරමින් හෙල්ලයේ මිට අල්ලාගත් මම, රිකිල්ලක් කඩනවා වගේ පහසුවෙන් එය කඩා දැමුවා.

"ආහ්!" එයා බෙරිහන් දුන්නා. "මැටි මෝලා! ගඳ ගහන කුණු පණුවා!"

එයා ඊටත් වඩා නරක දේවල් කියලා කෑගහන්න තිබුණා, ඒත් ඊට කලින් එයාව ඇළෙන් ගොඩට විසිවෙලා වැටෙන විදිහට මම, මගේ කඩු මිටෙන් එයාගේ නළල මැදට පහරක් දුන්නා.

කෑ ගසන හඬවල් සමග උඩගු ප්‍රීති ඝෝෂා ඇසෙන්න ගත්තේ අන්න ඒ වෙලාවේදියි. වටපිට බලද්දි, රතු කණ්ඩායමේ කොඩිය උඩට ඔසවාගෙන මායිම් ඉර දෙසට වේගයෙන් දුව එන ලූක්ව මම දැක්කා. තවත් හර්මීස් කොල්ලෝ දෙන්නෙක් දෙපැත්තෙන් එයාව ආරක්ෂා කරන අතරේ, එයාලාට පිටුපසින් ඇපලෝ කොල්ලෝ කීප දෙනෙක් හෙෆෙස්ටස් ළමයි එක්ක සටන් කරමින් සිටියා. ඒරීස් කට්ටිය නැගිටින අතරේ, ක්ලැරිස් තෝන්තුවෙන් වගේ කොඳුරමින් ශාප කරන්න පටන් ගත්තා.

"උප්පරවැට්ටියක්!" එයා කෑගැසුවා. "ඒක රැවටිල්ලක්!"

එයාලා ලූක්ව ලුහුබඳින්න ගත්තත් ඒ වෙද්දි පරක්කු වැඩියි. ලූක් මීනු බිමට දුවගෙන එද්දි හැම දෙනාම ඇළ අසලට රොක් වුණා. අපේ පැත්ත ප්‍රීති ඝෝෂාවලින් දෙදුරුම් කෑවා. දිලිසෙමින් සැලෙන්න ගත් රතු කොඩිය රිදී පාටට හැරුණා. ඌරු ඔළුව සහ හෙල්ලය වෙනුවට කැබින් එකොළහේ සංකේතය වූ දවැන්ත කැඩුසියස් ලකුණක් එතැන මතුවුණා. ලූක්ව ඔසවා කර මතට ගත් නිල් කණ්ඩායමේ අය වටේ

යන්න ගත්තා. ගස් අතරින් පිම්මේ දුව ආ කයිරොන් හක් ගෙඩිය පිඹබා.

තරගය අවසානයි. අපි දිනුම්.

සතුටු වෙන පිරිසට මමත් එකතු වෙන්න යද්දි, මට එහා පැත්තේ, මගේ ළඟින්ම ඇනබෙත්ගේ කටහඬ ඇසෙන්න ගත්තා. " විරයා, නරකම නැහැ."

මම ඒ පැත්ත බැලුවත් එයා එතැන සිටියේ නැහැ.

"මොන ලෝකෙන්ද ඔයා ඒ විදිහට සටන් කරන්න ඉගෙන ගත්තේ?" එයා ඇසුවා ඒත් එක්කම, නළියන්න ගත් වාතය අතරින් එයා මතුවුණේ මේ දැන් ඔළුවෙන් ගැලෙව්වා වගේ පෙනුණු යැන්කී බේස්බෝල් කැප් එකකුත් අතේ රඳවාගෙනයි.

මගේ කේන්තිය වැඩි වෙනවා මට දැනුණා. එයා මේ දැන් අදෘශ්‍යමානව සිටියා කියන කාරණයවත් මම ගණන් ගත්තේ නැහැ. "ඔයා මාව ඇමට තිබ්බා," මම කිවුවා. "ඔයා මාව මෙතැනට දැම්මේ ක්ලැරිස් මගේ පස්සෙන් එනවා කියලා ඔයා දැනගෙන හිටිය නිසයි. ඒ අතරේ ඔයා ලූක්ව වෙන පාරකින් යැව්වා. මේ ඔක්කෝම ඔයා කලින්ම සැලසුම් කරගෙන ඉඳලා තියෙන්නේ."

ඇනබෙත් උරහිස් ඇකිළුවා. "මම ඔයාට කිව්වනේ, ඇතීනාට හැම වෙලාවෙම සැලසුමක් තියෙනවා."

"මාව කුඩු පට්ටම් වෙන විදිහේ සැලසුමක්."

"මම පුළුවන් තරම් ඉක්මනට ආවා. මම මැදට පනින්න ලෑස්ති වුණේ, ඒත්..." එයා උරහිස් ඇකිළුවා. "ඔයාට උදවු ඕනෑ වුණේ නැහැ."

මගේ තුවාල වූ අත එයා දැක්කා. "ඔයා කොහොමද ඒක කළේ?"

"කඩු කැපුමක්," මම කිවුවා. "ඔයා හිතුවේ මොකක් කියලද?"

"නෑ. එතැන තිබුණේ කඩු කැපුමක් තමයි. ඒත් දැන්... බලන්නකෝ."

තුවාලයේ ගලමින් තිබූ ලේ නතර වෙලා. ලොකු කැපුම තිබූ තැන දැන් තිබුණේ දිග, සුදු පාට සීරුමක් විතරයි. එය පවා මැකී යමින් තිබුණා. මම බලා ඉද්දිම එය පුංචි තුවාල කැළැලක් වෙලා, ඉන්පසු මුළුමනින්ම අතුරුදහන් වුණා.

"ම-මට තේරෙන්නේ නැහැ."

ඇනබෙත් බරටම කල්පනා කරන්න ගත්තා. මගේ කකුල් දෙස බැලූ එයා, ඊට පස්සේ ක්ලැරිස්ගේ කැඩුණු හෙල්ලය දෙස බලා, "වතුරෙන් එළියට අඩිය තියන්න, පර්සි." කිව්වා.

"ඇයි-"

"කිව්ව දේ කරන්නකෝ."

මම වතුරෙන් එළියට ආවා. එකවරම මට තද මහන්සියක් දැනෙන්න ගත්තා. මගේ අත් නැවතත් හිරිවැටුණා. මගේ ඇඩ්‍රිනලින් වේගය මාව අත ඇරලා ගියා. මාව වැටෙන්න ගියත්, ඇනබෙත් මාව අල්ලා ගත්තා.

"ඔහ්, ස්ටයික්ස්," එයා ශාප කළා. "මේක නම් හොඳ දෙයක් නෙවෙයි. මට ඕනෑ වුණේ නැහැ... මම හිතාගෙන හිටියේ ඒ සියුස් වෙන්නැති කියලා..."

එයා අදහස් කළේ මොකක්ද කියලා අහන්න කලින් අර බලු ගෙරවුම මට ආපසු ඇහුණා. හැබැයි ඒ කලින් වතාවට වඩා කිට්ටුවෙන්. උඩු බිරුම් හඬක් වනාන්තරය පුරා පැතිරුණා.

කඳවුරුකරුවන්ගේ ප්‍රීතිඝෝෂා එසැණින්ම නතර වුණා. කයිරොන් පෞරාණික ග්‍රීකවලින් මොනවදෝ කෑගසා කිව්වා. එයා කියූ දේ මම සම්පූර්ණයෙන්ම තේරුම්ගත් බව මට තේරුණේ පසුවයි: "සූදානම් වෙන්න! මගේ දුන්න!"

ඇනබෙත්, එයාගේ කඩුව එළියට ඇදලා ගත්තා.

එතැන, අපිට ටිකක් උඩින් ගල් කුළක් උඩ සිටියේ ලෝදිය වගේ රතු පාට ඇස් දෙකකුත්, කිණිසි වගේ උල් දතුත් ඇති රයිනෝ කෙනෙක් තරම් ලොකු, කළු දඩ බල්ලෙකුයි.

ඒකාගේ බැල්ම කෙලින්ම යොමු වෙලා තිබුණේ මගේ දෙසටයි.

ඇනබෙත් ඇරෙන්න වෙන කිසිම කෙනෙක් සෙලවුණේවත් නැහැ. "දුවන්න, පර්සි!" එයා කෑගැසුවා.

මගේ ඉදිරියට පනින්න එයා උත්සාහ කළත්, දඩ බල්ලා ඊට වඩා වේගවත් වුණා. එයාට උඩින් පැන්න ඌ සද්දන්ත හෙවණැල්ලක් වගේ ඇවිත් මගේ ඇඟේ වදිද්දී මාව පිටුපසට ඇද වැටුණා. ඌගේ දළිපිහි වගේ තියුණු නිය මගේ සන්නාහය ඉරාගෙන යනවා මට

දැනුණා. කඩදාසි හතලිහක විතර මිටියක් එකින් එකට ඉරනවා වගේ, තදින් වැදෙන හඬවල් ගොඩක් සමග දඩ බල්ලාගේ බෙල්ල මැදින් ඊතල පොකුරක් එළියට ආවා. ඒත් එක්කම ඒ රාක්ෂයා මගේ කකුල් දෙක ළඟ මැරිලා වැටුණා.

හාස්කමකින් වගේ මම තවමත් ජීවතුන් අතර. තීරුවලට ඉරී තිබුණු මගේ සන්නාහය ඇතුළ බලන්න මට උවමනා වුණේ නැහැ. මගේ පපුවේ දැනුණු උණුසුම්, තෙත ගතිය නිසා මාව බරපතළ ලෙස කැපී ඇති බව මම තේරුම් ගත්තා. තව තත්පරයක් පරක්කු වුණා නම්, ඒ සතා මාව රාත්තල් සියයේ මස් කුට්ටියක් කරනවා.

මුහුණේ දරුණු පෙනුමකුත්, අතේ දුන්නකුත් ඇතිව කයිරොන් අපේ දෙසට හැල්මේ දුවගෙන ආවා.

"ඩී ඉමෝර්ටල්!" ඇනබෙත් කිව්වා. "ඒ වධක භූමියෙන් ආව යම බල්ලෙක්. උන් මෙහෙ එන්නේ නැහැ... උන්ට මෙහෙට එන්න බැහැ..."

"කවුරුහරි ඌව කැඳවලා තියෙනවා," කයිරොන් කිව්වා. "කවුරුහරි කඳවුර ඇතුළෙම කෙනෙක්."

ලූක් එතැනට ආවා. එයාගේ අතේ තිබුණු කොඩිය අමතක වෙලා, එයාගේ උත්කර්ෂවත් මොහොත අවසන් වී ගිහින්.

"මේ ඔක්කොම පර්සිගේ වැරැද්ද! පර්සි තමයි ඌව කැඳවන්න ඇත්තේ" ක්ලැරිස් කෑගැසුවා.

"නිශ්ශබ්ද වෙන්න, ළමයෝ." කයිරොන් එයාට කිව්වා.

යම බල්ලාගේ සිරුර හෙවණැලි අතරට දියවෙලා, පොළොවට උරාගෙන අතුරුදහන් වූ හැටි අපි බලා සිටියා.

"ඔයාව තුවාල වෙලා," ඇනබෙත් මට කිව්වා. "පර්සි, ඉක්මනට වතුරට බහින්න."

"මට අවුලක් නැහැ."

"නෑ. අවුලක් තියෙනවා." එයා කිව්වා. "මේක හොඳට බලාගන්න, කයිරොන්."

වාද කරන්න බැරි තරමට මම මහන්සියෙනුයි සිටියේ. මුළු කඳවුරම මගේ වටේට එකතු වෙද්දී, මම ආපසු ඇළට බැස්සා.

Scanned with CamScanner

එසැණින්ම මට වඩාත් හොඳ ගතියක් දැනෙන්න ගත්තා. මගේ පපුවේ වූ කැළඹීම් ටිකෙන් ටික නැසෙනවා මට දැනුණා. කඳවුරුකරුවන්ගෙන් සමහරෙක් පුදුමයෙන් හුස්ම ඉහළට ඇද්දා.

"බලන්න, ම-මම දන්නේ නෑ ඇයි කියලා," සමාව ඉල්ලන අදහසින් මම කිව්වා. "මට කණගාටුයි..."

ඒත් එයාලා බලා සිටියේ මගේ තුවාල සුව වූ දෙස නොවෙයි. මගේ ඔළුවට උඩින් තිබූ යම් දෙයක් දිහා එයාලා ඇසිපිය නොගසා බලාගෙන සිටියා.

"පර්සි," ඇඟිල්ල දිගු කර පෙන්වමින් ඇනබෙත් කතා කළා. "ම..ම..."

මම උඩ බලන විටත් සලකුණ මැකී යන්න පටන්ගෙන තිබුණා, ඒත්, කොළ පාට එළියකින් බැබළෙමින්, කැරකුණු ඒ රූපය හඳුනා ගන්න තවමත් මට පුළුවන්කම තිබුණා. ඒ තුඩු තුනක හෙල්ලයක්: ත්‍රිශූලයක්.

"ඔයාගේ තාත්තා," ඇනබෙත් මිමිණුවා. "මේක නම් ඇත්තටම හොඳ නැහැ."

"තීරණය ලැබුණා." කයිරොන් නිවේදනය කළා.

මගේ වටේටම සිටි කඳවුරුකරුවෝ දණ ගසන්න පටන් ගත්තා. වැඩි කැමැත්තක් නොපෙන්වූවත්, ඒරීස් කැබිනයේ අය පවා දණ ගැසුවා.

"මගේ තාත්තා?" මම ඇසුවේ සම්පූර්ණයෙන්ම අවුල් වෙලායි.

"පොසෙයිඩන්," කයිරොන් කිව්වා. "පෘථිවිය සොලවන්නා, කුණාටු ගෙන එන්නා, තුරඟයින්ගේ උත්පාදකයා, සැරදේවා! පර්සියස් ජැක්සන්, සමුද්‍රයට අධිපති දෙවියන්ගේ පුත්‍රයා."

09

මට ගවේෂණයකට යන්න මඟ පෑදුණා

ඊළඟ දවසේ උදෙන්ම කයිරොන් මාව කැබින් අංක තුනට මාරු කළා.

එය කාත් එක්කවත් හවුලේ පාවිච්චි කරන්න මට සිද්ධ වුණේ නැහැ. මගේ බඩු ඔක්කෝම: මිනටෝර් අඟයි, අමතර ඇඳුම් කට්ටලයයි, අඩුම-කුඩුම මල්ලයි තියාගන්න මට ඇති තරම් ඉඩ තිබුණා. රෑ කෑම වෙලාවට මගේම මේසයක වාඩි වෙන්නත්, මට උවමනා ක්‍රියාකාරකම් තෝරාගන්නත්, මම කැමති වෙලාවට කැබිනයේ විදුලි බුබුළු නිවා දමන්නත් මට අවසර ලැබුණා. තවදුරටත් අනෙක් අය කියන දේවල් අහන්න මට සිද්ධ වුණේ නැහැ.

ඉතින්, ඔය විදිහට මගේ තත්වය සම්පූර්ණයෙන්ම මූසල වුණා.

මාව තැනකට බාරගත්තා වගේ මට දැනෙන්න ගන්නකොටම, අන්තිමේදී මට ගෙදරක් විදිහට කැබින් එකොළහ ලැබුණා කියලා හිතනකොටම, මටත් සාමාන්‍ය ළමයෙක් විදිහට - එහෙමත් නැත්නම් අර්ධ-ලෝහිත ළමයෙක්ට ඉන්න පුළුවන් තරම් සාමාන්‍ය විදිහට ඉන්න ඉඩ ලැබෙයි කියලා හිතන්න පටන් ගන්නකොටම මාව අනෙක් අයගෙන් වෙන්කරලා, තනි කළේ හරියට මට බෝවෙන ලෙඩක් හැදිලා වගෙයි.

යම බල්ලා ගැන කිසිවෙක් මතක් නොකළත්, මම නැති තැන එයාලා ඒ ගැන කතා වෙන බව මට දැනුණා. ඒ ආක්‍රමණය නිසා හැම

දෙකාම බය වෙලා. එයින් පණිවුඩ දෙකක් ලැබුණා: පළවෙනි එක, මම සමුද්‍ර දෙවියන්ගේ පුතා කියලා, දෙවැනි එක, මාව මරන්න එක රැක්ෂයින් කිසිම දේකට නතර වෙන්නේ නැහැ කියලා. ආරක්ෂිතයි කියලා නිතරම සලකපු කඳවුරක් වුණත් ආක්‍රමණය කරන්න උන්ට පුළුවන්.

මගෙන් හැකි තරම් ඈත්වෙලා ඉන්න අනෙක් කඳවුරුකරුවෝ වගබලා ගත්තා. කැලෑවේදී මම ඒරීස්ට කළ දේ නිසා කැබින් එකොළහේ අය මාත් එක්ක කඩු සටන් පුහුණුවීම් කරන්න බය වුණා. ඒ නිසා, මගේ පුහුණුවීම් තිබුණේ ලූක් එක්ක විතරයි. සටන් පුහුණුවීම්වලදී එයා වෙන කවරදාටත් වඩා තදින් මට පහර දෙන්න පටන් ගත්තා. ඒ වගේම, ඒ ක්‍රියාකාරකම්වලදී මට සිද්ධ වූ තැලීම්, සීරීම් ගැන වද වීමත් එයා නතර කළා.

"ඔයා කරන පුහුණුවීම් ඔක්කොම ඔයාට උවමනා වෙන්නයි යන්නේ," අපි කඩු සහ ගිනි පන්දම් එක්ක වැඩ කරන අතරේ එයා අනාවැකියක් කිව්වා. "දැන් අපි ආපහු අර 'පොළොං හිස ගසා දමන පාර' කරමු. එක දිගට පනස් පාරක්."

තවමත් උදේ වරුවට මට ග්‍රීක පාඩම් කියා දෙන්න ඇනබෙත් ආවා, ඒත් එයා ඉස්සරට වඩා කලබල වෙලා ඉන්නවා වගෙයි පෙනුණේ. මම මොනවා හරි කියන හැම වතාවකදීම එයා මට රැවුවේ හරියට මම මේ දැන් එයාගේ ඇස් දෙක මැදට ඇන්නා වගෙයි.

පාඩම් ඉවර වෙලා එයා ආපසු ගියේ, "ගවේෂණයක්..., පොසෙයිඩන්?... ජරා, කුණු වෙච්ච..., සැලැස්මක් හදන්නම වෙනවා..." වගේ දේවල් එයාටම මුමුණාගනිමින්.

ක්ලැරිස් පවා මගෙන් ඈත්වෙලා හිටියා, ඒත් එයා මගේ දිහාවට හෙළූ විසකුරු බැලුම්වලින් මට පැහැදිලි වුණේ, එයාගේ මායා හෙල්ල කඩා දැම්මාට මාව මරන්න තරම් තරහවක් එයාට තිබුණා කියලායි. එයා මට කෑගහලා බැන්නා නම්, ගැහුවා නම් ඊට වඩා හොඳයි කියලා මට හිතුණා. අනෙක් අය මාව නොසලකා ඉන්නවාට වඩා, එයාලා එක්ක රණ්ඩුවකට හරි පැටලෙන්න මම කැමති වුණා.

මාව තුරුස්සන කෙනෙක් කඳවුරේ ඉන්න බව මම දැන ගත්තේ එක රෑක මම, මගේ කැබින් එකට යද්දී දොරෙන් ඇතුළට දමා තිබුණු සාමාන්‍ය මිනිසුන්ගේ පත්තරයක් නිසයි. නාගරික පුවත් පිටුව පෙරළා තිබූ එය 'නිව්යෝර්ක් ඩේලි නිවුස්' පත්තරේ පිටපතක්. ඒ ලිපිය

කියවන්න මට පැයක් විතර ගියේ, මගේ කේන්තිය වැඩි වෙන තරමට, පිටුවේ තිබූ වචනත් පාවෙනවා වැඩි වූ නිසායි.

පසුගියදා සිදූ වූ පුදුමාකාර මෝටර් රථ අනතුරෙන් පසු මව සහ පුතා තවමත් අතුරුදහන්!

සැලී ජැක්සන් සහ ඇයගේ පුත් පර්සි, අබිරහස් ලෙස අතුරුදන් වී සතියක් ගතවී ඇතත් තවමත් ඔවුන්ව සොයා ගැනීමට නොහැකි වී ඇත. ඔවුන්ගේ පවුලට අයත් '78 කැමරෝ වර්ගයේ මෝටර් රථය දරුණු ලෙස පිලිස්සී තිබියදී පසුගිය සෙනසුරාදා උතුරු ලෝන්ග් අයිලන්ඩ් පාරෙන් සොයා ගන්නා ලදී. එය සොයාගන්නා අවස්ථාව වන විට එහි වහලය ඉරී, ඉදිරි අක්ෂ දණ්ඩ බිඳී තිබුණු අතර, මෝටර් රථය අඩි සිය ගණනක් ලිස්සා යැමෙන් පසු පුපුරා ගොස් තිබුණි.

මව සහ පුතා සති අන්ත නිවාඩුවක් ගත කිරීමට මොන්ටවුක් බලා ගොස් තිබුණත්, තවමත් හෙළිදරව් කර ගත නොහැකි වූ හේතුවක් නිසා ඔවුන් ඉක්මනින්ම නැවතත් පිටව ගොස් තිබුණි. අනතුර සිදු වූ ස්ථානයේ තිබී කුඩා රුධිර පැල්ලම් කිහිපයක් සොයාගෙන තිබුණමුත්, අතුරුදන් වූ ජැක්සන්ලා පිළිබඳව කිසිම හෝඩුවාවක් සොයා ගැනීමට නොහැකි වී ඇත. ගම්බද ප්‍රදේශවාසීන් පවසා තිබුණේ අනතුර සිදු වූ කාලවකවානුව තුළදී අසාමාන්‍ය කිසිවක් දක්නට නොලැබුණ බවයි.

ජැක්සන් මහත්මියගේ සැමියා වන ගේබ් අග්ලියානෝ පවසන්නේ, ඔහුගේ සුළු-පුතා වන පර්සි ජැක්සන්, පාසල් ගණනාවකින් ඉවතට දමනු ලැබූ, සාහසික ක්‍රියාවලට නැඹුරුවක් දක්වන කරදරකාරී ළමයෙකු බවයි.

මවගේ අතුරුදන් වීමට පුතාව සැක කරන බවක් පොලීසිය විසින් සඳහන් නොකළ ද, අපරාධය සිදු වූ ආකාරය පිළිබඳව හෙළිදරව් කර ගැනීමට ද ඔවුන් සමත්ව නැත. පහත දක්වා ඇත්තේ සැලී ජැක්සන්ගේ සහ පර්සි ජැක්සන්ගේ මෑතකදී ගත් ඡායාරූප දෙකකි. මොවුන් පිළිබඳව කිසියම් තොරතුරක් වෙතොත් පහත දැක්වෙන ගාස්තු රහිත දුරකථන අංකය අමතා ඒ පිළිබඳව දැනුම් දෙන ලෙස පොලීසිය ජනතාවගෙන් ඉල්ලා සිටී.

එහි දක්වා තිබූ දුරකථන අංකය කළු පාට පෑනකින් රවුම් කරලා තිබුණා.

පත්තරය ගුළි කරලා පැත්තකට විසි කළ මම හිස් කැබිනයේ වූ මගේ ඇඳ උඩට කඩාගෙන වැටුණා.

"විලුපි මුහුද තියෙන්නෙ," මම මූසල විදිහට කිව්වා.

***

එදා රෑ, මේ සරම් කාලයකට දකපු නරකම හීනය මම දැක්කා.

කුණාටුවක් මැද්දේ මම වෙරළක දුවමින් සිටියා. මේ වතාවේ, මට පිටුපසින් තිබුණේ නගරයක්. ඒත් ඒ නිව්යෝර්ක් නෙවෙයි කියලා මම තේරුම් ගත්තේ ඒ නගරය පැතිරී තිබුණු ආකාරය වෙනස් නිසායි. ගොඩක් පුළුල්ව පැතිරුණු නගරයේ ගොඩනැගිලි අතරින්, පාම් ගස් සහ කුඩා කඳුවැටි ඈතින් පෙනෙන්න තිබුණා.

සර සියයක් විතර ඈතින් රළ අතරේ පිරිමි දෙන්නෙක් රණ්ඩු වෙමින් සිටියා. මාංශ පේශීන්ගෙන් පිරුණු ඇඟවල්, දිග කොණ්ඩා සහ රැවුල නිසා එයාලාව පෙනුණේ ටී.වී එකේ ඉන්න මල්ලවපොර ශූරයෝ දෙන්නෙක් වගෙයි. ඒ දෙන්නාම කඩා හැලෙන ග්‍රීක කබායවල් හැඳ සිටියා. එක්කෙනෙක්ගේ නිල් පාට, අනෙකාගේ කොළ පාට. ඒ දෙන්නා, එකිනෙකාව බදාගෙන පොර අල්ලමින්, පයින් ඇන ගනිමින්, ඔළුවෙන් හප්පා ගත්තා. ඒ දෙන්නා එකට සම්බන්ධ වූ සෑම වතාවකදීම අකුණු කොටමින්, අහස අඳුරු වී, සුළඟත් වැඩි වුණා.

හේතුව මොකක්ද කියා නොතේරුණත්, එයාලාව නතර කරන්න මට උවමනා වුණා. ඒත්, මම වේගයෙන් දුවන්න උත්සාහ කළ තරමට සුළඟෙන් මාව පිටුපසට තල්ලු වුණා. අන්තිමේදී, මම පතුල්වලින් වැලි හාරමින්, එක තැන දුවමින් සිටියා.

කුණාටුවේ ගර්ජනාවට උඩින්, නිල් කබාය හැඳ සිටි කෙනා, කොළ කබාය හැඳ සිටි කෙනාට කෑගසන හඬ ඇහුණා. ඒක ආපහු දෙනවා! ඒක ආපහු දෙනවා! හරියට හෝඩියේ පන්තියේ ළමයෙක් සෙල්ලම් බඩුවකට රණ්ඩු වෙනවා වගෙයි.

රළ පෙළ තවත් ලොකු වෙමින් වෙරළේ හැපුණේ, ලුණු මිශ්‍ර පිපිසක් මගේ ඇසටත් ඉසිමිනුයි.

ඕක නවත්තපන්! රණ්ඩුව නවත්තපන්! මම කෑගැහුවා.

පොළොව වෙව්ලුවා. පොළොව යට කොතැනින්දෝ සිනාවක හඬක් ඇහුණා. මගේ ඇඟේ ලේ අයිස්වලට හැරෙන තරමට ඒ හඬ ගැඹුරු සහ දුෂ්ට වුණා.

පහළට එන්න, පුංචි වීරයෝ, ඒ හඬ කොඳුරමින් තාලෙට කිව්වා. පහළට එන්න!

පොළොව මැදටම පැල්මක් විවර කරමින් මට යටින් වූ වැල්ල දෙබෑ වුණා. මගේ කකුල් ලිස්සා ගියා. කළුවර මාව ගිලගත්තා.

මාව ඇද වැටෙනවා, කියන හැඟීමත් එක්ක මම ඇහැරුණා.

මම තවමත් කැබින් අංක තුනේ ඇඳ උඩ. දැන් පාන්දර බව මගේ ඇඟ කිව්වත්, ඒ වෙද්දිත් එළිය වැටිලා තිබුණේ නැහැ. කඳු අතරේ අකුණු පෙරළෙමින්, කුණාටුවක් කැකෑරෙමින් තිබුණා. ඒ කියන්නේ, ඒක මම හීනෙන් දැකලා නෙවෙයි.

පිටතින් ක්ලොප්-ක්ලොප් හඬකුත්, ඉන්පසු එළිපත්තට කුරයකින් තට්ටු කරන හඬකුත් ඇහුණා.

"ඇතුළට එන්න?"

කනස්සලු පෙනුමක් එක්ක ඇතුළට එබුණේ ග්‍රෝවර්. "මිස්ටර් ඩී ට ඔයාව මුණ ගැහෙන්න ඕනැලු."

"ඇයි ඒ?"

"එයාට මරන්න ඕනැලු... මං කියන්න ගියේ, ඒක එයාම ඔයාට කියනකම් හිටියොත් හොඳයි."

කලබලෙන් ඇඳුම් හැඳගත් මම ග්‍රෝවර් එක්ක ගියේ, මම ලොකු අමාරුවක වැටිලා, කියන විශ්වාසයෙන්.

දවස් ගාණක් තිස්සේ මම මහ ගෙදරින් කැඳවුමක් බලාපොරොත්තුවෙනුයි සිටියේ. දැන් මම පොසෙයිඩන්ගේ, ඒ කියන්නේ ළමයි බිහි කරන්න තහනම්, ලොකු තුන්කට්ටුවෙන් කෙනෙකුගේ පුතා කියලා ප්‍රසිද්ධියේ හෙළි වුණාට පස්සේ, මම ජීවතුන් අතර ඉඳීමම බරපතළ අපරාධයක් වෙන්න ඇති කියලායි මම හිතුවේ. මම ජීවත් වෙලා සිටියාට මට දියයුතු හොඳම දඬුවම මොකක්ද කියලා අනෙක් දෙවිවරු මෙච්චර දවස් වාද කරන්න ඇති. දැන් මිස්ටර් ඩී ලෑස්ති වෙන්නේ එයාලාගේ තීන්දුව දැනුම් දෙන්නයි.

ලෝන්ග් අයිලන්ඩ්වලට ඉහළ අහස කැකෑරෙන තීන්ත සුප් එකක් වගෙයි පෙනුණේ. කළු වැහි වලා කීපයක් අපේ දෙසට ඇදෙනවා දැකලා, අපිට කුඩයක් ඕනෑ වෙයිද කියලා මම ග්‍රෝවර්ගෙන් ඇසුවා.

"නැහැ," එයා කිව්වා. "අපිට වැස්සක් උවමනා නැත්නම් මෙහෙට කවදාවත් වහින්නේ නැහැ."

"එහෙනම්, අර මොකක්ද?" කුණාටුව තිබුණු දිසාව පෙන්වමින් මම ඇසුවා.

එයා අහස දෙසට නොසන්සුන් බැල්මක් හෙළුවා. "ඒක අපිට මග ඇරලා යයි. හරක කාලගුණය හැම වෙලාවෙම කරන්නේ එහෙමයි."

එයා කිවූ දේ හරි කියලා මට තේරුණා. මම මෙහෙ සිටි සතියක කාලයේදී, එකම වතාවක්වත් වැස්සේ නැහැ. මට දකින්න ලැබුණු වැහි වලාකුළු සියල්ල දෙණිය අද්දරින් ඈතට පාවෙලා ගියා.

ඒත් මේ කුණාටුව... ඒක නම් දුවැන්ත එකක් වගෙයි.

අප්පන්ද්‍ර පිටියේ ඇපලෝ කැබිනයේ ළමයි, සැටර්ලාට එරෙහිව උදෑසන ක්‍රීඩා වටය ක්‍රීඩා කරමින් සිටියා. ඩයනයිසියස්ගේ නිවුන්නු දෙන්නා ස්ට්‍රෝබෙරි යායවල් අතරින් යමින්, පැළවලට වැවෙන්න උදවු කරමින් සිටියා. සැම දෙනාම, තම-තමන්ගේ එදිනෙදා වැඩවල යෙදී සිටියත්, එයාලා ආතතියකින් ඉන්නවා වගෙයි පෙනුණේ. ඒ හැමෝම කුණාටුව දෙසට ඇස් රඳවාගෙන සිටියා.

ග්‍රෝවර් සහ මම මහ ගෙදර ඉදිරි දොර පියස්ස දෙසට ගියා. කොටි පුල්ලි වැටුණු හවායි කමිසයක් හැඳගෙන, කෝක් එකක් එක්ක කාඩ් සෙල්ලම් කරන මේසයේ ඩයනයිසියස් වාඩි වී සිටියේ මම පළවෙනි දවසේ එද්දී සිටි විදිහටමයි. මේසයේ විරුද්ධ පැත්තේ කයිරොන්. එයාගේ බොරු රෝද පුටුවේ වාඩිවෙලා සිටියා. ඒ දෙන්නා කාඩ් සෙල්ලම් කරමින් සිටියේ අදෘශ්‍යමාන ප්‍රතිමල්ලවයෝ දෙන්නෙකුට විරුද්ධවයි. කාඩ් කට්ටල දෙකක් වාතයේ පාවෙමින් තිබුණා.

"හොඳයි. හොඳයි," මිස්ටර් ඩී බලන්නේවත් නැතිව කිවුවා. "අපේ පුංචි සුපිරි තරුව."

මම නතර වෙලා බලාගෙන සිටියා.

"ළඟට එනවා," මිස්ටර් ඩී කිවුවා. "ඒ වගේම තමයි, නාකි කාවාටි රැවුලා ඔහේගේ තාත්තා වුණ පලියට, මං ඔහේට අෂ්ටාංග නමස්කාරය කරයි කියලා හිතන්න එපා, කොල්ලෝ."

විදුලි කෙටීම් ජාලයක් වලාකුළු අතරේ පැතිරුණා. අකුණු හඬට ගෙදර ජනේල පවා සෙලවුණා.

"බලා, බලා, බලාන්," ඩයනයිසියස් ඇද කළා.

කයිරොන්, එයාගේ කාඩ් අත ගැන නැති උනන්දුවක් මවා පෑවා. ග්‍රෝවර්, එයාගේ කුර ඉස්සරහට-පස්සට පද්දවමින් ගරාදි වැටට මුවා වුණා.

"මගේ විදිහට වැඩ කරන්න ඉඩ දුන්නා නම්," ඩයනයිසියස් කිවුවා, "මම ඔහේගේ කැල්ලෙන් කැල්ලට පුච්චලා දානවා. ඊට පස්සේ අළු ටික අතුගාලා දාලා, අපිට එන්න තියෙන කරදර ගොඩක් වළක්වා ගන්න තිබ්බා. ඒත්, එහෙම කරන එක මේ කඳවුරට මාව එවපු පරමාර්ථයට එදිරි වීමක් කියලායි කයිරොන් නම් හිතන්නේ: මේ ඔලමොට්ටලයින්ව උපද්‍රවවලින් ආරක්ෂා කරන එකට."

"ස්වයංසිද්ධ දහනයත් එක විදිහක උපද්‍රවයක් තමයි, මිස්ටර් ඩී." කයිරොන් මැදට පැන්නා.

"විකාර," ඩයනයිසියස් කිවුවා. "කොල්ලට කිසිම දෙයක් දැනෙන්නේවත් නැතිවෙයි. කොහොම වුණත්, සංවර වෙන්න මම එකඟ වුණ නිසා, ඒ වෙනුවට ඔහේව ඩොල්පින් කෙනෙක් කරලා, ඔහේගේ තාත්තා ළඟටම ආපහු යවන්නයි මං කල්පනා කරන්නේ."

"මිස්ටර් ඩී," කයිරොන් අනතුරු ඇඟෙව්වා.

"ඔහ්, හරි, හරි," ඩයනයිසියස් ටිකක් ලිහිල් වුණා. "ඒ ඇරෙන්න තවත් එක විකල්පයක් තියෙනවා. හැබැයි ඒක නම් මාරාන්තික විදිහේ තකතීරුකමක්." ඩයනයිසියස් නැගිටිද්දී අදෘශ්‍යමාන ක්‍රීඩකයෝ, එයාලාගේ කාඩ් අත් මේසයට අත හැරියා. "හදිස්සි රැස්වීමකට මම ඔලිම්පස්වලට යනවා. මං ආපහු එද්දිත් මේ කොල්ලා කඳවුරේ හිටියොත්, මම එයාව බෝතල් නහය තියෙන ඩොල්පින් කෙනෙක් කරලා අත්ලාන්තික් මුහුදට අරිනවා. ඔහේට තේරුණාද? ඒ වගේම, පර්සියස් ජැක්සන්, ඔහේට යන්තමින් හරි මොළයක් කියලා දෙයක් තියෙනවා නම්, ඔහේ අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ කියලා කයිරොන් යෝජනා කරන දේට වඩා, ඒක හොඳ තේරීමක් කියලා ඔහේටම පෙනෙයි."

කාඩ් කුට්ටමෙන් කාඩ් පතක් අතට ගත් ඩයනයිසියස් එය අඹරද්දී, ප්ලාස්ටික් සෘජුකෝණාස්‍රයකට හැරුණා. ක්‍රෙඩිට් කාඩ් එකක්ද? නැහැ. ආරක්ෂක කපොලු අවසර පත්‍රයක්.

එයා ඇඟිලිවලින් අසුරක් ගැසුවා.

Scanned with CamScanner

වාතය හැකිළෙමින් එයා වටේට හැමෙනවා වගේ පෙනුණා. ප්‍රක්ෂේපිත රූපයකට හැරුණු එයා, ඉන්පසු සුළඟක් වුණා. ඊටත් පස්සේ බලද්දී, අලුත් මිදිවල සුවඳ විතරක් ඉතිරි කරලා එයා ගිහින්.

කයිරොන් මගේ දිහා බලලා හිනාවුණා, ඒත් එයාට තිබුණේ මහන්සි වුණ පෙනුමක් වගේම පීඩනයට ලක්වුණ පෙනුමක්. "කරුණාකරලා වාඩි වෙන්න, පර්සි. ග්‍රෝවර්, ඔයාත්."

අපි වාඩි වුණා.

කයිරොන්, එයාගේ කාඩ් ටික මේසය උඩින් තැබුවා. එතැන තිබුණේ එයාට ප්‍රයෝජනයට ගන්න බැරි වූ දිනුම් අතක්.

"මට කියන්න, පර්සි," එයා ඇසුවා. "යම බල්ලා ගැන ඔයා මොකද හිතුවේ?"

ඒ නම ඇසෙද්දිත් මාව වෙව්ලුවා.

අයියෝ, ඒක මොකක්ද. යම බල්ලෙක්ව මට උදේ කෑමටත් එදි, වගේ කතාවක් මම කියනවා අහන්න සමහරවිට කයිරොන්ට උවමනා වෙන්න ඇති. ඒත් බොරුවක් කියන්න මට හිතුනේ නැහැ.

"ඒකා මාව බය කළා," මම කිව්වා. "ඔයා ඌට විද්දේ නැත්නම් මෙලහකටත් මම මැරිලා."

"ඔයාට ඊටත් වඩා භයානක දේවල් මුණ ගැහේවි, පර්සි. ඔයා මේක ඉවර කරන්න කලින් ගොඩාක් දරුණු දේවල් මුණ ගැහේවි."

"ඉවර කරන්න... මොකක්ද?"

"ඔයාගේ ගවේෂණය, ඇත්තටම. ඔයා ඒක බාර ගන්නවද?"

ඇඟිලි හරස් කරමින් සිටි ග්‍රෝවර් දෙසට මම ඉක්මන් බැල්මක් හෙළුවා.

"ම්... සර්," මම කිව්වා. "ඒක මොකක්ද කියලා ඔයා තාම මට කිවුවේ නැහැනේ."

කයිරොන්ගේ මුහුණ පුලුටු වුණා. "හොඳයි, ඒක තමයි අමාරුම කොටස. විස්තර කරන එක."

අකුණක ගර්ජනාවක් දෙණිය හරහා ඇදී ගියා. කුණාටුවේ අඳුරු වලාකුළු දැන් දෙණිය අද්දරටම ඇවිල්ලා. අහසයි මුහුදයි එකට කැකෑරෙනවා වගෙයි කියලා ඈත බලද්දී මට හිතුණා.

"පොසෙයිඩන් සහ සියුස්," මම කිව්වා. "මොකක් හරි වටිනා දෙයක් වෙනුවෙන් ඒ දෙන්නා රණ්ඩු කරගන්නවා... හොරකම් කරලා තියෙන දේ වෙනුවෙන්. එහෙම නේද?"

කයිරොන් සහ ග්‍රෝවර් බැල්මක් හුවමාරු කරගත්තා.

කයිරොන්, එයාගේ රෝද පුටුවේ ඉදිරියට වෙලා වාඩි වුණා. "ඔයා කොහොමද ඒක දැනගත්තේ?"

මගේ කම්මුල් රත් වෙනවා මට දැනුණා. මගේ හැකර කට අරින්නේ නැතිව ඉන්නයි මට තිබුණේ. "නත්තලෙන් පස්සේ ඉඳලම කාලගුණය හරිම අමුතුයි, හරියට අහසයි මුහුදයි යුද්ධ කරනවා වගෙයි. ඊට පස්සේ, මම ඇනබෙත් එක්ක කතා කළා. මොකක්දෝ හොරකමක් ගැන කතාවක් එයාට ඇහිලා තිබුණා. තව... මට මෙහෙම හීන වගයකුත් පෙනුණා."

"මං ඒක දැනගෙන හිටියා." ග්‍රෝවර් කිව්වා.

"කට වහනවා, සැටර්." කයිරොන් අණ කළා.

"ඒත්, ඒක එයාගේ ගවේෂණය නේ!" ග්‍රෝවර්ගේ ඇස් උද්වේගයෙන් දිලිසුනා. "ඒක එහෙම වෙන්නම ඕනෑ!"

"ඔරකල්ට විතරයි ඒක තීරණය කරන්න පුළුවන්." කයිරොන්, එයාගේ රළු රැවුල හෙමින් හෙමින් අත ගෑවා. "ඒ කොහොම වුණත්, පර්සි, ඔයා හරි. ඔයාගේ තාත්තායි සියුස් යි ශතවර්ෂ ගාණකට පස්සේ රණ්ඩු කරගන්නවා. හොරකම් කරලා තියෙන, වටිනා දෙයක් වෙනුවෙනුයි ඒ දෙන්නා රණ්ඩු වෙන්නේ. හරියටම කියනවා නම්: විදුලි අකුණක් වෙනුවෙන්."

මම කලබලෙන් හිනාවුණා. "මොකක්?"

"මේක සැහැල්ලුවට ගන්න එපා," කයිරොන් අනතුරු ඇඟෙව්වා. "මම මේ කියන්නේ ඔයා දෙක වසරේදී සෙල්ලම් කරන්න ගත්ත සෙල්ලම් බඩුවක් ගැන නෙවෙයි. මම කියන්නේ අඩි දෙකක් දිග, ඉහළම වර්ගයේ දිව්‍යමය ලෝකඩවලින් හදලා, දේව මට්ටමේ පුපුරණ ද්‍රව්‍යවලින් දෙකොණම මුද්‍රා තියපු සිලින්ඩරයක් ගැන."

"ඔහ්."

"සියුස්ගේ ප්‍රධාන අකුණ," කතාවට වැඩි-වැඩියෙන් උනන්දු වෙමින් කයිරොන් කියාගෙන ගියා. "එයාගේ බලයේ සංකේතය, අනිත්

හැම විදුලි අකුණකම පතරොම. ටයිටන්ලාට එරෙහිව කළ යුද්ධය වෙනුවෙන් සයික්ලොප්ස්ලා (එක ඇසක් පමණක් ඇති යෝධයෝ) නිපදවපු පළවෙනි අවිය. එටිනා කඳු මුදුන විනාශ කරලා, ක්‍රෝනොස්ව, එයාගේ සිංහාසනයෙන් බිමට ඇදලා දාපු අකුණ; ප්‍රධාන අකුණ. ඒක ඇතුළේ අහුරලා තියෙන ශක්තියත් එක්ක බලනකොට මිනිස්සු හදන හයිඩ්‍රජන් බෝම්බ නිකං රතිඤ්ඤ වගේ."

"එතකොට, ඒක නැති වෙලාද?"

"හොරකම් කරලා." කයිරොන් කිවුවා.

"කවුද?"

"කාටද?" කයිරොන් නිවැරදි කළා. "ඔයා තමයි ඒක කළේ."

මම කට ඇරන් බලාගෙන සිටියා.

"අඩු තරමේ -" කයිරොන් අතක් එසෙව්වා- "සියුස් හිතන්නේ එහෙමයි. දක්ෂිණායනය අතරතුරේදී, දෙවිවරුන්ගේ අන්තිම මහා මණ්ත්‍රණ සභාව තියෙද්දී, සාමාන්‍ය මනස්ගාත ගැන සියුස්, පොසෙයිඩන් දෙන්නා අතරේ වාදයක් ඇති වුණා; 'රෙයා අම්මා වැඩිපුරම කැමති වුණේ ඔයාට, මුහුදු විපත්තිවලට වඩා ගුවන් විපත්ති විශිෂ්ටයි,' වගේ විකාර කතා. පස්සේ, සියුස්ට තේරුණා එයාගේ ප්‍රධාන අකුණ නැතිවෙලා කියලා. එයාගේ සිංහාසන ශාලාවේදීම, එයාගේ ඉදිරිපිටදීම ඒක අරගෙන ගිහින්. එයා ඒ වෙලාවේම පොසෙයිඩන්ට චෝදනා කළා. මෙහෙමයි, දෙවි කෙනෙක්ට තවත් දෙවියෙක්ගේ බලයේ සංකේතය කෙලින්ම පැහැර ගන්න බැහැ - ඒක පරණම දිව්‍ය නීතිවලින් තහනම් කරපු දෙයක්. ඒත් ඔයාගේ තාත්තා මනුෂ්‍ය වීරයෙක්ව යොදවලා ඒක ගත්තා කියලායි සියුස් විශ්වාස කරන්නේ."

"ඒත්, මම ගත්තේ නෑ -"

"ඉවසිල්ලෙන් අහගෙන ඉන්න, දරුවෝ," කයිරොන් කිවුවා. "එහෙම සැක කරන්න සියුස්ට හොඳ හේතු කීපයක්ම තියෙනවා. සයික්ලොප්ස්ලාගේ කම්මල් තියෙන්නේ මුහුද යට. ඒකෙන් අකුණ හැදුව අය ගැන පොසෙයිඩන්ට යම් ආභාෂයක් ලැබෙනවා. සියුස් විශ්වාස කරන්නේ පොසෙයිඩන් ප්‍රධාන අකුණ අරගෙන, දැන් සයික්ලොප්ස්ලා ලවා හොර රහසේම ඒකේ නීති විරෝධී පිටපත් හදලා ආයුධ ගබඩා පුරවා ගන්නවා ඇති කියලා. ඊට පස්සේ, සියුස්ව, එයාගේ රාජාසනයෙන් ඇදලා දාන්න ඒවා පාවිච්චි කරාවි කියලා

එයා හිතනවා. සියුස්ට විශ්වාසයක් නැති එකම දේ, අකුණ හොරකම් කරවන්න පොසෙයිඩන් යොදවපු වීරයා කවුද කියන එකයි. ඒත් දැන්, ඔයාව පුතා විදිහට පොසෙයිඩන් ප්‍රසිද්ධියේම පිළිගෙන තියෙනවා. ශීත සෘතුවේ නිවාඩුවට ඔයා හිටියෙත් නිව්යෝක්වල. ඔලිම්පස්වලට හොරෙන් රිංගන එක ඔයාට ලේසියෙන්ම කරන්න පුළුවන්. ඉතින්, මේ දේවල් නිසා සියුස් හිතන්නේ හොරා කවුද කියලා එයා හොයා ගත්තා කියලා."

"ඒත්, මං කවදාවත් ඔලිම්පස්වලට ගිහිල්ලා නැහැ නේ! සියුස්ට නම් පිස්සු!"

කයිරොන්, ග්‍රෝවර් දෙන්නම සැකයෙන් වගේ අහස දෙස බැලුවා. ග්‍රෝවර් කියූ විදිහට වලාකුළු අපිව මග ඇරලා යන පාටක් නම් පෙනෙන්න තිබුණේ නැහැ. ඒවා කෙලින්ම දෙණිය පැත්තට පෙරළී ඇවිත්, මිනී පෙට්ටියක පියන වැසුවා වගේ අපිව වසාගත්තා.

"එර්, පර්සි..." ග්‍රෝවර් කිවුවා. "අහසට අධිපති ගැන විස්තර කරන්න අපි පි- වචනේ පාවිච්චි කරන්නේ නැහැ."

"බාගදා, මානසිකව විකෘති වෙලා කියන්න පුළුවන්," කයිරොන් යෝජනා කළා. "ඒත්, මීට කලිනුත් සියුස්ව රාජාසනයෙන් පහ කරන්න පොසෙයිඩන් උත්සාහ කරලා තියෙනවනේ. මං හිතන්නේ, ඔයාලාගේ අන්තිම වාර විභාගෙට දුන්න ප්‍රශ්න පත්තරේ තිස් අට වෙනි ප්‍රශ්නේ ඒක තමයි..." එයා මගේ දිහා බැලුවේ තිස් අට වෙනි ප්‍රශ්නේ මම මතක තියාගෙන ඇති කියලා එයා ඇත්තටම බලාපොරොත්තු වෙනවා වගෙයි.

මම දෙවියෙක්ගේ ආයුධයක් හොරකම් කළා කියලා කවුරුවත් මගේ පිට වරද පටවන්නේ කොහොමද? මට අඩු තරමේ ගේබ් කාඩ් සෙල්ලම් කරන තැනකින් අහු නොවෙන්න පීසා කැල්ලක්වත් හොරෙන් ගන්න බැහැ. මම උත්තරයක් දෙනතුරු කයිරොන් බලා සිටියා.

"රත්තරන් දූලක් ගැන මොකක් හරි නේද?" මම අනුමාන කළා. "පොසෙයිඩන්, හේරා දෙන්නා, තව දෙවිගොල්ලෝ කීප දෙනෙක් එක්ක එකතුවෙලා සියුස්ව උගුලකට අහු කරගත්තා. ඊට පස්සේ, හොඳ පාලකයෙක් වෙන්න සියුස් පොරොන්දු වෙනකම් එයාලා සියුස්ට යන්න දුන්නේ නැහැ, හරිද?"

"හරි," කයිරොන් කිවුවා. "එදායින් පස්සේ සියුස් කවදාවත් පොසෙයිඩන්ව විශ්වාස කළේ නැහැ. ඇත්ත වශයෙන්ම, ප්‍රධාන අකුණ

හොරකම් කළා කියන චෝදනාව නිසා එයා ගොඩාක් හිත රිදවාගෙන ඉන්නේ. මේ දෙන්නා දන් මාස ගාණක් තිස්සේ වාද කරගන්නවා, යුද්ධයකට අර අදිනවා. ඊට පස්සේ, ගින්නට පිදුරු දම්මා වගේ දන් ඔයාත් එළියට ආවා."

"ඒත් මං පොඩි ළමයෙක් නේ!"

"පර්සි," ග්‍රෝවර්ත් කතාවට එකතු වුණා. "ඔයා සියුස් වුණා නම්, ඔයාගේ සහෝදරයා ඔයාව පරද්දවන්න යටි කුට්ටු වැඩ කරනවා කියලා ඔයා කලින් ඉඳලම හිතුවා නම්, ඊට පස්සේ, හදිස්සියේම වගේ ඔයාගේ සහෝදරයා දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ කළ පූජනීය දිවුරුම කඩලා, ඔයාට විරුද්ධව ආයුධයක් විදිහට පාවිච්චි කරන්න පුළුවන් අලුත් මනුෂ්‍ය වීරයෙක්ව බිහි කළා කියලා පිළිගත්තොත්... මේ විදිහට හිතන්න ඔයා වුණත් පෙලඹෙන්නේ නැද්ද?"

"ඒත්, මම මුකුත් කළේ නැනේ. පොසෙයිඩන් - මගේ තාත්තා - එයා ඇත්තටම මේ ප්‍රධාන අකුණ හොරකම් කළේ නැහැ, නේද?"

කයිරොන් හුස්මක් පිටකළා. "හොරකම් කිරීම පොසෙයිඩන්ගේ ගතියක් නෙවෙයි කියලා මේ දිහා කල්පනාවෙන් බලාගෙන ඉන්න හුඟක් අය පිළිගන්නවා. ඒත් සමුද්‍ර දෙවියන්ගේ තියෙන ආඩම්බරකම නිසා සියුස්ට ඒක ඒත්තු ගන්වන්න එයා යන්නේ නැහැ. උත්තරායනය වෙද්දී පොසෙයිඩන් අකුණ ආපහු දෙන්න ඕනෑ කියලා සියුස් නියම කරලා තියෙනවා. ඒ කියන්නේ ජූනි විසි එක් වෙනිදා වෙද්දී, තව දවස් දහයකින්. ඒ දිනේටම, තමන්ට හොරා කියපු එකට සමාව ඉල්ලීමක් පොසෙයිඩන්ටත් ඕනෑ. මේ සහෝදරයෝ දෙන්නාට ඇත්ත තේරුම් කරලා දෙන්න හේරාට හරි ඩිමීටර්ට හරි හෙස්ටියාට හරි පුළුවන් වෙයි කියලා මම බලාපොරොත්තු වුණා. ඒත් ඔයා ආවායින් සියුස්ගේ තරහා ඇවිස්සුනා. දන් දෙන්නාගෙන් එක්කෙනෙක්වත් ආපහු හැරෙන්නේ නැහැ. කවුරු හරි මේකට මැදිහත් වුණේ නැත්නම්, ප්‍රධාන අකුණ හොයාගෙන, උත්තරායනයට කලින් ආපහු බාර දුන්නේ නැත්නම්, එහෙ යුද්ධයක් ඇති වේවි. ඒ වගේම, ඔයා දන්නවානේ, පර්සි, සියලු සුළුසුකම් සම්පූර්ණ වුණ යුද්ධයක් මොන වගේද කියලා?"

"නරකයි?" මම අනුමාන කළා.

"අවුල් ජාලයක් වුණ ලෝකයක් හිතේ මවාගන්න. සොබාදහම, තමන් එක්කම යුද්ධ කරගන්නවා. සියුස්, පොසෙයිඩන් දෙන්නා අතරින් එක්කෙනෙක්ගේ පැත්ත ගන්න කියලා ඔලිම්පියානුවන්ට බල

කරලා. මහා විනාශයක්, මනුෂ්‍ය සංහාරයක්, මිලියන ගාණක් මැරෙයි. මුළු බටහිර ශිෂ්ටාචාරයම එකම යුධ භූමියක් වේවි, ඒක කොයි තරම් විශාල වෙයිද කියනවා නම්, ඒකත් එක්ක බලද්දී ට්‍රෝජන් යුද්ධය නිකං කොට්ට පොර තරගයක් වගේ පෙනේවි."

"නරකයි." මම ආපහු කිව්වා.

"ඒ වගේම, ඔයාට තමයි, පර්සි ජැක්සන්, මුලින්ම සියුස්ගේ උදහස විඳින්න වෙන්නේ."

වැස්ස වහින්න පටන් ගත්තා. කරමින් සිටි ක්‍රීඩාව නතර කළ අත්පන්දු ක්‍රීඩකයෝ තුෂ්නිම්භූත වෙලා අහස දෙස බලා සිටියා.

අර්ධ-ලෝහිත කන්දට මේ කුණාටුව ගෙනැත් තිබුණේ මමයි. සියුස් මුළු කඳවුරටම දඬුවම් කරන්නේ මම නිසායි. මගේ තරහාව ඇවිස්සුනා.

"එතකොට, මම මේ තකතීරු අකුණ හොයාගන්න ඕනෑ," මම කිව්වා. "ඊට පස්සේ ඒක සියුස්ට ගිහින් දෙන්න ඕනෑ."

"සියුස්ගේ දේපොළ, පොසෙයිඩන්ගේ පුතෙක් ගෙනැත් බාර දෙනවාටත් වඩා හොඳ සාමදාන යෝජනාවක් කොහෙද?" කයිරොන් කිව්වා.

"ඉතින්, ඒක පොසෙයිඩන් ළඟ නෙවෙයි නම්, කොහෙද තියෙන්නේ?"

"මං හිතන්නේ මම දන්නවා," කයිරොන්ගේ මුහුණට බැරෑරුම් පෙනුමක් ආවා. "අවුරුදු ගාණකට කලින් මට අහන්න ලැබුණු අනාවැකියක කොටසක්... හොඳයි, ඒකේ සමහර පේළිවල තේරුම මට දන් තේරෙනවා. ඒ වුණත් මම තව දේවල් කියන්න කලින්, ඔයා නිල වශයෙන් ගවේෂණය බාරගන්න ඕනෑ. ඔයා ඔරකල්ගෙන් උපදෙස් ඉල්ලන්න ඕනෑ."

"අකුණ තියෙන්නේ කොහෙද කියලා මට කලින්ම කියන්න බැරි ඇයි?"

"මම ඒක කිව්වොත්, අභියෝගය බාර ගන්න ඔයා ගොඩාක් බය වෙයි."

මම තදින් කෙළ ගිල්ලා. "හොඳ හේතුවක්."

"ඒ කියන්නේ ඔයා එකඟයි ද?"

Scanned with CamScanner

මම ග්‍රෝවර් දෙස බැලුවා, මාව පොලඹවන්න වගේ එයා ඔළුව වැනුවා.

එයාට නම් මොකද, සියුස්ට මරන්න උවමනා මාවනේ.

"කමක් නැහැ," මම කිවුවා. "ඩොල්පින් කෙනෙක් වෙනවට වඩා ඒක හොඳයි."

"එහෙනම්, ඔරකල්ගෙන් උපදෙස් ගන්න මේක තමයි වෙලාව," කයිරොන් කිවුවා. "උඩ තට්ටුවට යන්න, පර්සි ජැක්සන්, අට්ටාලයට යන්න. ඔයා ආපහු පහළට ආවාම - එතකොටත් ඔයා හොඳ සිහියෙන් හිටියොත්, අපි මේ ගැන වැඩිදුර විස්තර කතා කරමු."

තට්ටු හතරකට පස්සේ, කොළ පාට බිම් දොරක් ළඟින් පඩි පෙළ අවසන් වුණා.

මම ලණුව ඇද්දා. ලී ඉණිමගක් පහළට වට්ටමින් දොර පහළට ඇරුණා.

උඩින් ආව උණුසුම් වාතයේ තිබුණේ පුස් ගඳත්, පල් වූ ලීවල ගඳත් එක්ක තවත් මොකක්දෝ ගඳක්... ඒ ගඳ මට මතක් කළේ ජීව විද්‍යා පන්තිය. උරගයෝ. ඒ සර්පයින්ගේ ගඳ.

තදින් හුස්මක් අල්ලාගත් මම උඩට නැග්ගා.

අට්ටාලය පුරවා තිබුණේ ග්‍රීක වීරයන්ගේ සුන්බුන් වලින්: මකුළු දැල්වලින් වැසුණු යුධ සන්නාහ ආධාරක; කාලයක් දීප්තිමත්ව තිබුණත් දැන් මළ කාලා, හිල් වූ පලිහවල්; ඉතාකා, සිරස්ගේ දූපත, රෝඩියන්ගේ දේශය වගේ නම් අලවලා තිබුණු ලෙදර් ට්‍රන්ක පෙට්ටි. ලුණු වතුරේ දාලා කල් තියාගත්ත හැඳුව දේවල් පිරවූ වීදුරු බුජම් ගොඩාක් දිග මේසයක අඩුක් කර තිබුණා - කපා වෙන්කළ ලොම් පිරුණු තිය පහුරු, කහ පාට තඩි ඇස්, එක එක විදිහේ රාක්ෂයින්ගේ කොටස්. බිත්තියේ එල්ලා තිබූ දූවිලි බැඳුණු ඵලකයකට තිබුණේ යෝධ සර්ප ඔළුවක පෙනුමක්, ඒත් එහි අං දෙකකුත්, මෝර දත් ඇන්දකුත් තිබුණා. ඒ ඵලකයේ, හයිඩ්‍රා හිස-01, වුඩ්ස්ටොක්, නිව්යෝක්-1969, ලේබලයක් අලවා තිබුණා.

ඒ අතරින් භයානකම සිහිවටනය ජනේලය ළඟ, කකුල් තුනේ බංකුවක ඉන්දවා තිබුණා: ඒ මමියක්. ඒත් එය රෙදිවලින් ඔතපු ජාතියේ එකක් නෙවෙයි. ලෙල්ලක් වගේ හැකිළිලා රැළි ගැසුණු මනුෂ්‍ය ගැහැනු සිරුරක්. අත් නැති බතික් ගවුමක් හැඳ සිටි එයාගේ බෙල්ලේ පබළු

මාල ගොඩාක් තිබුණා. එයාගේ කළු, දිග කොණ්ඩයට උඩින් කොණ්ඩා පටියක් දමා තිබුණා. එයාගේ මූහුණේ සම හිස්කබල මත තුනීවට පෙනුණා. වීදුරු සුදු පාට පැළුම් දෙකක් වගේ එයාගේ ඇස් දෙක පෙනුණේ හරියට ඇත්ත ඇස් වෙනුවට එතැන ටික් බෝල දෙකක් තියලා වගෙයි. එයා නම් මැරෙන්න ඇත්තේ ගොඩාක් කාලයකට කලිනුයි.

එයා දෙස බලද්දී මගේ කොඳු ඇට පේළිය දිගේ සීතලක් පැතිරෙනවා වගේ මට දැනුණා. ඒ, එයා බංකුවේ කෙලින් වාඩි වෙලා කට අරින්න කලිනුයි. කොළ පාට මීදුමක් මමියේ ඇරුණු කටින් එළියට ගලන්න ගත්තා. ඒ දුම පොළොවේ දඟර ගැහෙමින්, පිඹින්න ගත්තේ හරියට සර්පයෝ විසි දාහක් විතර එකතු වෙලා වගෙයි. කකුල් පැටලී වැටෙන්න යමින්, මම බිම් දොර දෙසට දිව්වත්, ඊට කලින් ඒක තදින්ම වැසුණා. ඒත් එක්කම මට, මගේ ඔළුව ඇතුළෙන් කටහඬක් ඇසෙන්න ගත්තා, මගේ එක් කනකින් ලිස්සා ගිය ඒ හඬ, මගේ මොළය වටේ දරණ ගසා ගත්තා: ඩෙල්ෆි හී ආත්මය ද, ෆීබස් ඇපලෝගේ අනාගත වක්තෘ ද, අති බලැති පොළඟා ගේ මාරයා ද මමයි. ප්‍රවේශ වනු. ගවේෂකය, විමසනු.

එපා, ස්තුතියි. වැරදි කාමරයක් වගේ. මම හොයන්නේ වැසිකිළියක්, කියලා කියන්න මට උවමනා වුණා. ඒත් එහෙම නොකර, ගැඹුරු හුස්මක් ගන්න මම, මටම බල කළා.

ඒ මමියට පණ තිබුණේ නැහැ. යම් දෙයක, එහෙමත් නැත්නම්, මගේ වටේට සුළි නංවමින් තිබූ කොළ මීදුමේ රැඳි බලයේ ග්‍රාහකයා ලෙසටයි එයා සිටියේ. ඒත්, ඒ බලය මගේ ගණිත ගුරුතුමිය හෝ මිනටෝර් වගේ දුෂ්ට දෙයක් ලෙස දැනුණේ නැහැ. එය ගොඩාක්ම කිට්ටු වුණේ පලතුරු තට්ටුව ළඟ කැටි නූල් ගොතමින් සිටි ආච්චිලා තුන්දෙනා දකිද්දී දැනුණු හැඟීමටයි: පෞරාණික, බලගතු සහ කොහෙත්ම මනුෂ්‍ය නොවෙන. ඒත්, මාව මරන්නත් විශේෂ උනන්දුවක් එයාට තිබුණේ නැහැ.

"මගේ දෛවය මොකක්ද?" අහන්න තරම් ධෛර්යයක් මම හොයා ගත්තා.

තව තවත් ගන සැරේට සුළි නැංවූ මීදුම මාවත්, මගේ ළඟ තිබූ රාක්ෂ-අච්චාරු බුජම් පිරවූ මේසයත් වට කරමින් එකතු වුණා. හදිසියේම, පිරිමි හතර දෙනෙක් මේසය වටේ වාඩි වෙලා කාඩ්

සෙල්ලම් කරන්න ගත්තා. එයාලාගේ මුහුණු ටිකෙන් ටික පැහැදිලි වුණා. එතැන සිටියේ ගද ගහන ගේබ් සහ එයාගේ යාළුවෝයි. මට පෙනුණු දර්ශනය ඇත්ත නොවෙන බව දන සිටියත් මගේ අත් මිට මෙලවුණා. ඒක මීදුමෙන් සෑදුන ඇස් බැන්දුමක් විතරයි.

මගේ දිහාවට හැරුණු ගේබ්, ඔරකල්ගේ රළු හඬින් කතා කළා: බටහිර දෙසට ගොස්, වෙනතක හැරුණු දෙවියන්ට මුහුණ දීමට තුඹට සිදු වේවි.

එයාට දකුණු පැත්තෙන් සිටි යාළුවා ඔළුව ඔසවා බලා, අර කටහඬින්ම කතා කළා: සොරකම් කරන ලද දේ තුඹ විසින් සොයාගෙන, ආරක්ෂිතව නැවත ගෙනැවිත් දේවි.

වම් පැත්තේ සිටි කෙනා කාඩ් දෙකක් මේසයට දමමින් කතා කළා: තුඹට යහළුවා යැයි අමතන අයෙකු තුඹට ද්‍රෝහි වේවි.

අන්තිමේදී, අපේ ගොඩනැගිලි පරිපාලක, එඩීගේ කටින් තරකම් ජේළිය පිට වුණා: අවසානයේදී, වඩාත්ම වැදගත් දේ බේරා ගැනීමට තුඹ අපොහොසත් වේවි.

ඒ දර්ශනය දිය වී යන්න පටන් ගත්තා. මුලදී, කිසිවක් සිතාගන්න බැරි තරමට පුදුම වෙලා මම බලාගෙන සිටියත් මීදුම තඩි, කොළ පාට සර්පයෙක් වගේ ආපසු මමියේ කට තුළට ලිස්සා යන්න පටන් ගනිද්දී මම කෑගැසුවා, "පොඩ්ඩක් ඉන්න! මොකක්ද ඔයා අදහස් කළේ? මොන යාළුවාද? මොකක් බේරා ගන්නද මට බැරි වෙන්නේ?"

ඒත්, මීදුම් සර්පයාගේ වලිගයත් මමියේ කට තුළ නොපෙනී ගියා. එයා ආපසු බිත්තියට හේත්තු වුණා. එයාගේ කට තදින් වැසුණේ හරියට ඒක අවුරුදු සිය ගාණකින් ඇරලා නැහැ වගෙයි. ආයෙමත් නිශ්ශබ්ද වූ අට්ටාලය සිහිවටන හැර වෙන කිසිවක් නැති පාළු, ජරාවාස වූ තැනකට හැරුණා.

මගේ ඇගෙන් මකුළු දැල් බැඳෙන තුරුම මෙතැන සිටගෙන සිටියත්, තවත් කිසිම දෙයක් දැන ගන්න නොලැබෙන බව මට හැඟුනා.

මගේ 'ඔරකල් බැහැදක්ම' ඉවරයි.

"ඉතින්?" කයිරොන් මගෙන් ඇහුවා.

මම කාඩ් සෙල්ලම් කරන මේසය අසල පුටුවක් උඩට ඇද වැටුණා. "එයා කිවුවා හොරකම් කරලා තියෙන දේ මං හොයාගෙන එනවා කියලා."

අපේ තිබුණු කෝක් කෑන් එකේ සුන්බුන් ටිකත් උනන්දුවෙන් හපන ගමන්, ග්‍රෝවර් පුටුවේ ඉදිරියට නැමුණා. "ඒක නම් නියමයි!"

"ඔරකල් හරියටම කිවුවේ මොනවද?" කයිරොන් ඕනෑකමින් ඇහුවා. "ඒක තමයි වැදගත්."

සර්ප හඬ නිසා තවමත් මගේ කන් පොපියනවා වගෙයි. "එයා... එයා කිවුවා මට බටහිර පැත්තට ගිහිල්ලා වෙන පැත්තකට හැරුණු දෙවියන්ට මූණ දෙන්න වෙනවලු. හොරකම් කරපු දේ හොයාගෙන, පරිස්සමින් ආපහු ගෙනැත් දෙනවලු."

"මං ඒක දැනගෙන හිටියා," ග්‍රෝවර් කිවුවා.

කයිරොන් නම් තෘප්තිමත් වූ බවක් පෙනුණේ නැහැ. "වෙන මුකුත් නැද්ද?"

එයාට ඒක කියන්න මට උවමනා වුණේ නැහැ.

මොන යාළුවාද මට ද්‍රෝහි වෙන්නේ? මට එච්චර යාළුවෝ හිටියෙත් නෑනේ.

එතකොට අන්තිම ජේළිය - වඩාත්ම වැදගත් දේ බේරා ගැනීමට මම අපොහොසත් වේවි. මොන ජාතියේ ඔරකල් කෙනෙක්ද, 'ඔහ්, දන්නවද වැඩක්, ඔයාට මේ වැඩේ හරියට කරගන්න වෙන්නේ නෑ,' වගේ කතාවක් කියලා මාව ගවේෂණයකට යවන්නේ?

මම කොහොමද ඒක හෙළි කරන්නේ?

"නෑ," මම කිවුවා. "ඒ ටික විතරයි."

එයා මගේ මුහුණ දෙස ඕනෑකමින් බලා සිටියා. "බොහොම හොඳයි, පර්සි. ඒත්, මේකත් දැනගන්න: ඔරකල්ගේ වචනවලට හැම වෙලාවෙම වගේ තේරුම් දෙකක් තියෙනවා. ඒවා ගැන ගොඩාක්ම හිතන්නත් එපා. සිදුවීම සිද්ධ වෙනකල්ම ඇත්ත මොකක්ද කියලා පැහැදිලි නැහැ."

මොකක් හරි දෙයක් මම එයාට නොකියා හිතේ තියාගෙන ඉන්නවා, කියලා එයා තේරුම්ගත් බව මට දැනුණා. ඒ නිසා, මගේ හිත හදන්නයි එයා උත්සාහ කළේ.

"හරි," මම කිවුවේ මාතෘකාව වෙනස් කරන්න උවමනාවෙන්. "එතකොට, මම කොහෙටද යන්න ඕනෑ? කවුද මේ බටහිර ඉන්න දෙවියා?"

"ආහ්, හිතන්න, පර්සි." කයිරොන් කිව්වා. "සියුස්, පොසෙයිඩන් දෙන්නා යුද්ධ කරලා දුර්වල වුණොත්, කාටද ඒකෙන් ප්‍රයෝජනයක් තියෙන්නේ?"

"එයාලාව යටත් කරගන්න උවමනාවෙන් ඉන්න වෙන කෙනෙක්ට ද?" මම අනුමාන කළා.

"අන්න හරි. කෝන්තරයක් හිතේ තියන් ඉන්න කෙනෙක්ට, යුග ගාණකට කලින් ලෝකය බෙදුව දා ඉඳලාම තමන්ගේ පංගුව ගැන අසතුටෙන් ඉන්න කෙනෙක්ට, මිලියන ගාණක මරණයන් නිසා තමන්ගේ රාජධානිය බලවත් වෙන කෙනෙක්ට. තව දුරටත් දරුවන් බිහි නොකර ඉන්න දිවුරුමක් දෙන්න තමන්ට බල කළත්, දැන් එයාලාම ඒ දිවුරුම කඩ කළ නිසා තමන්ගේ සහෝදරයින්ට වෛර කරන කෙනෙක්ට."

මම දකපු හීන ගැන, ඒවාගේදී පොළොව යට ඉඳන් කතා කළ යක්ෂ හඬ ගැන මම කල්පනා කළා. "හේඩීස්."

කයිරොන් ඔළුව වැනුවා. "වෙන්න පුළුවන් එකම කෙනා තමයි මරණයට අධිපති දෙවියා."

ග්‍රෝවර්ගේ කටින් ඇලුමිනියම් කෑල්ලක් එළියට පැන්නා. "හෝ, මො-මොකක්?"

"ෆියුරි කෙනෙක් පර්සිගේ පස්සෙන් ආවා," කයිරොන් එයාට මතක් කළා. "මෙයාගේ අනන්‍යතාවය හෙළිවෙනකම් එයා මේ කොල්ලා ගැන හෙවිල්ලෙන් හිටියා, ඊට පස්සේ එයා පර්සිව මරන්න උත්සාහ කළා. ෆියුරිලා කීකරු වෙන්නේ එක ස්වාමියෙකුට විතරයි: ඒ හේඩීස්ට."

"ඔව්, ඒත් - ඒත් හේඩීස් වීරයෝ හැමෝටම වෛර කරනවා නේ," ග්‍රෝවර් විරුද්ධ වුණා. "විශේෂයෙන්ම, පර්සි කියන්නේ පොසෙයිඩන්ගේ පුතෙක් කියලා එයා දැන ගත්තා නම්..."

"යම බල්ලෙක් වනාන්තරේට ආවා," කයිරොන් කියාගෙන ගියා. "උන්ව කැඳවන්න පුළුවන් වධක භූමියෙන් විතරයි. ඒ වගේම ඒ කැඳවීම කරන්න ඕනෑ කඳවුර ඇතුළේ කෙනෙක්මයි. හේඩීස්ට අනිවාර්යයෙන්ම මෙහෙ ඔත්තුකාරයෙක් ඇති. පොසෙයිඩන්, එයාගේ නම සුද්ධ කරගන්න පර්සිව පාවිච්චි කරයි කියලා එයා සැක කරන්න

ඇති. මේ තරුණ උප-දෙවියා ගවේෂණයක් කරන්න කලින්ම එයාව මරලා දාන්න හේඩීස් බොහෝම කැමති වෙන්න ඇති."

"මරු," මම කෙඳිරුවා. "එතකොට, ප්‍රධාන දෙවිවරු දෙන්නෙක්ටම මාව මරන්න ඕනෑ."

"ඒත් ගවේෂණයක්..." ග්‍රෝවර් කෙළ ගිල්ලා. "මං කියන්නේ, ප්‍රධාන අකුණ වෙන කොහේ හරි තියෙන්න බැරිද? මයින්වල වගේ? අවුරුද්දේ මේ කාලෙට මයින් හරිම ෂෝක් පළාතක්."

''ප්‍රධාන අකුණ හොරකම් කරන්න හේඩීස්, එයාගේ දාසයෙක්ව යැව්වා." කයිරොන් ස්ථිර ලෙස කිවුවා. "සියුස් චෝදනා කරන්නේ පොසෙයිඩන්ට කියලා හොඳින්ම දැනගෙන එයා ඒක පාතාල ලෝකේ හැංගුවා. මරණයට අධිපතිගේ චේතනාව මොකක්ද කියලාවත්, එයා යුද්ධයකට මේ කාලෙම තෝරාගත්තේ ඇයි කියලාවත් මට තේරෙනවා කියලා බොරුවට අඟවන්න මට උවමනාවක් නැහැ. ඒත් එක දෙයක් නම් ස්ථිරයි. පර්සි පාතාල ලෝකයට ගිහින්, ප්‍රධාන අකුණ හොයාගෙන, ඇත්ත හෙළි කරන්න ඕනෑ."

නුහුරු ගින්නක් මගේ බඩ තුළ ඇවිළෙනවා මට දැනුණා. පුදුමාකාරම දේ වුණේ, මට කිසිම බයක් නොදැනීමයි. ඒක කලින් ඉඳලාම තිබුණු බලාපොරොත්තුවක්. පළිගැනීමට තිබුණු ආශාවක්. මේ වෙද්දී, හේඩීස් මාව මරන්න තුන් පාරක් උත්සාහ කරලා තිබුණා; මුලින්ම ෆියුරිවත්, ඊට පස්සේ මිනොටර්වත්, අන්තිමට යම බල්ලෙක්වත් එවලා. මගේ අම්මාව ක්ෂණික එළියක් තුළට අතුරුදන් වුණෙත් එයාගේ වැරැද්ද නිසායි. දැන් එයා උත්සාහ කරමින් සිටියේ මාවත්, මගේ තාත්තාවත් නොකළ වැරැද්දකට පටලවන්නයි.

එයාව පරද්දවන්න මම ලෑස්තියි.

ඒ ඇරත්, මගේ අම්මාත් පාතාල ලෝකේ නම්...

හෝව්, කොල්ලෝ, තවමත් හොඳ සිහියෙන් තිබුණු මගේ මොළයේ පුංචි කොටසක් කතා කළා. ඔයා පොඩි එකෙක්, හේඩීස් කියන්නේ දෙවියෙක්.

ග්‍රෝවර් සිටියේ වෙව්ලමින්. එයා බැඳපු අල පෙති කනවා වගේ කාඩ් කන්න පටන් ගත්තා.

දුප්පත් කොල්ලාට ඕනෑ වුණේ මාත් එක්ක ගවේෂණයක් සම්පූර්ණ කරලා, එයාගේ 'සොයන්නෙකුගේ බලපත්‍රය' - ඒක මොකක්

වුණත් - තේනයි. ඒත්, මම කොහොමද මේ ගවේෂණයට යන්න එයාට සහා කරන්නේ? විශේෂයෙන්ම, මෙකෙන් අසමත් වෙන්න මගේ දෛවය ලියැවී තියෙන බව ඔරකල් කිවුවාට පස්සේ... මේක නම් සියදිවි නසා ගැනීමක් වගෙයි.

"බලන්න, ඒ හේඩීස් කියලා අපි දන්නවා නම්," මම කයිරොන්ට කිවුවා. "අනික් දෙවිවරුන්ට ඒක කියන්න අපිට බැරිද? එතකොට සියුස්ට හරි පොසෙයිඩන්ට හරි පුළුවන් නේ පාතාල ලෝකෙට ගිහින් ඔළු ගෙඩි දෙක-තුනක් වප්ප කරලා එන්න."

"සැක කරනවා කියන එකයි, දන්නවා කියන එකයි සමාන නැහේ," කයිරොන් කිවුවා. "ඇරත්, අනිත් දෙවිවරු හේඩීස්ව සැක කළත් - මං හිතන්නේ පොසෙයිඩන් එහෙම කරනවා - එහෙට ගිහින් අකුණ අරගෙන එන්න එයාලාට පුළුවන්කමක් නැහැ. මොකද, ආරාධනාවක් නැතිව වෙනත් දෙවියෙක්ගේ භූමි ප්‍රදේශයට ඇතුළු වෙන්න තවත් දෙවියෙකුට බැහැ. ඒකත් පෞරාණික නීතියක්. එහෙම බලනකොට, වීරයින්ට සමහර වරප්‍රසාද තියෙනවා. එයාලාගේ ශක්තියයි, එඩිතරකමයි තියෙනකල් ඕනෑ තැනකට ගිහින්, ඕනෑ කෙනෙක්ට අභියෝග කරන්න එයාලාට පුළුවන්. වීරයෙක් කරන වැඩවලට කිසිම දෙවියෙක් වගකීම ගන්න උවමනා නැහැ. දෙවිවරු හැම වෙලාවෙම මිනිස්සු හරහා වැඩ කරවාගන්නේ මොකක් නිසා කියලද ඔයා හිතන්නේ?"

"ඔයා කියන්නේ මාව පාවිච්චි කරනවා කියලද?"

"මං කියන්නේ, පොසෙයිඩන් මේ කාලේම ඔයාට හිමිකම් කියපු එක අහම්බයක් නෙවෙයි කියලා. ඒක හරිම අනතුරුදායක සූදුවක්. ඒත් එයා ඉන්නේ දුෂ්කර අවස්ථාවකට මැදි වෙලා. එයාට ඔයාව උවමනායි."

මගේ තාත්තාට මාව උවමනායි.

බහුරූපේක්ෂයක් ඇතුළේ තියෙන වීදුරු කෑල්ලක් වගේ, මගේ හිත ඇතුළේ සිතුවිලි වටේට පෙරළුණා. කෑතගෑ වෙන්නද නැත්නම් අමනාප වෙන්නද, සතුටු වෙන්නද නැත්නම් කේන්ති ගන්නද කියලා මටම හිතා ගන්න බැරි වුණා. අවුරුදු දොළහක් තිස්සේ පොසෙයිඩන් මාව ගණන් නොගෙන සිටියා. දැන්, හදිසියේම එයාට මාව උවමනා වෙලා.

මම කයිරොන් දෙස බැලුවා, "මම පොසෙයිඩන්ගේ පුතා කියලා ඔයා මුල ඉඳලාම දැනගෙන හිටියා, නේද?"

"මගේ හිතේ සැකයක් තිබුණා. මම කිව්වත් වගේ... මමත් ඔරකල්ට කතා කරලා තිබුණේ."

එයාගේ අනාවැකිය ගැන මට නොකියන දේවල් ගොඩක් තිබුණු බව තේරුණත් ඒ වෙලාවේ මට ඒ ගැන වද වෙන්න බැහැ කියලා මම හිතුවා. මොකද, මමත් නොකියා සිටි දේවල් තිබුණා නේ.

"එහෙනම්, මේ දේවල් මට පැහැදිලිව කියන්න," මම කිවුවා. "මම පාතාල ලෝකෙට ගිහින්, මරණයට අධිපතිව මුණ ගැහෙන්න ඕනෑ."

"හරි," කයිරොන් කිවුවා.

"විශ්වයේ බලගතුම ආයුධය හොයා ගන්න ඕනෑ."

"හරි."

"ඊට පස්සේ, උත්තරායනයට කලින්, ඒ කියන්නේ තව දවස් දහයක් ඇතුළත ඒක ආපහු ඔලිම්පස්වලට අරගෙන එන්නත් ඕනෑ."

"ඒ ටික තමයි කරන්න තියෙන්නේ."

මම ග්‍රෝවර් දෙස බැලුවා, එයා භාරත ආසියාව කටේ ඔබාගත්තා.

"අවුරුද්දේ මේ කාලෙට මයින් හරිම ෂෝක් පළාතක් කියලා මම කලින් මතක් කළාද?" එයා හෙමිහිට ඇසුවා.

"ඔයා යන්න ඕනෑ නැහැ," මම එයාට කිවුවා. "ඒ තරම් දෙයක් ඔයාගෙන් ඉල්ලන්න මට බැහැ."

"ඔහ්..." එයා, එයාගේ කුර එහෙ-මෙහෙ කළා. "නෑ... ඒක මේ... සැටර්ලායි පොළොව යට තැනුයි... හොඳයි..."

ගැඹුරු හුස්මක් ගත් එයා, ටී-ෂර්ට් එකේ රැඳි කාඩ් කැබලි සහ ඇලුමිනියම් කුඩු පිසදාමින් නැගිට්ටා. "ඔයා මගේ ජීවිතය බේරුවා, පර්සි. මාවත් එක්ක යන්න ඕනෑ කියලා ඔයා කිවුවේ ඇත්තටම නම්, මං ඔයාව තනි කරන්නේ නැහැ."

අඬන්න හිතෙන තරම් සහනයක් මගේ හිතට දැනුණා, හැබැයි එහෙම කරන එක නම් වීර වැඩක් වගේ පේන්නේ නැති වෙයි කියලා මට හිතුණා.

මාසයකට-දෙකකට වඩා වැඩි කාලයක් මාත් එක්ක සිටි එකම යාළුවා වුණේ ග්‍රෝවර්. මැරුණු හමුදාවකට විරුද්ධව තනි සැටර්

කෙනෙක්ට කරන්න පුළුවන් දෙයක් තියේවි ද කියලා විශ්වාසයක් නොතිබුණත්, එයා මාත් එක්ක ඉන්න බව දැනගත්තාම මට වඩාත් හොඳ ගතියක් දැනුණා.

"මුළු ගමනටම, එළ-කොල්ලෝ." මම කයිරොන් දෙසට හැරුණා. "ඉතින්, අපි කොහේටද යන්නේ? ඔරැකල් කිව්වේ බටහිරට යන්න කියලා විතරනේ."

"පාතාල ලෝකයේ ඇතුළු වීම හැම වෙලාවෙම තියෙන්නේ බටහිර පැත්තේ. ඔලිම්පස් වගේම ඒකත් යුගයෙන් යුගයට තැන මාරු කරනවා. දැනට ඒක තියෙන්නේ, ඇත්ත වශයෙන්ම, ඇමරිකාවේ."

"කොහෙද?"

කයිරොන් පුදුම වුණා. "මං හිතුවේ ඒ පැහැදිලි කිරීම ඇති වෙයි කියලා. ඇතුළු වීමේ දොරටුව තියෙන්නේ ලොස් ඇන්ජලීස්වල."

"ඔහ්," මම කිව්වා. "එහෙම වෙන්න එපැයි. එතකොට, අපි ප්ලේන් එකක නැගලා-"

"නෑ!" ග්‍රෝවර් යටිගිරියෙන් කෑගැසුවා. "පර්සි, ඔයා මොනවද හිතන්නේ? ඔයා ජීවිතේටම ප්ලේන් එකක ගිහින් තියෙනවද?"

අපහසුවට පත් වූ හැඟීමක් දැනෙද්දී, මම ඔළුව හෙල්ලුවා. මගේ අම්මා කවදාවත් මාව ගුවන් යානයකින් කිසිම ගමනක් එක්ක ගියේ නැහැ. එයා හැම වෙලාවේම කිව්වේ අපිට ඒතරම් සල්ලි නැහැ කියලායි. ඒ ඇරත්, එයාගේ දෙමව්පියෝ මැරුණෙත් ගුවන් යානා අනතුරකින් නේ.

"පර්සි, හිතන්න," කයිරොන් කිව්වා. "ඔයා සමුද්‍ර දෙවියන්ගේ පුතා. ඔයාගේ තාත්තාගේ තරකම ප්‍රතිවාදියා සියුස්, අහසට අධිපති. ඔයාව ප්ලේන් එකකින් ගෙනියන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරන්න තරම් ඔයාගේ අම්මා මෝඩ වුණේ නැත්තේ ඒකයි. එතකොට ඔයා යන්නේ සියුස්ගේ බල ප්‍රදේශයෙන්. ඒ කියන්නේ ඔයාට කවදාවත් පණපිටින් පොළොවට එන්න ලැබෙන්නේ නැතිවෙයි."

අපිට ඉහළින් විදුලි කෙටුවා. අකුණක් මහ හඬින් පුපුරා ගියා.

"හොඳයි," මම කිව්වේ, කුණාටුව දෙස නොබලා ඉන්න තීරණය කරමින්. "එහෙනම් මම ගොඩබිමෙන් යන්නම්."

"අන්න හරි," කයිරොන් කිව්වා. "ඔයාට යාළුවෝ දෙන්නෙක්ව එක්ක යන්න පුළුවන්. එක්කෙනෙක් ග්‍රෝවර්. අනිත් කෙනාත් දැනටම ඉදිරිපත් වෙලා ඉන්නේ, ඔයා එයාගේ උදවු බාරගන්න කැමති නම්."

"ආහ්..." මම බොරු පුදුමයක් පෑවා. "මේ වගේ ගවේෂණයකට කැමැත්තෙන් ඉදිරිපත් වෙන්න තරම් මෝඩ වෙන්නේ කවුද?"

කයිරොන්ට පිටුපසින් වාතය දිලිසෙන්න ගත්තා.

යැන්කී කැප් එක පිටුපස සාක්කුවට ඔබාගනිමින්, ඇනබෙත් දෘශ්‍යමාන වුණා.

"ගවේෂණයක් කරන්න මම සෑහෙන කාලයක් තිස්සේ බලාගෙන ඉන්නේ, පාසි මොළේ," එයා කිව්වා. "ඇතීනාට පොසෙයිඩන්ව පේන්න බැහැ තමයි. ඒත්, ලෝකේ බේරා ගන්න යන්නේ ඔයා නම්, ඔයා බාල්දි පෙරලගන්න එක නතර කරන්න පුළුවන් හොඳම කෙනා තමයි මම."

"ඔව් ඉතින්, ඔයාම එහෙම කියාගන්නකෝ," මම කිව්වා. "මං හිතන්නේ මේකටත් ඔයාට සැලැස්මක් ඇති, එහෙම නේද, පණ්ඩිත ආච්චි?"

එයාගේ කම්මුල් රතු වුණා. "ඔයාට මගේ උදවු ඕනෑද, එපාද?"

ඇත්තම කියනවා නම්, මට ඕනෑ වුණා. මට ගන්න පුළුවන් සෑම උදවුවක්ම මට උවමනා වුණා.

"තුන් කට්ටුවක්," මම කිව්වා. "ඒක වැඩ කරයි."

"නියමයි," කයිරොන් කිව්වා. "අද හවසට, මැන්හැටන් බස් නැවතුම්පොළට යනකම් ඔයාලාව එක්ක යන්න අපිට පුළුවන්. එතැනින් එහාට ඔයාලාගේ ගමන තනියම යන්න වෙනවා."

විදුලියක් කෙටුවා. කිසිම දවසක දරුණු කුණාටුවක් ලැබෙන්නේ නැහැ කියූ දෙණියට මහ වැස්සක් ඇද හැලෙන්න පටන් ගත්තා.

"නාස්ති කරන්න වෙලාවක් නැහැ," කයිරොන් කිව්වා. "මං හිතන්නේ, දැන් ඔයාලා ගමන් මලු ලෑස්ති කරගත්තොත් හොඳයි."

Scanned with CamScanner

10

මම සම්පූර්ණයෙන්ම හොඳ බසයක් වැනසුවා

මගේ බඩු අහුරාගන්න මට ඒ තරම් වෙලාවක් ගියේ නැහැ. මිනටෝර් අඟ මගේ කැබින් එකේ තියලා යන්න මම තීරණය කළ නිසා, ග්‍රෝවර් මට සොයා දුන් ගමන් මල්ලේ අහුරා ගන්න මට ඉතිරි වුණේ අමතර ඇඳුම් කට්ටලයයි, දත් බුරුසුවයි විතරයි.

කඳවුරු ගබඩාවෙන් මට ණයක් ලෙසට ඩොලර් සියයක් සහ රන් ඩ්‍රච්මා (ග්‍රීසියේ භාවිතා කළ මුදල් වර්ගය) විස්සක් දුන්නා. මාරි බිස්කෝතුවක් තරම් ලොකු මේ කාසිවල එක් පැත්තක ග්‍රීක දෙවිවරුන්ගේ රූපත්, අනෙක් පැත්තේ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ රූපයත් මුද්‍රා තබා තිබුණා. ඉස්සර කාලේ මිනිස්සු රිදියෙන් සෑදූ ඩ්‍රච්මා පාවිච්චි කළත්, ඔලිම්පියානුවෝ තම තනි රත්තරනින් සෑදූ ඩ්‍රච්මා හැර වෙන කිසිවක් පාවිච්චි නොකරන බව කයිරොන් අපිට කිවුවා. මිනිස් නොවෙන ගනුදෙනුවලදී - ඒකේ තේරුම මොකක් වුණත් - මේ කාසි ප්‍රයෝජනවත් වෙයි කියලා එයා කිවුවා. හදිසි අවස්ථාවකදී අපිට බරපතළ ලෙස තුවාල වුණොත් විතරක් පාවිච්චි කරන්න නෙක්ටාර් කෑන් දෙකකුත්, ඇම්බ්‍රෝසියා පිරවූ, වතුර නොයන මලු දෙකකුත් එයා ඇනබෙත්ට සහ මට දුන්නා. ඒවා දිව්‍ය ආහාර බව කයිරොන් අපිට නැවත මතක් කළා. ඒවාගෙන් ඕනෑම තුවාලයක් සුව කරන්න පුළුවන් වුණත්, සාමාන්‍ය මිනිස්සුන්ට නම් ඒවා මාරාන්තිකයිලු. අර්ධ-ලෝහිතයෙක් වුණත් ඒවා වැඩිපුර ගත්තොත් උණ හැදෙන්න පුළුවන්ලු.

මාත්‍රාවට වඩා වැඩියෙන් ගත්තොත් අපිව පිච්චිලා යාවි කියලා එයා කිවුවා.

ඇනබෙත්, එයාගේ මායා යැන්කී කැප් එකත් අරන් ආවා. ඒක එයාගේ දොළොස්වෙනි උපන් දිනයට අම්මාගෙන් ලැබුණු තෑග්ගක්ලු. කම්මැලි හිතෙන වෙලාවට කියවන්න පෞරාණික ග්‍රීක භාෂාවෙන් ලියූ ශ්‍රේෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්ප පොතකුත්, කමිස අත තුළ සඟවාගත් දිග, ලෝකඩ පිහියකුත් එයා ළඟ තිබුණා. ඒ පිහිය නිසා ලෝහ පරීක්ෂක උපකරණයක් හරහා යන පළවෙනි වතාවෙම අපිව අහුවෙන බව මට නම් සියයට සියයක් විශ්වාස වුණා.

ග්‍රෝවර්, එයාගේ බොරු කකුල් දාගෙන, කලිසමකුත් හැදගෙන මනුස්සයෙක් වගේ යන්න ලෑස්ති වුණා. එයා කොළ පාට රස්ටා තොප්පියකුත් දමාගත්තේ, බැරි වෙලාවත් මගදී වැස්සකට තෙමිලා එයාගේ කැරලි කොණ්ඩය සමතලා වුණොත්, එයාගේ අං දෙකේ මුදුන් පිටට පෙනේවි හිතලයි. එයාගේ තද තැඹිලි පාට ගමන් මල්ල ලෝහ කෑලිවලින් සහ ඇපල්වලින් පුරවාගෙන තිබුණේ ගමනේදී හැදෙන පොඩි බඩගින්නට කන්නයි. එයාගේ එළු තාත්තා එයාට කපා දුන් බට නළා කුට්ටමකුත් එයාගේ සාක්කුවේ දමාගෙන සිටියත්, ග්‍රෝවර් එවායින් වාදනය කරන්න දන සිටියේ සිංදු දෙකක් විතරයි.

අනෙක් කඳවුරුකරුවන්ට සමුදුන් අපි, අවසන් වතාවට ස්ට්‍රෝබෙරි යායවල් ටිකත්, මුහුදත්, මහ ගෙදරත් බලාගත්තාට පසු, අර්ධ-ලෝහිත කන්ද නැගලා, සියුස්ගේ දුව, තාලියාගේ පයින් ගහ අසලට ගියා.

අපි එනතුරු කයිරොන් රෝද පුටුවට වී බලා සිටියා. අසනීප කාමරයේ ඉන්නකොට මට දකින්න ලැබුණු ජේත්තුකාරයා කයිරොන් අසලම සිටියා. කඳවුරේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා එයා බව ග්‍රෝවර් මට කිවුවා. එයාගේ මුළු ඇඟ පුරාම ඇස් තියෙන්නේ කිසිම වෙලාවක එයාව පුදුමයට පත් කරන්න බැරි වෙන්නලු. ඒ වුණත් එදා එයා මුළු ඇඟම ආවරණය වෙන විදිහේ රියැදුරු නිල ඇඳුමකින් සැරසී සිටි නිසා, මට දකගන්න හැකි වුණේ එයාගේ බෙල්ලේ, අත්වල සහ මුහුණේ තිබූ ඇස් ටික විතරයි.

"මේ ඉන්නේ ආර්ගස්," කයිරොන් මට කිවුවා. "එයා ඔයාලාව නගරෙට අරගෙන යාවි, ඒ වගේම, එයා වටපිටාවේ වෙන දේවල් ගැනත්, එර්... ඇස් ගහගෙන ඉඳීවි."

Scanned with CamScanner

අපිට පිටුපසින් අඩි සද්දයක් ඇහුණා.

පැසි පන්දු ක්‍රීඩාවට පළඳින ජාතියේ සපත්තු ජෝඩුවකුත් අරන් කන්ද උඩට දුවගෙන ආවේ ලූක්.

"හේයි!" එයා හති දමුවා. "ඔයාලාව අල්ලගන්න පුළුවන් වුණේ හොඳ වෙලාවට."

ලූක් ළඟ පාතක ඉන්නා හැම වෙලාවකම වෙනවා වගේ, ඒ වෙලාවෙත් ඇනබෙත් රතු වුණා.

"ඔයාලාට සුබ පතන්නයි ඕනෑ වුණේ," ලූක් මට කිවුවා. "අනික, මී... ඔයාට මේකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙයි කියලා මට හිතුණා." එයා මගේ අතට දුන් සපත්තු ජෝඩුවට තිබුණේ හරිම සාමාන්‍ය පෙනුමක්. එයින් හැමූ ගඳ පවා සාමාන්‍ය වුණා.

"මයියා!" ලූක් කිවුවා.

සපත්තු දෙකේ විලුඹ ළඟින් මතු වූ සුදු පාට කුරුලු තටු දකලා මම කොයි තරම් බය වුණාද කිව්වොත්, මගේ අතින් සපත්තු ජෝඩුව බිමට අත ඇරුණා. තටු නැමිලා, අතුරුදන් වෙන තුරුම සපත්තු ජෝඩුව උඩ පැන පැන පොළොවේ එහෙ මෙහෙ දඟලුවා.

"මරයි!" ග්‍රෝවර් කිවුවා.

ලූක් හිනාවුණා. "මගේ ගවේෂණය කරද්දිත් මේවා මට ගොඩක් උදවු වුණා. තාත්තාගෙන් ලැබුණ තෑග්ගක්. ඇත්තටම, මේ දවස්වල මම මේවාගෙන් වැඩි ප්‍රයෝජනයක් ගන්නේ නැහැ..." එයාගේ මුහුණ දුක්බර වුණා.

මොනවා කියන්නද කියලා මම දන සිටියේ නැහැ. ලූක් අපිට සමු දෙන්න ආව එකම කොයි තරම් දෙයක්ද. පහුගිය දවස්වල මම අනිත් අයගේ අවධානය වැඩියෙන් දිනාගත් නිසා එයා මාත් එක්ක අමනාප ඇති කියලා මම බයෙන් සිටියේ. ඒත්, මෙන්න දැන් එයා මට මායා තෑග්ගක් දෙනවා... මාවත් ඇනබෙත් තරමටම රතු කරන්න ඒක ප්‍රමාණවත් වුණා.

"හේයි, වීරයා," මම කිවුවා. "ස්තූතියි."

"අහන්න, පර්සි..." ලූක් අපහසුවෙන් ඉන්නවා වගෙයි පෙනුණේ. "ඔයා යන්නේ ගොඩාක් අයගේ බලාපොරොත්තු අරගෙන.

ඉතින්, ඒ නිසා... මං වෙනුවෙනුත් රාක්ෂයෝ ටිකක් මරලා එන්න, හරිද?"

අපි අතට-අත දුන්නා. ග්‍රෝවර්ගේ අං දෙක අතරට තට්ටුවක් දමූ ලූක්, සිහිය නැතිවෙලා වැටෙන්න වගේ බලාගෙන සිටි ඇනබෙත්ව වැළඳගෙන සමු දුන්නා.

"ඔයාට කලන්තේ වගේද?" ලූක් ගියාට පසු මම ඇනබෙත්ගෙන් ඇසුවා.

"මට එහෙම නෑ."

"ඔයා වෙනුවට ගිහින් කොඩිය අල්ලගන්න ඔයා ලූක්ට ඉඩ දුන්නා, පුළුවන් නම් නැහැ කියන්න?"

"ඔහ්... ඔයා එක්ක කොහේවත් යන්න මම මොකට කැමති වුණාද මන්දා."

එයා අඩි හප්පමින් ගියේ කන්දෙන් එහා පැත්තේ පාර අයිනේ නතර කර තිබූ සුදු පාට කාරය ළඟටයි. වාහනයේ යතුරු කැරැල්ල කරකවමින් ආර්ගස් එයා පසුපස ගියා.

පියාඹන සපත්තු ජෝඩුව අහුලා ගනිද්දී, හදිසියේම මට නරක හැඟීමක් දැනුණා. මම කයිරොන් දෙස බැලුවා. "මේක මට පාවිච්චි කරන්න බැරි වෙයි, නේද?"

එයා ඔළුව සෙලෙව්වා. "ලූක් අදහස් කළේ හොඳක් කරන්න, පර්සි. ඒත්, උඩින් යනවා කියන එක නම්... ඔයාට එච්චර ගුණ දෙයක් නෙවෙයි."

බලාපොරොත්තු කඩවෙලා මම ඔළුව වැනුවත්, එතකොටම මට අදහසක් පහළ වුණා. "හේයි, ග්‍රෝවර්. ඔයාට මායා බඩුවක් ඕනෑද?"

එයාගේ ඇස් දෙක දැල්වුණා. "මට?"

අපි ඉක්මනින්ම එයාගේ බොරු කකුල්වලට සපත්තු ජෝඩුව දැමුවා. දැන්, ලෝකයේ පළවෙනි පියාඹන එළු-කොල්ලා දියත් වෙන්න සූදානම්.

"මයියා!" එයා කෑගැසුවා.

කරදරයක් නැතිව පොළොවෙන් උඩට එසවුණත්, ඊට පස්සේ එයා පැත්තකට වැටුණු නිසා, එයාගේ ගමන් මල්ල තණ ගොල්ලේ

Scanned with CamScanner

ඇතිල්ලෙන්න ගත්තා. හීලෑ නොකළ අශ්වයෙක් උඩ පනිනවා වගේ, පියාඹන සපත්තු ජෝඩුව දිගටම බකල ගහන්න ගත්තා.

"පුහුණු වෙන්න," කයිරොන් කෑගසා කිව්වා. "ඔයාට ඕනෑ කරන්නේ පුහුණුව!"

"ආ...හ්!" හරහා වැටුණු ග්‍රෝවර්, ඔළුව කාරය දෙසට හරවාගෙන, පිස්සු හැදුණ තණකොළ කපන යන්ත්‍රයක් වගේ කන්ද පහළට පියාඹන්න ගත්තා.

මමත් එයා පසුපසින් යන්න කලින් කයිරොන් මගේ අතින් අල්ලා ගත්තා. "මට තව කාලය තිබුණා නම්," එයා කිව්වා. "ඔයාව මීට වඩා හොඳට පුහුණු කරන්න තිබුණා, පර්සි. හර්කියුලිස්, ජේසන් - මේ හැමෝටම හොඳ පුහුණුවක් ලැබුණා."

"ඒකට කමක් නැහැ. මම හිතුවේ මටත් -"

පොඩි ළමයෙක් වගේ කතා කරන්න කලින්, මම කතාව නතර කරගත්තා. මම හිතමින් සිටියේ මගේ තාත්තාත් මට ගවේෂණයට උදවු වෙන්න මොකක් හරි මායා බඩුවක් දුන්නා නම්, කියලායි. හරියට ලූක්ගේ පියාඹන සපත්තු, එහෙමත් නැත්නම් ඇනබෙත්ගේ අදෘශ්‍යමාන කැප් එක වගේ පුදුමාකාර දෙයක්.

"මට නම් මොනවා වෙලාද මන්දා?" කයිරොන් කෑගැසුවා. "මේක නැතුව ඔයාට යන්න ඉඩ දෙන්නේ කොහොමද?"

කබා සාක්කුවෙන් පෑනක් එළියට ගත් එයා ඒක මට දුන්නා. කළු තීන්ත පිරවූ, කොපුව ගැලවිය හැකි සාමාන්‍ය බෝල්පොයින්ට් පෑනක් වූ එය සත තිහකට විතර කඩෙන් ගන්න පුළුවන්.

"ෂෝක් නේ..." මම කිව්වා. "ස්තූතියි."

"පර්සි, ඕක ඔයාගේ තාත්තා දුන්න තෑග්ගක්. මම ඕක අවුරුදු ගාණක් තියාගෙන හිටියේ, මම බලාගෙන ඉන්නේ ඔයා වෙනුවෙන් කියලාවත් නොදැනයි. ඒත්, දැන් නම් මට අනාවැකිය පැහැදිලියි. ඔයා තමයි කෙනා."

මට මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයට ගිය ක්ෂේත්‍ර චාරිකාව මතක් වුණා. මම මිසිස් ඩොඩ්ස්ව වාෂ්ප කරලා දැම්මේ එදා නේ. එදා, කයිරොන් මගේ දෙසට විසි කළ පෑන කඩුවකට හැරුණා. මේ තියෙන්නේ ඒකවත්ද...?

මම පෑනේ කොපුව ගලවද්දීම, එය ටිකෙන් ටික දිගු වෙන්න ගත්තේ මගේ අතට දැනුණු බරත් වැඩි කරමින්. තත්පර බාගයකට විතර පසු මගේ අතේ තිබුණේ දෙපැත්තේම මුවහත ඇති, දිලිසෙන ලෝකඩ කඩුවක්. රන් ඇණ වද්දා තිබූ ඒ කඩු මිට ලෙදර්වලින් සාදා තිබුණා. මගේ අතට හරියටම සමබරව දැනුණු පළවෙනි ආයුධය වුණේ ඒ කඩුවයි.

"මේ කඩුවට තියෙන්නේ ඛේදනීය ඉතිහාසයක්. ඒ නිසා අපි ඒ ගැන කතා නොකර ඉමු," කයිරොන් මට කිව්වා. "ඒකේ නම තමයි ඇනාක්ලුස්මස්."

"රිප්ටයිඩ් (රළ ඉරන්නා)," මම පරිවර්තනය කළේ, මට පෞරාණික ග්‍රීක කොයි තරම් පහසුවෙන් තේරුම් ගන්න පුළුවන්ද, කියලා පුදුම වෙමිනුයි.

"හදිසි අවස්ථාවලදි විතරක් ඒක පාවිච්චි කරන්න," කයිරොන් කිව්වා. "ඒ වගේම, රාක්ෂයින්ට විරුද්ධව විතරයි. ඇත්තටම, අත්‍යවශ්‍ය හේතුවකට ඇරෙන්න වෙන කිසිම වෙලාවක වීරයෙක් සාමාන්‍ය මනුස්සයෙක්ට හිරිහැර කරන්නේ නැහැ. ඒත් මේ කඩුවෙන් නම් කිසිම අවස්ථාවක එයාලාට හිරිහැරයක් කරන්න බැහැ."

දුෂ්ට ලෙස මුවහත ඇති තලය දෙස මම බැලුවා. "ඇයි මේකෙන් මිනිස්සුන්ට හිරිහැරයක් කරන්න බැහැ කිව්වේ? කොහොමද එහෙම බැරි වෙන්නේ?"

"මේ කඩුව හදලා තියෙන්නේ දිව්‍යමය ලෝකඩවලින්. සයික්ලොප්ස්ලා මේක හැඩ තැලුවේ එට්නා කන්දේ හදවතෙන් පණ පදම් කරලා. මේක සිසිල් කළේ ලීතී ගංගාවෙන්, මේක ඕනෑම රාක්ෂයෙකුට, පාතාලයෙන් එන ඕනෑම සතෙකුට මාරාන්තිකයි. හැබැයි ඒ ඉතින් ඊට කලින් උන් ඔයාව මැරුවේ නැත්නම් විතරයි. ඒත් මේ තලය මිනිස්සු හරහා නම් මිරිඟුවක් වගේ යාවි. මේ තලයට එයාලාව මරන්න තරම් වටින්නේ නැහැ. ඒ වගේම, මම ඔයාට කල් තියාම කියන්නේ: ඔයා උප දෙවියෙක් නිසා දිව්‍යමය හෝ සාමාන්‍ය ඕනෑම ආයුධයකින් ඔයාව මරන්න පුළුවන්. ඔයාට අනතුරක් වෙන්න තියෙන ඉඩ දෙගුණයකින් වැඩියි."

"දැන ගත්ත එක හොඳයි."

"දැන් පෑන ආපහු වහන්න."

පැන් කොපුවෙන් කඩු තුඩට තට්ටු කරද්දීම හැකුළුණු විප්ටයිඩ්, නැවතත් බෝල්පොයින්ට් පෑනකට හැරුණා. මම ඒක සාක්කුවට ඔබාගත්තේ ටිකක් බයෙනුයි. මොකද, මම ඉස්කෝලේදීත් පෑන් නැති කරගන්න හරිම දක්ෂයි නේ.

"ඔයාට බැහැ," කයිරොන් කිවුවා.

"මොකවද බැරි?"

"පෑන නැති කරගන්න," එයා කිවුවා. "ඒකට වශියක් කරලා තියෙන්නේ. ඒ නිසා, ඒක හැම වෙලාවෙම ආපහු ඔයාගේ සාක්කුවෙන් මතුවේවි. උත්සාහ කරලා බලන්න."

පරිස්සමින් වුණත් මම, මට හැකි උපරිම දුරට පෑන විසිකළා. සන්ද පහළ තණ ගොල්ල අතරේ එය නොපෙනී යනවා මම බලා සිටියා.

"ඒකට පොඩි වෙලාවක් යාවි," කයිරොන් මට කිවුවා.

"දැන් ඔයාගේ සාක්කුව බලන්න."

කිවූ විදිහටම, පෑන නැවතත් සාක්කුවට ඇවිත් තිබුණා.

"හා... ඒක නම් මරේ මරු," මම පිළිගත්තා. "ඒත්, මම කඩුවක් ඇදලා යන්නවා මිනිස්සු දැක්කොත්?"

කයිරොන් සිනාසුණා. "මීදුම කියන්නේ බලවත් දෙයක්, පර්සි."

"මීදුම?"

"ඔව්. ඔය වගේ දේවල් ගැන ඉලියඩ් (හෝමර් විසින් රචිත ග්‍රීක සාහිත්‍ය පොතක්) එකේ ගොඩක් සඳහන් කරලා තියෙනවා. මොනම වෙලාවක හරි දිව්‍යමය හෝ යක්ෂමය මූලධාතු මනුෂ්‍ය ලෝකය එක්ක මිශ්‍ර වෙනවා නම්, ඊතෙක් මිනිසුන්ගේ පෙනීම අපැහැදිලි කරන මීදුමක් උපදිනවා. අර්ධ-ලෝහිතයෙක් නිසා ඔයාට නම් දේවල් ඒ විදිහටම පෙනේවි, ඒත් ඒ දේවල්ම මිනිස්සු තේරුම් ගන්නේ වෙනත් විදිහකට. දෙයක් එයාලාට නැළපෙන විදිහේ යථාර්ථයකට සංස්කරණය කරගන්න මිනිස්සු යන ගැඹුර නම් හරිම පුදුමාකාරයි."

මම විප්ටයිඩ් සාක්කුවට දමා ගත්තා.

පළවෙනි වතාවට, මේ ගවේෂණය ඇත්තක් බව මට දැනුණා. මම ඇත්තටම අර්ධ-ලෝහිත කන්දෙන් පිට වෙනවා. වැඩිහිටියෙකුගේ අධීක්ෂණයක්වත්, සැලැස්මක්වත්, අඩු තරමේ ජංගම දුරකථනයක්වත්

නැතිව මම බටහිරට යනවා. (ජංගම දුරකථනවලින් අපි ඉන්න තැන හොයාගන්න රාක්ෂයින්ට පුළුවන්ලු; අපි එකක් පාවිච්චි කරනවා කියන්නේ, ගිනි ගොඩක් ගහලා අපි ඉන්න තැන එයාලාට සංඥා කරනවාටත් වඩා අන්ත වැඩක්ලු.) රාක්ෂයෝ එක්ක සටන් කරලා, මළවුන්ගේ දේශයට ළඟා වෙන්න මගේ ළඟ කඩුවක් හැර වෙන කිසිම බලවත් ආයුධයක් තිබුණේ නැහැ.

"කයිරොන්..." මම කතා කළා. "දෙවිවරු අමරණීයයි කියලා ඔයා කිවුවේ... මං අහන්නේ, එයාලාට කලින් කාලයක් තිබුණා, නේද?"

"ඇත්තටම, එයාලාට කලින් යුග හතරක් තිබුණා. ටයිටන්වරුන්ගේ යුගය තමයි හතරවෙනි යුගය වුණේ. සමහර වෙලාවට ඒකට ස්වර්ණමය යුගය කියලත් කියනවා, හැබැයි ඒක නම් කොහෙත්ම නොගැළපෙන නමක්. මේ බටහිර ශිෂ්ටාචාරය සහ සියුස්ගේ පාලන කාලය තමයි පස්වෙනි යුගය."

"එතකොට, ඒක මොන වගේද... දෙවිවරුන්ට කලින් කාලය?"

කයිරොන්, එයාගේ තොල් හකුලා ගත්තා. "ඒක මතක තියෙන්න තරම් මමවත් නාකි නැහැ, ළමයෝ. ඒත්, ඒ කාලය මිනිස්සු වනචාරීව, කළුවරේ හිටිය කාලයක් කියලා නම් මම දන්නවා. ක්‍රෝනොස්, ටයිටන්ලාගේ අධිපතියා, එයාගේ රාජ්‍ය කාලයට ස්වර්ණමය යුගය කියලා කිවුවේ, ඒ කාලේ ජීවත් වුණ මිනිස්සු කිසිම දැනුමක් නැති, අහිංසක ජීවිත ගෙවපු නිසා. ඒත්, ඒක ප්‍රසිද්ධ වුණේ යන්තමින්. ටයිටන් රජා ඔයාලාගේ වර්ගයා ගැන කිසිම සැලකිල්ලක් දැක්වූවේ නැහැ. එයාට ඔයාලාව කට ගැස්මක්, නැත්තම් ලාබෙට විනෝදය සපයන ප්‍රභවයක් විතරයි. සියුස්ගේ රාජ්‍ය කාලය පටන් ගත්තාට පස්සේ, ප්‍රොමිතියස් කියන හොඳ ටයිටන්වරයා මිනිස් වර්ගයාට ගින්දර ලබා දුන්නාට පස්සෙයි ඔයාලාගේ වර්ගයා දියුණු වෙන්න පටන් ගත්තේ. ඒත්, ඒ නිසා ප්‍රොමිතියස්ව විප්ලවකාරී චින්තකයෙක් විදිහට හංවඩු ගැසුවා. ඔයාට මතක් කරගන්න පුළුවන් ඇති, සියුස් එයාට බොහොම සැරට දඬුවම් කළා. ඇත්ත වශයෙන්ම, ඊට පස්සේ දෙවිවරු මිනිස්සුන්ට හිතවත් වුණා, එයින් පස්සේ බටහිර ශිෂ්ටාචාරය ආරම්භ වුණා."

"ඒත්, දෙවිවරුන්ට දැන් මැරෙන්න බැහැ, නේද? මම කියන්නේ, ඒ බටහිර ශිෂ්ටාචාරය තියෙන තාක් එයාලාත් ජීවත් වෙනවා නේ. ඒ

නිසා... මට මේක කරගන්න බැරිවුණත්, හැමදේම අවුල් වෙන තරම් ගොඩක් නරක දෙයක් වෙන්නේ නැති වෙයි, නේද?"

කයිරොන්ගේ හිනාව දුකෙන් පිරිලා. "බටහිර යුගය කොයි තරම් කාලයක් තියෙයිද කියලා කවුරුවත්ම දන්නේ නැහැනේ, පර්සි. මේ. දෙවිවරු අමරණීයයි තමා. ඒත් ඉතින්, ටයිටන්ලාත් එහෙමනේ. එයාලා තවමත් ඉන්නවා. එක එක හිරගෙවල්වල හිරකරලා, අනන්ත වධ වේදනා, දඬුවම් විඳින්න සලස්වලා, බලයෙන්-ශක්තියෙන් හීන වෙලා හිටියත්, එයාලා තවමත් ජීවත් වෙනවා. දෙවිගොල්ලොත් ඒ වගේ කරුමයක් විඳින්න ඕනෑ කියලා, නැත්නම්, අපි ආපහු කළුවරෙන් පිරුණු අවුල් කාලයකට යන්න ඕනෑ කියලා ඉරණම තීන්දු නොකළොත් හොඳයි. අපිට කරන්න පුළුවන් එකම දේ තමයි, දරුවෝ, අපේ දෛවය අනුව යන එක."

"අපේ දෛවය... ඒක මොකක්ද කියලා අපි දන්නවා නම්."

"සන්සුන් වෙන්න," කයිරොන් මට කිවුවා. "ඔළුව නිරවුල්ව තියාගන්න. ඒ වගේම මතක තියාගන්න, සමහරවිට ඔයා මේ යන්නේ මිනිසා ඉතිහාසයේ ලොකුම යුද්ධය වළක්වන්න වෙන්නත් පුළුවන්."

"සන්සුන්," මම කිවුවා. "මම හොඳටම සන්සුන්."

කන්ද පාමුලට ගිහින්, මම ආපහු හැරී බැලුවා. තාලියාගේ පයින් ගහ මුලට වෙලා, කයිරොන්, එයාගේ සම්පූර්ණ අශ්ව-මිනිස් ස්වරූපයෙන් සිටගෙන සිටියා. එයා දුන්න ඉහළට ඔසවා ආචාර කළා. හරිම සාමාන්‍ය ගිම්හාන කඳවුරක, සාමාන්‍ය තරාශ්වයෙකුගෙන් ලැබෙන සමුදීමක්.

කඳවුරු ප්‍රදේශයෙන් පිටතට වාහනය පැදවූ ආර්ගස් අපිව ලෝන්ග් අයිලන්ඩ්වල බටහිරට රැගෙන ගියා. ඇනබෙත්ව සහ ග්‍රෝවර්ව දෙපැත්තෙන් තබාගෙන, මෙතන් යන සාමාන්‍ය තඩියක් වගේ නැවතත් අධිවේගී පාරේ යාම මට අමුතු අත්දැකීමක් වුණා. අර්ධ-ලෝහිත කන්දේ ගෙවූ සති දෙකට පසු, සැබෑ ලෝකය මනඃකල්පිතයක් වගෙයි මට දැනුණේ. පාර අයිනේ ඇති සෑම මැක්ඩොනල්ඩ්ස් අවන්හලක් දෙසම, දෙමව්පියන්ගේ වාහනවල පිටුපස අසුනේ වාඩිවෙලා යන සෑම ළමයෙක් දෙසම, වගේම, පාරේ තිබුණු සෑම දැන්වීම් පුවරුවක් දෙසත්, සෑම සාප්පු සංකීර්ණයක් දෙසමත් මම පුදුමයෙන් බලන බව මටම තේරුම් ගියා.

"මෙච්චර දුරකට නම් කිසිම අවුලක් වුණේ නැහැ," මම ඇනබෙත්ට කිවුවා. "හැතැප්ම දහයකට එක යකෙක්වත් නෑ."

එයා කේන්තියෙන් මගේ දෙස බැලුවා. "ඔය විදිහට කතා කරන එක අසුබයි, පාසි-මොළේ."

"ආයෙමත් මට මතක් කළේ - ඇයි ඔයා මට ඔච්චරටම වෛර කරන්නේ?"

"මං ඔයාට වෛර කරන්නේ නෑ."

"බොරු කියන්න එපා."

ඇනබෙත්, එයාගේ කැප් එක නැමුවා. "බලන්න... අපි එකට ඉන්න පුළුවන් අය නෙවෙයි, හරිද? අපේ දෙමව්පියෝ ප්‍රතිවාදී අය."

"ඇයි?"

එයා සුසුමක් හෙළුවා. "ඔයාට කොච්චර හේතු ඕනෑද? එක සැරයක් ඔයාගේ තාත්තා, එයාගේ පෙම්වතී එක්ක ඇතීනාගේ දේවස්ථානයක ඉඳලා මගේ අම්මාට අහුවුණා. ඒක ලොකුම ලොකු අපහාසයක්. තව සැරයක්, ඇතැන්ස් නගරයේ පාලක දෙවියා වෙන්න ඇතීනායි, පොසෙයිඩන්යි තරග කළා. ඔයාගේ තාත්තා, එයාගේ තෑග්ග විදිහට මොකක්දෝ විකාර මුහුදු වතුර උල්පතක් නිර්මාණය කළා. මගේ අම්මා ඔලිව් ගහ නිර්මාණය කළා. අම්මාගේ තෑග්ග වඩාත් හොඳ බව දකපු මිනිස්සු ඒ නගරය අම්මාගේ නමින් නම් කළා."

"එහෙනම් එයාලා ඔලිව්වලට ගොඩාක් කැමති ඇති."

"ඔහ්, ඒක අතෑරලා දාන්න."

"මෙකනේ, එයා තෑග්ග විදිහට පීසා එකක්වත් නිර්මාණය කළා නම්, ඔන්න මට හිතාගන්න තිබුණා."

"ඒක අතෑරලා දාන්න කිව්වනේ!"

ඉදිරි අසුනේ සිටි ආර්ගස් හිනාවුණා. එයා කිසිවක් නොකීවත්, එයාගේ බෙල්ල පිටුපස තිබූ එක නිල් පාට ඇසක් මට ඉඟි මැරුවා.

ක්වීන්ස්වලදී මාර්ග තදබදය නිසා අපේ වේගය අඩු වුණා. ඉතින්, අපි මැන්හැටන්වලට යද්දී ඉර බහින වෙලාව ඇවිල්ලා. ඒ අතරේ වැස්සකුත් පටන් ගත්තා.

නැගෙනහිර ඉහළ කොටසේ, ෆ්‍රේ හවුන්ඩ් නැවතුම්පොළ ළඟින් ආර්ගස් අපිව බැස්සුවා. එතැන සිට අපේ ගෙදරට ඒ හැටි දුරක්

නැහැ. එතැන තැපැල් පෙට්ටියක, මගේ පින්තූරයක් සහිත [illegible] දැන්වීමක් අලවා තිබුණා: ඔබ මේ දරුවා දුටුවාද?

ඇනබෙත් හෝ ග්‍රෝවර් දකින්න කලින් මම ඒක ඉරා දැමුවා.

අපේ ගමන් මලු බැව ආර්ගස්, අපිට බස් ටිකට් අරන් දීලා ආපසු යන්න ගියා. එයා රථ ගාලෙන් පිටට වාහනය ගන්නා තුරුම, එයාගේ අත පිටුපස වූ ඇහැ අපි ගැන සෝදිසියෙන් සිටියා.

මගේ පරණ ගෙදරට කොයි තරම් කිට්ටුද කියලා මම කල්පනා කළා. සාමාන්‍ය දවසක නම්, මේ වෙද්දී මගේ අම්මා රසකැවිලි සාප්පුවේ වැඩ ඉවර වෙලා ගෙදර ඇවිත්. සමහරවිට, ගඳ ගහන ගේබ් නම් කාඩ් සෙල්ලම් කර-කර ගෙදර ඇති. එයාට නම් අම්මා නැතුව පාළුවක් දැනෙන්නෙවත් නැතිව ඇති.

ඇනබෙත්, එයාගේ ගමන් මල්ල කරේ දමාගත්තා. මගේ බැල්ම යොමු වී තිබුණු දෙස එයාත් උවමනාවෙන් බැලුවා. "අම්මා එයාව කසාද බැන්දේ ඇයි කියලා ඔයාට දැනගන්න ඕනෑද, පර්සි?"

මම ඇස් ලොකු කරගෙන එයා දෙස බැලුවා. "ඔයාට මගේ හිත කියවන්න පුළුවන්ද?"

"ඔයාගේ චිත්තවේගයන් විතරයි." එයා උරහිස් ඇකිළුවා. "මං හිතන්නේ, සැටිර්ලාට ඒක කරන්න පුළුවන් කියලා ඔයාට කියන්න මට අමතක වෙන්න ඇති. ඔයා හිත-හිතා හිටියේ ඔයාගේ අම්මායි, [illegible] ගැන, නේද?"

මම ඔළුව වැනුවේ, ග්‍රෝවර්ට කියන්න අමතක වුණු තව මොනා මොනා දේවල් ඇතිද, පුදුම වෙමින්.

"ඔයා නිසයි අම්මා එයාව කසාද බැන්දේ," ග්‍රෝවර් මට කිවුවා. "ඔයා එයාව 'ගඳ ගහන ගේබ්' කිව්වට, ඒ ගැන කිසිම අදහසක් ඔයාට නැහැ. ඒ මිනිස්සයාගෙන් ගඳ පිට වෙනවා... ඊයා, ඒ ගඳ මට මෙතැනටත් දැනෙනවා. ඔයා සති ගාණකින් එයාගේ කිට්ටුව ඉඳලා නැති වුණත්, එයාගේ ගඳේ සලකුණු මට ඔයාගෙන් දැනෙනවා."

"ස්තුතියි," මම කිවුවා. "ළඟම නාන කාමරේ තියෙන්නේ කොහෙද?"

"ඔයා ඒකට ස්තූතිවන්ත වෙන්න ඕනෑ, පර්සි. ඔයාගේ [illegible] කොච්චර අප්පිරියා ජනක විදිහට මනුස්ස ගඳ ගහනවද කිව්වොත්, එයාට ඕනෑම උප දෙවියෙක්ගේ රස් වළල්ල ආවරණය කරන්න

පුළුවන්. එයාගේ වාහනය ඇතුළේ එක පාරක් ඉව කරපු ගමන් මම ඒක දැන ගත්තා: අවුරුදු ගාණක් තිස්සේ ඔයාගේ ඉව මුවා කරමින් ඉඳලා තියෙන්නේ ගේබ්. හැම ගිම්හාන සෘතුවකම ඔයා එයා එක්ක ජීවත් නොවුණා නම්, රාක්ෂයෝ ඔයාව හොයාගන්නේ ගොඩාක් කාලෙකට කලින්. ඔයාගේ අම්මා එයා එක්ක නැවතිලා හිටියේ ඔයාව ආරක්ෂා කරන්න. එයා නම් හරිම බුද්ධිමත් ගෑනු කෙනෙක්. මේක කියන්නේ ඔයාගේ හිත හැදෙයිද බලන්න - එයා අර වගේ මනුස්සයෙක් එක්ක ජීවත් වෙන්න ඇත්තේ ඔයාට ගොඩාක් ආදරේ නිසයි."

ඇත්තටම, ඒකෙන් මගේ හිත හැදුනේ නැහැ, ඒත් ඒ බව නොපෙන්වා ඉන්න මම උත්සාහ කළා. මම ආයෙමත් එයාව මුණ ගැහෙනවා, මම හිතුවා. එයා යන්නම ගිහින් නැහැ.

මගේ චිත්තවේගයන් මේ තරමටම කලවම් වෙලා තියෙද්දිත්, ග්‍රෝවර්ට ඒවා කියවන්න පුළුවන්ද හිතලා මම පුදුම වුණා. ඇනබෙත් මාත් සමග හිඳීම මට සතුටක් වුණත්, මම එයාලාට අවංක නොවීම ගැන වරදකාරී හැඟීමක් මට දැනුණා. මේ පිස්සු ගවේෂණයට මම කැමති වූ ඇත්තම හේතුව මම එයාලාට කිවුවේ නැහැ නේ.

ඇත්තම කාරණය මේකයි; සියුස්ගේ විදුලි අකුණ සෙවීම ගැනවත්, ලෝකය බේරා ගැනීම ගැනවත් අඩු තරමේ, මගේ තාත්තාට මේ කරදරෙන් ගොඩ එන්න උදවු කරන්නවත් මම කරදර වුණේ නැහැ. ඒ ගැන කල්පනා කරන තරමට, මට පොසෙයිඩන්ව තුරුස්සන්න ගත්තා. එයා කවදාවත් මාව බලන්න ආවේ නැහැ, මගේ අම්මාට උදවු කළෙත් නැහැ, අඩු තරමේ දරු-නඩත්තු චෙක් එකක්වත් එව්වේ නැහැ. එයා මං වෙනුවෙන් හිමිකම් කිවුවේ එයාට වැඩක් කරවාගන්න උවමනා නිසා විතරයි.

මම සැලකිල්ලක් දක්වූ එකම කාරණය වුණේ මගේ අම්මා විතරයි. හේඩීස් හරිම අසාධාරණ විදිහට එයාව අරගෙන ගියා. ඒ නිසා, එයාව ආපහු දෙන්න හේඩීස්ට සිද්ධ වේවි.

තුඹට යහළුවා යැයි අමතන අයෙකු තුඹට ද්‍රෝහි වේවි. මගේ හිත ඇතුළෙන් ඔරැකල් කෙඳිරුවා. අවසානයේදී, වඩාත්ම වැදගත් දේ බේරා ගැනීමට තුඹ අපොහොසත් වේවි.

කට වහගන්නවා, මම ඒකට කිවුවා.

වැස්ස දිගටම ඇද හැළුණා.

ඔසයක් එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටි අපි ග්‍රෝවර්ගේ මල්ලේ තිබූ ඇපල් ගෙඩියකින් සෙල්ලම් කරන්න අන්තිමට තීරණය කළා. සෙල්ලමේදී ඇනබෙත්ගේ දක්ෂකම් අදහන්න බැරි වුණා. එයාට දණහිසෙන්, වැලමිටෙන්, උරහිසෙන් - ඕනෑම ආකාරයකට ඇපල් ගෙඩිය පොලා පන්නවන්න පුළුවන් වුණා. මමත් ඒ සෙල්ලමට කොහෙත්ම දුර්වල වුණේ නැහැ.

මම ඇපල් ගෙඩිය ග්‍රෝවර්ගේ දිහාවට දැමූ පසු සෙල්ලම අවසන් වුණා. ඒ වෙලාවේ ඒක ග්‍රෝවර්ගේ කටට ගොඩාක් කිට්ටු වුණා. ඉතින්, මහා එච් කටක් ඇතුළට අපේ බෝලය අතුරුදහන් වුණා.

ග්‍රෝවර් රතු වුණා. එයා සමාව ඉල්ලන්න උත්සාහ කළත්, ඇනබෙත්ටයි මටයි හිනාව නතර කරගන්න බැරි වුණා.

අන්තිමේදී, බසය ආවා. අපි පෝලිම ගැසී නගින්න බලා ඉන්න අතරේ ග්‍රෝවර් වටපිට බලමින්, සුළඟ ඉව කරන්න ගත්තේ එයා ආසම කෑමක සුවඳ දකිලා වගෙයි.

"ඇයි මොකද?" මම ඇහුවා.

"මම දන්නේ නෑ," එයා ආතතියෙන් වගේ කිවුවා. "සමහරවිට, මුකුත් නැතුව ඇති."

මුකුත් නැති වෙන්න බැරි බව මටත් දැනුණ නිසා මමත්, මගේ උරහිසට උඩින් හැරී බලන්න ගත්තා.

අන්තිමේදී, බසයට නැගලා, තුන් දෙනාටම වාඩිවෙන්න පිටුපස අසුනක් සොයාගත්තාට පසු මට සහනයක් දැනුණා. අපි, අපේ ගමන් මලු රාක්කයේ ඇසිරුවා. ඇනබෙත් කලබලයෙන් වගේ එයාගේ තොප්පියෙන් කකුලට තට්ටු කරන්න ගත්තා.

අන්තිම මගියාත් බසයට නගිද්දී ඇනබෙත්, එයාගේ අතක් මගේ දණහිස් උඩින් තැබුවා. "පර්සි..."

ඒ වෙලාවේ බසයට ගොඩවුණේ වයසක ගැහැනු කෙනෙක්. පොඩි වූ වෙල්වට් ගවුමක් සහ ලේස් අත් මේස් හැඳ සිටි එයා නැඩියක් නැති, තැඹිලි පාට ගෙතූ තොප්පියකින් මුහුණ මුවා කරගෙන සිටියා. එයා ළඟ ලොකු අත් බෑගයකුත් තිබුණා. ඒ ගැහැනු කෙනා ඔළුව පැත්තකට ඇල කර බලද්දී දිලිසුන එයාගේ කළු ඇස් දෙක දැකලා මොහොතකට මගේ පපුවට ගැහෙන්නත් අමතක වුණා.

ඒ මිසිස් ඩොඩ්ස්. වයසට ගිහින්, තවත් ටිකක් හැකිළී තිබුණත්, ඒ අර යක්ෂ මුහුණම තමයි.

මම, මගේ අසුනේ යටටම ගිලුණා.

එයාට පිටුපසින් තවත් වයසක ගැහැනු දෙන්නෙක් ආවා. එක්කෙනෙක් කොළ පාට තොප්පියක් දාලා. අනෙකා දම් පාට තොප්පියක් දාලා. ඒ හැරෙන්න, එයාලත් හරියටම මිසිස් ඩොඩ්ස් වගේමයි - ගැට ගැසුණු අත්, ගමන් මලු, පොඩිවුණ වෙල්වට් ඇඳුම - හැමදේම එක වගේමයි. තුන් නිවුන් යක්ෂ ආච්චිලා.

එයාලා තුන් දෙනා රියැදුරුට පිටුපස වූ මුල්ම ආසනවල වාඩිවුණා. ආසන අතර ප්‍රවේශ මාර්ගය අසල සිටි ආච්චිලා දෙන්නා මැදි මග හරහා කතිර හැඩයට කකුල් දමා ගත්තා. අහම්බයෙන් සිදු වූවක් ලෙස පෙනුණත් එයාලා එයින් පැහැදිලි පණිවුඩයක් දුන්නා. කිසිවෙකුටත් පිටවීම තහනම්.

නැවතුම්පොළින් පිටත්වූ බසය අපිවත් රැගෙන මැන්හැටන්වල මටසිළුටු පාරවල් දිගේ ඉදිරියට ඇදුණා. "එයා එච්චර කාලයක් මැරිච්ච විදිහටම ඉඳලා නැහැ," මගේ කටහඬ වෙව්ලන්නේ නැතිව තබා ගන්න උත්සාහ කරමින් මම කිවුවා. "එක පැරයක් එයාලාව මැරුවොත් අපේ ජීවිත කාලේටම ආයේ එන්නැති වෙයි කියලා නේද ඔයා කිවුවේ?"

"මං කිවුවේ ඔයා වාසනාවන්ත නම්, කියලා," ඇනබෙත් කිවුවා. "ඒක නම් ඔයාට චුට්ටක්වත් නෑ වගේ."

"එයාලා තුන් දෙනාම," ග්‍රෝවර් අඬන්න වගේ කිවුවා. "ඩී ඉමෝර්ටේල්ස්!"

"ඒකට කමක් නෑ," ඇනබෙත් කිවුවේ බරටම කල්පනා කරමින්. "ෆියුරීලා. පාතාල ලෝකේ ඉන්න නපුරුම රාක්ෂයෝ. අවුලක් නෑ. අවුලක් නෑ. අපි ජනෙල්වලින් පැනලා එළියට යමු."

"ඒවා අරින්න බෑ," ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"පිටිපස්සේ දොරක් ඇති නේ?" එයා යෝජනා කළා.

එහෙම දොරක් තිබුණේ නැහැ. එහෙම එකක් තිබුණත් එයින් වැඩක් වෙන්නේ නැති වේවි. ඒ වෙද්දී අපි නමවෙනි මාර්ග පථය දිගේ ලින්කන් උමඟ දෙසට ගමන් කරමිනුයි සිටියේ.

"වටේ ඉන්න හැමෝම බලාගෙන ඉන්නකොට එයාලා අපිට ගහන්න එන්නේ නැතිවෙයි," මම කිවුවා. "එහෙම නේද?"

"මිනිස්සුන්ගේ පෙනීම දුර්වලයි නේ," ඇනබෙත් මට මතක් කළා. "එයාලාගේ මොළේ තේරුම් ගන්නේ එයාලා මීදුම හරහා දකින දේ විතරයි."

"ඉතින්, නාකි ආච්චිලා තුන් දෙනෙක් අපිව මරනවා කියලා එයාලාට පේන්නේ නැති වෙයිද?"

එයා ඒ ගැන ටිකක් කල්පනා කළා. "කියන්න අමාරුයි. ඒත්, අපිට මිනිස්සුන්ගේ උදවු බලාපොරොත්තු වෙන්න බැහැ. සමහරවිට... හදිසි පිටවීම් දොරක් වහලේ තියෙනවද දන්නෑ."

අපි ලින්කන් උමගට ඇතුළු වුණා. ඒත් එක්කම, මැදි මගේ තිබූ එළිය හැර, මුළු බසයම අඳුරු වුණා. වැස්සේ හඬ නැතිවීමෙන් බිය හිතෙන නිහඬතාවක් ඇති වුණා.

මිසිස් ඩොඩ්ස් නැගිට්ටා. කලින් පුරුදු වෙලා ආව දෙබසක් කියනවා වගේ නීරස හඬකින් මුළු බසයටම ඇහෙන්න එයා නිවේදනයක් කළා: "මට වැසිකිළියට යන්න ඕනෑ."

"මටත් ඕනෑ." දෙවැනි සහෝදරියත් කිවුවා.

"මටත් ඕනෑ." තුන් වැනි සහෝදරියත් කිවුවා.

එයාලා තුන් දෙනාම මැදි මග දිගේ එන්න ගත්තා.

"හරි, මට මතක් වුණා," ඇනබෙත් කිවුවා. "පර්සි, මගේ කැප් එක ගන්න."

"මොකටද?"

"එයාලාට ඕනෑ ඔයාව. ඒ නිසා අදෘශ්‍යමාන වෙලා, ඉස්සරහට යන්න. එයාලා ඔයාව පහු කරනකම් ඉන්න. එතකොට ඔයාට පුළුවන් වෙයි ඉස්සරහට ගිහින් එළියට පැන ගන්න."

"ඒත්, ඔයාලා -"

"සමහරවිට, එයාලා අපිව ගණන් ගන්නේ නැතිවෙයි." ඇනබෙත් කිවුවා. "ඔයා ලොකු තුන්කට්ටුවේ කෙනෙක්ගේ පුතා නිසා ඔයාගේ සුවඳ වැඩියෙන් පැතිරෙනවා ඇති."

"ඒත්, ඔයාලාව දාලා යන්න මට බැහැ."

"අපි ගැන කරදර වෙන්න එපා," ග්‍රෝවර් කිවුවා. "දැන් යන්න!"

මගේ අත් වෙවුලුවා. බයගුලුකමක් වගේ දැනුනත්, මම කැප් එක දමාගත්තා.

ඊට පස්සේ මම පහළ බලනකොට, තවදුරටත් එතැන මගේ ඇඟ තිබුණේ නැහැ.

මම මැදි මග දිගේ ඉදිරියට ගියා. ආසන පේළි දහයක් පසු කරගෙන ඉදිරියට යන්න මට පුළුවන් වුණා. ඉන්පසු ෆියුරිලා මාව පසු කරනවාත් එක්කම මම හිස් අසුනකට පැනගත්තා.

නැවතුන මිසිස් ඩොඩ්ස් ඉව කරමින්, කෙලින්ම මගේ දෙස බැලුවා. මගේ පපුව පිටි කොටන්න ගත්තා.

පෙනුණු විදිහට නම්, එයා කිසිවක් දැක්කේ නැහැ වගෙයි. එයයි, එයාගේ සහෝදරියෝ දෙන්නයි දිගටම ගියා.

මම නිදහස්. බසයේ ඉදිරියටම යන්න මට ඉඩ ලැබුණා. ඒ වෙද්දි අපි ලින්කන් උමගේ අනෙක් කෙළවරට ළං වෙලයි සිටියේ. මම හදිසි නැවතුම් බොත්තම ඔබන්න සූදානම් වෙද්දිම, භයානක විලාපයක් පිටුපස ආසන පේළියෙන් ඇහුණා.

වයසක ආච්චිලා තවදුරටත් ආච්චිලා ලෙසට සිටියේ නැහැ. එයාලාගේ මුහුණු නම් වෙනස් නොවී තිබුණා - මං හිතන්නේ ඒවා ඊටත් වඩා කැත වෙන්න විදිහක් නැති නිසා වෙන්න ඇති - ඒත් එයාලාගේ ඇඟවල්, වවුල් තටු සහ තියු පහුරු සහිත අත, පය ඇති දුඹුරු පාට හම් කඩමාලුවලට හැකුළුණා. එයාලාගේ අත් බෑග් දැවෙන කසවලට හැරුණා.

ඇනබෙත්ව සහ ග්‍රෝවර්ව වටකරගත් ෆියුරිලා, කසවලින් පහර දෙමින් පිඹින්න ගත්තා: "කොහෙද ඒක? කොහෙද?"

බසයේ සිටි අනෙක් මිනිස්සු, එයාලාගේ ආසනවල වකුටු වෙලා බෙරිහන් දෙන්න ගත්තා. ඒ කියන්නේ, එයාලාටත් මොකක්හරි පෙනුණා.

"එයා මෙතැන නැහැ!" ඇනබෙත් කෑගැසුවා. "එයා ගිහින්!"

ෆියුරිලා කස ඉහළට එසෙව්වා.

Scanned with CamScanner

ඇනබෙත්, එයාගේ ලෝකඩ පිහිය ඇදලා ගත්තා. ග්‍රෝවර්, එයාගේ කෑම මල්ලෙන් ටින් කෑන් එකක් අරගෙන, එයින් දමලා ගහන්න සූදානම් වුණා.

ඊළඟට මම කළ දේ කොයි තරම් ආවේගකාරී, අනතුරුදායක දෙයක්ද කියනවා නම්, වසරේ මුරණ්ඩුම ළමයා ලෙසට මාව නම් කරන්න වුණත් ඉඩ තිබුණා.

කලබල වී සිටි රියැදුරා උත්සාහ කරමින් සිටියේ පසුපස බලන කණ්ණාඩිය තුළින් සිදු වෙන දේ බලා ගන්නයි.

තවමත් අදෘශ්‍යමානව සිටි මම එයාගෙන් සුක්කානම උදුරාගෙන, බසය වම් පැත්තට කැපුවා. දකුණු පැත්තට විසි වෙන අතරේ, හැමෝම මොර දුන්නා. ඒ ඝෝෂාව අතරින් මම බලාපොරොත්තු වූ හඬ - ඒ කියන්නේ ෆියුරිලා තුන් දෙනෙක් ජනේලයක තදින් වදින හඬ මට ඇහුණා.

"හේයි!" රියැදුරා කෑගැසුවා. "හේයි - හෝව්!"

අපි දෙන්නා සුක්කානමට පොර කෑවා. උමං බිත්තියේ වැදුණු බසයේ ලෝහ ඇඹරෙමින්, සැතපුමක් විතර ඈතට ගිනි පුපුරු විසිවුණා.

පැත්තකට ඇල වුණු බසය, ලින්කන් උමගෙන් පිටත වූ වැහි කුණාටුව දෙසට ඇදී ගියා. මිනිස්සු සහ යක්ෂණියෝ බසය තුළ බෝල වගේ එහෙ මෙහෙ පෙරළුණා.

කොහොම හරි, පිටවීමක් සොයා ගන්න රියැදුරාට හැකි වුණා. දුසිම් බාගයක විතර වාහන එළි මැදින්, වෙඩිල්ලක වේගයෙන් අධිවේගී පාරට පිවිසුණු අපේ බසය නිව් ජර්සි දෙසට යන ග්‍රාමීය පාරක් දෙසට පෙරළෙන්න වුණා. නිව්යෝක් හරහා ගලන ගංගාවට එතැන ඉඳන් වැඩි දුරක් නැහැ. අපිට වම් පැත්තෙන් කැලෑවකුත්, දකුණු පැත්තෙන් හඩ්සන් ගංගාවත් තිබුණා. රියැදුරා ගඟ පැත්තට බරවෙලා යනවා වගෙයි මට පෙනුණේ.

තවත් ශ්‍රේෂ්ඨ අදහසක්: මම හදිසි තිරිංග පෑගුවා.

අඳෝනා නැගූ බසය තෙත තාර මත සම්පූර්ණ රවුමක් කැරකී, ගස් අතරට කඩා වැදුණා. හදිසි ආපදා එළි දැල්වෙමින් බසයේ දොර විවෘතයෙන් ඇරුණා. මුලින්ම බසයෙන් පිටතට පැන ගත් රියැදුරා පිටුපසින් විලාප තියමින් සිටි මගියෝ ටිකත් එළියට යන්න කලබල කළා. එයාලාට යන්න ඉඩ දීලා මම රියැදුරු ආසනය දෙසට ගියා.

ඒ අතරේ, ආපසු සමබරතාවය ලබාගන්න ෆියුරිලාට පුළුවන් වුණා. පෞරාණික ග්‍රීකවලින් 'ළඟට එන්න එපා!' කෑ ගසමින්, පිහිය වැනූ ඇනබෙත්ට එයාලා කසයෙන් පහර දෙන්න පටන් ගත්තා. ඒ අතරේ ග්‍රෝවර් ටින් කෑන්වලින් දමා ගැසුවා.

මම විවෘතව තිබූ දොර දෙස බැලුවා. එතැනින් ගැලවිලා යන්න මට ඕනෑ තරම් ඉඩ තිබුණා, ඒත් මම කොහොමද මගේ යාළුවන්ව දාලා යන්නේ? මම අදෘශ්‍යමාන වෙන කැප් එක ගැලවූවා. "හේයි!"

දිගු දළ විලිස්සමින් මගේ දෙසට හැරුණු ෆියුරිලා දකිද්දී එතැනින් පිට වෙන එක ඇඟට ගුණයි කියලා හදිසියේම වගේ මට පෙනෙන්න ගත්තා. මිසිස් ඩොඩ්ස් ආඩම්බර ගමනින් මැදි මග දිගේ ඇවිද ආවේ හරියට ඉස්කෝලේදී ගණන්වලට මම ගත්ත එෆ් එක දෙන්න එයා එන්න පුරුදු වෙලා සිටි විදිහටමයි. එයා කසය සොලවන සෑම වතාවකදීම, රතු පාට ගිනිදලු ලෙදර් පටිය දිගේ නටනවා පෙනුණා.

දෙපැත්තෙන් තිබූ ආසන උඩට නැගගත් එයාගේ කැත සහෝදරියෝ දෙන්නා තඩි, තපුරු කටුස්සෝ දෙන්නෙක් වගේ මගේ දිහාවට බඩගාන්න පටන් ගත්තා.

"පර්සියස් ජැක්සන්," මිසිස් ඩොඩ්ස් කතා කළේ අමුතුම උච්චාරණ විලාසයකින්. "නුඹ දෙවිවරුන්ව අමනාප කරගත්තා. නුඹ මිය යා යුතුයි."

"ඔයා ගණන් ටීචර් විදිහට ඉන්නකොට මීට වඩා හොඳයි වගේ," මම එයාට කිවුවා.

එයා ගෙරෙව්වා.

ඉඩක් ලැබෙන තුරු බලා සිටි ඇනබෙත් සහ ග්‍රෝවර් හොරෙන් හොරෙන් ෆියුරිලාගේ පිටුපසට ආවා.

බෝල්පොයින්ට් පෑන සාක්කුවෙන් පිටතට ගත් මම එහි කොපුව ගැලෙව්වා. රිප්ටයිඩ් දිගු වී දිලිසෙන, දෙපැත්ත කැපෙන කඩුවකට හැරුණා.

ඒක දැකපු ෆියුරිලා පසුබැවා.

මිසිස් ඩොඩ්ස් මීට කලින් රිප්ටයිඩ් තලයේ රස විඳලා තිබුණ නිසාම, නැවත වතාවක් ඒක දකින්න එයා කැමති නොවූ බව මට තේරුණා.

"යටත් වෙනු," එයා පිම්බා. "එවිට තුඹට සදාකාලිකව වද විඳින්න සිදු නොවේවි."

"හොඳ උත්සාහයක්," මම එයාට කිවුවා.

"පර්සි, බලාගෙන!" ඇනබෙත් කෑගැසුවා.

මිසිස් ඩොඩ්ස් මගේ කඩුව තිබූ අතට එයාගේ කසයෙන් පහර දෙනකොටම දෙපැත්තේ සිටි ෆියුරිලා මගේ දිහාවට පැන්නා.

මට දැනුණේ මගේ අත උණු ඊයම්වලින් එතුවා වගෙයි. ඒත්, කොහොම හරි රිප්ටයිඩ් අත නොහැර ඉන්න මට පුළුවන් වුණා. වම් පැත්තේ සිටි ෆියුරිට කඩු මිටෙන් ඇන්න මම, එයාව ආසනයක් උඩට වැට්ටුවා. ඊට පස්සේ මම දකුණු පැත්තේ සිටි ෆියුරිව පෙති ගැසුවා. කඩු තලය එයාගේ බෙල්ලේ වදිනවාත් එක්කම බෙරිහන් දුන් එයා පුපුරා ගොස් දූවිල්ලකට හැරුණා. ඇනබෙත් මල්ලවපොර ඉරියව්වකින් මිසිස් ඩොඩ්ස්ව අල්ලගෙන පිටුපසට අදින අතරේ, ග්‍රෝවර් එයාගේ අතේ තිබුණ කසය උදුරාගත්තා.

"ආයි!" එයා කෑගැසුවා. "උයි! පිච්චෙනවෝ! පිච්චෙනවෝ!"

මම කඩු මිටෙන් පහර දුන් ෆියුරි, එයාගේ නිය පහුරු සූදානම් කරගෙන නැවතත් මගේ ඇඟට පැන්නා. ඒත් මගේ රිප්ටයිඩ් පහරක් වැදුණු එයා පොලු පහරක් වැදුණු කණා මුට්ටියක් වගේ කුඩුවෙලා ගියා.

මිසිස් ඩොඩ්ස් දඟලමින් සිටියේ ඇනබෙත්ව එයාගේ පිටෙන් ඉවත් කරගන්නයි. එයා පයින් ගසමින්, හූරමින්, පිඹිමින්, හපමින් දඟලුවත්, ග්‍රෝවර් මිසිස් ඩොඩ්ස්ගේ කකුල් දෙක එයාගේම කසයෙන් ගැට ගසන තුරුම ඇනබෙත් එයාව අල්ලාගෙන සිටියා. අන්තිමට, ඒ දෙන්නා එකතු වෙලා මිසිස් ඩොඩ්ස්ව මැදි මග දිගේ පිටුපසට තල්ලු කළා. මිසිස් ඩොඩ්ස් නැගිටින්න උත්සාහ කළත්, එයාගේ වවුල් තටු සොලවන්න තරම් ඉඩක් එතැන නොතිබුණ නිසා එයාව නැවතත් බිමට ඇදගෙන වැටුණා.

"සියුස් තුඹව විනාශ කරාවි!" එයා දිවුරුවා. "හේඩීස් තුඹගේ ආත්මය ගනීවි!"

"බ්‍රකාස් මෙස් වෙසිමිනි!" මම කෑගැසුවා.

ඒ ලතින් වචන ටික ආවේ කොහෙන්ද කියලා මට විශ්වාසයක් තිබුණේ නැහැ. ඒත්, මං හිතන්නේ ඒකේ තේරුම 'මගේ කලිසම කාපියා' කියන එකයි.

අකුණකින් බසය දෙදුරුම් කෑවා. මගේ බෙල්ල පිටුපස කෙස් පවා කෙලින් වුණා.

"එළියට යන්න!" ඇනබෙත් මට කෑගැසුවා. "දැන්ම!" මට තවත් අනුබලදීම් උවමනා වුණේ නැහැ.

ඉක්මනින් එළියට පැනගත් අපිට අනෙක් මගියෝ තෝන්තුවෙන් වගේ ඉබාගාතේ යන විදිහත්, සමහරු රියැදුරා එක්ක වාද කරන හැටිත්, තවත් සමහරු "අපි මැරෙන්න යනවෝ!" කෑගසමින් එක තැන රවුමට දුවනවාත් දකින්න ලැබුණා. හවායි කමිසයක් හැඳ, කැමරාවක් අතේ තියාගෙන සිටි සංචාරකයෙක් මම කඩුව ආවරණය කරගන්න කලින් මගේ පින්තූරයක් ගත්තා.

"අපේ බෑග් ටික!" ග්‍රෝවර්ට මතක් වුණා. "ඒවා දාලා ඇවි-"

ඩෝං!!!

බසයේ ජනේල මහ හඬින් පුපුරා යද්දී, මගියෝ මුවාවෙන්න තැන් සොයමින් දිව්වා. අකුණු පහරට වහලය තීරුවලට ඉරී, ලොකු වළක් සෑදී තිබුණා. ඒත්, ඇතුළෙන් ඇසුණු කේන්තියෙන් පිරුණු ලතෝනිය මට කිවුවේ මිසිස් ඩොඩ්ස් තවම මැරිලා නැති බවයි.

"දුවන්න!" ඇනබෙත් කිවුවා. "එයා උදවුවට කට්ටිය කැඳවනවා! අපි ඉක්මනට මෙතැනින් පිට වෙන්න ඕනෑ!"

මොර සූරන වැස්ස මැදින් අපි වේගයෙන් කැලයට වැදුණා. අපිට පිටුපසින් බසය ගිනිදලු නංවමින් ඇවිළුණත්, අපිට ඉදිරියෙන් තිබුණේ ගන කළුවර විතරයි.

Scanned with CamScanner

11

අපි මහා බහිරව වෙළඳ පොළට ගොඩ වැදුණා

සමහර වෙලාවට, ග්‍රීක දෙවිවරු තවමත් ඉන්න බව දනගෙන ඉන්න එකත් හොඳයි කියලා හිතෙනවා. මොකද, එතකොට ඔයා කරන දේවල් වැරදුනාම ඒ වැරැද්ද පටවන්න කෙනෙක් ඉන්නවා නේ. උදාහරණයක් විදිහට, මේ දත් රාක්ෂ ප්‍රහාරයකට අහුවෙලා, ඊට පස්සේ අකුණකින් පුපුරා ගිය බසයකින් පිටවෙලා ඔයා යනකොට, හතර අතින්ම මහා වැස්සකුත් ඇද වැටෙනවා නම්, ගොඩාක් අය හිතන්නේ ඒක නම් ඇත්තටම අවාසනාව නිසා වෙන දෙයක් කියලයි; ඒත්, ඔයා අර්ධ-ලෝහිතයෙක් නම්, මොකක් හරි දිව්‍යමය බලයකින් ඔයාගේ දවසම මුස්පේන්තු කරන්න හදන බව ඔයාට තේරුම් ගන්න පුළුවන් වෙනවා.

ඔන්න ඔය විදිහට ඇනබෙත්, ග්‍රෝවර් සහ මම නිව් ජර්සි ගං ඉවුර දිගේ වූ කැලෑව මැදින් ඇවිදගෙන ගියේ, අපේ නහයවල් පසාරු කරගෙන පැතිරුණු හඩිසන් ගංගාවේ ගඳත් ඉවසාගෙනයි. ඒ අතරේ, අපිට පිටුපසින් තිව්වයෝක් රෑ අහස කහ පාටින් දිලිසුනා.

ග්‍රෝවර් වෙවුලමින් කොටළුවෙක් වගේ බෙරිහන් දුන්නා. එයාගේ ලොකු එළු ඇස්වල කළු ඉංගිරියා දෙක පැළම් දෙකක් තරමට සිහින් වෙලා, බයෙන් පිරිලා තිබුණා. "කාරුණික ඇත්තෝ තුන් දෙනාම... තුන් දෙනාම එක පාර."

මගේ හිරියේ සැහෙන කම්පනයකින්. බසයේ සිද්ධ වුණ පිපුරුමේ හඬ තවමත් මගේ කන් තුළ දෝංකාර දුන්නා. ඒ වුණත්, "දිගටම යමු! අපි ඈතට යන තරමට ඇගට ගුණයි." කියමින් ඇනබෙත් දිගටම අපිව ඇදගෙන ගියා.

"අපේ සල්ලි ඔක්කොම එතැන තිබුණේ," මම එයාට මතක් කළා. "අපේ කෑම, ඇඳුම්. හැමදේම."

"ඔව් ඉතින්, සමහරවිට, රණ්ඩුව මැදට පනින්න ඔයා තීරණය නොකළා නම් -"

"එහෙනම් මං මොනවා කරනවාටද ඔයා කැමති වුණේ? ඔයාලාව මරනකල් බලාගෙන ඉන්නවටද?"

"ඔයා මාව ආරක්ෂා කරන්න ඕනෑ නැහැ, පර්සි. මට හැමදේම හොඳින් කරගන්න පුළුවන්කම තිබ්බා."

"පෙති පාන් ගෙඩියක් වගේ පෙති ගැහිලා," ග්‍රෝවර් මැදට පැන්නා. "ඒත් හොඳින්."

"කට වහගන්නවා, එළු-කොල්ලෝ." ඇනබෙත් කිවුවා.

ග්‍රෝවර් දුකින් කෙඳිරි ගෑවා. "ටින් කෑන් ටික... ඒක හැම අතින්ම ඉස්තරම් ටින් කෑන් මල්ලක්."

කිලුටු රෙදිවල ගඳ හැමූ ඇඹරුණු ගස් අතර, මඩ පොළොව කලතමින් අපි ඉදිරියට ගියා.

විනාඩි කීපයකට පස්සේ ඇනබෙත් මගේ ළඟට ආවා. "බලන්න, මම..." එයාගේ කටහඬ පැකිළුණා. "ඔයා අපි වෙනුවෙන් ආපහු ආව එකට මට ගොඩාක් සතුටුයි. හොඳද? ඒක නම් ඇත්තටම නිර්භීත වැඩක්."

"අපි කණ්ඩායමක්නේ, නේද?"

තවත් විනාඩි කීපයක් යනතුරු එයා නිහඬව සිටියා. "බැරි වෙලාවත් ඔයා මැරුණා නම් එහෙම... ඒක ඔයාට එපා වෙන වැඩක් වෙන එක ඇරුණාම, මේ ගවේෂණයත් එතැනින් ඉවර වෙනවා. සමහරවිට, ඇත්ත ලෝකය දකින්න මට ලැබෙන එකම අවස්ථාව මේක වෙන්න පුළුවන්."

අන්තිමේදී අකුණු කුණාටුව අඩු වුණා. නගරයේ දීප්තිය අපිට පිටුපසින් බොඳවී ගියේ, කැලි කැපිය හැකි කළුවරක අපිව තනි

කරමින් ඇනබෙත්ගේ තඹ කොණ්ඩයේ තැනින් තැන දිලිසුමක් හැර වෙන කිසි දෙයක් මට පෙනුණේ නැහැ.

"ඔයා අවුරුදු හතේ ඉඳන් අර්ධ-ලෝහිත කඳවුරෙන් පිටට ගියේම නැද්ද?" මම එයාගෙන් ඇහුවා.

"නෑ... පොඩි පොඩි ක්ෂේත්‍ර චාරිකා විතරයි. මගේ තාත්තා ."

"අර ඉතිහාස මහාචාර්ය."

"ඔව්. ඒ ගෙදර ජීවත් වෙන්න මට බැරි වුණා. මං කිවුවේ, අර්ධ-ලෝහිත කඳවුර තමයි දැන් මගේ ගෙදර." එයා කලබලයෙන් කියාගෙන ගියේ කවුරුහරි එයාව නවත්වන්න හදාවි කියලා බයෙන් වගෙයි. "කඳවුරේදී අපි දිගටම පුහුණුවීම් කරනවා. ඒක හොඳයි තමයි, ඒත් ඇත්තටම රාක්ෂයෝ ඉන්නේ පිටත ලෝකයේ නේ. එහෙදී තමයි ඔයාට ඇත්තටම දක්ෂකමක් තියෙනවාද, නැද්ද කියලා දැනගන්න ලැබෙන්නේ."

එයා ගැන හරියට දැන නොසිටියා නම්, එයාගේ කටහඬේ දෙගිඩියාවක් තිබුණාද කියලා මම සැක කරන්න වුණත් ඉඩ තිබුණා.

"අර පිහිය පාවිච්චි කරන්න ඔයා සෑහෙන දක්ෂයි නේ," මම කිවුවා.

"ඔයා එහෙම හිතනවද?"

"පිටුපිට කෙනෙක්ගේ පිටේ පුළුණු යන ඕනෑම කෙනෙක් මට නම් හොඳයි."

මට ඇත්තටම දැකගන්න බැරි වුණත්, එයා හිනාවුණා කියලා මට හිතුණා.

"ඔයා දන්නවද," එයා කිවුවා. "සමහරවිට මට තිබුණේ... බස් එකේදී මොකක් හරි විහිළු කතාවක්වත් ඔයාට කියලා..."

එයා කියන්න හැදූ දේ මොකක් වුණත්, කර්කශ ටූට්-ටූට්-ටූට් හඬකින් එයට බාධා වුණා. ඒක හරියට දරුණු වේදනාවකට හසුවුණ බකමූණෙක් කෑගහනවා වගේ හඬක්.

"හේයි, මගේ බටනළා තවම වැඩ කරනවා!" ග්‍රෝවර් කෑගැසුවා. "මට 'පාර හොයන්න' සිංදුව මතක තිබුණා නම්, අපිට මේ කැලෙන් එළියට යන්න තිබුණා!"

එයා ස්වර කීපයක් පිම්බා, ඒත්, ඒ තනුව එයා වාදනය කරන්න දැන සිටි සිංදු දෙකෙන් එකක් කියලයි මට නම් සැක හිතුණේ.

ඒත් එක්කම, පාර හොයාගන්නවා වෙනුවට ගහක හැප්පිලා ඔළුව ගෙඩි ගස්සවා ගන්නයි මට සිද්ධ වුණේ.

මට නැති සුපිරි බලයන් ලැයිස්තුවට මම තවත් එකක් එකතු කළා: අඳෝරක්ත ඇස් පෙනීම.

පැටලී වැටෙමින්, ශාප කරමින්, අන්ත කාලකණ්ණි හැඟීමක් එක්ක තවත් සැතපුමක් විතර ගියාට පස්සේ, මට ඉදිරියෙන් එළියක් පේන්න ගත්තා: නියෝන් සලකුණක්. මට කෑමවල සුවඳ දැනෙන්න ගත්තා.

බැදපු, තෙල් බේරෙන, ඉස්තරම් කෑම. අර්ධ-ලෝහිත කඳවුරට ආවාට පස්සෙම පෝෂ්‍යදායී නොවන කෑමක රස බලන්න නොලැබුණ බව මට මතක් වුණේ එතකොටයි. කඳවුරේදී අපිට කන්න ලැබුණේ මිදි, පාන්, චීස් සහ දෙවගනන් විසින් සූදානම් කළ බාබකියු වගේ දේවල් විතරයි නේ. ඒ නිසාම, මේ කොල්ලාට ඩබල් චීස් බර්ගර් එකක් කන්න ඕනෑම වුණා.

ගස් අතරින් පාළුවට ගිය පාරක් දකින තුරුම අපි ඉදිරියට ගියා. පාරේ අනෙක් පැත්තේ වසා දැමූ ඉන්ධන පිරවුම්හලකුත්, කඩමාලු වී ගිය 1990 ගණන්වල චිත්‍රපටි දැන්වීම් පුවරුවකුත්, වෙළඳාමට විවෘත කළ එක් තැනකුත් තිබුණා. නියෝන් එළිය සහ ප්‍රණීත සුවඳ පැතිරුණේ එතැනින්.

ඒත්, එතැන මම බලාපොරොත්තු වුණ විදිහේ ක්ෂණික කෑම විකුණන කඩයක් නෙවෙයි. ඒක සිමෙන්තිවලින් සෑදූ වලස්සු, තණ පිට්ටනි මැද තැබීමට සෑදූ රණ හංසයෝ, තව ලීවලින් කැටයම්කළ ඉන්දියානුවෝ වගේ අරුමෝසම් දේවල් විකුණන තැනක්. අක්කර ගාණක් පුරා තැබූ ප්‍රතිමාවලින් වටවුණ දිග, උසින් අඩු, බඩු ගබඩාවක් එහි ප්‍රධාන ගොඩනැගිල්ල වුණා. මගේ වචන අන්ධතාවයට ස්තුතිවන්ත වෙන්න, ගේට්ටුවට උඩින් සවිකර තිබුණු නියෝන් පුවරුවේ රතු පාට ඇල අකුරින් වූ නම කියවාගන්න මට කොහෙත්ම බැරි වුණා.

මට එය පෙනුණේ: 'එම් දූන්නාගේ මාහ බවහිර පෙළඳවොළ' ලෙසයි.

"මොකක්ද ඒකෙන් කියන්නේ?" මම ඇහුවා.

"මං දන්නෙත් නැහැ." ඇනබෙත් කිවුවා.

එයා කියවන්න කොච්චර ආසයිද කිව්වොත්, එයාටත් වචන අන්ධතාවය තියෙන බව මට සහමුලින්ම අමතක වෙලායි තිබුණේ.

"එම් නැන්දාගේ මහා බහිරව වෙළඳ පොළ." ග්‍රෝවර් පරිවර්තනය කළා.

දන්වීමේ තිබූ විදිහටම සිමෙන්තිවලින් සෑදූ, කැත, රැවුල් වැවූ පුංචි මිනිස්සු දෙන්නෙකුගේ ප්‍රතිමා ඇතුළු වීමේ දොරටුව දෙපස තිබුණා. ඒ බහිරව ප්‍රතිමා දෙක හිනාවෙලා අත් වනමින් හිටියේ හරියට ඡායාරූපයකට පෙනී ඉන්න දෙන්නෙක් වගෙයි. මම පාර පැනලා, හැම්බර්ගර් සුවඳ දිගේ ගියා.

"හේයි..." ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා.

"ඇතුළෙන් එළියක් පේනවා," ඇනබෙත් කිවුවා. "සමහරවිට ඒක ඇරලා ඇත්තේ."

"ස්නැක් බාර් එකක්," මම කල්පනාවෙන් බරවෙලා කිවුවා.

"ස්නැක් බාර් එකක්." ඇනබෙත් එකඟ වුණා.

"ඔය දෙන්නට පිස්සුද මන්දා?" ග්‍රෝවර් කිවුවා. "මේ තැන හරිම අද්භූතයි නේ."

අපි එයාව ගණන් ගත්තේ නැහැ.

එහි ඉදිරි කොටස ප්‍රතිමාවලින් පිරුණු වනාන්තරයක් වගෙයි: සිමෙන්ති සත්තු, සිමෙන්ති ළමයි, වෙන එකක් තියා බට නළාවක් වාදනය කරන සිමෙන්ති සැටර් කෙනෙකුත් එතැන සිටියා. ඒක දැකපු ග්‍රෝවර් නම් ගොඩාක් බය වුණා.

"බ්ලා-හා-හා!" එයා හඬගෑවා. "ඒකේ පෙනුම හරියට මගේ ෆර්ඩිනැන්ඩ් මාමා වගෙයි නේ!"

අපි කඩයේ දොර ළඟ නතර වුණා.

"අනේ, තට්ටු කරන්න නම් එපා," ග්‍රෝවර් බැගෑපත් වුණා. "මට රාක්ෂ ගඳක් දැනෙනවා."

"පියුරිලාගේ ගඳෙන් ඔයාගේ නහය ඇහිරිලා," ඇනබෙත් එයාට කිවුවා. "මට නම් දැනෙන්නේ බර්ගර් සුවඳක් විතරයි. ඔයාට බඩගිනි නැද්ද?"

"මස්!" එයා කට ඇද කළා. "මං කන්නේ එළවළු විතරයි."

"ඔයා ටින් එන්චිලඩා යි ඇලුමිනියම් කෑනුයි කනවා." මම එයාට මතක් කළා.

"ඒවත් එළවළු තමයි. දැන් එන්න. අපි මෙතැනින් යමු. මේ පිළිම... මගේ දිහා බලාගෙන ඉන්නවා."

කිරි-කිරි හඬක් එක්ක දොර ඇරුණා. අපිට ඉදිරියෙන් සිටගෙන සිටියේ උස, මැදපෙරදිග ගැහැනු කෙනෙක් - අඩු තරමේ, එයා මැදපෙරදිග වෙන්න ඇති කියලා මම හිතුවා. මොකද, එයා අත් දෙක හැර මුළු සිරුරම වැසෙන ආකාරයේ කළු පාට දිග ගවුමක් හැඳගෙනයි සිටියේ. ඒ වගේම, එයා, එයාගේ ඔළුවත් මුළුමනින්ම ආවරණය කරගෙන සිටියා. කළු පාට දැල් සළුවට පිටුපසින් එයාගේ ඇස් දිලිසෙනවා මට පෙනුණා. ඒත් මට එයා ගැන හොයාගන්න ලැබුණේ එච්චරයි. එයාගේ කෝපි පාට අත් දෙකේ වයස්ගත පෙනුමක් තිබුණත්, ඒවාට හොඳින් සාත්තු සප්පායම් කරලා ලස්සනට තියාගෙන සිටියා. ඉතින්, දැන් ආච්චි කෙනෙක් වෙලා සිටියත් එයා කාලයක් ලස්සන ගැහැනු කෙනෙක් වෙලා ඉන්න ඇති කියලා මට හිතුණා.

එයාගේ උච්චාරණ විලාසයේත් ලාවට වගේ මැද පෙරදිග උරුවක් තිබුණා. "ළමයිනේ, තනියම ගමන් යන්න දැන් රෑ වෙලා වැඩියි නේ. කෝ ඔයාලාගේ දෙමව්පියෝ?"

"එයාලා... ම්..." ඇනබෙත් කියන්න ගත්තා.

"අපි අනාථ ළමයි," මම කිවුවා.

"අනාථ ළමයි?" ඒ ගැහැනු කෙනා ඇසුවා. ඒ වචනයත් එයාගේ කටට නුහුරුයි වගේ. "අනේ, දරුවනේ! එහෙම වුණේ කොහොමද?"

"අපිට, අපේ කැරවෑන් එක මඟ ඇරුණා," මම කිවුවා. "අපේ සර්කස් කැරවෑන් එක. අපේ මාස්ටර් කියලා තිබුණේ අපි අතරමං වුණොත් පිරවුම්හල ළඟට එන්න කියලා. ඒත්, එයාට ඒක අමතක වෙලා වගේ. එහෙම නැත්නම්, එයා කිවුවේ වෙන පිරවුම්හලක් ගැනද දන්නෙත් නැහැ. කොහොම හරි, දැන් අපිව අතරමං වෙලා. මට මේ දැනෙන්නේ කෑම සුවඳක්ද?"

"අනේ, දරුවනේ," ඒ ගැහැනු කෙනා කිවුවා. "ඔයාලා ඉක්මනට ඇතුළට එන්න. පව්, දුප්පත් ළමයි. මම එම් නැන්දා. ඔයාලා

කෙළින්ම මේ ගබඩා කාමරේ පිටිපස්සට යන්න. එතැන තමයි කෑම කන තැන."

එයාට ස්තූති කළ අපි ඇතුළට ගියා.

"සර්කස් කැරවෑන් එකක්!" ඇනබෙත් මට කෙඳිරුවා.

"හැම වෙලාවෙම ඔළුව පාවිච්චි කරනවා, නේද?"

"ඔයාගේ ඔළුව නම් පිරිලා ඇත්තේ මුහුදු පාසිවලින්ම තමයි."

ඒ ගබඩා කාමරය පිරී තිබුණේ එක එක විදිහේ ඇඳුම් හැඳගෙන, එක එක ආකාරයට මුහුණේ හැඟීම් පෙන්වමින් ඉන්නා ප්‍රතිමා ගොඩකින්. ඒ ප්‍රතිමාවලින් එකක් හෝ ගෙදර ගෙනියනවා නම්, ඒ කෙනාට ලොකු මිදුලක් තිබිය යුතු බව මට හිතුණා. මොකද, ඒවා ඔක්කොම තිබුණේ ජීවමාන අයගේ ප්‍රමාණවලටමයි. ඒත්, ඒ වෙලාවේ නම් මම වැඩිපුර සිතුවේ කෑම ගැනයි.

කමක් නෑ, ඔයාට ඕනෑ නම් මට මෝඩයා කියන්න. මම නාඳුනන ගැහැනු කෙනෙක්ගේ කඩයක් ඇතුළට ගියා තමයි, ඒත් ඒ වෙලාවේ මම ගොඩාක් බඩගිනි වෙලායි සිටියේ. එහෙම වෙලාවට මම හිතන්නේ නැතිව වැඩ කරනවා. ඒ වගේම තමයි, ඔයාට කවදාවත් එම් නැන්දාගේ බර්ගර්වල සුවඳ දැනිලා නැතේ. ඒ සුවඳ හරියට හිනා වායුව වගේ සිහිය අවුල් කරවනවා. ඒ වෙලාවේ ග්‍රෝවර් බයාදු ලෙසින් කළ කෙඳිරිගෑම්වත්, වටපිටාවේ තිබූ ප්‍රතිමාවල ඇස් අපිව ලුහුබඳින බවවත්, අඩු තරමේ, එම් නැන්දා අපිට පිටුපසින් දොර අගුලු දැමූ බවවත් මගේ සැලකිල්ලට ලක් වුණේම නැති තරම්.

මම සැලකිල්ලක් දැක්වූ එකම කාරණය කෑම කන තැන සොයාගැනීම විතරයි. කියූ විදිහටම, ගබඩා කාමරය පිටුපස දැල් කට්ටුවක්, සෝඩා යන්ත්‍රයක්, විස්කෝතු පුලුස්සන උඳුනක් සහ චීස් සාදන යන්ත්‍රයක් ඇති ක්ෂණික කෑම කවුන්ටරයක් තිබුණා. ඔයාට උවමනා කෑම දෙයක්ම හා විනෝද ගමන්වලට ගෙනියන ජාතියේ යකඩ මේස කිහිපයකුත් එතැන තිබුණා.

"කරුණාකරලා වාඩි වෙන්න," එම් නැන්දා කිව්වා.

"නියමයි," මම කිව්වා.

"මේ..." ග්‍රෝවර් ටිකක් අදිමදි කළා. "අපි ළඟ සල්ලි කීයක්වත් නැතේ, මැඩම්."

"නෑ, නෑ, දරුවනේ, සල්ලි උවමනා නෑ. මේක විශේෂ අවස්ථාවක්, එහෙම නේද?" මම ග්‍රෝවර්ගේ ඉළ ඇට කුඩුවට වැළමිටෙන් අනින්න කලින් එම් නැන්දා කිව්වා. "මේක මේ සෝක් අනාථ ළමයින්ට මං දෙන සංග්‍රහයක්."

"ස්තූතියි, මැඩම්." ඇනබෙත් කිව්වා.

එම් නැන්දා එක්වරම දරදඬු වුණේ හරියට ඇනබෙත් වැරදි දෙයක් කිව්වා වගෙයි, ඒත් ඉක්මනින්ම ඒ වයසක ගැහැනු කෙනා නැවතත් ලිහිල් වුණා. ඉතින්, ඒක මම හිතේ මවාගත් දෙයක් වෙන්න ඇති, මම හිතුවා.

"බොහොම හොඳයි, ඇනබෙත්," එයා කිව්වා. "ඔයාට තියෙන්නේ හරිම ලස්සන අළු පාට ඇස් දෙකක් නේ, දරුවෝ." එයා ඇනබෙත්ගේ නම දැනගත්තේ කොහොමද හිතලා මම පුදුම වුණේ ඊටත් සැහෙන වෙලාවකට පසුවයි. මොකද, ඒ වනතුරුත් එම් නැන්දාට අපිව හඳුන්වා දෙන්න අවස්ථාවක් ලැබී තිබුණේ නැහැ නේ.

කවුන්ටරය පිටුපසට නොපෙනී ගිය අපේ සත්කාර කරන්නිය කෑම හදන්න පටන් ගත්තා. අපි හිතන්නත් කලින් එයා ආපසු ආවේ ප්ලාස්ටික් බන්දේසි පිරවූ ඩබල් චීස් බර්ගර්, වැනිලා ෂේක් සහ ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් අරගෙනයි.

මගේ බර්ගර් එකෙන් බාගයක් විතර ගිල දැමුවාට පස්සෙයි මට හුස්ම ගන්න මතක් වුණේ.

ඇනබෙත්, එයාගේ වැනිලා ෂේක් එක තලු ගැසුවා.

ග්‍රෝවර් ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් එකින් එක අහුලන අතරේ බන්දේසියේ තිබුණු ඉටි කොළය දෙසට ඇස් රඳවාගෙන සිටියේ ඒකත් කන්න වගෙයි. ඒ වුණත් එයා තවමත් සැකයෙන් ඉන්නවා වගෙයි පෙනුණේ.

"මොකක්ද ඒ පිඹින සද්දේ?" එයා ඇසුවා.

කන් දිගෙන සිටියත්, මට එහෙම හඬක් ඇසුණේ නැහැ. ඇනබෙත් ඔළුව සෙලෙව්වා.

"පිඹිනවා?" එම් නැන්දා ඇසුවා. "සමහරවිට ඔයාට ඇහෙන්න ඇත්තේ තෙල් කරවෙන සද්දේ වෙන්නැති. ඔයාට තියෙන්න තියුණු කන් දෙකක් නේ, ග්‍රෝවර්."

"මම කන්වලට විටමින් බොනවා නේ."

Scanned with CamScanner

"ඒක නම් හොඳ වැඩක්," එයා කිවුවා. "ඒත් කරුණාකරලා, දැන් විවේක ගන්න."

එම් නැන්දා කිසිවක් කෑවේ නැහැ. අඩු තරමේ කෑම උයන වෙලාවේදිවත් එයා ඔළුව ආවරණය කරගෙන සිටි සළුව ඉවත් කළෙත් නැහැ. දැන්, අපි ඉදිරියෙන් වාඩි වූ එයා ඇඟිලි බැඳගෙන, අපි කෑම කන දෙස බලා සිටියා. කෑම ගන්නා වෙලාවට මුහුණ වසාගත් කෙනෙක් මගේ දෙස බලා ඉන්න එක නම් ටිකක් හිත කලබල කරවන දෙයක් වුණා, ඒත් එයාගේ බර්ගර් එක කෑවාට පසු මට තෘප්තිමත් බවක් වගේම පොඩි නිදිමතකුත් දැනෙන්න ගත්තා. ඉතින්, අපිට සත්කාර කළ කෙනා එක්ක අඩු තරමේ පොඩි කතාබහක්වත් කළොත් හොඳයි කියලා මට හිතුණා.

"එතකොට, ඔයා බහිරව රූප විකුණනවා?" මම ඇසුවේ උනන්දුවක් පෙන්වන්න උත්සාහ කරමිනුයි.

"ඔව් නේ," එම් නැන්දා කිවුවා. "තව සත්තු, මිනිස් රූප. ගෙවත්තකට ගැළපෙන ඕනෑම දෙයක්. ඉල්ලුම තියෙන ඕනෑම එකක්. ඔයා දන්නවා නේ, ප්‍රතිමා කලාව කියන්නේ හරිම ප්‍රසිද්ධ දෙයක්."

"මේ පාරේ ගොඩක් වෙළඳාම් තියෙනවාද?"

"නැහැ, අධිවේගී පාර හැදුවට පස්සේ වැඩිය නැහැ. ගොඩක් වාහන දැන් මේ පාරෙන් එන්නේ නැනේ. ඉතින්, මට එන හැම ගනුදෙනුකාරයෙක්වම මම හොඳින් බලාගන්න ඕනෑ."

මගේ බෙල්ල මුල පොපියන්න ගත්තේ හරියට කවුරුහරි මගේ දිහා බලාන ඉන්නකොට වගෙයි. මම හැරී බැලුවා, ඒත් එතැන තිබුණේ පාස්කු කූඩයක් අතේ තියාගෙන ඉන්න පුංචි ගැහැනු ළමයෙකුගේ ප්‍රතිමාවක් විතරයි. ඒ ප්‍රතිමාවේ චූටි චූටි දේවල් පවා ලස්සනට මතු කර තිබූ විදිහ නම් විශ්වාස කරන්නත් බැරි තරම්. ගෙවත්තක දකින්න ලැබෙන සාමාන්‍ය ප්‍රතිමාවකට වඩා එය ගොඩක් හොඳට තිබුණා. ඒත්, ඒ ගැහැනු ළමයාගේ මුහුණේ මොකක් හෝ වැරැද්දක් මට දැනුණා. එයින් පෙන්නුම් කළේ ඒ ළමයා පුදුම වෙලා, නැත්නම් බය වෙලා ඉන්නවා වගෙයි.

"අහ්," එම් නැන්දා දුකින් කිවුවා. "ඔයාට පේනවා නේද, මගේ සමහර නිර්මාණ හරියට ඇවිත් නැහැ. ඒවා සවුත්තු වෙච්ච පිළිම. ඒ නිසා ඒවා විකුණන්නේ නැහැ. මූණ තමයි හරියට මතු කරගන්න අමාරුම. හැම වෙලාවෙම මූණ හරියට ගන්න අමාරුයි."

"මේ පිළිම ඔක්කොම ඔයාමද හදන්නේ?" මම ඇසුවා.

"ඔව් නේ. ඉස්සර නම් මගේ වැඩවලට උදවු කරන්න මට සහෝදරියෝ දෙන්නෙක් හිටියා. ඒත්, එම් නැන්දාව තනි කරලා ඒ දෙන්නම යන්න ගියා. දැන් මට තියෙන්නේ මේ පිළිම විතරයි. ඒකයි මම මේවා හදන්නේ. ඔයාට පේනවා නේ, ඒවා තමයි මට තනි රකින්නේ." එයාගේ කටහඬේ දුක්බර බව කොයි තරම් ගැඹුරු වුණාද කියනවා නම්, එයා වෙනුවෙන් දුක් නොවී ඉන්න මට බැරි වුණා.

"සහොදරියෝ දෙන්නෙක්?" කෑම නතර කළ ඇනබෙත්, පුටුවේ ඉදිරියට නැවෙමින් ඇසුවා.

"ඒක හරිම දරුණු කතාවක්," එම් නැන්දා කිවුවා. " පොඩි ළමයින්ට අහන්න හොඳ එකක් නෙවෙයි, ඇත්තටම. ඔයාට පේනවානේ, ඇනබෙත්. කාලෙකට කලින්- මම තරුණ කාලේ, එක නපුරු ගෑනු කෙනෙක් මං ගැන ඉරිසියාවෙන් හිටියා. ඒ කාලේ මට... ඔයා දන්නවා නේ, පෙම්වතෙක් හිටියා. ඉතින් මේ නපුරු ගෑනු කෙනා අපි දෙන්නාව වෙන් කරන්න අධිෂ්ඨාන කරගෙනයි හිටියේ. එයා මහා භයානක අනතුරක් සිද්ධ වෙන්න සැලැස්වූවා. එතකොට මගේ සහෝදරියෝ දෙන්නත් මගේ ළඟම හිටියා. ඉතින් ඒ දෙන්නත්, එයාලාට පුළුවන් තරම් කාලයක් මගෙත් එක්ක මගේ අවාසනාව බෙදා ගත්තා. ඒත්, අන්තිමේදි එයාලා යන්න ගියා. එයාලා නැති වුණා. නොමැරී බේරුණේ මං විතරයි. ඒකත් ලොකු මිලකට. හිතා ගන්නත් බැරි තරමේ මිලකට."

එයා අදහස් කළ දේ ගැන මට හරියටම විශ්වාසයක් නැති වුණත්, එයා පව් කියලා මට හිතුණා. මගේ ඇසිපිය ටිකෙන් ටික බර වෙමින් තිබුණේ, පිරුණු බඩ නිසා ඇති වූ නිදිමතෙනුයි. පව්, අසරණ නැන්දා. මෙච්චර හොඳ කෙනෙක්ට කරදර කරන්න කාටද උවමනා වෙන්නේ?

"පර්සි?" මගේ අවධානය ගන්න ඇනබෙත් මාව සෙලෙව්වා. "අපි දැන් ගියොත් හොඳයි. මං කිවුවේ, අපේ මාස්ටර් අපි එනකම් බලාගෙන ඉන්නවද දන්නේ නැනේ."

ඇනබෙත්ගේ හඬේ කලබල වූ ගතියක් තිබුණා. එයට හේතුව මට තේරුම් ගන්න බැරි වුණා. ඒ වෙද්දී ග්‍රෝවර් බන්දේසියේ තිබුණු ඉටි කොළයත් කන්න පටන්ගෙන තිබුණා. ඒක අසාමාන්‍ය දෙයක් ලෙස එම් නැන්දා දකින්න ඇති, ඒ වුණත් එයා කිසිවක් කිවුවේ නැහැ.

Scanned with CamScanner

"හරිම ලස්සන අළු පාට ඇස් දෙකක්," එම් නැන්දා නැවතත් ඇනබෙත්ට කිවුවා. "අනේ, ඇත්තටම මේ වගේ අළු පාට ඇස් දෙකක් මට දකින්න ලැබුණේ ගොඩාක් කාලෙකට පස්සේ."

එයා ඇනබෙත්ගේ කම්මුල අතගාන්න වගේ ඉදිරියට නැමුණා, ඒත් ඊට කලින් ඇනබෙත් පුටුවෙන් නැගිට්ටා.

"අපි ඇත්තටම යන්න ඕනෑ."

"ඇත්ත!" ඉටි කොළය සම්පූර්ණයෙන්ම ගිල දැමූ ග්‍රොවර් පුටුවෙන් නැගිට්ටා. "අපේ මාස්ටර් බලාගෙන ඉන්නවා! හරි!"

මට එතැනින් යන්න උවමනා වුණේ නැහැ. මට පිරුණු සහ තෘප්තිමත් හැඟීමක් දැනෙමිනුයි තිබුණේ. එම් නැන්දා ඇත්තටම හොඳයි. එයා එක්ක ටිකක් නැවතිලා ඉන්නයි මට උවමනා වුණේ.

"අනේ, දරුවනේ," එම් නැන්දා බැගෑපත් වුණා. "මට පොඩි ළමයින්ගේ මූණ දකින්නේ හරිම කලාතුරකින්. ඔයාලා යන්න කලින් අඩු තරමේ රූපයක්වත් ඉඳලා යන්න බැරිද?"

"රූපයක්?" ඇනබෙත් පරීක්ෂාකාරීව ඇසුවා.

"ෆොටෝ එකකට. එතකොට ඒක බලාගෙන අලුත් පිළිම ටිකක් හදන්න මට පුළුවන් වෙයි. ඔයාලාට පේනවා නේ, පුංචි ළමයි හරිම ප්‍රසිද්ධයි. හැමෝම ළමයින්ට ආදරෙයි නේ."

ඇනබෙත්, එයාගේ ඇගේ බර කකුලකින් කකුලකට මාරු කළා. "මං හිතන්නේ නැහැ අපිට පුළුවන් වෙයි කියලා, මැඩම්. එන්න, පර්සි -"

"අනිවාර්යයෙන්ම අපිට පුළුවන්," මම කිවුවා. අපිට නොමිලේ කන්න දුන් වයසක ගැහැනු කෙනාට ඇනබෙත් අහංකාරකම් පෙන්වමින් කපුරු ලෙස හැසිරීම ගැන මම සිටියේ කේන්තියෙන්. "එක ෆොටෝ එකක් විතරයි නේ, ඇනබෙත්. මොකක්ද ඒකෙන් වෙන වැරැද්ද?"

"ඔව්, ඇනබෙත්," ගැහැනු කෙනා පුරු-පුරු ගෑවා. "කිසිම වැරැද්දක් නැහැ."

ඇනබෙත් එයට අකමැති බව මට තේරුණා, කොහොම වුණත්, ඉදිරි දොරෙන් පිටත වූ ප්‍රතිමා පිරුණු මිදුලට අපිව කැඳවාගෙන යන්න එයා එම් නැන්දාට ඉඩ දුන්නා.

ගල් වූ සැටර් ප්‍රතිමාව අසලම උද්‍යාන බංකුවක් දෙසට එම් නැන්දා අපිව මෙහෙයවූවා. "දැන්," එයා කිවුවා, "ඔයාලා ඉන්න උවමනා විදිහ මම කියන්නම්. ගැනු දරුවා මැද හිටියොත් හොඳයි, මං හිතන්නේ. එතකොට, මේ පිරිමි දරුවෝ දෙන්නා දෙපැත්තෙන්."

"ෆොටෝ එකක් ගන්න මෙතැන එළිය මදිනේ," මම ඇසුවා.

"ඔහ්, හොඳටම ඇති," එම් නැන්දා කිවුවා. "අපිට එකිනෙකාව පේන තරම් එළිය තියෙනවානේ, නේද?"

"ඔයාගේ කැමරාව කෝ?" ග්‍රෝවර් ඇසුවා.

එම් නැන්දා අඩියක් පිටුපසට ගියේ එයාගේ දර්ශනය අගය කරන්න වගෙයි. "දැන්, මූණ තමයි අමාරුම කොටස. මං වෙනුවෙන් ඔයාලා හිනාවක් දෙන්නකෝ, හැමෝම? කෝ තව ටිකක් ලොකු හිනාවක්?"

එහා පැත්තේ තිබූ සිමෙන්ති සැටර් ප්‍රතිමාව දෙස බැලූ ග්‍රෝවර් මුමුණන්න ගත්තා, "ඒක නම් ඇත්තටම ෆර්ඩිනැන්ඩ් මාමා වගේමයි."

"ග්‍රෝවර්," එම් නැන්දා සැර කළා. "මේ පැත්ත බලන්න, දරුවෝ."

ඒ වුණත් එයා අතේ තවමත් කැමරාවක් නැහැ.

"පර්සි-" ඇනබෙත් කතා කළා.

ඇනබෙත්ට ඇහුම්කන් දිය යුතු බවට මගේ සහජ බුද්ධිය මට අනතුරු ඇඟෙව්වා. ඒත් කැමත්, වයසක ගැහැනු කෙනාගේ කටහඬත් එක් වී සෑදුණ නැළවිල්ල නිසා දැනුණු නිදිබර හැඟීම එක්ක සටන් කරන්න මට සිදුවුණා.

"මම ඉක්මනට එන්නම්," එම් නැන්දා කිවුවා. "ඔයාලා දන්නවා නේ, මේ ජරා සළුව නිසා මට ඔයාලාව හොඳින් බලා ගන්න අමාරුයි..."

"පර්සි, මෙතන මොකක් හරි වැරැද්දක් තියෙනවා," ඇනබෙත් තදින් කිවුවා.

"වැරැද්දක්?" ඔළුව වටේ තිබුණු සළුව ලිහන අතරේ එම් නැන්දා ඇසුවා. "කොහෙත්ම නෑ, දරුවෝ. අද රෑ මට මුණ ගැහුණේ සුපිරි ආගන්තුකයෝ ටිකක් නේ. ඉතින්, මොකක්ද වැරැද්ද?"

"ඒ ෆර්ඩිනැන්ඩ් මාමා තමයි!" ග්‍රෝවර් පුදුමයෙන් ගීල්ලුවා.

"ඒ ගැනි දිහා බලන්න එපා!" ඇනබෙත් කෑගැසුවා. යැන්කි කැප් එක ඇඳලා අරන් හිසේ දමාගත් ඇනබෙත් අතුරුදහන් වුණා. එයාගේ අදෘශ්‍යමාන අත් දෙක මාවයි, ග්‍රෝවර්වයි බංකුවෙන් බිමට ඇද දැමුවා.

මම බිමට වැටෙද්දී, මගේ ඇස් දෙක එම් නැන්දාගේ සෙරෙප්පු දැමූ දෙපය දෙසට යොමු වුණා.

ග්‍රෝවර් එක පැත්තකටත්, ඇනබෙත් තවත් පැත්තකටත් බඩ ගාගෙන යන හඬ මට ඇහුණා. ඒත්, සෙලවෙන්නවත් බැරි තරමට මගේ සිහිය විකල් වෙලායි තිබුණේ.

මට උඩින් ආගන්තුක, රළු හඬක් ඇසෙන්න ගත්තේ එවිටයි. මගේ ඇස් එම් නැන්දාගේ දත් මට්ටමට එසවුණා. ඒ අත් ගැට ගැසුණු, ඉන්නෝ පිරුණු අත් දෙකක් වෙලා. එයාගේ නියපොතු වෙනුවට තියුණු, ලෝකඩ නිය පහුරු මතු වෙලා.

මම තවත් ඉහළ බලන්න සූදානම් වෙනකොටම, මගේ වම් පැත්තේ කොහෙන්දෝ ඇනබෙත් බෙරිහන් දුන්නා, "එපා! බලන්න එපා!"

පුංචි සර්පයෝ පිඹින රළු හඬවල් මට ඇහෙන්න ගත්තා, ඒවා ඇසුණේ මට උඩින්, හරියටම... හරියටම එම් නැන්දාගේ හිස තිබිය යුතු තැනිනුයි.

"දුවන්න!" ග්‍රෝවර් කෑගැසුවා. "එයා බොරලු උඩ වේගයෙන් දුවන අතරේ "මයියා!" කියා කෑගසමින්, පියාඹන සපත්තුවලට පණ දෙන්න උත්සාහ කරනවා මට ඇහුණා.

මට සෙලවෙන්නවත් බැරි වුණා. එම් නැන්දාගේ ගැට ගැසුණු නිය පහුරු දෙස බලා ඉන්න අතරේ, එයා මට ඇති කර තිබූ අස්වාභාවික නිදිමතෙන් ගැලවෙන්න මම උත්සාහ කළා.

"මේ වගේ තරුණ, කඩවසම් මූණක් විනාශ කරන එක නම් හරිම අපරාධයක්," එයා තොඳොල් වෙමින් කිවුවා. "මාත් එක්ක නතර වෙන්න, පර්සි. ඔයාට කරන්න තියෙන්නේ උඩ බලන එක විතරයි."

එයාට කීකරු වෙන්න ඇති වූ පෙලඹවීම සමග මම සටන් කළා. උඩ බලනවා වෙනුවට එක පැත්තකට හැරුණු මගේ ඇස් දෙකට හසුවුණේ උයන්වල ලස්සනට රඳවන වීදුරු බෝලයක්. එහි තැඹිලි පාට වීදුරුව මත වැටුණු එම් නැන්දාගේ අඳුරු ඡායාව මට බලාගන්න

හැකි වුණා; හිස් ආවරණය ඉවත් කළ පසු එයාගේ මුහුණ පෙනුණේ දිලිසෙන, සුදුමැලි රවුමක් වගෙයි. එයාගේ කොණ්ඩය දඟලමින්, ඇඹරුණේ සර්පයෝ වගෙයි.

එම් නැන්දා.

'එම්' නැන්දා.

කොහොමද මම මෙච්චරටම මෝඩ වුණේ?

හිතන්න, මම, මටම කියාගත්තා. මිථ්‍යා කතන්දරවල තියෙන විදිහට මෙඩූසා මැරුණේ කොහොමද?

ඒත් මට හිතාගන්න බැරි වුණා. මට මතක් වුණ විදිහට නම්, මගේ නමම තිබූ පර්සියස් කියන වීරයා එයාට පහර දෙනකොට මෙඩූසා සිටියේ නිදාගෙනයි. ඒත්, මේ වෙලාවේ නම් නින්ද එයාගේ අහලකවත් තිබුණේ නැහැ. එයාට උවමනා නම්, මේ දැන් වුණත් එයාගේ නිය පහුරුවලින් මගේ මුහුණ රේක්ක ගාන්න ඉඩ තිබුණා.

"අර අළු පාට ඇස් තියෙන කෙනා තමයි මට මෙහෙම කළේ, පර්සි," මෙඩූසා කිව්වත්, එයාගේ හඬේ නම් කිසිම දුෂ්ට බවක් තිබුණේ නැහැ. එයාගේ කටහඬ මට ඉහළ බලන්න, වයසක ආච්චි එක්ක එයාගේ දුක බෙදාගන්න ආරාධනා කළා. "ඇනබෙත්ගේ අම්මා, දුෂ්ට ඇතීනා ලස්සන ගෑනු කෙනෙක් වෙලා හිටිය මාව මේ තත්වෙට හැරෙව්වා."

"එයා කියන ඒවා අහන්න එපා!" ප්‍රතිමා අතරේ කොතැනදෝ තැනකින් ඇනබෙත්ගේ කටහඬ කෑගැසුවා. "දුවන්න, පර්සි!"

"කට වහගන්නවා!" මෙඩූසා ගෙරෙව්වා. ඉන්පසු එයාගේ කටහඬ නැවතත් සැනසිලි සහගත පුරු-පුරුවකට හැරුණා. "මේ කෙල්ලව විනාශ කරලා දාන්න මට සිද්ධ වෙන්නේ ඇයි කියලා ඔයාට පේනවා නේ, පර්සි. එයා තමයි මගේ හතුරිගේ දුව. එයාගේ පිළිමය දූවිලිවලට කුඩුකරලා දාන්න මට පුළුවන්. ඒත් ඔයාට, මගේ දරුවෝ, ඔයාට නම් විඳවන්න වෙන්නේ නෑ."

"නෑ," මම කෙඳිරුවා. මගේ කකුල් සොලවන්න මම උත්සාහ කළා.

"ඔයාට ඇත්තටම උවමනා දෙවිවරුන්ට උදවු කරන්නද?" මෙඩූසා ඇසුවා. "මේ ඔලමොට්ටල ගවේෂණයේදී ඔයාව බලාපොරොත්තුවෙන් ඉන්නේ මොකක්ද කියලා ඔයාට තේරෙනවද,

Scanned with CamScanner

පර්සි! පාතාල ලෝකයට ළඟා වෙන්න ඔයාට පුළුවන් වුණොත් මොකක් සිද්ධ වෙයිද? ඔලිම්පියානුවන්ගේ ඉත්තෙක් වෙන්න එපා, මගේ දරුවෝ. ඊට වඩා, පිළිමයක් වෙලා ඉන්න එක ඔයාට හොඳයි. ඔයාගේ ඇඟට ගුණයි."

"පර්සි!" මට පිටුපසින් ගුම්-ගුම් හඬක් ඇසුණේ රාත්තල් දෙසීයක විතර පැණි කුරුල්ලෙක් තටු ගසනවා වගෙයි. "පාත් වෙන්න!" ග්‍රෝවර් කෑගැසුවා.

මම හැරෙනකොටම බේස්බෝල් පිත්තක් තරම් ලොකු ගහක පෝසක් අරන් ග්‍රෝවර් ඊ අහස හරහා පියඹා ආවා. ඇස් දෙක තදින් වහගෙන, ඔළුව දෙපැත්තට ගස්සමින් සිටි එයා පාර හොයා ගත්තේ කන් දෙකේ සහ නහයේ ආධාරයෙනුයි.

"පාත් වෙන්න!" එයා ආයෙමත් කෑගැසුවා. "මම එයාට දෙන්නම්!"

ඒක ඇහුණාම, මට සෙලවෙන්න පුළුවන් වුණා. මං ග්‍රෝවර් ගැන හොඳට දන්න නිසා, එයා මෙඩූසාට ගහන්න යන පාර කැරකිලා ඇවිත් මටම වදින බව මම හොඳින්ම දන සිටියා. ඒ නිසා මම ඉක්මනින්ම පැත්තකට පැනගත්තා.

ඩොක්..!

ඒක ග්‍රෝවර් ගහක හැප්පුණු හඬ කියලයි මම මුලින්ම සිතුවේ. ඒත් එතකොටම, මෙඩූසා කද කේන්තියකින් බෙරිහන් දුන්නා.

"මූසල සැටර්," එයා ගෙරෙව්වා. "මම ඔහේවත් මගේ පිළිම කොට්ටට එකතු කරගන්නවා."

"ඒක ෆර්ඩිනැන්ඩ් මාමා වෙනුවෙන්!" ග්‍රෝවර් පෙරළා කෑගැසුවා.

තවත් පහරක් දෙන්න සූදානමින් ග්‍රෝවර් වේගයෙන් පහළට එනවා දකලා මම දණ ගාගෙන ඔහින් ප්‍රතිමා අතරේ හැංගුණා.

දඩෝස්..!

"ආ...ක්!" මෙඩූසා බෙරිහන් දුන්නා. එයාගේ සර්ප කොණ්ඩය දිවවල් දිගු කරමින් පිම්බා.

"පර්සි!" හරියටම මට එහා පැත්තෙන් ඇනබෙත්ගේ කටහඬ ඇහුණා.

මම කොච්චර උඩ ගියාද කියනවා නම්, තව පොඩ්ඩෙන් බහිරව ප්‍රතිමාවක මගේ කකුලත් වදිනවා. "දෙයියනේ! ආයේ නම් ඒ වැඩේ කරන්න එපා!"

යැන්කි කැප් එක ගැලවූ ඇනබෙත් ආපසු දෘශ්‍යමාන වුණා. "එයාගේ බෙල්ල කපලා දාන්න ඔයාට සිද්ධ වෙනවා."

"මොකක්? ඔයාට පිස්සුද? අපි මෙතැනින් එළියට පැනගමු."

"මෙඩූසා අපිට තර්ජනයක්. එයා දුෂ්ටයි. මටම එයාව මරන්න තිබ්බා, ඒත්..." ඇනබෙත් තදින් කෙළ ගිල්ලේ එයා පිළිගන්න අකමැති දෙයක් එළි කරන්න යනවා වගේයි. "ඒත්, හොඳ ආයුධයක් තියෙන්නේ ඔයා ළඟ නේ. ඇරත්, එයාගේ කිට්ටුවට යන්නවත් මට බැරි වෙයි. මගේ අම්මා එක්ක තියෙන තරහට එයා මාව කෑලිවලට පෙති ගහයි. ඔයාට - ඔයාට තමයි අවස්ථාවක් තියෙන්නේ."

"මොකක්ද? මට බැහැ -"

"බලන්න, එයා තවත් අහිංසක මිනිස්සුන්ව පිළිමවලට හරවනවට ඔයා කැමතිද?"

එයා ගල් ගැසුණු ආදරවන්තයින් ජෝඩුවක් පෙන්වමින් ඇසුවා. එකිනෙකා වටා දත් දමාගෙන තුරුලු වී සිටි ඒ දෙන්නාව මේ රාක්ෂණිය ප්‍රතිමා දෙකකට හරවා තිබුණා.

ඇනබෙත් ළඟ තිබූ ප්‍රතිමා පාදමකින් කොළ පාට වීදුරු බෝලයක් ඩැහැගත්තා. "ඔප දාපු පලිහක් තිබ්බා නම් මීට වඩා හොඳයි," එයා බරපතළ ලෙස බෝලය අධ්‍යයනය කළා. "මෙකේ උත්තලභාවය නිසා අපරූපණයක් ඇති වෙයි. එතකොට ප්‍රතිබිම්බයේ ප්‍රමාණය -"

"ඔයාට පුළුවන්ද තේරෙන භාෂාවකින් කතා කරන්න?"

"මං එහෙම තමයි කිවුවේ!" එයා වීදුරු බෝලය මගේ දෙසට විසිකළා. "එයා දිහා වීදුරුවෙන් විතරක් බලන්න. කීයටවත් කෙලින්ම බලන්න නම් එපා."

"හේයි, ළමයිනේ!" අපිට උඩින්, කොහැනදෝ ඉඳන් ග්‍රෝවර් කෑගැසුවා. "මට හිතෙන්නේ එයාට සිහිය නැති වෙලාද කොහෙදෝ!"

"ගර්...ර්!"

"නෑ, නෑ. එහෙම නෙවෙයි වගේ." ග්‍රෝවර් නිවැරදි කළා. ගහේ අත්තත් රැගෙන එයා තමත් පහරක් දෙන්න ගියා.

Scanned with CamScanner

"ඉක්මනට," ඇනබෙත් මට කිවුවා. "ග්‍රෝවර්ට හොඳ තහයක් තියෙනවා තමයි. ඒත්, කොයි වෙලාවේ හරි එයා ඇනගනී."

මම පැන පිටතට අරන්, කොපුව ගැලෙව්වා. මගේ අතේදීම විජ්ටයිඩ්ගේ ලෝකඩ තලය දිගු වුණා.

මෙඩූසාගේ කොණ්ඩයේ පිඹින හඬ දිගේ මම පාර හොයාගෙන ගියා.

මම වීදුරු බෝලය මතම ඇස් රඳවාගත්තේ, මෙඩූසාගේ ප්‍රතිබිම්බයක් හැර ඇත්ත රූපය මගේ ඇස නොගැටෙන ලෙසයි. විකසින් කොළ පාට වීදුරුව තුළින් මට එයාව පෙනුණා.

පිත්තෙන් තවත් පහරක් දෙන්න ග්‍රෝවර් නැවත වතාවක් පහළට ආවා, ඒත් මේ වතාවේ එයා උවමනාවටත් වඩා පහළට ඇවිත්. පිත්ත ඩැහැගත් මෙඩූසා ග්‍රෝවර්ව පහළට ඇදලා ගත්තා. වාතය හරහා කරණම් ගැසූ ග්‍රෝවර් ගල් වූ වලසෙකුගේ දත් මතට කඩා වැටුණා. "උා...හ්"

මෙඩූසා එයාට පහර දෙන්න සූදානම් වෙද්දිම මම කෑගැසුවා. "හේයි!"

මම එයාගේ පැත්තට යන්න පටන් ගත්තත්, ඒක පහසු වැඩක් නොවුණේ එක අතකින් කඩුවත්, අනෙක් අතින් වීදුරු බෝලයකුත් අරගෙන යන්න මට සිදුවූ නිසයි. බැරි වෙලාවත් එයා මට පහර දුන්නා නම් මට, මාවම ආරක්ෂා කරගන්න ගොඩාක් අමාරු වෙන්න තිබුණා.

ඒත්, එයා මට ළඟටම එන්න ඉඩ දුන්නා. අඩි විස්සක්, අඩි දහයක්.

දැන් මට එයාගේ මුහුණේ ඡායාවත් පෙනුණා. ඇත්තටම ඒක ඒ තරම් කැත වෙන්න බැහැ. වීදුරු බෝලයේ කොළ පාට සුළි නිසා ඒක විකෘති වෙලා, තිබුණාටත් වඩා කැතටයි පෙනෙන්න ඇත්තේ.

"නාකි ගෑනු කෙනෙක්ට ඔයා කරදර කරන්නේ නෑ නේද, පර්සි," එයා හෙමිහිට කොඳුරන්න ගත්තා. "මං දන්නවා, ඔයා එහෙම කරන්නේ නෑ."

වීදුරුව තුළින් පෙනුන මුහුණේ ඡායාවෙන් වශී වූ මම පැකිළෙන්න ගත්තා - ඒ ඇස් දෙක, කොළ පාට වීදුරුව හරහා ඇවිළෙනවා වගේ මට පෙනුණේ මගේ අත් දෙකත් දුර්වල කරමිනුයි.

"පර්සි, එයා කියන දේවල් අහන්න එපා!" සිමෙන්ති වලහා උඩ ඉඳන් ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"පරක්කු වැඩියි." මෙඩූසා කෙකර ගෑවා.

උල් කරගත් නිය පහුරු සමග එයා මට පහර දෙන්න පැන්නා.

එතකොටම මම, මගේ කඩුවෙන් පහර දුන්නා. ඒත් එක්කම මට ඇසුණේ අප්‍රසන්න හඬක්. 'ෂ්ලොක්!' ඊට පස්සේ බිංගෙයක් තුළින් සුළඟ හමනවා වගේ හඬක් - රාක්ෂණිය කුඩු වී යන හඬ ඇහුණා.

මගේ පාමුලට මොකක්දෝ ඇද වැටුණා. ඒ දෙස නොබලා ඉන්න මට ගොඩක් අමාරු වුණා. ගලා ආ උණුසුම් ඕජසවලින් මගේ මේස් තෙත් වෙනවාත්, පණ අදින පුංචි සර්ප ඔළු මගේ සපත්තු ලේස්වලින් අදිනවාත් මට දැනුණා.

"ඊයා," ග්‍රෝවර් කිවුවා. එයා තවමත් තදින් ඇස් වසාගෙන සිටියත් එයින් ආ ගර-ගර හඬ එයාටත් ඇසෙන්න ඇති. "ඊයම ඊයා."

ඇනබෙත්, එයාගේ ඇස් අහස දෙසට හරවාගෙන මගේ ළඟට ආවා. එයාගේ අතේ මෙඩූසාගේ සළුව තිබුණා. "හෙලවෙන්නැතුව ඉන්න." එයා කිවුවා.

රාක්ෂ ඔළුව ළඟ දණගසාගත් එයා ඒ දෙස නොබලා, බොහොම පරිස්සමින් එය වටේ කළු සළුව ඔතලා, එය අතට ගත්තා. එයින් තවමත් කොළ පාට ඕජස ගලමින් තිබුණා.

"ඔයා හොඳින්ද?" වෙවුලන කටහඬින් එයා ඇසුවා.

"ඔව්," මම කිව්වත් මගේ ඩබල් චීස් බර්ගර් එක එළියට එන්න හදනවා වගෙයි මට දැනුණේ. "ඇයි ඒ... ඇයි ඒ ඔළුව වාෂ්ප වෙලා ගියේ නැත්තේ?"

"ඔයා ඒක කපලා වෙන් කළාම, ඒක යුද්ධයෙන් දිනාගත්ත දෙයක් වෙනවා," එයා උත්තර දුන්නා. "හරියට ඔයාගේ මිනටෝර් අඟ වගේ. ඒත්, මේක ඔතලා තියෙන සළුව ගලවන්න එපා. ඒකට තවමත් පුළුවන් ඔයාව ගල් කරන්න."

ග්‍රෝවර් කෙඳිරිගාමින් වලහාගෙන් බිමට බැස්සා. එයාගේ නළලේ ලොකු ගෙඩියක් මතු වී තිබුණා. එයාගේ කොළ පාට රස්ටා තොප්පිය වූටි එළු අඟ එල්ලිලා, බොරු කකුල් දෙකත් කුරවලින් ගැලවී

තිබුණා. මියා සපත්තු ජෝඩුව ග්‍රෝවර්ගේ ඔළුව වටේ ඉබාගාතේ පියාඹුවා.

"අපේ වණ්ඩියා," මම කිවුවා. "තියම වැඩේ, බං."

එයා ලැජ්ජාශීලී ලෙස සිනාසුණා. "ඒ වුණාට ඒකේ තිබිච ජොලියක් නෑ. මෙඩූසාට පොල්ලෙන් ගහද්දී නම් ජොලි තමයි. ඒත්, කොන්ක්‍රීට් වලහෙක් උඩට ඇදගෙන වැටෙන එක නම් එපා වෙන වැඩක්."

එයා වාතයේ පාවෙමින් තිබුණු සපත්තු දෙක ඩැහැගත්තා. මම, මගේ තඩුව කොපුවට දමාගත්තා. ඉන්පසු අපි තුන් දෙනා ආපසු ගබඩා කාමරය තුළට ගියා.

කෑම කවුන්ටරය පිටුපස තිබී පරණ ප්ලාස්ටික් මලු කීපයක් සොයාගත් අපි ඒවාගෙන් තවත් වරක් මෙඩූසාගේ ඔළුව ආවරණය කළා. අපි කෑම ගත් මේසය උඩින් ඒක තියලා, ඒ වටේට වාඩි වුණේ කතා කරගන්නවත් බැරි තරමට හෙම්බත් වෙලායි.

අන්තිමේට, මම කතා කළා. "එතකොට, මේ රාක්ෂණිය වෙනුවෙන් අපි ස්තූති කරන්න ඕනෑ ඇතීනාටද?"

ඇනබෙත් නොරිස්සුම් සහගත බැල්මකින් මගේ දෙස බැලුවා. "ඇත්තටම, ඔයාගේ තාත්තාට. ඔයාට අමතකද? මෙඩූසා කියන්නේ පොසෙයිඩන්ගේ පෙම්වතිය වෙලා හිටිය කෙනා. දවසක්, එයාලා මගේ අම්මාගේ දේවස්ථානයේදී මුණ ගැහෙන්න තීරණය කළා. අන්න ඒ නිසයි ඇතීනා එයාව රාක්ෂණියක් කළේ. මෙඩූසායි, එයාට දේවස්ථානෙට ඇතුළු වෙන්න උදවු කරපු එයාගේ සහෝදරියෝ දෙන්නායි ගෝර්ගොන්ලා - ඒ කියන්නේ තපුරු දාෂ්ට්‍ර තියෙන අය තුන් දෙනෙක් වුණා. ඒ හින්දා තමයි මෙඩූසාට මාව පෙති ගහන්න ඕනෑ වුණේ. ඒත්, ඔයාව නම් ලස්සන පිළිමයක් විදිහට පරිස්සම් කරලා තියාගන්න එයා ලෑස්ති වුණේ. එයා තවමත් ඔයාගේ තාත්තාට කැමතියි වගේ. සමහරවිට, ඔයාව දක්කම එයාට පොසෙයිඩන්ව මතක් වෙන්නැති."

මට දැනුණේ මගේ මුහුණ ගිනි ගන්නවා වගෙයි. "ඔහ්, ඒ කියන්නේ, අපිට මෙඩූසාව මුණ ගැහුණේ මගේ වැරැද්දෙන්."

ඇනබෙත් කෙලින් වුණා. " 'එක ෆොටෝ එකක් විතරයිනේ, ඇනබෙත්. මොකක්ද ඒකෙන් වෙන වැරැද්ද?' " මගේ කටහඬ හරිම නැකට අනුකරණය කරමින් එයා කිවුවා.

"ඒක අමතක කරලා දාන්න," මම කිවුවා. "පණ්ඩිත ආච්චි."

"මැට්ටා."

"මෝ-"

"හේයි!" ග්‍රෝවර් මැදට පැන්නා. "ඔයාලා දෙන්නා මට ඔළුවේ කැක්කුමත් හදවනවා. සැටර්ලාට ඔළුවේ කැක්කුම හැදෙන්නෙත් නැහැ. දැන් අපි මේකට මොකද කරන්නේ?"

මම ඒ ඔළුව දෙස බලාගෙන සිටියා. ප්ලාස්ටික් මල්ලේ තිබුණු හිලකින් පිටතට පුංචි සර්පයෙක් එල්ලුණා. 'අප සමග ගනුදෙනු කළ ඔබට ස්තූතියි!' ඒ මල්ලේ එක පැත්තක මුද්‍රණය කර තිබුණා.

මට තද කේන්තියක් දැනුණා - ඇනබෙත් සහ එයාගේ අම්මා එක්ක විතරක් නෙවෙයි, දෙවිවරු හැමෝම ගැනත්, මේ ගවේෂණයට අපිව පිටත් කිරීම ගැනත්, අපිව පාරෙන් පිටතට විසි වෙන්න සැලැස්වූවාටත් ඒ වගේම කඳවුරෙන් අපි පිටවූ පළවෙනි දවසේදීම ලොකු සටන් දෙකකට අපිව පැටලවූවාටත්. මේ විදිහට ගියොත් නම් අපිට ලොස් ඇන්ජලීස්වලට පණපිටින් යන්න ලැබෙන්නේ නැති වෙයි. උත්තරායනයට කලින් නම් යන්න හිතන්නවත් බැරි වෙයි.

මෙඩූසා මොකක්ද කිවුවේ?

'ඔලිම්පියානුවන්ගේ ඉත්තෙක් වෙන්න එපා, මගේ දරුවෝ. ඊට වඩා, පිළිමයක් වෙලා ඉන්න එක ඔයාට හොඳයි.'

මම පුටුවෙන් නැගිට්ටා. "මම ඉක්මනට එන්නම්."

"පර්සි," මම යනවා දැකලා ඇනබෙත් කතා කළා. "ඔයා මොනවද -"

මෙඩූසාගේ කාර්යාලය හමුවනතුරුම මම ගබඩා කාමරය සෝදිසි කළා. එයාගේ ගිණුම් පොත්වල අලුත් ගනුදෙනු හයක සටහන් තිබුණා. ඒ බඩු තොග හයම යවා තිබුණේ හේඩීස්ගේ සහ පර්සෙෆෝන්ගේ උයන සරසන්නයි. පාතාල ලෝකයේ බිල්පත් ලිපිනය - ඩී.ඕ.ඒ. ශබ්දාගාරය, බටහිර හොලිවුඩ්, කැලිෆෝනියා. ලෙස බඩු

ප්‍රවාහන බිල්පතේ සටහන් කර තිබුණා. මම ඒ බිල්පත දෙකට නමලා සාක්කුවට දමා ගත්තා.

මුදල් යන්ත්‍රයෙන් ඩොලර් විස්සකුත්, රන් ඩ්‍රච්මා කීපයක් වගේම හර්මීස් සීඝ්‍රගාමී සේවයේ පාර්සල් ප්‍රවාහන තුණ්ඩු කීපයකුත් සොයාගන්න මට හැකි වුණා. ඒ සෑම තුණ්ඩුවකට කාසි දැමීමට පුංචි ලෙදර් මල්ල බැගින් අමුණා තිබුණා. මම කාර්යාලයේ ඉතිරි කොටස අවුස්සලා, මට උවමනා තරමේ පෙට්ටියක් සොයාගත්තා.

ආපසු මේසයට ගිය මම මෙඩූසාගේ ඔළුව පෙට්ටියට දමා පාර්සල් කළා. ඉන්පසු මම පාර්සල් ප්‍රවාහන තුණ්ඩුවක් පිරෙව්වා:

දෙවිවරු,

ඔලිම්පස් කන්ද,
මහල් අංක 600,
එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල,
නිව්යෝක්.
සුබ පැතුම් සමගින්,
පර්සි ජැක්සන්.

"එයාලා ඔය වැඩේට නම් කැමති වෙන්නේ නැතිවෙයි," ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා. "ඔයා ගරුසරුවක් නැති එකෙක් කියලා එයාලා හිතාවි."

මම රන් ඩ්‍රච්මා දෙක-තුනක් මල්ලට දමා, ඒක වැසූ ඉක්මනින්ම වාගේ පුංචි සීනු හඬක් ඇහුණා. ඉහළට පාවෙලා ගිය පාර්සලය පොප් හඬක් එක්ක අතුරුදන් වුණා.

"මම ගරුසරුවක් නැති එකෙක් තමයි," මම කිවුවා.

පුළුවන් නම් මගේ ඇදයක් කියන්න, අභියෝග කරන බැල්මකින් මම ඇනබෙත් දෙස බැලුවා.

ඒත්, එයා එහෙම කළේ නැහැ. දෙවිවරුන්ව අවුස්සන්න මට විශේෂ හැකියාවක් තියෙනවා කියන කාරණේ ගැන ඉවසිලිවන්න වෙන්න එයා පුරුදු වෙලාද කොහෙදෝ. "මේ බලන්න," එයා කෙදිරුවා. "අපිට අලුත් සැලැස්මක් ඕනෑ වෙනවා."

12

අපි පූඩ්ල් කෙනෙකුගෙන් උපදෙස් ගත්තා

එදා රෑ අපේ තත්වය අන්ත අසරණ වුණා.

මහ පාරෙන් යාර සියයක් විතර ඈතින්, කැලයේ එළිපෙහෙළි වූ තැනක අපි එදා රෑට කඳවුරු බැඳගත්තා. තරමක වගුරු බිමක් වූ එතැන වටපිටාවේ ළමයි එළිමහන් උත්සව පවත්වන්න පාවිච්චි කළ තැනක් වගෙයි පෙනුණේ. ඒ වටපිටාව පුරාම තලා දැමූ සෝඩා කෑන් සහ ක්ෂණික ආහාර කවර විසිරී තිබුණා.

එම් නැන්දාගේ තැනින් අපි කෑම ටිකකුත්, බ්ලැන්කෙට්ටු කීපයකුත් අරන් ආවා. ඒත්, ගිනි මැලයක් දල්වලා අපේ තෙත ඇඳුම් වේලා ගන්න තරම් අපි නිර්භීත වුණේ නැහැ. ෆියුරිලායි, මෙඩූසායි අපිට දවසකට ඇති වෙන්න කරදර දීලා තිබුණා. ඒ නිසා තවත් කරදර අපේ දෙසට ආකර්ෂණය කරගන්න අපිට උවමනා වුණේ නැහැ.

අපි මාරුවෙන් මාරුවට නිදා ගන්න තීරණය කළා. පළවෙනි මුරය කරන්න මම බාරගත්තා.

බ්ලැන්කෙට්ටුවක් උඩ ගුළි ගැසුණු ඇනබෙත් ඔළුව බිමින් තියාගත් හැටියේම වගේ ගොරවන්න පටන් ගත්තා.

පියාඹන සපත්තුවල උදවුවෙන් ගහක් උඩට ගිය ග්‍රෝවර් පහළ අත්තක වාඩිවෙලා, රෑ අහස දිහාවට රවාගෙන සිටියා.

Scanned with CamScanner

"ඔයාත් ටිකක් නිදාගන්න." මම එයාට කිව්වා. "මොකක් හරි කලබලයක් වුණොත් මං ඔයාව ඇහැරවන්නම්."

එයා ඔළුව වැනුවත්, නිදාගන්න උවමනාවක් එයාට තිබුණේ නැහැ වගෙයි. "මේ වෙලා තියෙන දේවල් නිසා මට දුක හිතෙනවා, පර්සි."

"මොකක් නිසාද? මේ කකසිරු ගවේෂණයට එකතු වුණ නිසාද?"

"නෑ. මේවත්ත මේවා නිසා." එයා වටපිටාවේ විසිරිලා තිබුණු කුණු ගොඩවල් පෙන්නුවා. "ඒ වගේම අහස. බලන්න, ඔයාට එක තරුවක්වත් පේන්න තියෙනවද කියලා. එයාලා අහසත් දූෂණය කරලා තියෙන්නේ. මේක නම් සැටර් කෙනෙක් වෙලා ඉපදෙන්න හොඳ කාලයක් නෙවෙයි."

"ඔව්. මං හිතන්නේ ඔයා පරිසර විද්‍යාඥයෙක් වෙන්න යන්නේ."

එයා මගේ දිහාවට රවා බැලුවා. "මිනිස්සුන්ට විතරයි එහෙම වෙන්න බැරි. ඔයාලාගේ වර්ගයා මේ ලෝකය වේගයෙන් විනාශ කරනවා... අනේ, අතෑරලා දාන්න. මනුස්සයෙක්ට දේශනා දෙන එක තේරුමක් නැති වැඩක්. මේ යන විදිහට නම්, මට කවදාවත් පෑන් ව හොයාගන්න බැරි වෙයි."

"පෑන්? බෝල්පොයින්ට් පෑන් ද?"

"පෑන්!" එයා තරහින් බෙරිහන් දුන්නා. "පෑ-න්. ශ්‍රේෂ්ඨ දෙවියෝ. ඔයා හිතන්නේ, මං සොයන්නෙකුගේ බලපත්‍රයක් ගන්න මහන්සි වෙන්නේ වෙන මොකක් නිසා කියලද?"

වාතයේ තිබුණු කුණු ගඳ සහ මඩ ගඳ තාවකාලිකව නැති කරමින්, ආගන්තුක සීත සුළඟක් එළිමහන් බිම හරහා ඇදී ගියා. බෙරි ගෙඩිවල සුවඳත්, කැලෑ මල්වල සුවඳත් සමඟ පිරිසිදු වැහි වතුරේ සුවඳ ඒ සුළඟ අරන් ආවා. කාලයකට කලින් මේ කැලයෙන් ඒ දේවල් තියෙන්න ඇති. හදිසියේම, මම කිසිදාක අත්විඳ නොතිබූ දෙයක් වෙනුවෙන් මගේ හිතේ කණගාටුවක් ඇති වුණා.

"ඒ සෝදිසිය ගැන මට විස්තර කියන්න." මම කිව්වා.

ග්‍රෝවර් මගේ දෙස පරිස්සමින් බැලුවේ, මම එයාව විහිළුවකට ගන්න හදනවාද, සැකයෙන් වගෙයි.

"අවුරුදු දෙදාහකට කලින්, වනයට අධිපති දෙවියෝ අතුරුදහන් වුණා." එයා මට කිව්වා. "එෆීසොස් වෙරළ කිට්ටුවෙන් ගිය නාවිකයෙක්ට අබිරහස් කටහඬක් වැල්ල දිහාවෙන් ඇහිලා තියෙනවා, 'ශ්‍රේෂ්ඨ දෙවි පෑන් මියගිය බව සවුන්ට දන්වනු' කියලා.

මේ ආරංචිය ඇහුවාම, මිනිස්සු ඒක විශ්වාස කළා. එදා ඉඳලා මිනිස්සු එයාගේ රාජධානිය මංකොල්ල කනවා. ඒත්, පෑන් කියන්නේ සැටර්ලාගේ අධිපතියා සහ පාලකයා. එයා අපිවයි, ලෝකයේ වනගත තැනුයි ආරක්ෂා කළා. ඒ නිසා, එයා මැරුණා කියලා අපි විශ්වාස කරන්නේ නෑ. අපේ හැම පරම්පරාවකම නිර්භීතම සැටර්ලා පෑන්ව හොයාගන්න ජීවිතයෙන් දිවුරුම් දෙනවා. එයාලා මුළු ලෝකය පුරාම හොයලා, හැම වනගත තැනක්ම පීරලා, පෑන් හැංගිලා ඉන්න තැනින් හොයාගෙන, එයාගේ නින්දෙන් ඇහැරවන්න උත්සාහ කරනවා."

"එතකොට, ඔයාටත් ඕනෑ සොයන්නෙක් වෙන්න?"

"ඒක තමයි මගේ ජීවිතේ හීනය," එයා කිව්වා. "මගේ තාත්තාත් සොයන්නෙක්. මගේ ෆර්ඩිනැන්ඩ් මාමා... අර පිළිමය වෙලා හිටියේ -"

"ඔව්, හරි. කණගාටුයි."

ග්‍රෝවර් ඔළුව සෙලෙව්වා. "මේකේ තියෙන අවදානම ගැන ෆර්ඩිනැන්ඩ් මාමා දැනගෙන හිටියා. ඒ වගේම මගේ තාත්තාත්. ඒත්, මම කොහොම හරි මේක කරනවා. මම, පණපිටින් එන පළවෙනි සැටර් වෙනවා."

"පොඩ්ඩක් ඉන්න - පළවෙනි?"

ග්‍රෝවර්, එයාගේ බට නළාව සාක්කුවෙන් එළියට ගත්තා. "කිසිම සොයන්නෙක් මේ වෙනකල් ආපහු ඇවිත් නැහැ. එක වතාවක් එයාලා පිටවෙලා ගියාම, එයාලා අතුරුදහන් වෙනවා. එයාලාව ආයේ පණපිටින් දකින්න ලැබිලා නැහැ."

"අවුරුදු දෙදාහකටම එක්කෙනෙක්වත් නැද්ද?"

"නෑ."

"එතකොට ඔයාගේ තාත්තා? එයාට මොකද වුණේ කියලා ඔයාට අදහසක්වත් නැද්ද?"

"මුකුත්ම නැහැ."

Scanned with CamScanner

"එහෙම වෙලාත් ඔයාට යන්නද ඕනෑ?" මම ඇසුවේ පුදුමයෙන්. "මම කියන්නේ, ඔයා ඇත්තටම හිතනවද පැන්ව හොයාගන්න කෙනා ඔයා කියලා?"

"මට එහෙම විශ්වාස කරන්න සිද්ධ වෙනවා, පර්සි. නැම සොයන්නෙක්ම එහෙම විශ්වාස කරනවා. ඒ විදිහෙන් විතරයි මිනිස්සු ලෝකයට කරලා තියෙන දේ දකලා අපිට ඇතිවෙන කලකිරීම නැති කරගන්න පුළුවන් වෙන්නේ. පැන්ව තවමත් ඇහැරවන්න පුළුවන් කියලා මට විශ්වාස කරන්න සිද්ධ වෙනවා."

අහසේ පැතිරී තිබුණු තැඹිලි පාට මීදුම දෙස බලාගෙන මම කල්පනා කළේ, කොහෙත්ම බලාපොරොත්තුවක් තියාගන්න බැහැ වගේ පෙනුණු හීනයක් පසුපස ග්‍රෝවර් එළවන්නේ කොහෙමද කියලයි. ඒත්, එහෙම බලනකොට, මගේ තත්වයේත් වෙනසක් නැතිබව මට තේරුණා.

"අපි පාතාල ලෝකයට යන්නේ කොහොමද?" මම එයාගෙන් ඇසුවා. "මං අදහස් කළේ, දෙවියෙකුට විරුද්ධව අපිට තියෙන අවස්ථා මොනවද?"

"මං දන්නෙත් නැහැ." එයා පිළිගත්තා. "ඒත්, කලින් මෙඩූසාගේ තැනේදී, අර... ඔයා පෙට්ටියක් හොයන්න ගියේ? ඒ වෙලාවේ ඇනබෙත් මාත් එක්ක කිය-කියා හිටියේ -"

"ඔන්, මට අමතක වුණා නේ, ඇනබෙත් දැනටමත් සැලසුම් ඔක්කොම හදලා ඇති කියලා."

"එයාට ඔච්චර නපුරු වෙන්න එපා, පර්සි. එයා හරිම අමාරු ජීවිතයක් ගෙවපු කෙනෙක්. ඒ වුණත් එයා හරිම හොඳයි. ඔක්කෝටම පස්සේ, එයා මට සමාවත් දුන්නා..." එයාගේ කටහඬ ගොත ගැසුණා.

"මොකක්ද ඔයා කිවුවේ?" මම ඇසුවා. "මොකටද ඔයාට සමාව දුන්නේ?"

හදිසියේම, ග්‍රෝවර්ට, එයාගේ බටනළාවෙන් තාල වාදනය කරන්න ලොකු උනන්දුවක් ඇති වුණා.

"පොඩ්ඩක් ඉන්න," මම කිවුවා. "ඔයා මුලින්ම රැකවලෙක් විදිහට වැඩ කළේ අවුරුදු පහකට කලින්. ඇනබෙත් කඳවුරට ඇවිල්ලත් අවුරුදු පහයි. එයා නෙවෙයි නේද... මං කිවුවේ, ඔයාට හරියට සම්පූර්ණ කරගන්න බැරිවුණ පළවෙනි රාජකාරිය -"

"ඒ ගැන කතා කරන්න මට බැහැ," ග්‍රෝවර් කිවුවා. එයාගේ සැලෙන යටිතොල දකිද්දී, තවදුරටත් ඒ ගැන හාරා අවුස්සන්න ගියොතින් එයා අඬන්න පටන් ගන්න බව මට තේරුම් ගියා.

"මම කලින් කිය-කියා හිටියා වගේ, මෙඩූසාගේ තැනේ දී ඇනබෙත් යි මමයි කතා වුණේ, මේ ගවේෂණයේ මොකක් හරි අමුතු දෙයක් සිද්ධ වෙනවා කියලා. පෙනෙන්න තියෙන දේ ඇත්ත නොවෙන, මොකක් හරි දෙයක් මේකේ ඇතුළේ තියෙනවා."

"ඔව් ඉතින්, හේඩීස් හොරකම් කරපු විදුලි අකුණක් නිසා මට නේ බැණුම් අහන්න වෙලා තියෙන්නේ."

"මං අදහස් කළේ ඒක නෙවෙයි," ග්‍රෝවර් කිවුවා. "ෆියුකාරුණික ඇත්තෝ මොකක් හරි හංගාගෙනයි හිටියේ. හරියට යැන්සි එකේ හිටිය මිසිස් ඩොඩ්ස් වගේ... එයා ඔයාව මරන්න එච්චර කාලයක් බලාගෙන හිටියේ ඇයි? ඊට පස්සේ, එදා බස් එකේදී වුණත්, එයාලා සාමාන්‍යයෙන් ඉන්න තරම් දරුණු වුණේ නැනේ."

"මට නම් එයාලාගේ තිබ්බ දරුණුකම හොඳටෝම ඇති."

ග්‍රෝවර් ඔළුව සෙලෙව්වා. "එයාලා කෑගහ ගහා අපෙන් ඇහුවේ: 'කොහෙද ඒක? කොහෙද?' කියලා."

"මං ගැන අහන්න ඇත්තේ." මම කිවුවා.

"අනේ මන්දා... ඒත් ඇනබෙත්යි මමයි හිතන්නේ, එයාලා ඇහුවේ කෙනෙක් ගැන නෙවෙයි කියලා. එයාලා ඇහුවේ 'කොහෙද ඒක?' කියලා. එයාලා මොකක් හරි බඩුවක් ගැන අහනවා වගෙයි පෙනුණේ."

"ඒකේ කිසිම තේරුමක් නැනේ."

"මං දන්නවා. ඒත්, බැරි වෙලාවත් අපි මේ ගවේෂණය ගැන තේරුම් අරන් තියෙන්නේ වැරදියට නම්? අපිට ප්‍රධාන අකුණ හොයාගත්න තියෙන්නෙත් තව දවස් නමයක් විතරයි..." මගෙන් උත්තර බලාපොරොත්තුවෙන් එයා මගේ දිහා බැලුවා. ඒත්, මගේ ළඟත් උත්තර තිබුණේ නැහැ.

මෙඩූසා කියූ දේ ගැන මම ආයෙමත් කල්පනා කළා: දෙවිවරු මාව පාවිච්චි කරනවාලු. ඉස්සරහට මට මුහුණ දෙන්න වෙන දේ, ගල් පිළිමයක් වෙනවටත් වඩා භයානකයිලු. "මම ඔයාට ඇත්තම කිවුවේ නැහැ." මම ග්‍රෝවර්ට කිවුවා. "ප්‍රධාන අකුණෙන් මට වැඩක් නැහැ.

මම පාතාල ලෝකෙට යන්න එකඟ වුණේ, මගේ අම්මාව ආපයමත් අරගෙන එන්න පුළුවන් වෙයි හිතලා විතරයි."

ග්‍රෝවර්, එයාගේ නළාවෙන් මෘදු තාලයක් වැයුවා. "මම ඒක දන්නවා, පර්සි. ඒත්, හේතුව ඒක විතරයි කියලා ඔයාට විශ්වාසද?"

"මගේ තාත්තාට උදවු කරන්න මට උවමනාවක් නැහැ. එයා මං ගැන බැලුවේ නැහේ. ඉතින් මටත් උවමනාවක් නැහැ එයා ගැන බලන්න."

ග්‍රෝවර් අත්ත උඩ ඉඳගෙන මගේ දෙසට බැල්මක් හෙළුවා. "බලන්න, පර්සි. මං ඇනබෙත් තරම් දක්ෂ කෙනෙක්වත්, ඔයා තරම් නිර්භීත කෙනෙක්වත් නෙවෙයි. ඒ වුණාට චිත්තවේග කියවන්න නම් මම ගොඩක් දක්ෂයි. ඔයාගේ තාත්තා ජීවතුන් අතර ඉන්න එකට ඔයාට ගොඩක් සතුටුයි. එයා ඔයාට හිමිකම් කියපු එක ගොඩක් හොඳයි කියලා ඔයාට හිතෙනවා. ඒ වගේම, එයාට ඔයා ගැන ආඩම්බර හිතෙන්න වැඩ කරන්න ඔයාගේ කොටසකට ඕනෑ. අන්න ඒ නිසායි ඔයා මෙඩූසාගේ ඔළුව ඔලිම්පස්වලට යැවුවේ. ඔයාට උවමනා වුණේ ඔයා කළ දේ තාත්තාට දකින්න සලස්වන්න."

"එහෙමද? එහෙනම් සැටර්ලාගේ චිත්තවේග වැඩ කරනවා ඇත්තේ මිනිස්සුන්ගේ ඒවාට වඩා වෙනස් විදිහට වෙන්නැති. මොකද කිව්වොත්, ඔයා වැරදියි. එයා මං ගැන මොනවා හිතුවත් මට කමක් නෑ."

ග්‍රෝවර් කකුල් දෙක අත්ත උඩට ගත්තා. "හොඳයි, එහෙනම් ඕනෑ එකක්."

"ඇරත්, පම්පෝරි ගහන්න වටිනා දෙයක් මම කරලා නැහේ. අපි නිව්යෝක්වලින් එළියට පැන ගත්තෙත් බොහොම අමාරුවෙන්. දත් අතේ සතයක්වත් නැතුව, බටහිරට යන්න විදිහකුත් නැතුව අපි මෙතැන හිරවෙලා."

ග්‍රෝවර් රෑ අහස දෙස බලා සිටියේ ඒ ප්‍රශ්නයට උත්තර හොයන්න වගෙයි. "පළවෙනි මුරය මම කළොත් කොහොමද, ආ? ඔයා ටිකක් නිදාගන්න."

ඊට විරුද්ධ වෙන්න මට උවමනා වුණත්, ග්‍රෝවර් මිහිරි, මෘදු තාලයක් වාදනය කරන්න ගත් නිසා මම අනෙක් පැත්තට හැරුණා.

මගේ ඇසිපිය ටිකෙන් ටික බර වුණේ මටත් නොදැනීමයි. වාදනයේ මැද කොටසට යද්දී මම නින්දට වැටුණා.

***

සිහිනයෙන්, ලොකු ආවාටයක් ඉදිරියේ තිබූ කළුවර ගුහාවක් තුළ මම සිටගෙන සිටියා.

අළු පාට මීදුමෙන් සෑදුණු භූතයෝ මගේ වටේට කොඳුරමින් කැලතුනා. ඒ හැමෝම මළගිය ආත්ම බව මම කොහොමදෝ දැන සිටියා.

එයාලා මගේ ඇඳුම්වලින් අදිමින් මාව පිටුපසට අදින්න උත්සාහ කළත්, ආවාටයේ කෙළවරටම යන්න මට පෙලඹවීමක් ඇති වුණා.

පහළ බලද්දී මට කරකැවිල්ලක් දැනෙන්න ගත්තා.

ගොඩාක් පළල්ව පැතිරී තිබුණු ඒ අඳුරු ආවාටයට පතුලක් නැතිව ඇති කියලා මට හිතුණා. කොහොම වුණත්, ඒ පාතාලය පතුලේ යම් දෙයක් - යම් දැවැන්ත, දුෂ්ට දෙයක් නැගිටින්න උත්සාහ කරනවා වගෙයි මට දැනුණේ.

පුංචි වීරයා, සරදමින් පිරුණු කටහඬක් පහළ කළුවර තුළින් දෝංකාර දුන්නා. ගොඩාක් දුර්වලයි, ගොඩාක් ළපටියි. ඒත්, සමහරවිට නුඹ වැඩේ කරාවි.

පෞරාණික, බැරෑරුම් බවක් තිබූ ඒ හඬ ඊයම්වලින් සෑදූ පොරෝනාවක් වගේ මාව වෙලාගත්තා.

එයාලා නුඹව රවට්ටලා තියෙන්නේ, කොලුවෝ, ඒ හඬ කිවුවා. අපි ගනුදෙනුවක් කරමු. නුඹට උවමනා දේ මම දෙන්නම්.

හිස් අවකාශයේ රූපයක් මතු වුණාඃ මගේ අම්මා, අතුරුදන් වූ මොහොතේ ගල් ගැසිලා. එයාගේ මුහුණ වේදනාවෙන් විරූපී වෙලා තිබුණේ හරියට මිනොටර් තවමත් බෙල්ල මිරිකාගෙන ඉන්නවා වගෙයි. මගේ දෙසට කෙලින්ම යොමු වී තිබුණු අම්මාගේ බැල්මේ තිබුණේ ආයාචනාවක්ඃ දුවන්න!

මම කෑගහන්න උත්සාහ කළත් මගේ හඬ පිටට ආවේ නැහැ.

මූසල හිනාවක් පාතාලය තුළ දෝංකාර දුන්නා.

නොපෙනෙන බලයකින් මාව ඉදිරියට අදින්න ගත්තා. මම තදින් සිටගෙන නොසිටියා නම් මාවත් පාතාලය තුළට ඇදීයන්න තිබුණා.

මට නැගිටින්න උදවු කරන්න, කොල්ලෝ. දැන්, ඒ කටහඬට නැඳුර බවක් එකතු වෙලා. මට අකුණ ගෙනත් දෙන්න. දෝශී දෙවිවරුන්ව වනසලා දාන්න!

මගේ වටේ සිටි මළවුන්ගේ ආත්ම කොඳුරන්න ගත්තා. එපා! නැගිටින්න!

මගේ අම්මාගේ රූපය බොඳ වෙන්න ගත්තා. මාව අල්ලාගෙන සිටි අදෘශ්‍යමාන ග්‍රහණය තව තවත් තද වුණා.

ඒ දෙය උත්සාහ කරන්නේ මාවත් පාතාලය තුළට ඇදගන්න නොවෙන බව මට තේරුණා. එය මාව පාච්චිච් කරලා වළෙන් ගොඩට ඇදෙන්නයි උත්සාහ කළේ.

හොඳයි. එය මිමිණුවා. නියමයි.

නැගිටින්න! මළවුන් කෙඳිරුවා. නැගිටින්න!

කවුදෝ මාව සෙලෙව්වා.

මං ඇස් ඇර බලද්දි එළිය වැටිලා.

"ඇති යන්තං," ඇනබෙත් කිවුවා. "පිල්ලියට පණ ඇවිල්ලා."

මම සිටියේ තවමත් වෙවුලමින්. පාතාල රාක්ෂයාගේ ග්‍රහණය තවමත් මගේ පපුව වටා තියෙනවා වගෙයි මට දැනුණේ. "මං කොච්චර වෙලා නිදාගත්තද?"

"මම උදේ කෑම හදනකම් නිදාගත්තා." ඇනබෙත් එම් නැන්දාගේ කෑම කවුන්ටරයෙන් ගෙනා කෝන් චිප්ස් පැකට්ටුවක් මට දුන්නා. "ග්‍රෝවර්ත් වටපිට බලන්න ගියා. බලන්නකෝ, එයාට යාළුවෙක් හම්බවෙලා."

මගේ ඇස් නාභිගත කරගන්න ටිකක් අපහසු වුණා.

බ්ලැන්කෙට්ටුවක් මත එරමිණිය ගොතාගෙන සිටි ග්‍රෝවර්ගේ ඔඩොක්කුවේ පුළුන් පිරවූ, රෝස පාට සතෙක් තිබුණා.

නෑ. ඒ පුළුන් පිරවූ සතෙක් නෙවෙයි, පූඩ්ල් වර්ගයේ ඇත්තම රෝස පාට බල්ලෙක්.

පූඩ්ල් බල්ලා මට බුරන්න ගත්තේ සැකයෙන් වගෙයි. "නෑ, එයා එහෙම නෑ." ග්‍රෝවර් ඌට කිවුවා.

මම ඇහිපිල්ලම් ගැසුවා. "ඔයා... මේකා එක්ක කතා කරනවද?"

බල්ලා ගොරවන්න ගත්තා.

"මේකා," ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා. "...තමයි අපේ බටහිරට යන ටිකට් එක. එයාට හොඳින් සලකන්න."

"ඔයාට සත්තු එක්ක කතා කරන්නත් පුළුවන්ද?"

ග්‍රෝවර් ඒ ප්‍රශ්නය නොසලකා හැරියා. "පර්සි, මේ ඉන්නේ ග්ලැඩියෝලා. ග්ලැඩියෝලා, මේ පර්සි."

මම ඇනබෙත් දෙස බලා සිටියේ, එයාලා මට කරන විහිළුවට එයාටම හිනා යන තුරුයි. ඒ වුණත්, එයාගේ මුහුණේ විහිළුවක ලකුණක්වත් නැහැ.

"මම රෝස පාට බූල් බල්ලෙක්ට හලෝ කියන්නේ නම් නෑ," මම කිවුවා. "ඒ ගැන හිතන්නවත් එපා."

"පර්සි," ඇනබෙත් කතා කළා. "මමත් බල්ලාට හලෝ කිවුවා. ඉතින්, ඔයත් එයාට හලෝ කියන්නකෝ."

බල්ලා ගොරවන්න ගත්තා.

ඉතින්, මමත් බල්ලාට හලෝ කිවුවා.

ග්‍රෝවර් කැලයේ ඇවිදිනකොට ග්ලැඩියොලාව මුණ ගැසුණු විදිහත්, ඒ දෙන්නා කතාවට වැටුණු හැටිත් ග්‍රෝවර් මට විස්තර කළා. ලඟපාත සල්ලිකාර පවුලකින් පැනලා ඇවිත් සිටි මේ බල්ලාව සොයා දෙන කෙනෙකුට ඩොලර් දෙසීයක තෑග්ගක් දෙන්න දැන්වීම් පළ කරලාලු. කලින් සිටි ගෙදරට ආපසු යන්න ග්ලැඩියෝලාට උවමනාවක් නොතිබුණත්, එයින් ග්‍රෝවර්ට උදවුවක් වෙනවා නම් ආපසු යන්න එයා කැමති වෙලා.

"ග්ලැඩියෝලා තෑග්ග ගැන දන්නේ කොහොමද?" මම ඇසුවා.

"එයාට කියවන්න පුළුවන්, මැට්ටෝ." ග්‍රෝවර් කිවුවා.

"ඇත්ත නේන්නම්," මම කිවුවා. "මම නේ මෝඩයා."

"එතකොට, අපි ග්ලැඩියෝලාව ගිහින් දෙනවා." ඇනබෙත්, එයාගේ හොඳම 'උපාය සැලසුම් කරන' හඬින් කිවුවා, "අපි සල්ලි

ගේනවා. ඊට පස්සේ, අපි ලොස් ඇන්ජලීස්වලට විකට් ගේනවා. සරලයි."

මට සිහිනයෙන් පෙනුන කොඳුරන හුතයෝ, ආවාටය ඇතුළේ සිටි කෙනා වගේම මගේ අම්මාගේ මුහුණත් මට මතක් වුණා. මේ හැමෝම මං එනතුරු බටහිර බලාගෙන ඉන්නවා ඇති.

"ආයෙමත් බස්වල ගමන් නම් බැහැ," මම පරීක්ෂාකාරිව කිවුවා.

"නැහැ," ඇනබෙත් එකඟ වුණා.

එයා ඇඟිල්ල දිගුකර පෙන්වූ කන්ද පාමුල තිබුණේ ඒ කළුවර නිසා අපිට නොපෙනුන දුම්රිය පාරවල් කිහිපයක්. "හැතැප්ම බාගයක් විතර දුරින් නැවතුම්පොළක් තියෙනවා. ග්ලැඩියෝලා කියන විදියට නම්, බටහිරට යන කෝච්චිය ඉර මුදුන් වෙද්දී පිටත් වෙනවා."

13

මම මාරක පිම්මක් පැන්නා

කඳු අතරින්, ගංගා උඩින්, කහ පාට කෙත් වතු පසු කරමින් බටහිර ඇදුණු දුම්රියේ අපි දවස් දෙකක් ගත කළා.

අපිට එක් වතාවක් හෝ රාක්ෂ පහරදීමක් සිදු නොවුණත්, මට විවේක ගන්න හැකි වුණේ නැහැ. මට දැනුණේ තමන්ගේ අවස්ථාව එනතුරු මොකෙක් හරි අපි ගැන සෝදිසියෙන් බලා ඉන්න අතරේ, අපි ප්‍රදර්ශන කූඩුවක තැගලා ගමන් කරනවා වගෙයි.

නැගෙනහිර වෙරළබඩ පත්තර කීපයකම මුල් පිටුවල මගේ පින්තූරයක් එක්ක නම-ගම පළ කර තිබූ නිසා, අනෙක් මගීන්ගේ අවධානයට ලක් නොවී ඉන්න මම උත්සාහ කළා. මම ග්‍රේ හවුන්ඩ් බසයෙන් බසිද්දි සංචාරකයෙක් ගත් මගේ ඡායාරූපය ට්‍රෙන්ටන් රෙජිස්ටර් පත්තරයේ පළකර තිබුණා. ඒ රූපයේ දඩබ්බර බැල්මක් එක්ක මම සිටියත් මගේ කඩුව බොඳ වී තිබූ නිසා එය බේස්බෝල් පිත්තක්, නැත්නම් දිග සීනිකූරක් ලෙසින් වුණත් හිතන්න පුළුවන්කම තිබුණා,

ඒ ඡායාරූපය සමග මේ ලිපිය පළ වී තිබුණා:

අවුරුදු දොළහක් වයසැති පර්සි ජැක්සන් මීට සති දෙකකට පෙර ලොන්ග් අයිලන්ඩ්හිදී සිදුවූ ඔහුගේ මවගේ අතුරුදන්වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම සඳහා පොලීසියට උවමනා කර ඇති අයෙකු වන අතර, ඔහු බසයක ගමන් ගනිමින් සිටි වියපත් කාන්තාවන් කිහිප දෙනෙකුට හිරිහැර කර, පළා යන අවස්ථාවේ ගත් ඡායාරූපයක්

Scanned with CamScanner

ඉහතින් දක්වා ඇත. ජැක්සන් මෙම ස්ථානයෙන් පළා ගොස් සුළු මොහොතකට පසු මෙම බසය නිව් ජර්සි මාර්ගයේදී පුපුරා ගොස් ඇත. මෙම සිද්ධිය ඇසින් දුටුවන්ගේ සාක්ෂි අනුව පොලීසිය විශ්වාස කරන්නේ ඔහු සමග තවත් තරුණ අපරාධ සහායකයින් දෙදෙනෙකුද ගමන් කරන බවයි. මෙම තරුණයාව අත්අඩංගුවට ගැනීම සඳහා තොරතුරු ලබා දෙන අයෙකුට මුදලින් ත්‍යාගයක් පිරිනැමීමට ඔහුගේ සුළු පියා වන ගේබ් අග්ලියානෝ මහතා ඉදිරිපත් වී ඇත.

"ගණන් ගන්නෙපා," ඇනබෙත් මට කිවුවා. "පොලීසියට කවදාවත් අපිව හොයාගන්න බැහැ." ඒත්, එයාගේ හඬේ නම් ඒ හැටි විශ්වාසයක් තිබුණේ නැහැ.

ඒ දවසේ ඉතිරිය දුම්රියේ එහෙ-මෙහෙ ඇවිදිමින් (මොකද, එක තැනකට වෙලා ඉඳගෙන ඉඳීම මට හරිම අමාරු වැඩක්) හෝ ජනේලවලින් පිටත බලමින් මම ගත කළා.

වතාවක්, දුනු මානාගෙන, ඉරිඟු කෙතක් හරහා දඩයමේ යන නරාශ්ව පවුලක් මට දකින්න ලැබුණා. ඒ අතරේ සිටි පෝනියෙක් තරමේ නරාශ්ව කොල්ලෙක් මාව දැකලා අත වැනුවා. මම මැදිරිය වටා ඉක්මන් බැල්මක් හෙළුවත් වෙනත් කිසිවෙක් එය දැක තිබුණේ නැහැ. වැඩිහිටි හැම දෙනාම සිටියේ ලැප්ටොප් පරිගණකවල හෝ සඟරාවල ඔළු ඔබාගෙනයි.

හවස් වරුවේ තවත් වතාවක්, ගස් අතරින් ගිය ලොකු සතෙක්ව මම දැක්කා. ඇමරිකාවේ කැලෑවල සිංහයෝ නැති බව මම දන්නවා වුණත්, ඒ සිංහයෙක් කියලා මට දිවුරන්න වුණත් පුළුවන්. ඒ සතා ලොකුම ලොකුයි. ඌගේ ලොම් හවස ඉර එළියෙන් රන් පාටින් දිලිසුනා. ටිකකින්, ගස් අතරින් පැනලා ගිය ඌ නොපෙනී ගියා.

ග්ලැඩියෝලාව බාරදීමෙන් අපිට ලැබුණු සල්ලි ප්‍රමාණවත් වුණේ ඩෙන්වර්වලට ටිකට් ගන්න විතරයි. නිදන මැදිරිවල ආසන ලබා ගන්න නොහැකි වූ නිසා අපි, අපේ ආසන මතම නිදිකිරා වැටුණා. මගේ බෙල්ලත් උලුක් වුණා. ඇනබෙත් මට එහා පැත්තෙන් සිටි නිසා නින්දෙන් කෙළ පෙරා නොගන්න මම උත්සාහ කළා.

ග්‍රෝවර් දිගටම ගොරවමින්, බෑ ගාමින් මගේ නින්ද කැඩුවා. එක් වතාවක්, එයා කකුල් ගස්සද්දී එයාගේ බොරු කකුල් ගැලවිලා වැටුණා. ඉතින්, අනෙක් මගියෝ දකින්න කලින් එය ආපසු සවි කරන්න ඇනබෙත්ටයි මටයි සිද්ධ වුණා.

"ඉතින්," ග්‍රෝවර්ගේ බොරු කකුල සවි කළාට පසු ඇනබෙත් මගෙන් ඇසුවා, "කාටද ඔයාගේ උදවු උවමනා?"

"ඒ කිවුවේ?"

"දැන් ටිකකට කලින් ඔයා නිදාගෙන ඉන්නකොට, 'මම ඔයාට උදවු කරන්නේ නෑ' කියලා හීනෙන් කියෙව්වා. ඔයා කාවද හීනෙන් දැක්කේ?"

ඒ ගැන කියන්න මගේ කැමැත්තක් තිබුණේ නැහැ. පාතාලයේ යක්ෂ හඬ මට සිහිනයෙන් දකින්න ලැබුණු දෙවෙනි දවසයි ඒ. ඒ වුණත්, ඒක මගේ හිතට ගොඩාක් වධ දුන් නිසාම, අන්තිමේදී මම ඒ ගැන එයාට කිවුවා.

සෑහෙන වෙලාවක් ගතවන තුරු ඇනබෙත් නිහඬව හිටියා. "ඒ නම් හේඩීස් නෙවෙයි වගේ. එයා හැම වෙලාවෙම පෙනී ඉන්නේ කළු පාට සිංහාසනයක ඉඳගෙන, ඒ වගේම, එයා කවදාවත් හිනා වෙන්නෙත් නැහැ."

"එයා මගේ අම්මාව ගනුදෙනු කරන්න කැමති වුණා. වෙන කාටද එහෙම කරන්න පුළුවන්?"

"මං හිතන්නේ... 'මට පාතාල ලෝකයෙන් නැගිටින්න උදවු කරන්න' කියලා එයා කිවුවා නම්, එයාට ඔලිම්පියානුවෝ එක්ක යුද්ධයක් උවමනා ඇති. ඒත්, දැනටමත් එයා ළඟ ප්‍රධාන අකුණ තියෙනවා නම්, එයා ඔයාට ඒක අරගෙන එන්න කියන්නේ ඇයි?"

මම ඔළුව සෙලෙව්වේ එයට උත්තර දැන සිටියා නම්, සිතමිනුයි. බසයේ සිටි ෆියුරිලා මොකක් හරි සොයමින් සිටියා කියලා ග්‍රෝවර් කියූ කතාව මට මතක් වුණා.

කොහෙද ඒක? කොහෙද?

සමහරවිට, මගේ චිත්තවේගයන් ග්‍රෝවර්ට දැනෙන්න ඇති. මහ හඬින් නහයෙන් පිම්බ එයා එළවළු ගැන මොනවදෝ කොඳුරමින්, ඔළුව අනෙක් පැත්තට හැරෙව්වා.

ඇනබෙත් එයාගේ අං දෙක වැහෙන්න තොප්පිය සකස් කළා. "පර්සි, ඔයාට හේඩීස් එක්ක ගනුදෙනු කරන්න බැහැ. ඔයා ඒක දන්නවානේ, නේද? එයා හිතක් පපුවක් නැති, කපටි, කෑදර කෙනෙක්. එයාගේ කාරුණික ඇත්තෝ මේ පාර වැඩිය ආක්‍රමණකාරී වුණේ නැතිවට මට කමක් නැහැ."

"මේ පාර?" මම ඇහුවා. "ඒ කියන්නේ, මීට කලිනුත් ඔයාට එයාලාව මුණ ගැහිලා තියෙනවාද?"

එයාගේ අත, එයාගේ මාලය වෙතට ඇදුණා. එහි තිබූ පයින් ගහක් පින්තාරු කළ සුදු පාට මැටි පබළුවක් එයාගේ ඇඟිලි අතරට මැදිවුණා. එය ගිම්හාන අවසානයකදී එයාට ලැබුණු පබළුවලින් එකක්. "මරණයට අධිපති ගැන මගේ හිතේ කිසිම ආදරයක් නැහැ කියලා විතරක් කියමුකෝ. ඔයාගේ අම්මා වෙනුවෙන් ගනුදෙනුවක් කරන්න පෙලඹෙන්න ඔයාට බැහැ."

"මේ දේම ඔයාගේ තාත්තාට සිද්ධ වුණා නම් ඔයා මොකද කරන්නේ?"

"ඒක ලේසියි," එයා කිවුවා. "මම එයාව දිරලා යන්න අරිනවා."

"ඔයා ඇත්තටමද කියන්නේ?"

ඇනබෙත්ගේ අළු පාට ඇස් දෙක මගේ ළඟ නතර වුණා. ඒ ඇස්වල තිබුණේ කඳවුරු කැලෑවේදී එයා යම බල්ලාට පහර දෙන්න කඩුව ඇදගත් මොහොතේ තිබූ බැල්මමයි. "මම ඉපදුණ දවසේ ඉඳලාම මගේ තාත්තාට මාව පේන්න බැහැ, පර්සි." එයා කිවුවා. ''එයාට කවදාවත් බබෙක් උවමනා වුණේ නැහැ. මාව ලැබුණාම, එයාට වැඩ වැඩි නිසා මාව ආපහු අරන් ගිහින් ඔලිම්පස්වල තියාගෙන හදන්න කියලා එයා ඇතීනාට කිවුවා. ඒත්, ඇතීනා ඒකට සතුටු වුණේ නැහැ. වීරයන්ව ඇති-දැඩි කරන්න ඕනෑ එයාලාගේ මනුෂ්‍ය දෙමව්පියෝ කියලා එයා මගේ තාත්තාට කිවුවා."

''ඒත්, කොහොමද... මං අදහස් කළේ, ඔයා ඉස්පිරිතාලෙක ඉපදෙන්න ඇතිව ඇතිනේ..."

"මම, මගේ තාත්තාගේ දොර පඩිය උඩ මතු වුණා. රත්තරන් තොටිල්ලක දාලා, මාව ඔලිම්පස්වලින් පහළට ගෙනාවේ සෙපියර් - ඒ කියන්නේ බටහිර සුළඟ. ඒක ප්‍රාතිහාර්යයක් විදිහට මගේ තාත්තා මතක තියාගෙන ඇති. සමහරවිට, එයා ඒ වෙලාවේ පින්තූර ටිකක් එහෙමත් අරන් තියාගෙන ඇති කියලා ඔයා හිතනවා ඇති, නේද? ඒත්, තාත්තා හැම වෙලාවෙම ඒ ගැන කතා කරන්නේ එයාගේ ජීවිතේ සිද්ධ වෙච්ච තරකම දේ විදිහටයි. මට අවුරුදු පහේදී ආපහු විවාහ වුණ එයා ඇතීනාව සම්පූර්ණයෙන්ම අමතක කළා. එයාට 'නියම' මිනිස් බිරිඳක් ලැබුණා, 'නියම' මිනිස් දරුවෝ දෙන්නෙකුත් ලැබුණා. ඉතින්,

මම කියලා කෙනෙක් මේ ලෝකේ නැහැ වගේ අඟවන්නයි එයා හැම වෙලාවෙම උත්සාහ කළේ."

මම දුම්රියේ ජනේලයෙන් එපිට බලා සිටියා. නිදන නගරයක එළි අපිව පසු කරගෙන ඈතට ඇදුණා. ඇනබෙත්ගේ හිත සනසන්න මට ඕනෑ වුණත්, ඒක කරන්නේ කොහොමද කියලා මම දන සිටියේ නැහැ.

"මගේ අම්මා හරිම භයානක මනුස්සයෙක් එක්ක විවාහ වුණා," මම එයාට කිවුවා. "ග්‍රෝවර් කියන්නේ එයා එහෙම කළේ මාව ආරක්ෂා කරන්නලු. මිනිස් පවුලක ගඳ ඇතුළේ මාව හංගන්නලු එහෙම කළේ. සමහරවිට, ඔයාගේ තාත්තාත් එහෙම හිතන්න ඇති."

ඇනබෙත් දිගටම මාලය එක්ක ඔට්ටු වුණා. එයා එහි පබළු අතරේ එල්ලා තිබුණු රත් මුද්දුව කරකවන්න ගත්තා. ඒක එයාගේ තාත්තාගේ මුද්දුවක් විය යුතු බව මට තේරුණේ ඒ වෙලාවේදියි. එයා ඇත්තටම තාත්තාට වෛර කරනවා නම්, ඒ මුද්දුව ළඟ තියාගෙන ඉන්නේ ඇයි කියලා මම පුදුමයෙන් කල්පනා කළා.

"එයා මං ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ," එයා කිවුවා. "එයාගේ නෝනා - මගේ කුඩම්මා මට සැලකුවේ මම විකාරයක් වගෙයි. එයාගේ ළමයි එක්ක සෙල්ලම් කරන්න එයා මට කවදාවත් ඉඩ දුන්නේ නෑ. මගේ තාත්තාත් ගත්තේ එයාගේ පැත්ත. කොයිම වෙලාවක හරි අනතුරුදායක දෙයක් - ඒ කියන්නේ රාක්ෂයෝ සම්බන්ධ දෙයක් සිද්ධ වුණොත් ඒ දෙන්නම කේන්තියෙන් මගේ දිහා බැලුවේ හරියට 'අපේ පවුල අනතුරේ දාන්න තරම් හයියක් ඔයාට කොහෙන්ද?' අහන්න වගෙයි. අන්තිමේදී, එයාලා මට අඟවපු දේ මම තේරුම් ගත්තා. එයාලාට මාව උවමනා වුණේ නැහැ. ඉතින්, මම ගෙදරින් පැනලා ආවා."

"එතකොට ඔයාගේ වයස කීයද?"

"මම කඳවුරට ආව කාලෙමයි. අවුරුදු හතයි."

"ඒත්... අර්ධ-ලෝහිත කන්දට එනකම් ඔයා තනියම ආවා වෙන්න බැහැ?"

"නැහැ, තනියම නෙවෙයි. ඇතීනා මාව මුර කළා. එයා මාව උදවු ලැබෙන තැනකට මෙහෙයවූවා. මම බලාපොරොත්තු නොවුණ

විදිහට මුණගැහුණ යාළුවෝ දෙන්නෙක් මාව බලාගත්තා. හැබැයි, ඒ පොඩි කාලයකට."

ඊට පස්සේ මොකද වුණේ, මට අහන්න උවමනා වුණත් ඇනබෙත්, එයාගේ දුක්බර මතකයන් ඇතුළේ ගිලුණා. ඉතින්, මම ග්‍රෝවර් ගොරවන හඬට කන් දෙමින්, ඔහියෝවේ අඳුරු කෙත් ඈතට ඇදී යන දෙස බලා සිටියා.

ජූනි දහතුන, උත්තරායනයට දවස් අටක් ඉතිරිව තියෙද්දි, දුම්රියේ අපි ගතකළ දෙවෙනි දවසත් ගෙවී යන අතරේ, රන් පාට කඳු සීපයක් පසු කරගෙන, මිසිසිපි ගඟට උඩින් ගිය අපි ශාන්ත ලුයිස් නගරයට ඇතුළු වුණා. යෝධ බඩු මල්ලක අඩු දෙක නගරය මැදින් සවි කරලා වගේ මට පෙනුණු නගර වාහල්කඩ ආරුක්කුව හොඳින් බලාගන්න උවමනාවෙන් ඇනබෙත් කොකෙක් වගේ බෙල්ල දිගු කරමින් එබී බලන්න වුණා.

"මටත් එහෙම එකක් කරන්න ඕනෑ," එයා හීල්ලුවා.

"මොක්ද?" මම ඇසුවා.

"ඒ වගේ දෙයක් හදන්න. ඔයා කවදාහරි පාතිනන් දෙව් මැඳුර දැකලා තියෙනවද, පර්සි?"

"පින්තූරවලින් විතරයි."

"කවදාහරි දවසක, මම ඒක බලන්න යනවා. දෙවිවරු වෙනුවෙන් ලොකුම ස්මාරකය මම හදනවා. තවත් අවුරුදු දහස් ගාණක් පවතින විදිහට."

මට හිනා ගියා. "ඔයා? ගෘහ නිර්මාණ ශිල්පියෙක් වෙනවා?"

මොන හේතුවක් නිසාද මන්දා, මට පෙනුණේ ඒක විහිළුවක් වගෙයි. ඇනබෙත් මුළු දවසම එක තැනක වාඩිවෙලා, නිශ්ශබ්දව නිර්මාණ අඳින්න උත්සාහ කරනවා, කියන අදහසම විහිළුවක් වගෙයි.

එයාගේ කම්මුල් රතු වුණා. "ඔව්, ගෘහ නිර්මාණ ශිල්පියෙක් තමයි. භූමිකම්පා එහෙම ඇති කරන දෙවියන්ගේ ළමයි වගේ තියෙන දේවලුත් විනාශ කරන අය නොවී, තමන්ගේ ළමයි අලුත් නිර්මාණ කරාවි කියලා ඇතීනා බලාපොරොත්තු වෙනවා."

මම පහළින් ගලාගිය මිසිසිපි ගඟේ බොර වතුර දෙසට ඇස් හරවා ගත්තා.

"සමා වෙන්න," ඇනබෙත් කිවුවා. "මම පහත් කතාවක් කිවුවේ."

"අපිට චුට්ටක්වත් එකතු වෙලා වැඩ කරන්න බැරිද?" මම ඉල්ලීමක් කළා. "මං අහන්නේ, ඇතීනා යි, පොසෙයිඩන් යි කවදාවත් සහයෝගයෙන් වැඩ කරලා නැද්ද?"

ඇනබෙත්ට ඒ ගැන කල්පනා කරන්න සිද්ධ වුණා. "මම හිතන්නේ... කරත්තය," එයා අවිශ්වාසයෙන් කිවුවා. "ඒක නිර්මාණය කළේ මගේ අම්මා, ඒත් පොසෙයිඩන් තමයි රළ මුදුන්වලින් අශ්වයන්ව නිර්මාණය කළේ. ඉතින්, ඒක සම්පූර්ණ කරන්න ඒ දෙන්නාට එකට වැඩ කරන්න වුණා."

"ඒ කියන්නේ, අපි දෙන්නටත් සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන්, නේද?"

හෝටලයකට මුවා වූ ආරුක්කුව දෙස ඇනබෙත් බලා ඉන්නා අතරේ අපි නගරය තුළටම ගමන් කළා.

"මං හිතනවා." අන්තිමේදී එයා උත්තර දුන්නා.

නගර නැවතුම්පොළට ඇදුණු දුම්රිය නතර වුණා. ඩෙන්වර් බලා ගමන් ආරම්භ කරන්න කලින් පැය තුනක විරාමයක් ගන්නා බව දුම්රියපොළෙන් නිවේදනය කළා.

ග්‍රෝවර් ඇඟමැලි කැඩුවා. සම්පූර්ණයෙන් ඇහැ ඇරෙන්නත් කලින් එයාගේ කටින් පිට වූ මුල්ම වචනය වුණේ, "කෑම."

"නැගිටින්න, එළු-කොල්ලෝ," ඇනබෙත් කිවුවා. "වටපිට බලන්න යමු."

"වටපිට බලන්න?"

"වාහල්කඩ ආරුක්කුව," එයා කිවුවා. "ඒක උඩට නගින්න මට ලැබෙන එකම අවස්ථාව මේක වෙන්න පුළුවන්. ඔයාලා එනවද, නැද්ද?"

ග්‍රෝවර් සහ මම බැල්මක් හුවමාරු කරගත්තා.

බැහැ කියන්න මට උවමනා වුණත්, ඇනබෙත් යනවා නම්, එයාට තනියම යන්න ඉඩ දෙන්න බැරි බව මට තේරුණා.

ග්‍රෝවර් උරහිස් ඇකිළුවා. "එහෙ රාක්ෂයෝ නැති කෑම කඩ ඇති නේ?."

Scanned with CamScanner

***

ආරුක්කුව පිහිටා තිබුණේ දුම්රියපොළේ සිට සැතපුමක් තරම් දුරකින්. දහවල් කාලය නිසා එයට ඇතුළුවන පෝලිමේ වැඩි සෙනඟක් සිටියේ නැහැ. 1800 ගණන්වලට අයත් සුන්බුන් තැන්පත් කර තිබූ භූගත කෞතුකාගාරයක් හරහා අපිට මුලින්ම ගමන් කරන්න ලැබුණා. එය එතරම් පුදුම හිතෙන තැනක් නොවුණත්, ආරුක්කුව ඉදිකළ ආකාරය ගැන සිත්ගන්නා සුළු දේවල් ටිකක් ඇනබෙත් කියමින් ගිය නිසාත්, ග්‍රෝවර්ගෙන් මට ජෙලි බීන්ස් ලැබුණු නිසාත් මම දිගටම ගමනේ යෙදුණා.

ඒ වුණත්, පෝලිමේ සිටි අනෙක් මිනිස්සු ගැන පරීක්ෂාකාරී වෙන්න මම අමතක කළේ නැහැ. "ඔයාට මොකක් හරි ගඳක් දැනෙනවද?" මම ග්‍රෝවර්ගෙන් මුමුණා ඇසුවා.

නුස්මක් ඉහළට ඇදගන්න විතරක් ජෙලි බීන්ස් මල්ලෙන් නහය එළියට ගත් එයා, "පොළොව යට," කිවුවේ පිළිකුලෙන්.

"පොළොව යට නුළගේ හැම වෙලාවෙම තියෙන්නේ රාක්ෂ ගඳ. ඒ නිසා, මොකෙක්වත් නැතුව ඇති."

ඒත්, කුමක් හෝ වරදක් ඇති බව මට දැනුණා. මගේ හිත මට කියන්න ගත්තේ අපි එතැන නොසිටිය යුතු බවයි.

"යාළුවනේ," මම කතා කළා. "දෙවිගොල්ලන්ගේ බල සංකේත ගැන ඔයාලා දන්නවා නේද?"

ආරුක්කුව ගොඩනැංවීමට භාවිතා කළ බඩු බාහිරාදිය ගැන ලිපියක් කියවමින් සිටියත්, ඇනබෙත් ඔළුව ඔසවා බැලුවා. "ඔව්?"

"හොඳයි. හේඩි-"

ග්‍රෝවර් උගුර පෑදුවා. "අපි ඉන්නේ සෙනඟ ගොඩක් මැද... ඔයා කියන්නේ, පහළ තට්ටුවේ ඉන්න අපේ යාළුවා ගැන නේ?"

"ම්... හරි," මම කිවුවා. "පහළම තට්ටුවේ ඉන්න අපේ යාළුවා. එයා ළඟ තියෙනවා නේද ඇනබෙත්ගේ වගේ තොප්පියක්?"

"ඔය කියන්නේ, අඳුරේ හිස්වැසුම," ඇනබෙත් කිවුවා. "ඔව්. ඒක තමයි එයාගේ බලයේ සංකේතය. දක්ෂිණායන මහා මන්ත්‍රණ සභාවේදී එයා ඉඳගෙන හිටිය තැනට එහා පැත්තේ ඒක තියෙනවා මං දැක්කා."

"එයාත් එතැන හිටියද?" මම ඇසුවා.

එයා ඔළුව වැනුවා. "වසරේ අඳුරුම දිනය - එදාට විතරයි එයාට ඔලිම්පස්වලට යන්න අවසර තියෙන්නේ. ඒත්, මට අහන්න ලැබිලා තියෙන දේවල් ඇත්ත නම්, එයාගේ හිස්වැසුම මගේ අදෘශ්‍යමාන කැප් එකට වඩා ගොඩාක් බලවත්..."

"එකේ බලයෙන් එයාට අඳුර වෙන්න පුළුවන්," ග්‍රෝවර් ඒ කතාව ස්ථිර කළා. "සෙවණැලි අතරට දියවෙලා යන්න, බිත්ති හරහා යන්න වුණත් එයාට පුළුවන්. එතකොට, කාටවත් එයාව පේන්නේ නැහැ, ඇහෙන්නෙත් නැහැ. එයාව අල්ලන්නත් බැහැ. එයාට කොයිතරම් නදින් බය පතුරන්න පුළුවන්ද කියනවා නම්, ඒකෙන් ඔයාව පිස්සු වැටෙන්න, නැත්නම් ඔයාගේ හදවත නතර වෙන්න වුණත් පුළුවන්. සිහි බුද්ධියක් තියෙන ඕනෑම සතෙක් කළුවරට බය මොකක් නිසා කියලද ඔයා හිතුවේ?"

"ඒත්, එහෙනම්... එයා අපි දිහා බලාගෙන, මේ වෙලාවේ මෙතැන ඉන්නවද, නැද්ද කියලා අපි කොහොමද දැනගන්නේ?" මම ඇසුවා.

ඇනබෙත් සහ ග්‍රෝවර් අතරේ බැල්මක් හුවමාරු වුණා.

"අපිට දැන ගන්න විදිහක් නෑ," ග්‍රෝවර් කිවුවා.

"නියමයි, ඒක ඇහුවාම මට හරිම සතුටුයි," මම කිවුවා. "නිල් පාට ජෙලි බීන්ස් එහෙම ඉතුරු වෙලා නැද්ද?"

ආරුක්කුවේ මුදුනට ගමන් කරන්න පොඩි සෝපානය දකිනඩතුරුම මම, මගේ ගැස්සෙන ස්නායු පාලනය කරගෙනයි සිටියේ. ඉඩකඩ සීමා වූ තැන් මට පේන්න බැහැ. ඒ වගේ තැන් මාව පිස්සු වට්ටනවා.

අපිට නගින්න ලැබුණු සෝපානයටම පුංචි බලු පැටියෙක් වඩාගත් ගැහැනු කෙනෙකුත් ගොඩවුණා. ඒ බලු පැටියාගේ කරේ අරුමෝසම් ගල් ඇල්લූ කර පටියක් දාලයි තිබුණේ. ඒ බල්ලා මග පෙන්වන බල්ලෙක්වත් වෙන්න ඇති කියලා මම හිතුවේ මුරකරුවෝ ඌ ගැන වචනයක්වත් නොකියූ නිසායි.

ආරුක්කුව තුළින් අපි උඩට යන්න පටන් ගත්තා. වංගු ගනිමින් ගමන් කරන විදුලි සෝපානයක යන්න මට ලැබුණු පළවෙනි වතාව එය වුණත්, මගේ බඩ නම් ඒ ගැන වැඩි සතුටක් දක්වූයේ නැහැ.

Scanned with CamScanner

"වැඩිහිටියෝ ආවේ නැද්ද?" මහත කාන්තාව අපෙන් ඇසුවා.

පබළු වගේ ඇස් දෙකකුත්, කෝපි කහට බැඳුණු උල් දතුත් තිබුණ එයා හැඩයක් නැති ඩෙනිම් තොප්පියක් දමාගෙන, තරමටත් වඩා ලොකු ඩෙනිම් ගවුමක් හැදගෙන සිටියා.

"එයාලා පහළ ඉන්නවා," ඇනබෙත් එයාට කිවුවා. "එයාලා උස තැන්වලට බයයි."

"අනේ පව්, අහිංසකයෝ."

බලු පැටියා ගොරවන්න ගත්තා. "අනේ, අනේ, සනී. හැසිරෙන්න ඉගෙන ගන්න," එයා ඌට කිවුවා. අයිතිකාරියගේ ඇස්වලට සමාන පෙනුමක් ගත් බලු පැටියාගේ පබළු ඇස් දෙකේ තිබුණේ බුද්ධිමත් හා නපුරු පෙනුමක්.

"සනී. ඒකද මෙයාගේ නම?" මම ඇසුවා.

"නෑ." එයාගේ උත්තරය එච්චරයි.

එයා හිනාවුණේ, එයින් හැමදේම පැහැදිලි වෙනවා වගෙයි.

ආරුක්කුව මුදුනේ වූ නිරීක්ෂණ මැදිරිය මට මතක් කළේ බුමුතුරුණු දමූ ටින් කෑන් එකක් ඇතුළතයි. පුංචි කවුළු පේළිය තුළින් බලද්දී එක් පැත්තකින් නගරයත්, අනෙක් පැත්තෙන් ගඟත් දර්ශනය වුණා. ඒ දසුන් සිත්ගන්නා සුළුයි. ඒ වුණත්, ඉඩකඩ ඇහිරුණු තැනක ඉන්නවාටත් වඩා මම අකමැති දෙයක් තියෙනවා නම් ඒ අඩි හය සියයක් ඉහළින් පිහිටි ඉඩකඩ ඇහිරුණු තැනක ඉන්න එකයි. ඉතින්, පුළුවන් තරම් ඉක්මනින් පහළට යන්නයි මට ඕනෑ වුණේ.

ඇනබෙත් දිගින් දිගටම ගොඩනැගිල්ලේ ව්‍යුහ ආධාරක ගැන, එයා මේ ආරුක්කුව හැදුවා නම් කවුළු තව ටිකක් ලොකු කරන විදිහ ගැන වගේම විනිවිද පෙනෙන පොළොවක් හදන විදිහ ගැනත් කියවන්න ගත්තා. එයා තවත් පැය ගාණක් එතැන රැඳෙන්න ඉඩ තිබුණත් මගේ වාසනාවට ගොඩනැගිලි පාලක නිවේදනය කළේ නිරීක්ෂණ මැදිරිය තව ටිකකින් වසා දමන බවයි.

ග්‍රෝවර්ව සහ ඇනබෙත්ව පිටවීම දෙසට තල්ලු කරගෙන ගිය මම එයාලාව සෝපානයට පැටෙව්වා. ඒක ඇතුළේ තවත් සංචාරකයෝ දෙන්නෙක් ඉන්නා බව මම දැක්කේ මමත් නගින්න සූදානම් වෙනකොටයි. ඉතින්, මට ඉඩක් නැහැ.

"ඊළඟ වතාවේ යමු, සර්." ගොඩනැගිලි පාලක කිවුවා.

"අපිත් බහින්නම්," ඇනබෙත් කිවුවා. "අපිත් ඔයා එක්ක ඉන්නම්."

ඒත්, එහෙම කළා නම් එතැන කලබලයක් වෙලා තවත් වෙලාව ගතවෙන්න ඉඩ තිබුණා. "නෑ, ඒකට කමක් නෑ. මම ඔයාලාව පහළදී හම්බ වෙන්නම්කෝ."

ග්‍රෝවර් සහ ඇනබෙත් කලබල වී සිටියත්, එයාලා සෝපානයේ දොර වැසෙන්න ඉඩ දුන්නා. සෝපානය බෑවුමේ නොපෙනී ගියා.

දැන්, නිරීක්ෂණ මැදිරියේ ඉතිරි මමයි, දෙමව්පියෝ එක්ක සිටි පුංචි පිරිමි ළමයෙකුයි, ගොඩනැගිලි පාලක සහ බලු පැටියා සමග සිටි මහත ගැහැනු කෙනා විතරයි.

මම අපහසුවෙන් මහත ගැහැනු කෙනාට හිනාවක් පෑවා. එයා ආපසු හිනා වෙද්දී එයාගේ දෙබල් දිව දත් අතරින් සෙලවුණා.

පොඩ්ඩක් ඉන්න.

දෙබල් දිව?

එය මම ඇත්තටම දැකපු දෙයක්ද, තීරණය කරන්න කලින් බිමට පැන්න බලු පැටියා මට බුරන්න පටන් ගත්තා.

"අනේ, අනේ, සනී." ගැහැනු කෙනා කිවුවා. "මේ වෙලාව හොඳයි වගේ පේනවද? අපි වටේට මේ මිනිස්සුත් ඉන්නවානේ."

"බව්වෙක්!" පුංචි පිරිමි ළමයා කිවුවා. "අර බලන්න, බව්වෙක්!"

එයාගේ දෙමව්පියෝ එයාව ආපසු ඇදලා ගත්තා.

මගේ දෙසට දත් විළිස්සාගෙන සිටි බලු පැටියාගේ කළු පාට තොල් අතරින් පෙණ වැගිරුණා.

"හොඳයි, පුතා," මහත ගැහැනු කෙනා සුසුමක් හෙළුවා. "ඔයා ඔච්චරටම කියනවා නම්."

මගේ බඩ ඇතුළේ අයිස් මිදෙන්න ගත්තා. "මේ... ඔයා මේ බලු පැටියාට පුතා කියලද කතා කළේ?"

"චිමෙරා, දරුවෝ," ගැහැනු කෙනා නිවැරදි කළා. "එයා චිමෙරා කෙනෙක්. වරද්ද ගන්නෙපා."

Scanned with CamScanner

එයාගේ අත්වල කොරපොතු පිරුණු කොළ පාට සම නිරාවරණය කරමින් එයා ඇඳුමේ අත් උඩට නමන්න ගත්තා. එයාට තිබුණේ බලු දත් බව එයා හිනා වෙද්දී මම දක්කා. එයාගේ ඇස්වල කළු ඉංගිරියාවන්ගේ විවර හරස් අතට පිහිටා තිබුණේ හරියට සර්පයින්ගේ වගෙයි.

මහ හඬින් බුරන්න ගත් බලු පැටියා, ඒ සෑම බිරුමක් එක්කම විතෙන් ටික ලොකු වුණා. මුලින්ම ඩොබමන් බල්ලෙක් තරමටත්, ඉන්පසු සිංහයෙක් තරමටත් ඌ ලොකු වෙද්දී, ඌගේ බිරුම් හඬවල් ගර්ජනා බවට පත්වුණා.

පුංචි පිරිමි ළමයා බෙරිහන් දුන්නා. එයාව ඇදගෙන පිටවීම දෙසට දුවගිය එයාගේ දෙමව්පියෝ, කටත් ඇරගෙන සතා දෙස බලා සිටි ගොඩනැගිලි පාලකගේ ඇගේ හැප්පුනා.

දැන්, චිමේරාගේ පිට වහලයේ වදින තරමට ඌ උස ගිහින්. ලේ කැටි ගැහුණු කේසර සහිත සිංහ ඔළුවකුත්, යෝධ එළු කුරත් තිබූ ඌට වලිගයක් වෙනුවට අඩි දහයක් විතර දිග සර්පයෙක් වැඩෙමින් තිබුණා. ඌගේ කරේ වූ අරුමෝසම් ගල් ඇල්లූ කර පටියේ එල්ලුණු පතුර පිඟානක් තරම් ලොකු වී තිබුණු නිසා එහි ලියා තිබූ දේ කියවා ගන්න පහසු වුණා: වියරු චිමේරා, ගිනි පිඹින සුළුයි, විෂ සහිතයි - හමු වුණොත්, කරුණාකර ටාටරස් 954 අමතන්න.

මම තවමත් කඩුව එළියට නොගත් බව මට මතක් වුණා. මගේ අත් හිරිවැටිලා. චිමේරාගේ ලේ තැවරුණු කට තිබුණේ අඩි දහයක් තරම් දුරකින්. මම සෙලවුණු හැටියේම ඒ සතා මට පහර දෙන්න පනින බව මම තේරුම් ගත්තා.

සර්ප ගැහැනිය හිනාවක් වගේ සූ හඬක් පිටකළා. "මෙක ගොරවයක්, පර්සි ජැක්සන්. වීරයෙක් එක්ක මගේ පැටියෙක්ව පරීක්ෂා කරන්න සියුස් හාමු මට ඉඩ දෙන්නේ කලාතුරකින්. මොකද, මම තමයි මෘගයින්ගේ අම්මා, බිහිසුණු එචිඩ්නා!"

මම එයා දිහා බලා සිටියා. ඒ වෙලාවේ මට කියන්න මතක් වුණේ එක දෙයයි: "ඒ කබැල්ලෑවෝ ජාතියකගේ නමක් නේද?"

එයාගේ උරග මුහුණ වියරුවෙන් කොළ හා දුඹුරු පාටට හැරෙද්දී එයා උඩු බිරුවා. "මිනිස්සු එහෙම කියන එක මට පේන්න බැහැ! ඔස්ට්‍රේලියාවත් මට පේන්න බැහැ! ඒ කෝලං සතාට මගේ නම

මොකට තිබ්බද මන්දා. අන්න ඒකට, පර්සි ජැක්සන්, මගේ පුතා නුඹව විනාශ කරාවි!"

සිංහ දත්වලින් දත්මිටි කමින් චිමේරා මගේ පැත්තට කඩා පැන්නා. පැත්තකට පැන ඌගේ සපාකෑම මග අරවාගන්න මට පුළුවන් වුණා.

ඒත්, මම පැන තිබුණේ කෑගසමින්, හදිසි පිටවීමේ දොර ඇරගන්නට උත්සාහ කරන ගොඩනැගිලි පාලක සහ අනෙක් පවුලේ අය සිටි තැනටයි.

එයාලාට කරදරයක් වෙන්න ඉඩ දෙන්න මට බැහැ. මගේ කඩුව එළියට ගත් මම මැදිරියේ අනෙක් පැත්තට දුව ගොස් කෑගැසුවා. "ඒයි, බලු කුක්කා!"

මම හිතුවේවත් නැති වේගයකින් චිමේරා ආපසු හැරුණා.

මම, මගේ කඩුව ඔසවන්නත් කලින් කට ඇරිය සතා මගේ දෙසට ගිනිදැල් කඳක් පිටකළා.

පිපුරුම සිදු වෙද්දිම මම බිමට නැමුණා. ගිනි ඇවිළෙන්න ගත් බුමුතුරුණු වලින් පිඹවූ රස්නෙයට මගේ ඇහිබැම් පවා පිලිස්සෙන්න ඉඩ තිබුණා.

මීට මොහොතකට කලින් මම සිටගෙන සිටි තැන බිත්තියේ දැන් දුම් දමමින් ලෝහ උණු වී වැගිරෙන හිලක් සෑදී තිබුණා.

නියමයි, මම හිතුවා. අපි මේ දූත් ජාතික ස්මාරකයකින් ඇවිළෙන පන්දමක් හැදුවා.

දිලිසෙන ලෝකඩ කඩුවක් බවට පත්වී මගේ අතේ තිබූ රිප්ටයිඩ්ගෙන් මම චිමේරාගේ බෙල්ලට පහරක් එල්ල කළේ ඌ ආපසු හැරෙන විටමයි.

මම කළ මාරක අත්වැරැද්ද වුණේ එයයි. බලු කර පටියේ වැදුණු තලයෙන් ගිනි පුපුරු විසිවුණත්, සතාට කිසිම හානියක් කරන්න ඒ පහරට බැරි වුණා. මම, මගේ සමබරතාවය නැවත ලබා ගන්න උත්සාහ කළා, ඒත්, ගිනි පිටකරන සිංහ කටින් ආරක්ෂා වෙන්න උත්සාහ කරන අතරේ දී මට මුළුමනින්ම අමතක වී තිබුණු සර්ප වලිගය මගේ බත් කෙණ්ඩයට ඌගේ දළ කිඳා බැස්සුවා.

Scanned with CamScanner

මගේ මුළු කකුලම ගිනි ගන්නවා වගෙයි මට දැනුණේ. චිමේරාගේ කටට රිජ්ටයිඩ් දමා අනින්නට මම උත්සාහ කළත්, මගේ වළලුකරේ එතුණු සර්ප වලිගය මගේ සමබරතාවය නැති කරමින් මාව බිමට ඇද දමද්දී, මගේ අතින් ගිලිහුණු කඩුව කැරකී ගොස් ආරුක්කුවේ හිල තුළින් මිසිසිපි ගඟ දෙසට විසි වුණා.

ආපසු දෙපයින් සිට ගන්න මට පුළුවන් වුණත්, මම දැනටමත් පරාද බව මම දැන සිටියා. මරණීය විෂ මගේ පපුව දෙසට ඇදී යනවා මට දැනුණා. ඇනාක්ලූස්මස් හැම වෙලාවේම ආපසු මගේ සාක්කුවෙන් මතු වේවි, කයිරොන් කියූ කතාව මට සිහි වුණා. ඒත්, තවමත් මගේ සාක්කුව හිස්. සමහරවිට, ඒක ගොඩක් ඈතට වැටෙන්න ඇති. සමහරවිට, ඒක ආපසු එන්නේ පෑනක් ලෙස තියෙද්දී විතරයි වෙන්න ඇති. මම ඒ ගැන දැන සිටියේ නැහැ. ඒ වගේම, ඒ ගැන සොයාගන්න තරම් කාලයක් මට ජීවත් වෙන්න ඉඩකුත් නැහැ.

බිත්තියේ වූ හිල දෙසට මම පසුබැස්සා. ගොරවමින් මගේ දෙසට දුව ආ චිමේරාගේ තොල් අතරින් දුම් පිටවුණා. සර්ප ගැහැනිය, එචිඩ්නා කෙකර ගාන්න වුණා. "එයාලා ඉස්සර වගේ වීරයන්ව හදන්නේ නැහැ වගෙයි, නේද, පුතේ?"

රාක්ෂයා ගොරවන්න වුණා. පැරදී සිටි මාව ඉවරයක් කරන්න ඌට හදිස්සියක් තිබුණේ නැහැ වගෙයි.

ගොඩනැගිලි පාලක සහ අනෙක් පවුල සිටි දෙසට මම ක්ෂණික බැල්මක් හෙළුවා. ඒ පුංචි පිරිමි ළමයා තාත්තාගේ කකුල පිටුපස හැංගිලා. මම මේ අයව ආරක්ෂා කළ යුතු වුණා. මට නිකන්ම මැරෙන්න බැහැ. මම හිතන්න උත්සාහ කළා, ඒත් මගේ මුළු ඇඟම ගිනි ගන්නවා වගෙයි. මගේ ඔළුවත් කැරකුණා. මට කඩුවකුත් නැහැ. සද්දන්ත ගිනි පිඹින රාක්ෂයෙකුට හා ඌගේ අම්මාට මම මුහුණ දිය යුතුව තිබුණා. මම හොඳටෝම බය වුණා.

වෙන යන්න තැනක් නොතිබුණ නිසා මම හිලේ කෙළවරට අඩිය තැබුවා. පහළින්, ගොඩාක් පහළින් ගඟ දිලිසෙමින් ගලා බැස්සා.

මම මැරුණොත්, මේ රාක්ෂයෝ යන්න යාවිද? මේ මිනිස්සුන්ට පාඩුවේ ඉන්න ඉඩ දේවිද?

"තුඹ පොසෙයිඩන්ගේ පුතෙක් නම්," එචිඩ්නා පිම්බා, "තුඹ වතුරට බය වෙන්නේ නැහැ. පැනපන්, පර්සි ජැක්සන්. වතුරෙන් තුඹට

හරදරයක් වෙන්නේ නැහැ කියලා පෙන්වාපන්. පැනලා තුඹේ කඩුව හොයාගනින්. තුඹේ ලේ උරුමය ඔප්පු කරපන්."

අන්න හරි, මම සිතුවා. තට්ටු දෙකක උසකින් වතුරට පැනීමත් ගල් කාර තට්ටුවක් උඩට පනිනවා වගේයි කියලා මම කොහේදිදෝ කියවා තිබුණා. මෙතැනින් පැන්නොත් මගේ කුඩුවත් හොයාගන්න බැරිවෙයි.

තවත් ගිනිදලු ප්‍රහාරයකට සූදානම් වෙමින් චිමේරාගේ කට රතු පාටින් දිලිසෙන්න ගත්තා.

"තුඹට කිසිම ශ්‍රද්ධාවක් නැහැ," එචිඩ්නා මට කිවුවා. "තුඹ දෙවිවරුන්ව විශ්වාස කරන්නේ නැහැ. තුඹට දොස් කියන්න මට බැහැ. පුංචි බයගුල්ලෝ. තුඹ දත් මැරෙන එක හොඳයි. දෙවිවරු ද්‍රෝහී ජාතියක්. තුඹේ හදවතට දත් විෂ ගිහින් ඉවරයි."

එයා කිවුවා හරිඃ මම මැරෙන්නයි යන්නේ. මගේ හුස්ම ටිකෙන් ටික අඩු වී යනවා මට දැනුණා. මාව බේරා ගන්න කාටවත්ම බැහැ, අඩු තරමේ දෙවියන්ටවත් බැහැ.

පිටුපසට ගිය මම පහළින් ගලන වතුර දෙස බැලුවා. මම බබෙක් කාලේ මගේ තාත්තාගේ හිනාවේ උණුසුම් දීප්තිය මගේ මතකයට ආවා. එයාට කොහොම හරි මාව දකින්න ලැබිලා ඇති. මම තොටිල්ලේ සිටි කාලේ මාව බලන්න එයා එන්න ඇති.

අපි කොඩිය ඇල්ලූ රැයේ පොසෙයිඩන් මම එයාගේ පුතෙක් බව ඔප්පු කළ මොහොතේ මගේ ඔළුවට උඩින් සුළි නංවමින් මතු වූ කොළ පාට ත්‍රිශූලය මට මතක් වුණා.

ඒත්, මෙ මුහුද නේවෙයි. මේ තියෙන්නේ ඇමරිකාවේ හරි මැද පිහිටා තියෙන මිසිසිපි ගඟයි. ඉතින්, සමුද්‍ර දෙවියෝ කොහොමද මෙතැන ඉන්නේ?.

"මැරියං, ශ්‍රද්ධාවක් නැති එකා," එචිඩ්නා රළු හඬින් කියද්දී, චිමෙරා තවත් ගිනිදළු කඳක් මගේ මුහුණට පිම්බා.

"තාත්තේ, මට උදවු කරන්න," මම යාඥා කළා.

ආපසු හැරුණු මම පහළට පැන්නා. මගේ ඇඳුම් ගිනිගෙන දවෙද්දී, මාරක විෂ මගේ නහර පුරා ගලද්දී, මාව වේගයෙන් වතුර දෙසට ඇද වැටුණා.

14

මම ප්‍රසිද්ධ පලා යන්නෙක් බවට පත් වුණා

පහළට යන අතරේදී මම, මගේ මරණය සමග එකඟතාවයකට ආ බවත්, මම මාරයාගේ මුහුණටම සිනාසුණ බවත් වගේම, මා තුළ වූ තව තව හැඟීරු දේවල් ගොඩකුත් මම හෙළිදරව් කරගත් බවත් කියාලාට කියන්න මම කැමතියි.

ඒත්, ඇත්තම කියනවා නම්? මගේ එකම සිතුවිල්ල වුණේ ආ... ඒ... ඒ...!

වුත් රටයක වේගයෙන් ගඟ මගේ දෙසට ආවා. මගේ පෙණහලු තුළ වූ වාතය පවා පුළුග සමග ඇදී ගියා. පල්ලිවල උස් කොත් මුදුන්, උස් මන්දිර සහ පාලම් මගේ දර්ශන පථයටත්, ඉන් පිටතටත් පෙරළුණා.

ඊට පස්සේ ජබෝස්!

පෙණ බුබුළුවලින් මාව වැසී ගියා. කළල් වතුර තුළට මාව කිඳා බසිද්දී, අපි සිය ගණනක් හැඹිරූ මඩේ සිර වී මාව සදාකාලයටම අතුරුදහන් වන බව මට හොඳටම සහතික වුණා.

ඒත්, මාව වතුරේ ගැවෙද්දී මට වේදනාවක් වුණේ නැහැ. දත් මගේ වැටීමත් මන්දගාමී වෙලා. පෙණ බුබුළු මගේ ඇඟිලි අතරින් ඉහළට ගලා ගියා. හඬක් නොනැගෙන ලෙස මාව ගං පතුලේ තැන්පත් වෙද්දී, ප්‍රමාණයෙන් මගේ මාත්පා තරම් ලොකු අඳුරුවෙක් අන්ධකාරය

දෙසට පිහිනා ගියා. රොත් මට සහ අප්පිරියා සහගත තුණ්ඩු - බිර බෝතල්, පරණ සපත්තු, ප්ලාස්ටික් මලු මගේ වටේ නැරකෙමින් තිබුණා.

එතැනදී, මට දේවල් කිහිපයක් අවබෝධ වුණා. මුල්ම එක, මාව රොටියක් වගේ සමතලා වෙලා තිබුණේ නැහැ. උඳුනක දමූ මස් කුට්ටියක් වගේ පිච්චිලා තිබුණෙත් නැහැ. අඩු තරමේ, මගේ නගර තුළ තැකෙරෙමින් තිබූ විමෙරාගේ විරෙත් කවුරුවත් මට දැනුණේ නැහැ. මම පණපිටින්. තියෙයි.

දෙවැනි එක මාව තෙමීලා නැහැ. මං අතක් කළේ, වතුරේ සීතල මට දැනුණා. මගේ ඇඳුම්වල ඇලිලෙමින් තිබූ ගිනිදලු තිවුණු තැන් පවා මට බලාගත හැකි වුණා. ඒත් මම, මගේ කමිසය අල්ලා බලද්දී එය මුළුමනින්ම වියළිවටයි මට දැනුණේ.

මගේ වටා පාවී ගිය තුණ්ඩු අතරේ තිබුණු පරණ ගිනි දල්වනයක් මම ඩැහැගත්තා.

ඒක නම් වෙන්න බැරි දෙයක්, මගේ හිත කිව්වා.

මම ගිනි දල්වනය දල්වද්දී එයින් ගිනි පුපුරු වීම වුණා. හරියටම පීසිසපී ගං පතුලේදී, එයින් පුංචි ගිනි දැල්ලක් මතුවුණා.

මම තෙතබිත් වූ ආහාර දවටනයක් දිය පාරෙන් අල්ලාගනිද්දිම වාගේ එයත් වියළුණා. කිසිම අපහසුවක් නැතිව එයටත් ගිනි දල්වන්න මට පුළුවන් වුණා. මගේ අතින් එය අත හැරෙද්දිම ගින්දර නිවී ගිහින් දවටනය ආපසු තෙතබරිත වුණා. හරිම අමුතුයි.

ඒත්, සිදු වූ අමුතුම දේ මම තේරුම් ගත්තේ අන්තිමටයි. මම හුස්ම ගත්තා. වතුර යට ඉඳගෙන, සාමාන්‍ය ලෙසටම මම හුස්ම ගනිමින් සිටියා.

කලවා උසට තිබූ මඩේ මම සිටගත්තා. මගේ කකුල් ගැහෙනවා වගෙයි දැනුණේ. මගේ අත් දෙකත් වෙවුලුවා. හරි නම්, මේ වෙද්දී මම මැරිලා ඉන්න එපැයි. ඒත්, එහෙම නොවීම හරියට... ප්‍රාතිහාර්යයක් වගෙයි.

මම ගැහැනු කෙනෙකුගේ කටහඬක් සිහින් මවාගත්තා. ඒ හඬ ටිකක් මගේ අම්මාගේ කටහඬ වගෙයි. ඒයි, මොකද ඉතින් කියන්නේ?

"ම... ස්තුතියි." වතුර යටදී මගේ කටහඬ පටිගත කළ එකක් වගෙයි. "ස්තුතියි... තාත්තේ."

ප්‍රතිචාරයක් නැහැ. තිබුණේ ගඟ පහළට ගසාගෙන යන කුණුත්, එහෙ-මෙහෙ පිහිනමින් සිටි අඟුලු මාළුවාත්, සෑම දෙයක්ම රන් පාටට හරවමින් වතුර මතුපිටට වැටී දිලිසුන රාස්සිගේ අව්වත් විතරයි.

පොසෙයිඩන් මාව බේරා ගත්තේ ඇයි? ඒ ගැන හිතන්න හිතන්න මට, මං ගැන දැනුන ලැජ්ජාවත් වැඩි වුණා. මීට කලිනුත් කීප වතාවක්ම මම වාසනාවන්ත වෙලා තිබුණා තමයි. ඒත්, චිමෙරා වගේ රාක්ෂයෙක් ළඟදී මට කිසිම අවස්ථාවක් තිබුණේ නැහැ. සමහරවිට, ආරුක්කුවේ සිටි අනෙක් අසරණ මිනිස්සු පිච්චෙන්න ඇති. මට එයාලාව ආරක්ෂා කරන්න බැරි වුණා. මගේ කිසිම වීරකමක් නැහැ. මමත් මේ අඟුලුවා එක්ක ගං පතුලේම නතර වුණා නම් හොඳයි වගේ.

පම්ප්-පම්ප්-පම්ප්. රොත් මඩ කලතමින් බෝට්ටුවක හබල් රෝදය මට ඉහළින් කැරකුණා.

අන්න, අඩි පහකට නුදුරින්, මඩින් උඩට මතු වෙලා මගේ කඩුවේ ලෝකඩ මිට දිලිසෙමින් තිබුණා.

මට අර ගැහැනු කටහඬ ආපසු ඇහුණා: පර්සි, ඔය කඩුව ගන්න. ඔයාගේ තාත්තා ඔයා ගැන විශ්වාස කරනවා. මේ වතාවේ නම්, ඒ හඬ මගේ ඔළුව තුළ තියෙන්නක් නෙවෙයි කියලා මම තේරුම් ගත්තා. ඒක මම හිතෙන් මවාගෙන නැහැ. එයාගේ වචන වතුර දිගේ රැළිති නංවමින් සෑම පැත්තකින්ම එනවා වගෙයි දැනුණේ.

"ඔයා කොහෙද?" මම හඬ නගා ඇසුවා.

ඉන්පසු, අඳුර අතරින් මට එයාව දකින්න ලැබුණා - දිය පාරේ හොල්මනක් වගේ, වතුරේ පාටම ගත් ගැහැනු කෙනෙක් කඩුවට ඉහළින් පාවෙමින් සිටියා. එයාට රැළි නැගෙන දිග කොණ්ඩයක් තිබුණා. යාන්තමින් දිශ්‍යමාන වුණ එයාගේ ඇස් දෙකත් මගේ ඇස් වගේම කොළ පාට වුණා.

මගේ උගුරේ ගුළියක් සිර වෙනවා වගේ දැනුණා. "අම්මේ?" මම එයාට කතා කළා.

නැහැ, දරුවෝ, මම පණිවුඩකාරියක් විතරයි. ඒ වුණාට, ඔයාගේ අම්මාගේ ඉරණම ඔයා හිතන තරම් බලාපොරොත්තු රහිත නැහැ. ඔයා සැන්ටා මොනිකා වෙරළට යන්න ඕනෑ.

"මොකක්?"

ඒක ඔයාගේ තාත්තාගේ කැමැත්ත. පාතාල ලෝකයට බහින්න කලින් ඔයා සැන්ටා මොනිකාවලට යන්නම ඕනෑ. අනේ, පර්සි, මට ගොඩක් වෙලා ඉන්න බැහැ. මට මෙතැන ඉන්න බැරි තරමටම මේ වතුර අපිරිසිදුයි.

"ඒත්..." මේ ගැහැනු කෙනා මගේ අම්මා හෝ අඩු තරමින්, අම්මාගේ දර්ශනයක් කියලා මට විශ්වාස වුණා. "ඔයා කොහොමද-"

අහන්න දේවල් ගොඩක් තිබුණත්, ඒ වචන මගේ උගුරේ සිර වුණා.

"මට නැවතිලා ඉන්න බැහැ, වීරයෝ," ගැහැනු කෙනා කිවුවා. එයා අත දිගු කරද්දී මට දැනුණේ දිය පාරක් මගේ මුහුණ අත ගෑවා වගෙයි. ඔයා සැන්ටා මොනිකාවලට යන්නම ඕනෑ! ඒ වගේම, පර්සි, තෑගි ගැන විශ්වාස කරන්න එපා...

එයාගේ කටහඬ මැකී ගියා.

"තෑගි?" මම ඇසුවා. "මොන තෑගිද? පොඩ්ඩක් ඉන්න!"

එයා තවත් වතාවක් කතා කරන්න උත්සාහ කළත්, එයාගේ හඬ පිටවුණේ නැහැ. එයාගේ රූපය දිය වී ගියා. ඒ මගේ අම්මා නම්, මට තවත් වතාවක් එයාව අහිමි වුණා.

මට දැනුණේ මාව ගිලිලා මැරෙන්න යනවා වගෙයි. ඒත්, ප්‍රශ්නයකට තිබුණේ; ගිලුණට මාව මැරෙන්නේ නැතේ.

ඔයාගේ තාත්තා ඔයා ගැන විශ්වාස කරනවා, එයා කිවුවා.

එයා මට වීරයා කියලත් කතා කළා. හැබැයි... එයා ඒක නම් කිවුවේ අඟුලුවාටද දන්නෙත් නැහැ.

මඩේ එරෙමින් රිප්ටයිඩ් දෙසට ගිය මම එය මිටෙන් අල්ලා ඇදගත්තා. සමහරවිට, චිමෙරා, ඌගේ තඩි, සර්ප අම්මා එක්ක මාව ඉවරයක් කරන්න බලාගෙන ඇති. අඩු තරමේ, පොලීසිය ඇවිත් ආරුක්කුවේ හිලක් ඇති කළ කෙනාව සොයනවාත් ඇති. එයාලා මාව සොයාගත්තොත්, මගෙන් අහන්න ප්‍රශ්න ගොඩාක් එයාලාට තියේවි.

Scanned with CamScanner

කවුළුවේ පියන දමූ මම, බෝල්පොයින්ට් පෑන සාක්කුවට ඔබාගත්තා. "ස්තූතියි, තාත්තේ." මම ආයෙමත් අඳුරු වතුරට කිවුවා.

ඉන්පසු, මම මඩ අතරින් පිහිනාගෙන වතුර මතුපිටට ආවා.

මම ගොඩට ඇවිත් තිබුණේ පාවෙමින් තිබූ කුණු ගොඩක් මැදිනුයි.

ඊට වීදියකට එහායින්, ශාන්ත ලුයිස්වල තිබූ සෑම හදිසි සේවා වාහනයක්ම ආරුක්කුව වට කරගෙන තිබුණා. එය වටේ බලා සිටි සෙනඟ දකිද්දී මට මතක් වුණේ අලුත් අවුරුදු සැදෑවේ ටයිම්ස් චතුරශ්‍රයයි.

"අම්මේ! අර අයියා වතුරෙන් ගොඩට ආවා." පුංචි ගැහැනු ළමයෙක් කිවුවා.

"ඒක හොඳයි, පැටියෝ." එයාගේ අම්මා ගිලන් රථ දෙස බැලීමට බෙල්ල දිගු කරමින් කිවුවා.

"ඒත්, එයාව තෙමිලා නැනේ!"

"ඒක හොඳයි, පැටියෝ."

ප්‍රවෘත්ති නිවේදිකාවක් කැමරාවට කතා කරමින් සිටියා: ''මෙය බොහෝ දුරට ත්‍රස්තවාදී ප්‍රහාරයක් නොවෙන්න පුළුවන්. ඒත්, මේ පිළිබඳව සිදුවන පරීක්ෂණ තවමත් ඇත්තේ මුල් අදියරවලයි. ඔබට දකගත හැකි ආකාරයටම, සිදු වී ඇති හානිය බරපතල්යි. ආරුක්කුව මුදුනේ සිට යම් අයෙක් පහළට වැටෙනවා දුටු බව මේ අනතුරින් දිවි බේරාගත් කිහිප දෙනෙකු සාක්ෂි දී තිබුණා. ඔවුන්ගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමටයි අප දැන් සූදානම් වෙන්නේ."

දිවි බේරාගත් අය. මගේ හිතට අස්වැසිල්ලක් දැනුණා. සමහරවිට, ගොඩනැගිලි පාලකයි, අනෙක් පවුලේ අයටයි කරදරයක් නැතිව පහළට එන්න ලැබෙන්න ඇති.

ඇනබෙත්, ග්‍රෝවර් දෙන්නාත් හොඳින් ඇති කියලා මම බලාපොරොත්තු වුණා.

සෙනඟ අතරින් ඉදිරියට යන්න මම උත්සාහ කළේ පොලිස් වැටෙන් එහා සිදුවන දේ බලාගන්නයි.

"...ගැටවර වියේ තරුණයෙක්," තවත් වාර්තාකරුවෙක් කියමින් සිටියා. "නිරීක්ෂණ මැදිරියේ සිටි මේ තරුණයා වියරු ලෙස

හැසිරෙමින්, යම් ආකාරයකින් මේ පුදුමාකාර පිපුරුම සිදුකළ ආකාරය ආරක්ෂක කැමරාවල සටහන් වී ඇති බවත් චැනල් ෆයිව් හට දැන ගැනීමට ලැබුණා. මෙය විශ්වාස කරන්න අපහසුයි, ජෝන්. නමුත් අපිට අසන්නට ලැබෙන්නේ එයයි. ජීවිත හානි සිදුවූ බවට මෙතෙක් තහවුරු වී නැහැ..."

ඔළුව නමාගෙන මම ඉක්මනින් පිටුපසට ආවා. අනෙක් පැත්තට යන්නට පොලිස් වැට වටා ලොකු රවුමක් යන්න මට සිද්ධ වුණා. නිල ඇඳුමින් සැරසුණු නිලධාරීයෝ සහ ප්‍රවෘත්ති වාර්තාකරුවෝ සෑම තැනම පිරිලා.

ඇනබෙත්ව සහ ග්‍රෝවර් සොයා ගැනීමේ අදහස අත්හැර දාන්න මම සූදානම් වෙද්දිම වාගේ, සුපුරුදු එළු කටහඬ මට ඇහුණා, "පර්ර්-සි!"

මම හැරෙද්දිම ග්‍රෝවර් මාව බදාගත්තා. "ඔයා හේඩීස් ළඟට අමාරු පාරෙන් ගියාවත්ද කියලා අපි හිතුවා!"

එයාට පිටුපසින් සිටි ඇනබෙත් තරහා මූහුණක් පෙන්වන්න උත්සාහ කළත්, මාව දකින්න ලැබීමෙන් එයාට පවා සහනයක් ලැබුණු බව මට තේරුණා. "ඔයාව විනාඩි පහකටවත් තනියම දාලා යන්න බැහැ නේ! මොකක්ද සිද්ධ වුණේ?"

"මාව පහළට වැටුණා."

"පර්සි! අඩි හයසිය තිහක් උඩ ඉඳන්?"

"ඉඩ දෙන්න!" අපිට පිටුපසින් පොලිස් නිලධාරියෙක් කෑගැසුවා. දෙපසට වූ සෙනඟ මැදින් ගිලන් මැස්සක දමූ ගැහැනු කෙනෙක්ව රැගත් අනුපූරක දොස්තරලා දෙන්නෙක් කඩිමුඩියේ ආවා. ඒ නිරීක්ෂණ මැදිරියේ සිටි පුංචි පිරිමි ළමයාගේ අම්මා බව මම ඉක්මනින්ම හඳුනා ගත්තා. "එතැන යෝධ බල්ලෙක් හිටියා, ගින්දර පිඹින බලු පැටියෙක් -" එයා කියෙව්වා.

"හොඳයි, මැඩම්." දොස්තර කෙනෙක් කිවුවා. "සන්සුන් වෙන්න. ඔයාගේ පවුලේ අය හොඳින් ඉන්නවා. ඔයාගේ බෙහෙත් වැඩ කරන්න පටන්ගෙන තියෙන්නේ."

"මට පිස්සු නෑ! අර කොල්ලා හිලෙන් එළියට පැන්නාම රාක්ෂයෝ අතුරුදහන් වුණා." එතකොටම, එයා මාව දැක්කා. "අර ඉන්නේ එයා! එයා තමයි ඒ කොල්ලා!"

ඉක්මනින් ආපසු හැරුණු මම ඇනබෙත්ව සහ ග්‍රෝවර්ව මගේ පිටුපසින් ඇදගෙන ගිහින් සෙනග අතරට එකතු වුණා.

"මොනවද මේ වෙන්නේ?" ඇනබෙත් ප්‍රශ්න කළා. "එයා ඒ කියෙව්වේ සෝපානේ හිටිය බලු පැටියා ගැනද?"

චිමෙරා ගැනත්, එචිඩ්නා ගැනත්, මගේ ජල කරණම ගැනත් වගේම වතුර යට සිටි ගැහැනු කෙනාගේ පණිවුඩය ගැනත් සම්පූර්ණ කතාවම මම එයාලාට කිවුවා.

"වෝව්," ග්‍රෝවර් කිවුවා. "ඔයාව සැන්ටා මොනිකාවලට එක්ක යන්න අපිට සිද්ධ වෙනවා! ඔයාගේ තාත්තා කරපු කැඳවීමක් අහක දාන්න ඔයාට බැහැ නේ."

ඇනබෙත් එයට ප්‍රතිචාර දක්වන්න කලින්, අපි පසු කළ වාර්තාකරු කියමින් සිටි ප්‍රවෘත්තිය ඇසෙද්දී මාව හිටි තැනම ගල් ගැහුණා. "පර්සි ජැක්සන්. ඔබ හරි, ඩෑන්. මීට දින තුනකට කලින් නිව් ජර්සිවල සිදු වූ බස් රථ අනතුර සම්බන්ධයෙන් බලධාරීන්ට උවමනා කර තිබුණු තරුණයාගේ හැඩහුරුකම්වලට මේ පිපිරීම සිදුකළා යැයි සැක කෙරෙන තරුණයාගේ හැඩරුව ගැළපෙන බව චැනල් ටිවෙල්ව්හට දැනගැනීමට ලැබුණා. මේ තරුණයා බටහිරට ගමන් කරන බවයි විශ්වාස කරන්නේ. නිවසේ සිට නරඹන ඔබ සඳහා, මෙහි දැක්වෙන්නේ පර්සි ජැක්සන්ගේ ඡායාරූපයක්."

ප්‍රවෘත්ති වෑනය ළඟින් නැමීගෙන ගිය අපි පටු පාරකට පැන ගත්තා.

"මුල් දේ මුලින්ම," මම ග්‍රෝවර්ට කිවුවා. ''අපි මෙහෙන් පැනගන්න ඕනෑ!"

කොහොම හරි, කාටවත් හසු නොවී ආපසු දුම්රියපොළට යන්න අපිට හැකි වුණා. දුම්රිය ඩෙන්වර් බලා පිටත් වීමට මොහොතකට කලින් අපි එයට ගොඩවුණා. කළුවර වෙමින් තිබූ ශාන්ත ලුයිස් ක්ෂිතිජයේ තවමත් පොලිස් එළි දැල්වෙද්දී, දුම්රිය බටහිර බලා ඇදී ගියා.

15

අපිට දෙවියෙක්ගෙන් චීස් බර්ගර් සංග්‍රහයක් ලැබුණා

උත්තරායනයට දවස් හතකට කලින්, ජූනි දහ හතර වෙනිදා දහවල වෙද්දී අපේ දුම්රිය ඩෙන්වර් වෙත ළඟාවුණා. ගෙවුණු රෑ දුම්රිය ආපනශාලාවෙන් කෑම ගත්තාට පසු අපිට කෑම ගන්න ලැබුණේ නැහැ. අර්ධ-ලෝහිත කන්දෙන් පිට වුණාට පස්සෙම අපිට නාන්න ලැබුණෙත් නැහැ. ඒක නම් අපිව දකින ඕනෑම කෙනෙකුට පැහැදිලිව පේනවා ඇති කියලා මම හිතුවා.

"අපි කයිරොන්ට කතා කරන්න බලමු," ඇනබෙත් කිවුවා. "ගඟේ හිටිය හොල්මන ඔයාට කිව්ව දේවල් කයිරොන්ට කියන්න ඕනෑ."

"අපිට ෆෝන් පාවිච්චි කරන්න බැහැ නේ?"

"ෆෝන්වලින් කතා කරමු කියලා මම කිවුවේ නැහැනේ."

අපි පැය බාගයක් විතර නගරයේ කඩමණ්ඩි ගාණේ ඇවිද්දත්, ඇනබෙත් හොයන්නේ මොනවාද කියලා මම නම් හරියටම දැන සිටියේ නැහැ. ශාන්ත ලුයිස්වල තෙතබර කාලගුණයෙන් පසු, මෙහි තිබුණු වියළි, උණුසුම් කාලගුණය අරුමයක් වගෙයි දැනුණේ. අපි හැරෙන සෑම පැත්තකින්ම ගල් කඳු මගේ දිහා බලා සිටියේ, නගරයට කඩා වදින්න සූදානමින් ඇති වඩදිය රැල්ලක් වගෙයි.

අන්තිමේදී, අපිට හිස්, ස්වයං-සේවා වාහන සේදුම්පොළක් සොයාගන්න ලැබුණා. එහි ප්‍රධාන පාරෙන් ඈතින්ම තිබූ කුටියට අපි ගියේ මුර සංචාරයේ යෙදෙන පොලිස් වාහන ගැනත් විමසිලිමත් වෙමිනුයි. වාහනයක් නැති ගැටවරයෝ තුන් දෙනෙක් වාහන සේදුම්පොළක කැරකෙනවා පොලිසියෙන් දක්කෝතින්, අපි ඉන්නේ හොඳකට නෙවෙයි කියලා ඉක්මනින්ම තේරුම් ගනීවි.

"ඇත්තටම, අපි මොනවද මෙතැන කරන්නේ?" මම ඇසුවේ, ග්‍රෝවර් වතුර විදිනය අතට ගනිද්දියි.

"ඒකට සත හැත්තෑ පහක් ඕනෑ," එයා නාහෙන් අඬන්න ගත්තා. "මගේ ළඟ තියෙන්නේ කාලේ දෙකක් විතරයි නේ. ඇනබෙත්?"

"මගේ දිහා බලන්න එපා," එයා කිව්වා. "කෑම ගන්න ගිහිල්ලා මාව සතේටම හිඳුණා."

මගේ සාක්කුවේ තිබුණු අන්තිම කාසි ටික අතට ගත් මම එයින් කාලේ කාසියක් ග්‍රෝවර්ට දුන්නා, එතකොට මට ඉතිරි වුණේ නිකල් කාසි දෙකකුත්, මෙඩූසාගේ තැනින් ගත් ඩ්‍රච්මාවකුත් විතරයි.

"නියමයි," ග්‍රෝවර් කිව්වා. "ඇත්තටම, අපිට මේක වතුර විදින බෝතලයකිනුත් කරන්න පුළුවන්. හැබැයි, එතකොට සම්බන්ධතාවය ඒ තරම් හොඳ වෙන්නේ නැහැ. එහෙම කරද්දී වතුර විදලම මගේ අත රිදෙන්න ගන්නවා."

"ඔයා මොනවා ගැනද කියවන්නේ?"

යන්ත්‍රයට කාසි කැවූ එයා 'සිහින් මීදුම' බොත්තම එබුවා. "අයි- මැසේජ්."

"ඉන්ස්ටන්ට් මැසේජ් ද?"

"අයිරිස් මැසේජ්," ඇනබෙත් නිවැරදි කළා. "දේදුන්නට අධිපති අයිරිස් දේවතාවිය දෙවිවරු වෙනුවෙන් පණිවුඩ ගෙනියනවා. ඉල්ලීමක් කරන විදිහ ඔයා දන්නවා නම්, එයා කාර්යබහුලත් නැත්නම්, අයිරිස් අර්ධ-ලෝහිතයෝ වෙනුවෙනුත් ඒක කරනවා."

"ඔයා වතුර විදින එකකින් දේවතාවියෙක් කැඳවන්නද හදන්නේ?"

ග්‍රෝවර් වතුර විදිනයේ තොසලය වාතයට අල්ලද්දී එයින් ඝන, සුදු මීදුමක් ලෙසට වතුර විදින්න ගත්තා.

"නැත්නම්, මීට වඩා ලේසියෙන් දේදුන්නක් මවන ක්‍රමයක් ඔයා දන්නවාද?"

කිව්වත් වගේම, සැඳෑ එළිය වාෂ්පය හරහා පෙරී ඇවිත් දේදුනු පාටවලට වෙන්වුණා.

ඇනබෙත්, එයාගේ අත මට දිගු කළා. "ඩ්‍රච්මා එක දෙන්නකෝ."

මම ඒක එයාගේ අතින් තැබුවා.

එයා ඒ කාසිය ඔළුවට උඩින් එසෙව්වා. "අහෝ දේවතාවියනි, අපගේ පූජාව පිළිගන්න."

එයා ඩ්‍රච්මාව දේදුන්නට විසි කළා. එය රන්වන් පාටින් දිලිසී අතුරුදහන් වුණා.

"අර්ධ-ලෝහිත කඳවුර," ඇනබෙත් ඉල්ලුවා.

මොහොතක් ගතවන තුරු කිසිවක් සිදුවුණේ නැහැ.

ඉන්පසු, මීදුම අතරින් මම බලා සිටියේ ලෝන්ග් අයිලන්ඩ් පසුබිම් කරගත් ස්ට්‍රෝබෙරි යායවල් දෙසයි. මහ ගෙදර පියස්ස යට අපි ඉන්නවා වගෙයි පෙනෙන්නට තිබුණේ. අත්වැට අසල කොට කලිසමක් සහ තැඹිලි පාට බැනියමක් හැඳගත්, වැලි පාට කොණ්ඩයක් ඇති කොල්ලෙක් අපිට පිටුපා සිටගෙන සිටියා. ලෝකඩ කඩුවක් අතින් ගෙන සිටි එයා දෙණිය පහළ තිබූ යම් දෙයක් දෙස ඕනෑකමින් බලා ඉන්නවා පෙනුණා.

"ලූක්!" මම කතා කළා.

ඇස් දෙක ලොකු කරගෙන එයා හැරුණා. මීදුම තුළින් මට පෙනුණේ එයාගේ කොටසක් වුණත්, එයා අඩි තුනකට විතර එහා මගේ ඉදිරියෙන්ම ඉන්නවා වගෙයි මට දැනුණේ.

"පර්සි!" එයාගේ කැළැල ඇති මුහුණ පුරා හිනාවක් ඇඳුණා. "ඔය ඉන්නේ ඇනබෙත් ද? දෙවියන්ට ස්තූති වේවා! ඔයාලා හැමෝම හොඳින් නේද?"

"අපි... අහ්... හොඳින්," ඇනබෙත් ගොත ගැසුවා. එයා පිස්සුවෙන් වගේ එයාගේ කුණු ගෑවුණු ටී-ෂර්ට් එක හරිගස්සන්නත්, මුහුණට වැටුණු කොණ්ඩය අතින් හදන්නත් ගත්තා. "අපි හිතුවේ කයිරොන් - මම මේ කියන්න ගියේ -"

"එයා කැබින්වලට ගිහින්." ලූක්ගේ හිනාව මැකී ගියා. "කඳවුරුකාරයෝ ගැන අපිට පොඩි ප්‍රශ්න ටිකක් මතුවෙලා. ඔයාලාගේ වැඩ අවුලක් නැතිව වෙනවා නේද? ග්‍රෝවර්ත් හොඳින්ද?"

"මම මෙහේ," ග්‍රෝවර් කතා කළා. තොසලය එක් පැත්තකට හැරවූ එයා ලූක්ගේ දර්ශන පථයට ආවා. "මොන වගේ ප්‍රශ්නද?"

ඒ වේලාවේම වගේ, මහ හඬින් සංගීතය දමා ගත් ලොකු කාරයක් සේදුම්පොළට ඇතුළු වුණා. අපි අසලම තිබූ කුටිය තුළට එය ඇදී යද්දී, එහි ශබ්ද විකාශනවල කම්පනයට පොළොව දෙදුරුම් කෑවා.

"කයිරොන්ට සිද්ධ වුණා - මොකක්ද ඒ සද්දේ?" ලූක් කෑගැසුවා.

"මං ඒ ගැන බලන්නම්." ආපසු කෑගැසූ ඇනබෙත්ගේ මුහුණෙන් පෙනුණේ එතැනින් ඉවතට යන්න නිදහසට කාරණයක් ලැබීම එයාට ලොකු සහනයක් වගෙයි.

"ග්‍රෝවර්, එන්නකෝ!"

"මොකද?" ග්‍රෝවර් ඇසුවා. "ඒත්-"

"පර්සිට හොසල් එක දීලා ඉක්මනට එන්න!" එයා නියෝග කළා.

ගැහැනු ළමයින්ව තේරුම් ගැනීම ඔරකල්ව තේරුම් ගන්නවාටත් වඩා අමාරු බවට මොනවදෝ දොඩවමින් වතුර විදිනය මගේ අතට දුන් ග්‍රෝවර් ඇනබෙත් පසුපස ගියා.

දේදුන්න දිගටම පවත්වා ගනිමින් ලූක් සමග කතා කළ හැකි වන සේ මම පොම්පය නැවත සකස් කළා.

"කයිරොන්ට රණ්ඩුවක් නතර කරන්න වුණා," ලූක් සංගීතයට ඉහළින් කෑගැසුවා. "මෙහේ දේවල් සෑහෙන්න තද වෙලයි තියෙන්නේ, පර්සි. සියුස්-පොසෙයිඩන් දෙන්නගේ රණ්ඩුව ගැන පිටට ආරංචි වෙලා. ඒ කොහොමද කියලා අපි තවම දන්නේ නෑ - සමහරවිට, අර යම බල්ලාව ගෙන්වපු එකාගෙම වැඩක් වෙන්න ඇති. දැන් කඳවුරුකාරයෝ පිල් බෙදෙන්න පටන්ගෙන. ඒකත් ට්‍රෝජන් යුද්ධය වගේ වේගෙනයි එන්නේ. ඇෆ්‍රොඩයිටි, ඒරිස්, ඇපලෝ කට්ටිය පොසෙයිඩන්ගේ පැත්ත අරන්. ඇතීනා, සියුස්ගේ පැත්තේ."

ක්ලැරිස්ගේ කැබින් එක මොනම හේතුවකට හෝ මගේ තාත්තාගේ පැත්ත ගනීවි කියලා හිතද්දිත් මාව වෙවුලුවා. එහා කුටියේ ඇනබෙත් තවත් කොල්ලෙක් සමග වාද කරන හඬත්, ඊට පස්සේ, සංගීත හඬ සෑහෙන්න අඩු වෙනවාත් මට ඇහුණා.

"ඉතින්, ඔයාලගේ තත්ත්වෙ කොහොමද?" ලූක් මගෙන් ඇසුවා. "ඔයාලව මග ඇරුණාට කයිරොන් දුක් වෙයි."

මම ලූක්ට සෑම දෙයක් ගැනම - මගේ සිහින ගැන පවා කිවුවා. එයාව ආපසු දකින්න ලැබීමෙන්, විනාඩි කිහිපයකට හරි ආපසු කඳවුරට යන්න ලැබීමෙන් මගේ හිතට සෑහෙන හොඳක් දැනුණා. මම කොයි තරම් කාලයක් කතා කළාද කියලා මට තේරුණේ තවත් විනාඩියකින් වතුර නතර වන බවට සංඥ කරමින් යන්ත්‍රයෙන් බීප් හඬක් පිට වීමට ගත්විටයි.

"අනේ, මටත් ඔතැන ඉන්න තිබුණා නම්," ලූක් මට කිවුවා. "මට බය, අපිට මෙහේ ඉඳන් වැඩි උදවුවක් කරන්න බැරි නිසයි. ඒත්, අහන්න... ප්‍රධාන අකුණ ගත්තේ හේඩීස්ම වෙන්න ඕනෑ. දක්ෂිණායනයේදී එයත් ඔලිම්පස්වල හිටියා. අපේ ක්ෂේත්‍ර චාරිකාවේ භාරකාරයා විදිහට මම යද්දි, අපිට එයාව දකින්න ලැබුණා."

"ඒත්, කයිරොන් කිවුවා දෙවිගොල්ලන්ට එකිනෙකාගෙන් මායා බඩු කෙලින්ම ගන්න බැහැ කියලා."

"ඒක ඇත්ත," ලූක් කියද්දි, එයාගේ මුහුණේ තිබුණේ කරදරකාරී පෙනුමක්. "ඒ වුණත්... හේඩීස් ළඟ අඳුරේ හිස්වැසුම තියෙනවානේ. වෙන කවුරුවත් කොහොමද සිංහාසන ශාලාවට රිංගලා ප්‍රධාන අකුණ හොරකම් කරන්නේ? එහෙනම් එයාට අදෘශ්‍යමාන වෙන්න පුළුවන් වෙන්න ඕනෑ."

එයා කියූ දේ ලූක්ටම තේරුම් යන තුරු අපි දෙන්නම නිශ්ශබ්දව හිටියා.

"ඔහ්, හේයි," එයා විරෝධය පෑවා. "මං ඇනබෙත්ව නෙවෙයි අදහස් කළේ. එයයි මමයි ඉස්සර ඉඳලම අඳුරනවා. එයා කවදාවත්ම... මං කියන්න ගියේ, මට එයා මගේ නංගි කෙනෙක් වගෙයි."

මම පුදුම වුණේ ඇනබෙත් ඒ වර්ණනාවට කැමති වෙයිද හිතලයි. එහා කුටියේ සංගීතය මුළුමනින්ම නතර වුණා. හීනියට පත්

Scanned with CamScanner

වූ මනුස්සයෙක් යටිගිරියෙන් කෑගසන හඬත්, කාරයේ දොරවල් තදින් වැසෙන හඬටත් පසු, ඒ කාරය සේදුම්පොළින් එළියට හැල්මේ ගියා.

"ඒ මොකක්ද කියලා ඔයා ගිහින් බැලුවොත් හොඳයි," ලූක් කිවුවා. "අහන්න, ඔයා අර පියාඹන සපත්තු දාගෙනද ඉන්නේ? ඒවාගෙන් ඔයාට ප්‍රයෝජනයක් වුණා කියලා දැනගන්න තියෙනවා නම් මගේ හිතට සහනයක් දැනෙයි."

"ඔන්... අන්... ඔව්!" වරදකාරී බොරුකාරයෙකුගේ ස්වරයෙන් කතා නොකර ඉන්න මම උත්සාහ කළා. "ඔව්, ඒවා හරිම ෂෝක්."

"ඇත්තට?" එයා හිනාවුණා. "ඒවා ගාණට තියෙනවද?"

වතුර නතර වුණා. මීදුම ටිකෙන් ටික සිඳී යන්න පටන් ගත්තා.

"හොඳයි, ඩෙන්වර්වලදී ඔයා පරිස්සම් වෙන්න." ලූක් කියද්දී, එයාගේ කටහඬ වියැකුනා. "ග්‍රෝවර්ටත් කියන්න මේ සැරේ හැමදේම හරියාවි කියලා! කවුරුවත් පයින් ගහක් වෙන්නේ නැති -"

ඊත්, මීදුම වාෂ්ප වෙලා ලූක්ගේ රූපය සම්පූර්ණයෙන්ම මැකී ගියා. වාහන සේදුම්පොළේ තෙමුණු, හිස් කුටියේ මම තනි වුණා.

ඇනබෙත් සහ ග්‍රෝවර් සිනාවෙමින් කෙළවරකින් මතු වුණත්, මගේ මුහුණ දකලා එයාලා නතර වුණා. ඇනබෙත්ගේ හිනාව මැකී ගියා. "මොකද වුණේ, පර්සි? ලූක් මොනවද කිවුවේ?"

"වැඩි දෙයක් නෑ," මම බොරුවක් කියද්දී, මගේ බඩ ලොකු තුන්කට්ටුවේ කැබින් තරම් හිස්වටයි මට දැනුණේ. "එන්න යමු, අපි රෑට කන්න මොනවාහරි හොයාගන්න බලමු."

විනාඩි කීපයකට පසු, අපි වාඩි වී සිටියේ රාත්‍රී කෑම සපයන හෝටලයක් තුළයි. අපි වටේටම සිටි පවුල්වල උදවිය බර්ගර් කමින්, සෝඩා සහ මෝල්ට් බොමින් සිටියා.

අන්තිමේදී, හෝටල් සේවිකාවක් අපේ ළඟට ආවා. එයා එක් ඇහිබැමක් එසෙව්වා. "හොඳයි?"

"අපිට, මේ.., රෑ කෑම ඕනෑ." මම කිවුවා.

"ඔය ළමයි ළඟ ඒකට ගෙවන්න සල්ලි එහෙම තියෙනවද?"

ග්‍රෝවර්ගේ යටි තොල සැලෙන්න ගත්තා. එයා අඬන්න ගනීද කියලා මට බය හිතුණා, එයා මේස රෙද්දවත් කන්න පටන් ගත්තොත්

ඊටත් වඩා විනාසයක් වෙන්නේ. ඇනබෙත් සිටියෙත් බඩගිනි වැඩිකමට කලන්තේ දාන්න වගෙයි.

හෝටල් සේවිකාවට කියන්න දුක හිතෙන කතාවක් ගොතාගන්න මම උත්සාහ කරන අතරේ, අලි පැටියෙක් තරම් විශාල මෝටර් සයිකලයක හඬින් මුළු ගොඩනැගිල්ලම දෙදුරුම් කෑවා.

හෝටලය තුළ සියලුම කතා නතර වුණා. මෝටර් සයිකලයේ ඉදිරිපස ලාම්පු රතු පාටින් බැබළුණා. රතු පාට ගිනිදැල් පින්තාරු කළ ගෑස් ටැංකියේ දෙපස සවිකර තිබූ පිස්තෝල කොපුවල ඇත්තම පතරොම් තුවක්කු දෙකක් තිබුණා. එහි ආසනය සම්වලින් සාදා තිබුණත්, ඒ සම්වලට තිබුණේ සුදු ජාතික මිනිස් සමක පෙනුමක්.

මෝටර් සයිකලය මත සිටි පිරිමියාට තිබුණේ මල්ලව පොර ශූරයින්වත් බිය වද්දන පෙනුමක්. රතු පාට අත් නැති ටී-ෂර්ට් එකක් සහ කළු කලිසමක් හැඳ, ඊට උඩින් කළු ලෙදර් කබායක් දමාගෙන සිටි එයා කලවයක දඩයම් පිහියක් බැඳගෙන සිටියා. රතු පාට අව් කණ්ණාඩි දමාගෙන සිටි එයාගේ මුහුණේ මට මෙච්චර කාලයකට දකින්න ලැබුණු නපුරුම, දාමරිකම පෙනුම තිබුණා. මට හිතුණු හැටියට එයා කඩවසම් වුණත්, අසත්පුරුෂ පෙනුමකුත් එයාට තිබුණා. නාවික මෝස්තරයට කැපූ තද කළු කොණ්ඩයට යටින් වූ මුහුණ සටන් බොහෝමයකින් ඇති වූ කැළැල්වලින් වැසිලා. පුදුමාකාරම දේ වුණේ, ඒ මුහුණ මීට කලින් කොහේදී හරි දැක පුරුදු බවක් මට දැනීමයි.

එයා ඇතුළට එද්දීම වියළි, උණුසුම් සුළඟක් හෝටලය පුරා හමා ගියා. සැම දෙනාම වශියකට හසුවෙලා වගේ නැගිට්ටත්, මෝටර් සයිකල්කරුවා එය නොසලකා හරිමින් අතක් වනද්දී එයාලා ආපසු වාඩි වුණා. හැම දෙනාම නැවතත් තම තමන්ගේ කතාබහ පටන් ගත්තා. හෝටල් සේවිකාව ඇහිපිල්ලම් ගහන්න ගත්තේ හරියට කවුරුහරි එයාගේ මොළයේ බොත්තමක් එබුවා වගෙයි. "ඔය ළමයි ළඟ ඒකට ගෙවන්න සල්ලි එහෙම තියෙනවද?" එයා අපෙන් ආපසු ඇසුවා.

"ඒක මං බලාගන්නම්," කියූ මෝටර් සයිකල්කරුවා අපි සිටි කොටසේ තිබුණු, එයාගේ තරමට වඩා ගොඩාක් පොඩි අසුනට රිංගුවේ ඇනබෙත්ව ජනේලය පැත්තට තල්ලු කරමින්.

"ඔහේ නාමත් මෙතැනද?" එයා ඇසුවේ කට ඇරන් බලා සිටින හෝටල් සේවිකාවගෙනුයි.

එයා ඇය දිහාවට ඇඟිල්ලක් දිගු කරද්දි හෝටල් සේවිකාව ගල් ගැසුණා. එක තැන කැරකෙමින් සිටියා වගේ වේගයෙන් අනෙක් පැත්තට හැරුණු එයා මුළුතැන්ගෙය පැත්තට ගමනේ ගියා.

සයිකල්කරුවා මගේ දිහා බැලුවා. රතු අව් කණ්ණාඩියට පිටුපසින් වූ එයාගේ ඇස් දෙක මට නොපෙනුණත්, නරක හැඟීම් ගොඩක් මගේ බඩ ඇතුළේ කැකෑරෙන්න පටන් ගන්නවා මට දැනුණා. තරහාව. අමනාපය. දොම්නස. බිත්තියකට ගහන්න මට ඕනෑ වුණා. කාත් එක්ක හරි රණ්ඩුවක් ඇති කරගන්න මට උවමනා වුණා. මේ මනුස්සයා හිතන් ඉන්නේ එයා කවුරු කියලද?

එයා මට දුෂ්ට හිනාවක් පෑවා. "එහෙනම්, ඔහේ තමයි නාකි කාවාටි රවුලාගේ ළමයා, හන්?"

එයින් මම පුදුමයට හෝ බයට පත් විය යුතු වුණත්, ඒ වෙනුවට මට දැනුණේ මම, මගේ බාප්පා ගේබ් දිහා බලන් ඉන්නවා වගෙයි. මට උවමනා වුණේ මේ මිනිහාගේ බෙල්ල ගලවලා දාන්නයි. "ඒකෙන් ඔයාට ඇති වැඩේ මොකක්ද?"

ඇනබෙත් අනතුරු අඟවන බැල්මකින් මගේ දෙස බැලුවා. "පර්සි, මේ ඉන්නේ -"

සයිකල්කරුවා අතක් එසෙව්වා.

"ඒකට කමක් නෑ," එයා කිවුවා. "කවුද ලොක්කා කියලා ඔහේලාට මතක තියෙනකල් මම ඒ වගේ දේවල් ගණන් ගන්නේ නැහැ. මම කවුද කියලා ඔහේ දන්නවා නේ, පුංචි මස්සිනේ?"

මේ පිරිමියාගේ මුහුණ හුරු පුරුදු ලෙස දැනුන හේතුව මට තේරුම් ගියේ ඒ වෙලාවේදියි. එයාට තිබුණු දුෂ්ට, නින්දා සහගත බැල්මම අර්ධ-ලෝහිත කඳවුරේ සමහර ළමයින්ට - හරියටම කියනවා නම්, කැබින් අංක පහේ ළමයින්ටත් තිබුණා.

"ඔයා ක්ලැරිස්ගේ තාත්තා," මම කිවුවා. "ඒරිස්, යුද්ධයට අධිපති දෙවියා."

දත් නියවූ ඒරිස් අව් කණ්ණාඩිය ගැලෙව්වා. එයාගේ ඇස් දෙක තිබිය යුතු තැන, හිස් කෙවෙණි තුළ දිලිසෙමින් තිබුණේ පුංචි න්‍යෂ්ටික පිපිරීමක පෙනුම ගත් ගින්නක් විතරයි. "අන්න හරි, මැට්ටෝ. ඔහේ ක්ලැරිස්ගේ හෙල්ල කැඩුවා කියලා මට ආරංචි වුණා."

"එයාට ඒක කරගන්න උවමනා වෙලා තිබ්බේ."

"වෙන්නැති. ඒක මරු. ඔහේ දන්නවද, මම, මගේ දරුවන්ගේ රණ්ඩුවලට මැදිහත් වෙන්නේ නෑ. මං මෙහෙට ආවේ ඔහේලා මේ ටවුමට ආවා කියලා මට ඇහුණ නිසා. මං ළඟ තියෙනවා ඔහේලාට පොඩි යෝජනාවක්."

චීස් බර්ගර්, බැදපු අල පෙති, ළූණු පෙති, චොකලට් කිරි වගේ කෑම ගොඩක් පිරවූ බන්දේසි කීපයක් එක්ක හෝටල් සේවිකාව ආපසු ආවා.

ඒරිස් එයාගේ අතට රන් ඩ්‍රච්මා කීපයක් දුන්නා.

එයා බයාදු ලෙස කාසි දිහා බැලුවා. "ඒත්, මේවා..."

ලොකු පිහිය එළියට ඇද ගත් ඒරිස් එයින් අතේ නියපොතු හාරන්න ගත්තා. "ප්‍රශ්නයක්ද, වස්තුවේ?"

තදින් කෙළ ගිල්ල සේවිකාව රන් කාසි අරන් යන්න ගියා.

"ඔයාට එහෙම කරන්න බැහැ," මම ඒරිස්ට කිවුවා. "පිහියක් අරන් මිනිස්සුන්ට තර්ජනය කරන්න ඔයාට බැහැ."

ඒරිස් මහ හඬින් හිනා වුණා. "ඔහේ විහිළු කරනවද? මම මේ රටට හරි ආසයි. මේ තමයි ස්පාර්ටාවට පස්සේ හොඳම තැන. ඔහේ ආයුධයක් අරගෙන නොවෙයිද යන්නේ, මැට්ටෝ? ඔහේ එහෙම කරන්න ඕනෑ. එළියේ තියෙන්නේ අනතුරු පිරිච්ච ලෝකයක්. අන්න ඒකෙන්, කතාව මගේ යෝජනාව පැත්තට හැරෙනවා. ඔහේගෙන් මට උදව්වක් ඕනෑ."

"මට දෙවියෙකුට කරන්න පුළුවන් උදව්ව මොකක්ද?"

"තමන්ටම කරගන්න තරම් දෙයියන්ට වෙලාවක් නැති වැඩක්. ඒක ඒ හැටි දෙයක් නෙවෙයි. මේ ටවුමේ අතෑරලා දාපු ජල උද්‍යානෙක මම, මගේ පලිහ දාලා ආවා. මම, මගේ පෙම්වතී එක්ක පොඩී... සවාරියක් ගිහින් හිටියේ. ඒත්, අපිට පොඩි බාධාවක් ආවා. ඒ වෙලාවේ මම පලිහ දාලා ඇවිත්, ඔහේලා ඒක මට ගෙනැත් දෙන්න ඕනෑ."

"ඇයි ඉතින් ඔයාම ගිහින් ඒක ගන්නේ නැත්තේ?"

එයාගේ ඇස්වල තිබුණු ගින්න තවත් ටිකක් උණුසුමව දැවෙන්න ගත්තා.

"මම ඔහේව ඕයෙස්ට හරවලා, මගේ සයිකලෙන් යට කරලා දාන්නේ නැත්තේ ඇයි? මොකද, මම ඒකට කැමති නැති නිසා. ඔහේ ගැන ඕප්පු කරන්න දෙවියෝ ඔහේට අවස්ථාවක් දීලා තියෙන්නේ, පර්සි ජැක්සන්. ඔහේ බයගුල්ලෙක් කියලා ඔප්පු කරන්නද හදන්නේ?" එයා ඉදිරියට නැමුණා. "එහෙමත් නැත්නම්, ඔහේ සටන් කරන්නේ ළඟ පාතක පනින්න ගෙක් තියෙනවා නම් විතරයිද? එතකොට ඔහේගේ තාත්තාට ඔහේව ආරක්ෂා කරන්න පුළුවන් නේ."

මේ මිනිහාගේ මූණට දෙකක් අනින්නම මට හිතුණත්, එයා බලා ඉන්නේ මම එහෙම කරන තුරු බව මට තේරුණා. මගේ තරහව ඇති කළේ ඒරීස්ගේ දේව බලයයි. මම එයාට පහර දෙනවා නම් එයා ගොඩාක් ආසා වෙයි. එයාට ඒ තෘප්තිය ලබා දෙන්න මට උවමනා වුණේ නැහැ.

"අපිට ඒ ගැන උනන්දුවක් නැහැ," මම කිවුවා. "අපි දැනටමත් ඉන්නේ ගවේෂණයක."

ඒරීස්ගේ දවෙන ඇස් දෙක මම දකින්න අකමැතිම දේවල් මට දකින්න දැලැස්වුවා - ලේ, දුමාරය සහ යුද පිටියක් පුරා විසිරුණු මළ සිරුරු. "ඔහේගේ ගවේෂණය ගැන මම දන්නවා, මැට්ටෝ. ඔය බඩුව හොරකම් කළාට පස්සේ මුලින්ම සියුස්, එයාගේ හොඳම අයව ඒක හොයන්න පිටත් කළා: ඇපලෝ, ඇතීනා, ආර්ටෙමිස්, මම. ඒ වගේ බලගතු ආයුධයක ඉව මට දැනුණෙත් නැත්නම්..." එයා දිවෙන් තොල් තෙත් කරගත්තේ, ප්‍රධාන අකුණ ගැන සිතුවිල්ල පවා එයාට බඩගිනි ඇති කරවනවා වගෙයි. "හොඳයි... ඒක මට හොයාගන්න බැරි වුණා නම්, ඔහේට ඒ ගැන බලාපොරොත්තුවක්වත් තියාගන්න බැහැ. එහෙම වුණත්, මම උත්සාහ කරන්නේ සැකයේ වාසිය ඔහේලාට දෙන්න. ඔහේගේ තාත්තායි මමයි සැහෙන කාලෙක ඉඳලා අඳුරන්නේ. කොහොම හරි, තාකි මිනී කාක්කාව මට සැකයි කියලා එයාට කිව්වෙත් මම තමයි."

"හේඩීස් අකුණ හොරකම් කළා කියලා ඔයා එයාට කිවුවා?"

"ඇත්තටම, කෙනෙක්ව වැරැද්දකට හසු කරන එක යුද්ධයක් පටන් ගන්න පොතේ තියෙන පරණම ක්‍රමයක්. මම ඒක ඉක්මනටම හඳුනගත්තා. එක විදිහකට බැලුවොත්, ඔහේගේ පුංචි ගවේෂණය වෙනුවෙන් ඔහේ මට ස්තූති කරන්න ඕනෑ."

"ස්තූතියි," මම ගෙරෙව්වා.

"හේයි, මම තයාගශීලී කෙනෙක් නේ. මගේ පුංචි වැඩේ කරලා දෙන්න. එතකොට, ඔහේගේ ගමන යන්න මං උදවු කරන්නම්. ඔහේටයි, ඔහේගේ යාළුවන්ටයි බටහිරට යන්න මං වාහනයක් ලෑස්ති කරලා දෙන්නම්."

"අපි දැනටමත් හොඳින් ගමන යනවා."

"අනේ, ඔව්. සල්ලි නෑ. වාහනයක් නෑ. ඔහේලා හැප්පෙන්න යන්නේ කවුරු එක්කද කියලා හෝඩුවාවක්වත් නෑ. මට උදවු කරන්න. ඊට පස්සේ සමහරවිට, ඔහේට දැනගන්න උවමනා දෙයක් මං කියන්න ඉඩ තියෙනවා. ඔහේගේ අම්මා ගැන දෙයක්."

"මගේ අම්මා ගැන?"

එයා විරිත්තුවා. "අන්න ඒක ඔහේගේ අවධානය ගත්තා. ජල උද්‍යානය තියෙන්නේ හැතැප්මක් විතර බටහිරට වෙන්න ඩෙලන්සිවල. ඔහේලාට ඒක මග ඇරෙන්න විදිහක් නෑ. ආදර සවාරි උමග ඇතුළේ බලන්න."

"ඔයාගේ සවාරියට බාධා වුණේ කොහොමද?" මම ඇහුවා. "ඔයා මොකකට හරි බය වුණාද?"

ඒරීස් දත් විලිස්සුවා, ඒත් එයාගේ තර්ජනාත්මක බැල්ම මම මීට කලින් ක්ලැරිස්ගෙන් දැක තිබුණා. එහි මොකක්දෝ ව්‍යාජ ගතියක් තිබුණේ හරියට එයා කලබලෙන් සිටියා වගෙයි.

"ඔහේට වෙන ඔලිම්පියානුවෙක්ව මුණ නොගැහී මාවම මුණ ගැහුණේ ඔහේගේ වාසනාවට, මැට්ටෝ. එයාලා මම වගේ නොහික්මුණුකම්වලට සමාව දෙන අය නෙවෙයි. ඔහේ වැඩේ කළාට පස්සේ මම මෙතැනදිම ඔහේව මුණ ගැහෙන්නම්. මාව කලකිරවන්න නම් එපා."

ඊට පස්සේ, මට කලන්තයක් හැදෙන්න ඇති, නැත්නම් මාව නිද්‍රාවකට වැටෙන්න ඇති. මොකද, මම ආපසු ඇස් ඇරිද්දී ඒරීස් යන්න ගිහින්. ඒ කතාබහ මම දැකපු හීනයක් කියලා වුණත් හිතෙන්න තිබුණා, ඒත් ඇනබෙත්ගේ සහ ග්‍රෝවර්ගේ මුහුණුවල තිබූ පෙනුම මට කිවුවේ වෙනත් කතාවක්.

"හොඳ නැහැ," ග්‍රෝවර් කිවුවා. "ඒරීස් ඔයාව හොයාගත්තා, පර්සි. ඒක නම් හොඳම නැහැ."

මම ජනේලයෙන් එපිට බැලුවා. මෝටර් සයිකලය අතුරුදහන් වෙලා.

ඒරීස් ඇත්තටම මගේ අම්මා ගැන මොනවා හරි දැන සිටියාද, නැත්නම්, එයා මාව රවට්ටනවාද? එයා ගියාම මගේ කේන්තිය සම්පූර්ණයෙන්ම සිඳුණා. මිනිසුන්ගේ චිත්තවේගයන් අවුල් කර දමන්න ඒරීස් ගොඩක් කැමති බව මම තේරුම් ගත්තා. එයාගේ බලය එයයි - කෙනෙකුගේ ආශාවන් තදින් ඇවිස්සුවාම එයින් එයාගේ කල්පනා ශක්තිය වැසී යනවා.

"සමහරවිට, මේක උගුලක් වෙන්න ඇති," මම කිවුවා. ''ඒරීස්ව අමතක කරලා අපි, අපේ ගමන යමු."

"අපිට බැහැ," ඇනබෙත් කිවුවා. "බලන්න, මටත් ඒරීස්ව පේන්න බැහැ තමයි. ඒත්, ඔයාට හරිම නරක අවාසනාවක් උවමනා නැත්නම් දෙවියන්ව නොසලකා අරින්න ඕයාට බැහැ. ඔයාව මීයෙක් කරනවා කියලා එයා කිවුවේ විහිළුවට නෙවෙයි."

හදිසියේම වගේ කෑමට රුචිය නැතිවී ගිය චීස් බර්ගර් එක දෙස මම බැලුවා. "එයාට අපිවම උවමනා ඇයි?"

"සමහරවිට, ඒක මොළය පාවිච්චි කරලා විසඳන්න ඕනෑ ප්‍රශ්නයක් වෙන්නැති," ඇනබෙත් කිවුවා. "ඒරීස්ට ශක්තිය තියෙනවා. ඒත්, එයාට තියෙන්නේ එච්චරයි. සමහර වෙලාවට, නුවණ ඉදිරියේදී ශක්තියට පවා නැමෙන්න සිද්ධ වෙනවා."

"ඒත්, මේ ජල උද්‍යානය... එයා හැසිරුණේ සෑහෙන බය වෙලා වගෙයි. යුද්ධයට අධිපති දෙවියන්ට පැනලා දුවන්න සිද්ධ කළේ මොකක් වෙන්න ඇතිද?"

ඇනබෙත් සහ ග්‍රෝවර් බයෙන් වගේ එකිනෙකා දෙස බලාගත්තා.

"මට බය, ඒක අපිටම හොයා ගන්න වෙයි." ඇනබෙත් කිවුවා.

***

අපි ජල උද්‍යානය සොයා ගන්නකොට, ඉර කඳු අතරින් බැසලන්න පටන්ගෙන තිබුණා. එතැන නාම පුවරුව දෙස බලද්දී, කාලෙකට ඉස්සර මේ තැන 'ජල උයන' ලෙස නම්කර තියෙන්න ඇති බව සිතා ගන්නට පුළුවන් වුණත්, දැන් එහි අකුරු කීපයක්ම කඩා වැටී තිබුණු නිසා එයින් කියවුණේ 'ජ. උ.න' ලෙසයි.

ඉබි-යතුරු දමා වසා තිබුණු ප්‍රධාන ගේට්ටුව මුදුනේ කටු කම්බි ඇද තිබුණා. එය තුළ වේළී ගිය යෝධ වෝටර් ස්ලයිඩයන්, බට සහ පයිප්ප සෑම තැනින්ම දඟර ගැසෙමින්, හිස් තටාක වෙතට ඇදී ගියා. පරණ ටිකට් සහ දැන්වීම් පත්‍රිකා පොළොව පුරා විසිරී තිබුණා. ගලා ආ රෑ කළුවර එතැනට ගෙනාවේ දුක්බර හා බියමුසු පෙනුමක්.

"ඒරීස්, එයාගේ පෙම්වතියව සවාරියකට එක්ක ආවේ මේ වගේ තැනකට නම්," කටු කම්බි දෙස බලමින් මම කිවුවා, "එයාගේ පෙනුම ගැන මට හිතාගන්න පුළුවන්."

"පර්සි," ඇනබෙත් අනතුරු ඇඟෙව්වා. "ඔයිට වඩා විනීත වෙන්න."

"ඇයි? මං හිතුවේ ඔයාට ඒරීස්ව පේන්න බැහැ කියලා."

"කොහොම වුණත් එයා දෙවියෙක් නේ. අනික, එයාගේ ආදරවන්තියටත් ඉක්මනට කේන්ති යනවා."

"එයාගේ පෙනුමට අපහාස කරන්න ඔයාට බෑ," ග්‍රෝවර්ත් එකතු කළා.

"කවුද එයා? එචිඩ්නා ද?"

"නෑ, ඇෆ්‍රොඩයිට්," ග්‍රෝවර් කිවුවේ සිහිනයෙන් වගෙයි. " ආදරයට අධිපතිනිය."

"මං හිතුවේ එයා වෙන කවුදෝ එක්ක විවාහ වෙලා ඉන්නවා කියලා," මම කිවුවා. "හෙෆාස්ටස් එක්ක."

"ඔයා මොකක්ද පෙන්වන්න හදන්නේ?" එයා ඇසුවා.

"ඔහ්," හදිසියේම, මට මාතෘකාව වෙනස් කිරීමේ උවමනාව දැනුණා. "ඉතින්, අපි ඇතුළට යන්නේ කොහොමද?"

"මයියා!" ග්‍රෝවර්ගේ සපත්තු දෙකට තටු ආවා.

වැටට උඩින් පියඹා ගිය එයා බලාපොරොත්තු නොවූ විදිහට උඩු ගුවනේදී කරණමක් ගහලා, අනෙක් පැත්තට ඇද වැටුණා. ඉක්මනින් නැගිටගත් එයා කලිසමේ දූවිලි ගසා දැමුවේ ඒ හැම දෙයක්ම එයා සැලසුම් කර කළා වගෙයි. "ඔයාලා එන්නේ නැද්ද?"

ඇනබෙත්ටයි මටයි පරණ ක්‍රමේට වැට දිගේ උඩට නැගලා, එකිනෙකා වෙනුවෙන් කටු කම්බි වැට පහත් කර අල්ලමින්, එහා පැත්තට බඩ ගා යන්න සිදුවුණා.

නෙවෙයි. එයා අත්කම්වලට දක්ෂයි. ඒ වුණාට ඇෆ්‍රෝඩයිට් කියන්නේ බුද්ධියට, දක්ෂකම්වලට කැමති කෙනෙක් නෙවෙයි නේ."

"එයා කැමති සයිකල්කාරයින්ට?"

"මන්දා."

"හෙෆාස්ටස් දන්නවද?"

"අපොයි, ඔව්," ඇනබෙත් කිවුවා. "එයා එක සැරයක් ඒ දෙන්නව අල්ලගත්තා. මං කිවුවේ, රත්තරන් දැලක් දාලා ඇත්තටම අල්ලගත්තා. ඊට පස්සේ එයාලාව බලලා හිනා වෙන්න දෙවිවරු ඔක්කෝටම ආරාධනා කළා. ඒ දෙන්නාව අපහසුවට ලක් කරන්න හෙෆාස්ටස් හැම වෙලාවෙම උත්සාහ කරනවා. අන්න ඒ නිසයි එයාලා මුණ ගැහෙන්න..."

කෙලින්ම ඉදිරිය බලාගෙන එයා නතර වුණා. "අර වගේ තැන් තෝරා ගන්නේ."

හිම මත ලිස්සා යාමේ ක්‍රීඩාව අපූරුවට කළ හැකි හිස් තටාකයක් අපිට ඉදිරියෙන් තිබුණා. අඩු තරමින් යාර පනහක්වත් පළල වූ එය පාත්‍රයක හැඩය ගත්තා.

විදිමට සූදානමින් දුනු මානාගෙන, තටු විහිදාගත් ලෝකඩ අනංග ප්‍රතිමා දුසිමක් විතර එහි ගැට්ට වටා තිබුණා. තටාකය පිරී තිබූ කාලයේ වතුර ගලා බසින්න ඇති කියලා හිතන්න පුළුවන් උමගක් අපිට විරුද්ධ පැත්තේ තිබුණා. ඊට උඩින් පුවරුවක සඳහන් කර තිබුණේ: ත්‍රාසජනක ආදර උමගේ සවාරිය!

ග්‍රෝවර් ගැට්ට අද්දරටම ගියා. "මේ බලන්න."

රෝස සහ සුදු පාට, උඩින් ආවරණය කළ, පුංචි හදවත් මෝස්තර පින්තාරු කළ ආසන දෙකේ බෝට්ටුවක් තටාකය පතුලේ අතරමං වී තිබුණා. එහි වම් ආසනය උඩ, මැකී යන එළියෙන් දිලිසෙමින් තිබුණේ ඔප දැමූ ලෝකඩ රවුමක හැඩය ගත් ඒරීස්ගේ පලිහයි.

"ඒක හරිම ලේසියි නේ," මම කිවුවා. "අපිට තියෙන්නේ පහළට බැහැලා ඒක අරගෙන එන්න විතරද?"

ළඟම තිබුණු අනංග ප්‍රතිමාවේ පාදම දිගේ ඇනබෙත් ඇඟිලි දිවෙව්වා.

වටපිටාව පරීක්ෂා කරමින් අපි උද්‍යානය හරහා ඇවිද යද්දී නෙවණැලි දිගු වෙමින් තිබුණා. එය එක එක විදිහේ ජල ක්‍රීඩා අංගන ගොඩක් තිබුණු තැනක්.

අපිව අල්ලා ගන්නට කිසිම රාක්ෂයෙක් ආවේ නැහැ. පුංචිම කලබලයක්වත් ඇති කරවන දෙයක් හෝ සිදුවුණේත් නැහැ.

අපි ඇර දමා තිබූ තෑගි කඩයක් සොයාගත්තා. එහි රාක්කවල තවමත් වෙළඳ බඩු අසුරා තිබුණා: හිම ගෝල, පැන්සල්, තැපැල් පත් සහ රාක්ක පිරවූ -

"ඇඳුම්," ඇනබෙත් කෑගැසුවා. "අලුත් ඇඳුම්."

"ඔව්," මම කිවුවා. "ඒත්, ඔයාට බැහැ නිකන්ම -"

"බලාගෙන ඉන්නකෝ."

මුළු රාක්කයකම බඩු ඩැහැගත් එයා ඇඳුම් මාරු කරන කාමරයක් තුළට අතුරුදන් වුණා. විනාඩි කීපයකට පස්සේ එයා එළියට ආවේ මල් මුද්‍රිත 'ජල උයනේ' කොට කලිසමක්, රතු පාට, විශාල 'ජල උයනේ' ටී-ෂර්ට් එකක් සහ 'ජල උයනේ' සමරු සපත්තු ජෝඩුවක් හැඳ පැළඳගෙනයි. එයාගේ පිටේ එල්ලාගෙන සිටි 'ජල උයනේ' ගමන් මල්ලට තවත් බඩු ගොඩක් දමාගෙන ඇති බව පැහැදිලිවම පෙනුණා.

"ඒ මොන විකාරයක්ද," ග්‍රෝවර් උරහිස් ඇකිළුවා. ඉක්මනින්ම, අපි තුන්දෙනා අභාවයට ගිය ජල උද්‍යානය වෙනුවෙන් ඇවිදින වෙළඳ දැන්වීම් බවට පත්වුණා.

අපි ආදර උමග සොයමින් දිගටම ගියා. මුළු උද්‍යානයම හුස්ම රඳවාගෙන බලා ඉන්නවා වගේ හැඟීමක් මට දැනෙන්න ගත්තා. "එතකොට ඒරීස් ඇෆ්‍රෝඩයිට් දෙන්නා," මම කතා කළේ වැඩිවන කළුවර ගැන අමතක කරන්නයි, "එයාලා අතරේ සම්බන්ධයක් තියෙනවාද?"

"ඒක පරණ ඕපාදූපයක්, පර්සි," ඇනබෙත් මට කිවුවා. "අවුරුදු තුන්දාහක් පරණ ඕපාදූපයක්."

"එතකොට, ඇෆ්‍රෝඩයිට්ගේ මහත්තයා?"

"හොඳයි, ඔයා දන්නවා නේ," එයා කිවුවා. "හෙෆාස්ටස්. කම්මල්කරුවා බබෙක් කාලේ සියුස් එයාව ඔලිම්පස් කන්දෙන් පහළට විසි කරපු නිසා එයා අබ්බාගාත වුණා. ඒ නිසා, එයා කඩවසම් කෙනෙක්

"මේකේ ග්‍රීක අකුරක් කැටයම් කරලා තියෙනවා," එයා කිවුවා. "ඊටා. මට පුදුමයි..."

"ග්‍රෝවර්," මම කතා කළා. "ඔයාට රාක්ෂ ගඳක් දැනෙනවාද?"

එයා සුළඟ ඉව කළා. "මුකුත් නැහැ."

"මුකුත් නැහැ කිවුවේ හරියට - ආරුක්කුවේදී එච්ඩ්නාගේ ගඳ දැනුණේ නැහැ වගේද, නැත්නම් ඇත්තටම මුකුත් නැද්ද?"

එයින් ග්‍රෝවර්ගේ හිත රිදුණා වගෙයි. "මං ඔයාට කිව්වනේ, ඒ පොළොව යට."

"හරි, හරි. මට සමා වෙන්න." මම ගැඹුරු හුස්මක් ගත්තා. "මම පහළට යනවා."

"මමත් ඔයා එක්ක එනවා." ග්‍රෝවර්ගේ හඬේ උදෙ‍යෝගිමත් ගතියක් නම් තිබුණේ නැහැ. ඒත්, ශාන්ත ලුයිස්වලදී සිද්ධ වුණ දේට වන්දි ගෙවන්න එයා උත්සාහ කරනවා කියලා මට හැඟුණා.

"එපා," මම එයාට කිවුවා. "ඔයා පියාඹන සපත්තු එක්ක උඩ ඉන්න. මතකයි නේ? ඔයා තමයි අපේ පියාඹන සෙනෙවියා. හදිසියේවත්, අවුලක් වුණොත් මාව බේරගන්න ඔයා ඉන්න එපැයි."

ග්‍රෝවර්, එයාගේ පපුව ටිකක් පුම්බා ගත්තා. "අනිවා. ඒත්, අවුලක් වෙන්නේ කොහොමද?"

"මං දන්නේ නෑ. නිකං, හැඟීමක් විතරයි. ඇනබෙත්, මාත් එක්ක එන්න -"

"ඔයා විහිළු කරනවද?" එයා මගේ දිහා බැලුවේ හරියට මම මේ දත් හදෙන් වැටුණා වගෙයි. එයාගේ කම්මුල් තද රතු පාටට හැරුණා.

"ඒ පාර මොකක්ද ප්‍රශ්නේ?" මම තරහින් ඇහුවා.

"මම, ඔයා එක්ක 'ත්‍රාසජනක ආදර උමගේ' යන්න? ඒක කොච්චර ලැජ්ජා හිතෙන වැඩක්ද? කවුරුහරි මාව දැක්කොත් එහෙම?"

"ඔයාව කවුරු දකින්නද?" ඒත්, දැන් මගේ මුහුණත් පිච්චෙනවා වගෙයි. මේ ගෑනු ළමයි නම් හැම දෙයක්ම පටලවනවා. "කමක් නෑ," මම එයාට කිවුවා. "මම මේක තනියෙන් කරන්නම්කෝ," ඒ වුණත්, මම තටාකයේ පහළට බසිද්දී, කොල්ලෝ හැම දෙයක්ම අවුල් කරන කතාවක් කොඳුරමින් එයා මගේ පසුපස ආවා.

අපි බෝට්ටුවට ළඟා වුණා. අසුනකට හේත්තු කර තිබූ පලිහ අසලම ගැහැනු කෙනෙකුගේ හිසේ බඳින ලේන්සුවකුත් තිබුණා. ඒරිස් සහ ඇෆ්‍රොඩයිට් මෙතැන සිටි ආකාරය සිතේ මවාගන්න මම උත්සාහ කළා. ජරාවට ගිය විනෝද උයනක මුණ ගැසෙන දෙවිවරු දෙන්නෙක්. මොකක්ද හේතුව?

උඩ සිට බලද්දී නොපෙනුණු දෙයක් මට දකින්න ලැබුණේ ඒ වෙලාවේදියි. මේ තැනට මුහුණලා, තටාකයේ ගැට්ට වටේටම කණ්ණාඩි සවිකර තිබුණා. මොන පැත්තට හැරුණත් එයින් අපිව පෙනුණා. හේතුව මෙය විය යුතුයි. මෙතැන ඒරිස් සහ ඇෆ්‍රොඩයිට් විනෝද වෙන අතරේ, ඒ දෙන්නා කැමතිම අය - ඒ කියන්නේ, ඒ දෙන්නාවම බලාගන්න එයාලාට පුළුවන් නේ.

මම ලේන්සුව අහුලා ගත්තා. රෝස පාටින් දිලිසුන එයින් හැමුවේ විස්තර කළ නොහැකි සුවඳක්. රෝස හෝ කඳුකර ලෝරල්. මොකක් හෝ හොඳ දෙයක්. සිහිනයෙන් වගේ හිනාවුණ මම ඒ ලේන්සුව මගේ කම්මුලේ පිරිමදින්න සූදානම් වෙද්දිම ඇනබෙත් ඒක උදුරගෙන, සාක්කුවට ඔබාගත්තා. "හපෝයි, එපා. ආදර මායාවෙන් ඈත්වෙලා ඉන්න."

"මොකෙන්?"

"ඔය පලිහ විතරක් ගන්න, පාසි මොළේ. ඊට පස්සේ අපි මෙතැනින් එළියට යමු."

මම පලිහට අත තැබූ මොහොතේම, අපි අමාරුවේ වැටුණු බව මම දැනගත්තා. ඉදිරිපස පුවරුව සමග සම්බන්ධ වී තිබුණු යම් දෙයක් මගේ අත වැදී බිඳුණා. මකුළු දැලක්, මම හිතුවත්, මගේ අතේ තිබුණු පොට දෙස බලද්දී මට දකින්න ලැබුණේ ඇසට නොපෙනෙන තරම් සිහින් ලෝහ කෙන්දක්. පැන්නුම් කම්බියක්.

"පොඩ්ඩක් ඉන්න," ඇනබෙත් කිවුවා.

"පරක්කු වැඩියි."

"මේ බෝට්ටුවේ පැත්තකත් ග්‍රීක අකුරක් තියෙනවා. තවත් ඊටා එකක්. මේක උගුලක්."

මුළු තටාකයම යෝධ යන්ත්‍රයකට හැරෙනවා වගේ දතිරෝද මිලියන ගාණක් ඇඹරෙන හඬ අපි වටෙන්ම ඇසෙන්න ගත්තා.

"යාළුවනේ!" ග්‍රෝවර් කෑගැසුවා.

ගැට්ට උඩ අනංග ප්‍රතිමා දුනුදිය අදින්න ගත්තා. ආවරණය වීමට යෝජනා කරන්නත් කලින් එයාලා ඊතල විද්දත්, ඒ අපිව ඉලක්ක කර නෙවෙයි. තටාකය හරහා එකිනෙකාට විදගත් ඊතල පිටුපස ඇමුණු සිහින් කම්බි අඩ කව හැඩයට ගිහින්, වැටෙන තැන්වල රැඳුණේ විශාල රන් තරු ලකුණක හැඩය සාදමිනුයි. ඊට පස්සේ, ප්‍රධාන කම්බි හරහා පුංචි ලෝහ පොටවල් මායාවකින් වියෙන්න ගත්තේ එයින් දැලක් සෑදෙන ලෙසයි.

"අපි මෙතැනින් එළියට පැනගන්න ඕනෑ," මම කිවුවා.

"මාර මොළේ!" ඇනබෙත් කිවුවා.

පලිහ ඩැහැගත් අපි දුවන්න ගත්තත්, තටාක බෑවුමේ ඉහළට නැගීම, පහළට බැසීම තරම් ලේසි වැඩක් වුණේ නැහැ.

"ඉක්මන් කරන්න!" ග්‍රෝවර් කෑගැසුවා.

දැලේ එක් කොටසක් අපි වෙනුවෙන් විවෘතව තියාගන්න එයා උත්සාහ කළත්, දැලට අත තියන සෑම වතාවකදීම රන් පොටවල් එයාගේ අතේ එතෙන්න ගත්තා.

හදිසියේම, අනංගයින්ගේ ඔළු විවෘත වී වීඩියෝ කැමරා එළියට මතු වුණා. තටාකය වටා එසවුණු පිරික්සුම් පහන්වල එළියෙන් අපේ ඇස් අන්ධ වෙද්දී, ශබ්ද විකාශනයක හඬ දෙදරන්න වුණා: "ඔලිම්පස් වෙත සජීවී විකාශනයට, තව මිනිත්තුවයි... තත්පර පනස් නමයයි, පනස් අටයි..."

"හෙෆාස්ටස්!" ඇනබෙත් බෙරිහන් දුන්නා. "මං කොච්චර මෝඩද? 'ඊටා කියන්නේ එච්' එයා මේ උගුල හදන්න ඇත්තේ එයාගේ නෝනාව ඒරිස් එක්ක අල්ලගන්න. දැන් අපිව නියම මෝඩයෝ දෙන්නෙක් වගේ ඔලිම්පස්වල සජීවීව පෙන්නයි."

අපි ගැට්ට ළඟටම කිට්ටු වෙද්දී එක්වරම කණ්ණාඩි පේළිය දෙබෑ වෙලා චූටි, ලෝහමය දේවල් එළියට වැගිරෙන්න ගත්තා.

ඇනබෙත් බෙරිහන් දුන්නා.

එතැන සිටියේ රොබෝ-මකුළු හමුදාවක්: ලෝකඩ සිරුරු, දිගටි කකුල්, පුංචි අඬු කටවල් එක්ක උන් රැල්ලක් වගේ අපේ දිහාවට දඩිබිඩියේ දුවගෙන ආවා.

"මකුළුවෝ!" ඇනබෙත් කෑගැසුවා. "මහ්-කුහ්-එවෝහ්!"

මම මීට කලින් කවදාවත් එයාව ඒ විදිහට දැක තිබුණේ නැහැ. බයවෙලා පිටුපසට වැටුණු එයාව රොබෝ-මකුළුවන්ගෙන් වැසී යන්න කලින් මම එයාව බෝට්ටුව දිහාවට ඇදගෙන ගියා.

ගැට්ට වටෙන්ම තටාකය මැදට ගලා ආ සත්තු මිලියන ගාණක් අපිව සම්පූර්ණයෙන්ම වට කරගත්තා. මේ සතුන්ව සාදා ඇත්තේ අපිව වටකරලා, හපා කාලා, අපිව මෝඩයෝ වගේ පෙන්වන්න මිසක් අපිව මරන්න වෙන්න බැහැ කියලා මම, මටම කියාගත්තා. ඒත්, මට ආපසු මතක් වුණේ, මේ උගුල අටවලා තිබුණේ දෙවියන්ට වුණත් අපි දෙවියෝ නෙවෙයි කියලයි.

ඇනබෙත් එක්ක මම බෝට්ටුවට ගොඩවුණා. මම බෝට්ටුව උඩට බඩගා එන මකුළුවන්ට පයින් ගසමින් ඉවත් කරන්න ගත්තා. මට උදවු කරන්න කියලා ඇනබෙත්ට කෑගසා කිව්වත්, බෙරිහන් දෙනවාට වැඩි දෙයක් කරන්න බැරි තරමට එයා බය වෙලයි සිටියේ.

"තිහයි, විසි නමයයි..." ශබ්ද විකාශනය කෑගැසුවා.

අපිව ගැට ගසන්නට උත්සාහ කරමින් මකුළුවෝ ලෝහ කෙඳි විදින්න ගත්තා. මුලදී, ඒ කෙඳි කඩන්න ලේසි වුණත්, ඒවා ටිකෙන් ටික වැඩි වෙද්දී මකුළුවෝත් නොනැවතී ආවා. ඇනබෙත්ගේ කකුලකට නැග සිටි එකෙකුට පයින් ගසද්දී ඌගේ අඬු මගේ අලුත් සපත්තුවේ කෑල්ලක් කඩාගත්තා.

පියාඹන සපත්තුවලින් උඩට ගිය ග්‍රෝවර් දැල ගලවන්න උත්සාහ කළත් එය සෙලවුණේවත් නැහැ.

හිතන්න, මම, මටම කිවුවා. හිතන්න.

ආදර උමගේ ඇතුළුවීම තිබුණේ දැලට යටිනුයි. රොබෝ-මකුළුවෝ මිලියන ගාණක් මඟ අහුරාගෙන නොසිටියා නම් අපිට ඒක පිටවීම විදිහට පාවිච්චි කරන්න තිබුණා.

"පහළොවයි, දහ හතරයි," ශබ්ද විකාශනය කිවුවා.

වතුර, මම හිතුවා. උමඟට වතුර එන්නේ කොහෙන්ද?

එතකොට, මට ඒවා දකින්න ලැබුණා: කණ්ණාඩි පිටුපස, මකුළුවන් එළියට ආ තැන යෝධ පයිප්ප පිහිටා තිබුණා. ඒ වගේම, දැලට උඩින් එක් අනංගයෙක් අසල, පාලක මැදිරිය විය යුතු වීදුරු ජනේල ඇති කුටියක් තිබුණා.

"ග්‍රෝවර්!" මම කෑගැසුවා. "අර කාමරේට යන්න! ඊත් බොත්තම හොයා ගන්න!"

"ඒත් -"

"කිව්ව දේ කරන්න!" ඒක පිස්සු බලාපොරොත්තුවක් වුණත්, අපිට තිබුණු එකම අවස්ථාව එයයි. දැන් බෝට්ටුවේ ඉදිරි කොටස මකුළුවන්ගෙන් පිරිලා.

ඇනබෙත්, එයාගේ ඔළුව පැලෙන්න තරම් හයියෙන් බෙරිහන් දෙමින් සිටි නිසා අපි දෙන්නට පිටවීමට ක්‍රමයක් හොයන්න සිද්ධ වුණේ මටයි.

දැන්, පාලක කුටියට රිංගාගත් ග්‍රෝවර් බොත්තම්වලට තදින් ගසන්න වුණා.

"පහයි, හතරයි -"

අත් උඩට ඔසවමින් ග්‍රෝවර් අසරණව මගේ දිහා බැලුවා. සෑම බොත්තමක්ම එබූ බව එයා මට ඇඟෙව්වා, ඒත්, තවමත් කිසිම දෙයක් සිදුවුණේ නැහැ.

ඇස් වසාගත් මම මිසිසිපි ගඟේ ගලා බසින වතුර, රැළි ගැන සිතුවා. මගේ බඩ ඇතුළේ පුරුදු ගැස්ම මට දැනෙන්න ගත්තා. මම සාගරය වෙන්වර්වලටම ඇදගන්නා ආකාරය සිතින් මවා ගන්න උත්සාහ කළා.

"දෙකයි, එකයි, බිංදුවයි!"

පයිප්ප පුපුරමින් වතුර එළියට ආවා. මකුළුවන්ව සෝදා දමමින් ඒවා තටාකයට පිරෙන්න ගත්තා. මට එහා පැත්තේ ආසනයට ඇනබෙත්ව ඇද දමූ මම එයාගේ ආසන පටිය දමද්දිම බෝට්ටුවේ වැදුණු උදම් රළ මකුළුවන්ව පිස දාමින්, අපිව මුළුමනින්ම නැහැව්වත්, එයින් අපේ බෝට්ටුව පෙරළුණේ නැහැ. හැරෙමින්, වතුර සමග උඩට එසවුණු බෝට්ටුව එක තැන කැරකෙන්න ගත්තා.

වතුර වැටීමෙන් පරිපථ අක්‍රමවත් වූ සමහර මකුළුවෝ වේගයෙන් ගිහින් තටාකයේ කොන්ක්‍රීට් බිත්තිවල හැපී කුඩු වී ගියා.

පිරික්සුම් පහන්වල එළි අපේ දිහාවට හැරුණා. අනංග-කැමරා කැරකෙමින් ඔලිම්පස්වලට සජීවී විකාශනය කිරීම පටන් ගත්තා.

ඒත්, මගේ හිත යොමුවෙලා තිබුණේ බෝට්ටුව පාලනය කිරීමට විතරයි. බිත්තිවලින් ඈත්වී, වතුර පහර සමග ගමන් කරන්න මම එයට අණ කළා. සමහරවිට, මේ මම සිතේ මවාගත් දෙයක් වෙන්න ඇති, ඒත්, බෝට්ටුව මට ප්‍රතිචාර දක්වන බව මට පෙනුණා. අඩු තරමේ, ඒක කැලි මිලියන ගාණකට කුඩු නොවී තිබුණා. ලෝහ දැලේ අපිව වදින්න සිව්වු වන තරමටම වතුර මට්ටම වැඩි වෙද්දී අන්තිම වතාවටත් එක තැන කැරකුණු බෝට්ටුව උමග පැත්තට නාසය හරවාගෙන, අපිව රැගෙන කළුවර තුළට වේගයෙන් ඇදී ගියා.

වංගු ගනිමින්, අනුමුලුවල වදිමින්, රෝමියෝ-ජුලියට් සහ තවත් වැලන්ටයින් දින සැරසිලි පසු කරගෙන අංශක හතළිස් පහකට ඇල වී, ගිලා බසිමින්, බෝට්ටුව ඇදී යද්දී තදින් අල්ලාගත් ඇනබෙත් සහ මම යටිගිරියෙන් බෙරිහන් දුන්නා.

ඊට පස්සේ, අපි උමගෙන් පිටට ගිහින් සිටියා. බෝට්ටුව කෙලින්ම පිටවීම දෙසට යද්දී රැ සුළඟ අපේ කොණ්ඩය අතරින් හමා ගියා.

අපේ ගමන හරි ආකාරව සිද්ධ වුණා නම්, අපිව ආදරයේ රන් ගේට්ටු අතරින් ගිහින්, පිටවීමේ තටාකයට පරිස්සමින් වැටෙන්න තිබුණා. ඒත්, ප්‍රශ්නය වුණේ ආදරයේ ගේට්ටුවලට දම්වැල් දාලා තිබීමයි. අපිට කලින් ගසාගෙන ගිය බෝට්ටු දෙකක් බාධකය ඉදිරිපිට ගොඩගැසී තිබුණා - එකක් බාගෙට ගිලිලා, අනෙක බාගෙට කුඩුවෙලා.

"ඔයාගේ ආසන පටිය ගලවගන්න," මම ඇනබෙත්ට කෑගැසුවා.

"ඔයාට පිස්සුද?"

"ඔයාට චප්ප වෙලා මැරෙන්න ඕනෑද?" මම ඒරීස්ගේ පලිහ අතේ ගැටගසා ගත්තා. "අපිට ඒකට පනින්න වෙනවා." මගේ අදහස සරල, පිස්සු එකක්. බෝට්ටුව හැප්පෙද්දී එයින් එන බලයෙන් ගැම්ම අරන් ගේට්ටුවට උඩින් පනින්න අපිට පුළුවන්. කාර් අනතුරුවලදී ඒ ක්‍රමයෙන් මිනිස්සු ජීවිත බේරාගෙන තියෙන බව මම අහලා තිබුණා. වාසනාව තිබුණොත් අපිටත් තටාකයට උඩින් පනින්න පුළුවන් වේවි.

මගේ අදහස ඇනබෙත් තේරුම්ගත් බව පෙනුණා. ගේට්ටුව ටිකෙන් ටික ළං වෙද්දී එයා මගේ අත අල්ලා ගත්තා.

"මම කියනකොට පනිමු," මම කිවුවා.

"නෑ මම කියනකොට!"

"මොකක්?"

"සරල භෞතික විද්‍යාව!" එයා කෑගැසුවා. "බලය වරක් ගමන්පථ කෝණය -"

"හරි, හරි." මම පෙරළා කෑගැසුවා. "ඔයා කියනකොට පනිමු"

එයා බලාගෙන ඉඳලා... ඉඳලා... ඊට පස්සේ මොර දුන්නා. "දැන්!"

දඩාස්!

ඇනබෙත් කිවුවා හරි. පනින්න ඕනෑ කියලා මම හිතුව වෙලාවේ පැන්නා නම්, අපිව ගේට්ටුවේ වදින්න තිබුණා. එයා අපිට උපරිම ඉපිලුම ගත්තා.

අවාසනාවට, ඒක අපිට උවමනා තරමටත් වඩා ටිකක් වැඩි වුණා. අපේ බෝට්ටුව කුඩු පට්ටම් වෙද්දී, ගුවනට විසිවූ අපි ගේට්ටුවට උඩින්, තටාකයටත් උඩින් ගිහින් ගල් තාර පොළොව දෙසට වැටෙන්න ගත්තා.

මොකක් හරි මාව පිටුපසින් අල්ලා ගත්තා.

"උයි!" ඇනබෙත් කෑගැසුවා.

ඒ ග්‍රෝවර්!

උඩු ගුවනේදී මගේ කමිසයෙනුත්, ඇනබෙත්ගේ අතකිනුත් අල්ලාගෙන සිටි එයා අපිව පොළොවට වැටෙන්න නොදී තියාගන්න උත්සාහ කළත් ඇනබෙත්ගේ සහ මගේ වේග ශක්තිය ඊට වැඩි වුණා.

"ඔයාලා බර වැඩියෝ!" ග්‍රෝවර් කෑගැසුවා. "අපි පහළට යනවෝ!"

ඇද වැටෙන වේගය අඩු කරන්න ග්‍රෝවර් උපරිමයෙන් උත්සාහ කරද්දී, අපි කැරකෙමින් පොළොව දෙසට වැටුණා.

අපිව ඡායාරූප පුවරුවක් තුළට කඩා වැටෙද්දී, සංචාරකයින්ට හූ-හූ මිතුරු තල්මසා ලෙස පෙනී සිටිමින් ඡායාරූප ගැනීමට සකස් කළ පුවරුවේ මුහුණ දමන සිදුර තුළට ග්‍රෝවර්ගේ ඔළුව කෙලින්ම ඇතුළු වුණා. තදින් වැදුණත්, පණපිටින් ඇනබෙත්ව සහ මාව පොළොවට වැටුණා. ඒරිස්ගේ පලිහ තවමත් මගේ අතේ.

අපිට හුස්මක් ගන්න පුළුවන් වූ හැටියේම ග්‍රෝවර්ව ගලවාගත් අපි, අපේ ජීවිත බේරාගත්තාට එයාට ස්තුති කළා. ත්‍රාසජනක ආදර උමග දිහා මම ආපසු හැරී බැලුවා. එහි වතුර බැස යමින් තිබුණා. අපේ බෝට්ටුව කැලිවලට කැඩී ගේට්ටුව අසල රැඳිලා.

යාර සිය ගාණකට එහා තටාකයේ ඇතුළුවීම ළඟ අනංගයෝ තවමත් කැමරාගත කරමින් සිටියා. පිරික්සුම් පහන්වල දීප්තිය අපේ මුහුණු එළිය කරද්දී ප්‍රතිමා, එයාලාගේ කැමරා කෙලින්ම අපේ දිහාවට හරවාගෙන සිටියා.

"සංදර්ශනය ඉවරා...යි!" මම කෑගැසුවා. "ඔයාලාට ස්තූතියි! සුබ රාත්‍රියක්!"

අනංගයෝ ආපසු මුල් ඉරියවුවට හැරුණා. විදුලි එළි නිවුණා. ත්‍රාසජනක ආදර උමගේ පිටවීමේ තටාකයට හෙමින් වතුර වැස්සෙන හඬ ඇරෙන්න මුළු උද්‍යානයම ආපසු නිහඬ හා කළුවර තැනක් වුණා. ඔලිම්පස් වෙළඳ දැන්වීමක් බලන්න විරාමයකට ගියාද, අපේ ප්‍රේක්ෂක ප්‍රතිචාර හොඳ මට්ටමක තිබුණාද හිතමින් මම පුදුම වුණා.

සරදමකට ලක්වෙන එක මට පේන්න බැහැ. මාව රවට්ටන එකත් මට පේන්න බැහැ. මට ඒ වගේ දේවල් කරන්න හදපු චණ්ඩි එක්ක ගනුදෙනු කරලා මට සෑහෙන අත්දැකීම් තිබුණා. පලිහේ බර අතට වාරු කරගත් මම, මගේ යාළුවෝ දිහාවට හැරුණා. "ඒරිස් එක්ක අපිට පොඩි කතාවක් තියෙනවා."

16

සීබ්‍රාවෙක් රැගෙන වේගාස් බලා

හෝටල් වාහන අංගනයේ යුධ දෙවියෝ අපි එනතුරු බලා හිටියා.

"හොඳයි, හොඳයි." එයා කිවුවා. "එහෙනම්, ඔහේලා පණපිටින් ආපහු ආවා."

"ඒක උගුලක් කියලා ඔයා දැනගෙන හිටියා," මම කිවුවා.

ඒරීස් දුෂ්ට හිනාවක් පෑවා. "තකතීරු ළමයි දෙන්නෙක්ව දැලට අහුවුණාම අර අබ්බගාත කම්මල්කාරයා සෑහෙන පුදුම වෙන්නැති කියලා මං ඕනෑ ඔට්ටුවක් අල්ලනවා. ඔහේලා ටී.වී එකේ ලස්සනට හිටියා."

මම පලිහ එයාට තල්លු කළා. "ඔහේ නම් නරුමයෙක්."

ඇනබෙත් සහ ග්‍රෝවර් හුස්ම ඇල්ලුවා.

පලිහ ඩැහැගත් ඒරීස් එය උඩ දමා කරකද්දී එහි හැඩය වෙනස් වෙලා වෙඩි නොවදින බැනියමකට හැරුණා. එයා ඒක පිටේ එල්ලා ගත්තා.

"අතන තියෙන ට්‍රක් එක පේනවද?" හෝටලය ඉදිරිපස පාරේ නවත්වා තිබූ රෝද දහ අටේ වාහනයක් දෙසට එයා ඇඟිල්ල දිගු කළා. "ඒක තමයි ඔහේලාගේ වාහනේ. ඒක වේගාස්වල එක පාරක් නවත්තලා, ඊට පස්සේ ඔහේලාව කෙලින්ම ලොස් ඇන්ජලීස්වලට අරන් යයි."

ට්‍රක් රථය පිටුපස සටහන් කර තිබූ දේ මට කියවගන්න පුළුවන් වුණේ ඒවා වචන අන්ධතාවය ඇති කෙනෙකුට හොඳ සංකලනයක් වෙන කළු පසුබිමේ සුදු පාටින් ආපස්සට මුද්‍රණය කර තිබුණු නිසායි: අන්තර්ජාතික කරුණාව; දයාබර සත්වෝද්‍යාන ප්‍රවාහන සේවය

අවවාදයයි: පණ ඇති සතුන්.

"ඔයා විහිළු කරනවා," මම කිවුවා.

ඒරීස් අසුරක් ගැසූ විට ට්‍රක් රථයේ පිටුපස දොර අගුළු ඇරුණා. "නොමිලේ බටහිරට ගමනක්, මැට්ටෝ. කනු-කුනු ගාන එක නතර කරනවා. තව, වැඩේ කරාට මෙතැන පොඩි දේවල් ටිකක් තියෙනවා."

සයිකල් හැඬලයේ එල්ලා තිබූ නිල් පාට නයිලෝන් ගමන් මල්ලක් ගත් එයා ඒක මගේ දිහාවට දැමුවා.

ඒ තුළ අපි හැමෝටම අලුත් ඇඳුම්, ඩොලර් විස්සක නෝට්ටු, පසුම්බියක් පිරවූ රන් ඩ්‍රැච්මා සහ චොකලට් විස්කෝතු පැකැට්ටුවක් තිබුණා.

"අපිට එපා ඔයාගේ ජරා -" මම කියාගෙන යද්දී මගේ දෙසට රතු එළි දැල්වෙන බැල්මක් හෙළමින් ග්‍රෝවර් මැදට පැන්නා. "ස්තුතියි, ඒරීස් උතුමාණෙනි. ගොඩාරියක් ස්තුතියි."

මම දත්මිටි කෑවා. සමහරවිට, දෙවියෙක් දෙන දෙයක් ප්‍රතික්ෂේප කිරීම භයානක අපහාසයක් වෙන්න ඇති. ඒ වුණත්, ඒරීස් ඇල්ලූ කිසිම දෙයක් මට උවමනා වුණේ නැහැ. අකමැත්තෙන් වුණත් මම ගමන් මල්ල උරහිසේ එල්ලා ගත්තා. මගේ තරහවට හේතුව යුද දෙවියන් අසලක සිටීම බව මම දැන සිටියා. ඒත්, එයාගේ නහය මැදට පාරක් අනින්න තවමත් මගේ අත කැසුවා. මේ තාක් කාලයකට මට මුහුණ දෙන්න වුණ සෑම දාමරිකයෙක්වම එයා මට මතක් කළා: නැන්සි බොබ්ෆිට්, ක්ලැරිස්, ගඳ ගහන ගේබ්, ඇනුම්පද කියපු ගුරුවරු - මෝඩයා කියලා මට කතා කළ, ඉස්කෝලවලින් මාව පිටමං කරද්දී මට හිනාවුණ සෑම නරුමයෙක්ම මගේ මතකයට ආවා.

දූත් ගනුදෙනුකරුවෝ දෙන්නෙක් විතර පෙනෙන්නට සිටි හෝටලය දෙස මම හැරී බැලුවා. අපිට රෑ කෑම පිළිගැන්වූ හෝටල් සේවිකාව ජනේලය හරහා අප දෙස සැකයෙන් බලා සිටියේ ඒරීස්ගෙන් අපිට කරදරයක් වෙයි කියලා බයෙන් වගෙයි. අපිව පෙන්වීමට මුළුතැන්ගෙයින් කෝකියෙක්ව ඇදගෙන ආ එයා කෝකියාට

මොනවදෝ කිවුවා. ඔළුව වැනූ කෝකියා පුංචි කැමරාවක් පිටතට අරන් අපේ ඡායාරූපයක් ගත්තා.

නියමයි, මම හිතුවා. හෙට ආයෙමත් අපි පත්තරේ ඉදිවි.

එහි සිරස්තලය මගේ සිතේ මැවුණා: දොළොස් වියැති සාහසික අපරාධකරු අසරණ සයිකල්කරුවෙකුට පහර දෙයි.

"ඔයා තව එක දෙයක් මට ණයයි," කටහඬ පාලනය කර ගැනීමට උත්සාහ කරමින් මම ඒරීස්ට කිවුවා. "මගේ අම්මා ගැන තොරතුරු කියන්න ඔයා පොරොන්දු වුණා."

"ඒ ආරංචිය දරා ගන්න පුළුවන් කියලා ඔහේට විශ්වාසද?" එයා සයිකලය පණ ගැන්වූවා. "එයා මැරිලා නැහැ."

මට යටින් පොළොව කැරකෙනවා වගේ පෙනෙන්න ගත්තා. "ඔයා මොකක්ද අදහස් කළේ?"

"මම අදහස් කළේ, එයා මැරෙන්න කලින් එයාව මිනටෝර්ගෙන් පැහැරගෙන කියලා. එයාව රත්තරන් පාට වැස්සකට හැරුණා, නේද? ඒක තමයි රූපාන්තරණය. මරණය නෙවෙයි. එයාව රඳවාගෙන ඉන්නේ."

"රඳවාගෙන, ඇයි?"

"ඔහේ යුද්ධය ගැන ඉගෙන ගන්න ඕනැ, මැට්ටෝ. ප්‍රාණ ඇපකාරයෝ. කාවහරි පාලනය කරන්න උවමනා නම් එයාගේ කෙනෙක්ව රඳවාගන්න ඕනැ."

"කවුරුවත් මාව පාලනය කරන්නේ නැහැ."

එයා හිනා වුණා. "අපොයි, ඇත්තද? ඔහොම යනකොට බලමුකෝ, කොල්ලෝ."

මම, මගේ අත් මිට මෙලෙවුවා. "අනංග පිළිමවලට බයේ දුවපු කෙනෙක් හැටියට ඔයා සෑහෙන ආත්ම තෘප්තිමත් කෙනෙක්නේ, ඒරීස්තුමනි."

එයාගේ අව් කණ්ණාඩිවලට පිටුපසින් ගිනිදැල් දිලිසුනා. මගේ කෙස් අතරින් උණුසුම් සුළඟක් හමනවා මට දැනුණා. "අපි ආයෙම මුණගැහෙමු, පර්සි ජැක්සන්. ඔහේ ඊළඟ වතාවේ සටන් කරද්දී, ටිකක් පරිස්සමින්."

මෝටර් සයිකලය පණගන්වා ගත් එයා ඩෙලන්සි පාරේ ඈතට ඇදී ගියා.

"ඒක නම් මොළේ ඇති වැඩක් නෙවෙයි, පර්සි." ඇනබෙත් කිවුවා.

"මට කමක් නැහැ."

"දෙවියෙක්ව හතුරු කරගන්න එක ඇගට ගුණ දෙයක් නෙවෙයි. විශේෂයෙන්ම අර දෙවියන්ව."

"හේයි, යාළුවනේ," ග්‍රෝවර් කිවුවා. "කතාවට බාධා කරන්න මං කැමති නෑ, ඒත්..."

එයා හෝටලය දෙසට ඇඟිල්ල දිගු කළා. කවුන්ටරය අසල අන්තිම ගනුදෙනුකරුවෝ දෙන්නා බිල ගෙවමින් සිටියා. මුළු සිරුරම ආවරණය වන ආකාරයේ කළු පාට ඇඳුම් හැඳ සිටි පිරිමි දෙදෙනාගේ පිටේ තිබුණු සුදු පාට ලාංඡනය 'අන්තර්ජාතික කරුණාව' වුක් රටයේ ලාංඡනයට සමාන වුණා.

"අපි 'සීඝ්‍රගාමී සත්වෝද්‍යාන ප්‍රවාහන සේවයේ ' යනවා නම් ඉක්මන් කරන්න වෙයි," ග්‍රෝවර් කිවුවා.

මම ඒකට අකමැති වුණත් අපිට විකල්පයක් තිබුණේ නැහැ. ඒ ඇරත්, මම ඇති තරම් ඩෙන්වර් බලාගෙනයි සිටියේ.

පාර හරහා දුවගෙන ගිය අපි, ලොකු වාහනයේ පිටුපසට නැග දොරවල් වසා ගත්තා.

ඒක ඇතුළේදී මුලින්ම මට දැනුණු දේ වුණේ ගඳයි. ඒක හරියට ලෝකේ ලොකුම පූස් ජරා ගොඩ වගෙයි.

මම ඇනාක්ලූස්මස් එළියට ගන්න තුරුම ඒ තුළ තිබුණේ තද කළුවරක්. තලයෙන් පිට වූ තුනී ලෝකඩ එළිය දුක්බර දර්ශනයක් මතට වැටුණා. අපිරිසිදු යකඩ කූඩු පේළියක් තුළ වාඩි වී සිටියේ එතෙක් කාලයකට මට දකින්න ලැබුණු දුක්ඛිතම සතුන් තුන් දෙනායි: සීබ්‍රාවෙක්, ඇලි සිංහයෙක් සහ මම නම නොදන්නා අමුතු ඇන්ටිලෝප් මුවෙක් එතැන සිටියා.

සිංහයාට කොහෙත්ම කන්න බැරි ටර්නිප් අල මල්ලක් කවුදෝ දමා තිබුණා. සීබ්‍රාට සහ ඇන්ටිලෝපයාට හැම්බර්ග් මස් සහිත බත්දේසිය බැගින් දමලා. සීබ්‍රාගේ කේසර පුරාම චුවින්ගම්

ඇලවී තිබුණේ කවුරු හරි එයාගේ ඇඟට විනෝදයට කෙළ ගසමින් සිටියා වගෙයි. අමන උපන්දින බැලූනයක් ඇන්ටිලෝපයාගේ අඟක ගැට ගසා තිබුණා.

පෙනුණු විදිහට කාටවත්ම සිංහයාගේ අසලට කිට්ටු වෙන්න උවමනාවක් තිබිලා නැහැ වගෙයි. ඒත්, ඒ අසරණ සතා, එයාගේ තරමට වඩා ගොඩාක් පුංචි ඉඩේ, කිලුටු බිලැන්කෙට්ටු කීපයක් අතරේ එහෙ මෙහෙ ඇවිදිමින් සිටියේ ට්‍රේලරය තුළ පැවති රස්නයට හති දමමිනුයි. එයාගේ රෝස පාට ඇස් වටේ මැස්සෝ කැරකෙමින් සිටියා. එයාගේ සුදු පාට ලොම් අතරින් ඉළ ඇට ඉලිප්පී පෙනුණා.

"මේ කරුණාවන්තකමද?" ග්‍රෝවර් මොර දුන්නා. " දයාබර සත්වෝද්‍යාන ප්‍රවාහනය?"

එයා ඒ වෙලාවේම ගිහින් රියැදුරන්ට එයාගේ නළාවලින් පහර දෙන්නත්, මමත් එයාගේ උදවුවට යන්නත් තිබුණා. ඒත්, එතකොටම ට්‍රක් රථයේ එන්ජිම පණ ගැන්වී, ට්‍රේලරය සෙලවෙන්න ගත්තේ අපිට වාඩිවීමට හෝ ඇද වැටීමට බල කරමින්.

ගඳ, උණුසුම හා මැස්සන්ව නොසලකා හරින්න උත්සාහ කරමින්, මුල්ලක ගොඩගසා තිබූ පුස් කාපු කෑම ගෝනි කීපයක් උඩට අපි ගොඩවුණා. ග්‍රෝවර් එළුවන්ගේ බෑ ගෑම් මාලාවකින් සත්තුන්ට කතා කළත්, එයාලා කළේ ග්‍රෝවර් දිහා දුක්බරව බලා හිඳීම විතරයි. කුඩු කඩා දමා, එතැනදීම සතුන්ව නිදහස් කරන්න ඇනබෙත්ට උවමනා වුණත්, ට්‍රක් රථය ගමන නවතන තුරු එසේ කිරීමෙන් ප්‍රයෝජනයක් නැති බව මම එයාට පෙන්වා දුන්නා. ඒ ඇරත්, සිංහයාට අර ටර්නිප්වලට වඩා අපිව ගොඩාක් රසවත්ව පේනවා ඇති කියලා මගේ හිත කියන්න ගත්තා.

මම සොයාගත් වතුර ජෝගුවෙන් එයාලාගේ භාජන පුරවලා, ඇනාක්ලුස්මස් පාවිච්චි කරමින් කූඩුවලට දමා තිබූ නොගැළපෙන කෑම එළියට ඇදලා ගත්තා. ඊට පස්සේ සිංහයාට මස් ටික දුන් මම ටර්නිප් අල සීබ්‍රාට හා ඇන්ටිලෝපයාට බෙදා දුන්නා.

ග්‍රෝවර් ඇන්ටිලෝපයාව සන්සුන් කරන අතරේ ඇනබෙත්, එයාගේ පිහියෙන් අඟේ ගැටගසා තිබූ බැලූනය කපා දැමුවා. සීබ්‍රාගේ කේසරවල ඇලී තිබුණු චුවින්ගම්ත් කපා ඉවත් කරන්න ඇනබෙත්ට උවමනා වුණත්, ට්‍රක් රථයේ ගැස්සීම් එක්ක එය අවදානම් වැඩක් කියලා අපි තීරණය කළා. පසුදා උදේට තව උදවු කරන බවට සතුන්ට

පොරොන්දු වෙන්න කියලා ග්‍රෝවර්ට කියූ අපි රැය ගෙවන්න සූදානම් වුණා.

ග්‍රෝවර් ටර්නිප් අල ගෝනියක් උඩ වකුටු වුණා; විස්කෝතු පැකැට්ටුව කැඩූ ඇනබෙත් ඕනෑවට එපාවට වගේ එයින් එකක් ලැට් ගෑවා; අපි ලොස් ඇන්ජලීස් යන ගමනෙන් බාගයක්ම ආ බව සිහි කරමින් මම, මාවම උදෙන්ගිමත් කරගන්න උත්සාහ කළා. අපේ ගමනාන්තයට බාගයක් දුර ඇවිත්. තාම ජූනි දහ හතර වෙනිදා විතරයි. උත්තරායනය සිදු වෙන්නේ විසි එක් වෙනිදාට. ඉතින්, අපිට ඕනෑ තරම් කාලය තිබුණා.

අනෙක් අතට බලද්දී, ඊළඟට මොනවා බලාපොරොත්තු වෙන්නද කියලා මට කිසිම අදහසක් තිබුණේ නැහැ. දෙවිවරු මාව සෙල්ලමකට අරගෙන. අඩු තරමේ, ඒ ගැන අවංක වෙන්න තරම් විනීතකමක් තිබුණේ හෙෆාස්ටස්ට විතරයි - එයා කැමරා අටවලා, විනෝදාංගයක් විදිහට මාව ප්‍රචාරය කළා. ඒත්, කැමරාවලින් පටිගත නොවුණට මගේ ගවේෂණය දිහා එයාලා බලා ඉන්න බව මට දැනෙමින් තිබුණා. දෙවිවරුන්ට මම විනෝදය සපයන කෙනෙක් වෙලා ඉවරයි.

"හේයි," ඇනබෙත් කතා කළා. "ජල උයනේදී පිස්සු නැටුවට මට සමා වෙන්න, පර්සි."

"ඒකට කමක් නෑ."

"ඒක මේ..." එයා වෙවුලුවා. "මකුළුවෝ."

"අරච්නේගේ කතාව නිසා නේද," මම අනුමාන කළා. "ඔයාගේ අම්මාට වියමන් තරගෙකට අභියෝග කරපු නිසා ඇතීනා එයාව මකුළුවෙකුට හැරෙව්වා, හරිද?"

ඇනබෙත් ඔළුව වැනුවා. "එදා ඉඳලා අරච්නේගේ දරුවෝ ඇතීනාගේ දරුවන්ගෙන් පළි ගන්නවා. මම ඉන්න තැනින් හැතැප්මක් ඇතින් මකුළුවෙක් හිටියත් උං මාව හොයා ගනී. ඒ ජරා සත්තු මට පේන්න බැහැ. කොහොම වුණත්, මම ඔයාට ණයයි."

"අපි එක කණ්ඩායමක්, මතකයි නේ?" මම කිවුවා. "ඒ ඇරත්, අපේ ග්‍රෝවර්ත් ලස්සනට ඉගිළුණා නේ."

එයාට නින්ද ගිහින් ඇති කියලා මම හිතුවත්, කොණක ඉඳන් එයා කෙඳිරුවා. "මං ඒක නියමෙටම කළා, නැද්ද?"

ඇනබෙත්ටයි මටයි හිනා ගියා.

ඇනබෙත් මගේ අතට විස්කෝතුවක් දුන්නා. "අයිරිස්-මැසේජ් එකේදී... ඇත්තටම, ලූක් මොනවත් කිවුවේ නැද්ද?"

මම විස්කෝතුව විකමින් එයාට දිය යුතු උත්තරය කල්පනා කළා. දේදුන්න හරහා සිදුවූ කතාබහ මුළු හවස් වරුව පුරාම මගේ හිතට වධ දුන්නා. "ලූක් කිවුවා ඔයාලා දෙන්නා කාලෙක ඉඳන් අඳුරනවා කියලා. තව, එයා කිවුවා ග්‍රෝවර් මේ සැරේ වරද්ද ගන්නේ නැතිවෙයි කියලා. කවුරුවත් පයින් ගහකට හැරෙන්නේ නැතිවෙයි කිවුවා."

කඳු තලයෙන් පිටවූ තුනී එළියෙන් එයාලාගේ මුහුණුවල පළ වූ හැඟීම් කියවන්න අමාරු වුණා.

ග්‍රෝවර් දුක්මුසු කොටළු හඬක් පිට කළා.

"මුලදීම ඔයාට ඇත්ත කියන්න මට තිබ්බෙ." එයාගේ කටහඬ වෙවුලුවා. "ඒත්, මං කොච්චර වැඩකට නැති එකෙක්ද කියලා දැනගත්තාම, මාව එක්ක යන්න ඔයාට ඕනෑ වෙන්නැති වෙයි කියලා මට හිතුණා."

"සියුස්ගේ දුව, තාලියාව බේරාගන්න ගිය සැටර් ඔයා නේද?"

ග්‍රෝවර් නොසතුටෙන් ඔළුව වැනුවා.

"එතකොට, කරදරයක් නැතිව කඳවුරට ආව තාලියාගේ අර්ධ-ලෝහිත යාළුවෝ දෙන්නා..." මම ඇනබෙත් දිහා බැලුවා. "ඒ ඔයා යි, ලූක් යි, එහෙම නේද?"

එයා විස්කෝතුව නොකාම පැත්තකට දැමුවා. "ඔයා කිවුවත් වගේ, පර්සි, අවුරුදු හතක අර්ධ-ලෝහිතයෙක්ට ඒ තරම් දුරක් තනියම යන්න බැහැ. ඇතීනා මට උදවු ගන්න පුළුවන් තැනකට මාව යැවුවා. එතකොට, තාලියාට අවුරුදු දොළහයි. ලූක්ට දහ හතරයි. එයාලාත් මං වගේම ගෙවල්වලින් පැනලා ආපු අය. මාවත් එක්ක යන්න එයාලා කැමති වුණා. එයාලා... පුහුණුවක් නැතුව වුණත් පුදුම හිතෙන විදිහට රාක්ෂයෝ එක්ක සටන් කළා. අපි සැලසුමක් නැතුවම වර්ජිනියාවලින් උතුරට ගියා. සති දෙකක් විතර එහෙම යනකොට ග්‍රෝවර් අපිව හොයාගත්තා."

"මට කියලා තිබ්බේ තාලියාව කඳවුරට එක්ක එන්න කියලා." ග්‍රෝවර් නහය උඩට අදිමින් කිවුවා. "තාලියාව විතරයි. ගලවාගැනීම පරක්කු කරන සිසිම දෙයක් කරන්න එපා කියලා කයිරොන් මට තදින්ම අණ කරලා තිබුණා. හේඩීස් එයාගේ පස්සෙන් එනවා කියලා

අපි දැනගෙන හිටියා. ඒත්, ලූක්වයි ඇනබෙත්වයි තනියම දාලා යන්න මට බැරි වුණා. මං හිතුවා... මං හිතුවා ඒ තුන්දෙනාවම පරිස්සමෙන් එක්ක යන්න මට පුළුවන් වෙයි කියලා. කාරුණික ඇත්තෝ අපේ පස්සෙන් ආවේ මගේ වැරැද්ද නිසා. මම හොඳටම බය වුණා. ආපහු කඳවුරට එද්දී බයටම මම පාර වරද්දගෙන තිබුණා. මම තව චුට්ටක් ඉක්මන් වුණා නම්..."

"ඔක නවත්ත ගන්න," ඇනබෙත් කිවුවා. "කවුරුවත් ඔයාට දොස් කියන්නේ නැහැ. තාලියා ඔයාට දොස් කිව්වෙත් නැහැ."

"එයා අපිව බේරගන්න එයාගේ ජීවිතේ කැප කළා," එයා දුකෙන් කිවුවා. "එයා මැරුණේ මගේ වැරැද්ද නිසා. විදාරීත වැඩිහිටියන්ගේ මණ්ඩලේ කිව්වෙත් එහෙමයි."

"ඔයා අනිත් අර්ධ-ලෝහිතයෝ දෙන්නව මඟ දාලා ආවේ නැහැ කියලද?" මම ඇසුවා. "ඒක මහ අසාධාරණ කතාවක් නේ."

"පර්සි හරි," ඇනබෙත් කිවුවා. "ඔයා හිටියේ නැත්නම් මං අද මෙතැන නැහැ, ග්‍රෝවර්. ලූක් ත් නැහැ. මණ්ඩලේ අය මොනවා කිව්වත් අපි ගණන් ගන්නෑ."

ග්‍රෝවර් කළුවරේ හිඳගෙන දිගටම සුසුම් හෙළුවා. "ඒක මගේ වෙලාව තමයි. මෙච්චර කාලෙකට හිටපු තරකම සැටර් මං වෙලත්, මේ සියවසේ බලගතුම අර්ධ-ලෝහිතයෝ දෙන්නාව මම හොයා ගත්තා, තාලියායි, පර්සියි."

"ඔයා වැඩකට නැති කෙනෙක් නෙවෙයි," ඇනබෙත් ස්ථිර ලෙස කිවුවා. "මට මුණ ගැහිලා තියෙන හැම සැටර් කෙනෙක්ටම වඩා ඔයා නිර්භීතයි. පාතාල ලෝකෙට බහින්න කැමති වෙන එක්කෙනෙක්ගේ නමක් කියන්න පුළුවන්ද. ඔයා මෙතැන ඉන්නවට පර්සි ගොඩක් සතුටු වෙනවා කියලා මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා."

එයා මගේ කකුලට පයින් ගැසුවා.

"ඔව්," එයා මට පයින් නොගැසුවත් මම එහෙම කියනවා. "ඔයා මාවයි, තාලියාවයි හොයා ගත්තේ වාසනාව නිසා නෙවෙයි, ග්‍රෝවර්. සැටර්ලාගෙන් හොඳම හිතක් තියෙන්නේ ඔයාට. ඔයා ස්වාභාවිකවම සොයන්නෙක්. අන්න ඒ හින්දා තමයි පෑන්ව හොයාන්න කෙනා ඔයා වෙන්නේ."

ඇඹුරු. කාංසිමත් සුසුම්ක හඬක් මට ඇහුණා. ග්‍රෝවර් මොනවාහරි කියන තුරු මම බලා සිටියත්, එයාගේ හුස්ම ඇහීම ටිකෙන් ටික බර වුණා. ඒ හඬ ගෙරවීමකට පෙරළෙද්දී එයාට නින්ද ගිය බව මම තේරුම් ගත්තා.

"එයා කොහොමද එහෙම කරන්නේ?" මම පුදුම වුණා.

"අනේ මන්දා," ඇනබෙත් කිව්වා. "හැබැයි, ඔයා එයාට එහෙම කිව්ව එක නම් හොඳයි."

"මං ඇත්තටමයි ඒ කිව්වේ."

කැම් ගෝනි උඩ ගැස්සෙමින්, සැතපුම් කීපයක් යන තුරු අපි නිහඬව සිටියා. සීබ්‍රා ටර්නිප් අලයක් ලෑටි ගෑවා. තොලේ රැඳුණ අන්තිම මස් කෑල්ලත් ලෙව කෑව සිංහයා බලාපොරොත්තු සහගතව මගේ දිහා බැලුවා.

ඇනබෙත්, එයාගේ මාලය අතගාන්න ගත්තේ, යුද්ධෝපායක් ගැන මරටම කල්පනා කරනවා වගෙයි.

"ඔය පයින් ගහ තියෙන පබළුව," මම ඇසුවා. "ඒක ලැබුණේ ඔයාගේ පළවෙනි අවුරුද්දටද?"

එයා ඒ දෙස බැලුවා. කරමින් සිටි දේ ගැන එයාට වැටහීමක් තිබිලා නැහැ වගෙයි.

"ඔව්," එයා කිව්වා. "හැම අගෝස්තුවකම, උපදේශකයෝ ඒ ගිම්හානයේ සිද්ධ වෙච්ච විශේෂම සිදුවීම තෝරගෙන, ඒක ඒ අවුරුද්දේ පබළුවේ අඳිනවා. මගේ ළඟ තියෙනවා තාලියාගේ පයින් ගහයි, ගිනිගත්ත ග්‍රීක නැවයි, සෑදෑ ගවුමක් ඇඳපු නරාග්වයායි - ඒක තමයි මරුම ගිම්හාන සෘතුව..."

"ඔයාගේ තාත්තාගේ විශ්වවිද්‍යාල මුද්දයි?"

"ඒකෙන් ඔයාට වැඩක් -" එයා කියන්න ගිය දේ නවත්වා ගත්තා. "ඔව්, ඔව්. ඒකයි."

"ඔයාට ඒ ගැන කියන්න බැරි නම් කමක් නැහැ."

"නෑ... ඒකට කමක් නෑ." එයා සැලෙන හුස්මක් ගත්තා. "ගිම්හාන සෘතු දෙකකට කලින්, මගේ තාත්තා ලියුමක් එක්ක මේක මට එව්වා. ඒ මුද්ද හරියට, ඇතීනාගෙන් එයාට ලැබුණ සිහිවටන තෑග්ගක් වගෙයි. ඇතීනා නොහිටින්න එයාට හාර්වඩ් විශ්වවිද්‍යාලයේ

පශ්චාත් උපාධි වැඩ කරගන්න ලැබෙන්නේ නැහැ... ඒක දිග කතාවක්. කොහොම හරි, ඒක මං තියාගන්නවා දකින්න එයාට උවමනායි කියලා තාත්තා කිව්වා. එයා මට ආදරෙයි, එයාට මං නැතුව පාළුයි කියලත්, තරුමයෙක් වගේ හැසිරුණාට මගෙන් සමාව ඉල්ලාත් තිබුණා. මං ගෙදර එනවා නම් එයා කැමති වුණා."

"ඒකේ එච්චර නරකක් පේන්නේ නැහේ."

"ඔව්, හොඳයි... ප්‍රශ්නේ වුණේ, මම තාත්තාව විශ්වාස කරපු එකයි. ගෙදර ගිහින්, ඉස්කෝලේ ඒ වසර සම්පූර්ණ කරන්න මම බැලුවා. ඒත්, මගේ කුඩම්මා වෙනස් වෙලා හිටියේ නැහැ. මං වගේ විකාරකාරියක් එක්ක ජීවත් වෙලා එයාගේ දරුවන්ව අනතුරේ දාන්න එයාට ඕනෑ වුණේ නැහැ. ඉතින්, රාක්ෂයෝ පහර දෙනවා - අපි රණ්ඩු වෙනවා. රාක්ෂයෝ පහර දෙනවා - අපි රණ්ඩු වෙනවා. ශීත සෘතු නිවාඩුව දෙනකල්වත් මට එහෙ ඉන්න බැරි වුණා. මම කයිරොන්ට කතා කරලා, ආපහු කෙලින්ම අර්ධ-ලෝහිත කඳවුරට ආවා."

"ඔයා ආයේ කවදාවත් තාත්තා එක්ක ජීවත් වෙන්න හිතන්නේ නැද්ද?"

එයා මගේ ඇස් මඟ හැරියා. "මං, මටම වධ දෙන්න කැමති නැහැ."

"ඔයා බලාපොරොත්තු අත අරින්න එපා," මම එයාට කිව්වා. "ඔයා තාත්තාට ලියුමක්වත් ලියන්න."

"උපදේශයට ස්තුතියි," එයා උනන්දුවක් නැතිව කිව්වා. "ඒත්, එයාට ජීවත් වෙන්න ඕනෑ කවුරු එක්කද කියලා මගේ තාත්තා තෝරාගෙන ඉවරයි."

අපි තවත් සැතපුම් කීපයක් නිහඬව ගියා.

"එතකොට, දෙවිවරු යුද්ධ කරන්න ගත්තොත්," මම ඇසුවා. "හැමදේම ට්‍රෝජන් යුද්ධයේදී වුණා වගේ වෙයිද? පොසෙයිඩන්ට එදිරිව ඇතීනා සටන් කරයිද?"

ඒරීස්ගෙන් ලැබුණු ගමන් මල්ල උඩ ඔළුව තියාගත් එයා ඇස් පියාගත්තා. "මගේ අම්මා මොනවා කරයිද මං දන්නේ නෑ. මම දන්නේ, සටනේදී මම ඔයා ළඟින්ම ඉන්නවා කියන එක විතරයි."

"ඇයි?"

"ඔයා මගේ යාළුවා නිසා, පාසි මොළේ. තව මොඩ ප්‍රශ්න තියෙනවද?"

ඒකට උත්තරයක් මට හිතාගන්න බැරි වුණා. වාසනාවකට මට එහෙම කරන්න උවමනා වුණේත් නැහැ. ඈනබෙත්ට නින්ද ගිහින්.

ග්‍රෝවර්ගේ ගෙරවීමත්, බඩගිනි බැල්මෙන් මගේ දිහා බලා සිටි ඇලි සිංහයාත් නිසා ඈනබෙත්ව අනුගමනය කරන්න මට අපහසු වුණත්, අන්තිමේදී, මමත් ඇස් පියාගත්තා.

මීට කලින් මිලියන වතාවක් විතර දක තිබුණු විදිහට මගේ නපුරු සිහිනය පටන් ගත්තා: ඇඟටම හිර වූ කමිසයක් හැඳගෙන, ප්‍රමිතිකරණ විභාගයකට පෙනී සිටීමට මට සිදු වී තිබුණා. අනෙක් ළමයි විවේක කාලයේ එළියට ගියත්, ගුරුවරයා දිගින් දිගටම මට කෑගසන්න ගත්තා, ඉක්මන් කරන්න, පර්සි. ඔයා මෝඩයෙක් නෙවෙයි නේද? ඔයාගේ පැන්සල අතට ගන්න.

ඊට පස්සේ, සිහිනය වෙනදාට වඩා වෙනස් වුණා.

මගේ පසෙක තිබූ මේසය දෙස බලද්දී, ඇඟටම හිර වූ කමිසයක් හැඳගත් ගැහැනු ළමයෙක් එහි වාඩි වී සිටිනවා මට පෙනුණා. මගේ වයසේ සිටි එයාට නොහික්මුණු කළු කොණ්ඩයකුත්, ඇස් ආලේපන ගැල්වූ, කැලඹෙන කොළ පාට ඇස් දෙකකුත්, ලප විසිරුණු නහයකුත් තිබුණා. කොහොම වුණත්, එයා කවුද කියලා මම දන සිටියා. එයා තමයි සියුස්ගේ දුව, තාලියා.

ඇගට හිර වූ ඇඳුම සමග ඔට්ටු වූ එයා, මට රවමින් කෑගැසුවා. හොඳයි පාසි මොළේ? අපි දෙන්නාගෙන් එක්කෙනෙක් මේකෙන් ගැලවෙන්න ඕනෑ.

එයා හරි, මගේ සිහින-ස්වරූපය සිතුවා. මම ආපහු ගුහාවට යනවා. හේඩීස්ට හොඳවයින් දෙකක් කියන්න මං යනවා.

හිර ඇඳුම මගෙන් ඉවතට දිය වී ගියා. පන්ති කාමරයේ පොළොව තුළින් මාව වැටෙන්න ගත්තා. ගුරුතුමාගේ හඬ සීතල සහ යක්ෂ හඬකට හැරිලා, මහා ආගාධයක පතුලකින් නැගෙන දෝංකාරයක් වගේ වෙන තුරු වෙනස් වුණා.

පර්සි ජැක්සන්, එය කිවුවා. ඔව්, මට පේන්නේ, හුවමාරුව හොඳට කෙරුණා.

මළවුන්ගේ ආත්ම මගේ වටා ලිස්සා යන, අඳුරු ගුහාව තුළට මම ආපසු ගොස් සිටියා. ආගාධය තුළ අදෘශ්‍යමානව, යක්ෂ හඬ කතා කරමින් සිටියත්, මේ වතාවේ ඒ ඇමතීම මං වෙනුවෙන් නෙවෙයි. ඒ හඬේ වූ ඇඟ හිරිවට්ටන බලය වෙනත් දිසාවකට යොමු වී තිබුණා.

එතකොට, එයා මුකුත් සැක කළේ නැද්ද? එය ප්‍රශ්න කළා.

මට හොඳින්ම හුරුපුරුදු කටහඬක් මගේ උරහිස අසල සිට එයට උත්තර දුන්නා. නැහැ, මගේ උතුමාණෙනි. එයත් අනිත් අය වගේම මෝඩයෙක්.

මම ආපසු හැරී බැලුවත්, එතැන කිසිවෙක් සිටියේ නැහැ. කතා කරන කෙනා අදෘශ්‍යමානවයි සිටියේ.

රැවටිල්ලක් පිට රැවටිල්ලක්, පාතාලයේ හඬ තාලයට කිවුවා. අති විශිෂ්ටයි.

ඇත්තටම, උතුමාණෙනි, මට පුරුදු කටහඬ කිවුවා, කපටි තැනැත්තා ලෙස ඔබතුමාව නම් කරලා තියෙන එක සාධාරණයි. ඒත්, ඒක ඇත්තටම උවමනාද? මම හොරකම් කරපු දේ කෙලින්ම ඔබතුමා ළඟට අරන් එන්න මට පුළුවන්කම තිබුණා -

නුඹ? රාක්ෂ හඬ අවඥාවෙන් ඇසුවා. නුඹ දනටමත් නුඹේ සීමාවන් පෙන්නලා ඉවරයි. මම මැදිහත් නොවුණා නම්, නුඹ මාව සම්පූර්ණයෙන්ම අසාර්ථක කරනවා.

ඒත්, මගේ උතුමාණෙනි -

සන්සුන් වෙන්න, පුංචි දාසයෝ. අපේ හය මාසයෙන් අපිට ගොඩක් දේවල් ලැබුණා. සියුස්ගේ තරහා වැඩි වුණා. පොසෙයිඩන්, එයාගේ අන්තිම තුරුම්පුවත් ඇද්දා. දන්, අපිට පුළුවන් ඒක එයාට විරුද්ධවම පාවිච්චි කරන්න. ඉක්මනටම, නුඹ ප්‍රාර්ථනා කළ තෑග්ග නුඹට ලැබේවි. ඒ වගේම, නුඹේ පළියත් ලැබේවි. බඩු දෙකම මගේ අතට ලැබුණු ගමන්ම... පොඩ්ඩක් ඉන්න, එයා මෙතැන ඉන්නවා.

මොනවා? හදිසියේම, අදෘශ්‍යමාන දාසයාගේ හඬ ගැස්සුණා. ඔබතුමා එයාව කැඳෙව්වාද, උතුමාණෙනි?

නෑ. යක්ෂ අවධානයේ මුළු බලයම මා මතට වැගිරුණේ මාව එතැනම ගල් කරමින්. එයාගේ තාත්තාගේ ලෙයට ශාප වෙන්න - එයා ගොඩක් වෙනස් වෙන සුළුයි, එයාව කලින්ම හොයා ගන්න අමාරුයි. ඒ කොල්ලා තනියෙන්ම මෙතැනට ඇවිත්.

Scanned with CamScanner

ඒක වෙන්න බැහැ! දාසයා කෑගැසුවා.

බාගදා, තුඹ වගේ නිවටයෙක්ට බැරුව ඇති. කටහඬ ගෙරෙව්වා. ඊට පස්සේ, එහි සීතල බලය මගේ දෙසට යොමු වුණා. ඉතින්... තුඹගේ ගවේෂණය හීනෙන් දකින්න තුඹ කැමතිද, තරුණ අර්ධ-ලෝහිතයෝ? එහෙනම් මම උදවු කරන්නම්.

දර්ශනය වෙනස් වුණා.

කළු ගරුඬ බිත්ති සහ ලෝකඩ පොළොවක් ඇති අපරිමාණ සිංහාසන ශාලාවක් තුළ මම සිටගෙන සිටියා. මිනිස් ඇටකටු එකට පෑස්සීමෙන් සෑදූ භයානක, හිස් සිංහාසනයක් එහි තිබුණා. වේදිකාව පාමුල රන්වන් එළියක් තුළ ගල්වෙලා, අත් විදහාගෙන මගේ අම්මා සිටියා.

මම එයා ළඟට යන්න උත්සාහ කළත්, මගේ කකුල් සෙලවුණේවත් නැහැ. මම එයා දෙසට අත දිගු කළා. මගේ අත ඇටකටුවලටම වියළී යන බව මට තේරුම් ගියේ එතකොටයි.

ග්‍රීක යුද සන්නාහවලින් සැරසුණු, විරිත්තාගත් ඇටසැකිලි මගේ වටේ රොක්වෙලා, මට සේද ලෝගු අන්දවමින්, ලෝරල් මල්වලින් මගේ හිස සරසද්දී, විමෙරාගේ විෂෙන් දුම් දමූ ඒ මල් මගේ හිස්කබල තුළටම පිළිස්සෙන්න වුණා.

යක්ෂ හඬ හිනා වුණා. සැරදේවා, ජයග්‍රාහී වීරයා!

මම ගැස්සිලා ඇහැරුණා.

ග්‍රෝවර් මගේ උරහිස සොලවමින් සිටියා. "ට්‍රක් එක නැවතුණා," එයා කිවුවා. "අපි හිතන්නේ එයාලා සත්තු බලන්න එනවද කොහෙදෝ."

"හැංගෙන්න!" ඇනබෙත් දත් අතරින් කිවුවා.

එයාට නම් ඒක ලේසියි. යැන්කි කැප් එක දමාගත් එයා අතුරුදහන් වුණා. ග්‍රෝවර්ටයි මටයි කෑම ගෝනි පිටුපස හැංගිලා, අපිවත් ටර්නිප් වගේ පෙනේවි කියලා බලාපොරොත්තු වෙන්න වුණා.

ට්‍රේලරයේ දොර හඬ නගමින් ඇරුණා. ඉර එළිය සහ උණුසුම ඇතුළට වැහිරුණා.

"හපෝයි!" ට්‍රක් රියැදුරෙක් කිවුවේ එයාගේ කැත හනය ඉදිරියෙන් අතක් වනමිනුයි. ඇතුළට ගොඩ වූ එයා සතුන්ගේ භාජනවලට වතුර පිරෙව්වා.

"උඹට රස්නේද, ලොකු උන්නැහේ?" සිංහයාගෙන් ඇසූ එයා ජෝගුවේ ඉතිරි වතුර සියල්ලම සිංහයාගේ මුහුණට දැමුවා.

සිංහයා තරහින් ගර්ජනා කළා.

"ඔව්, ඔව්, ඔව්." පිරිමියා ඇද කළා.

මට එහා පැත්තේ, ටර්නිප් ගෝනි යට සිටි ග්‍රෝවර්ට රිස්සුම් නැති වුණා. සාමයට ලැදි ශාක භක්ෂකයෙක් විදිහට බලද්දී එයාට තිබුණේ හරිම මිනීමරු පෙනුමක්.

රියැදුරා ඇන්ටිලෝපයා දෙසට තැළුණු හැපි මීල් මල්ලක් විසි කළා. එයා සීබ්‍රාට බොරු හිනාවක් පෑවා. "උඹට කොහොමද, ඉරි අප්පු? අඩු තරමේ, මෙතැනදී අපි උඹෙන් ගැලවෙනවා. උඹ මැජික් සංදර්ශනවලට කැමතිද? උඹ මේකට නම් ගොඩක් කැමති වෙයි. එයාලා උඹව දෙකට ඉරන්නයි යන්නේ!"

බියෙන් ඇස් ලොකු කරගත් සීබ්‍රා කෙලින්ම මගේ දිහා බැලුවා.

කිසිම හඬක් නොනැගුණත්, දහවල තරම් පැහැදිලිව සීබ්‍රා මට කතා කරන හඬ ඇහුණා: කරුණාකරලා, මාව නිදහස් කරන්න, ස්වාමිනි.

එයට ප්‍රතිචාර දක්වන්න බැරි තරමටම මම පුදුමයෙන් ගල් ගැසුණා.

ට්‍රේලරයේ පසෙකින් තද ටොක්, ටොක්, ටොක් හඬක් ඇහුණා.

"ඔහේට මොනවද ඕනෑ, එඩී?" ඇතුළේ සිටි පිරිමියා කෑගැසුවා.

එඩීගේ විය යුතු කටහඬක් එළියේ සිට ආපසු කෑගැසුවා, "මොරිස්? ඔහේ මොනවද කිවුවේ?"

"ඇයි ඔහේ තට්ටු කළේ?"

ටොක්, ටොක්, ටොක්.

"මොන තට්ටු කිරිල්ලක්ද?" එළියේ සිට එඩී මොරදුන්නා.

ඇස් රෝල් කළ මෝරිස් මෝඩයෙක් වගේ හැසිරීම ගැන එඩීට ශාප කරමින් ආපසු එළියට ගියා.

Scanned with CamScanner

තත්පරයකට පසු ඇනබෙත් මගේ ළඟින් මතු වුණා. එයා නවිටු කිරීම් කරන්න ඇත්තේ මෝරිස්ව පිටතට යවන්නයි. "මේ සත්ත්ව වෙළඳාම නීත්‍යානුකූල වෙන්න බැහැ," එයා කිව්වා.

"විහිළුවක් නෙවෙයි," ග්‍රෝවර් කිව්වා. එයා නැවතුණේ ඒකට කන් දෙන්න වගෙයි. "සිංහයා කියනවා මේ අය සත්ත්ව ජාවාරම්කාරයොලු!"

ඒක ඇත්ත. මගේ හිත තුළ සීබ්‍රාගේ හඬ කිව්වා.

"අපි එයාලව නිදහස් කරන්න ඕනෑ!" ග්‍රෝවර් කිව්වා. ඒ දෙන්නාම මගේ දිහා බලා සිටියේ, මගේ මෙහෙයවීම ලැබෙන තුරුයි.

මට සීබ්‍රා කතා කරන හඬ ඇසුණත්, සිංහයාගේ හඬ ඇසුණේ නැහැ. ඒ ඇයි? සමහර විට, ඒකත් ඉගෙනීමේ දුර්වලකමක් වෙන්න ඇති... මට තේරුම් ගන්න පුළුවන් සීබ්‍රාව විතරද? එතකොට, මට සිතුවිල්ලක් පහළ වුණා අශ්වයෝ. පොසෙයිඩන් අශ්වයන්ව නිර්මාණය කිරීම ඇනබෙත් මොනවද කිව්වේ?

සීබ්‍රාත් අශ්වයාට කිට්ටු සතෙක්ද? උන්ව මට තේරුම් ගන්න පුළුවන් වුණේ ඒ නිසාද?

කරුණාකරලා. මගේ කූඩුව අරින්න, ස්වාමීනි. ඊට පස්සේ මට කරදරයක් නැති වෙයි.

පිටත, එඩී සහ මෝරිස් එකිනෙකාට කෑගසා ගනිමින් සිටියා, ඒත්, ඕනෑම මොහොතක සතුන්ට වධ දීමට එයාලා ආපසු එන බව මම දැන සිටියා. රිප්ටයිඩ් ඩැහැගත් මම සීබ්‍රාගේ කූඩුවේ අගුල දෙබෑ කළා.

සීබ්‍රා වේගයෙන් එළියට පැන්නා. මගේ දෙසට හැරුණු එයා නැමී ආචාර කළා. ස්තුතියි, ස්වාමීනි.

අත් එසවූ ග්‍රෝවර් එළු හඬින් ආශිර්වාද කිරීමක් වගේ දෙයක් සීබ්‍රාට කිව්වා.

ඇසුණු ශබ්දය ගැන සොයා බැලීමට මොරිස් ඔළුව ඇතුළට ඔබද්දීම, සීබ්‍රා එයාට උඩින් පාරට පැන්නා. ඉන්පසු, මොරදෙන, යටිගිරියෙන් කෑගසන සහ වාහන නළා හඬවන ශබ්ද ගොඩාක් ඇසෙන්න ගත්තා. හෝටල්, කැසිනෝ සහ නියෝන් නාම පුවරු ගැවසීගත් මහ පාරේ පහළට සීබ්‍රා පිම්මේ දුවනවා දැක ගැනීමට අපි ට්‍රේලරයේ දොර අසලට දිව්වා. අපි මේ දැන් ලාස් වේගාස් නගරයට සීබ්‍රාවෙක් මුදා හැරියා.

ඌ පසුපස එඩී සහ මොරිස් දුවද්දී, එයාලා පසුපස පොලිස් නිලධාරීයෝ කීප දෙනෙකුත් කෑ ගසමින් දුවන්න වුණා, "හේයි! ඕකට ඔයාලා බලපත්‍ර ගන්න ඕනෑ!"

"අපිත් දැන් ගියොත් හොඳයි," ඇනබෙත් කිව්වා.

"අනිත් සත්තු මුලින්ම," ග්‍රෝවර් කිව්වා.

මම, මගේ කඩුවෙන් කූඩුවල අගුලු බින්දා. අත් එසවූ ග්‍රෝවර් සීබ්‍රාට කළ එළු ආශිර්වාදය ඒ සතුන්ටත් කළා.

"සුබ පැතුම්," මම එයාලාට කිව්වා. කූඩුවලින් පිටට පැන්න ඇන්ටිලෝපයා සහ සිංහයා එකටම පාරට පැන්නා.

සංචාරකයින්ගෙන් සමහරු කෑගැසුවා. වැඩි දෙනෙක් පිටුපසට වී ඡායාරූප ගත්තේ මෙයත් කැසිනෝ ප්‍රවර්ධන සූත්තරයක් කියා සිතමින් වෙන්න ඇති.

"සත්තුන්ට කරදරයක් නැතිවෙයි, නේද?" මම ග්‍රෝවර්ගෙන් ඇසුවා. "මං කිව්වේ, මෙහෙ තියෙන්නේ කාන්තාර ගොඩක් නේ -"

"ඒ ගැන බය වෙන්න එපා." එයා කිව්වා. "මං එයාලාට සැටර්ලාගේ අභය භූමියක් පිහිටෙව්වා."

"ඒ කියන්නේ?"

"ඒ කියන්නේ, එයාලා පරිස්සමින් කැලේකට යාවි." එයා උත්තර දුන්නා. "ජීවත් වෙන්න ආරක්ෂිත තැනක් හොයා ගන්නකල් වතුර, කෑම, ආවරණ වගේ එයාලාට ඕනෑ හැම දෙයක්ම එයාලාට ලැබේවි."

"අපිටත් ඒ ජාතියේ ආශිර්වාදයක් කරන්න ඔයාට බැරිද?" මම ඇසුවා.

"ඒක වැඩ කරන්නේ කැලෑ සත්තුන්ට විතරයි."

"එතකොට, ඒක වැඩ කරන්නේ පර්සිට විතරයි." ඇනබෙත් තර්ක කළා.

"අනේ යන්ඩ!" මම අමනාපය පෑවා.

"විහිළුවක් කළේ," එයා කිව්වා. "ඉක්මන් කරන්න. අපි මේ ජරා ට්‍රක් එකෙන් එළියට යමු."

Scanned with CamScanner

අපි කාන්තාරයේ දහවල තුළට පැකිළෙමින් අඩිය තැබුවා. එහි රත්නය අංශක එකසිය දහයක් තරම් වූ අතර, අපේ පෙනුම හැඹිරු හෙලේ බැදලා අරන් වගේ වුණා. ඒත්, සෑම දෙනාම කැලෑ සත්තු දිහා ලොකු උනන්දුවකින් බලා සිටියා මිසක් අපි ගැන අවධානයක් දක්වූයේ නැහැ.

මොන්ටෙ කාර්ලෝ, එම්.ජී.එම්. වගේ සුප්‍රසිද්ධ කැසිනෝ පසු කරමින් ගිය අපිට පිරමීඩ, මුහුදු මංකොල්ලකරුවන්ගේ නැවක් සහ ලිබර්ටි ප්‍රතිමාවේ අනුරුවක් දකින්න ලැබුණා. ඒ අනුරුව සැහෙන්න පුංචි වුණත්, එයින් මගේ ගෙදර යන ආශාව ඇවිස්සුණා.

අපි සොයමින් ගියේ මොකක්ද කියලා මට හරි තේරුමක් තිබුණේ නැහැ. සමහරවිට, අපි සොයන්න ඇත්තේ විනාඩි කිපයකට මේ රත්නයෙන් ගැලවිලා, සැන්ඩ්විච් එකක් සමග ලෙමනේඩ් වීදුරුවක් අරගෙන, බටහිරට යන්න අලුත් සැලැස්මක් හදාගන්න පුළුවන් තැනක්.

අපි වැරදි පැත්තකට හැරෙන්න ඇති. මොකද, පාරක් කෙළවර වෙන තැනක 'ලෝටස් හෝටලය සහ කැසිනෝව' ඉදිරියෙන් අපේ ගමන නැවතී තිබුණා. එහි දොරකඩ විශාල නියෝන් නෙළුම් මලක් එළිය විහිදමින් බැබළුණා. කිසිවෙක් ඇතුළට හෝ පිටතට නොගියත්, දිලිසෙන ක්‍රෝමියම් දොරවල් විවෘතව තිබුණේ වායු සමීකරණයේ මල් සුවඳ පිටතට ඉහිරවමිනුයි. සමහරවිට, ඒ නෙළුම් පොහොට්ටුවල සුවඳ වෙන්න ඇති. ඒත්, මම කවදාවත් ඒ මලක සුවඳ විඳ නැති නිසා ඒ ගැන මම දන සිටියේ නැහැ.

එහි සිටි දොරටු පාලක අපිට හිනාවක් පෑවා. "හේයි, ළමයිනේ. ඔයාලාට මහන්සි පාටයි. ඇතුළට ඇවිත්, වාඩි වෙන්න ඕනෑද?"

පහුගිය සතියක විතර කාලෙක ඉඳන් මම සැක සහිත වෙන්න ඉගෙන ගත්තා. ඔයා නොදන්නවා වුණත්, ඕනෑම කෙනෙක් රාක්ෂයෙක් හෝ දෙවියෙක් වෙන්න පුළුවන් කියන කාරණේ මම තේරුම් ගත්තා. ඒත්, මේ මනුස්සයා සාමාන්‍ය කෙනෙක් බව තේරුම් ගන්න මට එක බැල්මක් ප්‍රමාණවත් වුණා. ඒ හැරත්, කෙනෙක් ඒ තරම් අනුකම්පා සහගතව කතා කරනවා ඇසීමම මට සහනයක් වුණ නිසා ඔළුව වැනූ මම, අපි ඇතුළට එන්න කැමති බව කිවුවා. ඇතුළේදී, අපි වටපිට බලද්දීම ග්‍රෝවර් කෑගැසුවා, "වාව්!"

එහි සම්පූර්ණ ලොබියම යෝධ ක්‍රීඩාගාරයකට හරවා තිබුණා. තට්ටු හතලිහක් විතර උසට දිවෙන වීදුරු සෝපානයක් වටේ වෝටර්

ස්ලයිඩයක් දඟර ගැසිලා. බිත්ති දිගේ නැගීම සඳහා ගොඩනැගිල්ලේ එක් පැත්තක් සකසා තිබුණු අතරේ, එහි බන්ජී පැනීමට (ආරක්ෂාව සඳහා බන්ජී ලණුවක් කකුලේ බැඳ කරන පැනුම් ක්‍රීඩාව) පාලමකුත් තිබුණා. ඒ වගේම, එහි පුළුල් තිර රූපවාහිනී තරම් විශාල වීඩියෝ ක්‍රීඩා සිය ගාණක් තිබුණා. සරලව කියනවා නම්, ඔයා නම් කරන ඕනෑම ක්‍රීඩාවක් එතැන තිබුණා. ළමයි කිප දෙනෙක් ඒවායේ ක්‍රීඩා කරමින් සිටියත් එතැන මහ සෙනඟක් සිටියේ නැහැ. ඒ නිසා කිසිම ක්‍රීඩාවක් කරන්නට පෝලිමේ ඉන්න සිදුවුණේ නැහැ. කෙනෙකුට සිතේ මවාගත හැකි සෑම කෑම වර්ගයක්ම සපයන හෝටල් සේවිකාවන් සහ කෑම කවුන්ටර එහි සෑම තැනම දකින්න ලැබුණා.

"හේයි!" හෝටල් සේවකයෙක් කතා කළා. අඩු තරමේ, එයා හෝටල් සේවකයෙක් කියලා මම අනුමාන කළා. නෙළුම් මල් මෝස්තර වැටුණු කහ සහ සුදු පාට හවායි කමිසයකුත්, කොට කලිසමකුත් හැඳ සිටි එයා රබර් සෙරෙප්පු කුට්ටමක් පැළඳගෙන සිටියා. "ලෝටස් කැසිනෝවට සාදරයෙන් පිළිගන්නවා. මෙන්න ඔයාලාගේ කාමරවල යතුරු."

"ම්, ඒත්..." මම ගොත ගැසුවා.

"නෑ, නෑ," එයා කිවුවේ සිනාසෙමින්. "බිල ගැන බලාගෙනයි තියෙන්නේ. අතිරේක අයකිරීම් නැහැ. සන්තෝසම් දෙන්න උවමනාත් නැහැ. උඩම තට්ටුවේ කාමර අංක 4001ට යන්නකෝ. ඔයාලාට තව මොනවා හරි උවමනා වුණොත් - හරියට, ඔයාගේ නාන බේසමට වැඩිපුර පෙණ ඕනෑ නම්, වෙඩි තියන්න පියාඹන ඉලක්ක මදි නම්, නැත්නම් වෙන ඕනෑම උවමනාවකට පිළිගැනීමේ කවුන්ටරයට කතා කරන්න. මේ තියෙන්නේ ඔයාලාගේ ලෝටස් ක්‍රෙඩිට් කාඩ්. මේවා කෑම, ක්‍රීඩා, ගමන්, ඕනෑම එකකට වලංගුයි."

එයා අපි තුන් දෙනාට කොළ පාට ප්ලාස්ටික් ක්‍රෙඩිට් කාඩ්පත් ලබා දුන්නා.

මෙතැන මොකක් හෝ වැරදීමක් සිදුවී ඇති බව මට තේරුණා. ඇත්තටම, එයා හිතුවේ අපි මිලියනපතියෙකුගේ ළමයි කියලා වෙන්න ඇති. කොහොම වුණත්, මම කාඩ්පතක් අතට ගත්තා. "මේකේ කීයක් තියෙනවද?"

එයාගේ ඇහිබැම් එකට ගැට ගැසුණා. "මොකක්ද ඔයා අදහස් කළේ?"

"මම ඇහුවේ, මේකේ තියෙන සල්ලි ඉවර වෙන්නේ කවදාවද?"

එයා හිනා වෙන්න ගත්තා. "ඔන්, ඔයා විහිළු කරනවා නේද, නේයි, ඒක නම් මරු. මෙහෙ ඉන්න ටිකේ හොඳට විනෝද වෙන්න."

සෝපානයෙන් ගිය අපි, අපේ කාමර පරීක්ෂා කර බැලුවා. ඒ කාමර කට්ටලයේ වෙන් වෙන්ව පිහිටි නිදන කාමර තුනකුත්, රස කැවිලි, සෝඩා සහ චිප්ස් පිරවූ කවුන්ටරයකුත්, කාමර සේවා ලබා ගැනීමට ක්ෂණික ඇමතුම් දුරකතනයකුත් තිබුණා. බූල් තුවා සහ වතුර පිරවූ මෙට්ට සමග පිහාටු කොට්ටත්, චන්ද්‍රිකා සම්බන්ධය සහිත පුළුල් තිර රූපවාහිනියක් සහ අධිවේගී අන්තර්ජාල සේවාවත් අපිට සපයා තිබුණා. සඳලුතලයේ වෙනම උණු වතුර නාන බේසමක් තිබුණා. කියූ විදිහටම, එහි පියාඹන ඉලක්ක විදින යන්ත්‍රයක් එක්ක තුවක්කුවක් තිබුණේ අපිට ලාස් වේගාස් අහසට මැටි පරෙවියෝ විදලා, ඒවාට වෙඩි තැබිය හැකි ලෙසයි. එහි නීත්‍යානුකූල බව ගැන මම දන සිටියේ නැතත්, එය ආසා හිතෙන වැඩක් බව මම තේරුම් ගත්තා. ඇතින් පෙනුණු කාන්තාරයේ දසුන් සිත්ගන්නාසුලු වූවත්, මේ වගේ කාමරයක ඉන්නකොට ඒ දර්ශන දිහා බලන්න අපිට කාලයක් තියේවිද කියන සැකය මගේ හිතට ආවා.

"ඔන්, දෙයියනේ," ඇනබෙත් කිවුවා. "මේ තැන නම්..."

"මරු," ග්‍රෝවර් කිවුවා. "මරේ මරු."

ඇඳුම් කුට්යක් පුරවා තිබූ ඇඳුම් මගේ මිම්මට හරියටම ගැලපුණා. මම ඒ දිහා රවා බැලුවේ ඒක ටිකක් අමුතු බව කල්පනා කරමින්.

ඒරිස්ගෙන් ලැබුණු ගමන් මල්ල මම කුණු කූඩයකට එබුවේ, තව දුරටත් එය උවමනා නැති නිසායි. මෙතැනින් පිට වෙද්දී හෝටල් ගබඩාවෙන් අලුත් එකක් ගන්න මට පුළුවන්.

වතුර මල යට සිටගත් මට සතියක කුණු වැකුණු ගමනින් පස්සේ නෑම සතීපදායක දෙයක් විදිහටයි දැනුණේ. මම ඇඳුම් මාරු කරගෙන, චිප්ස් පැකැට්ටුවක් හා කෝක් කෑන් තුනකුත් බඩට දමාගෙන කාමරයෙන් පිටට ආවේ කාලයකට පස්සේ දැනුණු සුව පහසුවත් එක්කයි. මගේ හිත අස්සේ මොකක්දෝ පුංචි ප්‍රශ්නයක් දිගින් දිගටම වධ දෙමින් තිබුණා. මම දැකපු සිහිනයක් හෝ ඒ වගේ දෙයක්... මගේ යාළුවෝ එක්ක කතා කරන්න මට ඕනෑ වුණා. ඒත්, ඒක පරක්කු වුණාට කමක් නැහැ කියලා මම හිතුවා.

මම නිදන කාමරයෙන් පිටතට එද්දී ඇනබෙත්, ග්‍රෝවර් දෙන්නාත් නාලා, ඇඳුම් මාරු කරගෙන සිටියා. ඇනබෙත් නැෂනල් ජියෝග්‍රැෆි චැනලය දමා ගත්තා අතරේ ග්‍රෝවර් හිත පිරෙන්නම බැදපු අල පෙති කමින් සිටියා.

"මෙච්චර බලන්න දේවල් තිබිලත් ඔයා නැෂනල් ජියෝග්‍රැෆි දාගෙන. ඔයාගේ මොළේ මොකක් හරි අවුලක් තියෙනවද?" මම එයාගෙන් ඇහුවා.

"ඒක ප්‍රයෝජනවත් නේ."

"මට හොඳ ගතියක් දැනෙනවා," ග්‍රෝවර් කිවුවා. "මං මේ තැනට හරි ආසයි."

ග්‍රෝවර් නොදැනුවත්වම එයාගේ සපත්තු ජෝඩුවෙන් තටු මතු වෙලා එයාව පොළොවෙන් අඩියක් විතර උඩට ඉස්සී, ආපසු බිමට පහත් වුණා.

"ඉතින්, දැන් මොකද කරන්නේ?" ඇනබෙත් ඇහුවා. "ටිකක් නිදාගමුද?"

මූහුණෙන් මූහුණ බලාගත් ග්‍රෝවර් සහ මම විරිත්තුවා. අපි දෙන්නාම, අපේ කොළ පාට ලෝටස් ක්‍රෙඩිට් කාඩ්පත් දිගු කළා.

"සෙල්ලම් වෙලාව," මම කිවුවා.

අන්තිමට හිතේ හැටියට විනෝද වූ දවසක් මගේ මතකයේවත් නැති තරම්. මම ආවේ ටිකක් දුප්පත් පවුලකිනුයි. විනෝද වෙනවා කියලා අපි අදහස් කළේ හෝටලයකින් කෑමක් කාලා, කුලියට චිත්‍රපටි තැටියක් අරන් බලන එකයි. වේගාස්වල තරු පහේ හෝටලයක දවසක් ගත කරන එක? හීනයක් වගෙයි.

බන්ජී පැනීම් පහ-හයක් කළ මම, වෝටර් ස්ලයිඩයේ හා කෘත්‍රිම හිම බෑවුම්වල ලිස්සා යෑමත්, වගේම එෆ්.බී.අයි. වෙඩික්කරුවෙකුගේ ක්‍රීඩාවත් කළා. සෙල්ලමකින් සෙල්ලමකට මාරු වෙද්දී මට කීප සැරයක්ම ග්‍රෝවර්ව දකින්න ලැබුණා. ප්‍රතිලෝම දඩයම් ක්‍රීඩාව - ඒ කියන්නේ, මුවා ගිහින් දඩයක්කාරයාට වෙඩි තියන ක්‍රීඩාවට එයා ඇත්තටම ආසා කළා. ඇනබෙත් පුංචි පුංචි වීඩියෝ ක්‍රීඩා සහ බුද්ධි පරීක්ෂණ සෙල්ලම් ජාති කරනවා මම දැක්කා. එතැන යෝධ ත්‍රිමාන රූපවලින් තමන්ගේම නගරයක් නිර්මාණය කරන්න පුළුවන් සෙල්ලමක් තිබුණා. එහිදී, ප්‍රක්ෂේපිත ගොඩනැගිලි ප්‍රදර්ශන පුවරුවේ

උඩට මතුවන ආකාරය තමන්ටම දක ගන්න පුළුවන්. මම ඒ ගැන වැඩිය නොසිතුවත්, ඇනබෙත් නම් ඒකට ගොඩාක් කැමති වුණා.

මොකක් හෝ වැරැද්දක් තියෙන බව මුලින්ම මට තේරුණේ කොයි වෙලාවෙද මන්දා.

සමහරවිට, ඒක සිද්ධ වෙන්න ඇත්තේ එෆ්.බී.අයි. වෙඩික්කරු ක්‍රීඩාව කරද්දී මට එහා පැත්තෙන් සිටි කොල්ලාව දක්කාට පස්සෙයි. මට හිතුණු විදිහට, එයාගේ වයස අවුරුදු දහ තුනක් විතර වුණත්, එයා හැඳ සිටි ඇඳුම්වල තිබුණේ විකාර පෙනුමක්. එයා එල්විස් ප්‍රෙස්ලිට පිස්සු වැටුණු තාත්තා කෙනෙක්ගේ පුතෙක් වෙන්න ඇති කියලා මම හිතුවා. බෙල් බොටම් කලිසමකුත්, කළු කරපටි ඇල්លූ රතු පාට ටී-ෂර්ට් එකකුත් හැඳ සිටි එයා කොණ්ඩය රැළි කර, ජෙල් තවරා තිබුණේ හරියට පාටියකට යන ගැහැනු ළමයෙකුගේ වගෙයි.

එෆ්.බී.අයි. වෙඩික්කරු ක්‍රීඩාව කරද්දී එයා කතා කළා, "නියමයි, බං. මම සති දෙකක් තිස්සේ මෙහෙ ඉන්නේ. දවසින් දවසට හොඳ හොඳ අලුත් සෙල්ලම් එනවා."

හරිම අමුතුයි?

පස්සේ, අපි කතා කරමින් ඉන්නකොට මොකක් හෝ දෙයක් 'වාවර්,' කියලා මං කියද්දී එයා මගේ දිහා පුදුමයෙන් බැලුවේ මීට කලින් කවදාවත්ම ඒ වචනය අහලා නැහැ වගෙයි.

එයාගේ නම ඩැරින් බව මට දැනගන්න ලැබුණා. ඒත්, මම එයාගෙන් ප්‍රශ්න අහද්දී මාව කරච්චලයක් වෙලා, ආපසු එයාගේ පරිගණක තිරය දෙසට හැරුණා.

"හේයි, ඩැරින්" මම කතා කළා.

"මොකද?"

"මේ අවුරුද්ද මොකක්ද?"

එයා මට රැවුවා. "ගේම් එකේද?"

"නැහැ. ඇත්තටම?"

එයාට ඒක කල්පනා කරන්න සිද්ධ වුණා. "1977."

"නෑ." මම කිවුවේ හිතට බයක් දැනෙද්දියි. "ඇත්තටම?"

"හේයි, මනුස්සයෝ. මට ගේම් ගහන්න තියෙනවා."

එයින් පස්සේ, එයා මාව ගණන් ගත්තේම නැහැ.

මම වටේ හිටිය මිනිස්සු එක්ක කතා කරන්න පටන් ගත්තා. ඒත් ඒක ලේසි වුණේ නැහැ. එයාලා රූපවාහිනී තිරවලට, ක්‍රීඩාවලට, කෑමවලට, නැත්නම් එයාලා කැමති ඕනෑම දේකට ඇලිලයි හිටියේ. මේ 1985 බව එක කොල්ලෙක් මට කිවුවා. තවත් කෙනෙක් කිවුවේ මේ 1993 කියලායි. ඒ හැම දෙනාම කියා සිටියේ එයාලා මෙතැන ඇවිත් වැඩි කාලයක් නැති බවයි, දවස් දෙක-තුනයි, වැඩිම වුණොත් සති දෙක-තුනයි. ඒ ගැන එයාලා හරියටම දන සිටියේ නැහැ වගේම ඒ ගැන සැලකිල්ලක් දක්වූයේත් නැහැ.

මටත් ඒක තේරුම් ගියේ ඉන් පසුවයි. මම කොච්චර කාලයක් මෙහෙ හිටියාද? මට පෙනුණේ නම් හරියට පැය දෙකක් විතරයි වගෙයි. ඒ වුණත්, ඇත්තටම එහෙමද?

අපි මෙතැනට ආව හේතුව මතක් කරගන්න මම උත්සාහ කළා. අපි ලොස් ඇන්ජලීස්වලට යමින් සිටියේ. අපිට කියලා තිබුණේ පාතාල ලෝකයට ඇතුළු වෙන දොරටුව හොයාගන්න කියලායි. මගේ අම්මා... එක බිහිසුණු තත්පරයකට, එයාගේ නම මතක් කරගන්න මට අමාරු වුණා. සැලී. සැලී ජැක්සන්. මම එයාව හොයාගන්න ඕනෑ. ඊළඟ ලෝක යුද්ධයට මුල පුරන්න කලින් මම හේඩීස්ව නවත්වන්න ඕනෑ.

ඇනබෙත් තවමත් එයාගේ නගරය ගොඩ නගනවා මම දක්කා.

"එන්න යමු," මම එයාට කතා කළා. "අපි කොහොම හරි මෙතැනින් එළියට යන්න ඕනෑ."

ප්‍රතිචාරයක් නැහැ.

මම එයාව සෙලෙව්වා. "ඇනබෙත්?"

එයා තරහින් මගේ දෙස බැලුවා. "මොකද?"

"අපි මෙතැනින් යන්න ඕනෑ."

"යන්න? ඔයා මොනවද කියවන්නේ? මම දැනුයි කුලුනු හැදුවේ."

"මේ තැන උගුලක්."

මම ආපහු එයාව සොලවනකල්ම එයාගෙන් ප්‍රතිචාරයක් නැහැ. "මොකද, අනේ?"

"අහන්න. පාතාල ලෝකේ. අපේ ගවේෂණය!"

"අයියෝ, පොඩ්ඩක් ඉන්න, පර්සි. තව විනාඩි දෙක තුනයි."

Scanned with CamScanner

"ඇනබෙත්, මෙතැන 1977න් ආව අයත් ඉන්නවා. කවදාවත් වයසට ගිහින් නැති ළමයි ඉන්නවා. ඔයා ඇතුළට ආවොත්, ඔයාට හැමදාම ඉන්න වෙනවා."

"ඉතින්?" එයා ඇසුවා. "මීට වඩා හොඳ තැනක් ඔයාට හිතාගන්න පුළුවන්ද?"

එයාගේ මැණික් කටුවෙන් අල්ලාගත් මම එයාව ක්‍රීඩාවෙන් ඇදලා ගත්තා.

"එයි!" කෑගැසූ එයා මට පහර දුන්නත්, වෙන කවුරුවත් අපි දෙස බලන්න කරදර වුණේ නැහැ. එයාලා හොඳටෝම කාර්යබහුල වෙලා.

මම එයාව මගේ ඇස් දෙසට හරවා ගත්තා. "මකුළුවෝ. ලොකු, බූල් මකුළුවෝ." මම කිවුවා.

එයින් එයාව ගැස්සුණා. එයාගේ බැල්ම පැහැදිලි වුණා. "අනේ, මගේ දෙයියනේ," එයා කිවුවා. "අපි කොච්චර වෙලා -"

"මම දන්නේ නෑ. ඒත්, අපට ග්‍රෝවර්ව හොයා ගන්න තියෙනවා."

ග්‍රෝවර් සොයමින් ගිය අපිට එයා තවමත් මුව දඩයක්කාර සෙල්ලම කරනවා දකින්න ලැබුණා.

"ග්‍රෝවර්!" අපි දෙන්නාම කෑගැසුවා.

"මැරියං, මිනිහෝ! මැරියං. මෝඩ, පරිසරේ හැඩි කරන එකා!"

"ග්‍රෝවර්!"

ප්ලාස්ටික් තුවක්කුව මගේ පැත්තට හැරවූ එයා කොකා ගස්සන්න පටන් ගත්තේ හරියට මමත් එයාගේ සෙල්ලමේ ඉලක්කයක් වගෙයි.

මම ඇනබෙත් දෙස බැලුවා, ඊට පස්සේ අපි දෙන්නාම ග්‍රෝවර්ගේ අත් දෙකෙන් අල්ලාගෙන ඇදගෙන ගියා. එයා කෑගසද්දී පියාඹන සපත්තු ජෝඩුවට පණ ඇවිත් එයාව අනෙක් පැත්තට අදින්න ගත්තා. "එපා! මම අලුත් ලෙවල් එකකට ගියා විතරයි! එපා!"

ලෝටස් හෝටල් සේවකයා අපි දිහාවට කඩිමුඩියේ ආවා. "
හොඳයි, ඔයාලා දැන් ඔයාලාගේ ප්ලැටිනම් කාඩ් ගන්න ලෑස්තිද?"

"අපි මෙහෙන් යනවා," මම එයාට කිවුවා.

"මොන තරම් ලැජ්ජාවක්ද," එයා කියද්දී, එයා ඒක ඇත්තටම අදහස් කළ බවත්, අපි මෙතැනින් ගියොත් එයාගේ හිත බිඳෙන බවත් මට හැඟුණා. "අපි ප්ලැටිනම් කාඩ් සාමාජිකයෝ වෙනුවෙන් තට්ටුවක්ම පුරවලා අලුත් ගේම් දැම්මා විතරයි."

එයා කාඩ්පත් දිගු කරද්දී එයින් එකක් මටත් ඕනෑ වුණා. එය ගත්තොත් මට කවමදාකවත් මෙතැනින් පිටවෙන්න නොලැබෙන බව මම දැනගෙන සිටියා. මම මෙහෙ නතර වෙලා, හැමදාටම සෙල්ලම් කරමින්. හැමදාම සතුටින් ඉඳීවි, ඊට පස්සේ, ඉක්මනින්ම මට මගේ අම්මාවත්, මගේ ගවේෂණයත්, සමහරවිට, මගේම නමත් අමතක වෙලා යාවි. මම හැමදාටම 'හරිම අගෙයි' ඩිස්කෝ ඩැරින් එක්ක වෙඩික්කරු ක්‍රීඩාව කරමින් ඉඳීවි.

කාඩ්පතක් ගැනීමට ග්‍රෝවර් අත දිගු කළත් එය ආපසු ඇදගත් ඇනබෙත්, "එපා, ස්තුතියි." කිවුවා.

අපි දොර දෙසට යද්දී කෑමවල සුවඳත්, ක්‍රීඩාවල හඬත් වැඩි වැඩියෙන් ආකර්ෂණීයව දැනෙන්න ගත්තා. උඩ තට්ටුවේ අපේ කාමර ගැන මට සිහිවුණා. අපිට එක රැයකට මෙහෙ නතර වෙන්න පුළුවන්, අදට විතරක්වත් ඇත්තම ඇඳක නිදාගන්න පුළුවන්...

ඉන්පසු, ලෝටස් කැසිනෝවේ දොරෙන් පිටතට පැන්න අපි පදික වේදිකාව දිගේ පණ කඩාගෙන දිව්වා. අපි ලෝටස් හෝටලයට ගිය දවසේම හවස් වරුව වගේ එදා දැනුණත්, එහි මොකක්දෝ වැරැද්දක් තිබුණා. කාලගුණය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. කාන්තාරයට අකුණු කොටමින්, කුණාටුවක් ඇති වී තිබුණා.

ඒරීස්ගේ ගමන් මල්ල මගේ උරහිසක එල්ලෙමින් තිබුණා. එය හරිම පුදුමයක් වුණේ, ඒ මල්ල කාමර අංක 4001 කුණු කූඩයට දැමූ බව මට හොඳටම විශ්වාස වූ නිසයි. ඒත්, ඒ මොහොතේ මට වඩ වෙන්න වෙනත් ප්‍රශ්න ඕනෑ තරම් තිබුණා.

ළඟම වූ පත්තර තට්ටුවක් අසලට දිවූ මම මුලින්ම කළේ අවුරුද්ද කියවන එකයි. දෙවියන්ට ස්තුති වෙන්න, ඒ අපි පිටත් වූ අවුරුද්දමයි. මම දිනය දැක්කේ ඊටත් පස්සේයි: ජූනි විසි වෙනිදා.

අපි ලෝටස් හෝටලයේ දවස් පහක් ඉඳලා.

උත්තරායනයට කලින් අපිට ඉතිරි වෙලා තිබුණේ තවත් එක දවසක් විතරයි. එක දවසකින් අපිට, අපේ ගවේෂණය සම්පූර්ණ කරන්න වෙනවා.

17

අපි වතුර ඇඳක් ගන්න සාප්පු සවාරියේ ගියා

ඒක ඇනබෙත්ගේ අදහසක්.

ඇත්තටම අපිට සල්ලි තියෙනවා වගේ අපිව කුලී රියක පිටුපසට පැටවූ එයා, "ලොස් ඇන්ජලීස්වලට," රියැදුරාට කිවුවා.

කටේ රඳවාගෙන සිටි සිගරට්ටුව සැපූ රියැදුරා අපිව මනින බැල්මක් හෙළුවා. "ඒක හැතැප්ම තුන්සීයක ගමනක්. ඒ හින්දා, මුලින්ම ඒකට ගෙවලා ඉන්ඩ වෙයි."

"ඔයා කැසිනෝ කාඩ් බාර ගන්නවද?" ඇනබෙත් ඇසුවා.

එයා උරහිස් ඇකිළුවා. "සමහර ඒවා ගන්නවා. ක්‍රෙඩිට් කාඩ් වගේම තමයි. ඉස්සෙල්ලම සල්ලි ගාණ බලන්ඩ වෙනවා."

ඇනබෙත් එයාගේ අතට කොළ පාට ලෝටස් කාඩ්පත දුන්නා.

එයා ඒ දෙස පරිස්සමින් බැලුවා.

"ඕකේ සල්ලි ගාණ බලන්න," ඇනබෙත් ආරාධනා කළා.

එයා ඒක යන්ත්‍රයට දැමුවා.

මුදල් යන්ත්‍රයේ මීටරය කැරකෙමින් විදුලි එළි දැල්වුණා. අන්තිමේදි, ඩොලර් ලකුණ ළඟින් අනන්ත ලකුණ මතු වුණා.

රියැදුරාගේ කටින් සිගරට්ටුව බිමට වැටුණා. එයා අපි දෙසට හැරුණේ ඇස් දෙකත් ලොකු කරගෙනයි. "ලොස් ඇන්ජලීස්වල කොහෙටද... අහ්, උත්තමාවියනි?"

"සැන්ටා මොනිකා ජැටියට," ඇනබෙත් ටිකක් කෙලින් වෙලා වාඩි වුණා. 'උත්තමාවිය' කෑල්ලට එයා ආසයි කියලා මට තේරුණා. "ඉක්මනින් අපිව අරන් ගියොත් ඉතුරු සල්ලිත් ඔයාටම තියාගන්න පුළුවන්."

සමහරවිට, ඒ කතාව එයා නොකියා ඉන්නයි තිබුණේ. මෝජේව් කාන්තාරය හරහා ගිය මුළු ගමන පුරාවටම කුලී රියේ වේග මීටරයේ කටුව අනූ පහෙන් පහළට බැස්සේම නැහැ.

ගමන අතරේදී අපිට කතා කරන්න ඇති තරම් කාලය ලැබුණා. මගේ අලුත්ම සිහිනය ගැන ඇනබෙත්ට සහ ග්‍රෝවර්ට කිව්වත්, මම ඒ ගැන මතකයට ගන්න උත්සාහ කරද්දී ඒ තොරතුරු වැඩි වැඩියෙන් අවුල් වුණා. ලෝටස් හෝටලය මගේ මතකය අක්‍රමවත් කරලා වගෙයි පෙනුණේ. අදෘශ්‍යමාන දාසයාගේ කටහඬ කොයි වගේද සිහි කරන්න මට අමාරු වුණත්, ඒක මම දන්නා කෙනෙකුගේ බව මට විශ්වාස වුණා. ඒ දාසයා පාතාලයේ සිටි යක්ෂයාට 'මගේ උතුමාණෙනි' හැර තවත් නමකින් කතා කළා... මොකක් හරි විශේෂ නමක් හෝ පටබැඳි නමක්...

"නිහඬ තැනැත්තා ද?" ඇනබෙත් යෝජනා කළා. "ධනවත් තැනැත්තා ද? ඒ දෙකම හේඩීස්ට කියන නම්."

"වෙන්න පුළුවන්..." මම කිව්වත්, ඒ එකක්වත් නිවැරදියි කියලා මට හිතුණේ නැහැ.

"ඒ සිංහාසන ශාලාව නම් හේඩීස්ගේ එක වගෙයි," ග්‍රෝවර් කිවුවා. "සාමාන්‍යයෙන් ඒක ගැන විස්තර කරලා තියෙන්නේ ඒ විදිහට තමයි."

මම ඔළුව හෙල්ලුවා. "මෙතන මොකක් හරි වැරැද්දක් තියෙනවා. හීනේ ප්‍රධාන කොටස සිංහාසන ශාලාව නෙවෙයි. එතකොට, පාතාලයෙන් ඇහුණ කටහඬ... අනේ මන්දා, ඒක දෙවියෙක්ගේ හඬක් වගේ නම් දැනුණේ නැහැ."

ඇනබෙත්ගේ ඇස් ලොකු වුණා.

"මොකද?" මම ඇසුවා.

Scanned with CamScanner

"ඔව්, මුකුත් නැහැ. මං මේ නිකං - නෑ, ඒ හේඩීස්ම වෙන්න ඕනෑ. සමහරවිට, එයා ප්‍රධාන අකුණ ගන්න මේ අද්‍යශ්‍යමාන හොරාව යවන්න ඇති. ඊට පස්සේ, මොකක් හරි වරදින්න ඇති -"

"මොකක් වගේද?"

"මම - මම දන්නේ නෑ," එයා කිවුවා. "කොහොමත්, එයා ඔලිම්පස්වලින් සියුස්ගේ බලයේ සංකේතය හොරකම් කළා නම්, ඊට පස්සේ, දෙවිගොල්ලෝ එයාගේ පස්සෙන් පන්නනවා නම්, මං කියන්නේ, ගොඩාක් දේවල් වරදින්න පුළුවන් නේ. ඉතින්, එක්කෝ මේ හොරාට අකුණ හංගන්න සිද්ධ වෙන්න ඇති. එහෙම නැත්නම්, එයාගේ අතින් ඒක නැති වෙන්න ඇති. කොහොම හරි, ඒක හේඩීස් ළඟට ගෙනියන්න එයාට බැරි වුණා. ඔයාට හීනෙන් ඇහුණ කටහඬ කිවුවේ එහෙමයි, නේද? ඒ කෙනා අසාර්ථක වුණා. බස් එකේදී ෆියුරිලා හෙව්වේ මොකක්ද කියලා ඒකෙන් පැහැදිලි වෙනවා. සමහරවිට, අපි අකුණ හොයාගත්තා කියලා එයාලා හිතන්න ඇති."

එයාට තිබුණු කරදරය මොකක්ද මම දන සිටියේ නැහැ. ඒත්, එයා සුදුමැලි වෙලා.

"ඒත්, මම දනටමත් අකුණ හොයාගෙන නම්, මං මොකටද පාතාල ලෝකෙට යන්නේ?" මම ඇසුවා.

"හේඩීස්ට තර්ජනය කරන්න," ග්‍රෝවර් යෝජනා කළා. "එයාට අල්ලසක් දීලා හරි, තර්ජනය කරලා හරි ඔයාගේ අම්මාව ආපහු ගන්න."

මම උරුවම් බෑවා. "එළුවෙක් විදිහට ඔයාට තියෙන්නේ මහ දුෂ්ට අදහස් නේ."

"ඇත්තද, ස්තූතියි."

"ඒත්, පාතාලයේ ඉන්න කෙනා කිවුවේ එයා බඩු දෙකක් ලැබෙනකල් බලන් ඉන්නවා කියලා නේ," මම කිවුවා. "ප්‍රධාන අකුණ එයින් එකක් නම්, අනික මොකක්ද?"

ග්‍රෝවර් ඔළුව හෙල්ලුවේ පැහැදිලිවම ව්‍යාකූල වෙලායි.

ඇනබෙත් මගේ දිහා බැලුවේ මම ඊළඟට අසන ප්‍රශ්නය එයා දන්නවා වගෙයි. ඒක අහන්න එපා, කියන නිහඬ ඉල්ලීම එයාගේ බැල්මේ තිබුණා.

"ආගාධය ඇතුළේ ඉන්නේ මොකාද කියලා ඔයාට අදහසක් තියෙනවා, එහෙම නේද?" මම එයාගෙන් ඇසුවා. "මම අදහස් කළේ, ඒ හේඩීස් නෙවෙයි නම්?"

"පර්සි... අපි ඒ ගැන කතා නොකර ඉමු. මොකද, ඒ හේඩීස් නෙවෙයි නම්... නෑ, ඒ හේඩීස්ම වෙන්නැති."

මුඩුබිම් පසුවෙමින් ගියා. කැලිෆෝනියා ප්‍රාන්ත සීමාවට සැතපුම් දොළහයි, අපි පසු කළ පුවරුවක් පෙන්නුම් කළා.

මට එක් සරල, වැදගත් තොරතුරක කොටසක් මග හැරී ඇති බව මට දැනෙන්න වුණා. ඒක හරියට, මම හොඳින්ම දන සිටිය යුතු සාමාන්‍ය වචනයක් දෙස මම බලා සිටියත් එහි අකුරක්-දෙකක් වටේට පාවීම නිසා ඒ වචනය මට තේරුම් ගන්න බැහැ වගෙයි. මගේ ගවේෂණය ගැන නැවත නැවතත් කල්පනා කරද්දී හේඩීස්ට මුහුණ දීම හරි උත්තරය නොවෙන බව වැඩි වැඩියෙන් මට සිතෙන්න ගත්තා. එතැන තවත් දෙයක්, ගොඩාක් භයානක දෙයක් සිදුවෙමින් පැවතුනා.

ප්‍රශ්නයකට තිබුණේ: හේඩීස් ළඟ ප්‍රධාන අකුණ ඇති කියලා ඔට්ටු අල්ලමින්, පැයට සැතපුම් අනූ පහක වේගයෙන් අපි පාතාල ලෝකය දිහාවට දුවමින් සිටීමයි. එහෙට ගියාට පස්සේ අපි වැරදි බව සොයාගන්න ලැබුණොත් ආපසු නිවැරදි කරගන්න කාලයක් අපිට නැති වේවි. එතකොට, උත්තරායන අවසන් දවස පහුවෙලා යුද්ධය පටන් ගනීවි.

"උත්තරය තියෙන්නේ පාතාල ලෝකෙම තමා," ඇනබෙත් මාව අස්වැසුවා. "ඔයා මළවුන්ගේ ආත්ම දක්කා නේද, පර්සි? එයාලා ඉන්නේ එහෙ විතරයි. අපි කරන්නේ හරි දේ තමයි."

මළවුන්ගේ ලෝකයට ඇතුළු වෙන්න හොඳ උපක්‍රම යෝජනා කරමින් අපේ ධෛර්යය වැඩි කරන්න එයා උත්සාහ කළත්, මට ඒකට හිතක් තිබුණේ නැහැ. එතැන අපි නොදන්නා කරුණු ඕනෑවටත් වඩා තිබුණා. ඒක හරියට, විෂය මොකක්ද කියා නොදන විභාගයකට තදින් පාඩම් කරනවා වගෙයි. මාව විශ්වාස කරන්න, ඒ වැඩේ මං ඕනෑ තරම් කරලා තියෙනවා.

කුලී රිය බටහිර බලා වේගයෙන් ඇදුණා. මරණයේ මිටියාවත (නැගෙනහිර කැලිෆෝනියාවේ මෝජේව් කාන්තාරයේ පිහිටි උද්‍යානයක්) හරහා ඇදී ආ සෑම සුළං රැල්ලකම හඬ මළගිය ආත්මවල

Scanned with CamScanner

හඬ වගෙයි මට ඇහුණේ. රෝද දහ අටේ වාහනයක තිරිංග හඬ කරන සැම වතාවකදීම මගේ මතකයට ආවේ එච්ඩ්නාගේ සර්ප කටහඬයි.

ඉර බසින්නට කිට්ටු වෙද්දී රියැදුරා අපිව සැන්ටා මොනිකා වෙරළෙන් බැස්සුවා. එහි පෙනුම චිත්‍රපටිවල පෙන්වන ලොස් ඇන්ජලීස් වෙරළක් වගේම වුවත්, වෙනසකට තිබුණේ වටෙන්ම හැමු ගඳයි. ඈටීය දිගේ සැණකෙළි වාහනත්, පදික වේදිකාව දිගේ පාම් ගසුත් පෙළ ගැහිලා තිබුණා. වැලිපර ඇතුළේ නිදා සිටි ගෙවල් නැති මිනිස්සුත්, හොඳ රැල්ලක් එනතුරු බලා සිටි රළ පදින ශූරයෝත් දකින්න ලැබුණා.

ග්‍රෝවර් සහ ඈනබෙත් එක්ක මම රළ වදින සීමාවටම ඇවිද ගියා.

"දැන් මොකද කරන්නේ?" ඈනබෙත් ඇසුවා.

බැසයන ඉරේ එළියෙන් පැසිෆික් සාගරය රන් පාටට හැරෙමින් තිබුණා. රටේ අනෙක් පැත්තේ සිට, වෙනත් සාගරයක් දිහා බලාගෙන මම මොන්ටවුක් වෙරළේ සිටි දවසට පසු කොයි තරම් කාලයක් ගත වෙලාද.

මේ හැමදේම පාලනය කරන්න පුළුවන් දෙවියෙක් ඉන්නේ කොහොමද? මගේ විද්‍යාව ගුරුතුමා ඒ දවස්වල කියූ විදිහට ලෝකයෙන් තුනෙන් දෙකක්ම මුහුදෙන් වැහිලාලු තියෙන්නේ. ඉතින්, මම එච්චර බලගතු කෙනෙකුගේ පුතෙක් වුණේ කොහොමද?

මම රැල්ලට අඩිය තැබුවා.

"පර්සි?" ඈනබෙත් කතා කළා. "මොනවද ඔයා කරන්නේ?"

වතුර මට්ටම මගේ ඉණ ළඟට එන තුරුත්, ඊට පස්සේ පපුව ළඟට එනතුරුත් මම දිගටම ඇවිදගෙන ගියා.

මට පිටුපසින් ඈනබෙත් කතා කළා. "ඔය වතුර කොච්චර ජරා වෙලාද කියලා ඔයා දන්නවාද? ඒකේ හැම ජාතියකම විෂ -"

මම, මගේ ඔළුවත් වතුර ඇතුළට එබුවේ එතකොටයි.

මුලදී මම හුස්ම අල්ලාගෙන සිටියේ ඕනෑකමින්ම වතුර ආශ්වාස කරන්න අමාරු නිසයි. අන්තිමේදී මට තවදුරටත් දරාගෙන ඉන්න බැරි වුණා. මම අමාරුවෙන් හුස්මක් ගත්තා. පුරුදු ලෙසටම, මට සාමාන්‍ය විදිහට හුස්ම ගන්න පුළුවන් වුණා.

නොගැඹුරු සාගරයේ ඉදිරියටම මම ඇවිදගෙන ගියා. අඳුරු වතුර තුළදී මට කිසිම දෙයක් නොපෙනිය යුතු වුණත්, කොහොමදෝ, හැමදෙයක්ම තියෙන තැන් මම දැන සිටියා. පෙරළෙමින් හැඩ වෙනා සාගර පතුල මට දැනුණා. වැලිපරවල පුල්ලි වැටී සිටි සැන්ඩ්-ඩොලර් (කාසියක් තරම් පැතලි මුහුදු බෙල්ලන් විශේෂයක්) ජනාවාස තිබූ තැන් හඳුනාගන්න මට පුළුවන් වුණා. උණු දිය සහ සීත දිය දහරා එකට එක්වෙන දියවැල් පවා දැක ගන්නට මට පුළුවන් වුණා.

මගේ කකුලේ යමක් ඇතිල්ලෙනවා මට දැනුණා. ඒ දිහා බැලූ මම තව පොඩ්ඩෙන් බැලැස්ටික් මිසයිලයක් වගේ වතුරෙන් උඩට විසිවෙනවා. මගේ පැත්තකින් දුවටෙමින් සිටියේ අඩි පහක් දිග මැකෝ මෝරෙක්!

ඒත්, ඌට මාව කන්න ඕනෑ වුණේ නැහැ. ඌ මගේ ඇගේ හනය පිරිමදිමින් හිටියේ බල්ලෙක් වගෙයි. මම බයෙන් බයෙන් ඌගේ පිටේ වරලට අත තැබුවා. ඒ සතා තවත් ටිකක් මට ළං වුණේ තදින් අල්ලාගන්න කියනවා වගෙයි. මම අත් දෙකින්ම ඌගේ වරල අල්ලාගත් පසු මාවත් ඇදගෙන ඌ පිහිනන්න පටන් ගත්තා. පහළ කළුවර තුළට මාව ඇදගෙන ගිය මෝරා විශාල ආගාධයක මුවවිටේ වැලි ඉවුරකින් මාව තැබුවා. එතැන සිටගෙන සිටිම හරියට, කිසිම දෙයක් හරියාකාරව දකින්න බැරි වුණත්, ඉදිරියෙන් ආගාධය තියෙන බව දැනගෙන, මහ රැක ග්‍රෑන්ඩ් කැනියොන් ආවාට ඉවුරේ සිටගෙන ඉන්නවා වගෙයි.

අඩි එකසිය පනහකට විතර උඩින් ජල තලය දිලිසුනා. හරි නම්, මේ පීඩනයට මාව තැලෙන්න ඕනෑ බව මම දැන සිටියා. ඒත්, එහෙම බලද්දී මට හුස්ම ගන්නත් බැරිවෙන්න එපැයි. මට යන්න පුළුවන් ගැඹුරේ සීමාවක් ඇතිද හිතලා මම පුදුම වුණා. පැසිෆික් සාගර පතුලටම කිඳා බහින්න මට පුළුවන්ද දන්නෑ.

ඒ වෙලාවේ, පහළ කළුවර තුළ මොකක්දෝ දිලිසෙනවා මට පෙනුණා. ඒක මගේ දෙසට ඇදෙද්දී ප්‍රමාණයෙන් විශාල වෙමින්, තව තවත් දීප්තිමත් වුණා. මගේ අම්මාගේ කටහඬ වගේ ගැහැනු හඬක් මට කතා කළා. "පර්සි ජැක්සන්."

එයා මගේ ළඟට එද්දී එයාගේ හැඩරුව වඩාත් පැහැදිලි වුණා. ගලා හැලෙන කළු කොණ්ඩයක් තිබුණු එයා කොළ පාට සේද ගවුමකින් සැරසී සිටියා. එයාගේ ඇස් දෙක හිත වියවුල් කරන තරම්

ලස්සන වූ නිසාද කොහෙදෝ, එයා නැග සිටි අශ්වයෙකු තරම් ලොකු මුහුදු අශ්වයාව මගේ අවධානයට ලක් වුණේ යන්තමින් වගෙයි.

එයා මුහුදු අශ්වයාගේ පිටෙන් බැස්සා. පැත්තකට පිහිනා ගිය මැකෝ මෝරා සහ මුහුදු අශ්වයා සෙල්ලම් කරන්න පටන් ගත්තා. ගැහැනු කෙනා මට හිනාවක් පෑවා. "ඔයා මෙච්චර දුරක් ඇවිත්, පර්සි ජැක්සන්. බොහොම හොඳයි."

මොනවා කරන්නද කියලා මට හරියටම තේරුමක් නොතිබූ නිසා, මම දෙකට නැමිලා එයාට ආචාර කළා. "මිසිසිපි ගඟේදී මට කතා කළේ ඔයා නේද?"

"ඔව්, දරුවෝ. මම මුහුදු දෙවඟනක්. මුහුදේ ආත්මයක්. ගඟක පෙනී ඉන්න එක ලේසි වැඩක් නෙවෙයි, ඒත් මගේ මිරිදිය නෑදෑයෝ වෙන ජල දෙවඟනෝ මගේ ජීව බලය පවත්වා ගන්න උදවු කළා. පොසෙයිඩන්ගේ මාළිගයේ සේවය නොකළාට, එයාලා පොසෙයිඩන් උතුමාට ගරු කරනවා."

"එතකොට... ඔයා පොසෙයිඩන්ගේ මාළිගාවේ සේවය කරනවද?"

එයා ඔළුව වැනුවා. "සමුද්‍ර දෙවියන්ගේ දරුවෙක් ඉපදුණේ ගොඩාක් කාලෙකට පස්සෙයි. අපි ඔයා දිහා බලාගෙන හිටියේ හරිම ආසාවෙන්."

හදිසියේම, මම චූටි කාලේ මොන්ටවුක් වෙරළේ ඉන්නකොට මුහුදු රළවල දකින්න ලැබුණු සිනාබර කාන්තා මුහුණුවල ඡායාවන් මගේ මතකයට ආවා. මගේ ජීවිතයේ සිද්ධ වූ ගොඩාක් අමුතු දේවල් වගේම, ඒ ගැනත් මම වැඩිය හිතලා තිබුණේ නැහැ.

"මගේ තාත්තා මං ගැන උනන්දු වෙනවා නම්, ඇයි එයා මෙතැනට ආවේ නැත්තේ? ඇයි එයා මාත් එක්ක කතා කරන්නේ නැත්තේ?" මම ඇසුවා.

සීතල දිය දහරාවක් ගැඹුරේ සිට උඩට මතු වුණා.

"ඔය තරම් රළු විදිහට සමුද්‍ර දෙවියන්ව මනින්න එපා." මුහුදු දෙවඟන මට කිවුවා. "එතුමා අනවශ්‍ය යුද්ධයක් ළඟටම ඇවිත් ඉන්නේ. එතුමාගේ කාලය යොදවන්න ගොඩාක් දේවල් තියෙනවා. ඒ ඇරත්, ඔයාට කෙලින්ම උදවු කරන්න එතුමාට තහනම්. ඒ වගේ අනිසි පක්ෂපාතීකම් පෙන්වන්න දෙවිවරුන්ට අවසර නැහැ."

"එයාලාගේ දරුවන්ටවත්?"

"විශේෂයෙන්ම එයාලාට. දෙවිවරුන්ට කරන්න පුළුවන් වක්‍ර බලපෑම් විතරයි. අන්න ඒ නිසයි මගෙන් ඔයාට අවවාදයකුත්, තෑග්ගකුත් ලැබෙන්නේ."

එයා අත දිගු කළා. ඒ අත්ලේ සුදු පාට මුතු ඇට තුනක් මතු වුණා.

"හේඩීස්ගේ රාජධානියට ඔයා යන ගමන ගැන මම දන්නවා," එයා කිවුවා. "එහෙට ගිහින්, නොමැරී බේරිලා ආවේ කීප දෙනෙක් විතරයි: ඕ'ෆියස් - එයාට ශ්‍රේෂ්ඨ සංගීත හැකියාවක් තිබුණා; හර්කියුලිස් - එයා මහා ශක්තිවන්තයෙක්; හුඩිනි - එයාට ටාර්ටරස්වල ගැඹුරුම තැනින් වුණත් ගැලවෙන්න හැකියාව තිබුණා. ඔයාට මේ කුසලතා තියෙනවද?"

"ම්... නෑ, මැඩම්."

"අහ්, ඒත්, ඔයා ළඟ වෙන දෙයක් තියෙනවා, පර්සි. ඔයා, ඔයාගේ හැකියාවන් තේරුම් ගන්න පටන් ගත්තා විතරයි. වැඩිමහලු වයසට එනකම් ජීවත් වෙන්න ඔයාට ලැබුණොත්, ඔයාට හිමිවෙන ශ්‍රේෂ්ඨ හා බිහිසුණු අනාගතය ගැන ඔරකල් අනාවැකියක් කියලා තියෙනවා. ඔයාට වෙලාවට කලින් මැරෙන්න පොසෙයිඩන් ඉඩ තියන්නේ නැහැ. ඒ නිසා, මේවා ගන්න. ඔයාට උවමනාවක් ආවාම, මේ මුතු ඇට ඔයාගේ කකුල් පාමුල කුඩු කරන්න."

"එතකොට මොනවද වෙන්නේ?"

"ඒක තීරණය වෙන්නේ ඔයාගේ අවශ්‍යතාවය මත. ඒත්, මතක තියාගන්න: සාගරයට අයිති දේ සෑමවිටම ආපසු සාගරයට එනවා."

"එතකොට අවවාදය මොකක්ද?"

එයාගේ ඇස් කොළ පාටින් සැලුණා. "ඔයාගේ හදවත කියන දේ කරන්න, නැත්නම්, ඔයාට හැමදේම අහිමි වේවි. බලාපොරොත්තු විරහිත බවෙන් සහ සැකයෙනුයි හේඩීස් පෝෂණය වෙන්නේ. එයාට පුළුවන් නම් ඔයාවත් රවට්ටන්න බලාවි. ඔයාගේ තීරණ ගැන ඔයාටම අවිශ්වාසයක් ඇති කරාවි. ඔයා එයාගේ රාජධානියට ඇතුළු වුණාට පස්සේ, ඔයාට ආපහු පිට වෙන්න එයා කවදාවත් කැමැත්තෙන් ඉඩ දෙන එකක් නැහැ. විශ්වාසය නැති කරගන්න එපා. සුබ පැතුම්, පර්සි ජැක්සන්."

Scanned with CamScanner

මුහුදු අශ්වයාව කැඳවූ එයා ඌගේ පිට නැගී ආචාරය දෙසට ඇදුණා.

"පොඩ්ඩක් ඉන්න!" මම කතා කළා. "තෑගි ගැන විශ්වාස කරන්න එපා කියලා ගඟේදී ඔයා මට කිවුවා. මොන තෑග්ද?"

"සුබ ගමන්, තරුණ වීරයෝ." එයා ආපසු කතා කරද්දී එයාගේ හඬ ගැඹුර තුළ වියැකෙමින් තිබුණේ. "ඔයා, ඔයාගේ හදවතට ඇහුම්කන් දෙන්න ඕනෑ." දිලිසෙන කොළ පාට තිතක් බවට පත්වූ එයා, ඉන්පසු නොපෙනී ගියා.

එයා පසුපසින් කළුවර තුළට යන්නයි මට ඕනෑ වුණේ. පොසෙයිඩන්ගේ මාළිගාව දකගන්න මට උවමනා වුණා. ඒත්, බැසයන ඉරෙන් අඳුරු වන වතුර දිහා බලද්දී මං එනතුරු බලා ඉන්න මගේ යාළුවන්ව මට මතක් වුණා. අපිට ඉතිරි හරිම පොඩි කාලයයි...

මම වෙරළ දෙසට පිහිනුවා.

වෙරළට ළඟා වූ සැණින්ම මගේ ඇඳුම් වේලුණා. මම සිද්ධ වුණු දේවල් ග්‍රෝවර්ට සහ ඇනබෙත්ට කියලා, මුතු ඇට තුනත් පෙන්වූවා.

ඇනබෙත්ගේ මුහුණ පුලුටු වුණා. "මිලක් නැතිව කිසිම තෑග්ගක් ලැබෙන්නේ නැහැ."

"ඒවා නිකං ලැබුණේ."

"නෑ." එයා ඔළුව සෙලෙව්වා. "ග්‍රීක කියමනක් තියෙනවා 'දිවා ආහාරයක් වැනි නොමිලේ ලැබෙන දෙයක් නැහැ' කියලා. ඔන්න බලන්නකෝ, ඕකටත් මිලක් ගෙවන්න වෙයි."

ඒ සතුටුදායක සිතුවිල්ලත් එක්ක අපි ආපසු හැරුණා.

***

ඊරිස් දූත් ගමන් මල්ලේ තිබූ මාරු සල්ලිවලින් අපි බටහිර හොලිවුඩ්වලට යන බසයකට ගොඩ වුණා. එම් නැන්දාගේ බහිරව වෙළඳපොළෙන් ගත් පාතාල ලෝකයේ ලිපිනය මම රියැදුරාට පෙන්වූවත් ඩී.ඕ.ඒ. ශබ්දාගාරය ගැන එයා කවදාවත් අසා තිබුණේ නැහැ.

"ඔයාව දකිනකොට මට ටී.වී එකේ දකපු කාවදෝ මතක් වෙනවා." එයා මට කිවුවා. "ඔයා ළමා නළුවෙක් වගේ කවුරු හරිද?"

"අන්... මම අවදානම් දර්ශනවල රඟපාන කෙනෙක්... ළමා නළුවෝ ගොඩකගේ අවදානම් කොටස්වල මම රඟපාලා තියෙනවා."

"ඔහ් එහෙනම්, ඒක තමයි."

එයාට ස්තූති කළ අපි ඊළඟ නැවතුමෙන් ඉක්මනින්ම බැස ගත්තා.

ඩී.ඕ.ඒ. ශබ්දාගාරය සොයමින් අපි සැතපුම් ගාණක් ඇවිද්දා. ඒක තියෙන තැන කවුරුවත්ම දන්නා පාටක් පෙනුණේ නැහැ. ඒ ලිපිනය දුරකථන නාමාවලියේ තිබුණෙත් නැහැ.

පොලිස් ජංගම රථ මග හරින්නට අපි දෙවතාවක්ම පටු පාරවල්වලට රිංගා ගත්තා.

උපකරණ වෙළඳසැලක ජනේලයක් අසලින් යද්දී, එහි ක්‍රියාත්මකව තිබූ රූපවාහිනියේ සිටි කෙනා දකලා මාව ගල් ගැහුණා. ඒ මගේ බාප්පා, ගඳ ගහන ගේබ්. එයා සුප්‍රසිද්ධ නිවේදිකාවක් එක්කයි කතා කරමින් සිටියේ - මං කියන්නේ, එයා හිටියේ හරියට මහා ප්‍රසිද්ධ කෙනෙක් වගෙයි. නිවේදිකාව අපේ ගෙදර, කාඩ් සෙල්ලමක් මැද එයා එක්ක කතා කරද්දී, රත් පාට කොණ්ඩයක් ඇති තරුණ ගැහැනු කෙනෙක් එයා ළඟ ඉඳගෙන එයාගේ අතට තට්ටු කරමින් සිටියා.

එයාගේ කම්මුලේ කිඹුල් කඳුළක් දිලිසුනා. "අවංකවම, මිස් වෝල්ටර්ස්, මෙතැන ඉන්න ඕුගර්, මගේ ශෝක උපදේශිකාව නොහිටින්න මම විනාශ වෙලා ඉදියි. මගේ සුළු පුතා මම ආදරය කරපු හැම දෙයක්ම මගෙන් ගත්තා. මගේ නෝනා... මගේ කාර් එක... ම-මට සමා වෙන්න. ඒ ගැන කතා කරන්න මට අමාරුයි."

"ඔබට ඇහුණා නේද," නිවේදිකාව කැමරාව දෙසට හැරුණා. "සිත බිඳී ගිය පුද්ගලයෙක්. බරපතළ ප්‍රශ්න ඇති ගැටවරයෙක්. ඔබට මතක් කරන්න, ඩෙන්වර්වලදී ගත් මේ කලහකාරී පලායන තරුණයාගේ අවසන් ඡායාරූපය මම ඔබට නැවතත් පෙන්වන්නම්."

මම, ඇනබෙත් සහ ග්‍රෝවර් කොලරාඩෝ හෝටලය ළඟ ඊරිස් සමග කතා කරමින් සිටින අපැහැදිලි ඡායාරූපයක් තිරයේ මතුවුණා.

"මේ ඡායාරූපයේ සිටිනා අනෙක් ළමයි කවුද?" නිවේදිකාව ඇසුවේ නාට්‍යයක දෙබස් කියනවා වගෙයි. "එයාලා සමග ඉන්නා

පිරිමියා කවුද? මේ පර්සි ජැක්සන් අපරාධකරුවෙක් හෝ ත්‍රස්තවාදියෙක් වෙලාද? නැත්නම් සිහිසුණු කල්ලියක බුද්ධි ශෝධනයට ලක් වූ ගොදුරක් බවට පත් වෙලාද? විරාමයකින් පසු, අපි මේ පිළිබඳව ප්‍රමුඛ පෙළේ ළමා මනෝ විද්‍යාඥවරියක් සමග සාකච්ඡා කරමු. එතෙක්, රැඳී සිටින්න අප සමගම."

"මෙන්න මෙහෙ එන්න." ග්‍රෝවර් මට කතා කළා. මම උපකරණ වෙළඳසැලේ ජනේලය හිල් කරන්න කලින් ග්‍රෝවර් මාව බලෙන්ම ඇදගෙන ගියා.

කළුවර වැටෙද්දී කැදර පෙනුම ඇති අය සෙල්ලම් කරන්න පාරට ඇදෙන්න පටන් ගත්තා. දැන්, මාව වැරදියට තේරුම් ගන්න එපා. නිව්යෝක්වල හැදුණු වැඩුණු නිසා මම ලේසියෙන් බය වෙන කෙනෙක් නෙවෙයි. ඒත්, මට ලොස් ඇන්ජලීස් දැනුණේ නිව්යෝක් නගරයට වඩා හාත්පසින්ම වෙනස්වටයි. ගෙදරදී, හැම දෙයක්ම කිට්ටුයි වගෙයි පෙනුණේ. එහෙදී, නගරය කොයි තරම් ලොකු වුණත් අපිට අතරමං නොවී ඕනෑම තැනකට යන්න-එන්න පුළුවන්කම තිබුණා. ඉතින්, මෝඩයෙක් නොවෙන ඕනෑම ළමයෙකුට පරිස්සමින් ඉන්න හැකියාව එහි තිබුණා.

ලොස් ඇන්ජලීස්වල එහෙම නැහැ. එහෙ-මෙහෙ යන්න අමාරු තරම් ව්‍යාකූල ලෙස ඒ නගරය පැතිරිලා. ලොස් ඇන්ජලීස් විශාල වුණා මදිවාට, එය ශබ්ද පිරුණු, සැරිසැරීමට අපහසු, අමුතු තැනක් බවට පත්වෙලා තිබුණා. හෙට - ඒ කියන්නේ උත්තරායනය සිදුවෙන දවස වෙද්දී පාතාල ලෝකයේ දොරටුව කොහොම හොයාගත්තද කියලා මට හිතා ගන්න බැරි වුණා.

කල්ලි ගැසුණ මිනිස්සු, හිගන මිනිස්සු වගේම අපි දිහා විමසිල්ලෙන් බලන පදික වෙළඳුන්වත් පසුකර ගෙන අපි ඉදිරියට ගියා.

මුඩුක්කු පාරක පිවිසුමක් පසු කරමින් අපි ඉක්මන් ගමනින් යද්දී, කළුවර තුළින් කටහඬක් මතු වුණා, "ඒයි, උඹ."

මෝඩයෙක් වගේ මම එතැනම නතර වුණා.

අපි හිතන්නත් කලින් කොල්ලෝ කල්ලියක් අපිව වට කළා. වයිනා ඇඳුම් හැඳ සිටි ඒ හය දෙනාගේ මුහුණුවල තිබුණේ තුච්ඡ පෙනුමක්. හරියට යැන්සි එකේ හිටිය ළමයි වගේ මෙයාලත් පෝසත් පවුල්වල තරක ළමයි.

ඉබේම වගේ, මම රිප්ටයිඩ් එළියට ඇද්දා.

හිටි හැටියේම කඩුවක් මතු වෙද්දී කොල්ලෝ ටික පිටුපසට වුණත්, එයාලාගේ නායකයා දිගටම මගේ දිහාවට ආවේ එයාගේ මෝඩකම නිසාද, නිර්භීතකම නිසාද හිතලා මම පුදුම වුණා.

එයාට කඩුවෙන් පහර දීලා මම කරගත්තේ ලොකු අත්වැරැද්දක්.

ඒ කොල්ලා කෑගැසුවා. ඒත්, එයා සියයට සියයක්ම මනුෂ්‍යයෙක් වෙන්න ඇති. මොකද, එයාගේ පපුව හරහා ගිය කඩු තලයෙන් එයාට කිසිම හානියක් වුණේ නැහැ. එයා පහළ බැලුවා. "මේ මොන..."

එයාගේ පුදුමය කේන්තියකට හැරෙන්න කලින් මට තත්පර තුනක විතර කාලයක් තියෙන බව මට තේරුණා. "දුවන්න!" මම ඇනබෙත්ට සහ ග්‍රෝවර්ට කෑගැසුවා.

පාර හරස් කරගෙන සිටි කොල්ලෝ දෙන්නෙක්ව තල්ලු කරගෙන අපි පාර දිගේ දිව්වේ යන්නේ කොහේද කියලාවත් නොදනයි. අපි එක්වරම කොණකට හැරුණා.

"අතන!" ඇනබෙත් කෑගැසුවා.

ඒ කොටසේ විවෘතව තිබූ එකම කඩයේ ජනේල නියෝන් එළිවලින් දිලිසුනා. එහි දොරට උඩින් වූ පුවරුවේ තිබුණේ : 'ක්‍රුටිස් ගේවරතු ඇඳ න්සා ප්පුව' වගේ දෙයක්.

"ක්‍රුස්ටිගේ වතුර ඇඳන් සාප්පුව?" ග්‍රෝවර් පරිවර්තනය කළා.

හදිසි අවදානම් තත්වයකදී හැර වෙන කිසිම වෙලාවක මම ඒ වගේ තැනකට යන්නේ නැහැ. ඒත් මේ වෙලාව ඒකට සිකුරටම ගැලපුණා.

දොරෙන් ඇතුළට දිවූ අපි වතුර ඇඳක් පිටුපස හැංගුණා. තත්පරයකට විතර පස්සේ කොලු කල්ලිය එතැන පහු කරගෙන දිව්වා.

"මං හිතන්නේ අපි එයාලව මග ඇරියා," ග්‍රෝවර් හති ඇරියා.

"කාවද මග ඇරියේ?" අපිට පිටුපසින් කටහඬක් ඇවි දුන්නා.

අපි තුන් දෙනාම උඩ ගියා.

අපිට පිටුපසින් සිටගෙන සිටි කෙනා විනෝද ඇඳුමක් හැඳගත්ත මිනී කාක්කෙක් වගෙයි. ඔළුවේ එක කෙස් ගහක්වත් නොතිබුණ එයා අඩුම තරමේ අඩි හතක්වත් උස ඇති. අළු පාට ලෙදර් වගේ සමකුත්, ගන පිල්ලම් ඇති ඇස් දෙකකුත් එක්ක ඇඟ හරිවට්ටන සර්ප හිනාවකුත් එයාට තිබුණා. එයා හෙමින් සීරුවේ අපේ දිහාවට

Scanned with CamScanner

ආවත්, උවමනා නම් එයාට ඊට වඩා වේගවත් වෙන්න පුළුවන්, කියන හැඟීම මගේ හිතට ආවා.

එයාගේ ඇඳුම් ලෝටස් හෝටලයෙන් ලැබිලා වෙන්නත් පුළුවන්. ඒවාට තිබුණේ හැත්තෑව දශකයේ පෙනුමක්. එයා හැඳ සිටි සේද කමිසයේ බොත්තම් පපුව ළඟටම හැරදමා තිබුණා. එයාගේ වෙල්වට් කබායට අල්ලා තිබූ කබා පටි මාර්ග සංඥා ඉරි තරම් පළලයි. මට ගණන් කරන්නත් බැරි තරම් රිදී මාල ගොඩක් එයාගේ බෙල්ල වටේ තිබුණා.

"මම ක්‍රස්ටි," එයා කිවුවේ තපුරු හිනාවක් එක්කයි.

"හදිස්සියේ ඇතුළට ආවට කණගාටුයි," මම එයාට කිවුවා. "අපි මේ, නිකං, බලන්න ආවේ..."

"ඔයා අදහස් කළේ, නරක ළමයින්ගෙන් හැංගෙන්න ආවා කියන එකද?" එයා ගෙරෙව්වා. "එයාලා හැම රෑම මේ පැත්තේ රස්තියාදු ගහනවා. එයාලාට ස්තුති වෙන්න, මගේ තැනට මිනිස්සු ගොඩක් එනවා. කියන්න, ඔයාලාට වතුර ඇඳක් බලන්න ඕනෑද?"

එපා, ස්තුතියි, මම කියන්න හැදුවත්, මගේ උරහිස උඩින් ලොකු අතක් තැබූ එයා ප්‍රදර්ශනාගාරයේ ඇතුළටම මාව තල්ලු කරගෙන ගියා.

එතැන ඔයාට හිතේ මවාගත හැකි හැම ජාතියකම වතුර පිරවූ මෙට්ට සහිත ඇඳන් තිබුණා: එක එක වර්ගයේ දැවවලින් සෑදූ ඒවා, එක එක මෝස්තරයේ ඇතිරිලි දැමූ ඒවා, රැජිනියන්ට ගැළපෙන ඒවා, රජවරුන්ට ගැළපෙන ඒවා, විශ්වයටම අධිපතිගේ ප්‍රමාණයට සෑදූ ඒවා.

"මේක තමයි ජනප්‍රියම මෝස්තරය," ඉස් පුවරුව තුළට ලාවා ලාම්පු වැද්දූ, කළු සැටින් ඇඳ ඇතිරිලි දැමූ ඇඳක් මතින් ක්‍රස්ටි අත ගෙනිච්චේ ආඩම්බරයෙන්. එහි මෙට්ටය කම්පනය වුණේ ජෙලි තට්ටුවක් වගෙයි.

"අත් මිලියනයක සම්බාහනයක්," ක්‍රස්ටි අපිට කිවුවා. ''යන්න, ගිහින් බලන්න. ඇඳට නැගලා නිදාගෙන බලන්න. මම මුකුත් කියන්නේ නැහැ. කොහොමත්, අද එක වෙළඳාමක්වත් වුණෙත් නැහැ නේ."

"ම්, නෑ, මං හිතන්නේ..." මම කියන්න ගත්තා.

"අත් මිලියනයක සම්බාහනයක්!" කෑගැසූ ග්‍රෝවර් ඇඳට පැන්නා. "ෂා... මේක නම් නියමයි."

"හ්ම්ම්," ක්‍රස්ටි කිවුවේ එයාගේ නිකට අතගාමින්. "හොඳටම කිට්ටුයි."

"හොඳටම කිට්ටු මොකටද?" මම ඇසුවා.

එයා ඇනබෙත් දිහා බැලුවා. "මට කරන උදවුවක් විදිහට අර ඇඳට චුට්ටක් නැගලා බලන්න, කෙල්ලේ. ඒක හරියයි."

"ඒත්, මොකටද -" ඇනබෙත් ඇසුවා.

ධෛර්යමත් කරන ලෙසින් එයාගේ උරහිසට තට්ටු කළ ක්‍රස්ටි එයාව එක්කගෙන ගියේ රාමුවේ සිංහ කැටයමක් ඇති සුපිරි වර්ගයේ ඇඳක් වෙතටයි. ඇනබෙත් එහි ඇලවෙන්න අදිමදි කරද්දී, ක්‍රස්ටි එයාව තල්ලු කළා.

"ඒයි!" එයා විරෝධය පෑවා.

ක්‍රස්ටි අසුරක් ගැහුවා. "අර්ගෝ!"

ඇඳ දෙපැත්තෙන් පිටට පැන්න ලණු දෙකක් ඇනබෙත්ව ඇඳට තබා ගැට ගසමින් එයා වටා එතෙන්න ගත්තා.

ග්‍රෝවර් නැගිටින්න උත්සාහ කළත් කළු සැටින් ඇඳෙනුත් මතු වූ ලණුවලින් එයාව ඇඳට හිරවුණා.

"නි-නියම න්-නෑ!" ග්‍රෝවර් මොර දෙද්දී අත් මිලියනයේ සම්බාහනයෙන් එයාගේ හඬ සැලුණා. "ච-චුට්ටක්-වත් න්-නියම න්-නෑ!"

ඇනබෙත් දෙස බැලූ යෝධයා ඊට පස්සේ මගේ දෙස බලා විරිත්තුවා. "තව පොඩ්ඩෙන් ඉවරයි."

පැත්තකට පැන ගන්න මම උත්සාහ කළත් එයාගේ යෝධ අතක් මගේ බෙල්ල වටා හිරවුණා. "හෝව්, කොල්ලෝ... බය වෙන්නෙපා. අපි තප්පරෙන් ඔයාටත් එකක් හොයාගමු."

"මගේ යාළුවන්ට යන්න දෙනවා."

"ඔහ්, අනිවාර්යයෙන්ම යන්න දෙන්නම්. හැබැයි, ඊට කලින් එයාලාව ගැළපෙන විදිහට හරි ගස්සන්න වෙනවා."

"ඒ කියන්නේ?"

"පේනවද? මෙතැන තියෙන ඇඳන් ඔක්කෝම හරියටම අඩි හයක් දිගයි. ඔයාගේ යාළුවෝ කොට වැඩියි නේ. ඉතින්, එයාලාව දික් ගස්සන්න ඕනෑ."

Scanned with CamScanner

ඇනබෙත් සහ ග්‍රෝවර් දිගටම දඟලන්න වුණා.

"අසම්පූර්ණ මිනුම් මට පේන්න බැහැ," ක්‍රස්ටි මිමිණුවා. අර්ගෝ!"

අලුත් ලණු පොටවල් දෙකක් ඇඳන්වල උඩින් සහ යටින් මතුවෙලා ග්‍රෝවර්ගේත් ඇනබෙත්ගේත් කකුල්වල වළලුකරත්, අත් කටවලුත් ගැට ගැසුවා. ඉන්පසු, මගේ යාළුවන්ව දෙකෙලවරවලින් දෙපැත්තට අදිමින් ලණු තද වෙන්න පටන් ගත්තා.

"දුක් වෙන්නෙපා," ක්‍රස්ටි මට කිවුවා. "මේවා දිග අදින වැඩ. වැඩීම වුණොත් එයාලාගේ කොඳු නාරටිවලට වැඩිපුර අඟල් තුනක් විතර එකතු වෙයි. මේකෙන් පස්සේ එයාලා ජීවත් වෙන්න පවා ඉඩ තියෙනවා. දැන්, අපි ඔයා කැමති ඇඳක් තෝරගමු, නේ?"

"පර්සි!" ග්‍රෝවර් යටිගිරියෙන් කෑගැසුවා.

මගේ හිත වේගයෙන් දුවන්න ගත්තා. මේ යෝධ වතුර ඇඳන් වෙළෙන්දාව මට තනියෙන් විනාශ කරන්න බැරි බව මම දැනගෙන සිටියා. මගේ කඩුව එළියට ගන්නත් කලින් එයා මගේ බෙල්ල කඩලා දමාවි.

"ඔයාගේ ඇත්ත නම ක්‍රස්ටි නෙවෙයි, නේද?" මම ඇසුවා.

"ඇත්ත නම නම්, ප්‍රෝක්‍රස්ටීස්," එයා පිළිගත්තා.

"අදින්නා," මම කිවුවා. ඒ කතන්දරය මගේ මතකයට ආවා: තෙසියස් ඇතැන්ස්වලට යද්දී එයාට උවමනාවටත් වඩා ආගන්තුක සත්කාර කරලා මරන්න උත්සාහ කළේ මෙයායි.

"ඔව්," වෙළෙන්දා කිවුවා. "ඒත් 'ප්‍රෝක්‍රස්ටීස්' වගේ නමක් කියන්න පුළුවන් කාටද? අනික, ඒක වෙළඳාමට ගැළපෙන්නෙත් නැහැ. දැන් 'ක්‍රස්ටි' කියන නම ඕනෑ කෙනෙක්ට කියන්න පුළුවන් නේ."

"ඔයා හරි. ඒක කියවෙන විදිහත් ලස්සනයි."

එයාගේ ඇස් දෙක දීප්තිමත් වුණා. "ඔයා එහෙම හිතනවද?"

"ඔව්, ඇත්තටම." මම කිවුවා. "එතකොට, මේ ඇඳන්වල නිමාව? අති විශිෂ්ටයි."

එයාගේ මුහුණේ ලොකු හිනාවක් පැතිරුණා, ඒත් මගේ බෙල්ල වටා තිබුණු එයාගේ ඇඟිලි නම් බුරුල් වුණේ නැහැ. "මගෙන් බඩු ගන්න එන අයට මමත් ඕකම කියනවා. හැම වෙලාවෙම කියනවා.

ඒ වුණාට, කවුරුවත් වැඩේ නිමාව ගැන බලන්න කරදර වෙන්නේ නැහැ. ලාවා ලාම්පු ඇතුළේම හයි කරපු ඉස් පුවරු කීයක් විතර ඔයා දැකලා ඇතිද?"

"වැඩිය නැහැ."

"අන්න හරි!"

"පර්සි!" ඇනබෙත් මොර දුන්නා. "ඔයා මොනවද ඔය කරන්නේ?"

"එයාව ගණන් ගන්නෙපා," මම ප්‍රෝක්‍රස්ටීස්ට කිවුවා. "එයා මහ වාතයක්."

යෝධයා මහ හඬින් හිනාවුණා. "මගෙන් බඩු ගන්න එන හැමෝම එහෙමයි. හරියටම අඩි හයක් උසට කවුරුවත් නැහැ. කිසිම සැලකිල්ලක් නැති උදවිය. ඊට පස්සේ, ඇඳේ දිග ගැළපෙන්නේ නෑ කියලා අවලාද කියනවා."

"බැරි වෙලාවත්, එයාලා අඩි හයකට වඩා දිග නම් ඔයා මොකද කරන්නේ?"

"ඔහ්, ඒක හැම වෙලාවෙම වගේ වෙනවා. ඒක හරි ගස්සන්න හරිම ලේසියි."

එයා මගේ බෙල්ල අත හැරියා, ඒත් මට ප්‍රතිචාර දක්වන්න ඉඩක් ලැබෙන්නත් කලින්, ළඟ වූ මේසයක් අසලට ගිය එයා ඒ පිටුපසින් ලොකු, තල දෙකේ පිත්තල පොරවක් අරගෙන ආවා. "මම කරන්නේ එයාව පුළුවන් තරම් ඇඳේ මැදට කරලා, වැඩි ටික දෙපැත්තෙන් කපලා කොට කරන එක." එයා කිවුවා.

"අහ්," මම අමාරුවෙන් කෙළ පොදක් ගිල්ලා. "මොළේ ඇති වැඩක්."

"ඔයා වගේ බුද්ධිමත් ගනුදෙනුකාරයෙක්ව මුණ ගැහෙන්න ලැබුණට මට හරිම සතුටුයි."

දැන් නම් මගේ යාළුවන්ව ඇත්තටම දිග ඇදෙන්න පටන්ගෙන තිබුණා. ඇනබෙත්ව ටිකෙන් ටික සුදුමැලි වුණා. ග්‍රෝවර්ගේ උගුරෙන් ගර-ගර සද්දයක් නැගුණේ හරියට බෙල්ල හිර කළ පාත්තයෙකුගේ වගෙයි.

Scanned with CamScanner

"ඉතින්, ක්‍රස්ටි..." මම කිවුවේ මගේ කටහඬ සැහැල්ලුවෙන් තියා ගන්න උත්සාහ කරමින්. අලුත විවාහ වූ අය වෙනුවෙන් හදවත් හැඩයට සාදා තිබූ විශේෂ ඇඳක් දිහාවට මම බැල්මක් දැම්මා. "මේ ඇඳේ වතුර සෙලවෙද්දී, තරංග ඇතිවීම නවත්තන්න මොනවා හරි කරලාද තියෙන්නේ?"

"ඇත්තටම, ඔව්. බොරු නම් නැගලා බලන්න."

"ඔව්, සමහරවිට, මට හරියයි. ඒත්, ඔයා වගේ උස මහත කෙනෙක්ව වුණත් දරා ගන්න මේකට පුළුවන්ද? එතකොටත්, තරංග මතු වෙන්නෙම නැද්ද?"

"ඒක සහතිකයි."

"නෑ. වෙන්න බෑ?"

"ඇත්තටම එහෙමයි."

"කෝ, එහෙනම් මට පෙන්වන්න."

එයා හරිම ආසාවෙන් ඇඳේ වාඩිවෙලා, මෙට්ටයට අතින් තට්ටු කළා. "දැක්කා නේද? තරංග ඇත්තේම නැහැ."

මම අසුරක් ගැහුවා. "අර්ගෝ!"

පිටතට පැන්න ලණු ක්‍රස්ටි වටා එතෙමින් එයාව මෙට්ටයට තද කර ගැට ගැසුවා.

"ඒයි!" එයා කෑගැසුවා.

"එයාව හරි මැදට කරන්න." මම කිවුවා.

මගේ නියෝගයෙන් ලණු ආපසු සැකසුණා. ක්‍රස්ටිගේ ඔළුව මුළුමනින්ම ඇඳෙන් පිටට පැන්නා. එයාගේ කකුල් දෙක ඇඳෙන් එළියට එල්ලුණා.

"එපා!" එයා කිවුවා. "පොඩ්ඩක් ඉන්න! මේක ප්‍රදර්ශනේට තියපු එකක් විතරයි."

මම රිප්ටයිඩ් එළියට ගත්තා. "දිග පොඩ්ඩක් අඩු කරමු..."

මම කරන්න යන දේ ගැන මගේ හිතේ කිසිම සැක සංකාවක් තිබුණේ නැහැ. ක්‍රස්ටි මනුෂ්‍යයෙක් නම් එයාට කොහොමටවත්ම මගෙන් හිරිහැරයක් වෙන්නේ නැති වෙවී. එයා රාක්ෂයෙක් නම්, ටික කාලයකට එයා දූවිල්ලක් වෙලා ඉන්න එක හොඳයි.

"ඔයා හරියට හෙට්ටු කරනවා නේ," එයා මට කිවුවා. "මම තෝරාගත් මෝසතරවලට සීයට තිහක වට්ටමක් ඔයාට දෙන්නම්."

"මං හිතන්නේ, මම උඩින් පටන් ගත්තොත් හොඳයි." මම කඩුව එසෙව්වා.

"මූලික ගෙවීම් එපා! මාස හයක් යනකම් පොලියත් එපා!"

මම කඩුව වේගයෙන් පහළට ගෙනාවා. ක්‍රස්ටිගේ වෙළඳ යෝජනා නැවතුණා.

මම අනෙක් ඇඳන්වල ලණු කපා දැමුවා. වේදනාවෙන් කෙඳිරි ගාමින්, මට සෑහෙන දෙස් දෙවොල් තියමින් ඒ දෙන්නා නැගිට්ටා.

"ඔයාලා උස ගිහින් වගේ," මම කිවුවා.

"මාර විහිළුව," ඇනබෙත් කිවුවා. "ඊළඟ වතාවෙවත් ඔයිට වඩා ඉක්මන් කරන්න."

ක්‍රස්ටිගේ මේසය පිටුපස වූ ලුහුඬු දැන්වීම් පුවරුව දෙස මම බැලුවා. එහි හර්මීස්ගේ පාර්සල් ප්‍රවාහන සේවයේ වෙළඳ දැන්වීමක් සහ ලොස් ඇන්ජලීස් ප්‍රදේශවාසී රාක්ෂයින්ගේ සාරසංග්‍රහයක දැන්වීමකුත් තිබුණා. ඊට යටින්, වීරයින්ගේ ආත්ම සඳහා විශේෂ වට්ටම් ලබා දෙන බව පළ කළ ඩී.ඕ.ඒ. ශබ්දාගාරයේ නද තැඹිලි පාට දැන්වීමක් තිබුණා. 'අපි සැම විටම සොයන්නේ නව කුසලතා ඇති අයයි!' එහි ලොකුවට පළකර තිබුණා. ඊට යටින් සිතියමක් සමග තිබුණේ ඩී.ඕ.ඒ. හි ලිපිනයයි.

"ඉක්මන් කරන්න," මම, මගේ යාළුවන්ට කිවුවා.

"අපිට විනාඩියක් දෙන්නකෝ," ග්‍රෝවර් මැසිවිලි නැගුවා. "අපිව මැරෙනකම් ඇදුනා විතරයි."

"ඒ කියන්නේ ඔයාලා පාතාල ලෝකෙට යන්න ලෑස්ති ඇති නේ," මම කිවුවා. "මෙතැන ඉඳන් කඩ වීදියකට එහායින් ඒක තියෙන්නේ."

18

ඇනබෙත් බලු පාසලක් දැම්මා

අපි කළු ගරුඬ පුවරුවක රන් පාටින් අමුණා තිබූ අකුරු දෙස බලා සිටියා: ඩී.ඕ.ඒ. ශබ්දාගාරය

පහළ වීදුරු දොරේ මෙසේ අච්චු කපා තිබුණා: නීතිඥයන්ට සහ පණ ඇති අයට ඇතුළු වීම තහනම්.

මෙහි නිකරුණේ ගැවසීමෙන් වළකින්න.

ඒ මැදියමට කිට්ටු වුණත්, හොඳින් ආලෝකමත් කර තිබූ ප්‍රවේශ ශාලාවේ මිනිස්සු පිරී සිටියා. ආරක්ෂක මේසයට පිටුපසින් අව් කණ්ණාඩි සහ ශ්‍රවණ උපකරණ පැළඳගත්, සැර පරුෂ පෙනුමක් ඇති මුරකරුවෙක් සිටගෙන සිටියා.

මම, මගේ යාළුවෝ දෙසට හැරුණා. "හරි, ඔයාලාට සැලසුම මතකයි නේ?"

"සැලසුම," ග්‍රෝවර් තදින් කෙළ ගිල්ලා. "ඔව්, මං හරි ආසයි ඒකට."

"ඒක වැඩ නොකළොත් මොකද වෙන්නේ?" ඇනබෙත් ඇසුවා.

"අසුභවාදී විදිහට හිතන්න එපා අනේ."

"හරි, හරි," එයා කිවුවා. "අපි දැන් මළවුන්ගේ ලෝකෙට යන්න හදනවා, ඒත් මම අසුභවාදී විදිහට හිතන්න හරකයි."

සැන්ටා මොනිකාවලදී මුහුදු දෙවඟනගෙන් මට ලැබුණු මුතු ඇට තුන මම අතට ගත්තා. මොකක් හරි වැරැද්දක් වුණොත් මේවාගෙත් නම් ලොකු පිටුවහලක් ලැබෙන පාටක් මට පෙනුණේ නැහැ.

ඇනබෙත් මගේ උරහිස උඩින් අතක් තැබුවා. "මට සමා වෙන්න, පර්සි. ඔයා හරි. අපිට මේක කරන්න පුළුවන්. කිසිම අවුලක් වෙන්නේ නැති වෙයි."

එයා ග්‍රෝවර්ට වැලමිටෙන් ඇන්නා.

"අන්න හරි!" එයා එක සැරේටම කිවුවා. "අපි මෙච්චර දුරක් ආවා. ප්‍රධාන අකුණ හොයාගෙන, ඔයාගේ අම්මාවත් බේරගන්න අපිට පුළුවන්. කිසිම අවුලක් නැහැ."

ඒ දෙන්නා දෙස බලද්දී මට කෘතඥතාපූර්වක හැඟීමක් දැනුණා. විනාඩි කිපයකට කලින් මම ඒ දෙන්නාට සුපිරි ඇඳන් උඩ මැරෙන්න කිට්ටු වෙනකල්ම දිග ඇදෙන්න සැලැස්වූවා. දැන්, එයාලා මං වෙනුවෙන් නිර්භීත වෙලා, මගේ හිත හදන්න උත්සාහ කරනවා.

මම මුතු ඇට ආපසු සාක්කුවට දමා ගත්තා. "යමු. අපි යමපල්ලෝ ටිකකගේ තට්ටේ පළලා එමු."

අපි ඩී.ඕ.ඒ. පිවිසුම් ශාලාවට ඇතුළු වුණා.

සැඟවුණු ශබ්ද විකාශනවලින් මෘදු සංගීතයක් වාදනය වුණා. එහි බිත්ති සහ බුමුතුරුණු ලෝහ අළු පාට ගත්තා. ඇටකටු අත් වගේ පෙනුමක් ඇති හීනි පතොක් ගස් වර්ගයක් මුල්ලක සිටුවා තිබුණා. කළු ලෙදර්වලින් සැදූ පුටු හැම එකකම කවුරු හෝ වාඩි වී සිටියා. එතැන මිනිස්සු වාඩිගෙන, සිටගෙන, ජනේලවලින් එපිට බලාගෙන හෝ සෝපානය එනතුරු බලාගෙන සිටියා. ඒ කිසිවෙක් සෙලවුණේවත්, කතා කළේවත් නැහැ. ඇස් කොණෙන් බලද්දී එයාලාව හොඳින් බලාගත්ත මට පුළුවන් වුණත්, ඒ කෙනෙක් දිහා මම විශේෂ අවධානයකින් බලද්දී එයාලා විනිවිද පේන්න ගත්තා... එයාලාගේ ඇඟවල් හරහා මට අනෙක් පැත්ත බලාගන්න පවා පුළුවන් වුණා.

ආරක්ෂක මුරකරුගේ මේසය පුංචි වේදිකාවක් මත තිබූ නිසා එයා දිහා හිස් ඔසවලා බලන්න අපිට සිද්ධ වුණා.

චොකලට් පාට සමක් සහ හමුදා මෝස්තරයට කොට කළ සුදට හුරු රත් පාට කොණ්ඩයක් තිබුණු එයා උස, කඩවසම් කෙනෙක්. කැස්බෑ ලෙලිවලින් සෑදූ අව් කණ්ණාඩි පැළඳ සිටි එයාගේ ජේද, ඉතාලි ඇඳුම් කට්ටලය එයාගේ කොණ්ඩයේ පාටට ගැලපුණා. කබා පටියට ගසා තිබුණු නම සහිත රිදී පතුරට යටින් කළු පාට රෝස මලක් අමුණා තිබුණා.

එහි සඳහන් නම කියවූ මම එයා දෙස බැලුවේ පුදුමයෙන්. "ඔයාගේ නම කයිරොන් ද?"

එයා මේසය හරහා ඉදිරියට නැමුණා. එයාගේ කණ්ණාඩි කුට්ටමෙන් මගේම ඡායාව හැර වෙන දෙයක් මට පෙනුණේ නැහැ. එයාගේ හිනාව මිහිරි වුණත්, එහි ඇඟ හිරිවට්ටන ගතියක් තිබුණේ හරියට ඔයාව ගිලින්න සූදානම් වෙන පිඹුරෙක් වගෙයි.

"මොන තරම් වටින කොලු ගැටයෙක්ද." එයාගේ කතා විලාසයේ අමුත්තක් තිබුණේ එයා ඉංග්‍රීසි දෙවැනි භාෂාව විදිහට ඉගෙන ගත් කෙනෙක් වගෙයි. "කියන්න යාළුවා, මාව නරාස්සයෙක් වගේ පේනවද?"

"න්-නෑ."

"සර්," එයා මෘදුව එකතු කළා.

"සර්," මම කිවුවා.

නම් පතුර අල්ලාගත් එයා එහි අකුරු යටින් ඇඟිල්ල දිවෙව්වා. "ඔයාට මේක කියවන්න පුළුවන්ද, යාළුවා? ඒකේ තියෙන්නේ 'කෙරොන්' කියලා. කෝ... මාත් එක්ක කියන්නෑ කෙ-රොන්."

"කෙරොන්."

"නියමයි! දැන්ෑ මිස්ටර් කෙරොන්."

"මිස්ටර් කෙරොන්," මම කිවුවා.

"බොහොම හොඳයි," එයා ආපසු වාඩි වුණා. "අර නාකි අස්ස මිනිහා එක්ක මාව පටලවා ගන්නවාට මං ආසම නැහැ. දැන්, මේ මැරිච්ච ළමයි තුන්දෙනාට මගෙන් මොනවද කෙරෙන්න ඕනෑ?"

එයාගේ ප්‍රශ්නය මට දැනුණේ වේගයෙන් ආව බෝලයක් බඩේ වැදුණා වගෙයි. උදවුවක් බලාපොරොත්තුවෙන් මම ඇනබෙත් දිහා බැලුවා.

"අපිට පාතාල ලෝකෙට යන්න ඕනෑ," එයා කිවුවා.

කෙරොන්ගේ කට දෙපසට ඇදුණා. "හොඳයි, ඒක නම් අලුත් දෙයක්."

"එහෙමද?" ඇනබෙත් ඇසුවා.

"සරලයි, අවංකයි. අනිත් අය වගේ 'අයියෝ... මෙතැන වැරදීමක් වෙලා ඇති, මිස්ටර් කෙරොන්.' කිය කියා බොරුවට බෙරිහන් දීමක් නෑ." එයා අපි දිහා සෝදිසියෙන් බැලුවා. "එතකොට, ඔයාලා මැරුණේ කොහොමද?"

මම ග්‍රෝවර්ට වැළමිටෙන් ඇන්නා.

"ඔහ්," එයා කිවුවා. "මේ... ගිලුණා... වතුර බේසමක."

"ඔයාලා තුන්දෙනාම?" කෙරොන් ඇසුවා. අපි ඔළුව වැනුවා.

"ලොකු වතුර බේසමක් වෙන්නැති." කෙරොන් ටිකක් පුදුමයට පත්වුණා වගෙයි. "මං හිතන්නේ, ගමන් ගාස්තු ගෙවන්න ඔයාලා ළඟ සල්ලි නැතුව ඇති? සාමාන්‍යයෙන්, ලොකු අය ළඟ නම් ක්‍රෙඩිට් කාඩ් එහෙම තියෙනවා. එහෙමත් නැත්නම්, එයාලාගේ තොටුපොළ ගාස්තුවත් එයාලාගේ අන්තිම විදුලි බිලට එකතු කරනවා. ඒත් පුංචි ළමයි එක්ක... අප්පොච්චියේ, ඔයාලා කවදාවත් ලෑස්තිවෙලා මැරෙන්නේ නැනේ. ඉතින්, මට පේන විදිහට ඔයාලාට තව අවුරුදු දෙතුන් සීයක් යනකම් පැත්තකින් ඉඳගෙන ඉන්න වෙයි."

"ඔහ්, ඒ වුණාට අපි ළඟ සල්ලි තියෙනවා." ක්‍රස්ටිගේ මේසය පිටුපස සඟවා තිබී මට සොයාගන්න ලැබුණු රන් ඩ්‍රච්මාවලින් තුනක් මම මේසය උඩ තැබුවා.

"හොඳයි, දැන්..." කෙරොන් තොල් ලෙවකෑවා. "ඇත්තම ඩ්‍රච්මා. ඇත්තම රත්තරන් ඩ්‍රච්මා. මම මේවා දැක්කේ නෑ..."

එයා කෑදර ලෙසින් කාසි මත ඇඟිලි දිවෙව්වා.

අපි කිට්ටුවටම ආවා.

එතකොටම, කෙරොන් මගේ දිහා බැලුවා. එයාගේ අව් කණ්ණාඩිවලට පිටුපසින් වූ සීතල බැල්ම මගේ පපුවේ හිල් හාරනවා වගෙයි මට දැනුණේ.

"දන්, එතකොට," එයා කිවුවා. "මගේ නම හරියට කියවන්න ඔයාට බැරි වුණා නේද? ඔයා වචන අන්ධතාවය තියෙන කෙනෙක්ද, කොල්ලෝ?"

"නෑ," මම කිවුවා. "මම මැරිච්ච කෙනෙක්."

ඉදිරියට නැමුණු කෙරොන් ඉව කරලා බැලුවා. "ඔයා මැරිලා නෑ. මට කලින්ම තේරුම් ගන්නයි තිබ්බේ. ඔයා දේව පැටියෙක්."

"අපිට පාතාල ලෝකෙට යන්නම ඕනෑ," මම තදින්ම කියා සිටියා.

කෙරොන්, එයාගේ උගුර ගැඹුරෙන් ගෙරවුම් හඬක් පිට කළා.

ඒත් එක්කම, කාමරයේ සිටි අනෙක් උදවිය වාඩිවී සිටි තැන්වලින් නැගිට එහෙ මෙහෙ ඇවිදින්නත්, කලබලෙන් කෙස් අතරේ ඇඟිලි යවන්නත්, අත් ඔරලෝසු පරීක්ෂා කරන්නත් පටන් ගත්තා.

"ඔයාලාට පුළුවන් වෙලාවේ මෙතැනින් පිටවෙන්න," කෙරොන් අපිට කිවුවා. "මම මේ ටික අරගෙන, ඔයාලාව දැකපු බව අමතක කරලා දාන්නම්.

එයා කාසි ටික ගන්න උත්සාහ කළත්, ඊට කලින් මම ඒවා ආපසු ඩැහැගත්තා.

"උදවු නැත්නම් ගනුමනාවකුත් නැහැ." මට දැනෙමින් තිබුණාට වඩා නිර්භීතකමක් හඬට ආරෝපණය කරගන්න උත්සාහ කරමින් මම කිවුවා.

කෙරොන්ගේ උගුරෙන් ආයෙමත් ලේ කැටිගස්වන, ගැඹුරු ගෙරවුම පිට වුණා. කාමරයේ සිටි මළවුන්ගේ ආත්ම විදුලි සෝපානයේ දොරට තඩිබාන්න පටන් ගත්තා.

"ඒක නම් හරිම ලැජ්ජාවක්," මම සුසුමක් හෙළුවා. "ඔයාට දෙන්න අපි ළඟ තව ගොඩාක් තිබුණා."

මම ක්‍රුස්ටිගේ තැනින් ගෙනා කාසි මල්ලම අතට ගත්තා. එයින් මිටක් පුරවා ඩ්‍රැච්මා ගත් මම ඒවා ඇඟිලි අතරින් හැලෙන්න සැලැස්වූවා.

කෙරොන්ගේ ගෙරවුම පුරු-පුරුවකට හැරුණා. "ඔයා හිතන්නේ මාව සල්ලිවලට ගන්න පුළුවන් කියලද, දේව පැටියෝ?

මේ..ත්... නිකං දැනගන්න වගේ අහන්නේ, ඔයා ළඟ කීයක් විතර තියෙනවද?"

"ගොඩාරියක්," මම කිවුවා. "මෙච්චර අමාරු රස්සාවක් කරලත් හේඩීස් ඔයාට ඒ හැටි ගෙවන්නේ නැතුව ඇති කියලා මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා."

"අයියෝ... ඒ ගැන නම් කතා කරලා වැඩක් නැහැ. මුළු දවස පුරාම බබාලා බලාගන්නවා වගේ මේ මැරිච්ච අයගේ ආත්ම බලා ගන්න ඔයා වුණත් කැමතිද? හැම තිස්සෙම 'අයියෝ, මට මැරුණ කෙනෙක් වෙන්න දෙන්නෙපා' නැත්නම්, 'අනේ මට නොමිලේ එගොඩට යන්න දෙන්නකෝ' කියනවා. අවුරුදු තුන් දාහකින් මගේ පඩි වැඩි කරලා නැහැ. මේ වගේ ඇඳුම් ලාබෙට හම්බ වෙයි කියලා ඔයා හිතනවද?"

"ඔයාට ඊට වඩා ලැබෙන්න ඕනෑ," මම එයා එක්ක එකඟ වුණා. "පොඩි අගය කිරීමක්, ගරු කිරීමක්, හොඳ පඩියක්."

ඒ සෑම වචනයක් එක්කම මම තවත් රන් කාසිය බැගින් කවුන්ටරය මත ගොඩ ගැසුවා.

කෙරොන්, එයාගේ සේද ඉතාලි කබාය දෙසට බැල්මක් හෙළුවේ හරියට ඊටත් වඩා හොඳ ඇඳුමක් හැඳගෙන ඉන්නවා හිතේ මවාගන්න වගෙයි. "මං ඔයාට කියන්නම ඕනෑ, කොල්ලෝ. දැන් නම් ඔයා කියන දේ මට ටිකා..ක් විතර තේරෙනවා. හැබැයි, තවම ටිකයි."

මම තවත් කාසි කීපයක් ගොඩට එකතු කළා. "හේඩීස් එක්ක කතා කරන වෙලාවට ඔයාගේ පඩි වැඩිකිරීම ගැන එයාට මතක් කරන්නත් මට පුළුවන්."

එයා සුසුමක් පිටකළා. "කොහොම වුණත්, දැන් බෝට්ටුව සම්පූර්ණයෙන්ම වගේ පිරිලා තියෙන්නේ. ඔයාලා තුන් දෙනාවත් ඒකට එකතු කරගෙන මම පිටත් වුණා නම් හරි."

නැගී සිටි එයා අපේ සල්ලි අරගෙන කතා කළා, "මාත් එක්ක එන්න."

රැඳී සිටින මළගිය ආත්ම අතරින් අපි ඉදිරියට ඇදුණා. එයාලා සුළඟ වගේ අපේ ඇඳුම්වල දවටෙන්නත්, තේරුම් ගන්න බැරි දේවල් කොඳුරන්නත් වුණා. කෙරොන් ගොරවමින් එයාලාව පාරෙන් ඉවතට ඇද දැමුවා. "නොමිලේ යන්ඩ ඉන්න එවුන්."

Scanned with CamScanner

කොළ පාට ප්‍රවේශපත බැගින් අතේ තියාගෙන සිටින මළවුන් පිරුණු විදුලි සෝපානය තුළට එයා අපිව මෙහෙයවූවා. අපි එක්කම ඇතුළට රිංගන්න උත්සාහ කළ මළවුන් දෙන්නෙක් අල්ලාගත් කෙරොන් එයාලාව ආපසු ප්‍රවේශ ශාලාවට තල්ලු කළා.

"හරි, දූන් මම නැති අතරේ කවුරුවත් එක එක සැලසුම් හදන්නේ එහෙම නෑ," එයා ශාලාවට නිවේදනය කළා. "ඒ වගේම, කවුරුහරි ආයෙමත් මගේ රේඩියෝ චැනල් එක මාරු කරලා තිබුණොත් එහෙම, මං ඔහේලාව තවත් අවුරුදු දාහක් විතර මෙතැන තියාගන්නවා. තේරුණා නේද?"

එයා දොර වහලා, සෝපානයේ සිදුරකට යතුරුපතක් ඇතුළු කළාම අපිව පහළට යන්න පටන් ගත්තා.

"ලොබියේ ඉන්න ආත්මවලට මොකද වෙන්නේ?" ඇනබෙත් ඇහුවා.

"මුකුත් නෑ," කෙරොන් උත්තර දුන්නා.

"කොච්චර කාලයකටද?"

"සදාකාලයටම. නැත්නම් මට ත්‍යාගශීලී වෙන්න හිතෙනකල්."

"ඔහ්," ඇනබෙත් කිවුවා. "ඒක... සාධාරණයි."

කෙරොන් ඇහි බැමක් එසෙව්වා. "මරණය සාධාරණයි කියලා කවුද කිවුවේ, පුංචි නෝනා? ඔයාගේ වාරය එනකල් ඉන්නකෝ. කොහොමත්, ඔයාලා යන තැනදී ඒක ඉක්මනට එයි."

"අපි පණපිටින් එළියට එනවා," මම කිවුවා.

"හහ්."

හදිසියේම මට කරකැවිල්ලක් දැනෙන්න ගත්තා. තවදුරටත් පහළට නොගිය අපි ඒ වෙනුවට ඉදිරියට යන්න ගත්තා. මගේ වටේට සිටි ආත්මවල පෙනුම වෙනස් වෙන්න පටන් ගත්තා. එයාලාගේ අලුත් ඇඳුම් ඇවිලී ගිහින් අළු පාට ලෝගුවලට හැරුණා. විදුලි සෝපානයේ පොළොව පැද්දෙන්න ගත්තා.

මම තදින් ඇස් පියාගත්තා. මම ආපසු ඇස් අරිද්දී කෙරොන්ගේ ක්‍රීම් පාට ඉතාලි ඇඳුම කළු පාට දිග ලෝගුවකට හැරී තිබුණා. එයාගේ කැස්බෑ ලෙලි අව් කණ්ණාඩි කුට්ටම අතුරුදහන් වෙලා. එයාගේ ඇස් තිබිය යුතු තැන තිබුණේ ඒරිස්ගේ වගේ හිස් ඇස් කෙවෙණි

විතරයි. ඒත් කෙරොන්ගේ ඇස් කෙවෙණි රැයෙන්, මරණයෙන් සහ බලාපොරොත්තු බිඳවැටීම්වලින් මුළුමනින්ම අඳුරු වෙලයි තිබුණේ.

මම බලා ඉන්නවා එයා දක්කා. "මොකෝ?"

"නිකං," මම අමාරුවෙන් කිවුවා.

එයා දත් පෙන්වා විරිත්තනවා කියලා මම හිතුවත්, සිද්ධ වුණේ එහෙම නෙවෙයි. එයාගේ මුහුණේ සම විනිවිද පේන්න පටන් ගත්තේ මට ලේසියෙන්ම එයාගේ හිස්කබල දකගන්න සලස්වමිනුයි.

පොළොව දිගටම පැද්දෙන්න වුණා.

"මං හිතන්නේ මට මුහුදු කලන්තේ හැදෙන්න යනවද කොහෙදෝ," ග්‍රෝවර් කිවුවා.

මම ආපසු ඇහිපිල්ලම් ගසද්දී විදුලි සෝපානය තව දුරටත් සෝපානයක් වුණේ නැහැ. අපි සිටගෙන සිටියේ ලීවලින් සෑදූ බෝට්ටුවක් උඩයි. කෙරොන් රිටි ගාමින් අඳුරු, තෙල් වගේ ගඟක් හරහා අපිව ගෙනියමින් සිටියා. ඒ ගඟේ ඇටකටු, මැරුණු මාළු වගේම ප්ලාස්ටික් බෝනික්කෝ, තැළුණු කානේෂන් මල්, තෙතබරිත ඩිප්ලෝමා සහතික වගේ අමුතු දේවලුත් පාවුණා.

"ස්ටයික්ස් ගඟ," ඇනබෙත් මිමිණුවා. "ඒක හරිම..."

"අපිරිසුදුයි," කෙරොන් කිවුවා. "අවුරුදු දහස් ගාණක් තිස්සේ මෙතෙන් එගොඩට යන මිනිස්සු හැම දෙයක්ම මේ ගඟට විසි කරනවා - එයාලාගේ බලාපොරොත්තු, සිහින, කවදාවත් සැබෑ නොවූ ප්‍රාර්ථනා. මට නම් කියන්න තියෙන්නේ මේක කිසිම වගකීමක් නැති අපද්‍රව්‍ය කළමණාකරණයක් කියලා."

අපිරිසුදු වතුරෙන් උඩට මීදුම් කැරලි ගැසුණා. අපිට උඩින් හිරිලඹ - ඒ කියන්නේ එල්ලෙන, යෝධ හුණු කූරුවලින් සෑදුණු සිවිලිමක් කළුවර තුළ සැඟවී තිබුණා. ඈත ඉදිරියෙන් විෂවල ලා කොළ පාටින් දිලිසුණු වැල්ලක් තිබුණා.

භීතියෙන් මගේ උගුර හිරවුණා. මම මොනවද මෙතැන කරන්නේ? මගේ වටේට මේ ඉන්න කට්ටිය... එයාලා මැරිච්ච අය නේ.

ඇනබෙත් මගේ අත තදින් අල්ලා ගත්තා. සාමාන්‍ය තත්වයක් යටතේ නම් එයින් මාව අපහසුවට ලක්වෙන්න තිබුණා. ඒත්, එයාට දැනුණු විදිහ මම තේරුම් ගත්තා. මේ බෝට්ටුවේ පණ තියෙන

එක්කෙනෙක් හරි ඉන්න බව සහතික කරගන්නයි එයාට උවමනා වුණේ.

මම යාඥාවක් මුමුණන බව මටම තේරුණත්, ඒක කාට කරනවාද කියලා මමවත් දන සිටියේ නැහැ. මේ පාතාලයේ තියෙන්නේ එක දෙවියෙකුගේ අණසක විතරයි, මට මුහුණ දෙන්න වෙලා තිබුණෙත් එයාටමයි.

පාතාල ලෝකයේ වෙරළ සීමාව අපේ දර්ශන පථයට ආවා. ගිරිකුළු සහ යමහල් වැලිවලින් වැසුණු වෙරළ තීරය යාර සීයක් විතර ඈතින් වූ උස ගල් බැම්මක් දක්වාම පැතිරී තිබුණා. ගල් බැම්ම අපිට නොපෙනෙන සීමාව දක්වාම දෙපසට ඇදුණා. කොළ පාට මන්දාරම තුළ ළඟ පාතකින් පිටවූ හඬක් ගල්වල වැදී දෝංකාර දුන්නා - ඒක සද්දන්ත සතෙකුගේ උඩු බිරුමක්.

"තාකි මූළු තුනාට බඩගිනි වෙලා." කෙරොන් කිවුවා. කොළ පාට එළියෙන් එයාගේ හිනාව ඇටකටු ගොඩකට හැරුණා. "ඔයාලාගේ නරක වෙලාව තමයි, දෙව පැටවුනේ."

අපේ බෝට්ටු පතුල කළු වැල්ල තුළට ලිස්සා ගියා. මළවුන් ගොඩ බහින්න පටන් ගත්තා. චූටි ගැහැනු ළමයෙකුගේ අතින් අල්ලා ගත් අම්මා කෙනෙක්. අත් අල්ලාගත් වයසක ජෝඩුවක්. අළු පාට ලෝගුව ඇතුළේ කකුල් අද්දවමින් නිහඬව යන මගේ වයසේ කොල්ලෙක්.

"ඔයාට සුබ පතන්න මට තිබුණා, යාළුවා. ඒත් මේ පාතාලේ එහෙම ඒවා නැහැ. ඔන්න, මගේ පඩි වැඩිකිරීම ගැන කියන්න අමතක කරන්න එහෙම එපා."

අපේ රන් කාසි ගණිමින් පසුම්බියට දමාගත් එයා ආපසු රිට අතට ගත්තා. හිස් බෝට්ටුව නැවතත් එගොඩට රැගෙන යන අතරේ එයා මොකක්දෝ සිංදුවක් කියනවා ඇහුණා.

අපි මළවුන් පසුපසින් ගෙවී ගිය පාරක් දිගේ ඉදිරියට ගියා.

මම බලාපොරොත්තුවෙන් හිටියේ මොකක්ද කියලා මට හරියටම විශ්වාස නැහැ - මුතු වගේ දීප්තිමත් ගේට්ටුවක් හෝ ලොකු, කළු පාට දොරයක් වගේ දෙයක්. ඒත්, පාතාල ලෝකයේ ඇතුළු වීම පෙනුණේ ගුවන් තොටුපොළ ආරක්ෂක ගේට්ටුවක් වගෙයි.

'ඔබ දන් ඇතුළු වන්නේ එරෙබස් වෙතයි.' සඳහන් යෝධ කළු ආරුක්කුවකට යටින් ඇතුළු වීමේ දොරටු තුනක් වෙන්-වෙන්ව තිබුණා. ඒ සෑම දොරටුවකම ලෝහ පරීක්ෂක උපකරණ සහ ආරක්ෂක කැමරා සවිකර තිබුණා. ඊට එපිටින් වූ උපකරණ කුටි පාලනය කරමින් සිටියේ කෙරොන් වගේ භූතයෝයි.

බඩගිනිකාර සතාගේ උඩු බිරුම දන් මහ හඬින් ඇසුණත්, එය නැගෙන තැන මට හිතාගන්න බැරි වුණා. සේඩිස්ගේ දොරටුව මුර කරමින් සිටිය යුතු ඔළු තුනේ බල්ලා, සර්බෙරස් පේන්න හිටියේ නැහැ.

මළවුන් පෝලිම් තුනකට පෙළ ගැසුණා. එයින් පෝලිම් දෙකක 'රාජකාරී සඳහා' කියලත්, එක් පෝලිමක 'පහසු මරණ' කියලත් සලකුණු කර තිබුණා. 'පහසු මරණ' පෝලිම වේගයෙන් ඉදිරියට ඇදුණත් අනෙක් දෙක බඩගෑවා.

"ඔයාට මොනවද හිතෙන්නේ?" මම ඇනබෙත්ගෙන් ඇසුවා.

"වේගයෙන් යන පෝලිම කෙලින්ම යනවා ඇස්ෆොඩෙල් යායට වෙන්න ඕනෑ," එයා කිවුවා. "තරගයක් නෑ. උසාවියෙන් තීන්දුවක් ගන්න අවදානම එයාලාට ගන්න බැහැ. මොකද, ඒක එයාලාට විරුද්ධව යන්න ඉඩ තියෙනවා නේ."

"මෙහෙ මැරිච්ච මිනිස්සුන්ටත් උසාවියක් තියෙනවද?"

"ඔව්. විනිශ්චයකාරයෝ තුන් දෙනෙක් ඉන්නවා. එයාලා විනිශ්චය ආසනේ මාරුවෙන් මාරුවට වාඩි වෙනවා. මයිනස් රජතුමා, තෝමස් ජෙෆර්සන් ජනාධිපතිතුමා, ශේක්ස්පියර් වගේ කට්ටිය. සමහර වෙලාවට, එයාලා ජීවිතයක් දිහා බලලා ඒ කෙනාට විශේෂ තෑග්ගක් - ඒ කියන්නේ ස්වර්ගයට යන්න දෙන්න තීරණය කරනවා. සමහර වෙලාවට, දඬුවම් දෙන්න තීරණය කරනවා. ඒත් හුඟක් මිනිස්සු, මෙහෙමයි, එයාලා ඔහේ ජීවත් වෙනවා. කිසිම විශේෂත්වයක්, හොඳක් හෝ නරකක් නැහැ. ඉතින්, එයාලා ඇස්ෆොඩෙල් යායට යනවා."

"ඊට පස්සේ?"

"කැන්සාස්වල තිරිඟු යායක සදහටම ඉන්න විදිහ හිතේ මවා ගන්න," ග්‍රෝවර් කිවුවා.

"ගොරෝසුයි?" මම කිවුවා.

"ඒක අච්චර ගොරෝසු නැහැ." ග්‍රෝවර් කෙඳිරුවා. "බලන්න."

කළු ලෝගු හැඳගත් භූතයෝ දෙන්නෙක් එක් මළගිය ආත්මයක් පසෙකට ඇදලා අරන් ආරක්ෂක මේසය දිහාවට ඇදගෙන ගියා. ඒ මැරුණු මිනුස්සයාගේ මූහුණ දැකලා පුරුදුයි වගෙයි.

"අර පුවෘත්තිවලට පෙන්නුව ධර්ම දේශකයා එයා නේ, මතකද?" ග්‍රෝවර් ඇහුවා.

"ආහ්, ඔව්." මට දන් මතක් වුණා. අපි යැන්සි විද්‍යාලයේ ඉන්නකොට එයාව දෙසැරයක් විතර රූපවාහිනියේ පුවෘත්තිවල පෙන්නුවා. එයා අනාථ නිවාසවලට දෙන්න කියලා ඩොලර් මිලියන ගාණක් සම්මාදම් කරලා, ඊට පස්සේ ඒ සල්ලිවලින් එයාගේ බංගලාවට රත්තරන් වැසිකිළි පෝච්චි ගන්නයි, ගේ ඇතුළේ ගොල්ෆ් පිට්ටනි හදන්නයි වියදම් කරද්දී අහුවෙලා තිබුණා. ඊට පස්සේ පොලීසියෙන් එයාව පන්නද්දී එයාගේ ලැම්බොගිනි කාරය පල්ලමකට පෙරළිලා එයා මැරුණා.

"එයාලා ඒ මිනිහට මොනවද කරන්න යන්නේ?" මම ඇහුවා.

"හේඩීස්ගෙන් විශේෂ දඬුවමක්," ග්‍රෝවර් අනුමාන කළා. "ගොඩක් නරක මිනිස්සු මෙහෙ ආව ගමන්ම, එයාලාට හේඩීස්ගේ විශේෂ අවධානය ලැබෙනවා. පියු-කාරුණික ඇත්තෝ එයාට සදාකාලිකව වධ විඳින්න ලැස්ති කරයි."

පියුරිලාව මතක් වෙද්දී මගේ ඇඟ වෙවුලුවා. මම දන් ඉන්නේ එයාලාගේ අඩවියේ බව මගේ මතකයට ආවා. නාකි මිසිස් ඩොඩ්ස් දන් තොල කට ලෙව කකා බලාගෙන ඇති.

"ඒත්, එයා ධර්ම දේශකයෙක් නම්," මම කිවුවා. "එයා අදහන්න ඇත්තේ වෙන අපායක් ගැන නේ..."

ග්‍රෝවර් උරහිස් ඇකිළුවා. "එයාට මෙතැන පේනවා ඇත්තේ අපිට පේන විදිහට නෙවෙයි වෙන්නැති. මිනිස්සු දකින්නේ එයාලාට දකින්න උවමනා දේ විතරයි."

අපි ගේට්ටුවට තවත් ළං වුණා. දන්, උඩු බිරුම ශකායි තරම් හඬින් ඇහුණාද කියනවා නම්, ඒ සද්දෙට මගේ කකුල්වලට යටින් පොළොවත් දෙදුරුම් කෑවා. ඒ වුණාට ඒ හඬ එන තැන මට තවමත් සොයාගන්න බැරි වුණා.

එතකොටම, අපිට අඩි පනහක් විතර ඉදිරියෙන් කොළ පාට මීදුම හලියන්න වුණා. ප්‍රධාන පාර විදි තුනකට බෙදෙන තැන සිටගෙන හිටියේ අති විශාල බල්ලෙක්.

මට ඌව කලින් දකගන්න බැරි වුණේ ඒ සතාත් මළවුන් වගේම විනිවිද පෙනුන නිසායි. ඌ සෙලවෙද්දී ඌට පිටුපසින් තිබූ ඕනෑම දෙයක් එක්ක ඌ මිශ්‍ර වුණා. ඝන පෙනුමක් තිබුණේ ඌගේ ඇස්වලට සහ දත්වලට විතරයි. ඒ ඝන ඇස් මේ වෙලාවේ කෙලින්ම යොමු වෙලා තිබුණේ මගේ දිහාවටයි.

මගේ කට ඇරුණා. ඒ වෙලාවේ මට කියන්න මතක් වුණේ එකම දෙයයි. "එයා රොට්වෙලර් බල්ලෙක් නේ."

මම හැම වෙලාවේම සර්බෙරස්ව හිතේ මවාගත්තේ කළු පාට, හොම්බ එල්ලා වැටෙන මස්ටිෆ් වර්ගයේ බල්ලෙක් විදිහටයි. ඒත්, දන් නම් එයා පිරිසිදු රොට්වෙලර් වර්ගයේ බල්ලෙක් බවට සැකයක් නැහැ. වෙනසකට තිබුණේ එයා අයිස් යුගයේ මැමත් කෙනෙක් වගේ දෙගුණයක් විශාල වීමත්, මුළුමනින්ම වාගේ අදෘශ්‍යමාන වීමත්, ඔළු තුනක් තිබීමත් විතරයි.

මළවුන් කිසිම බයක් නැතිව එයාව පසුකරගෙන ගියා. 'රාජකාරි සඳහා' පෝලිම් දෙක එයාගේ දෙපසට බෙදී ගියා. 'පහසු මරණ' පෝලිම එයාගේ ඉදිරි ගාත් මැදින් සහ බඩ යටින් ගියත් එයාලාට අඩු තරමේ නැමෙන්නවත් සිද්ධ වුණේ නැහැ.

"මට දන් ඌව ටික ටික පැහැදිලි වෙනවා," මම කෙඳිරුවා. "ඒ ඇයි?"

"මං හිතන්නේ..." ඇනබෙත්, එයාගේ තොල් දෙක තෙත් කළා. "අපිත් මැරෙන්න කිට්ටු වෙන නිසාද කොහෙදෝ."

බල්ලාගේ මැද ඔළුව අපි දෙසට දිගු වුණා. සුළඟ ඉව කළ ඌ ගෙරෙව්වා.

"ඌට පණ තියෙන අයගේ ඉව දනෙනවා," මම කිවුවා.

"ඒත්, ඒකට කමක් නෑ," මට එහා පැත්තේ වෙවුලමින් හිටිය ග්‍රෝවර් කිවුවා. "මොකද, අපිට සැලැස්මක් තියෙනවා නේ."

"හරි," ඇනබෙත් කිවුවා. මම මීට කලින් කවදාවත්ම එයාගේ කටහඬ ඒ තරම් සිහින්ව අහලා තිබුණේ නැහැ. "සැලැස්මක්."

අපි යෝධ බල්ලා දෙසට ගියා.

ඌගේ මැද ඔළුව අපේ දෙසට දත් නියවා ගෙරෙව්වා, ඊට පස්සේ ඌ බිරුව සද්දෙට මගේ ඇස් බෝල පවා සෙලවුණා.

"ඌ කියන දේ ඔයාට තේරෙනවද?" මම ග්‍රෝවර්ගෙන් ඇහුවා.

"අපොයි, ඔව්," එයා කිවුවා. "මට හොඳට තේරෙනවා."

"මොනවද ඌ කියන්නේ?"

"මං හිතන්නේ, ඒක හරියටම තේරුම් කරන්න මිනිස්සුන්ගේ භාෂාවල වචනයක් නැද්ද කොහෙදෝ."

මම ක්‍රිස්ටිගේ ඇඳ පොල්ලකින් කඩාගෙන ආව ලොකු කෝටුව මගේ ගමන් මල්ලෙන් එළියට ගත්තා. එය උඩට එසවූ මම, සතුටුදායක බලු සිතුවිලි සර්බෙරස් දෙසට යොමු කරන්න උත්සාහ කළා. මම දැන් මැරෙන්න යන්නේ නැහැ වගේ මම හිනා වෙන්න බැලුවා.

"හේයි, ලොකු යාළුවා," මම කතා කළා. "එයාලා ඔයා එක්ක වැඩිය සෙල්ලම් කරන්නේ නෑ, නේද?"

"ග-ර්-ර්-ර්!"

"හොඳ කොල්ලා," මම හෙමිහිට කිවුවා.

මම කෝටුව වැනුවා. බල්ලාගේ මැද ඔළුවත් ඒ සමග වැනුණා. මළවුන්ව මුළුමනින්ම නොසලකා හරිමින් බල්ලාගේ අනෙක් ඔළු දෙකත් මගේ දිහාවට ඇස් හැරෙව්වා. දැන් මම සර්බෙරස්ගේ සම්පූර්ණ අවධානයට ලක් වෙලා. ඒක හොඳ දෙයක්ද කියලා නම් මට හරියටම විශ්වාසයක් තිබුණේ නැහැ.

"මින්න, අල්ල ගන්න!" මම මන්දාරම දිහාවට කෝටුව වේගයෙන් විසි කළා. 'ජබෝස්' ඒක ස්ටයික්ස් ගඟට වැටෙන හඬ මට ඇහුණා.

සිත් නොගත් බැල්මකින් සර්බෙරස් මගේ දෙසට රවාගෙන සිටියා. ඌගේ ඇස් සීතල සහ රෞද්‍ර පෙනුමක් ගත්තා.

අපේ සැලසුම වතුරේ ගියා.

සර්බෙරස් දැන් අලුත්ම විදිහකට උගුරු තුනෙන්ම ගොරවන්න පටන් ගත්තා.

"මේ, පර්සි?" ග්‍රෝවර් කතා කළා.

"ඇයි?"

"ඔයා මේක දැනගත්තොත් හොඳයි කියලා මට හිතුණා."

"මොකක්ද?"

"සර්බෙරස්? එයා කියනවා අපි කැමති දෙවියෙක්ව මතක් කරගන්න තප්පර දහයක් දෙනවලු. ඊට පස්සේ... මෙහෙමයි... එයා බඩගින්නේ ඉන්නේ."

"පොඩ්ඩක් ඉන්න!" ඇනබෙත් කිවුවා. එයා, එයාගේ මල්ල අවුස්සන්න වුණා.

අයියෝ, මම හිතුවා.

"තප්පර පහයි," ග්‍රෝවර් කිවුවා. "අපි දැන් දුවමුද?"

ඇනබෙත් මිදි ගෙඩියක් තරමේ රතු පාට රබර් බෝලයක් එළියට ගත්තා. 'ජල උයන-ඩෙන්වර්' එහි ලේබල් කර තිබුණා. මම එයාව නවත්වන්න කලින් බෝලය ඔසවා ගත් ඇනබෙත් සර්බෙරස් ළඟට ගියා.

"මේ බෝලේ දැක්කද? ඔයාට බෝලේ ඕනැද, සර්බෙරස්? කෝ, ඉදගන්න!"

අපි තරමටම බල්ලාත් පුදුමයට පත්වෙලා වගෙයි.

ඌගේ ඔළු තුනම පැත්තකට නැමුණා. නාස්පුඩු හයම පළල් වුණා.

"ඉඳ ගන්න!" ඇනබෙත් ආයෙමත් කිවුවා.

දැන් ඕනෑම මොහොතක එයා ලෝකයේ ලොකුම බලු බිස්කෝතුව වෙන බව මට නම් සහතික වුණා.

ඒත්, ඒ වෙනුවට තොල් තුනම ලෙවකෑ සර්බෙරස් පස්සාගාත් මත වාඩි වුණේ එයාගේ බඩ යටින් යමින් සිටි 'පහසු මරණ' පෝලිමේ මළවුන් දුසිමක් විතර චප්ප කරමිනුයි. විසිරී ගිය මළවුන්ගෙන් රෝදයක හුළං යනවා වගේ හඬක් පිටවුණා.

"හොඳ කොල්ලා!" ඇනබෙත් කිවුවා.

එයා සර්බෙරස්ට බෝලය විසි කළා.

Scanned with CamScanner

ඌ එය මැද කටින් අල්ලා ගත්තා. ඌට යන්තමින් හපන්න විතරක් ඇති වූ ඒ බෝලය ගැනීමට අනෙක් ඔළු දෙකත් පොරකන්න පටන් ගත්තා.

"ඕක බිමට දාන්න." ඇනබෙත් අණ කළා.

පොරකෑම නතර කළ ඔළු තුන එයා දිහා බැලුවා. බෝලය චූටි චූවින්ගම් කෑල්ලක් වගේ ඌගේ දත් දෙකක් අතරේ හිර වෙලා. මහ හඬින් කෙඳිරියක් පිට කළ ඌ සෙවෙල තැවරී, බාගෙට සැපූ බෝලය ඇනබෙත්ගේ පාමුලට දැමුවා.

"හොඳ කොල්ලා." බෝලයේ ගෑවී තිබුණු බලු කෙළ නොසලකා හරිමින් ඇනබෙත් එය අහුලා ගත්තා.

එයා අපේ දිහාවට හැරුණා. "දැන් යන්න. 'පහසු මරණ' පෝලිම ඉක්මනට යනවා."

"ඒත් -" මම කිව්වා.

"දැන්!" එයා බල්ලාට අණ කළ හඬින්ම කිව්වා.

ග්‍රෝවර් සහ මම පරිස්සමින් අඟලින් අඟල ඉදිරියට ඇදුණා.

සර්බෙරස් ගොරවන්න පටන් ගත්තා.

"ඔහොම ඉන්න!" ඇනබෙත් සතාට නියෝග කළා. "ඔයාට බෝලේ ඕනෑ නම්, ඔතනම ඉන්න!"

සර්බෙරස් කෙඳිරිගෑවත් එතැනින් සෙලවුණේ නැහැ.

"ඔයා මොකද කරන්නේ?" අපි ඇනබෙත්ව පසු කරද්දී මම එයාගෙන් ඇසුවා.

"මං කරන්නේ මොනවද කියලා මම දන්නවා, පර්සි," එයා මිමිණුවා. "අඩු තරමේ, මට සැහෙන විශ්වාසයි..."

ග්‍රෝවර් සහ මම බල්ලාගේ කකුල් අතරින් ඇවිද ගියා.

අනේ, ඇනබෙත්, මම හිතෙන් අයැදුවා. ඌට ආයෙමත් ඉඳගන්න නම් කියන්න එපා.

අපි අනෙක් පැත්තට ගියා. පිටුපසින් බලද්දී වුණත් සර්බෙරස්ගේ බිහිසුණු පෙනුමේ අඩුවක් තිබුණේ නැහැ.

"හොඳ බල්ලා!" ඇනබෙත් කිව්වා.

එයා කඩමාලු වූ රතු බෝලය උඩට එසෙවුවා. සමහරවිට, මම ගත් තීරණයම එයාගේ හිතටත් එන්න ඇති - එයා ඒක සර්බෙරස්ට දුන්නොත්, තවත් උපායකට එයා ළඟ කිසිවක් නැති වෙනවා.

කොහොම වුණත්, එයා බෝලය විසි කළා. බල්ලාගේ වම් කට ඉක්මනින්ම එය ඩැහැගත්තත්, එයට මැද ඔළුවේ සපාකෑම්වලට මුහුණ දෙන්න වුණා. ඒ අතරේ දකුණු පැත්තේ ඔළුව විරෝධය පාමින් ලතෝනි දුන්නා.

සතා කලබලෙන් සිටින අතරේ ඌගේ බඩ යටින් කඩිසරව ඇවිද ආ ඇනබෙත් ලෝහ පරීක්ෂක උපකරණය ළඟදී අපිට එකතු වුණා.

"ඔයා කොහොමද ඒක කළේ?" මම එයාගෙන් ඇසුවේ පුදුමයට පත්වෙලයි.

"බල්ලෝ පුහුණු කරන ඉස්කෝලේ," එයා හුස්ම අල්ලමින් කියද්දී එයාගේ ඇස්වල කඳුළු පිරෙනවා දකලා මට පුදුම හිතුණා.

"මං පුංචි කාලේ, මගේ තාත්තාගේ ගෙදර ඩොබර්මන් බල්ලෙක් හිටියා..."

"ඒකෙන් කමක් නෑ," ග්‍රෝවර් කිව්වේ මගේ කමිසයෙන් අදිමින්. "ඉක්මන් කරන්න!"

අපි 'පහසු මරණ' පෝලිම හරහා දුවන්න සූදානම් වෙද්දී සර්බෙරස් දුක හිතෙන විදිහට ඔළු තුනෙන්ම විලාප දෙන්න වුණා. ඇනබෙත් නැවතුණා.

අපේ දිහාවට නැමීගෙන සිටි බල්ලාට මුහුණ දෙන්න එයා ආපසු හැරුණා.

සර්බෙරස් බලාපොරොත්තු සහගතව හති දැමුවා. කෑලිවලට කැඩීගිය රතු බෝලය ඌගේ පාමුල තිබුණා.

"හොඳ කොල්ලා," ඇනබෙත් කියද්දී එයාගේ කටහඬේ දුකින් පිරුණු, අවිනිශ්චිත බවක් තිබුණා.

බල්ලාගේ ඔළු පැත්තකට හැරුණේ හරියට ඌ ඇනබෙත් ගැන දුක් වෙනවා වගෙයි.

"මම ඉක්මනටම ඔයාට නව බෝලයක් ගේන්නම්කෝ," ඇනබෙත් පොරොන්දු වුණා. "ඔයා ඒකට කැමතිද?"

බිල්ලා කෙඳිරිගෑවා. සර්බෙරස් තවමත් බෝලය වෙනුවෙන් බලා ඉන්න බව තේරුම් ගන්න මට බලු භාෂාව දැනගන්න උවමනා වුණේ නැහැ.

"හොඳ බල්ලා. මම ඉක්මනටම ඔයාව බලන්න එන්නම්කෝ. ම-මම පොරොන්දු වෙනවා." ඇනබෙත් අපේ දිහාවට හැරුණා. "අපි යමු."

ග්‍රෝවර් සහ මම ලෝහ පරීක්ෂක උපකරණය හරහා ගිය සැණින්ම ඒක හඬ නලමින් රතු එළි දල්වන්න පටන් ගත්තා. "අනවසර ඇතුළුවීමක්! මායාවන් අනාවරණයක්!"

සර්බෙරස් බුරන්න පටන් ගත්තා.

අපි 'පහසු මරණ' ගේට්ටුව හරහා දුවද්දී එහි තව තවත් අනතුරු ඇඟවීමේ සංඥා දල්වෙන්න වුණා. ඒ අතරේ, අපි පාතාල ලෝකය තුළට දිවුවා.

විනාඩි කීපයකට පසු, අපි කළු පාට රුස්ස ගහක දිරා ගිය කඳ පිටුපස හැංගිලා, හුස්ම අල්ලන අතරේ, පියුරිලාගෙන් උදවු ඉල්ලා මොර දෙමින් ආරක්ෂක භූතයෝ අපිව පන්නා කරගෙන දඩිබිඩියේ දිවුවා.

"හොඳයි, පර්සි. අපි අද ඉගෙන ගත්තේ මොකක්ද දන්නවද?" ග්‍රෝවර් හොඳරා ඇසුවා.

"ඔළු තුනේ බල්ලෝ කෝටුවලට වඩා රතු පාට රබර් බෝලවලට කැමතියි කියන එකද?"

"නෑ," ග්‍රෝවර් කිවුවා. "ඔයාගේ සැලසුම් අන්තිම සවුත්තුයි කියන එක!"

මට නම් එහෙම හිතුණේ නැහැ. සමහරවිට, ඇනබෙත්ටයි මටයි දෙන්නාටම හරි අදහසක් තියෙන්න ඇති කියලා මම හිතුවා. මේ පාතාල ලෝකයේදී පවා, හැම දෙනාටම - අඩු තරමේ සතෙක්ට වුණත් කලාතුරකින් හරි පුංචි අවධානයක්වත් උවමනායි. භූතයෝ අපිව පන්නකරගෙන යනතුරු සැඟවී ඉන්න අතරේ මම ඒ ගැන කල්පනා කළා. තමන්ගේ අලුත් යාළුවාව හොයමින් සර්බෙරස් විලාප තියන හඬ අහගෙන ඉන්න ගමන් ඇනබෙත්, එයාගේ කම්මුලට වැටුණු කඳුළු පිස දමනවා දැක්කත්, මම ඒක නොදැක්ක ගාණට හිටියා.

19

අපි ඇත්ත හෙළිදරවු කරගත්තා, වාගේ

ප්‍රසංගයකදී ඔයාට දකින්න ලැබුණු ලොකුම සෙනග හිතේ මවා ගන්න, රසිකයෝ මිලියන ගාණක් පිරුණු පාපන්දු පිටියක් මතක් කරගන්න.

දැන්, ඒ වගේ මිලියන ගුණයක් විතර ලොකු පිට්ටනියක මිනිස්සු ඇහිරිලා, තදබද වෙලා ඉන්න විදිහත්, එතැන විදුලිය විසන්ධි වෙලා, කිසිම හඬක්වත්, එළියක්වත් නැතිව තියෙනවා මවා ගන්න. මිනිස්සු වේදිකාව පිටුපස මොකක් හෝ ඛේදවාචකයක් සිදු වෙලා. මිනිස්සු කොඳුරමින් සෙවණැලි අතරේ එහෙ මෙහෙ ඇවිදිනවා. කවදාවත් ආරම්භ නොවෙන ප්‍රසංගයක් වෙනුවෙන් එයාලා බලාගෙන ඉන්නවා.

ඔයාට ඒ දර්ශනය හිතේ මවා ගන්න පුළුවන් නම්, ඇස්ෆොඩෙල් යායේ පෙනුම ගැන ඔයාට හොඳ අදහසක් ඇති වේවි. යුග ගණනාවක මැරුණු මිනිසුන්ගේ කකුල්වලට පෑගී එහි කළු තණකොළ තැලිලා. වගුරු බිමක වගේ උණුසුම්, තෙත්බර සුළං හැමුවා. කළු පාට ගස් - ඒ පොප්ලර් ගස් කියලා ග්‍රෝවර් මට කිවුවා - තැනින් තැන එක ගොන්නට වැවී තිබුණා.

ගුහාවේ සිවිලිම පිහිටා තිබුණේ අපිට වඩා ගොඩාක් උඩිනුයි. දුෂ්ට ලෙස උල් වූ, අළු පාටින් දිලිසෙන හිරිලම් එහි එල්ලී නොතිබුණා නම් සිවිලිම කුණාටු වලාකුළු පිරුණු අහසක් වගේ පේන්නත් ඉඩ තිබුණා. ඕනෑම මොහොතක ඒවා අපේ ඇඟට කඩා වැටෙන්න ඉඩ

ඇති බව නොහිතා ඉන්න මම උත්සාහ කළත්, යායේ තැනින් තැන ඒවා සීපයක්ම කවා වැටී. කළු තණකොළ අතරින් කිදාබෑස තිබුණා. සුපිරි රොකට්ටුවක් තරම් විශාල පිරිලම් කෙල්ල පහරකට ලක්වෙනවා වගේ පොඩි පොඩි උවදුරු ගැන මළවුන් නම් වද වෙන්නේ නැතිව ඇති කියලා මම අනුමාන කළා.

ඇනබෙත්, ග්‍රෝවර් දෙන්නා එක්ක මම ආරක්ෂක භූතයෝ ගැන ඇස් ගෙහෙනම් සෙනගට එකතු වුණා. මගේ ඇස් ඇස්ෆොඩෙල් ආත්ම අතරේ හුරු පුරුදු මුහුණු සෙවීම මටම නවත්වාගන්න බැරි වුණත් මළවුන් දිහා බැලීම ලේසි වැඩක් වුණේ නැහැ. එයාලාගේ මුහුණු දිලිසුනා. ඒ හැම දෙනාම යම්තම් කේන්තියෙන් හෝ කලබලෙන් ඉන්නවා වගෙයි පෙනුණේ. එයාලා අපි ළඟට ඇවිත් කතා කළත් ඒ හඬවල් ඇහුණේ වවුලෝ චර-චර ගානවා වගෙයි. අපිට එයාලාව තේරුම් ගන්න බැරි බව දැනගත්තාම එයාලා රවාගෙන යන්න ගියා.

මළවුන් භය උපදවන්නේ නැහැ. එයාලා දුකෙන් ඉන්නවා විතරයි.

ප්‍රධාන ගේට්ටුවේ සිට කළු කුඩාරම් ගැසූ මණ්ඩපයක් දෙසට ගමන් ගිය අලුත් සාමාජිකයෝ එක්ක අපිත් ඒ දෙසට ඇදුණා. ඒ මණ්ඩපයේ බැනරයක් එල්ලා තිබුණා: ස්වර්ගය සහ සදාකාලික නිරය සඳහා විනිශ්චය.

අලුතින් අභාවප්‍රාප්ත වූවන් සාදරයෙන් පිළි ගනිමු!

කුඩාරම් පිටුපසින් තරමින් පුංචි පෝලිම් දෙකක් එළියට ආවා.

ආරක්ෂක භූතයෝ වම් පස පෝලිමේ සිටි මළවුන්ට පහර දෙමින්, එයාලාව ගලින් සෑදූ පාරක් දිගේ ඇදගෙන ගියා. ඒ පාරේ ඈත කෙළවර තිබුණේ දුම් දමමින් ලෝදිය ගංගා ගලන අපරිමාණ බිඳුණු බිමක්. ඒ වධක බිම එක් එක් වධයන් සඳහා කටු කම්බිවලින් කොටස්වලට වෙන්කර තිබුණා. එතැන යම බල්ලෝ මිනිස්සු දඩයම් කරනවා, එයාලාව උල හිඳුවා ගිනි තියනවා, නිරුවතින් කටු පඳුරු අතරේ දුවවනවා වගේම ඔපෙරා සංගීතයට සවන් දෙන්න සලස්වනවාත් මේ තරම් ඈතක සිට වුණත් මට දැකගන්න හැකි වුණා. ඒ වගේම, මට විස්තර කරන්න උවමනා නැති ආකාරයේ දරුණු වධ වේදනාවලට පවා මිනිසුන්ව ලක් කර ඇති විදිහ මම දැක්කා.

විනිශ්චය මණ්ඩපයේ දකුණු පසින් එළියට ආ පෝලිමේ තත්වය ටිට වඩා ගොඩාක් හොඳ වුණා. මේ අයව කැඳවාගෙන ගියේ සකල ලෝකයේ එකම සතුටුදායක තැන ලෙසට පෙනෙන්නට තිබුණු පුංචි මිටියාවතකටයි. තාප්පවලින් වටකර තිබූ මෙහි ආරක්ෂක ගේට්ටුවලට එපිටින් රෝමානු මෝස්තරයේ ලොකු ගෙවල්, මධ්‍යතන යුගයේ මාළිගා සහ වික්ටෝරියානු යුගයේ වලව් වගේ ඉතිහාසයේ හැම යුගයකටම අයිති ලස්සන ගෙවල් දකින්න ලැබුණා. රිදී පාට තණකොළ වැවූ මිදුල්වල රිදී සහ රන් පාට මල් පිපිලා. සිනා හඬවල් සහ රසවත් කෑම උයන සුවඳ ඒ පැත්තෙන් ගලා ආවා.

ඒ තමයි ස්වර්ගය.

ඒ මිටියාවත මැද පුංචි දූපත් තුනක් ඇති විලක් නිල් පාටින් දිලිසුනා. ඒ ආශිර්වාදිතයින්ගේ දූපත් - ඒ කියන්නේ මැරුණට පස්සේ තුන් වතාවක් ආපසු ඉපදෙන්න තෝරාගෙන, ඒ තුන් වතාවේදීම ස්වර්ගයට එන්න ඉඩ සලස්වාගත් අය ඉන්නා තැනයි. මැරුණට පස්සේ මට යන්න උවමනා තැන මොකක්ද කියලා මම එවෙලේම තේරුම් ගත්තා.

"ඒක තමයි තැන," ඇනබෙත් කිවුවේ හරියට මගේ හිත කියෙව්වා වගෙයි. "ඒක තමයි වීරයන්ගේ තැන."

ඒ වුණත්, ඇස්ෆොඩෙල් යායේ හෝ අඩු තරමේ වධක භූමියේ සිටින මිනිස්සු ගාණ එක්ක සංසන්දනය කරද්දී ස්වර්ගයේ ඉන්නේ කොයි තරම් අඩු පිරිසක්ද කියලා මම කල්පනා කළා. තමන්ගේ ජීවිත කාලයේදී හොඳ වැඩ කරලා තියෙන්නේ හරිම ටික දෙනෙක් විතරයි. ඒක නම් කණගාටුදායක දෙයක් වුණා.

විනිශ්චය මණ්ඩපයෙන් ඈත්වූ අපි ඇස්ෆොඩෙල් යායේ ඇතුළටම ගියා. එහි කළුවර ටිකෙන් ටික වැඩි වුණා. අපේ ඇඳුම්වල පාට මැකී ගියා. දොඩවන මළවුන් ගොඩ ටිකෙන් ටික තුනී වෙන්න ගත්තා.

මේ විදිහට හැතැප්ම කීපයක් ඇවිදගෙන ගියාට පස්සේ අපිට හුරු පුරුදු කෑගැසීමක් ඈතින් ඇහෙන්න ගත්තා. කළු ඔබ්සිඩියන් පාෂාණවලින් සෑදූ මාළිගාවක් ඈත ක්ෂිතිජයේ පෙනෙන්න වුණා. වවුල් පෙනුම ඇති අඳුරු සත්තු තුන්දෙනෙක් එහි තාප්පයට උඩින් කැරකෙමින් සිටියා: ෆියුරීලා. එයාලා බලා ඉන්නේ අපි එනතුරු බව මට හැඟුණා.

"මට හිතෙන්නේ, දූත් නම් ආපහු හැරෙන්න පරක්කු වැඩියි වගේ." ග්‍රෝවර් කල්පනාබරව කිවුවා.

"අපිට කරදරයක් වෙන්නේ නැතිවෙයි," මම විශ්වාසී ලෙස කියන්න උත්සාහ කළා.

"සමහර විට, අපි ඉස්සෙල්ලාම අනිත් තැන්වල බලලා හිටියා නම් හොඳ නැද්ද," ග්‍රෝවර් යෝජනා කළා. "මේ... ස්වර්ගය වගේ තැන්වල එහෙම..."

"මෙහෙ එනවා, එළු කොල්ලෝ." ඇනබෙත් එයාගේ අතකින් අල්ලා ගත්තා.

ග්‍රෝවර් වේදනාවෙන් කෑගැසුවා. තටු මතු වූ එයාගේ සපත්තු දෙක එක්ක එයාගේ කකුල් ඉදිරියට විසි වුණේ එයාව ඇනබෙත්ගෙන් ඉදිරියට අදිමිනුයි. එයාව තණගොල්ල උඩ උඩුබැලි අතට වැටුණා.

"ග්‍රෝවර්." ඇනබෙත් දොස් කිවුවා. "පිස්සු නටන්න එපා."

"ඒත් මම නෙවෙයි -"

එයා ආපසු කෑගැසුවා. දූත් එයාගේ සපත්තුවලට පිස්සු හැදිලා වගේ තටු ගහන්න ගත්තා. පොළොවෙන් උඩට එසවුණු ඒවා ග්‍රෝවර්ව අපෙන් ඉවතට අදින්න වුණා.

"මයියා!" එයා මොර දුන්නා, ඒත් ඒ මායා වචනයෙන් කිසිම බලපෑමක් නැහැ වගෙයි. "ආයෙමත්, මයියා! නමයයි-එකයි-එක හදිසි ඇමතුම් සේවය! උදව් කරන්ඩෝ!"

කම්පනයෙන් මිදුණු මම ග්‍රෝවර්ගේ අත ඩැහැ ගත්තා, ඒත් පරක්කු වැඩියි. වේගය වැඩි වූ එයා හිමේ ලිස්සා යනවා වගේ කන්ද පහළට ඇදී ගියා.

අපි එයා පසුපස දිව්වා.

"සපත්තු දෙක ගලවන්න!" ඇනබෙත් කෑගැසුවා.

ඒක මොළේ ඇති අදහසක් වුණත්, එයාගේ සපත්තු දෙක උපරිම වේගයෙන් එයාව ඇදගෙන යද්දී ඒක කරන්න නම් ලේසි නැහැ කියලා මම අනුමාන කළා. ග්‍රෝවර් ඉදගන්න උත්සාහ කළා, ඒත් එයාට සපත්තු ලේස්වලට කිට්ටු වෙන්න බැරි වුණා.

දොඩවමින් සිටි මළවුන් දෙන්නෙකුගේ කකුල් මැදින් වේගයෙන් ඇදී ගිය ග්‍රෝවර්ව පෙනෙන මානයේ තියාගන්න උත්සාහ කරමින් අපි දිගටම එයා පසුපස දිව්වා.

ග්‍රෝවර් කෙළින්ම යන්නේ හේඩීස්ගේ මාළිගාවේ ගේට්ටු අතරින් ඇතුළට කියලා මට නම් හොඳටම විශ්වාස වුණා, ඒත් දකුණු පැත්තට තියුණු හැරවුමක් ගත් සපත්තු දෙක එයාව ඇදගෙන ගියේ ඊට විරුද්ධ පැත්තටයි.

කන්දේ බෑවුම වැඩි වුණා. ග්‍රෝවර්ගේ වේගයත් වැඩි වුණා. එයා එක්කම යන්න ඇනබෙත්ටයි මටයි උපරිම වේගයෙන් දුවන්න සිද්ධ වුණා. ගුහා බිත්ති ක්‍රමයෙන් පටු වෙද්දී අපි උමගකට ඇතුළු වූ බව මට තේරුම් ගියා. කළු තණකොළ හෝ ගස් කිසිවක් නොතිබූ මෙහි අපේ කකුල්වලට යටින් ගලුත්, ඉහළින් හිරිලඹවල මන්දාලෝකයත් විතරක් තිබුණා.

"ග්‍රෝවර්!" මම මොර දෙද්දී මගේ කටහඬ දෝංකාර දුන්නා. "මොකක් හරි අල්ල ගන්න!"

"මොකක්ද?" එයා ආපසු මොර දුන්නා.

එයා බොරලු ඩැහැ ගනිමින් සිටියත් එයාගේ වේගය අඩු කරන්න ප්‍රමාණවත් තරමේ දෙයක් එතැන තිබුණේ නැහැ.

උමඟ කළුවර සහ සීතල වෙන්න ගත්තා. මගේ අත්වල රෝම කෙළින් වුණා. එය ඇතුළේ හමමින් තිබූ යක්ෂ ගඳ මම නොදන සිටිය යුතු දේවල් ගැන පවා මට හිතන්න සැලැස්වූවා - පෞරාණික ගල් අල්තාර මත ඉහිරවූ ලේ, මිනීමරුවෙකුගේ කටින් හමන ගඳ.

ඊට පස්සේ, අපිට ඉදිරියෙන් තිබුණු දේ දැකපු මම හිටි තැනම නතර වුණා.

විශාල, අඳුරු ගුහාවක් තුළට උමගේ කෙළවර පළල් වුණා. ඒ ගුහාව මැද තිබුණේ යෝධ ගොඩනැගිල්ලක් වුණත් සම්පූර්ණයෙන්ම ගිල්වන්න පුළුවන් තරමේ ආගාධයකුයි.

"ඉක්මනට එන්න, පර්සි!" මගේ මැණික් කටුවෙන් අදිමින් ඇනබෙත් කෑගැසුවා.

"ඒත් ඒක -"

"මං දන්නවා!" එයා බෙරිහන් දුන්නා. "මේක තමයි ඔයා හීනෙන් දකපු තැන! ඒ වුණාට අපි ග්‍රෝවර්ව අල්ලා ගත්තේ නැත්නම් එයාව පහළට වැටෙයි." ඇත්තටම, එයා හරි. ග්‍රෝවර්ගේ අකරතැබ්බය මාව ආපසු ගමනට යොමු කළා.

එයා කෑගසමින් බිම පහුරු ගෑවත් පියාඹන සපත්තු නොනැවතීම එයාව ආගාධය දිහාවට ඇද්දා. එයාව වැටෙන්න කලින් අල්ල ගන්න අපිට පුළුවන් වෙන පාටක් තිබුණේ නැහැ.

එයා බේරුණේ එයාගේ කුර නිසයි.

කොහොමත් පියාඹන සපත්තු එයාගේ කකුල්වලට වඩා ලොකුවටයි තිබුණේ. ඉතින් අන්තිමේදී ග්‍රෝවර් ලොකු ගලක් අල්ල ගනිද්දි එයාගේ වම් සපත්තුව ගැලවිලා විසි වුණා. ඒක ආගාධයේ කළුවර තුළට වේගයෙන් පියඹා ගියා. දකුණු සපත්තුව දිගටම එයාව අදිමින් සිටියත් එය කලින් තරම් වේගවත් වුණේ නැහැ. එල්ලී සිටි ලොකු ගල හැංගුරමක් ලෙස පාවිච්චි කරමින් වේගය අඩු කරගන්න ග්‍රෝවර්ට පුළුවන් වුණා.

එයා ආගාධයට අඩි දහයක් විතර ඈතින් ඉන්නකොට එයාව අල්ලගෙන, ආපසු බෑවුමේ උඩට ඇදගෙන යන්න අපිට පුළුවන් වුණා. ගැලවී ගිය අනෙක් සපත්තුව කේන්තියෙන් අපේ වටේ කැරකෙමින් විරෝධය පාන්න වගේ අපේ ඔළුවලට පයින් ගහලා, ඊට පස්සේ අනෙකට එකතු වෙන්න ආගාධයට පැන්නා.

මහන්සියෙන් අඩපණ වූ අපි ඔබ්සිඩියන් බොරලු උඩ කඩාවැටුණා. මගේ අත් පයවල ඊයම් බරු එල්ලලා වගෙයි මට දැනුණේ. මගේ ගමන් මල්ල පවා කලින් තිබුණාට වඩා බරට දැනෙන්න ගත්තේ හරියට කවුරුහරි ඒකට ගල් පුරවලා වගෙයි.

ග්‍රෝවර්ව හොඳටම සීරිලා තුවාල වෙලා. එයාගේ අත්වලින් ලේ ගැලුවා. එයා බය වුණාම වෙන විදිහට එයාගේ කළු ඉංගිරියා දෙක එළුවෙකුගේ වගේ හීනි වී තිබුණා.

"මං දන්නෑ කොහොම..." එයා හති දැමුවා. "මම නෙවෙයි..."

"වුට්ටක් ඉන්න," මම කිවුවා. "ඇහෙනවද?"

මට මොකක්දෝ ඇහුණා - ඒක කළුවරෙන් මතු වුණ ගැඹුරු කෙඳිරුම් හඬක්.

තවත් තත්පර තීපයකට පස්සේ ඇනබෙත් කතා කළා. "පර්සි, මේ තැන-"

"ෂ් ෂ්..." මම සිට ගත්තා.

ඒ හඬ ටිකෙන් ටික වැඩි වුණා. ඒ කොඳුරන යක්ෂ හඬ අපිට ගොඩක් පහළ ආගාධය තුළිනුයි මතු වුණේ.

ග්‍රෝවර් නැගිට වාඩි වුණා. "මො-මොකක්ද ඒ සද්දේ?"

දැන්, ඇනබෙත්ටත් ඒක ඇහිලා තිබුණා. මට ඒ බව එයාගේ ඇස්වලින් පෙනුණා. "ටාටරස්. ටාටරස්වල ඇතුළුවීමේ දොරටුව." මම රිප්ටයිඩ් එළියට ගත්තා.

ලෝකඩ කඩුව කළුවරේ දිස්නය දෙද්දි යක්ෂ හඬ පැකිළෙන බවක් පෙනුණා, ඒත් මොහොතකට පසු ඒක ආයෙමත් මැතිරුම පටන් ගත්තා.

මට දැන් ඒ වචන හොඳටම වගේ වෙන්කර හඳුනාගන්න පුළුවන් වුණා. ඒවා පෞරාණික. ග්‍රීකවලටත් වඩා පෞරාණික වචනයි. ඒවා...

"මන්තර," මම කිවුවා.

"අපි මෙතැනින් එළියට යන්න ඕනෑ." ඇනබෙත් කිවුවා.

ග්‍රෝවර්ව ආපසු කුරවලින් සිටවූ අපි උමග දිගේ ආපසු යන්න පටන් ගත්තා. මගේ කකුල් මට උවමනා තරම් වේගවත් වුණේ නැහැ. මගේ ගමන් මල්ලේ බර මාව පහළට ඇද්දා. අපිට පිටුපසින් කටහඬ කේන්තියෙන් මොර දෙද්දී අපි දුවන්න පටන් ගත්තා.

මොහොතක්වත් ගතවුණේ නැහැ.

සීතල සුළං ධාරාවක් පිටුපසින් අපිව අදින්න ගත්තේ හරියට මුළු ආගාධයම හුස්ම අදිනවා වගෙයි. එක බිහිසුණු මොහොතකට මගේ කකුල් බොරලු උඩ ලිස්සලා, මාව වැටෙන්න ගියා. අපි තව ටිකක් හරි ආගාධයේ කටට කිට්ටුවෙන් හිටියා නම් අපිව ඇතුළටම ඇදිලා යන්න ඉඩ තිබුණා.

දිගටම ඉදිරියට යන්න දැගලූ අපි අන්තිමේදී ඇස්ෆොඩෙල් යායට උමග විවෘත වෙන තැනට ආවා. සුළඟ නැති වුණා. උමගේ ගැඹුරින් ක්‍රෝධය පිරුණු ලතෝනියක් පිටවුණා. අපි එළියට පැන ගත්තාට එක්කෙනෙක් නම් සතුටු නැහැ වගෙයි.

"ඒ මොකාද ඒ?" කලින් තැනට වඩා ආරක්ෂිතව පෙනුණු කළු පොප්ලර් ගස් ගොන්න අතරට අපි ඇද වැටුණාට පසු ග්‍රෝවර් හති දමමින් ඇසුවා.

"හේඩීස්ගේ හුරතලෙක්ද?"

ඇනබෙත්යි මමයි මුහුණෙන් මුහුණ බලාගත්තා. එයා මොකක් හරි අදහසකට සාත්තු කරන බව මට තේරුණා, සමහරවිට ඒක ලොස් ඇන්ජලීස්වලින් කුලී රියට නැගපු වෙලාවේ එයාගේ හිතේ වැඩ කළ අදහසම වෙන්න ඇති. ඒත් ඒක අපිත් එක්ක බෙදාගන්න ඇනබෙත් බය වුණා. මගේ බය දෙගුණ කරන්න ඒකම ප්‍රමාණවත් වුණා.

කඩු තුඩට කොපුව තැබූ මම ඒක පෑනකට හරවා, ආපසු මගේ සාක්කුවට දමාගත්තා. "අපි දිගටම යමු," මම ග්‍රෝවර් දිහා බැලුවා. " ඔයාට ඇවිදින්න පුළුවන්ද?"

එයා කෙළගිල්ලා. "ඔව්, අවුලක් නෑ. කොහොමත් මම ඒ සපත්තු දෙකට වැඩි කැමැත්තෙන් නෙවෙයි හිටියේ."

එයා ඒ ගැන නිර්භීත විදිහට කතා කරන්න උත්සාහ කළත්, අපි දෙන්නා තරමටම එයාත් වෙවුලමිනුයි හිටියේ. ආගාධයේ සිටියේ මොකෙක් වුණත් ඒ කාගේවත් හුරතලෙක් නම් වෙන්න බැහැ. ඒක කියන්න බැරි තරම් පෞරාණික සහ බලගතු දෙයක්. අඩු තරමේ එච්ඩිනා නිසාවත් මට ඒ වගේ හැඟීමක් දැනුණේ නැහැ. ඒ ගුහාවට පිටුපස හරවලා ආපසු හේඩීස්ගේ මාළිගාවට යන්න පිටත් වෙද්දී මට මුළුමනින්ම වගේ සහනයක් දැනුණා.

ඒත්...

තාප්පයට උඩින් අන්ධකාරය තුළ ෆියුරිලා කැරකෙමින් සිටියා. කළු පාටින් දිලිසුන බලකොටුවේ පිටත බිත්ති මැද තට්ටු දෙකක් උස ලෝකඩ ගේට්ටුව සම්පූර්ණයෙන්ම හැර දමා තිබුණා.

ගේට්ටුවට කිට්ටු වෙද්දී එහි කැටයම් කර ඇත්තේ මරණයේ දර්ශන බව මට දකින්න ලැබුණා. එයින් සමහරක් නූතන කාලයට අයිති ඒවායි: නගරයකට උඩින් පරමාණු බෝම්බයක් පුපුරා යන දර්ශනයක්. විෂ වායු ආවරණ පැළඳගත් සෙබළු පිරුණු අගලක දර්ශනයක් වගේම අප්‍රිකාවේ සාගතයෙන් දුක් විඳින මිනිස්සු හිස් භාජන අතේ තියාගෙන බලන් ඉන්නා දර්ශනයකුත් ඒ අතර තිබුණා. ඒත් ඒ හැම එකකටම

තිබුණේ මීට අවුරුදු දහස් ගාණකට කලින් ලෝකඩ තුළට කැටයම් කරලා වගේ පෙනුමක්. මම බලා ඉන්නේ සැබෑවට පත් වූ අනාවැකි දිහාද කියලා මම පුදුමයෙන් කල්පනා කළා.

ඇතුළු මිදුලේ තිබුණේ මෙච්චර කාලයකට මට දකින්න ලැබුණු පුදුමාකාරම උද්‍යානයයි. වෛවර්ණ බිම්මල්, විසකුරු පඳුරු සහ ඉර එළිය නැති තැන්වල වැවෙන දිලිසෙන පැලෑටිවලින් එතැන පිරී තිබුණා. මගේ අත් මිටක් තරම් ලොකු රතු කැට, නොකැපූ දියමන්ති පොකුරු වගේ වටිනා මැණික්වලින් එතැන මල් නැති අඩුව පිරිමසා තිබුණා. උත්සවයකට ඇවිත් ගල් ගැසුණු ආරාධිත අමුත්තෝ වගේ ගල් ගැසුණු ළමයි, සැටර්ලා සහ හාස්‍යජනක විදිහට හිනාවෙන නරාශ්වයන්ව තැනින් තැන සිටුවා තිබුණා. ඒවා මෙඩූසාගේ බහිරව වෙළඳ පොළෙන් ගෙනා ඒවායි.

උයන මැද දෙළුම් ගස් යායක් දකින්න ලැබුණා. ඒවාගේ නැඹිලි පාට මල් නියෝන් එළි වගේ කළුවර මැදින් දිලිසුනා.

"පර්සෙෆොන්ගේ උයන," ඇනබෙත් කිවුවා. "නවතින්නේ නැතුව යමු."

එතැන නතර නොවී දිගටම යන්න එයාට උවමනා වුණු හේතුව මට තේරුණා. ඒ දෙළුම්වල සුවඳ ඉවසාගෙන ඉන්න බැරි තරම්. ඒවා කන්න මට හදිසි ආශාවක් ඇති වුණා, ඒත් එතකොටම පර්සෙෆොන්ගේ කතාන්දරය මට මතක් වුණා: පාතාල ලෝකයේ කෑමකින් එක කටක් හරි කෑවොතින් අපිට ආයේ කවදාවත් මෙතැනින් පිට වෙන්න ලැබෙන්නේ නැහැ. ග්‍රෝවර් හොඳට ඉදුණු, ලොකුම ගෙඩියක් කඩා ගන්න කලින් මම එයාව ඇදගෙන එතැනින් ගියා.

මාළිගාවේ පඩි පෙළ නැගපු අපි, කළු කුලුනු දෙකක් පසු කරමින්, කළු ගරුඬ ඇල්ලූ පෝටිකෝවක් හරහා හේඩීස්ගේ විමානයට ඇතුළු වුණා. පිවිසුම් ශාලාවේ ඔප දැමූ ලෝකඩ පොළොව මතට පන්දම් එළිය වැටිලා කැකෑරෙනවා වගෙයි පෙනුණේ. සිවිලිමක් නොතිබුණු එහි ඈත ඉහළින් ගුහාවේ පියස්ස විතරක් පෙනුණා. මෙහෙදී එයාලට වැස්ස ගැන කරදර වෙන්න උවමනා නැතිව ඇති කියලා මම අනුමාන කළා.

හමුදා ඇඳුම්වලින් සැරසුණු ඇටසැකිලි සෑම පැති දොරක්ම මුර කරමින් සිටියා. ඒ සමහරෙක් ග්‍රීක සන්නාහවලිනුත්, තවත් සමහරු බ්‍රිතාන්‍ය රතු කබා නිල ඇඳුමිනුත්, ඉතිරි අය කඩමාලු වූ

Scanned with CamScanner

ඇමරිකානු හෙඩියක් උරහිසේ ගැසූ ඉද හමුදා ඇඳුම්වලින්නුත් සැරසී සිටියා. එයාලා හෙලි. තුවක්කු සහ එම්-16 රයිෆල්වලින් සන්නද්ධ වුණ අයයි. ඒ කිසි කෙනෙක් අපිට කරදර නොකළත්, එයාලාගේ හිස් ඇස් කෙවෙනි සාලාවේ අනෙක් කෙළවරේ දොරටුව ළගට යනතුරුම අපිව ලුහුබැන්දා.

ඇමරිකානු නාවික හමුදා ඇටකෝටිවෝ දෙන්නෙක් දොරටුව මුර කරමින් හිටියා. අත් බෝම්බ විදින තුවක්කු පපුවට තද කරගෙන හිටි එයාලා අපිට විච්චතුවා.

"දන්නවද," ග්‍රොවර් කෙඳිරුවා. "මං හිතන්නේ හේඩීස්ට නම් ගෙයින් ගෙට ගිහින් බඩු විකුණන වෙළෙන්දන්ගෙන් කරදරයක් නැතුව ඇති."

දැන් මගේ ගමන් මල්ල ටොන් එකක් විතර බරට දැනුණා. ඒ ඇයි කියලා මට හිතාගන්න බැරිවුණා. වැරදිලාවත් මම ගල් ගෙඩියක් ඇතුළට දාගෙනද බලන්න ඒක අරින්න මට ඕනෑ වුණා. ඒත් මේ ඒකට වෙලාව නෙවෙයි.

"හොඳයි, යාළුවනේ," මම කතා කළා. "මං හිතන්නේ අපි... දොරට තට්ටු කරන්න වෙයිද?"

ඒ එක්කම කොරිඩෝව දිගේ හමා ආ උණුසුම් සුළගෙන් දොර මුළුමනින්ම ඇරුණා. මුරකාරයෝ පැත්තකට වුණා.

"මං හිතන්නේ ඒකේ තේරුම 'ඇතුළට යන්න' කියන එක." ඇනබෙත් කිව්වා.

ඇතුළේ වූ ශාලාව මම හීනෙන් දැකපු තැනට හැම අතින්ම සමාන වුණා. එකම වෙනස වුණේ මේ වතාවේ සිංහාසනයේ හේඩීස් වාඩිවෙලා හිඳීම විතරයි.

මට මුණ ගැසුණු තුන්වෙනි දෙවියා එයා වුණත්, ඇත්තටම දේව පෙනුමක් තිබුණු පළවෙනි කෙනා එයයි.

ඒකට එක හේතුවක් වුණේ එයා අඩු තරමේ අඩි දහයක්වත් උස් වීමයි. ඒ වගේම, කළු සේද ලෝගුවක් හැඳ සිටි එයා රනින් ගෙතූ ඔටුන්නක් පැළඳගෙන සිටියා. ඇලි කෙනෙක් වගේ සුදුමැලි සමක් තිබුණු එයාට උරහිස දක්වා දිග, තද කළු කොණ්ඩයක් තිබුණා. ඒරිස් වගේ මස්පොඩවලින් පිරුණු කෙනෙක් නොවුණත් එයාගෙන් බලයේ

ජ් විහිදුණා. මිනිස් ඇටකටුවලින් සැදූ සිංහාසනයේ එයා හාන්සි වෙලා හිටියේ සුනම්‍ය, සුන්දර හා භයානක අඳුන් දිවියෙක් වගෙයි.

අපි එයාගේ නියෝග පිළිපදින්න ඕනෑ කියලා මට එවෙලේම දැනෙන්න ගත්තා. මම දන්නවාට වඩා දේවල් එයා දන්නවා. ඒ නිසා මගේ ස්වාමියා වෙන්න ඕනෑ එයයි. ඊට පස්සේ, එයින් ගැලවෙන්න මම, මටම බල කළා.

ඒරිස් ළඟ පාතක ඉන්නකොට සිද්ධ වුණා වගේම හේඩීස්ගේ බලයත් මට බලපෑම් කරමින් තිබුණා. මම පින්තූරවලින් දකලා තිබුණු හිට්ලර්ගේ පෙනුම, නැපෝලියන්ගේ පෙනුම වගේම මරාගෙන මැරෙන බෝම්බකරුවන්ව මෙහෙයවන ත්‍රස්තවාදී නායකයන්ගේ පෙනුමත් සංකලනය වූ පෙනුමක් මරණයට අධිපතිට තිබුණා. ඒ වගේ තියුණු ඇස් දෙකකුත්, වශී කරවනසුලු දුෂ්ට අනුහසකුත් හේඩීස්ට තිබුණා.

"මෙහෙට එන්න තරම් නුඹ නිර්භීතයි, පොසෙයිඩන්ගේ පුත්‍රය," එයා සුමට කටහඬකින් කිවුවා. "නුඹ මට කරපු දේටත් පස්සේ, ඒක නම් ඇත්තටම නිර්භීත වැඩක්. එහෙම නැත්නම් සමහරවිට, නුඹ අමු මෝඩයෙක් වෙන්නැති."

මගේ අත්-පා පුරා හිරියක් පැතිරුණේ හේඩීස්ගේ කකුල් දෙක ළඟ බිම වැතිරිලා පොඩි නින්දක් ගන්න මාව පොලඹවමින්. එතැන වකුටු වෙලා සදාකාලයටම නිදාගන්න මට ඕනෑ වුණා.

ඒ හැඟීම එක්ක සටන් කරමින් මම ඉදිරියට අඩියක් තැබුවා. කියන්න ඕනෑ මොනවාද කියලා මම දැනගෙන හිටියා. "උතුමාණෙනි සහ බාප්පේ, මං ආවේ ඉල්ලීම් දෙකක් අරගෙන."

හේඩීස් ඇහිබැමක් එසෙව්වා. එයා සිංහාසනයේ ඉදිරියට වෙලා වාඩි වෙද්දී එයාගේ කළු ලෝගුවේ රැලි අතරින් වධ විඳින සෙවණැලි මුහුණු මතුවුණේ වධක භූමියේ හිරවුණු ආත්මවලින් ඒ ඇඳුම වියලා වගෙයි. එයාගේ ඉතිරි ඇඳුම් වියලා තියෙන්නෙත් ඒ විදිහටද හිතලා මගේ හිතේ පැත්තක් පුදුම වුණා. හේඩීස්ගේ යට ඇඳුමකට වියෙන්න නම් කලින් ජීවිතේදී එයාලා මොන තරම් පවු වැඩ කරලා තියෙන්න ඇතිද?

"ඉල්ලීම් දෙකක් විතරද?" හේඩීස් ඇසුවා. "උද්ධච්ච කොල්ලා. නුඹ දැනටමත් අරගෙන තියෙන හරිය මදිවට වගෙයි. කියනවා, එහෙනම්, නුඹව තවම මරලා දැම්මේ නැත්තේ මේකෙන් මට විනෝදයක් දැනෙන නිසා."

මම කෙළ පොදක් ගිල්ලා. මම බය වෙලා හිටිය විදිහටම මේක සිද්ධ වෙයෙනයි එන්නේ.

හේඩීස්ගේ සිංහාසනයට එහා පැත්තේ තිබුණු පුංචි සිංහාසනය දිහාවට මම බැල්මක් හෙළුවා. කළු පාට මලක හැඩයට සාදා තිබූ එහි රන් ආලේප කරලා. පර්සෙෆොන් රැජින මෙතැන හිටියා නම් කියලා මට හිතුණා. එයාට, එයාගේ සැමියාගේ හිත සන්සුන් කරන්න පුළුවන්ලු. ඒත්, මේ ගිම්හාන සෘතුව නේ. ඇත්ත වශයෙන්ම පර්සෙෆොන්, එයාගේ අම්මා, කෘෂිකර්මයට අධිපති දෙවඟන - ඩිමීටර් එක්ක ලෝකය එළිය කරන්න ගිහින් ඇති. සෘතු භේදය ඇති වෙන්නේ පෘථිවියේ ඇල වීම නිසා නෙවෙයි, එයාගේ සංචාර නිසාලු.

ඇතමෙත් උඬුර පැදුවා. එයාගේ ඇඟිල්ලක් මගේ පිටේ ඇනුණා.

"හේඩීස් උතුමාණෙනි," මම කිවුවා. "බලන්න, සර්, දෙවිවරු අතරේ යුද්ධයක් ඇති වෙන්න බැහැ. එහෙම වුණොත් ඒක... නරකයි."

"ගොඩාක් නරකයි." ග්‍රෝවර්ත් එකතු කළා.

"සියුස්ගේ ප්‍රධාන අකුණ මට දෙන්න," මම ඉල්ලුවා. "කරුණාකරලා, සර්. ඒක ඔලිම්පස්වලට අරගෙන යන්න මට ඉඩ දෙන්න."

හේඩීස්ගේ ඇස් දෙක අනතුරුදායක ලෙස දීප්තිමත් වුණා. "තුඹ කරලා තියෙන දේවල්වලට පස්සෙත්, මේ බොරුව දිගටම කරගෙන යන්න තරම් හයියක් තුඹට ආවද?"

මම, මගේ යාළුවෝ දෙසට බැල්මක් හෙළුවා. එයාලාත් මං තරමටම අන්දමන්ද වෙලා වගෙයි.

"ම්...හාර්ජේ," මම කතා කළා. "ඔයා දිගටම කියනවා 'තුඹ කරලා තියෙන දේවල්වලට පස්සේ' කියලා. ඇත්තටම මම මොනවද කරලා තියෙන්නේ?"

සිංහාසන ශාලාව කොයි තරම් තද කම්පනයකින් වෙවුලුවාද කියනවා නම්, සමහරවිට ඒක උඩම තට්ටුවේ ලොස් ඇන්ජලීස්වලට පවා දැනෙන්න ඇති. ගුහා වියන්සේ කැලි කඩා හැලුණා. බිත්ති දිගට තිබූ සියලුම දොරවල් ඇරී, ඇටසැකිලි සෙබළු එළියට එන්න ගත්තා. එතැන බටහිර ශිෂ්ටාචාරයේ සෑම යුගයකටම, සෑම රටකටම අයිති

සෙබළු සිය ගාණක් හිටියා. පිටවීම සියල්ල අහුරමින් එයාලා ශාලාව වටේට හිටගත්තා.

හේඩීස් ගිගිරුවා. "තුඹ හිතන්නේ මට යුද්ධයක් ඕනෑ කියලද, දෙව පැටියෝ?"

හැබැයි, මෙයාලා සාම නියෝජිතයෝ වගේ නම් පේන්නේ නෑ. මට කියන්න උවමනා වුණා. ඒත් ඒක අනතුරුදායක උත්තරයක් වෙන්න ඉඩ තියෙනවා කියලා මට හිතුණා.

"මරණයට අධිපති ඔයා නේ," මම පරිස්සමින් උත්තර දුන්නා. "යුද්ධයක් නිසා ඔයාගේ රාජධානිය ලොකු වෙනවා, නේද?"

"මගේ සහෝදරයෝ කියන්නෙම ඕක තමයි! මට තව යටත් වැසියෝ ඕනෑ ඇති කියලා තුඹ හිතනවද? ඇස්ෆොඩෙල් යායේ තියෙන තදබදේ තුඹට පේන්නේ නැද්ද?"

"හොඳයි..."

"පහුගිය අවුරුදු සීයට විතරක් මගේ රාජධානිය කොච්චර ඉදිමුණාද, මට කොච්චර අතුරු කොටස් අරින්න වුණාද කියලා තුඹට අදහසක්වත් තියෙනවද?"

ප්‍රතිචාර දක්වන්න මම කට ඇරියා, ඒත් හේඩීස් වක්කඩ කැඩුවා වගේ කියවාගෙන ගියා.

"ආරක්ෂක භූතයෝ වැඩි කරන්න වුණා," එයා වැලපුණා. "විනිශ්චය මණ්ඩපේ ළඟ තදබදේ වැඩි වෙලා. සේවකයින්ගේ අතිකාල වැඩි කරන්න වෙලා. මම පෝසත් දෙවියෙක් විදිහටයි හිටියේ, පර්සි ජැක්සන්. පොළොව යට තියෙන වටිනා ලෝහ ඔක්කොම පාලනය කරන්නේ මම. ඒත් මට තියෙන වියදම්!"

"කෙරොන්ටත් පඩි වැඩිවීමක් ඕනෑ," කාරණය මතක් වූ සැණින් මම කියලා දැම්මා. ඒක මගේ කටින් පැන්නට පස්සේ, මගේ කට මහගත්තා නම් මීට වඩා හොඳයි කියලා මට හිතුණා.

"කෙරොන් ගැන මට මතක් කරන්නවත් එපා!" හේඩීස් මොර දුන්නා. "ඉතාලි සූට් ගැන දැනගත්ත දවසේ ඉඳලා ඒ භූතයාගෙන් මට විසුමක් නැහැ! හැම තැනම ප්‍රශ්න. මේ ඔක්කොම මං තනියම විසඳගන්න එපැයි. මාළිගාවේ ඉඳන් ගේට්ටුව ළඟට යන-එන ටිකම ඇති මාව පිස්සු වට්ටන්න! ඒ මදිවට, මැරුණු එවුන් තව එනවා. නෑ,

Scanned with CamScanner

දේව පැටියෝ. මට තවත් යටත් වැසියෝ නම් ඕනෑම නෑ! මම මේ යුද්ධය ඉල්ලුවේ නෑ."

"ඒ වුණාට, ඔයා සියුස්ගේ ප්‍රධාන අකුණ ගත්තනේ."

"බොරු බේගල්!" තවත් ගර්ජනාවක්. හේඩීස් සිංහාසනයෙන් නැගිට්ටා. එයා විදුලි කණුවකටත් වඩා උසයි. "සියුස්ව රවට්ටන්න නුඹේ තාත්තාට පුළුවන් ඇති, කොල්ලෝ. ඒත් මම එච්චර මෝඩ නැහැ. එයාගේ සැලසුම මොකක්ද කියලා මට පේනවා."

"එයාගේ සැලසුම?"

"දක්ෂිණායනයේ හොරා නුඹයි." එයා කිවුවා. "නුඹේ තාත්තා හිතුවේ එයාගේ පුංචි රහස විදිහට නුඹව තියාගන්න. එයා නුඹව ඔලිම්පස්වල සිංහාසන ශාලාවට මෙහෙයවූවා. නුඹ ප්‍රධාන අකුණයි, මගේ හිස්වැසුමයි ගත්තා. නුඹව අනාවරණය කරගත්ත මම, මගේ ෆියුරි කෙනෙක්ව යැන්සි ඉස්කෝලෙට යැවුවේ නැත්නම්, යුද්ධයක් පටන් ගන්න පොසෙයිඩන් හැදුව උපක්‍රමය හංගන්න එයාට පුළුවන් වෙන්න තිබ්බා. ඒත් දැන් නුඹව බලෙන්ම එළියට ඇදිලා ආවා. පොසෙයිඩන්ගේ හොරා විදිහට නුඹව හෙළිදරව් වේවි. ඒ වගේම මට, මගේ හිස්වැසුම ආපහු ලැබේවි!"

"ඒත්..." ඇනබෙත් කතා කළා. එයාගේ හිත පැයට සැතපුම් මිලියනයක වේගයෙන් දුවන බව මට තේරුණා.

"හේඩීස් උතුමාණෙනි, ඔබතුමාගේ අඳුරේ හිස්වැසුමත් නැති වෙලාද?"

"මුකුත් නොදන්න ගාණට රඟපාන්න එපා, කෙල්ල. මේ කොල්ලාට මෙතැනට ඇවිල්ලා, පොසෙයිඩන්ගේ නාමෙන් මට තර්ජනය කරන්න නුඹයි, මේ සැටර්යි දෙන්නම උදවු කළා. කිසිම සැකයක් නෑ, මට අන්තිම බලපෑම කරන්න තමයි එන්න ඇත්තේ. තර්ජනය කරලා මගෙන් උදවු ගන්න පුළුවන් කියලා පොසෙයිඩන් හිතනවද?"

"නෑ!" මම කිවුවා. "පොසෙයිඩන් නෙවෙයි - මං නෙවෙයි -"

"හිස්වැසුම අතුරුදහන් වුණ එක ගැන මම කිසිම දෙයක් කිවුවේ නැහැ." හේඩීස් ගෙරෙව්වා. "මොකද, ඔලිම්පස්වල කාගෙන්වත් මට පුංචිම සාධාරණයක්වත්, පුංචිම උදවුවක්වත් ලැබෙයි කියලා මම හිතන්නේ නැහැ. මගේ බලගතුම භීතියේ ආයුධය නැතිවෙලා කියලා

ප්‍රිටට ආරංචි වුණොත් මටමයි නරකක් වෙන්නේ. ඒ නිසා, මම ම ඒක හොයන්න පටන් ගත්තා. ඊට පස්සේ, නුඹේ තර්ජනයත් අරගෙන නුඹ මගේ ළඟට එනවා කියලා දැන ගත්තාම මම නුඹව නතර කරන්න හැදුවෙ නෑ."

"ඔයා අපිව නතර කරන්න හැදුවෙ නෑ? ඒත් -"

"මගේ හිස්වැසුම ආපහු දෙනවා, නැත්නම් මම මරණය නතර කරනවා," හේඩීස් තර්ජනය කළා. "ඒක තමයි මගේ ප්‍රතියෝජනාව. මම පොළොව ඇරලා, මළවුන්ව ආපහු ලෝකෙට යවනවා. මම නුඹේ රටවල් නරක හීනයකට හරවනවා. එතකොට, පර්සි ජැක්සන් - නුඹේ ඇටසැකිල්ල මගේ හමුදාවේ නායකයා වෙයි."

ආයුධ මානාගත් ඇටකෝටු සෙබළ අඩියක් ඉදිරියට ආවා.

ඒ වෙලාවේදී, හරිනම් මම බය වෙන්න ඕනෑ.

අමුතුම දේ වුණේ, ඒ වෙනුවට මට තරහවක් දැනීමයි. මම නොකරපු වැරැද්දකට මාව පටලවනවා තරම් මට කේන්ති යන වෙන දෙයක් නැහැ. මට ඒ වගේ අත්දැකීම් ගොඩාක් තියෙනවා.

"ඔයත් සියුස් තරම්ම නරකයි," මම කිවුවා. "ඔයා හිතන්නේ මම ඔයාගෙන් හොරකම් කළා කියලද? ඒ නිසාද ඔයා මගේ පස්සේ ෆියුරිලාව එවුවේ?"

"ඇත්ත වශයෙන්ම," හේඩීස් කිවුවා.

"එතකොට අනිත් රාක්ෂයෝ?"

හේඩීස් තොල පෙරළුවා. "එයාලා ගැන මම දන්නේ නෑ. නුඹව ඉක්මනට මරන්න මට උවමනාවක් තිබ්බේ නැහැ - මට ඕනෑ වුණේ නුඹව පණපිටින් මගේ ඉස්සරහට ගෙනල්ලා, වධක භූමියේ තියෙන හැම වධයකටම නුඹට මුහුණ දෙන්න සලස්වන්නයි. මගේ රාජධානියට නුඹට ලේසියෙන්ම ඇතුළු වෙන්න මම ඉඩ දුන්නේ මොකක් නිසා කියලද නුඹ හිතන්නේ?"

"ලේසියෙන්ම?"

"මගේ බඩුව ආපහු දෙනවා!"

"ඒත් මගේ ළඟ ඔයාගේ හිස්වැසුම නැහැනේ. මං ආවේ ප්‍රධාන අකුණ අරගන්න."

Scanned with CamScanner

"ඒක දනටමත් තුඹ ළඟ" හේඩීස් කෑගැසුවා. "තුඹ මෙතෙට ආවේ ඒකත් අරගෙනයි, මෝඩ පැටියෝ. මට තර්ජනය කරන්න පුළුවන් කියලා හිතුවද?"

"ඒත් මම එහෙම කළේ නැහැ!"

"එහෙනම්, ඔය මල්ල අරිනවා."

භයානක හැඟීමකින් මගේ හිත පිරුණා. ගල් ගෙඩියක් දාලා වගේ ගමන් මල්ලේ දනුණු බර. එහෙම වෙන්නේ කොහොමද...

උරහිසෙන් මල්ල ගැලවූ මම එහි සිපරය ඇරියා. ඒක ඇතුළේ අඩි දෙකක් දිග, දෙපසින්ම උල් වූ ලෝහ සිලින්ඩරයක් උතුරා යන ශක්තියෙන් ගුම්-ගුම් හඬ පිටකරමින් තිබුණා.

"පර්සි," ඇනබෙත් කතා කළා. "කොහොමද -"

"ම්-ම්. දන්නේ නෑ. මට තේරෙන්නේ නෑ."

"මේ වීරයෝ නම් ඔක්කොම එකයි," හේඩීස් කිවුවා. "මේ වගේ ආයුධයක් මගේ ඉස්සරහට ගේන්න පුළුවන් කියලා තුඹ හිතුවේ තුඹගේ ආඩම්බරකම තුඹව මෝඩයෙක් කරපු නිසා. සියුස්ගේ ප්‍රධාන අකුණ මම ඉල්ලුවේ නම් නෑ. ඒ වුණාට, දැන් ඒක මෙතැන තියෙන නිසා තුඹ ඒක මට පවරා දෙන්න ඕනෑ. ඒක හෙට්ටු කරන්න හොඳ බඩුවක් වෙයි කියලා මට විශ්වාසයි. දැන් එතකොට... කෝ මගේ හිස්වැසුම?"

මාව හොල් වුණා. මගේ ළඟ හිස්වැසුමක් කොහෙන්ද. මගේ ගමන් මල්ලට ප්‍රධාන අකුණ ආවේ කොහොමද කියලා මට අදහසක්වත් තිබුණේ නැහැ. හේඩීස් මොකක් හරි උප්පරවැට්ටියකට අර අඳිනවා කියලා හිතන්න මට ඕනෑ වුණා. හේඩීස් තමයි මේ කතාවේ දුෂ්ටයා. ඒත්, හදිසියේම ලෝකය අනෙක් පැත්තට හැරුණා. මාව ඉන්නෙත් වුණ බව මට තේරුණා. කවුරුහරි සියුස්, පොසෙයිඩන් සහ හේඩීස්ට එකිනෙකාගේ බෙලි මිරිකාගන්න සලස්වලා. ප්‍රධාන අකුණ තිබුණේ මගේ ගමන් මල්ලේ. එතකොට... මට ඒ මල්ල දුන්නේ...

"පොඩ්ඩක් ඉන්න, හේඩීස් උතුමාණෙනි," මම කිවුවා. "මේ ඔක්කොම අත්වැරැද්දක්."

"අත්වැරැද්දක්?" හේඩීස් ගර්ජනා කළා.

ඇටකෝට්ටෝ, එයාලාගේ ආයුධ මැනුවා. ඈත ඉඳන් වවුල් තටු වදින හඬක් ඇහුණා. ඒත් එක්කම පියාඹලා තුන්දෙනා, එයාලාගේ ස්වාමියාගේ සිංහාසනය පිටුපසට ගොඩබෑවා. මිසිස් ඩොඩ්ස්ගේ මූණ තිබුණු පියුරි මගේ දිහාවට ආශාවෙන් දත් නියවලා එයාගේ කසය වැනුවා.

"මෙතැන කිසිම අත්වැරැද්දක් නෑ," හේඩීස් කිවුවා. "තුඹ ආවේ ඇයි කියලා මම දන්නවා - තුඹ අකුණ අරගෙන ආව නියම හේතුව මම දන්නවා. තුඹ ආවේ මෙයා වෙනුවෙන් හෙට්ටු කරන්න."

හේඩීස්, එයාගේ අත්ලෙන් රන් පාට ගිනි බෝලයක් නිදහස් කළා. මගේ ඉදිරියේ පඩි පෙළ පාමුල ඒක පුපුරා ගියා. එතකොටම, රන් පාට එළියක් ඇතුළේ ගල් ගැසුණු මගේ අම්මා එතැන මතු වුණේ මිනටෝර් එයාගේ ජීවය මිරිකන්න පටන්ගත් වෙලාවේදී හිටිය විදිහටමයි.

මට කතා කරගන්න බැරිවුණා. එයාව අල්ලන්න මම අත දිගු කළා. ඒත්, ඒ එළිය ගිනිමැලයක් වගේ උණුසුම්.

"ඔව්," හේඩීස් තෘප්තිමත් හඬකින් කිවුවා. "මම එයාව ගත්තා. අන්තිමේදී, තුඹ මාත් එක්ක කේවල් කරන්න එනවා කියලා මම දැනගෙන හිටියා, පර්සි ජැක්සන්. මගේ හිස්වැසුම ආපහු දෙනවා. ඊට පස්සේ, බාගදා මම එයාට යන්න ඉඩ දෙයි. තුඹ දන්නවනේ, එයා මැරිලා නෑ. තාම නෑ. හැබැයි, තුඹ මාව අමනාප කරගත්තොත්, ඒක වෙනස් වෙයි."

මගේ සාක්කුවේ තිබුණු මුතු ඇට ගැන මම හිතුවා. සමහරවිට, මෙතැනින් ගැලවෙන්න මට ඒවා උදවුවක් වේවි. මට, මගේ අම්මාව නිදහස් කරගන්න පුළුවන් වුණොත්...

"අහ්, මුතු ඇට," හේඩීස් කියද්දී, මගේ ඇගේ ලේ කැටි ගැහුණා. "ඔව්, මගේ සහෝදරයයි - එයාගේ සූත්තරයි. ඒවා එළියට ගන්න, පර්සි ජැක්සන්."

මගේ කැමැත්තට පිටින් ගිය මගේ අත මුතු ඇට එළියට ගත්තා.

"තුනයිද තියෙන්නේ," හේඩීස් ඇසුවා. "මොන තරම් ලැජ්ජාවක්ද. ඔය එකකින් ආරක්ෂා කරන්න පුළුවන් එක්කෙනෙක්ව විතරයි කියලා තුඹ දන්නවනේ. එහෙනම්, තුඹේ අම්මාව ගන්න උත්සාහ

කරලා බලනවා, දෙව පැටියෝ. එතකොට, මාත් එක්ක සදාකාලයම ගත කරන්න තුඹේ කොයි යාළුවාද කියලා යන්නේ? තෝරගමුකෝ බලන්න. එහෙම බැරිනම්, මල්ල මට දීලා, මගේ කොන්දේසි පිළිගන්නවා."

මම ඇනබෙත් සහ ග්‍රෝවර් දෙස බැලුවා. එයාලාගේ මුහුණු අඳුරු වෙලා.

"අපිව රවට්ටලා," මම එයාලාට කිවුවා. "මේකට පැටලෙව්වා."

"ඔව්, ඒත් මොකටද?" ඇනබෙත් ඇහුවා. "එතකොට, ආගාධයෙන් ඇහුණ කටහඬ -"

"මම තවම දන්නේ නෑ," මම කිවුවා. "ඒත්, මං හිතාගෙන ඉන්නේ ඒ ගැන අහන්න."

"තීරණයක් ගන්නවා, කොල්ලෝ!" හේඩිස් මොර දුන්නා.

"පර්සි," ග්‍රෝවර් මගේ උරහිස උඩින් අතක් තැබුවා. "එයාට අකුණ දෙන්න ඔයාට බැහැ."

"මං ඒක දන්නවා."

"මාව මෙහෙ තියලා යන්න." එයා කිවුවා. "තුන්වෙනි මුතු ඇටේ ඔයාගේ අම්මා වෙනුවෙන් පාවිච්චි කරන්න."

"නෑ!"

"මම සැටර් කෙනෙක්," ග්‍රෝවර් කිවුවා. "මිනිසුන්ට වගේ අපිට ආත්ම නැහැ. මම මැරෙනකම් වධ දෙන්න එයාට පුළුවන් වෙයි, ඒත් මාව සදාකාලයටම තියාගන්න එයාට බැහැ. මාව මලක් වෙලා හරි ආයෙමත් ඉපදේවි. ඒක තමයි හොඳම විදිහ."

"නෑ," ඇනබෙත්, එයාගේ ලෝකඩ කිණිස්ස ඇදලා ගත්තා. "ඔය දෙන්නා මෙතෙන් යන්න. ග්‍රෝවර් ඔයාට පර්සිව ආරක්ෂා කරන්න තියෙනවා. සොයන්නෙකුගේ බලපත්‍රය අරගෙන පෑන්ව හොයන්න යන්නත් තියෙනවා. පර්සිගේ අම්මාව මෙතැනින් එළියට ගෙනියන්න. මම ඔයාලව ආරක්ෂා කරන්නම්. සටන් කරලාම මැරෙන්නයි මම සැලසුම් කරන්නේ."

"කිසිවෙක් නෑ," ග්‍රෝවර් කිවුවා. "මම තමයි නතර වෙන්නේ."

"ආපහු හිතලා බලන්න, එළු කොල්ලෝ," ඇනබෙත් කිවුවා.

"දෙන්නාම ඕක නතර කරනවද!" මගේ හදවත දෙකට පළනවා වගෙයි මට දැනුණේ. ඒ දෙන්නම මාත් එක්ක ගොඩාක් දේවල්වලට මුහුණ දුන්නා. බහිරව උයනේදී ග්‍රෝවර් මෙඩූසාට පහර දුන්නු විදිහ මට මතක් වුණා, තව, ඇනබෙත් අපිව සර්බෙරස්ගෙන් බේරගත් විදිහ; හෙෆාස්ටස්ගේ ජල උයනේදී, ශාන්ත ලුයිස් ආරුක්කුවේදී වගේම ලෝටස් කැසිනෝවේදිත් අපි ජීවිත බේරාගෙන ආවා. මගේ යාළුවෙක් මට ද්‍රෝහී වෙයි කියලා හිතෙත් වද වෙමින් මම හැතැප්ම දහස් ගාණක් ගෙව්වා, ඒත් මේ යාළුවෝ කවමදාකවත් එහෙම කරන්නේ නැහැ. එයාලා දිගින් දිගටම මාව බේරාගන්න එකයි කළේ. ඊට පස්සේ, දැන් මගේ අම්මා වෙනුවෙන් එයාලගේ ජීවිත කැප කරන්න පවා එයාලා හිතනවා.

"කරන්න ඕනෑ මොකක්ද කියලා මම දන්නවා," මම කිවුවා. "මේවා ගන්න."

මම එයාලට මුතු ඇටය බැගින් දුන්නා.

"ඒත්, පර්සි..." ඇනබෙත් කතා කළා.

මම, මගේ අම්මා දිහාවට හැරුණා. මගේ ජීවිතය කැප කරලා එයා වෙනුවෙන් අන්තිම මුතු ඇටය පාවිච්චි කරන්න මට තදින්ම ඕනෑ වුණත්, ඒ ගැන එයා කියන්නේ මොකක්ද කියලා මම දැන සිටියා. එයා කවදාවත් ඒකට ඉඩ දෙන්නේ නැහැ. මම අකුණ ආපසු ඔලිම්පස්වලට අරගෙන ගිහින් සියුස්ට ඇත්ත කියන්නම ඕනෑ. මේ යුද්ධය මම නතර කරන්නම ඕනෑ. එහෙම නොකර, මම අම්මාව බේරා ගත්තොත් අම්මා කවදාවත්ම මට සමාව දෙන්නේ නැති වේවි.

මීට අවුරුදු මිලියනයකට විතර කලින් අහන්න ලැබුණා වගේ මට දැනුණු අර්ධ-ලෝහිත කන්දේ ඔරකල්ගේ අනාවැකිය මගේ මතකයට ආවා: අවසානයේදී වඩාත්ම වැදගත් දේ බේරා ගැනීමට නුඹ අපොහොසත් වේවි.

"මට සමාවෙන්න," මම අම්මාට කිවුවා. "මම ආපහු එනවා. මං ඒකට ක්‍රමයක් හොයා ගන්නම්."

හේඩිස්ගේ මුහුණේ තිබුණු උදාසීන බැල්ම මැකී ගියා. "කොල්ලෝ...?" එයාට කියවුණා.

"මම ඔයාගේ හිස්වැසුම හොයාගන්නම්, බාප්පේ," මම එයාට කිවුවා. "මං ඒක ආපහු ගෙනත් දෙන්නම්. කෙරොන්ගේ පඩි වැඩි කරන්න අමතක කරන්න එපා."

"මාත් එක්ක සෙල්ලම් කරන්න ලැස්ති වෙන්න එපා -"

"ඒ වගේම, ඉඳලා හිටලාවත් සර්බෙරස් එක්ක සෙල්ලම් කළාට වැරැද්දක් වෙන්නේ නෑ. එයා රතු පාට රබර් බෝලවලට ආසයි."

"පර්සි ජැක්සන්, තුඹ -"

"දැන්" මම කෑගැහුවා.

අපි, අපේ පාමුල මුතු ඇට කුඩු කළා. එක බිහිසුණු මොහොතකට කිසිවක් සිද්ධ වුණේ නැහැ.

"මුන්ව විනාශ කරපල්ලා!" හේඩීස් මොර දුන්නා.

කඩු, තුවක්කු, රයිෆල් මානාගත් ඇටසැකිලි හමුදාව ඉදිරියට දුවගෙන ආවා. ගිනි දල් නැගෙන කස වනමින් පියුරීලා ඉදිරියට පැන්නා.

ඇටසැකිලිවෝ වෙඩි තියන්න පටන් ගනිද්දිම මගේ පාමුල තිබුණු මුතු ඇට කැලී කොළ පාට එළියක් හා නැවුම් මුහුදු සුළං පහරක් පිට කරමින් පුපුරා ගියා. මාව වට කරගත් කිරි සුදු පාට ගෝලයක් මාවත් අරගෙනම ටිකෙන් ටික පොළොවෙන් උඩට එසවෙන්න ගත්තා.

ඇනබෙත් සහ ග්‍රෝවර්ත් මගේ පිටුපසින්ම ආවා. අපි උඩට පාවෙමින් යද්දී අපේ දෙසට ඇදී ආව හෙලි සහ උණ්ඩ මුතු බුබුලේ වැදී ආපසු විසිවුණා. හේඩීස් කොයි තරම් වියරුවෙන් කෑගැසුවාද කියනවා නම්, ඒ හඬට මුළු බලකොටුවම දෙදරන්න ගත්තා. ඒ රය ලොස් ඇන්ජලීස්වලට නම් සාමකාමී රැයක් වෙන්නේ නැති බව මට හොඳින්ම තේරුම් ගියා.

"උඩ බලන්න." ග්‍රෝවර් බෙරිහන් දුන්නා. "අපිව හැප්පෙන්නයි යන්නේ!"

කිවුවා වගේම, අපි වේගයෙන් හිරිලඹ දෙසට ඇදෙමින් සිටියා. ඒවා අපේ බුබුළ කඩාගෙන, අපිවත් හිල් කරාවි කියලා මම හිතුවා.

"මේ බුබුළ හසුරුවන්නේ කොහොමද?" ඇනබෙත් කෑගසා ඇසුවා.

"අපිට එහෙම කරන්න බැහැ!" මම ආපසු කෑගැසුවා.

බුබුළ වියස්සේ වදිද්දී අපි යටිගිරියෙන් බෙරිහන් දුන්නා. ඊට පස්සේ හැමදේම... කළුවර වුණා.

අපි මැරිලාද?

නෑ, එහෙම වෙන්න බැහැ. අපිව ඉහළට නැගෙන හැඟීම මට තවමත් දැනෙමින් තිබුණා. වායු බුබුළක් වතුර හරහා උඩට යන තරම් පහසුවෙන් අපි ගන පාෂාණ තට්ටු හරහා උඩට ඇදුනා. මුතු ඇටවල බලය එයයි. සාගරයට අයිති දේ සෑම විටම ආපසු සාගරයට යන්නේ කොහොමද කියලා මම තේරුම් ගත්තා.

ටික වේලාවක් ගතවෙන තුරු මගේ ගෝලයේ සුමට බිත්තිවලට පිටින් කිසිවක් දකගන්න මට බැරි වුණා. ඊට පස්සේ, මගේ මුතු බුබුළ මුහුදු පතුලෙන් උඩට මතු වුණා. ග්‍රෝවර් සහ ඇනබෙත් සිටි අනෙක් කිරි සුදු බුබුළු දෙක සමග මම වතුරෙන් ඉහළට නැගුණා. ඊට පස්සේ - "පොප්!"

සැන්ටා මොනිකා බොක්ක මැද රළ පදින්නෙක්වත් පෙරළාගෙන අපි වතුරෙන් උඩට මතුවුණා. රළ පදින්නා කේන්තියෙන් කෑගැසුවා, "ඒයි!"

ග්‍රෝවර්ව අල්ලාගත්ත මම එයාව ජීවිතාරක්ෂක බෝයාවක් මතට ඇද දැමුවා. ඊට පස්සේ මම ඇනබෙත්වත් අල්ලාගෙන එතැනට ඇදගෙන ගියා. අඩි එකොළහක් විතර දිග යෝධ සුදු මෝරෙක් කුතුහලෙන් අපේ වටේ කැරකෙන්න ගත්තා.

"යනවා යන්ඩ." මම කිවුවා.

අනෙක් පැත්තට හැරුණු මෝරා වේගයෙන් පිහිනා ගියා.

බිම්මල් විෂවීමක් ගැන මොනවදෝ දොඩවපු රළ පදින්නා, එයාට හැකි තරම් වේගයෙන් අපෙන් ඈතට හබල් ගෑවා.

දන් වෙලාව මොකක්ද කියලා මම කොහොමදෝ දැනගෙන සිටියා: ඒ ජූනි විසි එක් වෙනිදා පාන්දර, උත්තරායනය සිදුවෙන දවස.

ඈතින් ලොස් ඇන්ජලීස් නගරය ගිනි ගනිමින් තිබුණා, නගරය වටේන්ම දුම්රොටු අහසට නැගුණා. එහෙ භූමිකම්පාවක් සිද්ධ වෙලා. හේඩීස් තමයි ඒකට වග කියන්න ඕනෑ. සමහරවිට, එයා දැනටමත් මළවුන් හමුදාවක් මගේ පිටුපසින් එවලා ඇති.

ඒත් ඒ මොහොතේදී, මගේ ලොකුම ප්‍රශ්නය වුණේ පාතාල ලෝකය නෙවෙයි.

මම වෙරළට යන්න ඕනෑ. මම සියුස්ගේ ප්‍රධාන අකුණ ආපහු ඔලිම්පස්වලට ගෙනියන්න ඕනෑ. ඒ හැමදේටම වඩා, මාව රවට්ටපු දෙවියා එක්ක මට බරපතළ කතාබහක් කරන්න තිබුණා.

20

මම, මගේ නරුම නෑයා සමග සටන් කළා

වෙරළාරක්ෂක බෝට්ටුවක් අපිව වතුරෙන් ගොඩට ගත්තා. ඒත් වැඩි වෙලාවක් අපිව තියාගන්නවත්, සාමාන්‍ය ගමනට අඳින ඇඳුම් පිටින්ම ළමයි තුන්දෙනෙක් මුහුදු බොක්ක මැදට වැටුණේ කොහොමද කියලා පුදුම වෙන්නවත් බැරි තරමට එයාලා කාර්යබහුල වෙලායි හිටියේ. එයාලට ආපදාවක් ගැන බලාගන්න වෙලා තිබුණා. එයාලගේ රේඩියෝවලට පීඩාවට පත් වෙච්ච අයගේ ඇමතුම් අතුරු-සිදුරු නැතිව ගලා ආවා.

අපේ උරහිස් වටා තුවා පොරවලා, වතුර බෝතලය බැගින් අපේ අතට දීලා, අපිව සැන්ටා මොනිකා ජැටියෙන් බැස්සවූ එයාලා තවත් මිනිස්සු බේරාගන්න ඉගිලී ගියා.

අපේ ඇඳුම්වලින් වතුර වැස්සුණා. මගේ ඇඳුම් පවා තෙමිලා තිබුණේ. වෙරළාරක්ෂක බෝට්ටුව පේන මානයට එද්දී මම හිතෙන් යාඥා කළේ එයාලා මාව ගොඩට ගනිද්දී මම සම්පූර්ණයෙන්ම නොතෙමී ඉන්නවා එයාලාට දකින්න ලැබෙන්න එපා කියලයි. ඉතින්, මාව තෙමෙන්න කියලා මම ප්‍රාර්ථනා කළා. හිතූ විදිහටම, මගේ වතුරට නොතෙමෙන බලය මාව අත හැරලා තිබුණා. මගේ සපත්තු දෙක මම ග්‍රෝවර්ට දුන් නිසා මම සිටියේ සපත්තු නැතිවයි. අපෙන් කෙනෙක්ට කුර තියෙන්නේ ඇයි කියලා වෙරළාරක්ෂකයෝ පුදුම

වෙනවට වඩා, කෙනෙක්ට සපත්තු නැත්තේ ඇයි කියලා පුදුම වෙන එක හොඳයි නේ.

වියළි පොළොවට ළඟා වුණාට පස්සේ, පායා එන ලස්සන ඉරට මෙපිටින් නගරය ගිනි ගන්නා දෙස බලාගෙන අපි වෙරළ දිගේ ඇවිද ගියා. මම එලොව ගිහින් මෙලොව ආවා වගෙයි මට දැනුණේ - කොහොමත් ඉතින් එහෙමනේ. සියුස්ගේ ප්‍රධාන අකුණ නිසා මගේ ගමන් මල්ල ගොඩාක් බර වුණා. අම්මාව දැක්කාට පස්සේ මගේ හිත ඊටත් වඩා බර වෙලා.

"මට නම් ඒක විශ්වාස කරන්නත් බැහැ," ඇනබෙත් කිවුවා. "අපි එච්චර දුරක් ගියේ -"

"ඒක උගුලක්," මම කිවුවා. "ඇතීනාගේ වගේ මොළයකින් හැදුව දක්ෂ යුද උපායක්."

"ඒයි," එයා සැර කළා.

"ඔයාටත් ඒක තේරුණා, එහෙම නේද?"

එයාගේ තරහව මැකී යද්දී, එයා බිම බලාගත්තා. "ඔව්, මටත් තේරුණා."

"ඒත්, මට තේරුණේ නැහැ!" ග්‍රෝවර් අවලාද නැගුවා. "කවුරුහරි මට -"

"පර්සි..." ඇනබෙත් කතා කළා. "මට ඔයාගේ අම්මා ගැන දුකයි. මට හරිම කණගාටුයි..."

මම එයාව ඇහුණේ නැති ගාණට හිටියා. මගේ අම්මා ගැන කතා කරන්න පටන් ගත්තොත් මම පොඩි එකෙක් වගේ අඬන්න පටන් ගනීවි.

"අනාවැකිය හරි ගියා," මම කිවුවා. " 'බටහිර දෙසට ගොස්, වෙනතක හැරුණු දෙවියන්ට මුහුණ දීමට නුඹට සිදුවේවි' කිව්වට, ඒ කියලා තියෙන්නේ හේඩීස් ගැන නෙවෙයි. හේඩීස්ට ලොකු තුන්කට්ටුව අතරේ යුද්ධයක් ඕනෑ කළේ නැහැ. මේ හොරකම කෙරෙව්වේ වෙන කවුරුහරි කෙනෙක්. එයා සියුස්ගේ ප්‍රධාන අකුණයි, හේඩීස්ගේ හිස්වැසුමයි හොරකම් කරවලා, මම පොසෙයිඩන්ගේ දරුවෙක් නිසා මාව ඒකට අහු කෙරෙව්වා. එතකොට පොසෙයිඩන්ට දෙපැත්තෙන්ම දොස් අහන්න වෙනවානේ. අද ඉර බහින වෙලාව වෙනකොට එහෙ

තුන් පැත්තක යුද්ධයක් පටන් ගනීවි. මට තමයි ඒකට වග කියන්න වෙන්නේ."

ග්‍රෝවර් ඔළුව හෙල්ලුවේ අන්ද මන්ද වෙලායි. "ඒත්, ඒ තරම් නීච වැඩක් කරන්නේ කවුද? ඔය තරමටම යුද්ධයක් උවමනා වෙලා තියෙන්නේ කාටද?"

හිටි තැනම නතර වුණ මම වෙරළ දිහා බැලුවා. "වෙන කාටද..."

එතැන, කළු ලෙදර් කබායක් සහ අව් කණ්ණාඩි පැළඳගෙන, ඇලුමිනියම් බේස්බෝල් පිත්තක් උරහිසේ රඳවාගෙන එයා අපි එනකල් බලාගෙන සිටියා. එයාගේ මොටර් සයිකලය පසෙක ගොරවමින් තිබුණා.

"හේයි, ළමයා," ඒරීස් කිවුවේ මාව දකලා ඇත්තටම සතුටු වුණා වගෙයි. "ඔහේ මැරෙන්න තේද හිටියේ?"

"ඔහේ මාව රැවැට්ටුවා," මම කිවුවා. "ඔහේ තමයි හිස්වැසුමයි, ප්‍රධාන අකුණයි හොරකම් කළේ."

ඒරීස් චිරිත්තුවා. "මෙහෙමයි, මම ම ගිහින් ඒවා හොරකම් කළේ නම් නෑ. දෙවිවරුන්ට අනිත් අයගේ බලයේ සංකේතවලට අත තියන්නවත් බැහැ නේ. ඒත්, මේ ලෝකේ වැඩක් කරන්න පුළුවන් වීරයෙක්ට ඉන්නේ ඔහේ විතරක් නෙවෙයි නේ."

"ඔහේ කාවද පාවිච්චි කළේ? ක්ලැරිස්වද? දක්ෂිණායනයේදී එයත් එතැන හිටියනේ."

ඒ අදහසෙන් එයා විනෝද වුණා වගෙයි පෙනුණේ. "ඒකෙන් වැඩක් නෑ. ඔහේ මේ යුද්දෙ පටන් ගන්න බාධා කරනවානේ, ළමයෝ. පේනවනේ, ඔහේට තිබ්බේ පාතාල ලෝකෙදිම මැරෙන්න. එතකොට, ඔහේව මැරුවා කියලා නාකි කාවාටි රැවුලා හේඩීස් එක්ක වෛර බැඳගනියි. මිනී කාක්කාට සියුස්ගේ ප්‍රධාන අකුණ ලැබුණාම, සියුස් එයා ගැන ක්කේන්තියෙන් පිස්සු වැටෙයි. ඒ වගේම, හේඩීස් තවමත් මේක හොයනවා..."

බැංකු මංකොල්ලකරුවෝ පළඳින ජාතියේ තොප්පියක් සාක්කුවෙන් එළියට ගත් එයා ඒක සයිකල් හැඬල් දෙක අතරින් තැබුවා. ඉක්මනින්ම, ඒ තොප්පිය විසිතුරු ලෝකඩ යුද හිස්වැසුමකට හැරුණා.

ග්‍රෝවර් තදින් හුස්මක් ගත්තා. "අඳුරේ හිස්වැසුම."

"හරියට හරි," ඒරීස් කිවුවා. "දැන්, මම කොතැනද හිටියේ? ඔව්, හරි. හේඩීස් පොසෙයිඩන්, සියුස් දෙන්නා එක්කම වෛර බැඳ ගනියි. මොකද, මේක ගත්තේ කවුද කියලා එයා දන්නේ නැනේ. ඊට පස්සේ, ඉක්මනටම අපිට ඒ තුන්දෙනාගේ පොඩි වලියක් බලාගන්න ලැබෙයි."

"ඒත් එයාලා ඔයාගේ පවුලේ අය නේ!" ඇනබෙත් අමනාපය පෑවා.

ඒරිස් උරහිස් හැකුළුවා. "ඒවා තමයි හොඳම ජාතියේ යුද්ධ. මම නිතරම කියන දෙයක් තමයි 'ඔයාගේ නෑයෝ යුද්ධ කරනවා බලන් ඉන්නවා තරම් තවත් දෙයක් නෑ' කියන එක."

"ඔහේ ඩෙන්වර්වලදී මට ගමන් මල්ල දුන්නා," මම කිවුවා. "එතකොට, ප්‍රධාන අකුණ දිගටම තිබුනේ ඒක ඇතුළේ."

"ඔව් සහ නෑ," ඒරීස් කිවුවා. "බාගදා ඒක ඔහේලාගේ පුංචි මිනිස් මොළවලට තේරුම් ගන්න සංකීර්ණ වැඩි වෙයි. ඒත්, ඔය මල්ල තමයි ප්‍රධාන අකුණේ කොපුව. ඒකේ පිට පෙනුම ටිකක් වෙනස් කරලා විතරයි. අකුණ ඒකට සම්බන්ධ වෙලා තියෙන්නේ, හරියට ඔහේගේ කඩුව හැම වෙලාවෙම ආපහු ඔහේගේ සාක්කුවට එනවා වගේ, තේරුණාද?"

මට තේරුණේ නැත්තේ ඒරීස් ඒ ගැන දන්නේ කොහොමද කියලයි, ඒත් යුද්ධයට අධිපති දෙවියෝ හැම ආයුධයක් ගැනම දන්නවා ඇති හිතලා මම හිත හදාගත්තා.

"කොහොම හරි," ඒරීස් කියාගෙන ගියා, "මම මේකේ මායාව ටිකක් අලුත්වැඩියා කළා. ඒ නිසා, අකුණ කොපුව ඇතුළට යන්නේ ඔහේ පාතාල ලෝකෙට ගියාම විතරයි. ඔහේ හේඩීස්ට කිට්ටු වෙද්දී... ටොයිං! ඒක ඔහේ ළඟට යනවා. බැරි වෙලාවත් ඔහේ මගදී මැරුණොත් - ආයුදේ තවමත් මගේ ළඟ නිසා මට කිසිම පාඩුවක් වෙන්නේ නෑ."

"ඉතින් ප්‍රධාන අකුණ ඔයා ළඟම තියාගන්න ඔයාට තිබුණා නේ?" මම ඇසුවා. "ඒක හේඩීස්ට යවන්නේ මොකටද?"

ඒරීස්ගේ හනුවක් ගැහෙන්න ගත්තා. එක මොහොතකට, එයාගේ ඔළුව ඇතුළෙන් ඇහෙන වෙනත් හඬකට එයා කන් දෙනවා වගෙයි පෙනුණේ. "ඇයි මම තියාගත්තේ නැත්තේ... ඔව්... ඒ වගේ බලගතු ආයුධයක්..."

එයා දෑස් ගෙවෙලා තත්පරයක් ගියා... තත්පර දෙකක් ගියා...

මම ඇතමෙක් එක්ක සැක සහිත බැල්මක් හුවමාරු කරගත්තා.

ඒරීස්ගේ මුහුණ ආයෙමත් පැහැදිලි වුණා. "මට කරදරේක පැටලෙන්න ඕනෑ වුණේ නැහැ. මේක ඔහේ අතේ තියෙද්දී, බඩුත් එක්කම හොරු අල්ලගන්න එක ඊට වඩා හොඳයි නේ."

"ඔහේ කියන්නේ බොරු," මම කිවුවා. "පාතාල ලෝකෙට අකුණ යවන එක ඔහේගේ අදහසක් නෙවෙයි, එහෙම නේද?"

"අනිවාර්යයෙන්ම, ඒක මගේ අදහසක් තමයි!" එයාගේ අව් කණ්ණාඩිවලින් දුම් දමන්න ගත්තේ හරියට ඒක ගිනිගන්න යනවා වගෙයි.

"මේ හොරකම සැලසුම් කළේ ඔයා නෙවෙයි," මම අනුමාන කළා. "වෙන කවුරුහරි කෙනෙක් මේ බඩු දෙක හොරකම් කරන්න අර්ධ-ලෝහිතයෙක්ව යැවුවා. ඊට පස්සේ, එයාව හොයන්න සියුස් ඔයාව පිටත් කළාම, ඔයා හොරාව අල්ලගත්තා. ඒ වුණාට, ඔයා ඒ හොරාව සියුස් ළඟට අරන් ගියේ නැහැ. එයාට යන්න දෙන්න කියලා කවුරු හරි ඔයාට ඒත්තු ගැන්නුවා. තව අර්ධ-ලෝහිතයෙක් ඇවිල්ලා වැඩේ සම්පූර්ණ කරනකල් ඔයා බඩු දෙක තියාගෙන හිටියා. අර, ආගාධයේ ඉන්න එකා තමයි මේ ඔක්කොටම ඔයාට නියෝග දෙන්නේ."

"යුද්ධයට අධිපති දෙවියා මමයි! මම කාගෙන්වත් නියෝග ගන්නේ නෑ! මට එහෙම හීන පේන්නේ නෑ!"

මම ටිකක් පැකිළුණා. "කවුද හීන ගැන ඇහුවේ?"

එයින් ඒරීස් කැළඹුණු බවක් පෙනුණා, ඒත් ඒක බොරු හිනාවක් ඇතුළේ හංගා ගන්න එයා උත්සාහ කළා.

"අපි ආයෙමත් මේ ප්‍රශ්නේ දිහාවට හැරෙමු, ළමයෝ. ඔහේ තාම පණපිටින්. ඔය අකුණ අරගෙන ඔහේට ඔලිම්පස්වලට යන්න ඉඩ දෙන්න මට බැහැ. මොකද, අර ඔළු ඉදිමිච්ච මෝඩයෝ ටික ඔහේ කියන දේට ඇහුම්කන් දෙන්න ඉඩ තියෙනවා. ඉතින් ඒ නිසා, මට ඔහේව මරන්න සිද්ධ වෙනවා. මේක මගේ පෞද්ගලික තරහක් එහෙම නෙවෙයි, හරිද."

එයා අසුරක් ගැහුවා. එයාගේ පාමුල වැල්ල දෙබෑ කරගෙන එතැනින් එළියට ආවේ කඳවුරේ කැබින් අංක පහේ දොරට උඩින්

එල්ලා තිබුණු වල් ඌරු ඔළුවටත් වඩා ලොකු, ඊටත් වඩා කැත වල් ඌරෙක්. ඌගේ පබළු ඇස් දෙකෙන් මගේ දිහාව රවා බැලූ ඒ සතා දලිපිහි වගේ තියුණු දළ දෙක පහත් කරගෙන, වැල්ල පහුරු ගෑවේ මරන්න අණ ලැබෙන තුරුයි.

මම රැල්ලට අඩිය තැබුවා. "ඔහේම මාත් එක්ක සටනට එනවා, ඒරීස්."

එයා මහ හඬින් හිනාවුණා, ඒත් ඒ හිනාව ඇතුළේ නොසන්සුන්කමකුත් මට ඇහුණා. "ඔහේට තියෙන්නේ එක දක්ෂකමක් විතරයි, කොල්ලෝ. ඔහේ දන්නේ පැනලා දුවන්න විතරයි. ඔහේ විමෙරාගෙනුත් පැනලා දිව්වා. ඔහේ පාතාල ලෝකෙනුත් පැනලා දිව්වා. ඔහේ වෙන දෙයක් දන්නේ නෑ."

"ඇයි, බයයිද?"

"හීනෙන් තමයි." දත් එයාගේ අව් කණ්ණාඩිවල මැද උණු වෙන්න පටන්ගෙන තිබුණා. "අපිට කෙලින්ම මැදිහත් වෙන්න තහනම්. කණගාටුයි, ළමයා. ඔහේ මගේ මට්ටමේ නෑ."

"පර්සි, දුවන්න!" ඇනබෙත් කෑගැසුවා.

යෝධ වල් ඌරා පහර දෙන්න දුවගෙන ආවා.

ඒත් රාක්ෂයන්ගෙන්, හේඩීස්ගෙන්, ඒරීස්ගෙන් තියා කාගෙන්වත් බේරෙන්න පැනලා දුවලා මට ඇතිවෙලා තිබුණේ.

ඌරා මගේ දිහාවට දුවගෙන එද්දී, මගේ පෑනේ කොපුව ගැලවූ මම පැත්තකට අඩියක් තැබුවා. මගේ අතේ මතු වූ රිප්ටයිඩ්ගෙන් මම උඩු අතට පහරක් කැපුවා.

කැපී වෙන්වුණු ඌරාගේ දකුණු දළය මගේ කකුල් දෙක ළඟ වැටෙද්දී අන්දමන්ද වුණ සතා මුහුද දෙසට දිව ගියා.

"රැල්ල!" මම කෑගැසුවා.

එතකොටම, කොහෙදෝ ඉඳන් ආව රැල්ලක් ඌරා වටේ එතිලා, ඌව ගිලගත්තා. එක්වරක් මර බයෙන් කෑගැසූ සතා මුහුදේ නොපෙනී ගියා.

මම ආපසු ඒරීස් දෙසට හැරුණා. "ඔහේ දැන්වත් මාත් එක්ක සටනට එනවද?" මම ඇසුවා. "නැත්නම්, ඔහේ තවත් සතෙක්ගේ පිටිපස්සේ හැංගෙනවද?"

ඒරිස්ගේ මුහුණ ක්‍රෝධයෙන් දම් පාටට හැරුණා. "බලාගෙන, ළමයෝ. මට පුළුවන් ඔහේව -"

"කැරපොත්තෙක්ට හරවන්න," මම කිවුවා. "නැත්නම් පඩි පණුවෙක්ට. ඔව්, මට විශ්වාසයි, ඊකෙන් ඔහේගේ දේව පස්සට කස පාර වදින එක නවත්තගන්න පුළුවන්, නේද?"

එයාගේ අව් කණ්ණාඩිය මුදුනේ ගිනිදලු නැටුවා. "ඔව්, මට පේන්නේ ඔහේට ඇත්තටම වජ්ජ වෙන්න ආසා හිතිලා වගේ."

"මම පැරදුණොත්, ඔහේ කැමති සතෙක්ට මාව හරවන්න. අකුණත් ගන්න. හැබැයි, මම දිනුවොත් හිස්වැසුමයි, අකුණයි මට දීලා ඔහේ යන්න ඕනෑ."

ඒරිස් විරිත්තුවා.

එයා කරේ තිබුණු බේස්බෝල් පිත්ත අතට ගත්තා. "ඔහේ වජ්ජ වෙන්න ආසා කොහොමද: පරණ විදිහටද; අලුත් විදිහටද?"

මම එයාට මගේ කඩුව පෙන්නුවා.

"ඒක මරු, මැරිච්ච එකෝ," එයා කිවුවා. "පරණ ක්‍රමේට එහෙනම්." බේස්බෝල් පිත්ත යෝධ කඩුවකට හැරුණා. රතු කැටයක් කරේ රඳවාගත් විදි හිස්කබලක් ලෙසට එහි මිට සැකසී තිබුණා.

"පර්සි," ඇනබෙත් කතා කළා. "ඕක කරන්න එපා. එයා දෙවි කෙනෙක්."

"එයා බයගුල්ලෙක්." මම එයාට කිවුවා.

එයා තදින් කෙළ ගිල්ලා. "එහෙනම්, අඩු තරමේ වාසනාව ලැබෙන්න මේකවත් දාගන්න."

අවුරුදු පහක කදවුරු පබළු සහ එයාගේ තාත්තාගේ මුදුව ඇමුණු මාලය කරෙන් ගැලවූ එයා ඒක මගේ බෙල්ලේ ගැට ගැසුවා.

"සාමාදානයක්," එයා කිවුවා. "ඇතීනායි පොසෙයිඩනුයි එකට."

මගේ මූණ ටිකක් රත් වුණත් හිනාවක් මතු කරගන්න මට පුළුවන් වුණා. "ස්තූතියි,"

"මේකත් ගන්න," ග්‍රෝවර් කිවුවා. එයා මගේ අතට තැළුණු ටින් කෑන් එකක් දුන්නා. සමහරවිට, ඒක එයා සැතපුම් දහස් ගාණම

යනතුරු සාක්කුවේ පරිස්සම් කරගෙන හිටපු එකක් වෙන්න ඇති. "ඔයාගේ පිටිපස්සෙන් සැටර්ලා ඉන්නවා."

"ග්‍රෝවර්... මං දන්නෑ මොනවා කියන්නද කියලා."

එයා මගේ උරහිසට තට්ටුවක් දැමුවා. මම ටින් කෑන් එක පිටුපස සාක්කුවට ඔබාගත්තා.

"ඔහේලා සමුගැනීම් ටික කරලා ඉවරද?" ඒරිස් මගේ ඉදිරියට එද්දී, එයාගේ දිගු ලෙදර් කබාය පිටුපසින් ඇදී ආවා. පායා ආ ඉර එළියෙන් එයාගේ කඩුව ගින්දර වගේ දිලිසුනා. "මම සදාකාලයටම සටන් කරපු කෙනෙක්, කොල්ලෝ. මගේ ශක්තිය අසීමිතයි. ඒ වගේම මම මැරෙන්නෙත් නැහැ. ඔහේට මොනවද තියෙන්නේ?"

පොඩි අහංකාරකමක්. එහෙම හිතුවත් මම මුකුත් කිවුවේ නැහැ. වතුර මගේ වළලුකර ළඟට එනතුරු පිටුපසට ගිය මම, මගේ කකුල් රැල්ල තුළම තියාගත්තා. ගොඩාක් කාලයකට කලින් ඩෙන්වර් හෝටලයේදී ඇනබෙත් කියූ කතාව මම මතක් කළා: ඒරිස්ට ශක්තිය තියෙනවා. එයාට තියෙන්නේ එච්චරයි. නුවණ ඉදිරියේදී ශක්තියට පවා නැමෙන්න සිද්ධ වෙනවා.

එයා මගේ ඔළුව මැදට පහරක් එල්ල කළා. ඒත් ඒ පහර වදින්න මම එතැන හිටියේ නැහැ.

මගේ ඇඟ මම වෙනුවෙන් කල්පනා කළා. වතුරෙන් මාව ඉහළට තල්ලු කරනවා වගේ දැනෙද්දී, එයාට උඩින් විසි වී ගිය මම පහළට එන අතරේ එයාට කඩු පහරක් එල්ල කළා. ඒත් ඒරිස් ඊට වඩා ඉක්මන් වුණා. එයා පැත්තකට ඇඹරෙද්දී, එයාගේ පිට කොන්දේ වදින්නට තිබුණු කඩුව එයාගේ කඩු මිට කෙළවරේ වැදී පැත්තකට හැරුණා. එයා දත් නියෙව්වා. "නරක නෑ, නරක නෑ."

එයා ආපසු කඩු පහරක් එල්ල කරද්දී මට වියළි පොළොවට පනින්න සිද්ධ වුණා. පැත්තකට පැනලා, ආපහු වතුරට අඩිය තියන්න මම උත්සාහ කළත් මට උවමනා දේ ඒරිස් තේරුම් ගත්තා වගෙයි. මාව අභිභවා ගිය එයා කොයි තරම් තදින් මාව තල්ලු කළාද කියනවා නම්, කැලිවලට නොකැපී සිටීමට මගේ මුළු අවධානයම යොදවන්න මට සිදුවුණා. මම දිගින් දිගටම රැළලෙන් ඉවතට යමින් සිටියා. පහර දෙන්න මට කිසිම ඇරුණු තැනක් හොයාගන්න බැරි වුණා. එයාගේ කඩුව රිප්ටයිඩ්ට වඩා තවත් අඩි කීපයක් දිගයි.

Scanned with CamScanner

කිට්ටුවට යන්න, අපේ කඩු හරඹ පන්තියේදී දවසක් ලූක් මට කියලා දුන්නා. ඔයා ළඟ තියෙන්නේ තලය කොට කඩුවක් නම්, කිට්ටුවටම යන්න.

වැරෙන් ඇනීමක් එක්ක මම ඉදිරියට අඩිය තැබුවා. ඒත්, ඒරිස් බලාගෙන හිටියේ ඒ වෙනුවෙනුයි. කඩු තලය මගේ අතින් වැට්ටූ එයා, මගේ පපුවට පයින් ගැසුවා. මම අඩි විස්සක් - තිහක් විතර උඩින් විසිවෙලා ගියා. මම වැලි වැටියක් උඩට නොවැටුණා නම් මගේ කොන්ද කැඩෙන්න පවා ඉඩ තිබුණා.

"පර්සි!" ඇනබෙත් බෙරිහන් දුන්නා. "පොලීසියෙන්!"

මට හැමදේම පෙනුණේ දෙකක් වෙලායි. මගේ පපුවට කාලතුවක්කු උණ්ඩයක් වැදිලා වගේ දැනුණත්, මම කොහොම හරි ආපසු දෙපයින් හිටගත්තා.

ඒරිස් මාව දෙකට කපයි කියන බය නිසා එයාගෙන් ඇස් ඉවතට මට පුළුවන්කමක් තිබුණේ නැතත්, වෙරළබඩ පාර දිගේ රතු එළි දැල්වෙනවා ඇස් කොණකින් මට පෙනුණා. කාරයක දොරවල් මහ හඬින් වැසුණා.

"අතන, සර්!" කවුදෝ මොර දුන්නා. "පේනවද?"

රළු පොලිස් නිලධාරියෙකුගේ හඬක්: "ඒ නම් ටී.වී. එකේ හිටිය ළමයා වගේ... මොන මඟුලක්ද..."

"ඒ මිනිහා අතේ ආයුධ තියෙනවා," තවත් නිලධාරියෙක් කිවුවා. "කෝල් කරලා උදවු ඉල්ලන්න."

මම පැත්තකට පෙරළී යද්දී ඒරිස්ගේ කඩුව වැල්ල කපාගෙන ගියා.

මගේ කඩුව ළඟට දුවලා ගිය මම, අහුලගෙන ඒරිස්ගේ මූහුණට වේගවත් පහරක් දුන්නා, ඒත් මගේ කඩුව ආයෙමත් පැත්තකට හැරුණා විතරයි.

මම කරන්න යන්නේ මොකක්ද කියලා ඒක කරන්න මොහොතකට කලින් ඒරිස් හරියටම දැනගන්නවා වගෙයි පෙනුණේ.

මම ආයෙමත් රැල්ලට අඩිය තැබුවේ එයාට මාව ලුහුබඳින්න බල කරමින්.

"යටත් වෙනවා, ළමයෝ," ඒරිස් කිවුවා. "ඔහේට කිසිම බලාපොරොත්තුවක් නෑ. මම ඔහේ එක්ක සෙල්ලම් කරනවා විතරයි."

මගේ ඉන්ද්‍රියන් උපරිම වේගයෙන් වැඩ කරනවා වගෙයි දැනුණේ. ඇත්තම සටනකදී ඒ.ඩී.එච්.ඩී. නිසා අපේ ජීවිතය බේරෙනවා කියලා ඇනබෙත් කියූ කතාවේ තේරුම දැන් මට තේරුණා. හැම පුංචි තොරතුරක්ම සැලකිල්ලට ගනිමින් මම සම්පූර්ණ අවදියෙන් සිටියා.

ඒරිස්ගේ දරදඬු වූ තැන් දැකගන්න මට පුළුවන් වුණා. එයා පහර දෙන්න යන්නේ කොයි පැත්තටද කියලා මට කියන්න පුළුවන් වුණා. ඒ වෙලාවේදීම, මට අඩි තිහක් වම් පැත්තෙන් සිටි ඇනබෙත් සහ ග්‍රෝවර් ගැනත් මම අවධානයෙන් සිටියා. මහ හඬින් සයිරන් නළා හඬවාගෙන දෙවැනි පොලිස් කාරයත් එතැනට එනවා මම දක්කා. භූමිකම්පාවෙන් පසු පාරවල්වල අයාලේ ඇවිදිමින් සිටි අය අපේ වටේ රොක් වෙන්න ගත්තා. මම හිතන්නේ, ඒ සෙනඟ අතරේ වෙස් වළාගෙන, නුහුරු විදිහට ඇවිදින සැටර්ලා කීප දෙනෙකුත් මට දකින්න ලැබුණා. එතැන, සැලෙන රූප ඇති මළවුන් කීප දෙනෙකුත් හිටියේ හරියට සටන නරඹන්න පාතාල ලෝකයේ කට්ටියත් ඇවිල්ලා වගෙයි. ඒ අතරේම, ඉහළ කොතැනකින් හෝ වවුල් තටු වදින හඬකුත් මට ඇහුණා.

තවත් සයිරන් හඬවල්.

මම වතුර තුළට තවත් අඩියක් තැබුවා, ඒත් ඒරිස් ඊට වඩා වේගවත් වුණා. මගේ කමිස අත ඉරාගෙන ගිය එයාගේ කඩු තලය මගේ යටි බාහුවේ ගෑවීගෙන ගියා.

ශබ්ද විකාශන යන්ත්‍රයකින් පොලිස් කටහඬක් ඇහුණා, "තුවක්කු පහළට දානවා. දැන්මම ඒවා බිමින් තියනවා!"

තුවක්කු?

මම ඒරිස්ගේ ආයුධය දිහා බැලුවා. ඒක සැලෙනවා වගෙයි පෙනුණේ: වෙලාවකට පතරොම් තුවක්කුවක් වගෙත්, තවත් වෙලාවකට ලොකු කඩුවක් වගෙත් ඒක පෙනුණා. මිනිස්සුන්ට මගේ අතේ තියෙනවා පෙනුණේ මොකක්ද කියලා මම දැනගෙන හිටියේ නැහැ. ඒ මොකක් වුණත් ඒකෙන් එයාලාට මං ගැන කැමැත්තක් නම් ඇති නොවෙන බව මට සැහෙන විශ්වාස වුණා.

Scanned with CamScanner

අපේ ප්‍රේක්ෂකයෝ දෙස රවා බලන්න ඒරීස් හැරුණු නිසා මට හුස්මක් ගන්න පොඩි ඉඩක් ලැබුණා.

දැන්, එතැනට පොලිස් කාර් පහක් ඇවිත් තිබුණා. ඒවාට පිටුපසින් ඇනතියාගත් පොලිස් නිලධාරියෝ පෙළක් අපේ දෙසට පිස්තෝල එල්ල කරගෙන හිටියා.

"මේක පෞද්ගලික ප්‍රශ්නයක්" ඒරීස් ගර්ජනා කළා. ''පැත්තකට යනවල්ලා"

එයා අතක් වැනුවා. ඒත් එක්කම, රතු පාට ගිනි දැල් ජාලාවක් පොලිස් කාර් හරහා පෙරළී ගියා. වාහන පුපුරා යාමට කලින් මුවා වෙන්නට පොලිස් නිලධාරීන්ට යන්තමින් ඉඩක් ලැබුණා. එයාලාට පිටුපසින් සිටි සෙනග බෙරිහන් දෙමින් සී සී කඩ දුවන්න වුණා.

ඒරීස් මහ හඬින් හිනාවුණා. "දැන්, පුංචි වීරයා, මේ බා'බකියු එකට ඔහේවත් එකතු කරමු."

එයා කඩුව වනද්දී මම එයාගේ තලය පසෙකට හැරෙව්වා. එයාට පහරක් එල්ල කරන්න තරම් මම කිට්ටුවෙන් සිටි නිසා, බොරු පහරකින් එයාව රවට්ටන්න මම හිතුවා, ඒත් මගේ ප්‍රහාරය පැත්තකට ගැස්සුණා. දැන්, මුහුදු රළ මගේ පිටුපස වදිමින් තිබුණා. මාව ලුහුබැඳ ආව ඒරීස් කලවා මට්ටම දක්වා වතුරට බැස සිටියා.

මුහුදේ රිද්මය මට දැනුණා. වඩදිය පෙරළී එද්දී රළ ලොකු වෙලා වැඩෙන ආකාරය එක්ක හදිසියේම මට අදහසක් පහළ වුණා. පුංචි රළ, මම හිතුවා. මට පිටුපසින් වතුර බැස යනවා වගේ පෙනෙද්දී මම, මගේ හිතේ බලයෙන් වඩදිය ආපසු රඳවා ගත්තා. ඒත්, ඊට පිටුපසින් මහා පීඩනයක් ගොඩනැගෙමින් තිබුණා.

ආත්ම විශ්වාසයෙන් සිනාසෙමින් ඒරීස් ඉදිරියට ආවා. මම, මගේ කඩුව පහළට දමුවේ තව දුරටත් සටන් කරගෙන යාමට බැරි තරම් හෙම්බත් වෙලා වගෙයි. පොඩ්ඩක් ඉන්න, මම මුහුදට කිවුවා. දැන් එහි ගොඩනැඟී තිබූ පීඩනයෙන් මාවත් උඩට එසවෙනවා වගෙයි. ඒරීස්, එයාගේ කඩුව එසෙව්වා. ඒත් එක්කම ජල කඳ මුදා හැරිය මම රැල්ලට මැදි වූ ඒරීස්ට උඩින් රොකට්ටුවක වේගයෙන් පැන්නා.

එයාගේ මුහුණේ වැදුණු අඩි හයක් උස වතුර කඳ ආපසු බැස යද්දී, මුහුදු පාසි කටේ පුරවාගත් ඒරීස් ශාප කරමින් බෙරිහන් දුන්නා. වතුර කලතමින් එයාගේ පිටුපසට ගොඩබෑව මම කලින් වතාවේ කළ

විදිහටම එයාගේ ඔළුවට බොරු පාරක් එල්ල කළා. එතකොටම, ආපසු හැරුණු ඒරීස් කඩුව ඉහළට එසෙව්වා, ඒත් මේ වතාවේ අන්දමන්ද වී හිටපු එයාට මගේ උපාය කලින් හඳුනාගන්න බැරි වුණා. දිශාව මාරු කළ මම පැත්තකට පනින අතරේ රිප්ටයිඩ්ගේ තුඩ දෙවියන්ගේ විලුඹ පසාරු කරගෙන යන ලෙසට කඩුව කෙලින්ම වතුර තුළට ඇන්නා.

ඒ එක්කම නැගුණු ගර්ජනාවත් එක්ක බලද්දී හේඩීස්ගේ භූමිකම්පාව පුළු එකක් වගෙයි පෙනුණේ. අඩි පනහක් විතර දුරට පැතිරුණ නෙත රවුමක් වැල්ලේ ඉතිරි කරමින් මුහුද ඒරීස්ගෙන් ඉවතට බැස ගියා.

දෙවියන්ගේ රන් පාට ලේ, අයිකෝර් යුද දෙවියන්ගේ බූට් සපත්තුවකින් එළියට ආවා. එයාගේ මුහුණෙන් පළවුණේ වෛරයටත් එහා ගිය හැඟීමක්. වේදනාව, කම්පනය වගේම එයාට තුවාල වීම ගැන පුදුමයකුත් එහි තිබුණා. එයා පෞරාණික ග්‍රීක ශාපයක් කොඳුරමින් මගේ දිහාවට තොණ්ඩි ගසමින් ආවා.

ඒත්, යම් දෙයක් එයාව නතර කළා.

වලාකුළකින් ඉර මුවා වුණා වගේ, හැබැයි ඊටත් වඩා නරක ලෙස ආලෝකය මැකී ගියා. ශබ්ද සහ පාට වියැකී ගියා. කාලය මන්දගාමී කරමින් සීතල, බැරෑරුම් රූපකායක් වෙරළ පසුකරගෙන ගියා. ඒත් එක්කම උෂ්ණත්වය හිම මිදෙන මට්ටමට පහත වැටුණා. ජීවිතය බලාපොරොත්තු රහිත දෙයක් ලෙසත්, සටන් කිරීම ඵලක් නැති දෙයක් ලෙසත් මට දැනෙන්න ගත්තා.

කළුවර නැති වී ගියා.

ඒරීස් තෝන්තු වෙලා වගෙයි පෙනුණේ.

අපිට පිටුපසින් පොලිස් කාර් ගිනි ගනිමින් තිබුණා. ප්‍රේක්ෂක ජනකාය එතැනින් පලා ගිහිල්ලා. කම්පනයට පත් වූ ඇනබෙත් සහ ග්‍රෝවර් දිලිසෙන රන් පාට අයිකෝර් සෝදා හරිමින් ඒරීස්ගේ දෙපතුල් වලෙන් බැසයන වතුර දෙස බලා සිටියා.

ඒරීස් කඩුව පහතට හෙළුවා.

"ඔහේ හතුරෙක් හදාගත්තා, දේව පැටියෝ," එයා මට කිවුවා. "ඔහේ, ඔහේගේ ඉරණම තහවුරු කරගත්තා. සටනකදී ඔහේ කඩුව උස්සන හැම වතාවකදීම, ඔහේ දිනන්න බලාපොරොත්තු වෙන හැම

Scanned with CamScanner

වතාවකදීම ඔහේට මගේ ශාපය දුනෙව්. පරිස්සම් වෙනවා, පර්සි ජැක්සන්, ගොඩාක් පරිස්සම් වෙනවා."

එයාගේ ඇඟ දිලිසෙන්න පටන් ගත්තා.

"පර්සි!" ඇනබෙත් කෑගැහුවා. "ඒ දිහා බලන්න එපා!"

ඒරිස් දෙවියන්, එයාගේ සැබෑ අමරණීය ස්වරූපයට පත් වෙද්දී මම අනෙක් පැත්තට හැරුණා. ඒ දෙස බැලුවොත් මාව අළුවෙලා යන බව මම කොහොමදෝ දන සිටියා.

ආලෝකය නැති වී ගියා.

මම ආපසු හැරී බලද්දී ඒරිස් අතුරුදහන් වෙලා. හේඩිස්ගේ අඳුරේ හිස්වැසුම නිරාවරණය කරමින් රැල්ලක් මුහුදට ඇදුණා. මම ඒක අහුලගෙන මගේ යාළුවෝ දිහාවට ගියා.

ඒත් මම එතැනට ළඟා වෙන්න කලින් වවුල් තටු ගැහෙන හඬක් මට ඇහුණා. ලේස් තොප්පි දමා ගත්, යක්ෂ පෙනුම ඇති ආච්චිලා තුන් දෙනෙක් කස වනමින් මගේ ඉදිරියට ගොඩ බෑවා.

මැද සිටි ෆියුරි - මිසිස් ඩොඩ්ස් වෙලා හිටපු කෙනා - අඩියක් ඉදිරියට තැබුවා. එයාගේ දළ එළියට පැනලා තිබුණත් මේ වතාවේ නම් එයාට භය උපදවන පෙනුමක් තිබුණේ නැහැ. ඊටත් වඩා එයාට බලාපොරොත්තු කඩ වූ පෙනුමක් තිබුණේ හරියට මාව රෑ කෑමට ගන්න එයා සැලසුම් කරමින් හිටියත්, මාව කෑවොත් අජීර්ණයක් හැදෙයි කියලා එයාට හිතිලා වගෙයි.

"අපි හැමදේම දැක්කා," එයා පිම්බා. "එතකොට... ඇත්තටම ඒ තුඹ නෙවෙයි?"

මම එයා දිහාවට හිස්වැසුම විසි කළා. එයා ඒක පුදුමයෙන් අල්ලා ගත්තා.

"ඕක හේඩිස් උතුමාණන්ට ගිහින් දෙන්න," මම කිව්වා. "එයාට ඇත්ත කියන්න. එයාට කියන්න යුද්ධය අස් කරගන්න කියලා."

මදක් පැකිළුණු එයා ඉන්පසු එයාගේ බෙදුණු දිවෙන් කොළ පාට, ලෙදර් වගේ තොල් ලෙවකෑවා.

"හොඳින් ජීවත් වෙන්න, පර්සි ජැක්සන්. සැබෑම වීරයෙක් වෙන්න. මොකද, තුඹ එහෙම නොකළොත්, ආයේ කවදාහරි තුඹ මගේ අතට අහුවෙන්න ආවොත්..."

ඒ අදහස රස විඳිමින් එයා කෙකර ගෑවා. ඊට පස්සේ, එයාගේ සහෝදරියෝ සමග වවුල් තටු සැලූ එයා දුම් පිරුණු අහසට නැගිලා නොපෙනී ගියා.

මගේ දිහාවට පුදුමයෙන් ඇස් දල්වාගෙන බලා සිටි ග්‍රෝවර්ට සහ ඇනබෙත්ට මම එකතු වුණා.

"පර්සි..." ග්‍රෝවර් කතා කළා. "ඒක නම් අදහන්නත් බැරි තරම්..."

"බය හිතෙනවා," ඇනබෙත් කිව්වා.

"නියමයි!" ග්‍රෝවර් නිවැරදි කළා.

මට නම් බයක් දැනුණේ නැහැ. මට කොහෙත්ම 'නියම' ගතියක් දැනුණෙත් නැහැ. මම හිටියේ මහන්සි වෙලා, තුවාල වෙලා වගේම ශක්තිය මුළුමනින්ම සිඳිලායි.

"ඔයාලටත් ඒක දැනුණද... ඒක මොකක් වුණත්?" මම ඇහුවා.

, ඒ දෙන්නම නොසන්සුන්ව ඔළුව වැනුවා.

"ඒ උඩ හිටිය ෆියුරිලා වෙන්න ඇති," ග්‍රෝවර් කිව්වා.

ඒත්, මට නම් එහෙම හිතුණේ නැහැ. යම් දෙයක් ඒරිස් මාව මරණ එක නතර කළා. එහෙම කරන්න පුළුවන් දේ මොකක් වුණත්, ඒක ෆියුරිලාට වඩා ගොඩාක් බලවත් වෙන්න ඕනෑ.

මම ඇනබෙත් දිහා බැලුවා. අපි දෙන්නා අතරේ අවබෝධතාවයක් හුවමාරු වුණා. ආගාධයේ හිටියේ මොකාද, වාටරස්වල දොරටුව ළඟදී කතා කළේ මොකාද කියලා මට දැන් තේරුම් ගියා.

ග්‍රෝවර්ගෙන් මගේ ගමන් මල්ල ආපසු ගත් මම ඒක ඇතුළ බැලුවා. ප්‍රධාන අකුණ තවමත් ඒ තුළ තිබුණා. තුන්වෙනි ලෝක යුද්ධයට මුල පුරන්න තරම් ඒක පොඩි වැඩියි වගේ.

"අපි ආපහු නිව්යෝක්වලට යන්න ඕනෑ," මම කිව්වා. "අද රෑ වෙන්න කලින්."

"ඒක නම් කොහෙත්ම කරන්න බැරි දෙයක්," ඇනබෙත් කිව්වා. "එහෙනම් අපිට වෙන්නේ -"

"පියාඹන්න," මම එකඟ වුණා.

එයා මගේ දිහා බලාගෙන හිටියේ මාව කන්න වගෙයි.

"පියාඹන්න, ඒ කිවුවේ. ජෙට් එකක යන්නද? සියුස් අහසෙදිම ඔයාව විනාශ කරන්න ඉඩ තියෙන නිසා ඔයාට කවදාවත් එහෙම යන්න එපා කියලා නේද තියෙන්නේ. ඒ මදිවට, න්‍යෂ්ටික බෝම්බෙකටත් වඩා භයානක ආයුධෙකුත් අරගෙන උඩින් යන්නද හදන්නේ?"

"හරි," මම කිවුවා. "ඒ වගේ දෙයක් තමයි. ඉක්මනට යමු."

21

මම, මගේ ණය බේරුවා

තමා දකින සිදුවීම් එයාලාට ගැළපෙන විදිහේ යථාර්ථයකට සංස්කරණය කරගන්න මිනිස්සු යන ගැඹුර නම් හරිම පුදුමාකාරයි. කයිරොන් මට එහෙම කිවුවේ ගොඩාක් කාලයකට කලිනුයි. පුරුදු විදිහටම, සැහෙන පරක්කු වෙනකල් මම එයාගේ ප්‍රඥාව අගය කළේ නැහැ.

ලොස් ඇන්ජලීස් ප්‍රවෘත්තිවලට අනුව; සැන්ටා මොනිකා වෙරළේ සිදුවූ පිපිරීමට හේතු වුණේ ළමයින් පැහැර ගන්නා උමතු පුද්ගලයෙක් විසින් පොලිස් රථ දෙසට වෙඩි තැබීමයි. භූමිකම්පාව නිසා පැල්මක් ඇති වී තිබුණු ගෑස් ටැංකියකට අහම්බයෙන් ඔහුගේ උණ්ඩයක් වැදීම නිසා මෙය සිදුවී ඇත.

මේ උමතු පැහැර ගන්නා (නොහොත් ඒරීස්) යනු මාව සහ තවත් ගැටවරයින් දෙදෙනෙක් පැහැර ගත් පුද්ගලයාම වන අතර, එම තැනැත්තා විසින් අපිව නිව්යෝක් නගරයේ සිට දවස් දහයක් පුරාවට රට හරහා බිහිසුණු ගමනක් රැගෙන ගොස් ඇත.

කෙසේ වුවද, අවසානයේදී අසරණ පුංචි පර්සි ජැක්සන් යනු ජාත්‍යන්තර අපරාධකරුවෙක් නොවන බව තහවුරු වී ඇත.

ග්‍රේ හවුන්ඩ් බසයේදී ඔහු කලබැගෑනියක් ඇති කර තිබුණේ උමතු පුද්ගලයාගෙන් බේරී, පලා යාමට උත්සාහ කළ නිසාය. (එයින් පස්සේ, ලෙදර් ඇඳුමෙන් සැරසුණ කෙනෙක් බසයේ සිටිනවා දුටු බවට දිවුරන්න පවා සාක්ෂිකාරයෝ ඉදිරිපත් වුණා - "ඒත්, මට එයාව

කලින් මතක් නොවුණේ කොහොමද?!") ශාන්ත ලුයිස් ආරුක්කුවේ සිදුවූ පිපුරුමට මුල් වී ඇත්තේද මේ උමතු පුද්ගලයාමය. කොහොමත්, එවැනි දෙයක් කිරීමට කිසිම ළමයෙකුට හැකියාවක් නැත.

ඩෙන්වර් හෝටලයේ සිටි කල්පනාකාරී හෝටල් සේවිකාවකටද මේ උමතු පුද්ගලයා ළමයින් තුන්දෙනාට තර්ජනය කරන ආකාරය දකින්නට ලැබී තිබුණු අතර, තම මිතුරෙකු ලවා එය ඡායාරූප ගත කරවූ ඇය, ඒ පිළිබඳව පොලීසියට දන්වා ඇත. අවසානයේදී, නිර්භීත පර්සි ජැක්සන් (මගේ හිතෙත් මේ ළමයාට කැමැත්තක් ඇති වෙන්න ගත්තා) විසින් උමතු පැහැර ගන්නාගේ තුවක්කුවක් හොරකම් කරගෙන ඇති අතර, ඉන්පසු ලොස් ඇන්ජලීස් වෙරළේදී ඔහුත් සමග කරට-කර සටනක් කර ඇත. පොලීසිය වහාම එතැනට ළගා වුවද, සිදුවූ පිපිරීම නිසා පොලිස් රථ පහක් විනාශ වූ අතර උමතු පැහැර ගන්නා පලා ගොස් ඇත. මෙම සිදුවීමෙන් ජීවිත හානි කිසිවක් වාර්තා වී නැත. පර්සි ජැක්සන් සහ ඔහුගේ මිතුරෝ දෙදෙනා ආරක්ෂිතව පොලීසිය භාරයේ සිටී.

වාර්තාකරුවෝ මුළු කතාවම අපිට සපයද්දී, අපිට තිබුණේ ඔළුව වනමින්, ශෝකී සහ අතිශයින් වෙහෙසට පත් වූ (ඒක නම් අමාරු දෙයක් වුණේ නැහැ) අසරණ ළමයි වගේ කැමරාව ඉදිරියේ රඟපාන්න විතරයි.

"මට ඕනෑ," මම, මගේ කඳුළු සිර කරගෙන කතා කළා, "මගේ ආදරණීය බාප්පාව ආයෙමත් දකින්න විතරයි. එයාව ටී.වී එකේ දකපු හැම වතාවකදීම, එයා මට අපරාධකාර තරුණයා කියලා බනිද්දී වුණත්, මම දැනගෙන හිටියා... කොහොම හරි... අපිට ආපහු එකතු වෙන්න ලැබේවි කියලා. ඒ වගේම, මං දන්නවා මේ ලස්සන ලොස් ඇන්ජලීස් නගරයේ ඉන්න හැම කෙනෙක්ටම එයාගේ කඩෙන් නොමිලේ බඩු දෙන්න බාප්පාට උවමනා ඇති. මේ තියෙන්නේ එයාගේ දුරකථන අංකය." මගේ කතාවෙන් පොලිස් නිලධාරියෝ සහ වාර්තාකරුවෝ කොයි තරම් සැලුණාද කියනවා නම්, ඉක්මනින්ම, තොප්පියක් වටේ යවලා නිව්යෝර්ක්වලට ගුවන් යානා ප්‍රවේශපත් තුනක් මිල දී ගන්න සල්ලි එකතු කරලා දෙන්න පවා එයාලා පෙලඹුණා.

ගුවන් යානයක යනවා හැර මට වෙන විකල්පයක් නැති බව මම දැන සිටියා. වාතාවරණය ගැන සලකා බලලා සියුස් මට බුරුලක්

දේවි කියලා මම බලාපොරොත්තු වුණා. ඒ වුණත්, ගුවන් යානයට ගොඩ වෙන්න හිත හදාගන්න මට හරිම අමාරු වුණා.

මට ගුවන් ගතවීම දැනුණේ හරියට නපුරු හීනයක් වගෙයි. සෑම ගුවන් කැලඹීමක්ම ග්‍රීක රාක්ෂයන්ටත් වඩා බය ඉපැදුවා. ලා ගාඩියා ගුවන් තොටුපොළට අපි ආරක්ෂිතව ගොඩබාන තුරුම මම තදින් අල්ලාගෙන සිටි අත්ඇන්ද අත ඇරියේ නැහැ. අපි එනතුරු ප්‍රාදේශීය වාර්තාකරුවෝ පිටත රැස්කමින් බලාගෙන හිටියත්, ඈනබෙත්ට ස්තූති වෙන්න එයාලාව මග අරින්න අපිට පුළුවන් වුණා. අදෘශ්‍යමාන කැප් එක දමාගත් එයා, "අන්න එයාලා යෝගට් විකුණන තැනට ගිහිල්ලා! ඉක්මනට එතැනට යමු!" කියා කෑගහලා එයාලාව වෙනතකට යොමු කළා. ඊට පස්සේ, ගමන් මලු ලබා ගන්නා පර්යන්තයේදී එයා ආපසු අපිට එකතු වුණා.

කුලී රථ ගාලේදී අපි නැවතත් වෙන්වුණා. අර්ධ-ලෝහිත කන්දට ආපසු ගිහින්, සිදු වූ දේවල් ගැන කයිරොන්ව දැනුවත් කරන්න කියලා මම ඈනබෙත්ගෙන් සහ ග්‍රෝවර්ගෙන් ඉල්ලුවා. එයාලා ඒකට කැමති වුණේ නැහැ. අපි තුන්දෙනා එකතු වෙලා මූණ දුන් දේවල් ගැන හිතද්දී එයාලාට යන්න හරින එක ඇත්තෙන්ම අමාරු වැඩක් වුණත් මේ ගවේෂණයේ අන්තිම කොටස මම තනියම කළ යුතු බව මම දැන සිටියා. බැරි වෙලාවත්, හැමදේම නරක අතට හැරුණොත්, දෙවිවරු මාව විශ්වාස නොකළොත්... කයිරොන්ට ඇත්ත දන්වන්න ඈනබෙත් සහ ග්‍රෝවර් ජීවතුන් අතර සිටිය යුතුයි.

කුලී රියක් තුළට පැන්න මම මෑන්හැටන් බලා පිටත් වුණා.

පැය බාගයකට පස්සේ, මම එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ ප්‍රවේශ ශාලාවට ඇතුළු වුණා.

මගේ කඩමාලු වෙච්ච ඇඳුම් සහ සීරුණු මුහුණ නිසා මාව පේන්න ඇත්තේ හිඟන ළමයෙක් වගෙයි. මම පැය විසි හතරකින් විතර නිදාගෙන තිබුණෙත් නැහැ.

මම පිළිගැනීමේ මේසයේ සිටි මුරකරු ළඟට ගිහින් කතා කළා, "මට තට්ටු අංක හය සීයට යන්න ඕනෑ."

එයා කවරයේ විජ්ජාකරුවෙකුගේ රූපයක් ඇති ලොකු පොතක් කියවමිනුයි හිටියේ. මනඃකල්පිත කතාවලට මගේ වැඩි කැමැත්තක් නැතත්, ඒ පොත නම් හොඳ එකක් වෙන්න ඇති කියලා මට හිතුණේ

Scanned with CamScanner

පොතෙන් ඔළුව ඔසවා බලන්න මුරකරු සෑහෙන වෙලාවක් ගත්ත නිසයි. "එහෙම තට්ටුවක් නැහැ, ළමයෝ."

"මට සියුස්ව මුණගැහෙන්න ඕනෑ."

එයා මෝඩ හිනාවක් පෑවා. "මොකක්?"

"ඔයාට මම කියපු දේ ඇහුණානේ."

ඒ මුරකරුවා සාමාන්‍ය මනුස්සයෙක් වෙන්න ඇති හිතලා, එයා පිස්සන් කොටුවට කතා කරන්න කලින් මම එතැනින් දුවන්න ලෑස්ති වෙනකොටම එයා කතා කළා. "කලින් වෙලාවක් වෙන් කර ගත්තේ නැත්නම් මුණ ගැහෙන්න බැහැ, ළමයෝ. කලින් නොදන්වා එන කිසි කෙනෙක්ව සියුස් උතුමාණන් මුණ ගැහෙන්නේ නැහැ."

"ඔහ්, මං හිතන්නේ මේ සැරේට එයා ඒක වෙනස් කර ගනීවි," මම, මගේ ගමන් මල්ල ගලවා, එහි සිපරය ඇරියා.

මල්ල ඇතුළට එබුණු මුරකරුවාට තත්පර කීපයක් යනතුරු ලෝහ සිලින්ඩරය හඳුනා ගන්න බැරි වුණා. ඊට පස්සේ, එයාගේ මුහුණ සුදුමැලි වුණා. "ඒක නෙවෙයි නේද..."

"ඔව්, ඒක තමයි." මම තදින්ම කිවුවා. "ඔයාට ඕනෑ මම ඒක එළියට අරන් -"

"නෑ! නෑ!" දඩිබිඩියේ පුටුවෙන් නැගිටපු එයා මේසය වටේ අතගාලා යතුරුපතක් හොයාගෙන මට දුන්නා.

"මේක ආරක්ෂක සිදුරට ඇතුළු කරන්න. ඔයා යද්දී සෝපානයට වෙන කාවවත් ගන්න එපා."

මම එයා කියූ විදිහටම කළා. විදුලි සෝපානයේ දොර වැහුණු හැටියේම මම ආරක්ෂක සිදුරට යතුරුපත ඇතුළු කළා.

යතුරුපත අතුරුදහන් වෙද්දීම පාලන පුවරුවේ 600 සටහන් වූ රතු පාට අලුත් බොත්තමක් මතු වුණා.

ඒ බොත්තම ඔබලා මම බලාගෙන හිටියා, හිටියා, හිටියා.

ඒ අතරේ සිංදුවකුත් වාදනය වුණා.

අන්තිමේදි "ඩින්ග්!" සෝපානයේ දොරවල් දෙපසට ඇරුණා. එළියට අඩිය තැබුව මට තව පොඩ්ඩෙන් හෘදයාබාධයකුත් හැදෙනවා.

මම හිටගෙන හිටියේ අහස මැද ගලින් සෑදූ පටු පඩි පෙළක් උඩයි. ගුවන් යානයක් ගමන් කරන උසින් සිටි මට ඈත පහළින් මැන්හැටන් නගරය පෙනුණා. මට ඉදිරියෙන් කිරි ගරුඬ පඩි පෙළක් දගර ගැසී, වලාකුළු අතරින් අහසට නැගුණා. ඒ පඩි පෙළේ කෙළවරට මම ඇස් දිවෙව්වත් මට දකින්න ලැබුණු දේ පිළිගන්න මගේ මොළයට බැරි වුණා.

ආපහු බලන්න, මගේ මොළය කිවුවා.

අපි බලනවා තමයි, මගේ ඇස් කියා සිටියා. ඒක ඇත්තටම එතැන තියෙනවා.

වලාකුළුවලට උඩින් ඉහළට පැන නැගී තිබුණේ මුදුන හිමෙන් වැසුණු කඳු ගැටයක්. කන්ද දෙපස විවිධ තලවල මාළිගා දුසිමක් විතර එල්ලී තිබුණා - ඒක මන්දිරවලින් හැදුණ නගරයක්. ඒ සෑම මැදුරකටම සුදු පාට කුලුනු සහිත යෝධ පෝටිකෝ, රන් ආලේපිත මළු සහ ගිනිමැලවලින් දිලිසෙන ලෝකඩ ගිනි අගුරු බඳුන් තිබුණා. කඳු මුදුනේ සුදු හිම මතින් ඉහළට නැගී දිස්නය දුන් විශාලම මාළිගාව දෙසට නගරයේ සියලුම පාරවල් ඇදී ගියා. තැන් තැන්වල අඩමානයට එල්ලුණු උයන්වල ඔලිව් ගස් සහ රෝස පඳුරු මල්-පල දරාගෙන සිටියා. වර්ණවත් කූඩාරම්වලින් පිරුණු විවෘත කඩමණ්ඩියක්, කන්දේ එක් පසෙක ගලින් ඉදිකළ රංගාවාටයක් වගේම අශ්ව-ක්‍රීඩාංගණයකුත් මට දැකගන්න ලැබුණා. එය පෞරාණික ග්‍රීක නගරයක් වුවත් වෙනසකට තිබුණේ එහි කිසිවක් නටඹුන් වෙලා නොතිබීමයි. එය නවීන, පිරිසිදු සහ වර්ණවත් පෙනුමක් ගත්තා. මීට අවුරුදු දෙදහස් පන්සියයකට කලින් ඇතැන්ස් නගරය තියෙන්න ඇත්තෙත් මේ විදිහටයි.

මේක මෙතැන තියෙන්න විදිහක් නෑ, මම, මටම කියාගත්තා. ටොන් බිලියනයක ග්‍රාහකයක් වගේ මේක නිව්යෝක් නගරයට උඩින් එල්ලිලා තියෙන්නේ කොහොමද? මිනිස්සු මිලියන ගාණකගේ ඇස්වලට අසුවෙන මායිමේ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට උඩින් මෙහෙම දෙයක් තිබිලත් මිනිස්සුන්ගේ අවධානයට අසු නොවුණේ කොහොමද?

ඒත්, මෙතැන එය තිබුණා. ඒ වගේම මමත් එතැනට ගොස් සිටියා.

මම ඔලිම්පස් හරහා ඇවිද ගියේ සිහිනයෙන් වගෙයි. මුකුළු කරමින් සිටි වන දෙවඟනෝ දෙන්නෙක් පසු කරගෙන මම යද්දී

එයාලා සිලිව් ගෙඩිවලින් මට ගැහුවා. කඩමණ්ඩියේ සිටි වෙළෙන්දෝ කෝප්පවල ගෙණු ඇම්බ්‍රෝසියා, අලුත් පලිහක් වගේම රන් බැටළු ලොම් සළුවේ සැබෑ අනුරුවකුත් මට විකුණන්න උත්සාහ කළා. හෙෆාස්ටස් රූපවාහිනියේ දකින්න ලැබුණු ආකාරයටම, උයනක කලා දෙව්දුවරු නම දෙදෙනෙක්, එයාලාගේ සංගීත භාණ්ඩ සුසර කරමින් සිටියා. එයාලාගේ වටේ සැටර්ලා, ජල දෙවඟනෝ වගේම සුළු දෙවිවරු විය යුතු ගැටවරයින් පොකුරකුත් රොක්වෙලා සිටියා.

ළඟ එන සිවිල් යුද්ධය ගැන එයාලා කවුරුවත්ම වද වෙන බවක් පේන්න තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම, හැමෝම ප්‍රීතිමත් මුහුණුවරකින් ඉන්නවා වගෙයි පෙනුණේ. මම යන දෙස බලන්න හැරුණු එයාලා එකිනෙකාට මොනවදෝ කොඳුරා ගත්තා.

මම ප්‍රධාන පාර දිගේ කන්ද මුදුනේ වූ විශාල මාළිගාව දෙසට ගියා. මෙතැන හරියටම පාතාල ලෝකයේ මාළිගාවේ විරුද්ධ පිටපතක් වගෙයි.

පාතාලයේ හැමදේම කළු සහ ලෝකඩ පාට ගත්තත් මෙහෙ හැමදේම සුදු සහ රිදී පාටින් දිලිසුනා.

මෙතැනට සමාන වන ලෙසට හේඩීස්, එයාගේ මාළිගාව ඉදි කරන්න ඇති බව මම තේරුම් ගත්තා. දක්ෂිණායනයේදී හැර වෙන අවස්ථාවලදී එයාට ඔලිම්පස්වලට එන්න අවසර නැති නිසා හේඩීස් පාතාල ලෝකයේ එයාගේම ඔලිම්පස් මාළිගාවක් හදාගන්න ඇති. එයා ළඟදී මට නරක අත්දැකීම් ලැබී තිබුණා වුණත්, මට එයා ගැන පොඩි දුකක් දැනුණා. මෙතැනින් පිටුවහල් වී ඉන්න සිදුවීම ඇත්තෙන්ම සාධාරණ දෙයක් වගෙයි පෙනුණේ. ඕනෑම කෙනෙක්ව නපුරෙක් කරන්න ඒ වගේ දේකට පුළුවන්.

උඩට විහිදුණු පඩි පෙළ මැද මිදුලකින් අවසන් වුණා. එයට එපිටින් සිංහාසන ශාලාව තිබුණා.

ඒ ශාලාව එක්ක බලද්දී අපේ ලොකුම දුම්රිය නැවතුම්පොළත් පොඩි කබඩ් කාමරයක් වගෙයි. එහි අති විශාල කුලුනු ගෝලාකාර සිවිලිම දක්වා ඉහළ නැග තිබුණා. රන් ආලේප කර තිබූ ඒ සිවිලිමේ සමන් කරන තරු රටාවලින් හැඩකර තිබුණා.

හේඩීස්ගේ සිංහාසනයේ ප්‍රමාණය ගත් සිංහාසන දොළහක් යටිකුරු වූ අකුරේ හැඩයට පෙළ ගස්වා තිබුණේ අර්ධ-ලෝහිත කන්දේ කැබින්වල අනුපිළිවෙලටමයි. එහි මැද උදුනේ අතිවිශාල ගිනිමැලයක්

ඇවිලුණා. කෙළවරේ වූ සිංහාසන දෙක: දකුණු පැත්තේ ප්‍රධාන සිංහාසනය සහ එයට වම් පැත්තේ තිබුණු සිංහාසනය හැර අනෙක් සියල්ල හිස්ව පැවතුණා. මම එහාතුරු බලාගෙන සිටි මේ දෙවිවරු දෙන්නාව හඳුනා ගන්න මට කොහෙත්ම අමාරු වුණේ නැහැ. මම වෙවුලන කකුල්වලින් එයාලා ඉදිරියට ගියා.

හේඩීස් වගේම ඒ දෙන්නාත් යෝධ මිනිස් ස්වරූපයෙන් සිටියත් මට එයාලා දිහා බලන්න අමාරු වුණේ බලන හැම වතාවකදීම මගේ ඇඟ ගිනි ගන්නවා වගේ පුපුරු ගැසීමක් මට දැනුණු නිසායි. දෙවියන්ට අධිපති, සියුස් ඉරි මෝස්තරයක් වැටුණු තද නිල් පාට ඇඳුම් කට්ටලයක් හැඳ සිටියා. එයා වාඩි වී සිටියේ ගන ප්ලැටිනම්වලින් සෑදූ සරල සිංහාසනයකයි. හොඳින් මට්ටම් කර තිබූ එයාගේ කළු රැවුලේ තැනින් තැන අළු පාට වී තිබුණේ වැහි වලාකුළක් වගෙයි. ආඩම්බර, කඩවසම් වගේම සැර පරුෂ පෙනුමක් එයාගේ මුහුණේ තිබුණු අතර එයාගේ ඇස් වැහි අළු පාටක් ගත්තා.

මම එයාට කිට්ටු වෙද්දී ඕසෝන් වායුවේ ගඳ හැමූ සුළඟ පට-පට හඬින් පිපුරුවා.

එයාට එහා පැත්තෙන් වාඩි වී සිටියේ එයාගේ සහෝදරයා බවට කිසිම සැකයක් නැති වුණත්, එයා හැඳ සිටියේ ගොඩාක් වෙනස් ආකාරයටයි. එයාව දකිද්දී මගේ මතකයට ආවේ බටහිර වෙරළේ පදිංචි මනුස්සයෙක්වයි. කාකි කොට කාලිසමකුත්, පොල් ගෙඩි සහ හිරවුන්ගේ මෝස්තරයක් වැටුණු කමිසයකුත් හැඳ සිටි එයා ලෙදර් පටි සෙරෙප්පු කුට්ටමක් පැළඳගෙන සිටියා. අව්වට පිලිස්සීමෙන් එයාගේ සම තද දුඹුරු පාටට හැරිලා. වයසක මාළු අල්ලන්නෙකුගේ අත්වල වගේ එයාගේ අත්වලත් කැළැල් පිරී තිබුණා. එයාට තිබුණෙත් මගේ වගේම කළු පාට කොණ්ඩයක්. නිතරම වගේ මාව දඩබ්බරයෙක් විදිහට හංවඩු ගසන්නට හේතු වුණු කල්පනාබර පෙනුම එයාගේ මුහුණේත් දකින්න ලැබුණා. ඒත්, මගේ වගේම මුහුදු කොළ පාට ගත් එයාගේ ඇස් දෙක වටේටම රැළි ගැසී තිබුණේ එයාත් නිතරම සිනාසෙන කෙනෙක් බව පෙන්නුම් කරන්න වගෙයි.

එයාගේ සිංහාසනය ගැඹුරු මුහුදේ මාළු අල්ලන ධීවරයෙකුගේ පුටුවක් වගෙයි. සරල, කැරකෙන පුටුවක් වූ එහි කළු පාට ලෙදර් අසුනක් හා බිලී පිත්ත රැඳවීමට සම් කොපුවක් තිබුණා. ඒ වුණත්, එහි බිලී පිත්තක් වෙනුවට රඳවා තිබුණේ තුඩුවලින් කොළ පාට පුපුරු පිට වෙන ලෝකඩ ත්‍රිශූලයකුයි.

දෙවිදරු සෙලවුණේවත්, කතා කළේවත් නැතත්, එතැන වායුගෝලයේ නොයිවසුම් ගතියක් තිබුණේ හරියට ඒ දෙන්නා මේ දත් වාදයක් ඉවර කරලා වගෙයි.

ධීවරයාගේ සිංහාසනය ළඟ ගිය මම එයාගේ පාමුල දණ ගැහුවා. "තාත්තේ." ඔළුව ඔසවා බලන්න තරම් මම නිර්භීත වුණේ නැහැ. මගේ පපුව වේගයෙන් ගැහුණා. දෙවිවරු දෙන්නාගෙන් පිටවූ ශක්තිය මට දැනුණා. මම වැරදි දෙයක් කිව්වොත් එයාලා මාව දූවිලිවලට කුඩු කරලා දාන බවට මට කිසිම සැකයක් තිබුණේ නැහැ.

මගේ වම් පැත්තේ සිටි සියුස් කතා කළා. "මේ ගෙදර ස්වාමියාට මුලින්ම කතා කරලා හිටියා නම් හොඳ නැද්ද, කොල්ලෝ?"

මම දිගටම ඔළුව පහත් කරගෙන බලා සිටියා.

"කලබල වෙන්න එපා, සහෝදරයා," අන්තිමට පොසෙයිඩන් කිවුවා. එයාගේ කටහඬෙන් මගේ පරණම මතකයන් කැලඹුණා: මම බබෙක් කාලේ මතක තිබුණු අර උණුසුම් දීප්තිය; දෙවියන්ගේ අත මගේ නළල උඩ තියෙනවා වගේ දැනුණු හැඟීම. "මේ දරුවා, එයාගේ තාත්තාටයි කතා කළේ. ඒක තමයි හරි දේ."

"ඒ කියන්නේ, ඔයා තවමත් එයාට හිමිකම් කියනවා?" සියුස් තර්ජනාත්මකව ඇසුවා. "අපේ පූජනීය දිවුරුමට එරෙහිව ඔයා බිහි කරපු මේ දරුවාට ඔයා හිමිකම් කියනවා?"

"මං කරපු වැරැද්ද මම පිළිගත්තනේ," පොසෙයිඩන් කිවුවා. "දැන්, එයාට කතා කරන්න ඉඩ දෙමු."

වැරැද්ද.

මගේ උගුරේ ගුලියක් හිර වෙනවා වගෙයි මට දැනුණේ. එයා මං ගැන හිතන්නේ එහෙමද? මම වැරදීමක්ද? දෙවියෙකුට වුණ අත්වැරැද්දක ප්‍රතිඵලයක්ද?

"මම එක සැරේකුත් එයාට යන්න දුන්නා," සියුස් ගෙරෙව්වා. "මගේ බල ප්‍රදේශය හරහා පියාඹන්න තරම් ලොකුකමක්... පුන් එයාගේ ලැජ්ජා නැති වැඩේට එයාව අහසේදීම කුඩු කරලා දාන්නයි මට තිබුණේ."

"එහෙම කරලා ඔයාගෙම ප්‍රධාන අකුණත් විනාශ කරගන්නද?" පොසෙයිඩන් සන්සුන්ව ඇසුවා. "අපි එයා කියන දේ අහලා ඉමු, සහෝදරයා."

සියුස් තවත් ටිකක් ගෙරෙව්වා. "එහෙනම්, මම ඇහුම්කන් දෙන්නම්කෝ," එයා තීරණය කළා. "ඊට පස්සේ, මේ කොල්ලාව ඔලිම්පස්වලින් පහළට විසි කරනවද, නැද්ද කියලා මම තීරණය කරන්නම්."

"පර්සියස්," පොසෙයිඩන් කතා කළා. "මගේ දිහා බලන්න."

මම එයා දිහා බැලුවා. ඒත් එයාගේ මුහුණෙන් දකින්න ලැබුණේ මොනවාද කියලා මට තේරුම් ගන්න බැරි වුණා. එහි ආදරයක හෝ පිළිගැනීමක පැහැදිලි සලකුණක් තිබුණේ නැහැ. මාව දිරිගන්වන කිසිවක් තිබුණෙත් නැහැ. ඒක හරියට මුහුද දිහා බලන් ඉන්නවා වගෙයි: සමහර දවස්වලට එහි මූහුණුවර ගැන ඔයාට කියන්න පුළුවන්. ඒත්, ගොඩක් දවස්වලට ඒක තේරුම් ගන්න බැරි අබිරහසක් වගෙයි.

මං ගැන මොනවා හිතන්නද කියලා පොසෙයිඩන්ට තේරුමක් නැති බව මට දැනුණා. මාව පුතෙක් විදිහට ලැබීම ගැන එයාට සතුටුයිද, නැද්ද කියලාවත් එයා දැන සිටියේ නැහැ. ඒ වුණත්, පොසෙයිඩන් ඒ තරම් දුරස්වීම ගැන එක අතකින් මම සතුටු වුණා. මොකද, එයා සමාව ඉල්ලන්න උත්සාහ කළා නම්, එහෙම නැත්නම්, එයා මට ආදරෙයි කියලා කිවුවා නම්, අඩු තරමේ මාත් එක්ක හිනා වුණත් ඒක බොරුවක් විදිහට මට දැනේවි. හරියට මිනිස් තාත්තා කෙනෙක් වගේ එයා මාව බලන්න ආවේ නැති එක ගැන බොරු නිදහසට කරුණු කියනවා අහන්න මට ඕනෑ වුණේ නැහැ. කොහොමත්, මගේ හිතෙත් තවම එයා ගැන විශ්වාසයක් ඇතිවෙලා තිබුණෙත් නැහැ නේ.

"සියුස් උතුමාණන්ට කතා කරන්න, දරුවෝ," පොසෙයිඩන් මට කිවුවා. "ඔයාගේ කතාව එයාට කියන්න."

ඉතින්, හැම දෙයක්ම, සිද්ධ වූ විදිහටම මම එයාට විස්තර කළා. මම ලෝහ සිලින්ඩරය එළියට ගත්තා. අහසට අධිපති දෙවියන් ඉදිරියේදී විදුලි පුපුරු විසිරෙන්න පටන් ගත් එය මම සියුස්ගේ පාමුල තැබුවා.

ගොඩක් වෙලා යනතුරු එතැන පැවතුන නිශ්ශබ්දතාවය බිඳ දමන්න තිබුණේ ගිනිමැලය පුපුරු ගසමින් ඇවිළෙන හඬ විතරයි.

සියුස්, එයාගේ අත්ල දිග හරිද්දී ප්‍රධාන අකුණ එයට ඇදී ගියා. එයා ඒක තදින් අල්ලා ගත් පසු එය පරණ මෝස්තරයේ අකුණු පහරකට හැරෙනතුරුම එහි ලෝහ තුඩුවලින් විදුලිය පිට වුණා. අඩි

Scanned with CamScanner

විස්සක් දිග, වත් හැඩැති හෙල්ලක් වූ එයින් පිට වූ ශක්තිය නිසා මගේ ඇගෙ රෝම පවා කෙලින් වුණා.

"මේ කොල්ලා කියන්නේ ඇත්ත කියලා මට දැනෙනවා," සියුස් ගින් හඬින් කිවුවා. "ඒත්, ඒරීස් ඒ වගේ දෙයක් කළා කිව්වම... එයා එහෙම කෙනෙක් නෙවෙයි නේ."

"එයා උද්දච්ච, කලබලේට වැඩ කරන කෙනෙක්," පොසෙයිඩන් කිවුවා. "ඒක පවුලෙම අයගේ හැටියක් නේ."

"උතුමාණෙනි?" මම කතා කළා.

"ඇයි?" දෙන්නම උත්තර දුන්නා.

"ඒරීස් වැඩ කළේ තනියම නෙවෙයි. වෙන කවුරු හරි - වෙන මොකෙක් හරි - තමයි මේ අදහස ගෙනාවේ."

මට දකින්න ලැබුණු සිහින ගැන වගේම වෙරළේදී ඒරීස් මාව මරන එක නතර කරන්න හේතු වූ, ලෝකයම මොහොතකට එක තැන නතර කළ යක්ෂ සුසුමේ අත්දැකීම ගැනත් මම එයාලාට විස්තර කළා.

"සිහිනවලදී," මම කියාගෙන ගියා, "ඒ කටහඬ මට කිවුවේ අකුණ පාතාල ලෝකයට අරගෙන එන්න කියලා. ඒරීස්ටත් එහෙම හීන පේනවා කියලා එයා කියපු දේවල්වලින් තේරුණා. මට හිතෙන්නේ, යුද්ධයකට මුල පුරන්න මාව වගේම එයාවත් පාවිච්චි කරලා."

"ඒ කියන්නේ, ඔයා මේකට චෝදනා කරන්නේ හේඩීස්ට?" සියුස් ඇහුවා.

"නෑ," මම කිවුවා. "මං කිවුවේ, උතුමාණෙනි, මම හේඩීස් ළඟට ගිහින් තියෙනවා. ඒත් වෙරළේදී දැනුණ හැඟීම ඊට වඩා වෙනස්. මම අර ආගාධයට කිට්ටු වෙද්දී මට දැනුණේ ඒ හැඟීමමයි. ඒක තමයි ටාටරස්වල දොරටුව, එහෙම නේද? මොකක් හරි බලගතු, නපුරු දෙයක් ඒක යට කැලතෙනවා... මොකක් හරි දෙවිවරුන්ටත් වඩා පරණ දෙයක්."

පොසෙයිඩන් සහ සියුස් මුහුණෙන් මුහුණ බලාගත්තා. ඒ දෙන්නා අතරේ පෞරාණික ග්‍රීක භාෂාවෙන් වේගවත් සාකච්ඡාවක් ඇති වුණා. එයින් මට තේරුම් ගන්න හැකි වුණේ එක වචනයක් විතරයි. 'තාත්තා.'

පොසෙයිඩන් යම් ආකාරයක යෝජනාවක් ඉදිරිපත් කළත්, සියුස් ඒක ඉවත දැමුවා. පොසෙයිඩන් තර්ක කරන්න උත්සාහ කරද්දී සියුස් කේන්තියෙන් අතක් එසෙව්වා. "අපි ඔය ගැන ආයේ කතා කරන්නේ නැහැ," සියුස් කිවුවා. "මීතිස් කිලි මේ ලෝහයෙන් අයින් කරලා, ලෙම්නොස් වතුරෙන් මේ අකුණ පිරිසිදු කරගන්න මම දැන් යන්න ඕනෑ."

නැගී සිටි එයා මගේ දිහා බැලුවා. එයාගේ බැල්ම එක දශමයකින් විතර මෘදු වුණා. "ඔයා මට සේවයක් කළා, කොල්ලෝ. ඒ වගේ හපන්කමක් කරන්න පුළුවන් වෙලා තියෙන්නේ වීරයෝ දෙතුන් දෙනෙක්ට විතරයි."

"මට උදවු ලැබුණා, සර්," මම කිවුවා. "ග්‍රෝවර් අන්ඩර්වුඩ්, ඇනබෙත් චේස් දෙන්නා -"

"මගේ ස්තුතිය පෙන්වන්න, මම ඔයාගේ ජීවිතය අතාරිනවා. හැබැයි, මට ඔයාව විශ්වාස නැහැ, පර්සියස් ජැක්සන්. ඔයාගේ පැමිණීමෙන් ඔලිම්පස්වල අනාගතයට අගවන දේට මම කැමති නැහැ. ඒත්, පවුලේ සාමය වෙනුවෙන් මම ඔයාට ජීවත් වෙන්න ඉඩ දෙනවා."

"ම... ස්තුතියි, සර්."

"ආයේ කවදාවත් පියාඹන්න හිතන්නේ එහෙම නෑ. මම ආපහු මෙතැනට එනකොටත් ඔයා මට පේන්න හිටියොත් එහෙම ඔයාට මේ අකුණේ රහ බලන්න හම්බ වේවි. ඒ වගේම, ඔයාට දැනෙන අන්තිම රහත් ඒක තමයි."

අකුණකින් මාළිගාවම සෙලවුණා. ඇස් අන්ධ කරවන විදුලියක් එක්ක සියුස් අතුරුදහන් වුණා.

මම, මගේ තාත්තා එක්ක සිංහාසන ශාලාවේ තනි වුණා. ''ඔයාගේ ලොකු තාත්තා," පොසෙයිඩන් සුසුමක් හෙළුවා. "නාට්‍යයක රඟපානවා වගේ තැනකින් පිටවෙන්න හරිම දක්ෂයි. මට හිතෙන්නේ එයා රංගනයට අධිපති දෙවියෝ වුණා නම් මීට වඩා හොඳයි."

ඊට පස්සේ, අපහසුකාරී නිශ්ශබ්දතාවයක්.

"සර්," මම කතා කළා. "ඒ ආගාධයේ හිටියේ මොකාද?"

පොසෙයිඩන් මගේ දිහා සැලකිල්ලෙන් බැලුවා. "ඔයා ඒක අනුමාන කළේ නැද්ද?"

Scanned with CamScanner

"ක්‍රෝනොස්," මම කිව්වා. "ටයිටන්ලාගේ රජා."

ටාටරස්වලින් ගොඩාක් ඈත ඔලිම්පස්වල සිංහාසන ශාලාව පවා ක්‍රෝනොස්ගේ නම ඇහෙද්දී අඳුරු වුණා. මගේ පිටට දුනෙමින් තිබුණු ගිනිමැලයේ උණුසුමත් අඩු වුණා වගේ මට දැනුණා.

පොසෙයිඩන්, එයාගේ ත්‍රිශූලය අල්ලාගෙන සිටි ග්‍රහණය දැඩි කළා. "පර්සි, ක්‍රෝනොස්, එයාගේ තාත්තා - යුරේනස්ට කරපු විදිහටම පළවෙනි යුද්ධයේදී සියුස් අපේ තාත්තාවත් කෑලි දාහකට විතර කැපුවා. ඊට පස්සේ, සියුස් ක්‍රෝනොස්ගේ ඉතුරු වුණ කෑලි ටික ටාටරස්වල අඳුරුම වළට විසි කළා. ටයිටන් හමුදාව විසිරී ගියා, එට්නා කන්දේ තිබුණු එයාලාගේ බලකොටුව විනාශ කළා, එයාලාගේ මිතුරු රාක්ෂයන්ව ලෝකයේ ඈතම කොන්වලට එළෙව්වා. ඒ මොනවා කළත්, දෙවියෝ වන අපි වගේම ටයිටන්ලාත් මැරෙන්නේ නැහැ. ඉතින්, ක්‍රෝනොස්ගේ ඉතිරි කෑලි සදාකාලිකව වේදනා විඳිමින්, බලයට තෑදරකමෙන් තවමත් ජීවතුන් අතර ඉන්නවා."

"එයාව සනීප වෙනවා," මම කිව්වා. "එයා ආපහු එන්න හදන්නේ."

පොසෙයිඩන් ඔළුව හෙල්ලුවා. "යුග ගාණක් පුරා කාලෙන් කාලෙට ක්‍රෝනොස් දඟලලා තියෙනවා. එයා මිනිස්සුන්ගේ හීනවලට රිංගලා, යක්ෂ සිතුවිලි වපුරනවා. එයා ගැඹුරු තැන්වල ඉන්න රාක්ෂයන්ව අවුස්සනවා. ඒත්, එයාට ආගාධයෙන් නැගිටින්න පුළුවන් කියලා හිතන එක වෙනම දෙයක්."

"එයා හිතාගෙන ඉන්නේ ඒක තමයි, තාත්තේ. එයා කිව්වේ එහෙමයි."

දිගු වෙලාවක් යනතුරු පොසෙයිඩන් නිහඬව සිටියා.

"මේ ගැන සාකච්ඡා කරන එක සියුස් නතර කරලයි තියෙන්නේ. ක්‍රෝනොස් ගැන කතා කරන්න එයා අවසර දෙන්නේ නැහැ. ඔයා, ඔයාගේ ගවේෂණය සම්පූර්ණ කළා නේ, දරුවෝ. ඔයා කරන්න උවමනා එච්චරයි."

"ඒත් -" මම, මාවම නතර කරගත්තා. වාද කිරීමෙන් කිසිම හොඳක් වෙන්නේ නැති වේවි. ඒකෙන් වෙන්න ඉඩ තියෙන්නේ මගේ පැත්තේ ඉන්න එකම දෙවියාත් අමනාප වෙන එක විතරයි. "ඔයා... ඔයා කියන විදිහට, තාත්තේ."

තුනී සිනා රැල්ලක් එයාගේ තොල් මතට ආවා. "කීකරුකම ඔයාට ස්වාභාවිකවම එන්නේ නෑ, නේද?"

"නෑ... සර්."

"මං හිතන්නේ, මමත් ඒකට වග කියන්න ඕනෑ. යටත් වෙලා ඉන්න මුහුදත් කැමති නෑනේ." එයාගේ සම්පූර්ණ උසට නැගී සිටි එයා ත්‍රිශූලය අතට ගත්තා. ඊට පස්සේ, මිරිඟුවක් වගේ සැලෙමින් දිලිසුණු එයා සාමාන්‍ය මනුස්සයෙකුගේ ප්‍රමාණයට පත්වෙලා මගේ ඉදිරියේ හිටගත්තා. "ඔයා දැන් යන්න ඕනෑ, දරුවෝ. ඒත්, ඊට කලින් දැනගන්න, ඔයාගේ අම්මා ආපහු ඇවිල්ලා."

මම එයා දිහා බලාගෙන සිටියේ මුළුමනින්ම පුදුමයට පත් වෙලා. "මගේ අම්මා?"

"ඔයාට එයාව ගෙදරදී මුණගැහෙයි. ඔයා හේඩීස්ගේ හිස්වැසුම හොයලා දුන්නට පස්සේ හේඩීස් එයාව ආපහු එව්වා. මරණයට අධිපති පවා තමන්ගේ ණය ගෙවනවා."

මගේ පපුව වේගයෙන් ගැහුණා. මට ඒක විශ්වාස කරගන්නත් බැරි වුණා. "ඔයත් එනවද... ඔයත් කැමතිද..."

මට අහන්න උවමනා වුණේ අම්මාව බලන්න පොසෙයිඩන් එන්න කැමතිද කියලයි, ඒත් ඒක විහිළුවක් වගේ කියලා පස්සේ මටම තේරුණා. සාගරයට අධිපති දෙවියන්ව කුලී රියකට පටවාගෙන අපේ ගෙදරට ගෙනියනවා මම හිතේ මවා ගත්තා. ගතවූ අවුරුදු ගාණ පුරාවටම එයාට මගේ අම්මාව බලන්න උවමනා වුණා නම් එන්න තිබුණා. ඒ මදිවට, ගඳ ගහන ගේබ් ගැනත් හිතන්න වෙනවා නේ.

පොසෙයිඩන්ගේ ඇස් දුක්බර වුණා. "ගෙදර ගියාට පස්සේ, පර්සි, ඔයාට වැදගත් තෝරාගැනීමක් කරන්න වෙනවා. ඔයාගේ කාමරේ තිබිලා ඔයාට පාර්සලයක් හම්බ වේවි."

"පාර්සලයක්?"

"ඒක දැක්කම ඔයාට තේරුම් ගන්න පුළුවන් වෙයි. ඔයාගේ පාර තෝරලා දෙන්න වෙන කාටවත්ම බැහැ, පර්සි. ඒක ඔයාම තීරණය කරන්න ඕනෑ."

එයා අදහස් කළ දේ නොතේරුණත්, මම ඔළුව වැනුවා.

"ඔයාගේ අම්මා කාන්තාවෝ අතරේ රැජිනක්," පොසෙයිඩන් කල්පනාබරව කිවුවා. "ඒ වගේ මනුෂ්‍ය කාන්තාවක්ව අවුරුදු දහස් ගාණකින් මට මුණගැහිලා තිබුණේ නැහැ. ඒ වුණත්... ඔයා ඉපදුණු එක ගැන මට කණගාටුයි, දරුවෝ. මම ඔයාට වීරයෙක්ගේ ඉරණමක් උරුම කළා. වීරයෙකුගේ ඉරණම කවදාවත් සතුටුදායක වෙන්නේ නැහැ. ඒකේ ශෝකාන්තයක් මිසක් වෙන මුකුත් නැහැ."

ඒ කතාවෙන් මගේ හිත රිදවා නොගන්න මම උත්සාහ කළා. මෙන්න, මගේම තාත්තා මට කියනවා මම ඉපදුණු එක ගැන එයාට කණගාටුයිලු. "මං ඒ ගැන හිතන්නේ නැහැ, තාත්තේ."

"බාගදා, තවම නැතුව ඇති." එයා කිවුවා. "තවම නෑ. ඒ වුණත්, මගේ පැත්තෙන් ඒක සමාව දෙන්න බැරි අත්වැරැද්දක්."

"එහෙනම්, මම දැන් යන්නම්." මම නුහුරු ලෙස නැමී ආචාර කළා. "මම - මම ආයේ ඔයාට කරදර කරන්නෙ නෑ."

මම අඩි පහක් විතර ගියාට පස්සේ එයා කතා කළා. ''පර්සියස්,"

මම හැරුණා.

එයාගේ ඇස් දෙකට වෙනස්ම එළියක් - ආඩම්බරයෙන් පිරුණු එළියක් ඇවිත් තිබුණා. "ඔයා ඒක හොඳට කළා, පර්සියස්. මාව වරදවා තේරුම් ගන්න එපා. ඔයා තව මොන දේවල් කළත්, ඔයා මගේ කියලා මතක තියාගන්න. ඔයා සමුද්‍ර දෙවියන්ගේ සැබෑම පුතෙක්."

මම ආපසු දෙවියන්ගේ නගරය හරහා යද්දී හැම කතාබහක්ම නතර වුණා. කලා දෙව්දූවරු, එයාලාගේ ප්‍රසංගයට විරාමයක් තැබුවා. ගෞරවයෙන් හා කෘතඥතාවයෙන් මුහුණු පුරවාගත් සැටර්ලා, ජල දේවඟනන් ඇතුළු සැම දෙනාම මගේ දෙසට හැරුණා. මම එයාලාව පසු කරගෙන යද්දී ඒ හැමෝම දණ ගැසුවේ හරියට මම වීරයෙක් වගෙයි.

විනාඩි පහළොවකට පස්සේ, තවමත් නිද්‍රාවෙන් සිටි මම මැන්හැටන් නගරයට ඇවිත් සිටියා.

එහිදී කුලී රියක් අල්ලාගත් මම, අපේ ගෙදරට ගිහින්, දොරේ සීනුව නාද කරද්දීම එයා දොර ඇරියා - මගේ ලස්සන අම්මා. එයාගේ ළඟින් පෙපර්මින්ට් සහ සීනිකූරුවල සුවඳ හැමුවා. මාව දැකපු හැටියේම මහන්සිය හා දුක් වේදනා එයාගේ මුහුණෙන් අතුරුදහන් වෙලා ගියා.

"පර්සි! ඔහ්, දෙවියන්ට ස්තුති වේවා. අනේ, මගේ බබා."

එයා මාව තදින් තුරුලු කරගත්තා. මගේ ඔළුව අතගාමින් එයා හඬන තුරු අපි දොරකඩම සිටගෙන සිටියා.

ඒ මොහොතේ මගේ ඇසුත් බොඳ වෙලා තිබුණු බව මම පිළිගන්න ඕනෑ. අම්මාව දකින්න ලැබීමෙන් මගේ හිතට දැනුණු සහනය නිසාම මම වෙවුලමිනුයි හිටියේ.

එදා උදේ ගේබ්ව හොඳටෝම බය කරමින් අම්මාව ගෙදරින් මතු වූ බව එයා මට කිවුවා. එයාට මිනටෝර් ගැන කිසිම මතකයක් තිබිලා නැහැ. ජාතික ස්මාරක පුපුරවමින් රට හරහා සංචාරය කරන මාව අපරාධකාරයෙක් හැටියට පොලිසියට උවමනා කර තියෙන බව දැනගත්තාම එයාට විශ්වාස කරගන්නත් බැරිවෙලා. ඒ ප්‍රවෘත්තිය අහන්න නොලැබුණු නිසා එයා කනස්සල්ලෙන් හිත අවුල් කරගෙනයි ඉඳලා තියෙන්නේ. ඒ වුණත්, මේ මාසේ පඩිය ගන්න ඕනෑ නම් වැඩට යන්න කියලා ගේබ් එයාට බල කරලා.

මම කේන්තිය ගිලගෙන මගේ කතාව අම්මාට කිවුවා. ඒක සිදුවුණ තරම් බය නොහිතෙන ලෙස මම කියන්න උත්සාහ කළත් ඒක ලේසි වුණේ නැහැ. කතාව ඒරීස් එක්ක සටන් කළ තැනට එද්දිම සාලය දෙසින් ආව ගේබ්ගේ හඬ බාධා කිරීමක් කළා. "ඒයි, සැලී! අර මස් පාන් එක තවම හදලා ඉවර නැද්ද?"

අම්මා ඇස් වසාගත්තා. "ඔයාව දැකලා එයා සතුටු වෙන්නේ නම් නැති වෙයි, පර්සි. අද එයාගේ කඩේට ලොස් ඇන්ජලීස්වලින් කෝල් ලක්ෂයක් විතර ආවලු... මොකක්ද මේ, නොමිලේ දෙන බඩු ගැන අහලා."

"ඔහ්, ඒකද..."

එයා බයාදු විදිහට හිනා වුණා. "එයාව කේන්ති ගස්සන්නේ නැතුව ඉන්නකෝ, හරිද? එන්න යමු."

මම පිටට ගිහින් හිටිය එක මාසයට මුළු ගෙදරම ගේබ්ලන්තයකට හැරිලා තිබුණා. බුමුතුරුණ උඩ වළලුකර උසට කුණු පිරිලා. සෝපාව උඩ බීර කෑන් ගොඩ ගහලා. විදුලි පහන් ආවරණවල කිලුටු මේස් සහ යට ඇඳුම් එල්ලෙමින් තිබුණා.

ගේබ් සහ එයාගේ තඩි, කැත යාළුවෝ තුන්දෙනා මේසට වටේ කාඩ් සෙල්ලම් කරමින් සිටියා.

Scanned with CamScanner

මාව දැක්කම ගේබ්ගේ කටේ තිබුණු සිගරට්ටුව බිමට වැටුණා. එයාගේ මූහුණ ලෙඩ්දියවලටත් වඩා රතු පාටට හැරුණා. "මෙහෙට එන්න තරම් හයියක් ඔහේට තිබ්බද, තරුම කොල්ලා. මං හිතුවේ පොලීසිය -"

"කොහොම වුණත් එයා පොලීසියෙන් පැනලා යන කෙනෙක් නෙවෙයි නේ," මගේ අම්මා මැදට පැන්නා. "ඒක නම් හරිම ෂෝක් නේද, ගේබ්?"

ගේබ් අපි දෙන්නා දිහා මාරුවෙන් මාරුවට බැලුවා. මම ගෙදර ආව එක හරිම ෂෝක් කියලා එයාට නම් හිතුණේ නැහැ වගෙයි.

"ඔයාගේ ජීවිත රක්ෂණයෙන් ලැබුණ සල්ලි ආපහු දෙන්න වුණා මදිවට, සැලී," එයා ගෙරෙව්වා. "මට ෆෝන් එක ගෙනල්ලා දෙනවා. මම පොලීසියට කතා කරනවා."

"ගේබ්, එපා!"

එයා ඇහිබැම එසෙව්වා. "ඔයා මට එපා කියලද කිවුවේ? ඔයා හිතන්නේ මේ තරුමයා එක්ක මම ජීවත් වෙයි කියලද? එයා මගේ කාර් එක විනාශ කළාට පැමිණිලි කරන්න මට තවම පුළුවන්."

"ඒත් -"

එයා අතක් එසෙව්වා, ඒත් එක්කම මගේ අම්මා බයෙන් ඇකිළුණා.

පළවෙනි වතාවට මම දෙයක් තේරුම් ගත්තා. ගේබ් මගේ අම්මාට පහර දීලා තියෙනවා. ඒ කවදාද, කොයි තරමද කියලා මම දැනගෙන හිටියේ නැහැ. ඒත්, එයා එහෙම කරලා තියෙන බව මට විශ්වාස වුණා. සමහරවිට, අවුරුදු ගාණක් තිස්සේ මම ගෙදර නැති වෙලාවට එයා එහෙම කරන්න ඇති.

මගේ පපුවේ බැලුමක් වගේ කේන්තියෙන් පිරෙන්න ගත්තා. මම ගේබ් ඉදිරියට ගියේ ඉබේටම වගේ මගේ පෑනත් සාක්කුවෙන් එළියට අරගෙනයි.

ගේබ් හිනාවුණා. "මොකද, මැට්ටෝ? ඔහේ හදන්නේ මගේ ඇඟේ ලියන්නද? ඔහේ මගේ ඇඟට අතක් හරි තිබ්බොත්, මං ඔහේව කැම්දාටම හිරේට අරිනවා, තේරෙනවද?"

"හේයි, ගේබ්," එයාගේ යාළුවා, එඩී මැදිහත් වුණා. "එයා පොඩි ළමයෙක් නේ."

අමනාපයෙන් එයා දෙස බැලූ ගේබ් එයාගේ හඬ අනුකරණය කරමින් ඇද කළා: "පොඩි ළමයෙක් නේ."

එයාගේ අනෙක් යාළුවෝ මෝඩ විදිහට හිනාවුණා.

"මම ඔහේට උදව්වක් කරන්නම්, මැට්ටෝ," ගේබ්, එයාගේ දුම්කොළ කහට බැඳුණු දත් විලිස්සුවා. "ඔහේගේ බඩු ටිකත් අරගෙන මෙහෙන් තොලොංචි වෙලා යන්ඩ මං විනාඩි පහක් දෙන්නම්. ඊට පස්සේ, මම පොලීසියට කතා කරනවා."

"ගේබ්!" මගේ අම්මා බැගෑපත් වුණා.

"එයා එක සැරයක් පැනලා ගියා නම්, ඒ ගියපු විදිහටම එයාට ඉන්ඩ අරිනවා." ගේබ් එයාට කිවුවා.

රිප්ටයිඩ් එළියට ගන්න මගේ අත කැසුවා. ඒත්, මම එහෙම කළත් මේ කඩු තලයෙන් මිනිස්සුන්ට හානියක් වෙන්නේ නැහැ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නොවුණත් ගේබ් කියන්නෙත් මනුස්සයෙක් නේ.

අම්මා මගේ අතින් අල්ලා ගත්තා. "අනේ, පර්සි. එන්නකෝ. අපි ඔයාගේ කාමරේට යමු."

ක්‍රෝධයෙන් මගේ අත් වෙවුලද්දී මාව ඇදගෙන යන්න මම අම්මාට ඉඩ දුන්නා.

මගේ කාමරය ගේබ්ගේ කුණු ගොඩවල්වලින් පිරිලා. පාවිච්චි කර ඉවත දැමූ කාර් බැටරි ගොඩකුත්, කණගාටුව පළ කිරීමට එවූ කාඩ්පතක් එක්ක කුණු වූ මල් පොකුරකුත් එහි ගොඩ ගසා තිබුණා. ඒවා එවන්න ඇත්තේ රූපවාහිනී නිවේදිකාව සමග ගේබ් කළ සම්මුඛ සාකච්ඡාව නැරඹූ කෙනෙක් වෙන්න ඇති.

"ගේබ් ටිකක් කලබල වෙලා විතරයි, පැටියෝ," මගේ අම්මා මට කිවුවා. "මම එයා එක්ක පස්සේ කතා කරන්නම්. ඒ ඔක්කොම හරියාවි කියලා මට විශ්වාසයි."

"අම්මේ, ඒක කවදාවත් හරියන්නේ නැහැ. ගේබ් මෙහෙ ඉන්නකල් එහෙම වෙන්නේ නැහැ."

Scanned with CamScanner

එයා කලබලෙන් දැත් ඇඹරුවා. "මට පුළුවන්... මම ගිම්හාන කාලේ ඉතිරි දවස් ටිකේදී ඔයාව මං වැඩ කරන තැනට එක්ක යන්නම්. ඊළඟ වාරේදි, සමහරවිට නව බෝඩිම් ඉස්කෝලයක් -"

"අම්මේ."

අම්මා ඇස් බිමට හරවා ගත්තා. "මම උත්සාහ කරනවා, පර්සි. මට... තව ටික කාලයක් ඕනෑ."

මගේ ඇඳ උඩ පාර්සලයක් මතු වුණා. අඩු තරමේ, ඊට මොහොතකට කලින් ඒක එතැන නොතිබුණ බව මට දිවුරන්න වුණත් පුළුවන්.

එය පැසිපන්දුවක් දැමිය හැකි ප්‍රමාණයේ දිරාපත් වූ කාඩ්බෝඩ් පෙට්ටියක්. එහි ලිපිනය ලියන තීරුවේ තිබුණේ මගේම අත් අකුරුයි:

දෙවිවරු,

ඔලිම්පස් කන්ද,

මහල් අංක 600,

එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල,

නිව්යෝක්.

සුබ පැතුම් සමගින්,

පර්සි ජැක්සන්.

ඊට උඩින් පිරිමියෙකුගේ පැහැදිලි, තද අකුරෙන් අපේ ගෙදර ලිපිනය සමග මෙසේ ලියා තිබුණා: යවන්නාට ආපසු බාර දෙන්න.

හදිසියේම, ඔලිම්පස්වලදී මට පොසෙයිඩන් කියූ දේ අදහස මට තේරුණා.

පාර්සලයක්. තීරණයක්.

ඔයා තව මොන දේවල් කළත් ඔයා මගේ කියලා මතක තියා ගන්න. ඔයා සමුද්‍ර දෙවියන්ගේ සැබෑම පුතෙක්.

මම අම්මා දිහා බැලුවා. "අම්මා, මෙහෙන් ගේබ් යනවට ඔයා කැමතිද?"

"පර්සි, ඒක හිතන තරම් සරල නැහැ. මම -"

"අම්මේ, මම අහපු දේට උත්තර දෙන්නකෝ. ඒ නරුමයා ඔයාට ගහනවා නේද. එයා මෙහෙන් යනවට ඔයා කැමතිද, නැද්ද?"

මදක් පැකිළුණු එයා ඊට පස්සේ පෙනෙන-නොපෙනෙන තරමට ඔළුව වැනුවා. "ඔව්, පර්සි. මම කැමතියි. ඒක එයාට කියන්න මගේ හිතේ ධෛර්යය වැඩි කරගන්න මම උත්සාහ කරනවා. ඒත්, මං වෙනුවෙන් ඒක කරන්න ඔයාට බැහැ. මගේ ප්‍රශ්න විසඳන්න ඔයාට බැහැ."

මම පෙට්ටිය දිහා බැලුවා.

අම්මාගේ ප්‍රශ්නය මට විසඳන්න පුළුවන්. ඒ පෙට්ටිය ඇරලා, ඒක කාඩ් සෙල්ලම් කරන මේසය උඩට දාලා, ඇතුළේ තිබුණු දේ එළියට ගන්න මට උවමනා වුණා. මගේ ගෙදර, සාලයෙන් මගේම ප්‍රතිමා එකතුවක් පටන් ගන්න මට පුළුවන්.

කතන්දරවල ඉන්න ග්‍රීක වීරයෝ කරන්නේ එහෙමයි, මම හිතුවා. ගේබ්ට ලැබෙන්න ඕනෑ එහෙම දෙයක් තමයි.

ඒත්, වීරයෙකුගේ කතාව හැම වෙලාවෙම ඉවර වෙන්නේ ශෝකාන්තයකින්. පොසෙයිඩන් මට එහෙමයි කිවුවේ.

මට පාතාල ලෝකය මතක් වුණා. ගේබ්ගේ ආත්මය සදාකාලයටම ඇස්ෆොඩෙල් යායේ සැරිසරන විදිහ මම කල්පනා කළා. එහෙම නැත්නම්, වධක භූමියේ කටු කම්බි වැටට එහා පැත්තේ ඇති භයානක වධයකට එයාව නියම වුණොත් - ඔපෙරා සංගීතයට සවන් දෙමින්, උතුරන තෙල් කටාරමක ඉණ උසට බැහැගෙන සදාකාලිකවම කාඩ් සෙල්ලම් කරන්න එයාට සිද්ධ වුණොත්. එතැනට කාවහරි යවන්න මට අයිතියක් තියෙනවද? අඩු තරමේ ගේබ්ව වුණත්?

මීට මාසයකට කලින් නම් මම ඒකට පසුබට නොවෙන්න තිබුණා. ඒත් දැන්...

"මට ඒක කරන්න පුළුවන්," මම, මගේ අම්මාට කිවුවා. "මේ පෙට්ටිය ඇතුළ එක පාරක් බැලුවොත් එයා ආයේ කවදාවත්ම ඔයාට කරදර කරන්නේ නැති වේවි."

පෙට්ටිය දෙසට බැල්මක් හෙළූ එයා ඉක්මනින්ම ඒ ගැන තේරුම් ගත් බව පෙනුණා. "නෑ, පර්සි," අඩියක් පසුපසට යමින් අම්මා කිවුවා. "ඔයාට බැහැ."

Scanned with CamScanner

"පොසෙයිඩන් කිව්වේ ඔයා රැජිනක් කියලා," මම එයාට කිව්වා. "ඔයා වගේ ගෑනු කෙනෙක් එයාට අවුරුදු දහස් ගාණකින් හම්බ වුණේ නැහැ කියලා එයා කිව්වා."

අම්මාගේ කම්මුල් රතු වුණා. "පර්සි -"

"ඔයාට මීට වඩා දේවල් ලැබෙන්න ඕනෑ, අම්මේ. ඔයා විශ්වවිද්‍යාලයට ගිහින් ඔයාගේ උපාධිය ගන්න ඕනෑ. ඔයාට, ඔයාගේ පොත ලියන්න පුළුවන්. මීට වඩා හොඳ කෙනෙක් එක්ක ලස්සන ගෙදරක ජීවත් වෙන්න පුළුවන්. මාව ආරක්ෂා කරන්න ඔයා තවදුරටත් ගේබ් එක්ක ජීවත් වෙන්න ඕනෑ නැහැ. ගේබ්ගෙන් ඔයාව නිදහස් කරන්න මට ඉඩ දෙන්න."

එයා කම්මුලට වැටුණු කඳුළු බිඳුවක් පිහදැමුවා. "ඔයා කතා කරන්නෙත් හරියට ඔයාගේ තාත්තා වගේමයි," එයා කිව්වා.

"එක වතාවක්, එයා මං වෙනුවෙන් වඩදිය නතර කරන්න ඇනුවා. මං වෙනුවෙන් මුහුදු පතුලේ මාලිගාවක් හදන්න ලෑස්ති වුණා. එයා හිතුවේ එයාගේ අත වැනීමකින් මගේ ප්‍රශ්න ඔක්කොම විසඳන්න පුළුවන් කියලා."

"ඉතින්, එකේ ඇති වැරැද්ද මොකක්ද?"

එයාගේ බහුවර්ණ ඇස්වලින් අම්මා මගේ ඇතුළු පැත්ත විපරම් කරනවා වගෙයි පෙනුණේ. "මං හිතන්නේ, ඔයා ඒක දන්නවා, පුතේ. ඔයත් මං වගේම නිසා ඒක තේරුම් ගන්න ඔයාට පුළුවන්. මගේ ජීවිතේ අර්ථවත් වෙන්න නම් මම තනියම මං ගැන බලාගන්න ඕනෑ. මං ගැනවත්... මගේ පුතා ගැනවත් වගබලා ගන්න දෙවියෙකුට පවරන්න බැහැ. මගේ ධෛර්යය මම ම ඇති කරගන්න ඕනෑ. ඔයාගේ ගවේෂණය මට ඒක මතක් කරලා දුන්නා."

සාලය දෙසින් ඇහුණු රූපවාහිනියේ හඬට සහ පරුෂ වචනවලින් කතා කරන හඬවලට අපි කන් දුන්නා.

"මම මේ පෙට්ටිය තියලා යන්නම්," මම කිව්වා. "එයා ඔයාට කරදර කළොත්..."

පිළිමැලි පාටට හැරුණත් අම්මා ඔළුව වැනුවා. "ඔයා කොහෙද යන්නේ, පර්සි?"

"අර්ධ-ලෝහිත කන්දට."

"ගිම්හාන කාලෙටද... නැත්නම් හැමදාටමද?"

"මං හිතන්නේ, ඉස්සරහට වෙන දේවල් උඩ ඒක තීරණය වෙයි."

අම්මාගේ ඇස් දෙස බලද්දී, අපි අතරේ එකඟතාවයක් ඇතිවූ බව මට දැනුණා. ගිම්හාන සෘතුව ඉවර වෙද්දී තත්වය කොයි අතට හැරේවිද කියලා අපිට බලාගන්න ලැබේවි.

අම්මා මගේ නළලට හාදුවක් දුන්නා. "ඔයා වීරයෙක් වේවි, පර්සි. වීරයෝ අතරේ ශ්‍රේෂ්ඨම කෙනා වේවි."

මම අන්තිම වතාවටත් මගේ කාමරය දෙස බැලුවා. ආයේ කවදාවත්ම ඒක දකින්න නොලැබේවි කියලා මගේ හිත කිවුවා. ඊට පස්සේ, මම, මගේ අම්මා එක්ක ඉදිරි දොර ළඟට ගියා.

"මෙච්චර ඉක්මනට යනවද, මැට්ටෝ?" ගේබ් කෑගහලා ඇසුවා. "අනේ හොඳයි."

මගේ හිතේ තවත් පුංචි දෙගිඩියාවක් තිබුණා. මම කොහොමද එයාගෙන් පළිගන්න තියෙන හොඳම අවස්ථාව අතහැර දාන්නේ? මගේ අම්මාව බේරා ගන්නේ නැතුවම මම මෙතැනින් යන්න හදනවා.

"හේයි, සැලී," එයා මොර දුන්නා. "කෝ අර මස් පාන් එක, ඈ?"

අම්මාගේ ඇස්වල තරහවක තද බැල්මක් ඇවිළුණා. සමහරවිට, මේ දේවල් හොඳම විදිහට විසඳා ගන්න අම්මාට පුළුවන් වේවි කියලා එතකොට මට හිතුණා.

"මස් පාන් එක ඉක්මනටම ගේනවා, අනේ," එයා ගේබ්ට කිවුවා. "පුදුම මස් පාන් එකක්."

මගේ දිහා බැලූ එයා ඇහැක් ගැහුවා.

දොර වැහෙන අතරේ මට අන්තිමට දකින්න ලැබුණේ උද්‍යාන ප්‍රතිමාවක් විදිහට එයා කොහොම ඉඳීවිද කියලා කල්පනා කරනවා වගේ මගේ අම්මා ගේබ් දෙස බලා සිටින අන්දමයි.

Scanned with CamScanner

22

අනාවැකිය සැබෑවක් බවට වුණා

ලූක්ගෙන් පසු අර්ධ-ලෝහිත කන්දට පණපිටින් ආව මුල්ම වීරයෝ වුණේ අපි. ඒ නිසාම, හැමෝම අපිට සැලකුවේ හරියට අපි ටී.වී එකේ තරු තෝරන තරගයකින් දිනලා ආවා වගෙයි. කඳවුරේ සම්ප්‍රදායට අනුකූලව, අපිට උපහාර දැක්වීමට සූදානම් කර තිබූ ලොකු උත්සවයට අපිට යන්න වුණේ ලෝරල් මල් ඔටුනු පැළඳගෙනයි. ඉන්පසු අපිව පෙරහැරකින් ගිනිමැලය ළඟට කැඳවාගෙන ගියේ අපි නැති කාලයේදී අපේ කැබින්වල අය අපි වෙනුවෙන් සෑදූ භූමිදාන සළු පුලුස්සා දමන්නයි.

අළු පාට සේද රෙද්දක බකමූණන්ව ගෙත්තම් කර තිබූ ඇනබෙත්ගේ සළුව ගොඩාක් ලස්සනට තිබුණා. ඉතින්, එයාව ඒකේ ඔතලා භූමිදානය කරන්නේ නැති එක නම් ලැජ්ජාවක් වගෙයි කියලා මම එයාට කිව්වම අත මිටි කරලා මට පහරක් දුන් එයා මට කට වහගන්න කිව්වා.

පොසෙයිඩන්ගේ පුතා වූ මට කිසිම කැබින් සහයකයෙක් නොසිටි නිසා, ඒරිස්ගේ කැබින් එක මං වෙනුවෙන් භූමිදාන සළුවක් හදන්න කැමැත්තෙන්ම ඉදිරිපත් වෙලා තිබුණා. එයාලා පරණ ඇඳ රෙද්දක් අරගෙන, ඒක පුරාම හිනා මූණු ඇඳලා, හරි මැදින් 'මැට්ටා' කියලා ලොකුවට පින්තාරු කරලා තිබුණා.

ඒක පුලුස්සා දාන එක නම් හරිම විනෝදයක් වුණා.

ඇපලෝගේ කැබින් එකේ අය සිංදු කියන අතරේ, මාෂ්මෙලෝස් අතින් අතට යද්දී හර්මීස් කැබින් එකේ මගේ පරණ යාළුවෝ, ඇතීනාගේ කැබින් එකේ ඇනබෙත්ගේ යාළුවෝ සහ ග්‍රෝවර්ගේ සැටර් යාළුවෝ මාව වට කරගෙන සිටියා. විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලයෙන් ග්‍රෝවර්ට නිකුත් කර තිබුණු අලුත්ම සොයන්නෙකුගේ බලපත්‍රය සැටර් යාළුවෝ ඉහළින්ම අගය කරමින් සිටියා. ගවේෂණයේදී ග්‍රෝවර් කළ දේවල් ගැන මණ්ඩලයේ වැඩිහිටියෝ කියා තිබුණේ "බඩවැලේ කෙළවරට යනතුරු නිර්භීත කෙනෙක්" කියලයි.

උත්සවයේ සතුටු නොවුණ එකම පිරිස වුණේ ක්ලැරිස් සහ එයාගේ කැබින් එකේ අයයි. එයාලාගේ තාත්තාට අවමන් කළාට මට කවදාවත්ම සමාව නොදෙන බව එයාලා මට හෙළු විසකුරු බැළුම්වලින් පැහැදිලි වුණා.

ඒකෙන් මට කමක් නැහැ.

අඩු තරමේ අපිව පිළිගැනීමට ඩයනයිසියස් කරපු කතාවටවත් මගේ හිතේ සතුට අඩු කරන්න බැරි වුණා. "ඔව්, ඔව්, ඉතින් මැරෙන්නේ නැතුව කොහොම හරි ආපහු එන්න මේ පුංචි කොල්ලාට පුළුවන් වෙලා තියෙනවා. දැන් එයාගේ ඔළුව ඉස්සරටත් වඩා ඉදිමෙයි. හොඳා...යි, ඒකට ජය වේවා. තව නිවේදනයක් තියෙනවාඃ මේ සෙනසුරාදාට ඔරු පදින තරගය පවත්වන්නේ නැහැ..."

ආපසු කැබින් අංක තුනට යන්න මට සිදු වුණත්, තවදුරටත් ඒක පාළු තැනක් වගේ මට පෙනුණේ නැහැ. මුළු දහවල පුරාම පුහුණුවීම් කරන්න මට, මගේ යාළුවෝ සිටියා. රෑට මම ඇඳේ වැතිරිලා මුහුදේ හඬට කන් දුන්නේ මගේ තාත්තා එතැන ඉන්න බව දැනගෙනයි. සමහරවිට, එයාට තවම මං ගැන වැඩි විශ්වාසයක් නැතිව ඇති. සමහරවිට, මම ඉපදෙනවා දකින්න එයාට උවමනා නොවෙන්නත් ඇති. ඒ වුණත් එයා මගේ දිහා බලාගෙන ඉඳලා. ඒ වගේම මේ තාක් දුරට මම කළ දේවල් ගැන එයා ආඩම්බර වෙනවා.

මගේ අම්මා ගැන කියනවා නම්, එයාට අලුත් ජීවිතයකට අවස්ථාවක් ලැබී තිබුණා. මම කඳවුරට ඇවිත් සතියකට පස්සේ එයාගෙන් ලියුමක් ආවා. ගේබ් හිතාගන්නවත් බැරි විදිහට ගෙදරින් යන්න ගිහින් කියලා එයා ලියලා තිබුණා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, එයා මේ ලෝකයෙන්ම අතුරුදහන් වෙලා වගෙයිලු. එයාගේ අතුරුදහන් වීම ගැන අම්මා පොලීසියට පැමිණිලි කරලා තිබුණත්,

එයාලාට කවදාවත් ගේබ්ව හොයා ගන්න බැරි වේවි කියලා අම්මාට නිකමට වගේ හිතෙනවලු.

ඊට කොහෙත්ම සම්බන්ධයක් නැති කාරණයක් ගැන කියමින් අම්මා සඳහන් කර තිබුණේ එයාගේ පළවෙනි ජීව ප්‍රමාණයේ කොන්ක්‍රීට් ප්‍රතිමාව සෝහෝවල කලාගාරයක් හරහා ප්‍රතිමා එකතු කරන්නෙකුට විකුණන්න එයාට පුළුවන් වුණා කියලයි. අම්මා ඒ ප්‍රතිමාව නම් කර තිබුණේ 'සුදු අන්තුවා' ලෙසයි. එය විකිණීමෙන් සල්ලි ගොඩක් ලැබුණු නිසා අලුත් ගෙදරකට අත්තිකාරම් ගාස්තු ගෙවන්නත්, තිව්යෝත් විශ්වවිද්‍යාලයේ පළමු මාස හය සඳහා සල්ලි ගෙවන්නත් අම්මාට පුළුවන් වෙලා තිබුණා. සෝහෝ කලාගාරයෙන් තව තවත් නිර්මාණ ඉල්ලා අම්මාට කරදර කරනවලු. එයාලා ඒකට කියන්නේ 'ආධුනිකයෙකුගේ යෝධ පිම්මක්' කියලලු.

ඒත්, කලබල වෙන්න එපා, මගේ අම්මා ලියා තිබුණා. මම ප්‍රතිමා හදන එක නතර කළා. ඔයා මට දීලා ගිය උපකරණ පෙට්ටිය මම පැත්තකට දැම්මා.

ලිපුමේ අගට එයා පසුව ලිවීමක් එකතු කර තිබුණාඃ පර්සි, මෙහෙදී මට හොඳ පුද්ගලික ඉස්කෝලයක් හම්බ වුණා. ඔයා හත වසරට බැඳෙන්න කැමති වෙයි හිතලා මම ඒකට ඇතුළු වීමේ ගාස්තු ගෙව්වා. ඔයාට ගෙදර එන්න පුළුවන්. ඒත්, අර්ධ-ලෝහිත කන්දේ මුළු අවුරුද්දම ගත කරන්න ඔයාට ඕනෑ නම්, ඒකට කමක් නැහැ.

මම ඒ ලිපුම පරිස්සමින් නමලා මගේ ඇඳ ළඟ මේසය උඩින් තැබුවා. හැම රෑකම නිදාගන්න කලින් මම නැවත-නැවතත් එය කියෙව්වේ අම්මාට දිය යුතු උත්තරය ගැන තීරණයක් ගන්න උත්සාහ කරමිනුයි.

ජූලි හතර - ඒ කියන්නේ නිදහස් සවසේ, මුළු කඳවුරේම අය වෙරළට රැස් වුණේ කැබින් අංක නමයේ අයගේ මල් වෙඩි සංදර්ශනය නරඹන්නයි. හෙෆාස්ටස්ගේ දරුවෝ වූ එයාලා සාමාන්‍ය නිල්-රතු-සුදු ගිනිකෙළි කීපයකින් සෑහීමකට පත් වෙන්න සූදානම් වුණේ නැහැ. වෙරළ කිට්ටුව නොගැඹුරු මුහුදේ පහුරක් නැංගුරම් දැමූ එයාලා මිසයිල තරම් ලොකු රොකට්ටු එයට පැටෙව්වා. මේ සංදර්ශනය මීට කලින් දැක තිබුණු ඇනබෙත් කිවුවේ ඒ මල්වෙඩි අනුපිළිවෙලින් එක ළඟ පුපුරන නිසා ඒවා සජීවිකරණ රූපරාමු වගේ අහසේ පෙනේවි කියලයි. කලින් කියා තිබූ විදිහට නම් මේ සංදර්ශනයේ අවසානයට සූදානම්

කර තිබුණේ මුහුදට ඉහළ අහසේ මතුවෙන ස්පාර්ටන් රණශූරයෝ දෙන්නෙක් සටන් කරලා, ඉන්පසු පාට මිලියන ගාණකට පුපුරා යන ලෙසටයි.

ඇනබෙත් සහ මම සවාරී බ්ලැන්කෙට්ටුවක් බිම අතුරමින් ඉන්නකොට ග්‍රෝවර් එතැනට ආවේ අපිට සමු දෙන්නයි. එයා සුපුරුදු විදිහටම කලිසමක් සහ ටී-ෂර්ට් එකක් හැඳලා සපත්තු ජෝඩුවක් පැළඳගෙන හිටියා. ඒ වුණත්, ගතවුණු සති කීපය තුළදී ග්‍රෝවර් වැඩිමහලු පෙනුමක් ගෙන තිබුණා. දැන් එයාව පෙනුණේ උසස් පෙළ කොල්ලෙක් වගෙයි. එයාගේ එළු රැවුල ඝනවෙලා, එයාගේ බරත් වැඩිවෙලා තිබුණා. එයාගේ අං දෙක අඩු තරමේ අඟලක්වත් දිගු වී තිබුණු නිසා මිනිස්සු අතරේ ගැවසෙද්දී එයාට නිතරම තොප්පිය පළඳින්න සිදු වුණා.

"මම යනවා," එයා කිවුවා. "මං කියන්න ආවේ... හොඳයි, ඔයා දන්නවා නේ."

එයා වෙනුවෙන් සතුටු වෙන්න මම උත්සාහ කළා. කොහොම වුණත්, ශ්‍රේෂ්ඨ දෙවි - පෑන්ව සොයන්න යන්න සැටර්ලා හැමෝටම අවසර ලැබෙන්නේ නැහැ. ඒත්, එයාට සමුදීම ගොඩාක් අමාරු වුණා. මම ග්‍රෝවර්ව හඳුනාගෙන තවම ගතවී තිබුණේ අවුරුද්දක් පමණක් වුණත්, මට හිටපු පරණම යාළුවා එයයි.

ඇනබෙත් එයාව වැළඳ ගත්තා. බොරු කකුල් ගලවගන්න එපා කියලා එයා ග්‍රෝවර්ට කිවුවා.

එයා මුලින්ම සෙවීම පටන් ගන්නේ කොහෙන්ද කියලා මම ඇහුවා.

"ඒක පොඩි රහසක්," එයා කිවුවේ අපහසුවට පත්වෙලා වගෙයි. "ඔයාලාටත් මාත් එක්ක එන්න තිබුණා නම් කියලා මට හිතෙනවා. ඒත්, මිනිස්සු එක්ක පෑන්..."

"අපිට තේරෙනවා," ඇනබෙත් කිවුවා. "ඔයා ගමනට ඇති තරම් ටින් කෑන් ගත්තද?"

"ඔව්."

"එතකොට, ඔයාගේ බටනළා ටික මතක් කරලා ගත්තද?"

"අයියෝ... ඇනබෙත්," එයා නාහෙන් ඇඬුවා. "ඔයත් හරියට නාකි එළු අම්මෙක් වගෙයි නේ."

Scanned with CamScanner

ඒත්, එයාගේ හඬේ නම් තරහවක ලකුණක්වත් තිබුණේ නැහැ.

ගමින් මල්ලක් කරේ එල්ලා ගත් එයා සැරයටියක් අතට ගත්තා. එයාව පෙනුණේ කඳු නගින්නෙක් වගෙයි - යැන්සි ඉස්කෝලෙදී දාමරික කොල්ලන්ගෙන් මට ආරක්ෂා කරගන්න සිද්ධ වුණ පුංචි බටු කොල්ලාගේ ලකුණක්වත් එයාගෙන් පෙනුණේ නැහැ.

"හොඳයි," එයා කිවුවා, "මට සුබ පතන්නේ නැද්ද."

එයා තවත් වරක් ඇනබෙත්ව වැලඳ ගත්තා. මගේ උරහිසට තට්ටුවක් දැමූ එයා ඉන්පසු වැලි කඳු දෙසට පිටත් වුණා.

අපේ හිස්වලට ඉහළින් මල්වෙඩි පණ ගැසුවා: හේමියන් සිංහයාව මරන හර්කියුලිස්; වල් ඌරෙක් ලුහුබඳින ආර්ටෙමිස්; ඩෙලවෙයා තරණය කරන ජෝර්ජ් වොෂින්ග්ටන් (එයාත් ඇතීනාගේ පුතෙක්ලු.)

"හේයි, ග්‍රෝවර්," මම කතා කළා.

කැලය අද්දරට ගොස් සිටි එයා ආපසු හැරුණා.

"ඔයා කොහේ ගියත්, එහෙ එන්චිලඩා තියේවි කියලා මම හිතනවා."

ග්‍රෝවර් හිනාවුණා. ඊට පස්සේ එයා ගස් අතරින් ඈතට යන්න ගියා.

"අපිට ආයෙම එයාව මුණගැහේවි," ඇනබෙත් කිවුවා.

මමත් එහෙම හිතන්න උත්සාහ කළා. අවුරුදු දෙදහසකින් කිසිම සොයන්නෙක් ආපහු ඇවිත් නැහැ කියන කාරණාව... හොඳයි, ඒ ගැන නොහිතා ඉන්න මම තීරණය කළා. ආපහු එන මුල්ම කෙනා ග්‍රෝවර් වේවි. එයා වෙන්නම ඕනෑ.

ජූලි මාසය ගෙවී ගියා.

කොඩිය අල්ලන තරගය වෙනුවෙන් අලුත් උපක්‍රම සොයමින්, කොඩිය ඒරීස්ගේ අතට යාම වළක්වන්න අනෙක් කැබින් සමග මිත්‍ර ගිවිසුම් ඇති කරගනිමින් මම කාලය ගත කළා. ලෝදියවලට පුලුස්සා නොගෙන තාප්පයේ මුදුනටම නගින්න මට පළවෙනි වතාවට පුළුවන් වුණා.

ඉඳහිටක, මහ ගෙදර පසු කරගෙන යද්දී අට්ටාලයේ ජනේලය දිහා බැලූ මම ඔරකල් ගැන කල්පනා කළා. එයා කියූ අනාවැකිය සම්පූර්ණ වුණු බව මටම ඒත්තු ගන්වන්න මම උත්සාහ කළා.

බටහිර දෙසට ගොස්, වෙනතක හැරුණු දෙවියන්ට මුහුණ දීමට නුඹට සිදු වේවි.

කියපු විදිහටම මම බටහිරට ගියා, ද්‍රෝහී දෙවියා හේඩීස් නොවී ඒරීස් වුණත් මම එයාට මුහුණ දුන්නා.

සොරකම් කරන ලද දේ නුඹ විසින් සොයාගෙන, ආරක්ෂිතව නැවත ගෙනවිත් දේවි.

ඒකත් හරි. ප්‍රධාන අකුණ බාර දුන්නා. අඳුරේ හිස්වැසුම ආපහු හේඩීස්ගේ ඔළු ගෙඩියටම දැම්මා.

නුඹට යහළුවා යැයි අමතන අයෙකු නුඹට ද්‍රෝහී වේවි.

මේ පේළිය තවමත් මගේ හිතට වද දුන්නා. ඒරීස් මගේ යාළුවෙක් වගේ රඟපාලා, ඊට පස්සේ මට ද්‍රෝහී වුණා. ඔරකල් අදහස් කළේ ඒක වෙන්න ඕනෑ...

අවසානයේදී, වඩාත්ම වැදගත් දේ බේරා ගැනීමට නුඹ අපොහොසත් වේවි.

මම, මගේ අම්මාව බේරාගන්න අපොහොසත් වුණා. ඒත් එහෙම කළේ අම්මාට තනියම බේරෙන්න මම ඉඩ හැරිය නිසායි. ඒ වගේම, කළයුතු නිවැරදිම දේ එය බව මම දැන සිටි නිසායි.

එහෙනම්, මට තවමත් නොසන්සුන්කමක් දැනුණේ ඇයි?

ගිම්හාන වාරයේ අන්තිම රාත්‍රිය ඉක්මනින්ම උදා වුණා.

කඳවුරුකරුවෝ අන්තිම වතාවටත් එක්ව කෑම වේලක් ගත්තා. දෙවිවරු වෙනුවෙන් අපි, අපේ රෑ කෑමෙන් කොටසක් ගින්නට දැමුවා. ගිනිමැලය අසලදී ජ්‍යෙෂ්ඨ උපදේශකයෝ විසින් ගිම්හාන-වාර-අවසාන පබළු පිරිනැමීම සිදුකළා.

මට ලැබුණු ලෙදර් මාලයේ මගේ පළමු ගිම්හාන පබළුව අමුණා තිබෙනවා දකිද්දී රතු වුණ මගේ මූණ ගින්නේ එළියෙන් මුවා වීම ගැන මම සතුටු වුණා. එහි මෝස්තරය වුණේ තද කළු පසුබිමක් මැද මුහුදු කොළ පාටින් දිලිසෙන ත්‍රිශූලයකුයි.

"මේක ඒකමතිකව කරපු තෝරාගැනීමක්," ලූක් නිවේදනය කළා. "මේ පබළුවෙන් අපේ කඳවුරට පැමිණි සමුද්‍ර දෙවියන්ගේ පළමුවැනි පුතාවත්, යුද්ධයක් නැවැත්වීම සඳහා පාතාල ලෝකයේ අඳුරුම කොටසට යන්න ඔහු බාරගත් ගවේෂණයත් සිහිපත් කෙරෙනවා."

මුළු මහත් කඳවුරම නැගී සිට ප්‍රීති ඝෝෂා කළා. අඩු තරමේ, ග්‍රීස්ගේ කැබින් එකේ අය පවා නැගී සිටිනවා දකින්න ලැබුණා. ඇතීනාගේ කැබින් එකේ අය ඇනබෙත්ව ඉදිරියට තල්ලු කළේ ප්‍රශංසාව එයාටත් බෙදාගත හැකිවන ලෙසයි.

ඒ මොහොතේ මට දැනුණු සතුට සහ දුක මුසු හැඟීම ඊට කලින් කවදාවත් මම අත්විඳ තිබුණද කියලා මට නම් විශ්වාසයක් නැහැ. අන්තිමේදී, මං ගැන සොයා බලන, මම වැදගත් දෙයක් කළ බව සිතන පවුලක් මට ලැබී තිබුණා. ඒත්, උදේ වෙද්දී එයින් වැඩි දෙනෙක් අවුරුද්දේ ඉතිරි වැඩවලට කඳවුරෙන් පිටවෙලා යාවි.

ඊළඟ උදෑසන මගේ ඇඳ අසල මේසය උඩ තිබිලා මම ලියුමක් හොයාගත්තා.

එය පුරවන්න ඇත්තේ ඩයනයිසියස් කියලා මට සහතික වුණා. මොකද, එයා හැර වෙන කවුරුත් උවමනාවෙන්ම මගේ නම වැරැද්දුවේ නැහැ:

දයාබර පීටර් ජොන්සන්,

අර්ධ-ලෝහිත කඳවුරේ මුළු වර්ෂයම ගත කිරීමට ඔබ අදහස් කර ඇත්නම්, ඒ බව අද මධ්‍යාහ්නයට පෙර මහ ගෙදරට දැනුම් දිය යුතු වේ. ඔබේ අදහස පිළිබඳව අපව දැනුවත් නොකරන්නේ නම් ඔබ කැබින් කාමරයෙන් ඉවත් වී ගොස් ඇති බව හෝ දරුණු මරණයකට ගොදුරු වී ඇති බව අපි උපකල්පනය කරන්නෙමු. පිරිසිදු කිරීම සඳහා යොදවා ඇති හාර්පිලා ඉර බසින වේලාව වන විට රාජකාරි ආරම්භ කිරීමට නියමිත අතර ලියාපදිංචි වී නොමැති ඕනෑම කඳවුරුකරුවෙකු ආහාරයට ගැනීමට ඔවුන්ට අවසර දී ඇත. කඳවුරේ හැරදමා යන සියලුම පුද්ගලික භාණ්ඩ ලෝදිය වළට දමා පුළුස්සා දමනු ඇත.

සුබ දවසක් වේවා!

මිස්ටර් ඩී (ඩයනයිසියස්)

කඳවුරු අධ්‍යක්ෂක

ඔලිම්පියානු මන්ත්‍රණ සභාව, අංක 12

ඒ.ඩී.එච්.ඩී. නිසා සිද්ධ වුණ තවත් දෙයක් තිබුණා. යම් දෙයක් කරන්න නියමිත අන්තිම දවස වෙනතුරුම කාලය ගත වෙනවා මට දැනෙන්නේ නැහැ. ගිම්හානය අවසන් වෙලා තිබුණත් මම තවමත් මගේ තීරණය ගැන අම්මාටවත්, කඳවුරටවත් දන්වා තිබුණේ නැහැ. දැන්, ඒ තීරණය ගන්න මට ඉතිරි වෙලා තිබුණේ පැය කීපයක් විතරයි.

හරි නම්, ඒ තීරණය පහසු එකක් වෙන්න ඕනෑ. මම කියන්නේ, මාස නමයක් පුරාවට වීරයෙක් වෙන්න පුහුණු වෙනවද නැත්නම් මාස නමයක් පුරාවට පන්ති කාමරේක වාඩිවෙලා ඉන්නවද - හහ්.

ඒත්, එතැනදී මට අම්මා ගැනත් සලකා බලන්න වුණා. පළවෙනි වතාවට ගේබ් නැතිව මුළු අවුරුද්දක්ම මට, මගේ අම්මා එක්ක ජීවත් වෙන්න ඉඩ ලැබෙනවා. අපේ ගෙදර ඉඳන්, විවේක වෙලාවට නගරය පුරා රවුම් ගහන්න මට අවස්ථාව ලැබෙනවා. කාලයකට කලින්, අපේ ගවේෂණය අතරතුරේදී ඇනබෙත් කියූ දෙයක් මගේ මතකයට ආවා: ඇත්තටම රාක්ෂයෝ ඉන්නේ පිටත ලෝකයේ. එහෙදී තමයි ඔයාට ඇත්තටම දක්ෂකමක් තියෙනවාද, නැද්ද කියලා දැනගන්න ලැබෙන්නේ.

සියුස්ගේ දුව, තාලියාට අත්වූ ඉරණම ගැන මම කල්පනා කළා. මමත් අර්ධ-ලෝහිත කන්දෙන් පිට වුණෝතින් රාක්ෂයෝ කී දෙනෙක් මාව මරන්න ඒවිද කියලා මම පුදුම වුණා. කයිරොන්ගේ හෝ මගේ යාළුවන්ගේ කිසිම උදව්වක් නැතිව මම මුළු අවුරුද්දක්ම එකම තැනක හිටියොත් ඊළඟ ගිම්හාන සෘතුව වෙනතුරු පණ බේරාගෙන ඉන්නවත් මට පුළුවන් වේවිද? ඒකත්, අක්ෂර වින්‍යාස විභාගවලිනුයි, මල්ලව වාක්‍ය රචනාවලිනුයි මාව නොමැරී බේරුණොත් විතරයි. මල්ලව භූමියට ගිහින් කඩු හරඹ පුහුණුවීම් ටිකක් කළා නම් හොඳයි කියලා මට හිතුණා. සමහරවිට, ඒකෙන්වත් මගේ ඔළුව නිරවුල් කරගන්න පුළුවන් වේවි.

අගෝස්තු මාසයේ උණුසුමෙන් මිරිඟු නළියන කඳවුරු භූමිය බොහෝ දුරට හිස් වෙලා. සෑම කඳවුරුකරුවෙක්ම, එයාලාගේ කැබින්වල බඩු අසුරමින් හෝ අන්තිම පරීක්ෂාවට සූදානම් වීම සඳහා කොසු, ඉදල් රැගෙන එහෙ මෙහෙ දුවමින් සිටියා. ඇෆ්‍රොඩයිට් ළමයි කීප දෙනෙකුට, එයාලාගේ තඩි සූට්කේස් සහ රූපලාවන්‍ය බඩු පෙට්ටි

කන්ද මුදුනට ඔසවාගෙන යෑමට ආර්ගස් උදවු කරමින් සිටියා. කඳවුරේ ළමයින්ව ගුවන් තොටුපොළට ගෙන යාමට සූදානමින් බසය තිබුණේ එතැනයි.

යන එක ගැන දන්නමම හිතන්න එපා, මම, මටම කියාගත්තා. පුහුණුවීම් විතරක් කරන්න.

කඩු සරඹ අංගනයට ගිය මට දකින්න ලැබුණේ ලූක්ටත් මගේ අදහසම පහළ වී ඇති බවයි. එයාගේ ක්‍රීඩා බඩු මල්ල පැත්තක දමා තිබුණා. තනිවම පුහුණුවීම් කරමින් සිටි එයා පඹයන්ට පහරදීමට පාවිච්චි කළ කඩුව මම මීට කලින් කවදාවත් දකලා තිබුණේ නැහැ. එය සාමාන්‍ය වානේවලින් සෑදූ කඩුවක් විය යුතු වුණේ එයින් එයා පඹයන්ගේ හිස් මුලින්ම කපා දමමින්, පිදුරු පිරවූ කඳන්වලට අනිමින් සිටි නිසායි. එයාගේ තැඹිලි පාට උපදේශක ටී-ෂර්ට් එක දහඩියෙන් පෙඟිලා. එයාගේ මුහුණෙන් පළ වූ ඉරියවු තදබල වෙලා තිබුණේ එයාගේ ජීවිතය ලොකු අනතුරක වැටිලා වගෙයි. එයා එක පෙළට තැබූ පඹයෝ පේළියකගේම බඩවැල් එළියට ගනිමින්, අත්-පා කපා දමමින් ඒවා පිදුරු ගොඩවල්වලට හැරවූ දෙස මම බලා සිටියේ වශී වෙලයි.

ඒවා පඹයින් විතරක් වුණත් ලූක්ගේ හැකියාව ගැන බය මුසු ගරුත්වයක් මගේ හිතේ ඇතිවෙන්න එය ප්‍රමාණවත් වුණා. මේ කොල්ලා විශ්වාස කරන්නත් බැරි තරම් දක්ෂ සටන්කරුවෙක්. ඒ වුණත් එයාට, එයාගේ ගවේෂණය සම්පූර්ණ කරගන්න බැරි වුණේ කොහොමද කියලා මම තවත් වතාවක් පුදුමයෙන් කල්පනා කළා.

අන්තිමේදී, මාව දකපු එයා කඩු පහරක් අතරමැද නතර කළා. "පර්සි."

"ම..ම, සමා වෙන්න," මම කිවුවේ තරමක අපහසුවක් දනෙද්දියි. "මම නිකං -"

"ඒකට කමක් නෑ," කඩුව පහත දමමින් එයා කිවුවා. "අන්තිම වෙලාවේ පොඩි පුහුණුවීමක් කරන්න හිතුණා."

"අර පඹයෝ ටික නම් ආයේ කාටවත්ම කරදර කරන්නේ නැතිවෙයි."

ලූක් උරහිස් ඇකිළුවා, "හැම ගිම්හානයකම අපි අලුත් ඒවා හදනවා."

දන්, එයාගේ කඩුව හොසෙල්වී තිබුණු නිසා එහි මොකක්දෝ අමුත්තක් මට පෙනුණා. වර්ග දෙකක ලෝහවලින් එහි තලය සාදා තිබුණා - එක් දාරයක් ලෝකඩ, අනෙක වානේ.

මම ඒ දෙස බලා ඉන්නවා ලූක් දක්කා. "ඔහ්, මේකද? අලුත් භාණ්ඩයක්. මේක තමයි බැක්බයිටර් (කේලාම්කාරයා)."

"බැක්බයිටර්?"

ලූක් එය එළිය දෙසට හරවද්දී එය දූෂ්ට ලෙස දිස්නය දුන්නා. "එක පැත්තක් දිව්‍යමය ලෝකඩ. අනෙක් පැත්ත පදම් කරපු වානේ. මේක මනුෂ්‍ය, අමනුෂ්‍ය දෙගොල්ලන්ටම වැඩ කරනවා."

මගේ ගවේෂණය පටන් ගනිද්දී කයිරොන් කියූ දෙයක් මට මතක් වුණා - තදබල උවමනාවකදී හැර වෙන කිසිම අවස්ථාවකදී වීරයෙක් සාමාන්‍ය මිනිස්සුන්ට හානියක් නොකළ යුතුයි.

"එයාලාට ඒ ජාතියේ ආයුධ හදන්න පුළුවන් කියලා මම දැනගෙන හිටියේ නැනේ."

"මං හිතන්නේ එයාලාට බැරුව ඇති," ලූක් මගේ කතාවට එකඟ වුණා. "මේ ජාතියේ එකයි තියෙන්නේ."

මට පුංචි හිනාවක් පෑව එයා කඩුව කොපුවට දමාගත්තා. "අහන්න, මම ඔයාව හොයාගෙන යන්න තමයි හිටියේ. අපි අන්තිම පාරටත් කැලේ පැත්තට ගිහිල්ලා සටන් කරන්න මොකෙක් හරි හොයාගමුද?"

මම පැකිළුණේ ඇයි කියලා මටම හිතාගන්න බැහැ. හරි නම්, ලූක් ඒ තරම් මිත්‍රශීලී වීම ගැන මගේ හිතට සහනයක් දැනෙන්නයි ඕනෑ. මම ගවේෂණයට ගිහින් ආව දවසේ ඉඳන් එයා හිටියේ ටිකක් ඈත් වෙලයි. මට ලැබුණු ගරු-සැලකිලි නිසා එයා මාත් එක්ක අමනාප වෙලාවත්ද කියලා මම බයෙනුයි හිටියේ.

"ඔයා හිතන්නේ එහෙම හොඳයි කියලද?" මම ඇහුවා. "මං කිවුවේ-"

"අයියෝ... මෙහෙ එනවා," ක්‍රීඩා බඩු මල්ල ඇවිස්සූ එයා කෝක් කෑන් හයේ ඇසුරුමක් පිටතට ගත්තා. "මගේ ළඟ බීමත් තියෙනවා."

මම කෝක් කෑන් දෙස බලා සිටියේ මොන ලෝකෙන් එයාට ඒවා ලැබුණද හිතලා පුදුමයෙනුයි. කඳවුරු ගබඩාවේ සාමාන්‍ය මනුෂ්‍ය සෝඩා වර්ග කිසිවක් තිබුණේ නැහැ. සමහරවිට, සැටර් කෙනෙක් ලවා ගෙන්වා ගත්තොත් මිසක් ඒවා හොරෙන් ගෙන්වා ගන්න ක්‍රමයක් තිබුණෙත් නැහැ.

ඇත්ත වශයෙන්ම, රෑ කෑම වෙලාවට මායා බලයෙන් අපේ වීදුරුවලට අපි කැමති ඕනෑම බීමක් පිරෙනවා තමයි. ඒත්, කෑන් එකකින් බොනකොට දැනෙන රස ඒවාගෙන් දැනුණේ නැහැ.

පැණි රස සහ කැෆේන්. මගේ අධිෂ්ඨාන ශක්තිය කුඩුවෙලා ගියා.

"නියමයි," මම තීරණය කළා. "මොකද නැත්තේ?"

කැලයට වැදුණු අපි සටන් කරන්න රාක්ෂයෙක් හොයමින් පදුරු පීරුවා. ඒත් එහි වූ රස්නයේ හැටියට මොළේ කලදක් හරි තියෙන ඕනෑම රාක්ෂයෙක් සීතල, සනීප ගුහාවක් ඇතුළට වෙලා නිදාගෙනයි ඉන්න ඇත්තේ.

මගේ පළවෙනි කෝඩිය අල්ලන තරගයේදී මම ක්ලැරිස්ගේ හෙල්ලය කැඩුව දිය පහර කිට්ටුව වූ සෙවණ ඇති තැනක් අපි හොයාගත්තා. අපි දෙන්නා ලොකු ගලක් උඩ වාඩි වෙලා, කෝක් බොමින්, ගස් අතරින් පෙරී ආ ඉර එළිය දෙස බලා සිටියා. සෑහෙන වෙලාවකට පස්සේ ලූක් කතා කළා,"ගවේෂණයක යන්න නැතුව ඔයාට පාළුයිද?"

"අඩි තුනෙන් තුනට මරන්න එන රාක්ෂයෝ එක්ක? ඔයා විහිළු කරනවද?"

ලූක් ඇහිබැමක් එසෙව්වා.

"ඔව්, මට පාළුයි වගේ," මම පිළිගත්තා. "ඔයාට?"

එයාගේ මුහුණ හරහා හෙවණැල්ලක් පාවී ගියා.

ලූක්ගේ කඩවසම් පෙනුම ගැන ගැහැනු ළමයි කතා වෙනවා මම ඕනෑ තරම් අහලා තිබුණා. ඒත්, ඒ මොහොතේ එයාගේ මුහුණේ වෙහෙසට පත්වූ, තරහවෙන් පිරුණු පෙනුමක් මිසක් කිසිම කඩවසම් පෙනුමක් තිබුණේ නැහැ. එයාගේ වැලි පාට කොණ්ඩය ඉර එළියෙන් අළු පාටට හැරී පෙනුණා. එයාගේ මුහුණේ වූ තුවාල කැළැල වෙනදාටත්

වඩා ගැඹුරු පෙනුමක් ගත්තා. එයාව වයසක කෙනෙක් ලෙසට හිතේ මවාගන්න මට අපහසු වුණේ නැහැ.

"මගේ වයස අවුරුදු දාහතරේ ඉඳලම මම අර්ධ-ලෝහිත කන්දේ අවුරුද්ද පුරාම ජීවත් වුණා," එයා මට කිවුවා.

"තාලියාව... හොඳයි, ඔයා දන්නවනේ. මම දිගටම පුහුණුවීම් කළා, කළා, කළා. මට එළියේ තියෙන ඇත්ත ලෝකේ සාමාන්‍ය ළමයෙක් වෙන්න කවදාවත් ඉඩක් ලැබුණේ නැහැ. ඊට පස්සේ, එයාලා මාව ගවේෂණයකට තල්ලු කළා. මම ආපහු ආවම, ඒක හරියට, 'හොඳයි, සවාරිය ඉවරයි. සන්තෝසෙන් ජීවත් වෙන්න' කිවුවා වගෙයි."

එයා අතේ තිබුණු කෝක් කෑන් එක පොඩි කරලා දිය පාරට විසි කළේ මාව කම්පනයට පත් කරමින්. අර්ධ-ලෝහිත කන්දේදී ඔයාට මුලින්ම ඉගෙන ගන්න ලැබෙන දෙයක් තමයිඃ තැන තැන කුණු විසි කරන්න එපා. එහෙම කළොත් ඔයාට ජල දෙවඟනන්ගෙන් සහ වන දෙවඟනන්ගෙන් දොස් අහන්නත්, එයාලා ඔයාට එකට-එක කරද්දී ඒවා විඳගන්නත් වෙනවා. රෑට ඔයා නිදාගන්න ඇඳට නගිද්දී ඔයාගේ ඇඳ ඇතිරිලි ඇතුළේ පත්තෑයෝ සහ මඩ පිරිලා තියෙනවා ඔයාට සොයා ගන්න ලැබේවි.

"ලෝරල් මල් ඔටුනු එක්ක කරන විකාරේ," ලූක් කිවුවා. "මහ ගෙදර අට්ටාලේ දූවිලි වැදි වැදී තියෙන සිහිවටනයක් විදිහට ඉවර වෙන්න මම ලෑස්ති නැහැ."

"ඔයා කතා කරන්නේ හරියට ඔයා මෙහෙන් යන්නම යනවා වගෙයිනේ."

ලූක් මට පැටලිලි සහගත හිනාවක් පෑවා. "ඔහ්, මම යනවා තමයි, පර්සි. මම ඔයාව මෙතැනට එක්කගෙන ආවේ සමු දෙන්න."

එයා අසුරක් ගැසුවා. ඒත් එක්කම, මගේ පාමුල ඇවිළුණු පුංචි ගින්නකින් පොළොවේ වළක් පිච්චුණා. මගේ අතක් විතර ලොකු, කළු පාටින් දිලිසෙන සතෙක් එයින් එළියට බඩගෑවා. ගෝනුස්සෙක්.

මම, මගේ පෑන ගන්න සූදානම් වුණා.

"මම නම් එහෙම කරන්නේ නැහැ," ලූක් අනතුරු ඇඟෙව්වා. "වළ ගෝනුස්සන්ට අඩි පහළොවක් විතර දුර පනින්න පුළුවන්. උගේ තුඩට ඔයාගේ ඇඳුම් පසාරු කරන්න පුළුවන්. තත්පර හැටක් යද්දී ඔයා මැරිලා ඉඳීවි."

"ලූක්, මොනවද -"

එතකොටම, මට ඒක තේරුම් ගියා.

නුඹට යහළුවා යැයි අමතන අයෙකු නුඹට ද්‍රෝහී වේවි.

"ඔයා," මම කිව්වා.

සන්සුන්ව නැගිටපු එයා කලිසමේ දූවිලි පිස දැමුවා.

ගෝනුස්සා එයා ගැන කිසිම අවධානයක් දක්වූයේ නැහැ. උගේ කළු පාට ඇස් මගේ දෙසටම යොමු කරගෙන, මගේ සපත්තුව උඩට ඒ සතා බඩගෑවේ උගේ අඬු එකට වද්දමිනුයි.

"එළියේ තියෙන ලෝකෙදි මම ගොඩාක් දේවල් දැක්කා, පර්සි," ලූක් කිව්වා. "අඳුර රැස්වෙන හැටි, රාක්ෂයෝ ටිකෙන් ටික ශක්තිමත් වෙන හැටි ඔයාට දැනුණේ නැද්ද? මේ හැමදෙයක්ම කොච්චර කමකට නැති දේවල්ද කියලා ඔයා තේරුම් ගත්තේ නැද්ද? වීරයෝ හැමෝම දෙවිවරුන්ගේ ඉත්තෝ වෙලා. හරි නම්, මීට අවුරුදු දහස් ගාණකට කලින්ම එයාලා පරාද වෙන්න තිබුණා, ඒත් අර්ධ-ලෝහිතයන්ට ස්තුති වෙන්න එයාලා තවමත් එල්ලිලා ඉන්නවා."

මෙය සිදුවෙමින් පැවතුන බව මට විශ්වාස කරන්නත් බැරිවුණා.

"ලූක්... ඔයා කතා කරන්නේ අපේ දෙමව්පියෝ ගැන," මම කිව්වා.

එයා මහ හඬින් හිනාවුණා. "ඒක කිව්වේ මගේ හිතේ එයාලා ගැන ආදරයක් ඇති කරවන්නද? එයාලාගේ අනර්ඝ 'බටහිර ශිෂ්ටාචාරය' විෂබීජයක්, පර්සි. ඒක ලෝකයම විනාශ කරනවා. ඒක නතර කරන්න පුළුවන් එකම ක්‍රමය ඒක සම්පූර්ණයෙන්ම පුච්චලා පොළොවටම අළු කරලා, මීට වඩා සත්‍යවාදී දෙයක් අලුතින් පටන් ගන්න එකයි."

"ඔයත් ඒරීස් වගේම පිස්සෙක්."

එයාගේ ඇස් තරහින් දැල්වුණා. "ඒරීස් කියන්නේ මෝඩයෙක්. එයා සේවය කරමින් හිටිය සැබෑ ස්වාමියා කවුද කියලා එයා කවදාවත් තේරුම් ගත්තේ නැහැ. මට වෙලාව තිබුණා නම්, පර්සි, තව පැහැදිලි කරන්න තිබ්බා. ඒත්, මට බය, එච්චර වෙලාවක් ඔයා ජීවත් වෙන්නේ නැතිවෙයි."

ගෝනුස්සා මගේ කලිසම් කකුලක් උඩට බඩගෑවා.

මෙයින් ගැලවෙන්න ක්‍රමයක් තියෙන්නම ඕනැ. ඒ ගැන හිතන්න මට කාලය උවමනා වුණා.

"ක්‍රෝනොස්," මම කිව්වා. "එයාට තමයි ඔයා සේවය කරන්නේ."

හදිසියේම, වාතය සීතල වුණා.

"නම් කියද්දි ඔයා ඔයිට වඩා ප්‍රවේසම් වුණොත් හොඳයි," ලූක් අවවාද කළා.

"ප්‍රධාන අකුණයි, හිස්වැසුමයි හොරකම් කරන්න ක්‍රෝනොස් ඔයාව පාවිච්චි කළා. එයා හීනවලින් ඔයාට කතා කළා."

ලූක්ගේ ඇසක් තදින් ගැහුණා. "එයා ඔයාටත් කතා කළා, පර්සි. ඔයාට ඒවා අහන්න තිබුණා."

"එයා ඔයාගේ මොළේ හෝදනවා, ලූක්."

"ඔයා වැරදියි. මගේ දක්ෂකම් නාස්ති වෙනවා කියලා එයා මට පෙන්නුවා. මීට අවුරුදු දෙකකට කලින් මට ලැබුණ ගවේෂණය මොකක්ද කියලා ඔයා දන්නවද, පර්සි. මම හෙස්පෙරිඩීස්ගේ උයනෙන් රත්තරන් ඇපල් ගෙඩියක් හොරකම් කරලා, ඒක ඔලිම්පස්වලට ගේනවා දකින්න මගේ තාත්තා, හර්මීස්ට ඕනැ වුණා. මම කරපු පුහුණුවීම් ඔක්කොටම පස්සෙත් එයාට හිතාගන්න පුළුවන් වුණ හොඳම දේ තමයි ඒක."

"ඒක නම් ලේසි ගවේෂණයක් නෙවෙයි," මම කිව්වා. ''හර්කියුලිස් ඒක කළා."

"අන්න හරි," ලූක් කිව්වා. "කෙනෙක් කරපු දෙයක් ආපහු කිරීමේ තියෙන වටිනාකම මොකක්ද? දෙවිවරු හැමෝම දන්නේ එයාලගේ අතීතේ නැවත විකාශය කරන්න විතරයි. මගේ හිතේ ඒකට කැමැත්තක් තිබ්බේ නෑ. උයනේ හිටිය මකරා තමයි මට මේක ඊට දුන්නේ-" එයා කේන්තියෙන් මුහුණේ තුවාල කැළැල පෙන්වූවා - "ඊට පස්සේ මම ආපහු ආවාම, මට ලැබුණ එකම දේ අනුකම්පාව විතරයි. ඔලිම්පස් ගලෙන් ගලට ගලවලා විනාශ කරන්න මට ඒ වෙලාවෙම උවමනා වුණා. ඒත් මම, මගේ වෙලාව එනකල් ඉවසගෙන හිටියා. ඊට පස්සේ මම ක්‍රෝනොස්ව හීනෙන් දකින්න පටන්ගත්තා. මොකක් හරි ප්‍රයෝජනවත් දෙයක් - මීට කලින් කිසිම වීරයෙක් අත තියන්න

Scanned with CamScanner

වඩිනර නොවුණ දෙයක් හොරකම් කරන්න එයා මට ඒත්තු ගැන්වුවා. අපි දක්ෂිණායන චාරිකාව ගියාම, අනිත් කඳවුරුකාරයෝ නිදාගෙන ඉන්න අතරේ, මම සිංහාසන ශාලාවට රිංගලා සියුස්ගේ ප්‍රධාන අකුණ එයාගේ සිංහාසනය ළඟින්ම අරගත්තා. හේඩීස්ගේ අඳුරේ හිස්වැසුමත් ගත්තා. ඒක කොච්චර ලේසි වුණාද කියලා ඔයා විශ්වාස කරන්නෙත් නැති වෙයි. ඔලිම්පියානුවෝ හරිම උද්දච්චයි; එයාලාගේ දෙයක් කවුරුහරි හොරකම් කරයි කියලා එයාලා හීනෙන්වත් හිතන්න නැතුව ඇති. එයාලාගේ ආරක්ෂක අංශයත් කිසිම වැඩකට නැහැ. අහස ගොරවන්න පටන් ගනිද්දී මම නිව් ජර්සිවලට බාගයක් දුර ඇවිල්ලත් ඉවරයි. එයාලා මගේ හොරකම ගැන හොයාගෙන කියලා එනකොට මම දැනගත්තා."

දැන්, මගේ දණහිස උඩ වාඩි වී සිටි ගෝනුස්සා, ඌගේ දිලිසෙන ඇස්වලින් මගේ දිහා බලාගෙන හිටියා. මම, මගේ කටහඬ පාලනය කරගන්න උත්සාහ කළා. "ඉතින්, ඇයි ඔයා ඒ බඩු ක්‍රෝනොස් ළඟට අරන් නොගියේ?"

ලූක්ගේ හිනාව වියැකුණා. "මම... මම ඕනෑවටත් වඩා මං ගැන විශ්වාස කළා. හොරකම් කරපු අකුණ හොයන්න සියුස්, එයාගේ දුවලා පුතාලාව පිටත් කළා - ආර්ටෙමිස්, ඇපලෝ, මගේ තාත්තා හර්මීස්. ඒ වුණාට, මාව අල්ලගන්න පුළුවන් වුණේ ඒරිස්ට. මට එයාව පරද්දන්න තිබුණා, ඒත් මම සැලකිලිමත් වුණා මදි. මාව නිරායුධ කරපු එයා බල සංකේත දෙක අරගෙන, ඒවා ඔලිම්පස්වලට අරන් ගිහින්, මාව පණපිටින් පුච්චනවා කියලා තර්ජනය කළා. ඒ වෙලාවේ, මට ඇහෙන්න ගත්ත ක්‍රෝනොස්ගේ කටහඬ ඒරිස්ට කියන්න ඕනෑ දේවල් මට කියලා දුන්නා. දෙවිවරු අතරේ ඇතිවෙන මහා යුද්ධය ගැන අදහස මම එයාගේ ඔළුවට දැම්මා. එයාට කරන්න තියෙන්නේ බඩු දෙක හංගලා, අනිත් අය යුද්ධ කරනවා බලාගෙන ඉන්න විතරයි කියලා මම එයාට කිවුවා. ඒරිස්ගේ ඇස් දෙක තපුරු විදිහට දිලිසෙන්න ගනිද්දී එයා මගේ ඇම ගිල්ලා කියලා මම දැනගත්තා. එයා මට යන්න දුන්නා. කාටවත් මගේ අඩුව දැනෙන්න කලින් මම ආපහු ඔලිම්පස්වලට ගියා."

ලූක්, එයාගේ අලුත් කඩුව පිටතට ගත්තා. එහි පැතලි තලය එයා මහපටැඟිල්ලෙන් පිරිමැද්දේ එහි ලස්සනට එයා වශීවෙලා වගෙයි. "ඊට පස්සේ, ටයිටන් රජතුමා... එ-එයා මට තපුරු හීනවලින් දඬුවම් කළා. ආයේ කවදාවත්ම වරද්දාගන්නේ නැහැ කියලා මම දිවුරුවා. ආපහු අර්ධ-ලෝහිත කඳවුරට ආවට පස්සේ, එයා මට හීනෙන් කිවුවා,

නවක වීරයෙක් එනවා කියලා. ඒරිස්ගෙන් අකුණයි, හිස්වැසුමයි අරගෙන, ටාටරස්වලට අරගෙන එන්න එයාව උපායකින් රවට්ටන්න පුළුවන් වෙයි කියලත් කිවුවා."

"එදා රෑ, කැලේදී යම බල්ලාව කැඳෙවුවෙත් ඔයාම නමයි."

"කඳවුර ඔයාට ආරක්ෂිත තැනක් නෙවෙයි කියලා කයිරොන්ට හිතන්න සලස්වන්න අපිට ඕනෑ වුණා. එයා ඔයාව ගවේෂණයකට පිටත් කරන්නේ එතකොට විතරයි. හේඩීස් ඔයාගේ පස්සෙන් එයවා කියලා එයාගේ හිතේ තිබුණ බිය තහවුරු කරන්න අපිට සිද්ධ වුණා. හිතුව විදිහටම ඒක වැඩ කළා."

"අර පියාඹන සපත්තු ශාප කරපුවා," මම කිවුවා. "ඒවා තිබුණේ මාවයි, ගමන් මල්ලයි ටාටරස්වලට ඇදගෙන යන්න."

"ඒවා ඔයා දාගෙන හිටියා නම් එහෙම වෙන්න තිබුණා. ඒත් අපි නොහිතපු විදිහට ඔයා ඒවා සැටර්ට දීලා. ග්‍රෝවර් කියන්නේ අත ගහන හැම දෙයක්ම අවුල් කරන කෙනෙක්. එයා ශාපය පවා අවුල් කළා."

දැන්, මගේ කලවය උඩට ඇවිත් සිටි ගෝනුස්සා දෙස ලූක් බැලුවා. "ඔයාට තිබුණේ ටාටරස්වලදී මැරෙන්න, පර්සි. ඒත්, කරදර වෙන්න එපා. හැමදේම හරිගස්සන්න මගේ පුංචි යාළුවාව ඔයා එක්ක තියලා යන්නම්කෝ."

"ඔයාව බේරගන්න තාලියා, එයාගේ ජීවිතේ කැප කළා," මම කිවුවේ දත්මිටි කමින්. "ඔයා මෙහෙමද එයාට කළගුණ සලකන්නේ?"

"තාලියා ගැන කතා කරන්න එපා!" එයා කෑගැසුවා. "දෙවිගොල්ලෝ එයාට මැරෙන්න ඇරියා! ඒකටත් එයාලාට වන්දි ගෙවන්න වෙයි."

"ඔයාව අතකොලුවක් වෙලා, ලූක්. ඔයායි, ඒරිස්යි දෙන්නාවම. ක්‍රෝනොස් කියන දේවල් අහන්න එපා."

"මාව අතකොලුවක් වෙලා?" ලූක්ගේ කටහඬ කර්කශ වුණා. "ඔයා දිහා බලනවා. ඔයාගේ තාත්තා ඔයා වෙනුවෙන් මොනවද කරලා තියෙන්නේ? ක්‍රෝනොස් නැගිටීවි. ඔයා එයාගේ සැලසුම පරක්කු කළා විතරයි. එයා ඔලිම්පියානුවන්ව ටාටරස්වලට විසි කරලා, මනුෂ්‍ය වර්ගයාව ආපහු ගල් ගුහාවලට එළවයි. එයාට සේවය කරන - ශක්තිමත්ම අය ඇර අනිත් හැම කෙනෙක්වම."

"මේ සතාව අහකට ගන්නවා," මම කිවුවා. "ඔය කියන තරම් ඔයා ශක්තිවන්තයෙක් නම්, ඔයාම මාත් එක්ක සටනට එනවා."

ලූක් හිනාවුණා. "හොඳ උත්සාහයක්, පර්සි. හැබැයි, මම ඒරිස් නෙවෙයි. මාව ඒ ඇමට අල්ලගන්න ඔයාට බැහැ. මගේ ස්වාමියා බලාගෙන ඉන්නවා. ඒ වගේම, මට පවරන්න ඇති තරම් ගවේෂණ එයා ළග තියෙනවා."

"ලූක් -"

"සුබ පැතුම්, පර්සි. අලුත් ස්වර්ණ යුගයක් ඉස්සරහට එනවා. ඒත්, ඔයා ඒකේ කොටස්කාරයෙක් වෙන්නේ නෑ."

අඩ තවයක හැඩකට කඩුව කරකැවූ එයා කළුවර රැල්ලක් තුළට අතුරුදන් වුණා.

ගෝනුස්සා ඉදිරියට පැන්නා.

උංව ඈතට විසිවන ලෙස අතින් පහරක් ගැසූ මම, මගේ කඩුව පිටතට ගත්තා. ඒ සතා නැවතත් මගේ දෙසට පනිද්දී, උඩු ගුවනේදීම මම උංව දෙපළු කළා.

මම, මං ගැනම සතුටු වුණත්, ඒ සතුට රැඳුණේ මගේ අත දිහා බලන තුරු විතරයි. දුම් දමමින්, කහ පාට සැරව ගලන ලොකු, රතු පාට කැළැලකින් මගේ අත්ල වැහිලා තිබුණා. කොහොම හරි, ඒ සතා මට දෂ්ට කරලා.

මගේ කන් ඇතුළේ පිටි කොටනවා වගේ දැනුණා. මගේ ඇස්වල මීදුම බැඳිලා වගෙයි. වතුර, මම හිතුවා. මීට කලිනුත් වතුර මාව සනීප කළා.

වතුර පහරට වැටුණු මම, මගේ අත්ල ගිල්වූවත් වෙනසක් සිදුවන බවක් පෙනුණේ නැහැ. ගෝනුසු විෂ ඊට වඩා ප්‍රබල වුණා. මගේ පෙනීම ටිකෙන් ටික අඳුරු වෙමින් තිබුණා. මම අමාරුවෙන් නැගිට්ටා.

තත්පර හැටයි, ලූක් කිවුවේ එහෙමයි.

මම කොහොම හරි ආපසු කඳවුරට යා යුතුව තිබුණා. මම මෙතැනම ඇද වැටුණොත්, මගේ සිරුර රාක්ෂයින්ගේ රෑ කෑම වේවි. එතකොට, සිද්ධ වුණු දේ කාටවත්, කවදාවත්ම දැනගන්න නොලැබේවි.

මට දැනුණේ මගේ කකුල්වල ඊයම් බරු එල්ලලා වගෙයි. මගේ නළල ගිනි ගත්තා. මම පැකිළෙමින් කඳවුර දෙසට ඇදෙද්දී වන දෙවඟනන්, එයාලාගේ ගස්වලින් මැත් වුණා.

"උදව්," මම කෙඳිරුවා. "කරුණාකරලා..."

එයාලා දෙන්නෙක් මගේ දැතින් අල්ලාගෙන මාව ඉදිරියට ඇදගෙන යන්න ගත්තා. මම එළි පෙහෙළි කළ පෙදෙසට ඇතුළු වෙනවාත්, උපදේශකයෙක් උදවු ඉල්ලා කෑගසනවාත්, නරාශ්වයෙක් හක් ගෙඩියක් පිඹිනවාත් මගේ මතකයේ අන්තිමට සටහන් වුණා.

ඊට පස්සේ, හැමදේම අඳුරු වුණා.

මම අවදි වුණේ බිම බටයකුත් කටේ රඳවාගෙනයි. මම බොමින් සිටියේ චොකලට්-චිප් විස්කෝතු රස බීමක් - නෙක්ටාර්.

මම ඇස් ඇරියා.

මම සිටියේ මහ ගෙදර අසනීප කාමරයේ ඇඳක් මතයි.

මගේ දකුණු අත කොටයක් තරමට වෙලා තිබුණා. ආර්ගස් කොණකට වී මුර කරමින් සිටියා. මගේ ළඟින්ම වාඩි වී සිටි ඇනබෙත් නෙක්ටාර් විදුරුව අල්ලාගෙන, තෙත රෙදිකඩකින් මගේ නළල පිස දැමුවා.

"මෙන්න, අපි ආයෙමත් මෙතැන," මම කිවුවා.

"මෝඩ පැටියා," ඇනබෙත් කියද්දී, මට සිහිය ලැබීම ගැන එයා සතුටින් පිනාගිහින් කියලා මම දැනගත්තා. "අපි ඔයාව හොයා ගනිද්දී ඔයා කොළ පාට වෙලා, අළු පාටට හැරෙන්නත් පටන්ගෙන තිබුණේ. කයිරොන්ගේ බෙහෙත් නොතිබුණා නම් එහෙම..."

"දැන්, දැන්," කයිරොන්ගේ කටහඬ ඇහුණා. "පර්සිගේ ශරීර ශක්තියටත් ලකුණු ටිකක් ලැබෙන්න ඕනෑ."

මීට කලින් මට එයාව නොපෙනුණේ එයා මගේ ඇඳ පාමුල මිනිස් ස්වරූපයෙන් වාඩිවී සිටි නිසායි. එයා යටි කය මායා බලයෙන් රෝද පුටුව තුළ හිරකරලා, උඩු කය කබායකින් සහ ටයි පටියකින් සරසාගෙන සිටියා. එයා හිනාවුණත්, එයාගේ මුහුණ වෙහෙසට පත්වූ සුදුමැලි පෙනුමක් ගත්තේ හරියට එයා මුළු රැයක්ම ලතින් ප්‍රශ්න පත්තරවල හරි වැරදි බලමින් ඉඳලා වගෙයි.

"ඔයාට කොහොමද දැනෙන්නේ?" එයා ඇසුවා.

Scanned with CamScanner

"මගේ ඇඟ අධිශීත කරලා, ඊට පස්සේ මයික්‍රොවේව් උඳුනකට දාලා වගේ."

"වෙන්න පුළුවන්, ඒ වළ ගෝනුසු විෂ නේ. දැන්, ඔයාට පුළුවන් නම්, සිද්ධ වුණේ මොකක්ද කියලා ඔයා මට හරියටම කියන්න ඕනෑ."

අතරින්-පතර නෙක්ටාර්වලින් උගුර තෙමා ගනිමින්, මම මුළු කතාවම කිව්වා.

දිගු වේලාවක් යනතුරු කාමරයම නිහඬ වුණා.

"ලූක් එහෙම කළා කියලා මට විශ්වාස කරන්නත් බෑ..." ඇනබෙත්ගේ හඬ අතරමග ඇනහිටියා. එයාගේ මුහුණ තරහවෙන් සහ දුකෙන් පිරුණා. "ඔව්, ඔව්. මට විශ්වාස කරන්න පුළුවන්. එයාට නම් හොඳක් වෙන්න එපා... එයාගේ ගවේෂණයෙන් පස්සේ එයා ගොඩාක් වෙනස් වුණා."

"මේක ඔලිම්පස්වලට වාර්තා කරන්නම ඕනෑ," කයිරොන් මිමිණුවා. "මම දැන්ම යනවා."

"ලූක් දැන් එළියේ කොහේ හරි ඇත්තේ," මම කිව්වා. "මට එයාගේ පස්සෙන් යන්න වෙනවා."

කයිරොන් ඔළුව හෙල්ලුවා. "නෑ, පර්සි. දෙවිගොල්ලෝ -"

"අඩු තරමේ මේ ගැන කතා කරන්නෙවත් නැහැ," මම කඩා පැන්නා. "ඒ ගැන කතා කරන්නත් සියුස් තහනම් කරලා තියෙන්නේ!"

"පර්සි, මේක අමාරුයි කියලා මං දන්නවා. ඒත්, ඔයා පළිගන්න හදිස්සි වෙලා බැහැ. ඔයා තවම ඒකට ලෑස්ති නැහැ."

මම අකමැති වුණත්, කයිරොන් නිවැරදියි කියලා මගේ හිතේ පැත්තක් සැක කළා. තව සෑහෙන කාලයකට මට කඩු සටන් කරන්න නොලැබෙන බව මගේ අත දිහා බැලූ එක බැල්මකින්ම මම තේරුම් ගත්තා. "කයිරොන්... ඔරකල් ඔයාට කියපු අනාවැකිය... ඒක ක්‍රෝනොස් ගැන, නේද? ඒකේ මමත් ඉන්නවද? එතකොට, ඇනබෙත්?"

කයිරොන් සිවිලිම දෙසට සැක සහිත බැල්මක් හෙළුවා. "පර්සි, ඒක කියන්න -"

"ඒ ගැන මාත් එක්ක කතා කරන්න එපා කියලා ඔයාට අණ ලැබුණා, එහෙම නේද?"

එයාගේ ඇස් අනුකම්පාවෙන් සහ දුකෙන් පිරුණා. "ඔයා ශ්‍රේෂ්ඨ වීරයෙක් වේවි, දරුවෝ. ඔයාව සූදානම් කරන්න මම, මට පුළුවන් උපරිමය කරන්නම්. ඒත්, මම හිතනවා හරි නම්, ඔයාගේ ඉදිරියෙන් තියෙන පාර..."

කාමරයේ ජනේල පවා දෙදුරුම් කවමින් අකුණක් පුපුරා ගියා.

"හරි, හරි!" කයිරොන් කෑගැසුවා. "මම ඒක කියන්නේ නෑ!"

එයා සුසුමක් හෙළුවා. "දෙවිවරුන්ටත්, එයාලාගෙම හේතු තියෙනවා, පර්සි. ඔයාගේ අනාගතය ගැන ගොඩක් දැනගෙන ඉදීමෙන් කවදාවත් හොඳක් වෙන්නේ නැහැ."

"එහෙම කියලා මුකුත් නොකර, පැත්තකට වෙලා ඉඳගෙන ඉන්න අපිට බැහැ," මම කිව්වා.

"අපි පැත්තකට වෙලා ඉඳගෙන ඉන්නේ නැහැ," කයිරොන් පොරොන්දු වුණා. "ඒත්, ඔයා ගොඩාක් පරිස්සම් වෙන්න ඕනෑ. ක්‍රෝනොස්ට උවමනා ඔයාව එළියට ගන්න. ඔයාගේ ජීවිතය කඩාකප්පල් කරලා, ඔයාගේ සිතුවිලි බයෙන්, තරහවෙන් පුරවන්න එයාට ඕනෑ. එයාට උවමනා දේ එයාට දෙන්න එපා. ඉවසිලිවන්තව පුහුණුවීම් කරන්න. ඔයාටත් වෙලාවක් ඒවි."

"එච්චර කල් මම ජීවත් වුණොත් තමයි."

මගේ වළලුකර උඩින් කයිරොන් අතක් තැබුවා. "ඔයාට මාව විශ්වාස කරන්න වෙනවා, පර්සි. ඔයා ජීවත් වෙනවා. ඒත්, මුලින්ම ඊළඟ අවුරුද්ද ගැන ඔයා තීරණයක් ගන්න ඕනෑ. හරි තීරණය මොකක්ද කියලා ඔයාට කියන්න මට බැහැ..." ඒ ගැන එයාට හරිම පැහැදිලි උපදෙසක් තියෙන බවත්, එයා මට අවවාද නොකර ඉන්නේ හරිම අමාරුවෙන් බවත් මට දැනුණා. "ඒත්, ඔයා අර්ධ-ලෝහිත කන්දේ අවුරුද්දම ගත කරනවද, නැත්නම් හත වසරට ඇතුළු වෙන්න සාමාන්‍ය ලෝකෙට ගිහින්, ගිම්හාන කඳවුරුකාරයෙක් වෙනවද කියලා ඔයා තීරණය කරන්න ඕනෑ. ඒ ගැන කල්පනා කරලා බලන්න. මම ඔලිම්පස්වලින් ආපහු ආවාම, ඔයාගේ තීරණය මට දන්වන්න ඕනෑ."

එයාට විරෝධය පාන්න මට ඕනෑ වුණා. මට එයාගෙන් අහන්න තව ප්‍රශ්න තිබුණා. ඒත්, එයාගේ මුහුණෙන් පළවුණේ ඒ ගැන තවත් සාකච්ඡා කරන්න බැරි බවයි; කියන්න පුළුවන් හැමදේම එයා කියලා තිබුණා.

"මම පුළුවන් තරම් ඉක්මනට එන්නම්," කයිරොන් පොරොන්දු වුණා. "එතකල් ආර්ගස් ඔයාව බලාගනීවි."

එයා ඇනබෙත් දෙසට බැල්මක් හෙළුවා. "ඔහ්, ඒ වගේම, මගෙ දරුවෝ... ඔයා ලෑස්ති නම්, එයාලා මෙහෙට ඇවිත් ඉන්නේ."

"කවුද ඇවිත් ඉන්නේ?" මම ඇහුවා.

කාගෙන්වත් උත්තර නැහැ.

කයිරොන් කාමරයෙන් පිටට රෝද පුටුව පදවාගෙන ගියා. එයාගේ පුටුවේ රෝද පරිස්සමින් ඉදිරි පඩිවල වදින හඬ මට ඇහුණා.

ඇනබෙත් මගේ බීම වීදුරුවේ වූ අයිස් කැට දෙස බලා සිටියා.

"මොකක්ද අවුල?" මම එයාගෙන් ඇහුවා.

"මුකුත් නැහැ." එයා වීදුරුව මේසය උඩින් තැබුවා. "මම... මේ, ඔයා මට කරන්න කියපු දෙයක් කළා. ඔයාට... ම්... තව මොනවා හරි ඕනැද?"

"ඔව්. මට නැගිටින්න උදවු කරන්නකෝ. මට එළියට යන්න ඕනැ."

"පර්සි, ඒක නම් හොඳ අදහසක් නෙවෙයි."

මම ඇඳෙන් ඉවතට කකුල් දමා නැගිටින්න උත්සාහ කරද්දී බිමට වැටෙන්න කලින් ඇනබෙත් මාව අල්ලගත්තා. මගේ බඩ පෙරළිගෙන, ඔක්කාරයට ආවා.

"මම ඔයාට කිව්වනේ..." ඇනබෙත් කිවුවා.

"මම හොඳින්," මම තදින් කියා සිටියා. බටහිර ලෝකය විනාශ කරන්න ලූක් එළියේ ඉඳන් සැලසුම් හදද්දී, ලෙඩෙක් වගේ ඇඳක වැතිරිලා ඉන්න මට ඕනැ වුණේ නැහැ.

මම අමාරුවෙන් අඩියක් ඉදිරියට තැබුවා. ඊට පස්සේ තවත් අඩියක්, ඇනබෙත්ගේ වාරුව ඇතිව මම තැබුවා. ආර්ගස් අපේ පසුපසින්ම ආවත්, එයා අපේ දුරින් ඉන්න වගබලා ගත්තා.

අපි පියස්සට ළඟා වෙද්දී මගේ මුහුණ දහඩියෙන් නැහැවිලා. මගේ බඩවැල් ගැට ගැහිලා වගෙයි මට දැනුණේ. ඒ වුණත්, අත්වැට අසලටම යාගන්න මට හැකි වුණා.

ඒ වෙද්දී අඳුර වැටෙන්න ආසන්න වෙලා. කඳවුර මුළුමනින්ම පාළුවට ගිහින්. කැබින් කාමර කළුවර වෙලා, අත්පන්දු පිටිය නිහඬ

වෙලා තිබුණා. විලේ වතුර දෙබෑ කරගෙන යන ඔරු එකක්වත් නැහැ. කැලයටත් ස්ට්‍රෝබෙරි යායවලටත් එපිටින් ලෝන්ග් අයිලන්ඩ් වෙරළ ඉරේ අන්තිම එළියෙන් දිලිසුනා.

"ඔයා මොනවද කරන්න යන්නේ?" ඇනබෙත් මගෙන් ඇහුවා.

"මං දන්නේ නෑ."

මම අවුරුද්දම නතර වෙලා, වැඩි වැඩියෙන් පුහුණුවීම් කරනවා දකින්න කයිරොන්ට උවමනා බවට මට දැනුණු හැඟීම ගැන මම ඇනබෙත්ට කිවුවා. ඒත්, මට උවමනා ඒකමද කියලා මට විශ්වාසයක් තිබුණේ නැහැ. කොහොම වුණත්, ක්ලැරිස් එක්ක එයාව මෙහෙ තනිකරලා යන්න මට දුකයි කියලත් මම පිළිගත්තා...

ඇනබෙත් තොල් දෙක තදින් පියවාගත්තා, "මම මේ අවුරුද්දට ගෙදර යනවා, පර්සි." ඊට පස්සේ එයා හෙමිහිට කිවුවා.

මම ඇස් ලොකු කරන් එයා දිහා බලාගෙන හිටියා. "ඔයා කියන්නේ, ඔයාගේ තාත්තා ළඟට?"

එයා අර්ධ-ලෝහිත කන්ද මුඳුනට අත දිගු කළා. තාලියාගේ පයින් ගහ කිට්ටුව, කඳවුරේ මායා සීමාව අයිනේ හිටගෙන ඉන්න පවුලක ඡායාවන් මට පෙනුණා - පුංචි ළමයි දෙන්නෙක්, ගෑනු කෙනෙක් සහ තඹ කොණ්ඩයක් ඇති උස පිරිමි කෙනෙක්. එයාලා මඟ බලාගෙන ඉන්නවා වගෙයි පෙනුණේ. ඩෙන්වර් ජල උයනෙන් ඇනබෙත් ගෙනා ගමන් මල්ල වගේම එකක් පිරිමි කෙනාගේ අතේ තිබුණා.

"අපි ආපහු ආවට පස්සේ, ඔයා මට කරන්න කිව්ව විදිහටම මම එයාට ලියුමක් ලිවුවා," ඇනබෙත් කිවුවා. "මම එයාට ලිවුවා... මට කණගාටුයි කියලා. එයාට තවමත් මාව ඕනැ නම් මේ අවුරුද්දට ඉස්කෝලේ යන්න මම ගෙදර එන්නම් කියලත් කිවුවා. එයා ඉක්මනින්ම මට උත්තරයක් එව්වා. අපි තීරණය කළා... තව වතාවක් උත්සාහ කරලා බලන්න."

"ඒක නම් සෑහෙන ධෛර්යවන්ත වැඩක්."

එයා තොල් දෙක තද කරගත්තා. "මේ වාරේ ඉස්කෝලෙදී ඔයා මෝඩ වැඩ මොනවත් කරන්න හදන්නේ නෑ, නේ? අඩු ගාණේ... ඊට කලින් මට අයිරිස් මැසේජ් එකක්වත් එවනවා නේද?"

මම අමාරුවෙන් හිනාවක් මතුකර ගත්තා. "මම කරදර හොයාගෙන යන්නේ නැහැනේ. මොකද, සාමාන්‍යයෙන් මම එච්චර මහන්සි වෙනකල් කරදර බලාගෙන ඉන්නේ නෑ."

"ඊළඟ ගිම්හානෙදී මම ආපහු ආවම අපි ලූක්ව දඩයම් කරන්න යමු. අපි ගවේෂණයකට යන්න ඉල්ලමු. හැබැයි, අපිට අවසර දුන්නේ නැත්නම් අපි හොරෙන් හරි ගිහිල්ලා, ඒ වැඩේ කොහොම හරි කරමු, හොඳද?"

"ඒක නම් ඇතීනාගේ වගේ මොළේකින් හැදුව සැලැස්මක් වගෙයි."

එයා අත දිගු කළාම මම අතට-අත දුන්නා.

"පරිස්සමින් ඉන්න, පාසි මොළේ," ඇනබෙත් මට කිවුවා, "හොඳට ඇස් ඇරගෙන, සෝදිසියෙන් ඉන්න."

"ඔයාත් එහෙමයි, පණ්ඩිත ආච්චි."

එයා කන්ද මුදුනට ඇවිද ගිහින් එයාගේ පවුලේ අයට එකතු වූ දෙස මම බලා සිටියා. තාත්තාව තුහුරු ලෙස වැළඳගත් එයා අන්තිම වතාවටත් දෙණිය දෙස හැරී බැලුවා. එයා තාලියාගේ ගසට අතක් තබා, ඉන්පසු කන්දෙන් පහළ සාමාන්‍ය ලෝකයට පිටත් වුණා.

කඳවුරේදී පළවෙනි වතාවට මට ඇත්තෙන්ම තනිකමක් දැනෙන්න ගත්තා. මම ලෝන්ග් අයිලන්ඩ් වෙරළ දෙස බලද්දී මගේ තාත්තා කියූ දේ මගේ සිත තුළ රැව් දුන්නා, යටත් වෙලා ඉන්න සාගරයත් කැමති නැහැ නේ.

මම තීරණයක් ගත්තා.

පොසෙයිඩන් මගේ දෙස බලාගෙන සිටියා නම්, මගේ තෝරාගැනීම එයා අනුමත කරාවිද?

"ඊළඟ ගිම්හානෙදී මම ආපහු එන්නම්," මම එයාට පොරොන්දු වුණා. "එතකල් මම ජීවත් වෙනවා. කොහොම වුණත්, මම ඔයාගේ පුතා නේ." මාව ආපහු කැබින් අංක තුනට ගෙනියන්න කියලා මම ආර්ගස්ගෙන් ඉල්ලුවේ, ගෙදර යන්න බඩු අහුරාගන්නයි.

Scanned with CamScanner



'මෙහෙමයි, මට අර්ධ-ලෝහිතයෙක් වෙන්න ඕනෑ වුණේ නැහැ. ග්‍රීක දෙවියෙකුගේ පුතෙක් වෙන්න කොහෙත්ම උවමනා වුණේ නැහැ.

මමත් අනෙක් ළමයි වගේම ඉස්කෝලේ යමින්, පැසිපන්දු ක්‍රීඩා කරමින් සාමාන්‍ය ජීවිතයක් ගත කළ කොල්ලෙක්. ඒත් දවසක්, මම අහම්බයෙන් වගේ මගේ ගණිත ගුරුතුමියව වාෂ්ප කළා. දැන් මට වැඩිපුරම කරන්න වෙලා තියෙන්නේ රාක්ෂයින් සමග සටන් කිරීම සහ පණ බේරාගෙන ඉන්න උත්සාහ කිරීමයි.

අහසට අධිපති, සියුස්ගේ ප්‍රධාන අකුණ හොරකම් කළ බවට සියුස් මට චෝදනා කරන්නේ මේ අතරවාරයේදීයි. අහසට අධිපති දෙවියන්ගේ උදහසට ලක්වීම කොහෙත්ම හොඳ දෙයක් වුණේ නම් නැහැ.

ආශිර්වාද ප්‍රකාශකයෝ
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
033 2275419, 033 2276499

ISBN : 978-955-697-071-5
Rs. 650/=

Scanned with CamScanner